

# විසංගත කාලයක ලංකාව

යහපාලනයේ සිට 20 වැනි සංශෝධනය
දක්වා සංක්‍රාන්ති කාලය ගැන කතා සීයක්

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

# වසංගත කාලයක ලංකාව

## යහපාලනයේ සිට 20 වැනි සංශෝධනය දක්වා
## සංක්‍රාන්ති කාලය ගැන කතා සීයක්

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

# වසංගත කාලයක ලංකාව

යහපාලනයේ සිට 20 වැනි සංශෝධනය දක්වා සංක්‍රාන්ති කාලය ගැන කතා සීයක්


ප්‍රථම මුද්‍රණය: 2021

ISBN 978-624-5860-01-2


මෙම කතා සියය www.aithiya.lk හා www.dailyreporter.lk, right2lifelanka.org වෙබ් අඩවි තුළින් හා Aithiya media youtube ඔස්සේ හා Aithiya FB, Voice for Rights FB ඔස්සේ ප්‍රචාරය විය.


ප්‍රකාශනය:
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
අංක 288/135,
ජයවර්ධන පෙදෙස,
බේස්ලයින් පාර,
කොළඹ 10
දුරකථනය: +94 11 2699100
ඊ-මේල්: right2lifelk@gmail.com
www.right2lifelanka.org

මුද්‍රනය:
ඩිසයින් සිස්ටම්ස් (පුද්) සමාගම
23/1, 1 වන මාලිගාකන්ද පටුමග,
කොළඹ 10.

# ඇතුළට එබෙන්න කලින්..

චීනයේ වූහාන්වල වන සතුන් දඩයම් කරගෙන ඇවිත් විකුණන, ඒ මාර්කට්ටුව ගැන පුංචි පුංචි නිව්ස් අහන්න දකින්න කියවන්න ලැබුණු කාලයක තමයි අපි 'වොයිස් ෆෝ රයිට්ස්' යන තේමාව යටතේ මේ සංවාද සියය පටන් ගත්තේ. යහපාලනය අහවර වෙලා ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති විදිහට සිය ධුරයේ වැඩ පටන්ගෙන තිබුණ කාලයක් ඒක. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පිළිබඳව බොහෝ දෙනෙක් දැනගෙන සිටි නිසා දෝ සමාජ ක්‍රියාකාරිකයන් බොහෝ දෙනෙක් ප්‍රසිද්ධියේ අදහස් දක්වන්න බියවූ කාලයක් ඒක. ලංකාවේ වෙබ් මාධ්‍ය සංස්කෘතිය පිළිබඳව බොහෝ දෙනෙක්ට තවමත් තිබෙන්නේ නොපහන් හැඟීමක්, එනිසා සමහර ප්‍රමාතිකයින්ගෙන්, අදහස් නිශ්පාදකයින්ගෙන් අදහස් ලබාගැනීම මුලදි ප්‍රශ්නකාරී වුණා. නමුත් ඒ සියලු අභියෝග එක්ක අපි මේ අදහස් 100 ජනගත කිරීම දිගටම කරගෙන ගියා.

දේශපාලනය, කලාව සහ සංස්කතිය, නීතිය, මානවහිමිකම්, අධ්‍යාපනය, සෞඛ්‍ය, ආර්ථිකය, සංස්කෘතිය මේ සෑම ක්ෂේත්‍රයකම ප්‍රමුඛයින් සහ නවකයින් අපි මේ සංවාද පොකුර සඳහා බොහොම මහන්සියෙන් එකතුකරගත්තා. අපිට අවශ්‍ය වුණා අලුත් මුහුණුවලට ඉඩ විවර කරන්න. ප්‍රවීනයන්ට ඉඩ ලබාදෙමින්ම අපි ඔවුන් සම්බන්ධ කරගත්තා. ඒනිසා මේ හැම ක්ෂේත්‍රයක් පිළිබඳවම අලුත් කියවීම් බොහෝමයක් එළියට ආවා.

කෝවිඩ් වසංගතය ලෝකය පුරා ලැව් ගින්නක් වගේ පැතිරෙනකොට එහි උණුසුම ලංකාවට දැනෙනකොට අපි ඒ පිළිබඳව වගේම, මේ නව සාමාන්‍ය තත්ත්වය තුළ ජනජීවිතය ගැනත් මේ සංවාද සියය අස්සේ කතා කළා. ඒ වගේම පැවති යහපාලනය අහවර කරලා 19 වැනි ව්‍යවස්ථාව ඉවර කරලා 20 වැනි ව්‍යවස්ථාව රටතුළ තහවුරු වෙනකොට අපි ඒ ගැනත් මේ සංවාදය අස්සේ කතා කරන්න අමතක කළේ නැහැ. ඒ බොහෝ සංවාද හරවත් වගේම විවාද සම්පන්න වුණා කිව්වොත් ඒක හරී.

ඊට අමතරව පොලිස් වදහිංසාව, ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යසනය වගේ කාලීන සංවාදයනුත් මේ සංවාද සරණිය ඇතුලට අරගෙන එන්න අප පරිස්සම් වුණා. එහෙම බලනකොට මේ සංවාද සියය කියන්නේ මේ වසංගත කාලයේ, ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ සංක්‍රාන්ති යුගය පෙන්වන කැඩපතක්. මේ කාලයේ ලංකාවේ ආණ්ඩුකරණය වෙනස් වුණේ කොහොමද? මානව හිමිකම් තත්ත්වයන් වෙනස් වුණේ කොහොමද? වගේ බොහෝමයක් ක්ෂේත්‍රවල පරිනාමයන් පිළිබඳව කියවාගන්නට මේ සංවාද සියය උචිත බවයි අපගේ හැඟීම. දැන් මේ කතා සියය කියන්නේ ඉතිහාසය. ඒ ඉතිහාසය මෙහෙම පොතක් විදිහට සංස්කරණය කරන්න කල්පනා කළේත් එය අනාගතයට වැදගත් වේයැයි අපි සිතන නිසා.

අවසන මේ සංවාද සියය ගෙන එන්න දායකවූ වගේම සහය දැක්වූ සියල්ලන්ටම ස්තූතියි යන්න කිව යුතුයි.

**කේ. සංජීව - සංස්කාරක**

සංවාද සියය පළවූ වෙබ් අවකාශයන් ඃ

aithiya.lk
www.dailyreporter.lk
www.right2lifelanka.org
Aithiya Facebook page
Aithiya Media - Youtube
Voice for Rights (Facebook)

# පටුන


1. පොලීසියේම හිංසනයට ලක් වූ
පොලිස් නිළධාරියෙකුගේ කතාව. . . . . . . . . . . . . . . . . . . . . 15

2. පොලීසිය තාරික්ට ගැහුවේ ඇඳිරි නීතිය උල්ලංඝනය කළ
දෙන්නෙක් එක්ක . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 18
**අබ්දුල් හමීඩ් මොහොමඩ් වසීඩ් (තාරික් අහමඩ්ගේ පියා)**

3. ප්‍රචණ්ඩත්වය තියෙන්නේ, අපි නොහිතන තැනක . . . . . . . . . 21
**සුජිත් රත්නායක (චිත්‍ර ශිල්පී සහ කලා විචාරක)**

4. පත්ලක් නැති අගාධයකට රටේ ආර්ථිකය
ගමන් කරමින් තිබෙනවා . . . . . . . . . . . . . . . . . . . . . . . 23
**නීතිඥ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ (හිටපු පළාත් සභා මන්ත්‍රී)**

5. පුරාවිද්‍යා සංරක්ෂණය පිළිබඳව කාර්යසාධක බලකාය
මහා විහිළුවක්. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 27
**එරංග ගුණසේකර (සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක)**

6. අපේ ජනාධිපතිවරයා වැරදි රස්සාව තමයි තෝරගෙන
තියෙන්නේ. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 29
**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**

7. මේක මිලිටරීකරණය තමයි . . . . . . . . . . . . . . . . . . . . . . 32
**මාධ්‍යවේදී විමල් කැටිපේආරච්චි**

8. අද කලාකාරයාට රසිකයා පිළිබඳ විශ්වාසයක් නැහැ . . . . . . . 36
**නිර්මාණවේදී සංජය ඇපා සෙනෙවිරත්න**

9. අපි අද බිම් පණුවෝ වගේ. . . . . . . . . . . . . . . . . . . . . . 38
**සිනමාවේදී චින්තන ධර්මදාස**

10. බුද්ධිමය දේපල ප්‍රශ්නය විසඳගන්න
සාමූහික කළමනාකරණයට යමු. . . . . . . . . . . . . . . . . . . . . 42
**සංගීතවේදී හර්ෂ බුලත්සිංහල**

11. පරිසරය ගැන නොතකා පටන්ගත්ත ව්‍යාපෘති
රටට බරක් වෙලා . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 46
පරිසරවේදී සජීව චාමිකර

12. පාර්ලිමේන්තුව, විහිළුවට හාස්‍යයට ලක්කරගත යුතු
තැනක් නෙමෙයි . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 50
පර්යේෂිකා සදීශා ධර්මප්‍රේම

13. කාන්තාවක් දේශපාලනයට ගෙනා යුත්තේ
ඇය කාන්තාවක් වීම නිසාම නොවේ . . . . . . . . . . . . . . . . . 55
සමාජ ක්‍රියාකාරිනී මනු තිසේරා

14. සමාජ විපර්යාසයක් කිරීමේදී බාගෙට කරන්න බැහැ . . . . . . . 58
සාහිත්‍යවේදී ගාමිණී වියන්ගොඩ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .58

15. අපි සිවිල් සමාජය විදිහට දේශපාලන බලය
අභ්‍යාස කළ යුතුයි . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 62
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන් රත්නප්‍රිය

16. ලාංකිකයෝ චීනයේ මැදිහත්වීම ආක්‍රමණයක් විදිහට
දකින්නේ නෑ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 65
භූපති නලින් (දේශපාලන විචාරක)

17. රාජපක්ෂ පවුලට හොඳම ටික, අනෙක් අයට රොඩ්ඩු. . . . . . . . 70
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කරුණාරත්න පරණවිතාන

18. අද ජනමාධ්‍යයට සමාජයේ ඉඩක් නැහැ . . . . . . . . . . . . . . . 74
සීතා රංජනී - කැඳවුම්කරු නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

19. ඉදිරියේදී අසහනකාරී ව්‍යාධීන් සහිත පරම්පරාවක්
ඇති වෙන්න පුළුවන් . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 78
රංගන ශිල්පිනී කෞශල්‍යා ප්‍රනාන්දු

20. ලංකාවේ ප්‍රගතිශීලීන්ට ලිබරල්වාදයයි ප්‍රජාතන්ත්‍රවාදයයි අතර
වෙනස වටහාගන්න බෑ. . . . . . . . . . . . . . . . . . . . . . . . 82
දේශපාලන විශ්ලේෂක විදර්ශන කන්නන්ගර

21. 20 වැනි සංශෝධනය සම්මත වුණොත්
තොරතුරු අයිතියත් ඉවරයි . . . . . . . . . . . . . . . . . . . . . . 86
**නීතිඥ ජගත් ලියනාආරච්චි**

22. ජනතාව පාලකයන්ට බලය දෙන තරම් පහසුවෙන්, එය නැවත
ලබා ගැනීමට බැහැ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 90
**සාහිත්‍යවේදී කෞශල්‍යා කුමාරසිංහ**

23. අපි කරන්නේ, කාලෙන් කාලෙට එකතුවෙලා කෑගහන එක . . . 94
**කුමුදු කුමාරසිංහ (රංගන ශිල්පිනී)**

24. ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා කාන්තාවන්
ලිංගික හිංසනයට ලක්වෙලා. . . . . . . . . . . . . . . . . . . . . . . 96
**විමුක්ති ද සිල්වා (ලා වියා කැම්පසිනා සුළු ගොවි ව්‍යාපාරයේ
ජාත්‍යන්තර කමිටු සාමාජිකා)**

25. මේ වසංගතය නිසා ඩොලර් බිලියන එකොලහක විදේශ
විනිමයක් අහිමිවෙයි කියලා අපි හිතනවා . . . . . . . . . . . . . . 99
**බලපත්‍ර ලත් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන සංගමයේ ලේකම්
එම්.එෆ්.එම්. අර්ෂාඩ්**

26. ප්‍රජාතන්ත්‍රවාදය රාජපක්ෂවරුන්ට අරහන් . . . . . . . . . . . . . 103
**නීතිඥ රවී ජයවර්ධන**

27. ගෝඨාභයගේ මේ අත්හදා බැලීම
විගඩමක් වෙන්න නියමිතයි!. . . . . . . . . . . . . . . . . . . . . . . 106
**නීතිඥ ශිරාල් ලක්තිලක**

28. රාජපක්ෂවරු ගැන අපි හොඳට දන්නවා, අළුත් ව්‍යවස්ථාව
ගේන්නේ නෑ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .112
**පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක. . . . . . . . . . . . . . . . . . . . . . . .112**

29. උත්සාහය ආයෙත් රටම ගිනි තියන්න . . . . . . . . . . . . . . . .116
**මාමන්කඩවල පියරතන හිමි (උතුරු හා උතුරු මැද ද්වීතික සංඝනායක)**

30. ගොවි ජනතාව දැන් භුක්ති විඳින නිදහස
ඉදිරියේ දී නැති වේවි. . . . . . . . . . . . . . . . . . . . . . . . . . .119
**කවුඩුල්ලේ ජයතිස්ස**

31. රජය වෘත්තීය විශේෂඥයින්ට ඇහුන්කන් දෙන්නේ නෑ. . . . . 123
**රජයේ හෙද නිළධාරීන්ගේ සංගමයේ භාණ්ඩාගාරික ඊ.ඒ. ජයසිංහ**

32. වැඩිම මුදල් උපයන අය ගැන හෙව්වොත්, පාස්කු ප්‍රහාරයේ මහා මොළකාරයින් හොයාගන්න පුලුවන් . . . . . . . . . . . . . . . . 127
**චතුර ගලප්පත්ති (දෙවිනුවර ආසන සංවිධායක, සමගි ජන බලවේගය)**

33. ජනාධිපතිගේ “අපි ණය උගුලක අහු වෙලා නෑ” කියලා කියපු වචනේ අපට විශ්වාසයි. . . . . . . . . . . . . . . . . . . . . . . . .131
**බද්දේගම සමිත හිමි**

34. මේ ව්‍යාජ දේශප්‍රේමීත්වයට භික්ෂූන් වහන්සේලාත් වගකියන්න ඕනෑ. . . . . . . . . . . . . . . . . . . . . . . . . . .135
**චන්ද්‍රජෝති හිමි**

35. මේ ආණ්ඩුව දැන් කරන්නෙත් 2005-.2010 කාලේ කරපු ටිකමයි . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 139
**ආනන්ද ලැනරෝල් - බද්දේගම ප්‍රදේශීය සභාවේ හිටපු සභාපති**

36. රාජපක්ෂලා හැමදාම කළේ බලය එකතු කරන එක. . . . . . . . 142
**උපුල් නිශාන්ත - මාතර මහ නගර සභාවේ විපක්ෂ නායක**

37. පැරණි ලෝකය අවසන්! . . . . . . . . . . . . . . . . . . . . . . . . 144
**සුරංජිත් ගුණසේකර (අංශ ප්‍රධානී සමාජ විද්‍යා අධ්‍යායන අංශය රුහුණු විශ්ව විද්‍යාලය)**

38. සමාජයේ නිරෝගීතාවය බිඳ වැටිලා, සමාජයක් ලෙස ප්‍රතිකර්ම සෙවිය යුතුයි . . . . . . . . . . . . . . . . . . . . . . . 147
**සමිත උදයංග (සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය, රුහුණු විශ්ව විද්‍යාලය)**

39. පිළිකාකාරක ආහාර සම්බන්ධයෙන් අපි සමාජයක් විදිහට තවමත් සංවේදී නැහැ. . . . . . . . . . . . . . . . . . . . . . . . 150
**සමාජ ක්‍රියාකාරික නිමල් ද සිල්වා. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .150**

40. නව සාමාන්‍ය තත්ත්වය තුළ මානව ජීවිතය කෙබඳුද? . . . . . 156
**දිනේෂා කංකානම්ගේ (සහාය කතිකාචාර්ය සමාජ විද්‍යා අධ්‍යායන අංශය, රුහුණු විශ්ව විද්‍යාලය)**

41. කොවිඩ් මර්දනය දැන් යන්නේ ඇමරිකන් ක්‍රමයට,
අපිට ගැලවීමක් නෑ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 163
ජනතා විමුක්ති පෙරමුණු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න

42. වතු ජනතාවගේ ප්‍රශ්නයට එකම විසඳුම
ඔවුන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීමයි . . . . . . . . . . . . . . . 168
චාමර නානායක්කාර (ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොණරාගල)

43. අලි මිනිස් ගැටුම ඉර හඳ තියෙන තාක්කල් ම
ඉවර වෙන්නෙ නෑ. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 172
බලහරුවේ සිරිසුමන හිමි

44. අපි ලොකුවට උඩ දැම්මට පරම පවිත්‍ර මාර සිංහල තමයි අපි
කියලා, ඒක එහෙම නැහැ . . . . . . . . . . . . . . . . . . . . . . 175
නිශ්ශංක විජේමාන්න

45. කෝවිඩ් නිසා අසරණ වුණේ තුන්වෙනි පන්තියේ මිනිස්සු . . 179
කේ. පී සෝමලතා (සභාපති, ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය)

46. දේශපාලනික බලපෑම් ලංකාවේ
සංස්කෘතිකමය අංගයක් වෙලා . . . . . . . . . . . . . . . . . . . 182
විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරී අයුබ් ඛාන්

47. වතුකරයේ ජනතාවට තියෙන්නේ වෙන නීතියක්. . . . . . . . . .187
කන්මනී සිවනේෂන් - බදුල්ල ප්‍රාදේශීය සභා මන්ත්‍රී

48. මේ රටේ යම් ගැහැණියක් ඉතාම නරක විදිහට අපහාසයට
ලක්වුණා නම්, ඒ ගැහැණිය මම තමයි . . . . . . . . . . . . . . . .191
සන්ධ්‍යා එක්නැළිගොඩ

49. කලාකරුවෝ කියන්නේ රම්පේ කරපිංචා . . . . . . . . . . . . . 195
රංගන ශිල්පී දිලිප් රෝහන

50. අද මාධ්‍යවේදීන් ඇමතිතුමාගේ සපත්තු පොලිෂ් කරනවා . . . 198
ප්‍රාදේශීය මාධ්‍යවේදී ජනූර් කිච්ලාන්

51. විදුලිබල මණ්ඩලය ගිව්සුම් උගුලේ පැටලිලා ඉන්නේ. . . . . . 202
බන්දුල චන්ද්‍රසිරි හිටපු සභාපති ලංකා විදුලි පුද්ගලික සමාගම

52. අධිකරණය තමන්ගේ ගෞරවය රැක ගන්න
කටයුතු කරන්න අවශ්‍යයි. . . . . . . . . . . . . . . . . . . . . . . . . . 207
**අනිද්දා සංස්කාරක නීතිඥ කේ. ඩබ්ලිව්. ජනරංජන**

53. දැන් මාධ්‍යයේ ප්‍රධාන රාජකාරිය ජනමතය ගොඩනැගීම. . . . 213
**මාධ්‍යවේදී අජිත් පැරකුම් ජයසිංහ**

54. අපනයන ආර්ථිකය වැඩි කළ යුතුයි. . . . . . . . . . . . . . . . . . 216
**වරලත් ගණකාධිකාරී හර්ෂ ගුණසේන**

55. මේක දුප්පතුන්ට මරණය ගේන ණය ක්‍රමයක්. . . . . . . . . . . . 220
**පර්යේෂිකා අමාලි වෙදගෙදර**

56. රඹකැන් ඔය ඉඩම් දීලා තියෙන්නේ ගජ මිතුරන්ට. . . . . . . . . 223
**පරිසරවේදී තිලක් කාරියවසම්**

57. සුරංගනා කතා කියලා කාන්තාවන් අන්දන්න එපා. . . . . . . . . 226
**තමාරා දයානි හෙට්ටිමුල්ල ජාතික වෘත්තීය සමිති පෙරමුණ හා**
**වැඩ කරන ජන බලය සංවිධානය**

58. මේකට අවශ්‍ය මහජන සෞඛ්‍යය ප්‍රතිචාරයක්. . . . . . . . . . . . 228
**පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හරිනි අමරසූරිය**

59. පුවත්පත් මණ්ඩලය මොකද්ද? කුමක් සඳහා ද?. . . . . . . . . . . 231
**නීතීඥ විරංජන හේරත්**

60. මාධ්‍ය සංවිධානවල නිදහස ගැන විතරක් කතා කරන්න එපා. 235
**මාධ්‍යවේදී කපිල එම් ගමගේ**

61. සිවිල් සමාජය තරුණ ප්‍රජාව අතරට යා යුතුයි . . . . . . . . . . . 238
**මානව හිමිකම් ක්‍රියාකාරි සුරේෂ් නඩේෂන්**

62. වෙඩි තියන තැනට නොසන්සුන්තාවය හැදුවේ
බන්ධනාගාර නිළධාරීන්. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 241
**මානව හිමිකම් ක්‍රියාකාරික සුදේශ් නන්දිමාල්**

63. දේශීය වශයෙන් මේවා ගැන හොයලා බැලුවනම්
ජාත්‍යන්තරයට යන්න අවශ්‍ය නැහැ. . . . . . . . . . . . . . . . . . . 243
**මානව හිමිකම් ක්‍රියාකාරික රුකී ප්‍රනාන්දු**

64. මේක ඇවිල්ල ඩොලර් උල්පතක්. . . . . . . . . . . . . . . . . . . . 249
**ස්වාධීන වරාය සේවක සංගමයේ සභාපති ලාල් බංගමුවගේ**

65. ලංකාව කියන්නේ අතුරුදහන්වීමේ දිවයිනක් . . . . . . . . . . . 252
**හිටපු මානව හිමිකම් කොමසාරිස් රමණී මුත්තෙට්ටුවේගම**

66. මේ ආණ්ඩුව කොරෝනාව ගරානාවක් කරගත්තා . . . . . . . . . 257
**පාර්ලිමේන්තු මන්ත්‍රී මනූෂ නානායක්කාර**

67. ඔන්ලයින් අධ්‍යාපනය අසමානයි, ගමේ ළමුන්ට අසාධාරණයක් සිද්ධ වෙනවා . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 261
**ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝෂප් ස්ටාලින්**

68. කැබිනට් ඇමති කියන්නේ දැන් බෝඩ් ලෑල්ලක් විතරයි . . . . 265
**මහාචාර්ය එච් ඩබ්ලිව් සිරිල්**

69. කුල සාධකය රාජ්‍ය ප්‍රතිපත්තියක්..! . . . . . . . . . . . . . . . . . . 269
**මංජුල ගජනායක - මාර්තු 12 ව්‍යාපාරය**

70. වෙන එකම දේ කඩාගෙන වැටීම විතරයි . . . . . . . . . . . . . 273
**විශ්‍රාමලත් විදුලි අධිකාරී අජිත් මුණසිංහ**

71. චෝරනාගව පුටුවෙන් ඇදලා දාලා අනුලා බිසව රාජත්වයේ පිහිටෙව්වේ ඇයි? . . . . . . . . . . . . . 275
**ලේඛක සුජිත් අක්කරවත්ත**

72. ජීවන වියදම ගැන කතා කරලා වැඩක් නැහැ. . . . . . . . . . . . 280
**මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි**

73. මේක තනිකරම අධිකරණයට අපහාස කිරීමක් . . . . . . . . . . 283
**නීතිඥ හර්ශන නානායක්කාර**

74. අපි සමස්තයම කිලුටු කරගත්ත ජාතියක් කියලා . . . . . . . . . 286
**සිනමාවේදී සුදත් මහදිවුල්වැව**

75. මේ මිනිසුන් කුඩා තේ වතු අයිතිකාරයො කරන්න පුළුවන්. . . 289
**පාර්ලිමේන්තු මන්ත්‍රී වඩිවෙල් සුරේෂ්**

76. සතියෙ දවස්වල නමින් තමයි මේ මිනිස්සු
ණය හඳුන්වන්නේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . 292
**සමාජ ක්‍රියාකාරික දේවා ක්‍රිෂ්නන්**

77. ජිහාද් කියන වචනය පාවිච්චි කරලා මාව හිරේ දැම්මා. . . . . 295
**මාධ්‍යවේදී රම්ෂි රාසික්**

78. මේක අලුත් ආරම්භයක්. . . . . . . . . . . . . . . . . . . . . . . . 299
**සිනමාවේදී අසෝක හඳගම**

79. අයි.සී.සී.පී.ආර්. ලංකාවේ භාවිතයක් නෙවෙයි වෙන්නේ,
අවභාවිතයක් . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 303
**සිනමාවේදී නීතිඥ විසාකේස චන්ද්‍රසේකරම්**

80. ඉන්දියාව මට මගේ ගම වගේ . . . . . . . . . . . . . . . . . . . 307
**ප්‍රවීන ලේඛිකා සුනේත්‍රා රාජකරුණානායක**

81. ආදායම් උපයන්න තියෙන අවස්ථා පුද්ගලික අංශයට දීලා . . .311
**සෞඛ්‍ය වෘත්තීයවේදීන්ගේ විද්වත් සංගමයේ සභාපති රවි කුමුදේශ්**

82. සංස්කෘතික ජීවියා අභිමිවීම ඇතුලෙ තියෙන්නේ
ලොකු ඛේදයක්. . . . . . . . . . . . . . . . . . . . . . . . . . 314
**චිත්‍රශිල්පී ප්‍රගීත් රත්නායක**

83. රටේ පොදු ප්‍රශ්න දිහා වාර්ගික ඇහැකින් බලන්න එපා . . . . .317
**පාර්ලිමේන්තු මන්ත්‍රී ඉම්තියාස් බාකිර් මාකර්**

84. ඇඟලුම් කර්මාන්තය කිසිසේත්ම බිඳ වැටීමක් නැහැ
**නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සංගමයේ**
**සම ලේකම් ඇන්ටන් මාකස්**

85. අද දෙමළ ඊළමක් නෑ, අද තියෙන්නේ චීන ඊළමක්. . . . . . . 323
**හිටපු අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න**

86. වතු ආර්ථිකය කඩා වැටිලා නෑ ඒක බොරුවක්. . . . . . . . . . 328
**චතුර සමරසිංහ ලේකම්, වතු සේවා සංගමය**

87. රෑ 12න් පස්සේ තමයි වැඩිපුර ඔන්ලයින් පන්ති තියෙන්නේ. . 332
**ගුරු උපදේශිකා රේණුකා පද්මිණී**

88. වරදක් කළත් සිතකින් නොවේ කියලා, මේ බදු වංචාවෙන් පැනලා යන්න හදන්න එපා . . . . . . . . . . . . . . . . . . . . . . . . . 337
**පුබුදු ජයගොඩ - පෙරටුගාමී සමාජවාදී පක්ෂය**

89. ගොකරැල්ල උසස්පෙළ සිසුවාට වූ අසාධාරණය පිළිබඳ ජාතික පොලිස් කොමිසමෙන් යළි විමර්ශනයක් . . . . . . . . . . . . . . . 342

90. මළමිනී සොයාගෙන යන මාධ්‍ය සංස්කෘතියක් අපේ රටේ තියෙන්නේ. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 345
**මාධ්‍යවේදී චන්දන සිරිමල්වත්ත**

91. හාල් මාෆියාව නැතිකරන්න ආපු අය ඩඩ්ලි ඉස්සරහා දණ ගැහුවා. . . . . . . . . . . . . . . . . . . . . . . . . 348
**උදේනි දිසානායක - සභාපති සමස්ථ ලංකා කළමනාකරණ සේවා නිළධාරී සංගමය**

92. ණය ගෙවාගන්න බැරුව ගෙට ගිනි තබාගත් සෙල්වි . . . . . . 350

93. මේක ළමා හිංසනයට විරුද්ධව ලබාදුන් සුවිශේෂ නඩු තීන්දුවක්. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 352
**වෛද්‍ය තුෂ් වික්‍රමනායක**

94. පොදු යහපත වෙනුවෙන් කැප 10ක් හිටියොත් මේක ගොඩදාන්න පුලුවන් . . . . . . . . . . . . . . . . . . . . . . . . . 355
**නාට්‍යවේදී එම් සෆීර්**

95. වස විෂ නැති ආහාර ඕනෑ නම් මිනිස්සු ඒ ගැන හඬ නැගිය යුතුයි . . . . . . . . . . . . . . . . . . 360
**වෛද්‍ය සංකල්ප මාරසිංහ**

96. පරිනතබව තීරණය වෙන්නේ ජීවත්වුණ අවුරුදු ගානෙන් නෙවෙයි . . . . . . . . . . . . . . . . . 365
**නීතීඥ චරිත් ගල්හේන, ජාතික ජන බලවේගය**

97. තොරතුරු පනතේ උදව්වෙන්
පාරක් හදාගත්ත දයාරත්නගේ කතාව . . . . . . . . . . . . . . . . 368

98. පොලිස් වදහිංසාවට තවත් උදාහරණයක් . . . . . . . . . . . . . .371

99. ඝාතනයට වසර විස්සයි සැකකරු තවමත් නිදැල්ලේ . . . . . . 374

100. 20 සම්මතවීම සහ පාස්කු පරීක්ෂණ අතර ඩීල් එකක් තියෙනවද?
අපිට සැකයි . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 377
**පාර්ලිමේන්තු මන්ත්‍රී නිරෝෂන් පෙරේරා**

# 1. පොලීසියේම හිංසනයට ලක් වූ පොලිස් නිළධාරියෙකුගේ කතාව



එස් බුද්ධික මධුෂාන්

*පොලීසිය යනු රට තුළ නීතියේ පාලනය පවත්වාගෙන යන ප්‍රධාන ආයතනයයි. එය මහජනයාට වඩාත්ම සමීප විය යුතු ආයතනයයි. එහි සේවාවන් මහජනයා සමග බැඳිය යුතුය. එය මහජනයාට ඉහළින් පැවතිය යුතු නැත. එය මහජනයා බිය ගන්වන, තැති ගන්වන ආයතනයක් නොවිය යුතුය. එහෙත් අපගේ පොලීසිය තවමත් ජනතාවගෙන් සැහෙන්න දුරස්ථය. එයට හේතුව පොලීසිය ජනතාව මර්දනය කරන, හිංසනයට පත්කරන ආයතනයක් ලෙස ජනතාව අතර ස්ථාපිතව පැවතීමය. අප මේ කියන්න යන කතාවට අනුව පොලීසියේ හිංසනයට, ප්‍රචණ්ඩත්වයට පාත්‍ර වන්නේ පොලීසිය තුළම සේවය කරන පොලිස් කොස්තාපල්වරයෙක් ය. ඔහුගේ මෙම කතාව නැගඑන පොලිස් ප්‍රචණ්ඩත්වයට හොඳම නිදර්ශනයක් ය. අහන්න මේ කතාව..!*

## මම ගත්ත වෙපන් එකක් නැහැ

'මම එස් බුද්ධික මධුෂාන්, මම පොලීසියට බැඳුනේ 2016/12/15. මගේ නිල අංකය පී සී 91637. මම තඹුත්තේගම පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අවුරුද්දක පුහුණුවක් ලැබුවා, ඊට පස්සේ ගාල්ලේ අහංගම පොලිසියේ තමයි මුලින්ම රාජකාරි කළේ. ඊට පස්සේ ගිය අවුරුද්දේ ස්ථිර මාරුවීමක් ආවා මරදාන පොලීසියට. එහෙම මරදානට ඇවිත් රාජකාරි කරනකොට අප්‍රේල් මාසේ 26 වගේ උණ හැදුනා. පොලිස් රෝහලේ හිටියා, පස්සේ මෙඩිකල් අරං ගෙදර හිටියා. එහෙම ඉන්නකොට තමයි කොවිඩ් ප්‍රශ්නය ඇවිත් ඇඳිරිනීතිය වැටුනේ. පස්සේ ළඟම තියෙන පොලීසියට රාජකාරි වාර්තා කරන්න කිව්වා, මම අප්‍රේල් 01 ඉඳලා

පයාගල පොලීසියට රාජකාරි වාර්තා කළා. ඒ ඉන්න අතරේ අප්‍රේල් 15 මම ඩිවිෂන් මහත්තයාගේ වැඩකට කොළඹ ගියා. ගිහිං එනකොට පොලීසියේ ඩබ්ලිව් පී සී ලා එහෙම අඬ අඬා හිටියා. මම ඇහුවා ඇයි කියලා. එතකොට තමයි ආරංචි වුණේ පිස්ටල් එකක් නැතිවෙලා කියලා. ඇත්තටම අප්‍රේල් 13 වෙනි දා තමයි නැතිවෙලා තියෙන්නේ. එස් අයි මහත්තයෙක් තමයි අවසන් වතාවට අරං ගිහිං තිබුණේ. ඊට පස්සේ අපි මේ වෙපන් එක සැහෙන්න හෙව්වා"

"අප්‍රේල් 18 වෙනිදා මට ඩියුටි වැටිලා තිබුනේ රෑ 10 ට. ඒත් මට පයාගල පොලීසියෙන් කතාකරලා කිව්වා ඕඅයිසී මහත්තයා ස්පෙෂල් ඩියුටියකට කතාකරනවා කියලා කලින් එන්න කියලා. ඔය කෝල් එක ආවේ තුනට විතර. ඉතිං මම ඒ ගමන් පොලීසියට ගියා. ඊට පස්සේ මාව එක්කරගෙන ගියා කටුකුරුන්ද කොට්ඨාශ අපරාද අංශයට. ඊට පස්සේ එතනින් ඇතුළට යනකොටම දීපං වෙපන් එක කියලා කුනුහරුපයක් කියලා මට හොඳටම ගැහුවා. මට හිතාගන්න බැරිවුණා. මම කිව්වා මම ගත්තේම නෑ කියලා, ඒත් ඇහුවේ නෑ. මගේ මොබයිල් ෆෝන් එක ගත්තා. ඊට පස්සේ ඇතුලේ කාමරයකට මාව අරගෙන ගියා. හතර දෙනෙක් හිටියා. වීරසිරි කියලා අයිපී මහත්තයෙක් හිටියා. තව එතන අපරාද කොට්ඨාශයේ ඕඅයිසී මහත්තයා හිටියා. ඉතුරු දෙන්නා කවුද කියලා නම් දන්නේ නෑ. දැක්කොත් අඳුරන්න පුලුවන්. කාමරයට අරගෙන ගිහිං හැන්ඩ් කප් දැම්මා. ඊට පස්සේ පොල්ලකින් ගහන ගමන් ප්‍රශ්න කළා. වෙපන් එක දීපං කියලාම තමයි කිව්වේ. හයවෙනකම් විතර වදහිංසා කළා. ඊට පස්සේ රෑ 10ට කළුතර පොලීසියෙන් පයාගල පොලීසියට අරගෙනා අවා. ඊට පස්සේ අත්අඩංගුවට ගත්තා. බොන්න වතුර ටිකක් වත් දුන්නේ නෑ. පස්සේ අප්‍රේල් 19 වෙනිදා කළුතර මහේස්ත්‍රාත් නිළ නිවාසෙට අරගෙන ගියා. එතනට අරං ගිහිං තුවක්කු පනත, පොදු දේපල පනත, හොරකම, චෝදනා විදිහට දලා තමයි මහේස්ත්‍රාත්තුමිය ළඟට දැම්මේ. මම කිව්වා මට ලෝයර් කෙනෙක් ඕනී නේද කියලා. එතකොට කිව්වා ලෝයර් කෙනෙක් ඕනෑ නෑ උඹව පැය 24ක් රඳවලා තියාගෙන ප්‍රශ්න කරන්න අවසර ගන්න තමයි මහේස්ත්‍රාත් ළඟට දාන්නේ කියලා".

මසේත්‍රාත්තුමිය අප්‍රේල් 28 වෙනකම් බන්ධනාගාර ගත කරන්න කියලා කිව්වා. ඒ එක්කම මහේස්ත්‍රාත්තුමිය කිව්වා ඩොක්ටර් ළඟට දාන්න

කියලා. නාගොඩ ඉස්පිරිතාලේ පොලිස් මුරපොළේ හිටපු පොලිස් නිළධාරියෙක්ගේ යාළුවෙක් ළඟට තමයි මාව අරගෙන ගියේ, ගිහිං ඒ නිළධාරියා මාර්ගෙන් තමයි මාව නාගොඩ රෝහලේ ඩොක්ටර් කෙනෙක් ළඟට දැම්මේ. ඒ ඩොක්ටර් කොලේ පුරවන්නවත් දන්නේ නෑ. මම ඒ දොස්තර නෝනාට කිව්වා මට හොඳටම ගැහුවා කියලා. ඒත් ගණන් ගත්තේ නෑ. ඊට පස්සේ මාව පානදුරේ බන්ධනාගාරයට දාලා එතනින් බූස්ස බන්ධනාගාරේ ට යැව්වා. අප්‍රේල් 28 මට ඇප දුන්නට බූස්සට බස්සෙක ආවේ නෑ, මාව එක්කරගෙන යන්න. අප්‍රේල් 30 හවස තමයි එක්කරගෙන යන්න ආවේ. ඒ ඇවිත් කළුතර බන්ධනාග ාරයට අරගෙන ගියා. එහෙට යනකොට රෑ වුණා. ඊට පස්සේ මට ගෙදර යන්න වුණේ මැයි 01 දා".

"පොලීසියේ ඉහළ නිළධාරීන් මේකෙට මාව අහු කළේ ඔවුන්ට මේ ප්‍රශ්නයෙන් ගැළවෙන්න. ඒකෙන් මම හොරෙක් වුණා. දැන් මට රස්සාවත් නෑ. මගේ තාත්තත් පොලිස් නිළධාරියෙක්. අපේ පවුලටම මෙකෙන් අපහාසයක් තමයි වුණේ. මට මගේ රස්සාව ආයි ඕනෑ. මම හොරෙක් නොවෙයි කියන දේ එක්ක මට ආයිත් පොලීසියට යන්න ඕනෑ. අනික මට මේ අපරාදය කරපු ඉහළ නිළධාරීන්ට නීතියෙන් දඬුවම් ලැබෙන්න ඕනෑ. මම හිතනවා මට සාධාරණය ඉටුවෙයි කියලා".

*අපි කතාවට කියන්නේ පොලීසියට ඕනෑ නම් ගොරකා දඩමස් කළ හැකි බවය. මේ කතාව සනාථ කරන්නේ පොලීසිය පිළිබඳ එම මතය නිවැරදි බවය. අනෙක් පැත්තෙන් පොලීසිය තම නිළධාරියෙක්ට සලකන්නේ මෙවැනි ආකාරයට නම් ඔවුන් මහජනයාට සලකන ආකාරය ගැන සිතාගැනීම අපහසු නැත.*

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/GCDcYuGlycI

https://www.aithiya.lk/□□□□□□□□□□-□□□□□□□□-□□□-□□/

# 2. පොලීසිය තාරික්ට ගැහුවේ ඇඳිරි නීතිය උල්ලංඝනය කළ දෙන්නෙක් එක්ක




අබ්දුල් හමීඩ් මොහොමඩ් වසීඩ්
(තාරික් අහමඩ්ගේ පියා)

*තාරික් අහමඩ් අඩු මානසික වර්ධනයක් සහිත දරුවෙක්, ඔහුට නිවැරදිව වචන උච්චාරණය කරන්න බැහැ. කතා කරන්නේ සීමිත වචන ප්‍රමාණයක්. ඒ වචනත් ඔහු උච්චාරණය කරන්නේ ගොත ගසමින්. ඔහු නිරතව ඉන්න වැඩකට යම් කෙනෙක් බාධා කරයි නම් ඔහුට කේන්ති යනවා. එවැනි අවස්ථාවන්වලදී ඔහු කලබලකාරී හැසිරීමක් තමයි පෙන්නන්නේ. පසුගිය කොවිඩ් වසංගත ඇඳිරි නීතිය අවධියේ ඔහු බරපතළ හිංසනයකට ලක් වෙනවා. ඒ අලුත්ගම පොලීසියට අනුයුක්තව දර්ගා නගරයේ මුරපොළක රාජකාරී කළ පොලිස් නිළධාරීන් පිරිසක් අතින්. මෙය ලංකාවේ පොලීසිය තවමත් ජනතාවට සමීප නැහැ කියන්න එක් නිදර්ශනයක්.*

## අබ්දුල් හමීඩ් මොහොමඩ් වසීඩ් (තාරික් අහමඩ්ගේ පියා)

'මම ඉන්නේ අලුත්ගම දර්ගා නගරයේ නොම්බර 2/36, සෙන්ට්‍රල් පාර කියන ලිපිනයේ. මේ සිද්ධිය වුණේ මැයි මාසේ 25 හවස 4.30ට විතර. මම බාත්රූම් එකට ගිහිං නාලා එනකොට තාරික් ගෙදර පේන්න හිටියේ නෑ. මම ගෙදරින් එළියට බැහැලා බැලුවා, පේන්න හිටියේ නෑ. ඒපාර මම මහා පාරට ආවා බයික් එක අරගෙන. පාරට එනකොට මෝටර් බයික් එකකින් ආපු කෙනෙක් කීවා, පුතාව ගැටගහලා පොලිස් චෙක් පොයින්ට්එකේ තියාගෙන ඉන්නවා කියලා. ඒ බයික් එකේම මම චෙක් පොයින්ට් එක ළඟට ගියා. යනකොට මෙයාව චෙක් පොයින්ට් එක පිටිපස්සේ තාප්පෙ අයිනෙන් තියාගෙන ඉන්නවා. ගැටගහලා තමයි තියාගෙන හිටියේ. දෙන්නෙක්

දෙපැත්තෙන් අල්ලගෙන ඉන්නවා. මම ඇහුවා ඇයි මේ කියලා. පොලීසියේ මහත්තයෙක් කිව්වා මෙයා හොඳටම බීලා කියලා. මම ළමයාව ලෙහෙලා ගත්තා. කෙළින්ම අලුත්ගම පොලීසියට ගියා. ගිහිං ඇතුළට යනකොටම ඇතුලේ කෙනෙක් කිව්වා මෙයා නේද බීලා චෙක් පොයින්ට් එක ළඟ හිටියේ, මෙයාව දාන්න කූඩුවට කියලා. මම කිව්වා මෙයා කූඩුවට දාන්න එපා, මෙයා අසනීප තත්ත්වයක ඉන්න දරුවෙක් කියලා. ඊට පස්සේ කට උත්තරයක් අරං ගෙදර යන්න කියලා දරුවාව මට භාර දුන්නා'

'ගෙදරට ඇවිත් ඉන්නකොට රෑ 10ට විතර මගේ බොසාගේ පුතා කතා කරලා කිව්වා, පොඩි එක්කෙනා අරං OIC මහත්තයා එන්න කිව්වා කියලා. හරියට රෑ 10ට මම ආයි ගියා. OIC මහත්තයා දරුවා දිහා බලාගෙන ඉඳලා කිව්වා, ඩියුටි ඉන්න අය රෑ 10.30ට එනවා, ආවාම මම අහන්නම් කියලා, මට යන්න කිව්වා. මම ආයි ගෙදර ආවා. ඊට පස්සේ මැයි මාසේ 26 දහවල් මම ගෙදර ඉන්නකොට පොලිස් නිළධාරියෙක් ගෙදරට ආවා. ඇවිත් කිව්වා කළුතර පොලීසියේ ලොකු මහත්තයා එන්න කිව්වා කියලා. ඊට පස්සේ මම බයික් එකක නැඟලා ලොකු මහත්තයා ළඟට ගියා. ගියාම මේ ළමයාගේ පොටෝස් ලොකු මහත්තයා මට පෙන්නුවා. පෙන්නලා ඇහුවා මේ ළමයාද කියලා. මම ඔව් කිව්වා. සර් ඇහුවා මොනාද කෙරෙන්න ඕනෑ කියලා. මම කිව්වා එතන හිටපු නිළධාරීන්ට හොඳ දඬුවමක් දෙන්න කියලා. හරි කියලා තවත් නිළධාරියෙක්ට කතාකරලා කිව්වා, මෙයාගෙන් කටඋත්තරයක් අරගෙන ගෙදර යවන්න කියලා. මම පොඩි කටඋත්තරයක් දීලා ගෙදර ආවා. එදා රෑ තමයි මම මේ ළමයාට ගහනවා වීඩියෝ එක බැලුවේ. ඒක බලාගෙන ඉන්නකොට පේනවා ත්‍රීවීලර්කාරයෙකුත් ඇවිත් මගේ දරුවට ගහනවා. ඊට පස්සේ තවත් ත්‍රීවීලර්කාරයෙක් එතනට එනවා. ඊට පස්සේ ඒ දෙන්නා තමයි මේ ළමයා ගැටගහන්නේ. එතකොට මගේ ළමයා විතරක් නෙවෙයි මේ ත්‍රීවිලර්කාරයෝ දෙන්නත් ඇඳිරි නීතිය කඩකරපු දෙන්නෙක්. මම මේ ළමයාට වුණ අසාධාරණය වෙනුවෙන් යන්න පුලුවන් හැමතැනටම ගියා, පැමිණිලි දැම්මා. අපිට නීති මාර්ගයෙන් සාධාරණයක් වෙන්න තමයි ඕනෑ'.

## *හරක් මස් කන මිනිස්සු*

'මෙහෙම ඉන්නකොට මැයි මාසේ 30, ඒ එස් පී මහත්තයාගේ ඔෆිස් එකේ ඉඳලා පොලිස් නිළධාරියෙක් ආවා. එයා එක්ක මම නාගොඩ ඩී.එම්.ඕ. මහත්තයාගේ ඔෆිස් එකට ගියා. දරුවා පෙන්නන්න. එයා කතා කරපු දේවල් කතා කරන්නත් මම කැමති නෑ. හරක් මස් කන මිනිස්සු කියලා තමයි අපිට කිව්වේ. මේ දරුවා ගිහිං අංගොඩ දාන්න කියලත් කිව්වා. මේ ජාතියේ අය ගේන්න එපා, මොකටද ගෙනාවේ කියලා පොලිස් නිළධාරීන්ගෙන් අහනවා මට ඇහුනා. මම සද්ද නොකර හිටියා. දරුවා හරියට බැලුවෙත් නෑ. ඇයි අපිට මෙහෙම සළකන්නේ, මට හිතාගන්න බැහැ.

මේ දරුවට අවුරුදු 5ක් වෙනකොට තමයි අපි දන්නේ මේ දරුවට අසනීපයක් තියෙනවා කියලා. ඉස්කෝලෙට දාලා මාස පහක් යනකොට ටීචර් කිව්වා ඩොක්ටර් කෙනෙකුට පෙන්නන්න කියලා. පෙන්නුවා. තනියෙම දොඩවනවා. කතාව එන්නේ නෑ ගොත ගැහෙනවා. කෑම ඉල්ලනවා. වාංගෝ පෝංගෝ කියනවා, එච්චරයි.

*මෙවැනි දරුවෙක්ගේ හැසිරීම පොලිස් නිළධාරියෙකුට තේරුම් ගැනීමට අපහසුවීම සිතාගන්නට අපහසු ය. මෙවැනි දරුවෙක් පාපැදියක් පැදගෙන පොලිස් ආරක්ෂක මුර කපොල්ලක් තුළින් ගමන් කිරීමේදී ඇඳිරිනීතිය බලපැවැත්වෙන අවස්ථාවක නවතා ගැනීම අපට තේරුම් ගැනීමට අපහසු නැත. එහෙත් ඉන්පසුව මානුෂිකව කටයුතු කරමින් දරුවා හිංසනයෙන් තොරව දෙමාපියන් වෙත භාරදීම පොලීසියේ රාජකාරිය විය යුතුව තිබුණි. නමුත් කුමක් හෝ හේතුවකට එය එසේ නොවිණි. දරුවා මුස්ලිම් වීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා හෝ දරුවා හිංසනයට ගොදුරු විය. දරුවාගේ අසනීප හැසිරීම මෙම මුරපොළේ සේවය කළ පොලිස් නිළධාරීන් තේරුම් ගෙන තිබුණේ බීමත්කම ලෙසය. මෙම ක්‍රියාව සමස්ථ පොලිස් සේවයම අපකීර්තියට පත් කරයි. එනිසා දැන් පොලිස් ප්‍රධානීන් කළ යුතු වන්නේ මෙලෙස හිංසනයට ලක්වූ දරුවාට සාධාරණය හිමිකර දීමය.*

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/bkej8NXZVUU

https://www.aithiya.lk/justice-for-thariq-ahamed/

# 3. ප්‍රචණ්ඩත්වය තියෙන්නේ, අපි නොහිතන තැනක

## සුජිත් රත්නායක (චිත්‍ර ශිල්පී සහ කලා විචාරක)



සුජිත් රත්නායක

මම හිතන්නේ සමාජ ප්‍රචණ්ඩත්වය මේ කාලේ විශේෂයෙන් ඉස්මතුවෙලා පෙනුනට, අපේ සමාජයේ මේ ප්‍රචණ්ඩත්වය කාලෙක ඉඳලා තියෙනවා. දැන් ඇමරිකාවේ ජෝර්ජ් ෆ්ලොයිඩ් (කළු ජාතික) සිද්ධිය ගන්නකෝ, ඒක හරියට අපිට "සමාජ ප්‍රචණ්ඩත්වය" කියලා පැහැදිලි කරන්න පුලුවන්. වෙනත් රටවලත් එහෙමයි. නමුත් ලංකාවේ ඒක එහෙම නෑ. පැහැදිලි කරන්න බැරි මට්ටමට සමාජ ප්‍රචණ්ඩත්වය අපේ රට තුළ ගොඩනැගිලා තියෙනවා. අපේ වගේ රටවල ප්‍රචණ්ඩත්වය තියෙන්නෙ අර මට්ටමටත් එහාට ගිහිං කියලයි මට නම් හිතෙන්නේ. මම මෙහෙම උදාහරණයකින් ඒක පැහැදිලි කරන්නම්.

මෙන්න මෙහෙම හිතමු. මම වංචාකාරයෙක්. නැත්තන් හොරෙක්. නැත්තන් මගෝඩි වැඩක් කරපු මනුස්සයෙක්. කවුරු හරි මාව එහෙමයි කියලා සාක්ෂි සහිතව අල්ලගන්නවා. අල්ලගෙන කියනවා තමුසේ හොරා කියලා. එතකොට මොකද වෙන්නේ, වෙන රටකනම් සාමන්‍යයෙන් මෙහෙම දෙයක් වුණාට පස්සේ ඒකෙනා හොඳටම මානසිකව වැටෙනවා. නමුත් අපේ රටේ මොකෝ වෙන්නේ, අපේ රටේ ඒ මනුස්සයා තවත් උද්‍යෝගී වෙනවා. ඊට පස්සේ මේ මනුස්සයා තව මෙහෙයුමක් දියත් කරනවා, නෑ මම නෙවෙයි හොරා, මට අර චෝදනාව ගෙනාපු පුද්ගලයා තමයි හොරා කියලා කියන්න. මේ තත්ත්වය මම වෙන රටවල දැකලා නැහැ. මේක ලංකාවට ආවේනිකයි. කොච්චර ආවේනිකද කියලා කියනව නම් ඒ පුද්ගලයා අර චෝදනාව කරන පුද්ගලයා හොරා කියලා පෙන්නනවා. ඒකට බොරු ව්‍යාජ චෝදනා ගොඩක් හදනවා. ඉතිං අපේ මේ ප්‍රචණ්ඩත්වය තියෙන්නේ ක්‍රීඩාවක් විදිහට. ප්‍රංශය, ජර්මනිය, යුරෝපය වගේ කලාපවලත් මේක

තියෙනවා, හැබැයි ඒක මෙහෙම අස්ශීල ක්‍රීඩාවක් නෙවෙයි.

අපි හැමතිස්සේම කිසිම දෙයක් පිළිගන්නෙ නැති ජාතියක්. මහා ලොකු දූෂණ වංචා අක්‍රමිකතා වෙන්න ඕනෑ නැහැ. අපි හිතමු පුංචි වැරැද්දක් අතපසුවීමක්, දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ වුණා කියලා, දියුණු මිනිහගේ විදිහ තමයි “අනේ සොරි” කියලා කියන එක. ඒත් අපි එහෙමද? අපි එහෙම නෑ. අපි මොනවා හරි දෙයකට ස්තූති කරන්නෙවත් නැති ජාතියක්. සිංහල බෞද්ධ ශ්‍රී ලාංකික ජාතිය වැරැද්ද පිළිගන්නේ නෑ, උදව්වකට උපකාරයකට ස්තූතියි කියලා කියන්නේ නෑ, මොකක් හෝ දෙයක් කරන්න හදනකොට ඒ අදාළ පුද්ගලයින්ගෙන් අවසර ගන්නේ නෑ. මෙහෙම හිතන්නකෝ අපි කාගෙහරි ගෙදරකට ඇතුල් වෙනකොට අවසරවත් ගන්නවද? ගන්නේ නෑ!. කිසිම අවසරයක් නැතුව ගෙදර ඉස්සරහා දොරෙන් ඇතුල් වෙලා පිටිපස්ස දොරෙන් පිටවෙනවා. මේ චර්යාවන් කොච්චර කැතද? මට හිතෙන්නේ අපි මේ විදිහටත් මේ නඩත්තු කරන්නේ සමාජ ප්‍රචණ්ඩත්වය.

අපි දැන් කලාව පැත්තෙන් මේ ගැන ටිකක් හිතමු. අපි හිතමු කවුරු හරි කලා ඉතිහාසය ගැන පොතක් ලියනවා, මනුස්සයා හිතාමතාම තමන්ගේ මොකක් හරි පුද්ගලික ලැදියාවක් නිසා තවත් කලාකරුවෙක් ඒකලා ඉතිහාසයෙන් ඉවත් කරලා පොත ලියනවා. තවකෙනෙක්ව ඉතිහාසයෙන් ඉවත්කර දැමීම.., ඒකත් සමාජ ප්‍රචණ්ඩත්වය තමයි. එතනත් සිද්ධවෙන්නේ හිංසනය තමයි. දියුණු සමාජයන් මේ ස්වරූප අඳුරගෙන ඒවා සමාජය මත ක්‍රියාත්මක වීම අවම කිරීමට කටයුතු සංවිධානය කරලා තියෙනවා. ඒ නීති අනපනත් සම්මත කරගැනීම තුළින් වෙන්න පුලුවන්, නැතිනම් සාකච්ඡාව සංවාදය දැනුවත් කිරීම තුළින් වෙන්න පුලුවන්. නමුත් ලංකාව තුළ එහෙම සංවාදයක්වත් නෑ. ඒ නිසා මට හිතෙන්නේ අපි ප්‍රචණ්ඩත්වය තේරුම් ගන්න ඕනෑ චේතනාවේ දුෂ්ඨකම අනුවයි කියලයි මට හිතෙන්නේ. අපි හිතමු කෙනෙක් තමන්ට එන ක්ෂණික කෝපයකට තව පුද්ගලයෙක් පොල්ලකින් ගහලා මරනවා. මට හිතෙන්නේ ඒ ප්‍රචණ්ඩත්වය අර මම මුලින් කියපු විදිහට කලාකාරයෙක් කලා ඉතිහාසයෙන් ඉවත් කරනවා තරම් සහාසික නැහැ. ඒ නිසා මගේ සරළ කියවීම ප්‍රචණ්ඩත්වය තියෙන්නේ, අපි නොහිතන තැනක.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/FVEHc6lSUng

https://www.aithiya.lk/□□□□□□□□□□□-□□□□□□□□-□/

# 4. පත්ලක් නැති අගාධයකට රටේ ආර්ථිකය ගමන් කරමින් තිබෙනවා

## නීතීඥ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ (හිටපු පළාත් සභා මන්ත්‍රී)



නීතීඥ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ

***කොවිඩ් දෙවෙනි රැල්ලක් ඇවිත් තිබෙනවා, රට විශාල ආර්ථික අර්බුදයක ගිලෙමින් තිබෙනවා කියන දේ තමයි ආර්ථික විශේෂඥ මතය***

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දක්ෂ කළමනාකරුවෙක්, හොඳින් රට පාලනය කරන්න පුලුවන්, ආර්ථිකය හොඳින් පාලනය කරන්න පුලුවන්, කියලා තමයි බලයට ආවේ. විශේෂයෙන් එතුමා එක්ක හිටිය උගතුන් වියතුන් ආර්ථික විශේෂඥයන් කිව්වේ, සල්ලි මවලා හරි ආර්ථිකය ගොඩදාන්න පුලුවන් කියලා. නමුත් අපිට පේනවා ආණ්ඩුව ආරම්භයේදීම වැඩේ අනාගත්ත බව. ආණ්ඩුව ආපු ගමන් මොකද කළේ? බදු කපා හැරියා, භාණ්ඩාගාරයට එන විශාල මුදලක් එමගින් ආණ්ඩුවට අහිමි වුණා. මේ හරහා විශාල වශයෙන් රජයේ ආදායම අඩු වුණා. කියන්න කණගාටුයි මේ වෙනකොට පත්ලක් නැති අගාධයකට රටේ ආර්ථිකය ගමන් කරමින් තිබෙනවා.

***මේ තත්ත්වය තුළ ආර්ථිකය ගොඩගන්න වර්තමාන ජනාධිපතිවරයා මොකවත්ම කරලා නැද්ද?***

අද ජනාධිපතිවරයාගේ තනි අභිමතය පරිදි තමයි ආර්ථිකය හසුරවන්නේ. ඒවගේම විශාල වශයෙන් මුදල් අච්චු ගහනවා. මුදල් අච්චු ගැසීම නිසා ඩොලරය ඉහළ යමින් තිබෙනවා. රුපියල බාල්දු වෙමින් තිබෙනවා. මේ හරහා භාණ්ඩ මිල සහ ජීවන වියදම ඉහළ

යමින් තිබෙනවා. ඒ වගේම කොරෝනා නිසා මේ වෙනකොට විශාල වශයෙන් ආනයන තහනම් කරලා තිබෙනවා, අත්‍යාවශ්‍ය බඩු 32ක පමණ බදු වැඩි කරලා තිබෙනවා, මේ සියළු දේවල් හරහා රටේ ජනතාවගේ එදිනෙදා ජන ජීවිතයට විශාල බලපෑමක් එල්ලකරමින් තිබෙනවා. ඒ නිසා කොරෝනා වසංගතය හේතු කරගෙන බොහෝ දෙනෙකුගේ ආදායම් මාර්ග අහිමිවෙලා තිබෙනවා. මේ ආදායම් අහිමිවීම මිනිසුන්ට කොච්චර බලපාලා තියෙනවද කියන දේ අපිට සෑම ක්ෂේත්‍රයකම කඩාගෙන වැටීම තුළින් පේනවා. හෝටල් කර්මාන්තය, සංචාරක කර්මාන්තය, ප්‍රවාහන ක්ෂේත්‍රය, ආපනශාලා කර්මාන්තය, වගේ හැම ක්ෂේත්‍රයක්ම කඩාගෙන වැටීම තුළින් එහි රැකියාව කරන පුද්ගලයින්ගේ ආදායම් මාර්ග අහිමි වෙලා තිබෙනවා. ඒ හරහා ඔවුන්ගේ මිලදී ගැනීමේ ශක්තිය නැතිවෙලා තිබෙනවා. මේ තත්ත්වය අපිට හොඳට බලාගන්න පුලුවන් උකස්බඩු කඩයක් ළඟට ගියා නම්. ජනතාව තමන් ඉතුරු කරගත්ත රත්තරං බඩු උකසට තබමින් තමයි ජීවත් වෙන්නේ. බැංකුවක යම් මුදලක් තැම්පත් කරලා තිබෙනවා නම්, ඒකෙන් තමයි ජීවත් වෙන්නේ. රාජ්‍ය සේවක වැටුප් ගෙවාගන්න බැරිවෙලා තිබෙනවා. අතිකාල දීමනා කපලා දාලා තිබෙනවා. උත්සව දීමනා නතර කරලා තිබෙනවා. කිසිම දැනුන් දීමකින් තොරව යම්යම් හේතු සඳහන් කරමින් වැටුප් කප්පාදු කරමින් ඉන්නවා. මේ නිසා අපිට පේනවා මේ ආර්ථික අර්බුදය සෑම ක්ෂේත්‍රයක් පුරාම මීදුමක්වගේ පැතිරිලා ගිහිං තිබෙනවා කියන දේ.

***මේ ආර්ථික අර්බුදය කොපමණ ප්‍රමාණයකින් ජන ජීවිතයට බලපාලා තිබෙනවාද කියන දේ ගණනය කිරීමේ හැකියාවක් තාම නෑ. ඒකත් විශාල ගැටලුවක්...***

ඔබ ගණනය කරලා නෑ කිව්වට මිනිස්සු අතරට ගියාම අපිට දැනගන්න ලැබෙනවා විශාල පිරිසකගේ රැකියා මේ වෙනකොට නැතිවෙලා බව. පුද්ගලික අංශයේ 30%කට පමණ රැකියා අහිමි වෙයි කියලා පුරෝකථනයක් කරනවා. එසේ රැකියා අහිමි වීම ලක්ෂ 15කගේ පමණ ජීවිතවලට කෙළින්ම බලපාන්න පුලුවන්. ඒ සමගම ඔවුන්ගෙන් යැපෙන්නන් ආදිය ගත්තාම ලක්ෂ 40කගේ ජීවත් වීම පිළිබඳ ප්‍රශ්නයක් බවට මේ ආර්ථික අර්බුදය හේතුවෙලා.

***ඔබ මෙවැනි චෝදනා කළාට ණය පොලී වාරික කපාහැරීම, ණය ගෙවීම මාස තුනකට අත්හිටුවීම වගේ දේවල් ජනාධිපතිවරයා කළා නේද?***

රජය, බැංකුවලින් සහ ලීසින් සමාගම්වලින් ඉල්ලීමක් කළා මාස 6ක සහනයක් දෙන්න කියලා. නමුත් ලීසිං සමාගම් මේක තුට්ටුවකටවත් මායිම් කළේ නෑ. අනික් පැත්තෙන් මයික්‍රෝ ෆිනෑන්ස් ආයතන රජයේ නියෝග පැත්තකට විසි කරලා ණය වාරික ඉල්ලගෙන ගෙවල් ගානේ යන තත්ත්වයක් අද තියෙන්නේ. මේ කොවිඩ් වසංගතය හමුවේ වාරිකය ගෙවාගන්න බැරි ත්‍රීවීලර් රථ රියදුරෙක් වෙනුවෙන් කතාකරන්න ගිහිං එම සංගමයේ සභාපතිවරයාට මැරුණ් කන්න වුණා. මේක තමයි ආණ්ඩුව ජනතාවට දෙනවා කියපු සහනවල තත්ත්වය. අනික් පැත්තෙන් බැංකුවල පොලී අනුපාත අඩු කරනවා කිව්වා. 14% පොලිය 9%ට 7%ට අඩු කරනවා කිව්වා. අපිට පේනවා ඒ නියෝග පිළිගන්න මූල්‍ය සමාගම් සූදානම් නැහැ කියන එක. ජනාධිපතිවරයා මහ බැංකුවේ නිළධාරීන් ගෙන්නල්ලා ඔවුන්ට බැන්න පමණින්, තර්ජනය කරපු පමණින්, මේ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙන්නේ නෑ.

***ඔබ කියනවා ජනාධිපතිවරයාගේ නියෝග පිළිගන්න මූල්‍ය සමාගම් සූදානම් නෑ කියලා. ඒ නිසාද විශාල වශයෙන් හමුදා නිළධාරීන්, වගකිව යුතු ආයතන ප්‍රධානීන් විදිහට පත් කරන්නේ..***

අපි දන්නවා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ජනාධිපතිවරණ මැතිවරණ ව්‍යාපාරයේ විශාල වශයෙන් හමුදා නිළධාරීන් හිටියා. අපිට දැන් පේනවා එම හමුදා නිළධාරීන් රාජ්‍ය අංශයේ තනතුර සඳහා පත්වීම් ලබනවා. ආරක්ෂක ලේකම් ධුරයට විශ්‍රාමික හමුදා ජනරල්වරයෙක් වන කමල් ගුණරත්න පත් කළා. කෙනෙකුට ඒ පත්වීම යුක්තිසහගත කරන්න පුලුවන් රටේ ජාතික ආරක්ෂාව සඳහා මෙහෙම දෙයක් කළා කියලා. ප්‍රශ්නය තියෙන්නේ මේ පත්කිරීම් එතනින් නතර වුණේ නෑ. වරාය හිටපු හමුදාපතිවරයෙක් වන දයා රත්නායක මහතා යටතට පත් කළා. ගුවන් තොටුපළ විශ්‍රාමික හමුදා ජනරල්වරයෙක් වන චන්ද්‍රසිරි යටතට පත් කළා. ඔහු යාපනයේ ආඥාපති විදිහට වගේම ආණ්ඩුකාරවරයා විදිහටත් කටයුතු කළා. බස්නාහිර පළාත් ආණ්ඩුකාර ධුරය හිටපු ගුවන් හමුදාපති රොෂාන්

ගුණතිලක මහතාට දීලා තිබෙනවා. පාරිභෝගික සේවා අධිකාරිය විශ්‍රාමික හමුදා ජනරල්වරයෙක් වන ශාන්ත දිසානායකට ලබා දීලා තිබෙනවා. අද විදේශ කටයුතු අමාත්‍යාංශය සම්පූර්ණයෙන්ම පාලනය කරන්නේ රියල් අද්මිරාල් ජයනාත් කොළඹගේ. නාගරික සංවර්ධන අධිකාරිය තුළ ජනරල් සොයිසා තමයි සියල්ල කරන්නේ. මීට අමතරව පරිපාලන සේවයේ ඉහළ නිළධාරීන්ගෙන් පිරවිය යුතු අමාත්‍යාංශය ලේකම් තනතුරු සඳහා ද හමුදා නිළධාරීන් පත් කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය, මහවැලි හා කෘෂිකර්ම අමාත්‍යාංශය, ඒ වගේම වී අලෙවි මණ්ඩලය, මේ විදිහට සෑම ක්ෂේත්‍රයකටම හමුදාව සිය අඩු විහිදුවමින් තිබෙනවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/RhM1qEK8lsg

http://www.aithiya.lk/%e0%b6%b4%e0%b7%9c%e0%b6%bd%e0%b7%92%e0%b7%83%e0%b7%8a-%e0%b7%84%e0%b7%92%e0%b6%82%e0%b7%83%e0%b6%b1%e0%b6%ba%e0%b6%a7-%e0%b6%b1%e0%b7%92%e0%b6%ba%e0%b7%9d%e0%b6%9c-%e0%b6%b1%e0%b7%92/

# 5. පුරාවිද්‍යා සංරක්ෂණය පිළිබඳව කාර්යසාධක, බලකාය මහා විහිළුවක්

## එරංග ගුණසේකර
## (සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක)

***ජනාධිපතිවරයාගේ කාර්යසාධක බලකායන් පත් කිරීම සමාජවාදී තරුණ සංගමය විග්‍රහ කරගන්නේ කොහොමද ?***


එරංග ගුණසේකර

ලංකාවේ ව්‍යවස්ථාවට අනුව ප්‍රධාන බලකණු තුනක් තිබෙනවා. විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය කියලා. එතකොට මේ ව්‍යවස්ථාව ඇතුලේ විධායකය සතු බලතල පිළිබඳවත්, ව්‍යවස්ථාදායකය සතු බලතල පිළිබඳවත්, අධිකරණය සතු බලතල පිළිබඳවත් පැහැදිලිව සඳහන් වෙනවා. එතකොට දැනට අපිට දැනෙමින් තිබෙනවා ව්‍යවස්ථාව සතු බලතල, ඒ කියන්නේ අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ ඇමති මණ්ඩලය හා පාර්ලිමේන්තුව සතු යම් යම් බලතල, වර්තමානයේ රට ඇතුලේ උද්ගත තත්ත්වයන් පිට දාලා සක්‍රීය හමුදා සේවයේ සිටි නිළධාරීන් වෙත හෝ විශ්‍රාම ගිය හමුදා නිළධාරීන් වෙත පවරා දෙමින් තිබෙනවා කියන එක. ගෝඨාභය රාජපක්ෂ මහතා හිටපු හමුදා නිළධාරියෙක් නිසා හෝ ඔහු වටා වැඩියෙන් හමුදා නිළධාරීන් සිටීම මත හෝ ඔහු හමුදා නිළධාරීන් කෙරෙහි වැඩි විශ්වාසයක් තබනවා වෙන්න පුලුවන්. නමුත් මේ ක්‍රියාවලිය හරහා ව්‍යවස්ථාදායකය සතු යම් යම් බලතල විධායකය සතු කරගැනීමක් තමයි වෙන්නේ. මේක තමයි ගැටලුව.

අනික දැන් බලන්න, නැගෙනහිර පළාත අරඹයා පත් කර තිබෙන කාර්යසාධක බලකාය, ඊළඟට පුරාවිද්‍යා සංරක්ෂණය පිළිබඳව පත්කර තිබෙන කාර්යසාධක බලකාය, ආර්ථිකය පිළිබඳව පත්කර තිබෙන

කම්ටුව, මේ පත් කිරීම් දිහා බලනකොට අපිට ඒවා මහා විහිළු විදිහට තමයි පෙනෙන්නේ. මට හිතෙන්නේ මේ කරන දෙයින් වෙන්නේ, මේ රටේ ජනතාවට හමුදාව ගැන යම් ප්‍රසාදයක් තිබෙනවා නම් ඒකත් නැති කරලා දාන එක. සක්‍රීය හමුදා සේවයේ අවුරුදු ගානක් හිටපු කෙනෙක් රටේ ආර්ථිකය බලගැන්වීම පිළිබඳව උපදෙස් දෙන්නේ කොහොමද? ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ මේ ක්‍රියාවලිය හරහා අපිට එන සාධාරණ සැකය තමයි, ඔහු මේ කරන්නේ රට මිලිටරීකරණය කිරීම ද?.

***ලීසිං ප්‍රශ්නයක් පිළිබඳව කතාකරන්න ගිය ත්‍රීවීලර් රථ සංගමයක ප්‍රබලයෙක්, එම ලීසිං සමාගමේ මැරයින් විසින් ප්‍රහාරයක් එල්ලකරලා මරලා දානවා. පෙරටුගාමීන්ගේ සාමකාමී උද්ඝෝෂණයකට පොලීසිය දැවැන්ත ප්‍රහාරයක් එල්ලකරනවා. මේ සිදුවීම් ඔබ කියවා ගන්නේ කොහොමද?***

ඔබ දන්නවා ගියවර මහින්ද රාජපක්ෂ පාලනය පිළිබඳව නොයෙකුත් විවේචන තිබුණා. පාතාල ක්‍රියාකාරකම්, පැහැරගැනීම්, අනීතික ඝාතනයන් වගේ දේවල් ගැන. නමුත් මේ ආණ්ඩුව පත්වීමේදී ඒ පාර්ශවයෙන් ප්‍රකාශ වුණ කතාව තමයි, ඒ අනීතික ක්‍රියාවන් නැවත සිද්ධවෙන්නේ නෑ, ඒවා නැවැත්වීම සඳහා පැහැදිලි මැදිහත්වීමක් කරනවා කියන දේ. මට හිතෙන්නේ සමාජය ඒ ප්‍රකාශයන් විශ්වාස කළා විතරක් නෙවෙයි, ඒවා බරපතළ විදිහට සැලකිල්ලට ගත්තා කියලා. අනික් පැත්තෙන් පාතාල ක්‍රියාකාරකම් වගේ දෙයක් ගත්තොත් මිනිස්සු හිතුවා ගෝඨාභය රාජපක්ෂ වගේ කෙනෙක් ජනාධිපති වුණොත් මේක දවසින් දෙකෙන් ඉවර කරන්න පුලුවන් කියලා. නමුත් අපි මේ මාස හයක කාලය තුළ දැක්කා පාතාල ක්‍රියාකාරකම් වල, අනීතික ක්‍රියාකාරකම්වල විශාල වර්ධනයක්. මේවා වර්ධනය වෙන්නේ රට තුළ කොවිඩ් වසංගතය උඩුදුවමින් තිබෙන වෙලාවක. ආණ්ඩුව මේ කොවිඩ් තත්ත්වය පාවිච්චි කරමින් සිටිනවා තමන්ගේ දේශපාලනික උවමනාවන් වෙනුවෙන්. අනික් පැත්තෙන් ජනතාවට ලයිට් බිල පිළිබඳව, ලීසිං ප්‍රශ්නය පිළිබඳව, ණය වාරික ගෙවාගන්න ක්‍රමයක් නැතිවීම, ප්‍රශ්න රැසක් උද්ගතවෙලා තිබෙනවා. ආණ්ඩුව කොච්චර කීවත් ණය වාරික පිළිබඳ ප්‍රශ්නයට, රැකියා සුරක්ෂිතාව පිළිබඳ ප්‍රශ්නයට, උත්තර නෑ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**
https://youtu.be/rSunK8-JUW4

http://www.aithiya.lk/%e0%b6%b4%e0%b7%94%e0%b6%bb%e0%b7%8f%e0%b7%80%e0%b7%92%e0%b6%af%e0%b7%8a%e2%80%8d%e0%b6%ba%e0%b7%8f-%e0%b7%83%e0%b6%82%e0%b6%bb%e0%b6%9a%e0%b7-%8a%e0%b7%82%e0%b6%ab%e0%b6%ba-%e0%b6%b4%e0%b7%92/

# 6. අපේ ජනාධිපතිවරයා වැරදි රස්සාව තමයි තෝරගෙන තියෙන්නේ

## ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු



ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

***අපි මේ ඡන්දයට පෙර දැක්කා ජනාධිපතිවරයා ජනාධිපති කාර්ය සාධක බලකායන් වගේ දේවල් පත් කරලා ඒවායේ තනතුරු සඳහා හමුදා නිළධාරීන් පත් කරනවා. ඊට අමතරව යම් යම් අමාත්‍යාංශ සඳහා හමුදා නිළධාරීන් පත් කරනවා. මෙවරත් අමාත්‍යාංශ රැසක ලේකම්වරුන් විදිහට විශ්‍රාමික හමුදා නිළධාරීන් පත්කරලා තිබෙනවා. ඡන්දයට පෙර තිබුණ මේ තත්ත්වය සහ මෙහි තාර්කික අවසානය ඔබ විග්‍රහ කරන්නේ කොහොමද?***

මේක මම දකින විදිහට සම්පූර්ණයෙන්ම වැරදි දෙයක්. හමුදාව ඉන්නේ රට පාලනය කරන්න නෙවෙයි, හමුදාවට අත්දැකීම් තියෙන්නේ ඒකට නෙවෙයි. ඒකට සිවිල් සේවකයෝ, සිවිල් නිළධාරීන් ඉන්නකොට ඇයි අපි මෙහෙම කරන්නේ, ඒක තමයි මෙතන තිබෙන ප්‍රශ්නය. කලින් වතාවේ මේක කළේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියාට පස්සේ, එතකොට මේක ප්‍රශ්න කරන්න බෑ. එතකොට තිබුන තත්ත්වය එක්ක, මේ ජනාධිපති කාර්ය සාධක බලකායන් වගේ දේවල් සමාන්තර ආණ්ඩුවක් වගේ තමයි වැඩ කළේ. මේකෙන් පේන්නේ අපේ ජනාධිපතිතුමාට සිවිල් නිළධාරීන් එක්ක වැඩ කරන්න බැහැ කියන එකද? ඒක එහෙමනම් එතුමා වැරදි රස්සාව තමයි තෝරගෙන තිබෙන්නේ. මේවායින් පේන්නේ අපි කෙළින්ම යන්නේ මිලිටරි ආණ්ඩුවකට කියන එකයි. ඔහු ඔහුගේ අයියා වගේ දේශපාලකයෙක් නෙවෙයි. දේශපාලකයෙක් තීන්දු තීරණ ගන්නේ සංවාදයෙන්, සාකච්ඡාවෙන්, එහෙත් මිලිටරි මොලයක් තියෙන මනුස්සයා කියන දේ

කරන්න දන්නවා, හැබැයි සාකච්ඡා කරලා මොකවත් කරන්න දන්නේ නැහැ. ඒකයි මෙතන තියෙන ගැටලුව. ඉතිං දැන්වත් මේක වෙනස් වෙන්න ඕනෑ.

***ස්වාධීන කොමිෂන් සභා වගේ දේවල් අහෝසි කරනවා, අලුතින් ව්‍යවස්ථාවක් ගෙන එනවා වැනි කතා බොහොමයක් මේ වෙනකොට අපිට ඇසෙමින් තිබෙනවා. කොමිෂන් සභා පත් කිරීම සඳහා විශාල කාර්යභාරයක් කරපු ඔබගේ අදහස මොකද්ද මේ ඇතිවී තිබෙන තත්ත්වය පිළිබඳව***

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට, ඒක ආරක්ෂා කරගන්න නම්, ඒ පිළිබඳව හිතන, ඒක ආරක්ෂා කරගන්න පෝෂණය කරගන්න, වැඩකරන මිනිස්සු ඉන්න ඕනෑ. ඒ ගැන නිතර දෙවේලේ හිතන මිනිස්සු ඉන්න ඕනෑ. අපිට නීති පාස් කරන්න පුලුවන්. හැබැයි ඒවා රට අස්සේ සාර්ථකව ක්‍රියාත්මක කරගන්න නම් ඊට හරියන මිනිසුන් සිටිය යුතුයි. සමහර රටවල හරි ෂෝක් ව්‍යවස්ථාවල් තියෙනවා. හැබැයි ප්‍රධානියා ඒකාධිපතියෙක්, එතකොට වැඩක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය, කොමිෂන් සභා මේවා ආරක්ෂා කරගන්න එක අපේ වගකීම. එතකොට ඒ වගකීම විශ්වාස කරන ජනතාවක් ඉන්න ඕනෑ ඒ සඳහා. අනික් පැත්තෙන් කොමිෂන් සඳහා පත්වෙන පුද්ගලයිනුත් ප්‍රජාතන්ත්‍රවාදය ගැන විශ්වාසයෙන් කටයුතු කළ යුතුයි. ඔවුන් ඒක ආරක්ෂා වෙන විදිහට තමයි තීන්දු තීරණ ගන්න ඕනෑ. ලංකාවේ ඉතිහාසය දිහා බලන්න, අපිට පේනවා ලේ වැක්කෙරෙනවා. අපි දන්නවා හැම අවුරුදු 20කට සැරයක්ම මේක චක්‍රයක් වගේ වෙනවා. අපි මේක නතර කරන්න ඕනෑ. ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරගෙන ඉස්සරහට යන්න ඕනෑ. අපි ඒකාධිපති තත්ත්වයකට ගියොත් මොකද වෙන්නේ? හැමදාම ලේ හැලෙයි. ඒ නිසා ජනතාවගේ අභිලාෂය වෙන්න ඕනෑ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරගැනීම.

***ජනාධිපතිවරයා පසුගිය දවසක ප්‍රකාශ කරලා තිබුණා, යම් ජාත්‍යාන්තර සංවිධානයක් අප රටට බලපෑමක් කරනවා නම්, ඒ සංවිධානයෙන් ඉවත් වෙන්න සූදානම් කියලා. රාජ්‍ය නායකයා මෙහෙම හිතන පසුබිමක, ජිනීවා මානව හිමිකම් කොමිසම වැනි***

***අන්තර්ජාතික ආයතන සමග අපිට ඉදිරි කාලයේ වැඩකරන්න පුලුවන් වෙයිද?***

සාජන් සුනිල් රත්නායක අවුරුදු 5ක ළමයෙක්ගේ බෙල්ල කැපුවා. මේ හමුදා නිළධාරියාට සමාව දෙන්න එපා කියලා හැමෝම හඬ නැගුවා, ඒත් ජනාධිපතිවරයා මොකද කළේ ඔහුට සමාව ලබාදුන්නා. ඔහු එහෙම කොහොමද සමාවක් දෙන්නේ, කොහොමද එහෙම කරන්නේ? හැම උසාවියක්ම කිව්වා රත්නායක ගිල්ටි කියලා. ඔහු වැරදිකරු කියලා තමයි උසාවිය කිව්වේ. එහෙම තත්ත්වයකදී ජනාධිපතිවරයා සමාවක් දෙනවා කියන එකෙන් ඔහු කියන්නේ, අපේ උසාවිය දෙන තීන්දු වැරදියි කියලද? එහෙම වැරදියි නම්, අපි අන්තර්ජාතික විනිසුරුවරුන් ගේමුකෝ. අපි දන්නවා පහුගිය රජය මංගල සමරවීර අමාත්‍යවරයා හරහා සංහිදියාව සහ වගවීමේ ක්‍රියාවලියකට යනවා කියන එකගතාවයකට ජිනීවා මානව හිමිකම් කොමිසම සමග ආවා. ඒ එකඟතාවයේත් මේ අන්තර්ජාතික විනිසුරුවරුන් පිළිබඳව කතාවක් තිබෙනවා. ඒක රට තුළත් විශාල ආන්දෝලනයක් ඇති කළා. ඉතිං මේ සමාව ලබාදීම් ප්‍රකාශ කරන්නේ අපි අන්තර්ජාතික විනිසුරුවරුන් ගෙන එන්න ඕනෑ කියන එක නෙවෙයිද?

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/6_KJ2uygYVM

https://www.aithiya.lk/%e0%b6%b4%e0%b7%8a%e2%80%8d%e0%b6%bb%e0%b6%a2%e0%b7%8f%e0%b6%ad%e0%b6%b1%e0%b7%8a%e0%b6%ad%e0%b7%8a%e2%80%8d%e0%b6%bb%e0%b7%80%e0%b7%8f%e0%b6%af%e0%b7%93-%e0%b7%83%e0%b6%b8%e0%b7%8f%e0%b6%a2%e0%b6%ba/

# 7. මේක මිලිටරීකරණය තමයි

## මාධ්‍යවේදී විමල් කැටිපේආරච්චි


විමල් කැටිපේආරච්චි

***ගෝඨාභය රාජපක්ෂ වර්තමාන ජනාධිපතිවරයා බලයට පැමිණීම සඳහා භාවිතා කරපු ප්‍රධානම සටන් පාඨය වුණේ "ජාතික ආරක්ෂාව අනතුරේ" යන්න. ජනාධිපතිවරයා මෙහෙම කියලා බලයට පැමිණියත්, මේ වෙනකොට ඔහුට පොදු පුරවැසියාගේ ආරක්ෂාව තහවුරු කරන්න බැරිවෙලා තිබෙනවා. ඔබ මෙම තත්ත්වය විග්‍රහ කරන්නේ කොහොමද?***

ඔව්, ජාතික ආරක්ෂාව කියන වචනය ඒ කාලේ සාඩම්බරයෙන් වර නැගුණු වචනයක්. පසුගිය නොවැම්බරයේ ජනාධිපතිවරණයට කළින් අපි දන්නවා අපේ ප්‍රවෘත්ති නාලිකාවල මේ වචනය කියවුණ ආකාරය. මතක් කරලා බලන්නකෝ, ඒක කොච්චර ආඩම්බරයෙන් ද කිව්වේ කියලා. ඒ බැරෑරුම් ස්භාවය නිසාම, ජනතාවත් ඒක බැරෑරුම්ව ගත්තා. ඒකට පසුගිය පාලන කාලයේ ඇතිවුණ සමහර සිදුවීම් බලපෑවා. අපේ ජාතියට එරෙහිව තවත් ජාතියක් අවි අමෝරා ගන්නට යනවා, අපි ඒකට එරෙහිව කටයුතු කරන්නේ කොහොමද? කියන එක වගේ තැනකින් තමයි, ඒ කාලේ ජාතික ආරක්ෂාව කියන දේ ජනතාව තේරුම් ගත්තේ. ඇත්තටම ඒක එහෙමද? ජාතික ආරක්ෂාව කියන්නේ තවත් ජාතියකට, ජනවර්ගයකට එරෙහිව යුද්ධය ප්‍රකාශ කිරීමද? අපි ජාතිය කියලා හඳුනාගන්නේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් මේ හැමෝම එකතුවුණ, ශ්‍රී ලාංකේය ජාතිය. ඒ අදහස උඩ ඉඳලා අපි කියන්නේ ජාතික ආරක්ෂාව කියන දේ, ජාතින් අතර ප්‍රශ්නයක් බවට ලඝු වෙනවට වඩා අපි කැමතියි, ඒක පුරවැසියාගේ ආරක්ෂාව කියන තැනට යනවා නම්.

වර්තමානයේ හිස ඔසවමින් යන පොලිස් ප්‍රචණ්ඩත්වය ගැන කතා කළොත්, මේ ආරක්ෂක අංශ කියලා කියන්නේ තමන්ට ලැබෙන නියෝග මත කියාත්මක වෙන ආයතන පද්ධතියක්. එතකොට ආරක්ෂක අංශ මේ එල්ලකරන ප්‍රහාර ගත්තොත් ඒවා ඔවුන්ගේ අභිලාෂයන් මත සිද්ධවෙන දේවල් නෙවෙයි. ඒවා ඊට ඉහළින් එන යම් යම් අණදීම්, නියෝග මත වෙන දේවල්. ඒවා ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ප්‍රචණ්ඩත්වයේ ප්‍රබලත්වය වගේ දෙයක්, ඒ ආරක්ෂක අංශ සාමාජිකයා මත පදනම් වෙන්න පුලුවන්. නමුත් ඒ හැසිරීමට නියෝගය එන්නේ ඉහළින්. එතකොට මේ උද්ඝෝෂන වලට ප්‍රහාර එල්ල කිරීම් පිළිබඳ වගකීම, මේ නියෝග නිකුත් කරන දේශපාලන බලාධිකාරය ගන්න ඕනෑ. එතකොට අලුත් ජනාධිපතිවරයා යටතේ ප්‍රචණ්ඩත්වය වැඩිවෙනවා නම්, අපේ සමාජය විවෘත වෙන්නේ එවැනි කලාපයකට නම්, අපි පෙරළා ප්‍රශ්න කරන්නේ, එළඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී තවත් බලය ලබා දී මේ ජනාධිපතිවරයා ශක්තිමත් කිරීම හරහා ජනතාව බලාපොරොත්තු වෙන්නේ මොකද්ද කියන එක. ඒ නිසා අපි කියන්නේ මේ නැගඑන ප්‍රචණ්ඩත්වයට, සමාජ අපගමනයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු ජනතා බලවේග එකතුවෙන්න ඕනෑ කියන එක.

***අපි දැක්කා පසුගිය කාලයේ රජයේ ඉහළ තනතුරුවලට හමුදා නිළධාරීන් විශාල වශයෙන් පත් කරනවා. මේ සමග පුරවැසියන් තුළින් යම් සංවාදයක් මතුවුණා, මේ සිද්ධවෙමින් තිබෙන්නේ මිලිටරීකරණයද කියන කාරණය ගැන..***

ඔව්. සමහරු තර්ක කරනවා අපි දැක්කා මේක මිලිටරීකරණය කියලා, සමහරු ලෝකය පුරා තිබුණ හමුදා පාලනයන්, ඒකාධිපති පාලනයන් වගේ දේවල් උදාහරණයට අරගෙන ප්‍රථි-තර්කයන් ඉදිරිපත් කළා, නෑ එහෙම දෙයක් මෙතන නෑ කියලා. මේ සංවාදය මැද්දේ මම කියන්නේ මිලිටරීකරණය කියන දේ ඕනෑ නම් ප්‍රජාතන්ත්‍රවාදය කියන පිටකවරයක් අස්සෙ වුණත් හැදෙන්න වැඩෙන්න පුලුවන්. අපි දන්නවා කැබිනට් මණ්ඩලය කියලා දෙයක් තිබෙනවා, ඔවුන්ට හිමි බලතල තිබෙනවා, එතකොට ඒවා අතික්‍රමණය වෙන විදිහට යම් යම් පත් කිරීම් සිද්ධ වෙනවා, මේ තත්ත්වය දිගටම ගියොත් ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ඇවිත් ඇමති තනතුරු ලබාගත්ත මහජන

නියෝජිතයන්ට කරන්න දෙයක් නැතිවෙයි. එහෙම වුණොත් ඔවුන්ගේ පැවැත්ම නාමමාත්‍රික වෙයි. එවැනි තත්ත්වයක් තුළ ගොඩනැගෙන පාලනය මොන වගේ වෙයිද? ඒකයි අපගේ ප්‍රශ්නය.

***පසුගිය ජනාධිපතිවරණයෙන් පසුව ගෙවුන මේ කාලය තුළ සෑහෙන්න සිදුවීම් සිද්ධවුණා ජනතාව හඬ නැගිය යුතු. එහෙත් මේ තත්ත්වයන් නිවැරදිව විග්‍රහ කරගෙන, එම සිදුවීම්වලට විරුද්ධව හඬ නගන විපක්ෂයක් අපිට තවමත් පෙන්නෙන්නට නැහැ. ජනාධිපතිවරයාගේ පාර්ශවය තුනෙන් දෙකක බලයක් ඉල්ලනවා, මේ ඉල්ලීම පිටුපස තිබෙන අර්ථය තමයි ජනතා අභිලාෂයන් තලාගෙන යන ගල් රෝලක් නිර්මානය කරගැනීම. මෙම අලුත් තත්ත්වයන් තුළ ඔබ නියෝජනය කරන විපක්ෂ දේශපාලනය කෙබඳු ආකාර විය යුතුද?***

මර්ධනය දියත් කරගෙන එනවිට නොවැළැක්විය හැකිලෙස ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සටන ඉදිරියට පැමිණෙන බව අපි අමතක කළ යුතු නැහැ. අපි දැන් මැතිවරණයක මුවවිට ඉන්නේ. එක පැත්තක විධායක ජනාධිපතිවරයෙක් සිටිනවා, විශාල බලයක් එක්ක. අනික් පැත්තෙන් ඔහු නියෝජනය කරන පක්ෂය තුනෙන් දෙකක විශාල බලයක් ඉල්ලනවා. එතකොට මේ ඉල්ලන්නේ වැඩි වැඩියෙන් අධිකාරී බලය. මේ තත්ත්වය තුළ අපිට කියන්න තියෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අරගල කරන පළල්ම සමාජ පෙරමුණ නිර්මාණය වෙන්නට නියමිතයි කියන එක. ඒ ගැන අපි සැකයක් තබාගත යුතු නැහැ. පහුගිය කාලයේ වෙනස් මාර්ගවල ගිය වාමාංශීය කොටස්, ප්‍රගතිශීලි බලවේග එකට එකතුවෙලා වැඩකළ හැකියි කියලා පෙන්වලා තිබෙනවා. ඒක අපිට තිබෙන ලොකුම ශක්තියක්. ඒ වගේම ඒක අපිට තිබෙන හොඳ සංඥාවක්. එනිසා අපි පාලකයින්ට කියන්නේ, ඔබ කූඨ උපක්‍රමවලින් ජනතා බලය අතට අරගෙන අත්තොනෝමතිකව වැඩකරන්න ගියොත්, ප්‍රජාතන්ත්‍රවාදය ඩෝසර් කරන්න උපාය උපක්‍රම තේරුවොත්, ඊට විරුද්ධව මේ පැත්තෙන් පුලුල්ම ජනතා සන්ධානය ගොඩනැගෙයි.

***ඔබ මාධ්‍යවේදියෙක්, මේ වෙනකොට අපිට පේනවා ජනමාධ්‍යවේදීන් ස්වචාරණය කියන ආරක්ෂක කවචය ඇතුලට රිංගමින් ඉන්නවා.***

***අනෙක් පැත්තෙන් මේ ජනාධිපතිවරයා බලයට ගේන්න විශාල වැඩ කොටසක් කළ ජනමාධ්‍යවේදීන් සහ ආයතන තවදුරටත් සත්‍යයෙන් තොර මාධ්‍ය වාර්තාකරණයන් මගින් විශාල බලයක් වර්තමාන පාලන තන්ත්‍රයට ලබාදීම සඳහා කටයුතු කරමින් සිටිනවා. මේ තත්ත්වය තුළ ප්‍රගතිශීලි මාධ්‍ය කඳවුරේ කාර්යභාරය මොකද්ද?***

ජනමාධ්‍ය ගැන මම නිතරම අවධාරණය කරපු දෙයක් තමයි "අපි ජන මාධ්‍ය කම්කරුවෝ" කියන දේ. අපිට විවිධ ජනමාධ්‍ය කම්හල් තිබෙනවා, ඒවා විවිධ දේශපාලන අරමුණු ඔස්සේ තමයි වැඩකරන්නේ, එතකොට එම කම්හල්වල සේවය කරන පිරිස ජනමාධ්‍ය කම්කරුවන් විදිහට තමයි වැඩකරන්නේ. ඒ සේවකයින්ට නැත්තං කම්කරුවන්ට, ඒ ආයතනය තීරණය කරන ඇජෙන්ඩා එකට අනුව තමයි කටයුතු කරන්න වෙන්නේ. මේ සියල්ල මැද අපිට හෘදය සාක්ෂිය කියන දෙයක් තියෙනවා. එතකොට අපිට අර කම්හල් තුළ සිටිමින්ම අභ්‍යන්තර අරගලයක් කරන්න වෙනවා. ඒක මේ කරදරයක් නැතුව නිදහසේ කරන්න පුලුවන් වැඩක් නෙවෙයි. ඒක දුෂ්කරයි. මොකද යම්කිසි විදිහකින් ආයතනයෙන් එළියට විසිකළොත් මොකද වෙන්නේ? අපි ඊට පස්සේ ජීවත්වෙන්නේ කොහොමද? මේ සේරම දේවල් තිබෙනවා. හැබැයි මේ තත්ත්වය තුළ පවා අපිට පුලුවන් යම් සහායක් දෙන්න.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/4palSPokV6o

http://www.aithiya.lk/%e0%b6%b8%e0%b7%9a%e0%b6%9a-%e0%b6%b8%e0%b7%92%e0%b6%bd%e0%b7%92%e0%b6%a7%e0%b6%bb%e0%b7%93%e0%b6%9a%e0%b6%bb%e0%b6%ab%e0%b6%ba-%e0%b6%ad%e0%b6%b8%e0%b6%ba%e0%b7%92-%e0%b7%80%e0%b7%92%e0%b6%b8/

# 8. අද කලාකාරයාට රසිකයා පිළිබඳ විශ්වාසයක් නැහැ

## නිර්මාණවේදී සංජය ඈපා සෙනෙවිරත්න

***පොදු සමාජ දේශපාලනය ගත්තොත් මේ මොහොතේ රට තුළ තිබෙන තත්ත්වය මොන වගේද කියන එක හරි පැහැදිලියි. මේ වෙනකොට ජනාධිපතිවරයාට බහුතර ජනතාව 2/3 ක බලයක් ලබාදීලා තියෙනවා. එම තත්ත්වය මත තමයි ඉදිරි බල දේශපාලනික හැසිරීම තීරණය වෙන්නේ. මේ තත්ත්වය තුළ අපි කතාකරමු යටි තලයේ ක්‍රියාත්මක වෙන සංස්කෘතික දේශපාලනය ගැන.***



සංජය ඈපා සෙනෙවිරත්න

මේ මොහොතේ සංස්කෘතික දේශපාලනය වුණත් තීරණය වෙන්නේ, මේ පාලන රටාව එක්ක. සමස්ථය තීරණය වෙන්නේ එතනින්. අපි කොහොමද මේක තේරුම් ගන්නේ? අපි මේක තේරුන් අරගෙන ඉන්නවද? මට හිතෙන්නේ අපිට විසිරුණු අදහසක් තමයි මේ ගැන තිබෙන්නේ. එහෙම වුනාම ප්‍රශ්නයක් එනවා නේද? එතකොට කලාකරුවන්, විකල්ප මතදාරීන් විදිහට, අපි පුරවැසියන් කැඳවාගෙන යන්නේ කොහේද? ඒ ගමන කොතරම් පරිපූර්ණ වෙන්න පුලුවන්ද, මෙම තත්ත්වය තුළ. මට හිතෙන්නේ අපි අතර මේ පිළිබඳව වූ සන්නිවේදනය සෑහෙන්න දුර්වලයි. මුලින්ම අපි ඒ ප්‍රශ්නය නිවැරදිව හඳුනාගෙන එයට ප්‍රතිචාර දැක්විය යුතුයි. මම හිතන්නේ අපි පොදු අරමුණක් සඳා ගන්න ඕනෑ. අපි කොතනටද යන්නේ, කලාකරුවෝ විදිහට අපි ජනතාව ආමන්ත්‍රණය කරන්නේ කොහොමද කියන එක ගැන.

මට හිතෙන්නේ කොරෝනා කාලේ අපි ගෙදරටම කොටුවෙලා ඉන්න කාලේ, මේ පිළිබඳව යම් සංවාදයක් සමාජ මාධ්‍ය අවකාශයේ ඇති වුණා. ඒක සාධනීය තත්ත්වයක්. වර්තමානයේ මේ ගොඩනැගිලා

තිබෙන සමාජ දේශපාලන අවකාශයේ සංස්කතික දේශපාලනය අතිශය වැදගත්. ක්ෂුද්‍ර තලයේ මිනිසුන්ගේ අදහස් සිතුම් පැතුම් එක්ක ගනුදෙනු කරන්න පුලුවන් එතනින්. අපි සමාජයක් විදිහට වෙනසකට යන්න කල්පනා කරනවා නම්, අපි මේ ගැන සැහෙන්න හිතන්න ඕනෑ. අපිට සමාජයක් විදිහට වරදින්නත් එක හේතුවක් තමයි මේ සංස්කෘතික දේශපාලනය අමතක කිරීම. අපි අද කලාකරුවෝ, විකල්ප මත නිශ්පාදකයෝ, මොකද කරන්නේ? අද කලාකාරයාට රසිකයා පිළිබඳ විශ්වාසයක් නැහැ. රසිකයාටත් කලාකාරයා පිළිබඳව විශ්වාසයක් නැහැ. අද කලාකාරයෝ ගත්තොත් මේ ගොඩනැගෙමින් තිබෙන මාධ්‍ය අවකාශයේ රේටින්ග්ස් හදාගන්න තමයි දඟලන්නේ. කලාව කියන්නේ රේටින්ග්ස් නෙවෙයි. අද යූ ටියුබ් මාධ්‍ය අවකාශයකට ගියොත් පේනවා ගොඩක් දෙනෙක් තමන්ගේ චැනල් එක හිට් කරගන්න කරන දේවල්.

***අපි සංස්කෘතික දේශපාලන කතිකාවෙන් පොඩ්ඩක් පහළට බැහැලා, ටිකක් කතාකරමු මේ සමාජ අවකාශය ප්‍රචණ්ඩකරණය වීම ගැන***

මට හිතෙන්නේ මේක අපේ සංස්කෘතියේම ලක්ෂණයක්. බලන්න අර දර්ගා නගරයේ මානසික අඩු වර්ධනයක් තිබෙන දරුවාට පොලීසිය සලකපු විදිහ. ඔවුන්ට අඳුරගන්න බැරිවෙනවා මේ දරුවා අසනීපයකින් ඉන්න දරුවෙක් ද නැත්තං බීලද කියලා. ඉහළින් ආපු නියෝග යක් නිසා මේ දරුවට ගැහුවා කියලා මෙතනදී අපිට කියන්න බැහැ. ඒ වෙලාවේ එතන රාජකාරි කරපු පොලිස් නිළධාරීන්ගේ පුද්ගලික හැසිරීමේ අවුලක් එතන තිබෙන්නේ, එතකොට ඒක අපේ ඇගෙ 'ම තියෙන අවුලක්. මේ සහාසිකත්වයත් ප්‍රචණ්ඩත්වයත් සංස්කෘතික කාරණයක්. අපි හිතන විදිහේ අවුලක් මෙතන තියෙන්නේ. අනික් පැත්තෙන් එදා පෙරටුගාමීන්ට ගහපු එක ගන්න, ඒක ඉහළින් ආපු නියෝගයක් වෙන්න පුලුවන්. නමුත් ඒක ඔවුන්ගේ රාජකාරිමය හැසිරීම වෙන්න පුලුවන්ද? මම හිතන්නේ අපි, අපි ඇතුලෙන් විශාල ප්‍රචණ්ඩත්වයක් නඩත්තු කරමින් ඉන්නවා. අපි ඒක නැති කරගන්න ක්‍රමයක් මාර්ගයක් සොයා ගන්න ඕනෑ. කලාවට වැඩ තිබෙන්නේ මෙන්න මේ කලාපයේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/iE1hlZISj4Y

https://www.aithiya.lk/%e0%b6%85%e0%b6%af-%e0%b6%9a%e0%b6%bd%e0%b7%8f%e0%b6%9a%e0%b7%8f%e0%b6%bb%e0%b6%ba%e0%b7%8f%e0%b6%a7-%e0%b6%bb%e0%b7%83%e0%b7%92%e0%b6%9a%e0%b-6%ba%e0%b7%8f-%e0%b6%b4%e0%b7%92%e0%b7%85/

# 9. අපි අද බිම් පණුවෝ වගේ

## සිනමාවේදී චින්තන ධර්මදාස



චින්තන ධර්මදාස

*මේ වෙනකොට චින්තගේ දෙවෙනි ෆිල්ම් එක හොඳටම ඇවිලෙනවා, ඇත්තටම ඒකට ඇවිලෙන සුලුයි කියලා නම දාපු එක මරු!. මේ ෆිල්ම් එකේ මංගල දර්ශනයට එන්න කිව්වාම මම චින්තනගෙන් ඇහුවේ මේ කොරෝනා තත්ත්වය එක්ක, පෙන්නන එක අවධානම් සහගතයි නේද කියලා. මොකද ලංකාවේ ෆිල්ම් එකක් කරනවට වඩා ඒක පෙන්නලා, අඩුම ෆිල්ම් එක හදන්න ගිය ගානවත් කවර් කරගන්න එක හරිම අමාරු වැඩක්. කොහොම හරි අන්තිමට කොරෝනා නිසා ඇවිලෙන සුලුයි නිවිලා ගියා. ඔන්න දැන් ආයිත් ඇවිලෙන්න පටන් අරගෙන. ඉතිං මේ ඇවිලීමට පෙට්‍රල් චුට්ටක් විසිකරන්න හිතුවා.*

***චින්තන ඔයාගේ ෆිල්ම් එකට, අද ලංකාවේ සමාජයේ තිබෙන ත්‍රාසය එක්ක හැප්පෙන්න තියා ළඟටවත් යන්න බැහැ කියලා කිව්වොත්..***

මගේ ෆිල්ම් එක, ෆිල්ම් එකක් විදිහට ගත්තාම ත්‍රිලර් සාම්ප්‍රදායට වැටෙන ෆිල්ම් එකක් කියලා කියන්න පුලුවන්. නමුත් ලංකාවේ සමාජයේ එළියේ මිනිස් ජීවිතවල තිබෙන ත්‍රිලර් එක දනවන්න මේ ෆිල්ම් එකට බැහැ කොහෙත්ම. සමාජය ඊට වඩා ත්‍රිලින්. අපි කවුරුත් දන්නේ නැහැ අද නිදහස් චතුරශ්‍රයේ කවුරු හරි එල්ලිලා මැරිලා ඉදියි ද? එහෙම නැත්තං ෆිනෑස් කොම්පැනියක් ඉස්සරහා කවුරු ගහලා මරලා තියෙයිද කියලා. පාරේ මිනිස්සු යනකොට මහ දවල් මිනිස්සුන්ට ගහලා මරලා දානවා. කවුරුත් කිසිම විරෝධයක් දක්වන්නේ නැහැ. එවැනි ත්‍රිලර් සමාජයක මගේ ෆිල්ම් එක දනවන්නේ ඉතාමත් සුළු ත්‍රිල්

එකක්. ඒකට මම එකඟයි. ඇත්තටම එන්ටර්ටේනින් පැත්තේ තියෙන සියලු කලාවන් අද අසමත්. ඒකට හේතුව තමයි එළියේ සමාජය කලාවට වඩා එන්ටර්ටේනින්.

***මේ සමාජයේ හැටියට ෆිල්ම්ස් වුණත් සහාසික වෙන්න ඕනෑ නැද්ද කියලා මට වෙලාවකට හිතෙනවා. අපේ සිනමාව අද පන්සලක බෝමළුවක් වගේ.***

මට හිතෙන්නේ සමාජය සහාසික වෙන්න වෙන්න අපේ ෆිල්ම්ස් වුණත් ඒ පැත්තට ගියා කියලා. එතනදී ෆිල්ම්ස්වල තියෙන රූප රාමු කොතරම් සහාසිකද කියලා කියන්න බැහැ. හැබැයි පණ්ඩුකාභය, දුටුගැමුණු ආරේ රජ ෆිල්ම්ස් ආවානේ, ඒවායේ තිබෙන්නේ අපේ සහාසික ඉතිහාසය තමයි. ඒ කතාව තමයි චිත්‍රපටවල තිබෙන්නේ. කඩු උස්සගෙන ලේ හලාගෙන ජාතිය ගොඩනැඟුවා කියන එක තමයි ඒ ෆිල්ම්ස් වලින් කියන්නේ. ඉතිං ඒකම තමයි අද සමාජයෙත් තිබෙන්නේ. ඒක නිසා අපි අද හිතන්නේ යකඩ පොල්ලක් අරගෙන ඒකෙන් තම්බියෙක්ගේ ඔළුව පලලා ජාතිය ගොඩනගන්න ඕනෑ කියලා. නමුත් ඒ සහාසිකත්වය දෛනික ජීවිතයේ නිරූපනය වෙන්නේ කොහොමද කියන එක ගැන ෆිල්ම්ස් කළේ නැහැ කියන එකයි මගේ අදහස. දැන් මගේ ෆිල්ම් එක ගත්තත් ඒක එදිනෙදා සිදුවෙන සිදුවීමක් විදිහට ගත්තත්, ඒක රූපකාර්ථයක් දනවන ෆිල්ම් එකක් විතරයි. මේ නිසා මට හිතෙන්නේ මේ තියෙන වයලන්ස් එක පෙන්නන්න පුලුවන් මට්ටමකට අපි අපේ සිනමාව වර්ධනය කරගෙන නැහැ.

***අපිට දැන් ඉන්නවා උම්බලකඩ කෑල්ලක්වත් කන්නේ නැති ජනාධිපතිවරයෙක්, සුපිරිසිදු සිංහල ආණ්ඩුවක් බිහිවෙන්න නියමිතයි. මේ කාලාවකාශයේ අනාගත කලාවත් වෙජිටේරියන් කෑම වේලක් වගේ වෙන්න පුලුවන් නේද?***

මම හැම වෙලාවෙම සමාජය දෙස හෝ පුද්ගලයෙක් දෙස හෝ සිදුවීමක් දෙස නිශේධනාත්මකව බලන කෙනෙක් නෙවෙයි. මට හිතෙන්නේ හැම තත්ත්වයක් තුළම අපිට මොකක් හෝ ස්වර්ණමය අවස්ථාවක් තියෙනවා කියලා. මම එහෙම තමයි දේවල් දිහා බලන්නේ. හැමවෙලාවෙම ප්‍රොබ්ලම් එකක් තියෙනකොට ඒ එක්කම

මොකක් හරි ඔපර්චුනර්ටි එකකුත් තිබෙනවා. එතකොට අපි භාරග න්නේ ප්‍රොබ්ලම් එකද ඔපර්චුනර්ටි එකද කියන එක අපේ ප්‍රශ්නයක්. ඉතිං මම මෙතනදී ඒ අවස්ථාව නැතිනම් ඔපර්චුනර්ටි එක භාරග න්න කැමතියි. මම විශ්වාස කරනවා, මිනිස්සු තමන්ට එරෙහිව එන පීඩනය වැඩි වෙනකොට, ඔවුන් ඔවුන්ගේ නිර්මාණ අවකාශයන්, නිර්මාණ භාවිතාවන් පුලුල් කරගන්නවා කියන දේ. ඒකෙන් සල්ලි හොයන්න පුලුවන්ද, ඒක වෘත්තීමය තත්ත්වයකට යනවද, කියන එක වෙන ප්‍රශ්නයක්. අපි හිරවෙන්න හිරවෙන්න තමයි අපි අස්සෙන් හොඳ නිර්මාණ බිහි වෙන්නේ. ඒ නිසා මට හිතෙනවා මේ තත්ත්වය යටතේ ඉතාමත් හොඳ නිර්මාණ ඉදිරියේදී බිහිවෙයි. ඒවා ප්‍රදර්ශනය වෙයිද නැත්තං, යූටියුබ් වගේ වෙනත් විකල්ප අවකාශවල ප්‍රදර්ශනය වෙයිද කියන එක දැන්ම කියන්න බැහැ.

***විපක්ෂ මතවාදය කියන එක හැකිලෙමින් යනවා. අපි හැංගෙන්න කවච නිර්මානය කරගනිමින් ඉන්නවා, මේක අස්සේ මොනවද නොවෙන්න පුලුවන්..***

දැන් අපි මේ දේ තේරුම් ගන්න ඕනෑ. ඒ මොකද්ද දැන් මුලු රටම එකම කොඩියක් යටට ආපු වෙලාවක් මේක. දැන් අපි හැමෝම ඉන්නේ එකම මතවාදයක. දැන් විපක්ෂයත් කියන්නේ අපි සිංහල බෞද්ධ කියලා. ආණ්ඩුවත් කියන්නේ එහෙම. ඕනෑම මනුස්සයෙක් ගත්තොත් එයා බලාගෙන ඉන්නේ රාවනා නැගිටලා ඇවිත් ජාතිය බේරගන්නකම්. එකම මිත්‍යාවක් අදහන, එකම දේශපාලනයක් විශ්වාස කරන, අතීතකාමයකින් ඔදවැඩුන සමාජයක තමයි අපි අද ජීවත් වෙන්නේ, එතකොට වෙන්න පුලුවන් නරකම දේ තමයි, අපිට සිනමාව වගේ නවීන කලාවන් ගැන හිතන්න බැරිවෙන්න පුලුවන්. අපිට නාඩගම්, ටීටර්, රූකඩ වගේ දේවල් තමයි ඉස්සරහට කරන්න වෙන්නේ. මොකද රජ කාලේ වගේ සංස්කෘතික පසුබිමකට, අවකාශයකට ගැළපෙන දේවල් තමයි, කරන්න වෙන්නේ. ඒවට තමයි ඉල්ලුම එන්නේ. චිත්‍රපට ගත්තත්, යූටියුබ් වගේ අලුත් ඩිජිටල් අවකාශයන් වුණත් භාවිතා කරන්න, ඒ පිළිබඳව විවෘත දැක්මක් උවමනාවක් තියෙන මිනිස්සු අවශ්‍යයි. ඒත් බිම් පණුවෝ වගේ අපි අතීතයම හොයාගෙන හාරගෙන යන්න උනාම අපිට මේවගේ නවීන සමාජ අවකාශයන් ඕනෑ නෑ. ඒ වෙනුවට පොඩි කවි කොලයක්

කියවලා, නාඩගමක් නටනවා බලන්න තිබුණාම ඇති. චිත්‍රපටියක් වෙනුවට අපිට පුලුවන් මැතිවරණයක් දිහා බලා ඉන්න. ඒක රියැලිටි ෂෝ එකකට වඩා මහා පරිමාන ආශ්වාදයක්. වෙන්න පුලුවන් නරකම දේ තමයි අපි ඒ පැත්තට ගමන් කිරීම, මොකද අපිට මේ වෙලාවේ විකල්ප මතවාදයක් නෑ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/rctD47lsfi0

https://www.aithiya.lk/%e0%b6%85%e0%b6%b4%e0%b7%92-%e0%b6%85%e0%b6%af-%e0%b6%b6%e0%b7%92%e0%b6%b8%e0%b7%8a-%e0%b6%b4%e0%b6%ab%e0%b7%94%e0%b7%80%e0%b7%9d-%e0%b7%80%e0-%b6%9c%e0%b7%9a-%e0%b6%a0%e0%b7%92/

# 10. බුද්ධිමය දේපල ප්‍රශ්නය විසඳගන්න සාමූහික කළමනාකරණයට යමු

## සංගීතවේදී හර්ෂ බුලත්සිංහල

***නිර්මාණ මංකොල්ලය කියන දේ හර්ෂට තාත්තා නිසා බොහොම සමීපව දැනෙන්න ඇති.***


හර්ෂ බුලත්සිංහල

1987 ඉඳලා තමයි මමත් සංගීත නිර්මාණ කරන්නේ. හැබැයි මම නිර්මාණකරුවෙක් විදිහට මිනිස්සු අඳුරගන්නේ 1996 විතර. ඒ "මගේ මලයි" කියන සින්දුව එක්ක. ඒ අවධිය ගත්තත් මම බුද්ධිමය දේපල සම්බන්ධයෙන් කිසිදෙයක් දන්නේ නැහැ. මගේ තාත්තා වුණත් ඒ කාලේ මේක ගැන මොකවත් දන්නේ නැහැ. ඒ ගැන පළල් සංවාදයක් තිබුණෙත් නැහැ. අපි එක්ක ක්ෂේත්‍රයේ එකට වැඩ කරපු පිරිස් පවා මේ ගැන කතා කළේ නැහැ. ඇත්තටම මේ තත්ත්වය වෙනස් වෙන්නේ 2005 වර්ෂයේ වගේ කාලෙක. 2004 දී මට අවස්තාවක් ලැබෙනවා Audio Engineering ගැන වැඩිදුර ඉගන ගන්න කැනඩාවට යන්න. මගේ අතේ මුදල් වියදම් කරලා, තාත්තා අම්මා ළඟ තිබුණ සල්ලි වියදම් කරලා තමයි ඒ ගමන ගියේ. අවුරුද්දක් පුරා දිවෙන ඒ පාඨමාලාවේ විෂයක් තිබුණා එම් අයි ඕ කියලා. MIO කියන්නේ මියුසික් ඉන්ඩස්ට්‍රි ඕවර්වීව් කියන එක. මේ සබ්ජෙක්ට් එක අස්සෙ රේඩියෝ රොටේෂන් කියලා එකක් තියෙනවා. මේකෙන් කතා කරන්නේ කොහොමද රේඩියෝ චැනල්ස්, ටීවී චැනල්ස්, ඒ රටේ ගීත පාවිච්චි කරන්නේ කියන දේ. මේ සබ්ජෙක්ට් එක කරනකොට තමයි මම බුද්ධිමය දේපලක් තියෙනවා කියන දේ ඉගනගත්තේ. ඒ හරහා තමයි මම ඉගනගත්තේ Collective Management කියන කාරණාව. ඊට පස්සේ Audio Engineering වලට වඩා මට මේ සබ්ජෙක්ට් එක

ඉගනගැනීමේ ආසාව ආවා. ඒ ඔස්සේ තමයි මම මේ ගමන පටන් ගත්තේ.

ඒ වෙනකොට අපේ තාත්තගේ නිර්මාණ වගේම, මේ රටේ නිර්මාණකරුවන් බොහෝ දෙනෙක්ගේ නිර්මාණ අවභාවිතා වෙමින් තමයි තිබුණේ. ඒ නිර්මාණකරුවන්ගේ නිර්මාණ අවුරුදු 20 කට 30 කට වඩා අපයෝජනය වෙලා තිබුණා. මම කැමති නැහැ තාත්තා විතරක් මෙතන තියාගෙන කතා කරන්න. නිර්මාණකරුවන් හැමෝටම වගේ එක හා සමානව මේ අසාධාරණය සිද්ධවුණා. මමයි තාත්තයි එක ළඟ ජීවත් වෙන්නේ. එතකොට මේ චරිතය ජීවත්වෙන්නේ කොහොමද කියන එක මම දිනපතා දකිනවා. ඔහු සෑහෙන්න ගීත ලියලා තියෙනවා. නූතන ගීතයේ රූප රචකයා, ඔය වගේ වචනයෙන් දෙන්න පුලුවන් උපරිම ක්‍රෙඩිට් එක දීලා තියෙනවා. නමුත් ඒ නිර්මාණ වලින් සත පහක්වත් නොලබා ඔහු අසීරුවෙන් කොහොමද ජීවත් වෙන්නේ කියලා මම දැක්කා. කොච්චර නිර්මාණ ඔහුගේ නමින් තිබුණත්, ඔහු ජීවත් වුණේ ටෙලි නාට්‍යයකින් වගේ දේකින් හම්බ කළ සොච්චම් මුදලෙන්. ඔහුගේ සින්දු කොච්චර රේඩියෝ ස්ටේෂන්, ටෙලිවිෂන් පාවිච්චිකරනවද? ඇත්තටම මේ අත්දැකීම නිසා තමයි මම මේක ඉගනගන්නවා කියලා හිතුවේ. මේකෙදී මට උදව් කරපු පළවෙනි කෙනා තමයි අසෝක සේරසිංහ මහත්තයා. එක්තරා මොහොතකදී අපි හමුවුණාට පස්සේ ඔහු තේරුම් ගත්තා මේ පිළිබඳව මා සතුව යම් දැනුමක් තිබෙනවා කියලා. ඒ වෙනකොට ඔහු CVPS කියලා කලෙක්ටිව් සොසයිටි එකක් හදලා තිබුණා. ඒකත් එක්ක කටයුතු කරන්න අරගෙන තමයි මම මේ ගමන ආරම්භ කළේ. අවසානයේ නෛතික තත්ත්වයන් මත රටේ නිර්මානය කරලා තිබුණ සියලුම කලෙක්ටිව් සොසයිටීන් මේ වැඩේට ගැළපෙන්නේ නෑ කියලා වයිපෝ එක නැත්තං වර්ල්ඩ් ඉන්ටර් ලෙක්චුවල් ප්‍රොපටි ඕගනයිශේෂන් එක රිපෝට් එකක් දුන්නා 2004 සහ 2009 අවුරුදුවල. ඊට පස්සේ තමයි අපි අසෝක සේරසිංහ මහත්තයා එහෙම එකතුවෙලා වයිපෝ එක දුන්න රෙකමෙන්ඩේෂන්ස් යටතේ අලුත් ඕගනයිශේෂන් එකක් හැදුවේ. ඒ විදිහට තමයි අපි මේ ඇක්පෝ කියන සංවිධානය හදන්නේ. මේ සංවිධානය හදලත් දැන් අවුරුදු හතරක් වගේ තමයි වෙන්නේ.

***අපි බුද්ධිමය දේපල අයිතිය සුරැකීම ගැන දියුණු රටවල තිබෙන යාන්ත්‍රණය ගැන සහ හර්ෂලා දැන් කරමින් ඉන්න වැඩේ ගැන අපි ටිකක් කතාකරමු.***

1979 ලලිත් ඇතුලත්මුදලි මහත්තයා තමයි මුලින්ම බුද්ධිමය දේපල පිළිබඳ පනතක් ගේන්නේ. මේ පනත හඳුන්වා දුන්නට පස්සේ තමයි ලංකාවේ පළවෙනි සාමූහික කළමනාකරණ සංවිධානය බිහිවෙන්නේ. ඒ සංවිධානය තමයි SLPRS කියලා කියන්නේ. ඊට පස්සේ 1981 ඉඳලා 2002 වෙනකම් කිසිම දෙයක් වෙන්නේ නැහැ. අවුරුදු 21 කිසිම දෙයක් වෙන්නේ නෑ. 2002දී සුබසාධන සංගමයක් තමයි හදන්නේ. ජාතික බුද්ධිමය දේපල ඔෆිස් එකේ රෙජිස්ටර් කරනවා ඒක. ඒකෙන් තිබුණ ප්‍රශ්නය තවත් ව්‍යාකූල වෙනවා. ඊට පස්සේ 2003 ආයිත් බුද්ධිමය දේපල පනතක් ගේනවා. මේ පනත ඇවිත් අවුරුද්දක් යනකොට වයිපෝ එක ලංකාවට එනවා, ඔවුන් ඇවිත් සමීක්ෂණයක් කරනවා ලංකාවේ. ඒ සමීක්ෂණයෙන් පස්සේ කියනවා ඔස්කා සංවිධානය ඇතුලු මේ සංවිධාන දෙකම මේ වැඩේට ගැළපෙන්නේ නැහැ කියලා. 2009 ආයෙමත් සමීක්ෂණයක් කරන වයිපෝ සංවිධානය කියනවා ඒ වෙනකොට තිබෙන සාමූහික කළමනාකරණ සංවිධාන එකක්වත් මේ වැඩේට ගැළපෙන්නේ නැහැ කියලා. ඒ තත්ත්වය එක්ක තමයි 2013 ඇක්පෝ සංවිධානය බිහිවෙන්නේ. ලෝක බුද්ධිමය දේපල සංවිධානය, ප්‍රංශයේ සීසැක් කියන සංවිධානය අපිව පිළිගෙන තිබෙනවා. YouTube කියන්නේ අද හැමෝම පාවිච්චිකරන ඩිජිටල් ෆ්ලැට්ෆෝම් එකක්, ඔවුනුත් අපි එක්ක එකතුවෙලා වැඩකරන්න කැමතියි. ඔවුන් අපේ සංවිධානය පිළිගන්නවා. අපි අවුරුදු දෙකක වගේ කාලයක් ඇතුලේ විශාල ගමනක් ගිහිං තිබෙනවා. ගීත රචකයින්, ගායකයින්, සංගීතඥයින් කියන ත්‍රිත්වය ඇක්පෝ එකත් එක්ක එකතුවීම තමයි අපේ මේ ක්‍රියාදාමයේ ජයග්‍රහණය. ඔවුන්ට තමන්ගේ මේ බුද්ධිමය දේපල අයිතිය ලබාගන්නනම් අපි සමග එකතු වෙන්න ඕනෑ.

***අපි මේ සාමූහික කළමනාකරණය කියන කාරණය ටිකක් පැහැදිලි කරගමු***

ඇයි සාමූහික කළමනාකරණ ආයතනයක් නිර්මාණකරුවෙකුට අවශ්‍ය? මෙහෙම හිතමු, මම ගීතයක් නිර්මාණය කරනවා, එතකොට

මට පුලුවන්ද මේ ගීතයට අදාළ කොපි රයිට්ස් එකතුකරගන්න දවස තිස්සේ මේ නාලිකා සියල්ල අහන්න? බැහැ. එතකොට මම වෙනුවෙන් ඒ වැඩේ කරන්නේ මේ සාමූහික කළමනාකරණය පිළිබඳ ආයතනය. එතකොට නිර්මාණකරුවාට පුලුවන් ගෙදර ඉඳලා නිර්මාණ කරන්න. එයාට කොපි රයිට්ස් ගැන හිතන්න දෙයක් නැහැ. ඔහු ඇක්පෝ ආයතනය එක්ක සම්බන්ධ නම් අපි ලෝකෙටම අපේ ඇහැ දාගෙන ඉඳලා ඒ නිර්මාණකරුවාගේ නිර්මාණ අයිතිය එකතුකරලා දෙනවා. අපි දන්නවා බැංකුවල, ෂොපින් මෝල්ස්වල, මේ හැම්තැනකම ගීත විකාශය වෙනවා, එතකොට මේ හැමතැනක්ම අපි නිරීක්ෂණය කරනවා. ඊට පස්සේ ඒ අදාළ කොපි රයිට්ස් එකතු කරනවා. පිටරට ප්‍රසංගයක අපේ සිංදුවක් ගියත්, අපිට ඒ රටවල්වල තිබෙන මේ සාමූහික කළමනාකරණ ආයතන සමග එකතුවෙලා කොපි රයිට්ස් හුවමාරු කරගන්න පුලුවන්. ඒ රටේ ගීතයක් මෙහේ විකාශය වෙනකොට ඒක අපිට එකතුකරලා ඔවුන්ට දෙන්න පුලුවන්. අපේ ගීතයක් ඔවුන්ගේ රටේ යනව නම් ඒක ඔවුන් අපිට එකතුකරලා දෙන්නවා. සරළව ගත්තොත් මේ සාමූහික කළමනාකරණය පිළිබඳ ආයතනය වැඩකරන්නේ එහෙමයි. මේක අපිට ලංකාවේ නිවැරදිව හරියට ක්‍රියාත්මක කරගන්න පුලුවන් වුණොත් අපේ නිර්මාණකරුවන්ගේ නිර්මාණ අයිතිය සුරැකෙයි. ඔවුන්ට තමන්ගේ නිර්මාණය කොහේ විකාශය වුණත් ඒකට මුදලක් ලැබෙයි. ඒ නිසා තමයි අපි නිර්මාණකරුවන්ට කියන්නේ, අපි එක්ක එකතුවෙන්න කියලා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/d9xFvRPnotU

https://www.aithiya.lk/%e0%b6%b6%e0%b7%94%e0%b6%af%e0%b7%8a%e0%b6%b0%e0%b7%92%e0%b6%b8%e0%b6%ba-%e0%b6%af%e0%b7%9a%e0%b6%b4%e0%b6%bd-%e0%b6%b4%e0%b7%8a%e2%80%8d%e0%b6%bb%e0%b7%81%e0%b7%8a%e0%b6%b1%e0%b6%ba-%e0%b7%80/

# 11. පරිසරය ගැන නොතකා පටන්ගත්ත ව්‍යාපෘති රටට බරක් වෙලා

## පරිසරවේදී සජීව චාමිකර



සජීව චාමිකර

***අද වනවිට ලංකාවේ වනාන්තර පරිසර පද්ධතියට ඇතිවෙලා තියෙන අභියෝගය මොන ආකාරයක එකක්ද?***

ලංකාවේ අද වනවිට ඉතුරු වෙලා තියෙන ස්වභාවික වනාන්තර ආවරණය 17%ක් දක්වා ඉතාම පහළ මට්ටමකට පරිවර්තනය වෙලා තියෙන්නේ. පසුගිය කාල වකවානුව පුරාම මහා පරිමානයෙන් වනාන්තර පරිසර පද්ධති එළිපෙහෙළි කරමින් අක්‍රමවත් සංවර්ධන ව්‍යාපෘති තමයි ආරම්භ වුණේ. ඒ වගේම වාණිජ වගාවන් සඳහා වනාන්තර හෙළිපෙහෙළි කිරීම නිසා අද වන විට ස්වභාවික වනාන්තර අනාවරණය ශීඝ්‍රයෙන් පහළ බැසීමට ලක් වෙලා තියෙනවා. මේ ඉතුරු වනාන්තර ටික තමයි අද වනවිට තවදුරටත් විවිධ ආයෝජන ක්‍රියාවලින්ට නතුකරන්න උත්සාහ ගනිමින් තියෙන්නේ. ඒ සඳහා පාරිසරික අණ පනත් සංශෝධනය කරනවා. ඒ විතරක් නෙමෙයි ඉඩම් පනත් සංශෝධනය කරන්න සූදානම් වෙනවා. ඊට අමතරව මේ ඉඩම් භාවිතා කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරන්න නැත්තම් බහුජාතික සමාගම් හෝ වෙනත් මහා පරිමාණ සමාගම්වලට එම ඉඩම් පවරන්න, ඒ සඳහා ශක්තිමත්ව ක්‍රියාත්මක වීමට අවශ්‍ය නීතිමය රාමුව සීග්‍රයෙන් සකස් කරගනිමින් පවතිනවා. ඒ හේතුවෙන් අද වන විට ලංකාවේ වනාන්තර පරිසර පද්ධති දැඩි අභියෝගයකට ලක් වෙලා තියෙනවා.

***මීළඟට අපි අවධානය යොමු කළොත් රජය මේ සම්බන්ධයෙන් අණ පනත් කෙටුම්පත් සකස් කරමින් ඉන්නවා කියන කාරණය පිළිබඳව..***

වනාන්තර මේ ආකාරයට විවිධ ආයෝජන ක්‍රියාවලීන්ට නතු කරන්න අද වනවිට රජය පැත්තෙන් ක්‍රියාත්මකවන ප්‍රතිපත්තිමය යාන්ත්‍රණයන් කිහිපයක් තියෙනවා. එකක් තමයි "ඉඩම් බැංකු පනත". නව පනතක් ගෙනල්ල ඉඩම් බැංකුවක් මගින් ඉඩම් කොමිෂන් සභාවට අයිති සියලුම වනාන්තර ඇතුළු අනෙකුත් භූමි ප්‍රදේශ සියල්ල ආයෝජන ක්‍රියාවලීන්ට නතුකරන්න උත්සාහ දරමින් ඉන්නවා. මොකද අපි දන්නවා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති විශාල වනාන්තර ඉඩම් ප්‍රමාණයක් තියනවා. ඉතින් මේ ප්‍රමාණය පහසුවෙන් අත්පත් කර ගැනීමට පහුගිය කාලේ පුරාම පිඹුරුපත් සැකසුවා. මීට අමතරව අද වනවිට ක්‍රියාත්මක තවත් සැලසුමක් තියෙනවා, ඒ තමයි 2001 අවුරුද්දේ දී ප්‍රාදේශීය ලේකම් සහ දිස්ත්‍රික් ලේකම් සතුව තිබූ රජයට අයිති සියලුම වනාන්තර ඉඩම් වන සංරක්ෂණ ආඥාපනතේ 20 වගන්තිය යටතට පත් කරපු 5/2001 කියන චක්‍රලේඛය සංශෝධනය කරලා එක දැන් ආපස්සට හරවලා තිබෙනවා. දැන් අපිට පේනවා ප්‍රාදේශීය ලේකම්වරු කටයුතු කරන්නේ කොහොමද කියන දේ. මේ ඉඩම් කියන්නේ එක් පැත්තකින් රක්ෂිත වනාන්තර, නැත්තං වනාන්තර අතර සම්බන්ධතාවයක් ඇති කරන වනාන්තර, ඒ වගේම අලිමංකඩවල්, ඒ වගේම ජල පෝෂක ප්‍රදේශ, වැව් සහ ජලාශවල දිය පහරවල්, වෙරළබඩ පිහිටා තියෙන කඩොලාන පරිසර පද්ධති, මේ සියලුම දේවල් ආවරණය වන විදියට තමයි 5/2001 චක්‍රලේඛය ක්‍රියාත්මක වුණේ. දැන් මේ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉවත් කරලා වැරදි ආයෝජන ක්‍රියාවලීන්වලට වැරදි සංවර්ධනය ක්‍රියාවලීන්වලට යොමු කිරීම සඳහා සැලසුම් සකස් වෙමින් තිබෙනවා.

***සංවර්ධනය පවත්වාගනිමින් ගෝලීය උණුසුම අඩු කරගන්න කටයුතු කරන්නේ කොහොමද?***

තිරසර සංවර්ධනය කියන සංකල්පය 1992 දී විතර ලෝකය පුරාම කතිකාවතකට ලක් වෙච්ච දෙයක්. මේ සංකල්පය මතුවෙන්න ප්‍රධාන වශයෙන්ම බලපෑවේ සංවර්ධනය සහ ස්වභාවික සම්පත් සංරක්ෂණය කියන දෙක. මේවා එකිනෙකට වියුක්ත වෙච්ච සාධක විදියට තමයි

පහුගිය ඉතිහාසය පුරාම ක්‍රියාත්මක වුණේ. එතකොට මේ සාධක දෙක එකිනෙකට අතිපිහිත කිරීමේ ක්‍රියාවලිය තමයි තිරසර සංවර්ධනය එහෙම නැත්නම් යථාර්ථවාදී සංවර්ධනය හරහා ක්‍රියාත්මක කරන්න උත්සාහ දරන්නේ. මොකද පහුගිය ඉතිහාසයේ පුරා ලෝකයේ බොහෝ දියුණුව අත්පත් කරගත් රටවල අපිට දකින්න ලැබුණේ හුදු භෞතික සංවර්ධනයක්, එහෙම නැත්නම් වැරදි සංවර්ධනයක් අත්පත් කරගන්න ගිහිල්ලා පරිසරය දැවැන්ත බිඳවැටීමකට ලක් වීම තමයි දකින්න ලැබුණේ. ඉතින් නැවත එවැනි තත්ත්වයක් ඇති නොවෙන්න අවශ්‍ය කරන පසුබිම ගොඩනගන්න තමයි මේ තිරසර සංවර්ධනය එහෙම නැත්තං යථාර්ථවාදී සංවර්ධනය කියන න්‍යාය ලෝකය තුළ සාකච්ඡාවට ලක් කළේ.

අද වෙනවිට අපිත් ක්‍රියාත්මක වෙන්නේ මේවා වියුක්ත සාධක විදියට සලකා. ඒකට හේතුව තමයි අපි සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කරන්නේ එක්කෝ ආණ්ඩු බලය හොබවන කණ්ඩායම්වල අභිමතය පරිදි, එහෙම නැත්නම් ජනාධිපතිවරයෙක් හෝ යම්කිසි පුද්ගල කණ්ඩායමකට අවශ්‍ය පරිදි. නමුත් රටක සංවර්ධන සැලසුම් සකස් වෙන්න ඕනෑ රටේ ආර්ථික සංවර්ධන උපාය මාර්ගය මත. ඒ ආර්ථික සංවර්ධන උපාය මාර්ග මත ස්වභාවික සම්පත්, මානව සම්පත් කළමනාකරණයට ලක්වෙන්න ඕනෑ. මේ ක්‍රියාවලිය මත තමයි ඒ සඳහා අවශ්‍ය කරන භෞතික ගොඩනැගීම සිද්ධ වෙන්න ඕනෑ. ඒ මත තමයි යථාර්ථවාදී සංවර්ධනයක් අත්පත් කර ගැනීමේ හැකියාව ලැබෙන්නේ. එහෙම නැත්නම් හැම වෙලාවෙම අපි අපිට අවශ්‍ය පරිදි අපිට දැනෙන පරිදි සංවර්ධනය ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා, එහෙම නැත්තං ණය ආධාර ලබා ගැනීමේ අභිමතාර්ථ මත පමණක් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න ගියාම හැම වෙලාවෙම වෙන්නේ පරිසරයේ බිඳවැටීමක්.

මේකට උමා ඔය හොඳ උදාහරණයක්, මොකද උමාඔය අද වනවිට පවුල් ගණනාවක් අවතැන් කරලා තියෙනවා. රටට බරක් වෙලා තියෙනවා. මාගම්පුර වරාය මොන තරම් බරක් ද කියලා කියනවා නම්, අපිට එය චීන සමාගමකට අනූනම අවුරුදු බදු දෙන්න සිද්ධවෙලා තියෙනවා. ඊළඟට මත්තල ගුවන්තොටුපළ අද වන විට ඉන්දියානු සමාගමකට බදු දෙන්න වෙලා තියෙනවා. ඊට අමතරව පෝට් සිටි

ව්‍යාපෘතිය හරහා ගොඩනගපු දේවල් ස්ථාවරව තබා ගන්න අපිට අධ්‍යාපනයට හා සෞඛ්‍යයට වෙන් කරන්න තියෙන මුදල් 2017 දී රුපියල් මිලියන එක්දහස් හත්සිය හතළිහක් වැය කරන්න සිදුවුණා. ඊට අමතරව මේ අවුරුද්දේ මුල් කාලයේදී රුපියල් මිලියන අටසිය අසූ නමයක් වැය කරා වෙරළ කලාපය ස්ථාවරව තියාගන්න. මේ පෝට් සිටි ව්‍යාපෘතිය නිසා සිදුවෙලා තියෙන දැවැන්ත වෙරළ ඛාදනය වළක්වන්න. එතකොට මේ වගේ ක්‍රියාවලීන්ගෙන් තොරව යථාර්ථවාදී සංවර්ධන මාවතකට පිවිසීම තමයි අවශ්‍ය වෙන්නේ. එතනදී සංවර්ධනය සහ සංරක්ෂණය කියන දෙක එකිනෙකට අතිපිහිත වෙච්ච ක්‍රියාවලියක් අවශ්‍යයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/vuTzaGFkV1o

https://www.aithiya.lk/environmentalist-sajeewa-chamikara-environmental-destruction-in-sri-lanka/

# 12. පාර්ලිමේන්තුව, විහිළුවට හාස්‍යයට ලක්කරගත යුතු තැනක් නෙමෙයි

## පර්යේෂිකා සදීශා ධර්මප්‍රේම

***පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් දිගු කාලයක් අධ්‍යයනය කරමින් ඉන්න පර්යේෂිකාවක් ලෙස පාර්ලිමේන්තුවේ නියෝජිතයන් කටයුතු කරන්නෙ කොහොමද කියන එක ගැන පළමුවෙන් දැනගන්න කැමතියි.***



සදීශා ධර්මප්‍රේම

පාර්ලිමේන්තුව කියන්නේ රටේ තියෙන උත්තරීතරම ආයතනය. මොකද අපි හැමදෙනාටම බැහැනේ පාර්ලිමේන්තුවට ගිහිල්ලා අපි වෙනුවෙන් කතා කරන්න. ඒ නිසා තමයි අපි තව කෙනෙකුට ඡන්දෙ දීලා ඔහු අපේ නියෝජිතයා ලෙස යවන්නෙ. එහිදී ඔහු අපිව නියෝජනය කළ යුතුයි. හැබැයි ප්‍රශ්නේ තියෙන්නේ අපි යවපු සමහර නියෝජිතයින් අඩුම තරමින් පාර්ලිමේන්තුවේ කතා කරලවත් නැහැ. පහුගිය කාල වකවානුව දිහා බලනකොට අඩු තරමේ පාර්ලිමේන්තුවට පැමිණ නැති අයත් ඉන්නවා. අපි දන්නවා මාස තුනක් එක දිගට පාර්ලිමේන්තුවට ආවෙ නැති වුණොත් ඔහුගේ මන්ත්‍රීධුරය අහෝසි වෙනවා. ඉතින් ඒ හේතුව මත මාස තුන සම්පූර්ණ කරගන්න විතරක් පාර්ලිමේන්තුවට පැමිණෙන සමහර මන්ත්‍රීවරු අපි දකිනවා. ඒක ඇත්තටම ප්‍රශ්නයක්. මොකද හැමදාම පාර්ලිමේන්තුව පැවැත්වෙන්නේ නැහැනේ. මාසෙකට දවස් අටක් විතර බොහෝ වෙලාවට පාර්ලිමේන්තුව තියෙන්නෙ, අයවැය විවාද කාලයේ හැර. ඉතින් එහෙම බලනකොට පාර්ලිමේන්තු පැමිණීම ඉතාම වැදගත් වෙනවා. මන්ත්‍රීවරයාට පාර්ලිමේන්තුවට යනවට වඩා ගමේ වැඩ තියෙන්න පුලුවන්, පාරක් හදන්න, මළ ගෙවල්වල යන්න, මේ වගේ දේවල්

තියෙන්න පුලුවන්. ඒත් අපි මෙතනදි තේරුම් ගන්න ඕන දේ තමයි අපි පාර්ලිමේන්තුවට යම්කිසි නියෝජිතයෙක් යවන්නේ රටේ නීති සම්පාදනය කරන්න කියන එක.

***කාන්තා නියෝජනය ගැන පසුගිය කාලේ සෑහෙන්න කතා කළා. දැන් තරුණ නියෝජනය ගැන කතා කරනවා. හැබැයි මේ දෙකේම අපිට පේන්නේ රටේ දේශපාලනයේ සෑහෙන කාලයක ඉඳන් ඉන්න පවුල්වල පිරිස් විතරයි එන්නෙ. එහෙම නැතුව එළියේ සක්‍රීයව දේශපාලනය කරන පිරිස්වලට පවා නාම යෝජනා ගැනීමේදී ලොකු ප්‍රශ්නයක් තියෙනවා, මේ පවුල් ආධිපත්‍යය නිසා..***

ඇත්තටම ලංකාවේ මේ වෙනකොට අපි දකිනවා පවුල් සබඳතා තුළින් දේශපාලනයට පිවිසෙනවා. ඒ වගේම තමයි පාර්ලිමේන්තුවටත් එනවා. එතකොට අපි සමාජ මාධ්‍ය සහ අනෙකුත් මාධ්‍ය දිහා බලනකොට අපිට පැහැදිලිව පේනවා කොයි විදිහටද මේ පවුල් සම්බන්ධතා තියෙන අය මෙවරත් මැතිවරණට ඉදිරිපත් වුණේ කියලා. බැලුවොත් පහුගිය අටවැනි පාර්ලිමේන්තුව දිහා, පවුල් සම්බන්ධතා තියෙන හැත්තෑ එක් දෙනෙක් (71) සිටියා. ඒක අපි තවදුරටත් හොයලා බැලුවොත්, එක විවාහක යුවළක් හිටියා. සහෝදර යුගල හතරක් හිටියා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දරුවන් හෝ ළඟම ඥාතීන් තිස් දෙදෙනෙක් (32) හිටියා. ඒ වගේම තමයි දහදෙනෙක් (10) ඉන්නවා තුන්වැනි පරම්පරාවේ මන්ත්‍රීවරු. ඔය විදිහට අපිට කීපදෙනෙක් අඳුනග න්න පුළුවන්. ඇත්තටම කියනවා නම් මේ අපිට සොයාගත හැකි වූ දත්ත පමණයි. සමහර විට මේ සම්බන්ධතා ඊට වඩා වැඩි වෙන්නත් පුළුවන් අනිවාර්යෙන්ම. වර්තමාන පාර්ලිමේන්තුවේ තත්ත්වයත් අපිට මෙහෙම සොයා බලන්න පුලුවන්.

විශේෂයෙන් කාන්තා නියෝජනය ගොඩක් වෙලාවට දේශපාලන පසුබිම මත ආපු බවක් අපට හඳුනා ගන්න පුළුවන්. ඒත් එක්කම තවත් කෙනෙක්ට ප්‍රශ්න කරන්න පුළුවන් මේ දේශපාලන පසුබිමකින් ආවොත් විතරද වැඩ හොඳට කරන්නේ, දේශපාලන පසුබිමක් නැති කෙනෙකුට තමන්ගේ කාර්යය හොඳින් කරන්න බැරිද කියලා. ඇත්තටම ඒක කතා කරන්න කලින් පුළුවන් නම් අපේ වෙබ් අඩවියට (manthri.lk) ගිහින් බැලුවොත් ඔවුන්ට දේශපාලනය හොඳට කරන්න

පුළුවන්ද බැරිද කියන එක අපිට බලාගන්න පුළුවන්. මෙතැනදී මම කෙටි පැහැදිලි කිරීමක් කරන්නම්. මේක මගේ පෞද්ගලික අදහස. මෙතැනදී පාර්ලිමේන්තුව නියෝජනය කරනවා කියන එකයි දේශපාලනය කරනවා කියන එකයි මිනිස්සු පටලවගෙන තියෙනවා කියලා මට හිතෙනවා. අපි හැමවෙලේම උත්සාහ කරන්නේ ගෙදරට, ගමට එහෙම නැත්නම් අපේ කාට හරි රස්සාවක් දුන්නහම, නැත්තං අපේ ගමේ පාරක් හැදුවහම අන්න එයා තමයි හොඳම දේශපාලනඥයා. එයා තමයි අපි පාර්ලිමේන්තුවට යවන්න ඕනෑ කියලා. හැබැයි අපි හිතන්නෙ නැහැ ඒ දේවල් කරන්න තව පිරිස් ඉන්නවා ඒක ඔවුන්ගේ රාජකාරිය නෙවෙයි කියලා. ඇත්තටම පාර්ලිමේන්තුවට නියෝජිතයෙක් යවන්න ඕනේ රටේ සමස්ත ප්‍රතිපත්ති, නීතිය පිළිබඳ තීන්දු තීරණ ගන්න මිසක් අපේ පෞද්ගලික ඕනෑ - එපාකම් ඉෂ්ට කරන්න ද කියන එක ගැන අපි විශේෂයෙන් හිතන්න ඕනෑ.

***නීති සම්පාදනය කියන කාරණය ගත්තහම අපි දන්නවා පවුලේ සාමාජිකයෝ තමයි කාරක සභාවල ප්‍රධාන තනතුරුවලට පත් කරන්නේ. කාරක සභාවල සමහරවිට සාමාජිකයෝ කිහිපයක් ඉන්නත් පුළුවන් එක පවුලේ. එහෙම ගත්තහම විශාල බලපෑමක් සිද්ධ වෙනවා නීති සම්පාදනයට මේ පවුල් තුළින්. ඒක කොහොමද පර්යේෂිකාවක් විදිහට ඔබ දකින්නේ ?***

මේ විදිහේ පවුල් සබඳතා තියෙන අය පාර්ලිමේන්තුවට යැව්වා නම් අපි මේ දෙය අපේක්ෂා කරන්න වෙනවා. අනිත් එක අපි හරියටම දන්නේ නැහැ මේ අය පක්ෂපාතී විදියට හැසිරෙනවද නැද්ද කියලා. අපිට ඒක බොහොම සරල විදිහට කියන්න බැහැ. එළිපිට දකින්නත් නැහැ. මොකද ඒවා මිනිස් සබඳතා. මිනිස් සබඳතා අපට ගණනය කරන්න බැහැ. හැබැයි අපිට පුළුවන් වෙන්න ඕනෑ මහජනතාව නැත්තං ඡන්දදායකයන් විදිහට මේ දේවල් තේරුම් ගන්න. අපි තමයි ඒ වැරැද්ද කරන්නේ. මම එවැනි අපේක්ෂකයෙකුට ඡන්දෙ දුන්න නම්, මමයි පවුල් පාලනය පාර්ලිමේන්තුවට අරගෙන ගිහිල්ලා තියෙන්නෙ. ඉතින් එතැනදී පක්ෂපාතී කම් සිදුවුණත් අපිට දේශපාලනඥයින්ට චෝදනා කරන්න බැහැ, ඒක ඡන්දදායකයන්ගේ වැරැද්ද විදියටයි මම දකින්නේ.

***මම ඇහුවොත් පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන්ට අදහසක් තියෙනවද පාර්ලිමේන්තුව කියන්නේ මොකක්ද එහි කාර්යභාරය විය යුත්තේ කුමක්ද කියන දේ සම්බන්ධයෙන්..***

ඇත්තටම ලංකාවෙ පාර්ලිමේන්තුව ගත්තහම අපිට පිටින් ඉඳන් බලන කෙනෙක්ට හිතෙන්න පුළුවන් විශේෂයෙන් ජනමාධ්‍ය නිසා, මේ පාර්ලිමේන්තුව කියන්නේ වැඩකට නැති ආයතනයක් කියලා. ඒක තමයි පහුගිය කාලේ 225ම එපා, පාර්ලිමේන්තුව ඕනේ නැහැ, බෝම්බ ගහමු වගේ දේවල් කිව්වේ.

නමුත් පර්යේෂණ කණ්ඩායමක් විදිහට manthri.lk අපි දකිනවා පාර්ලිමේන්තුව තුළ වැඩ සිද්ධ වෙනවා. හැබැයි මාධ්‍ය මේ දේවල් වාර්තා කරන්නේ නැහැ. ඒක හරිම අවාසනාවන්ත තත්ත්වයක්. මොකද ගොඩක් වෙලාවට මිනිස්සුන්ට විනෝදය ලබන්න පුළුවන් දේවල් විතරක් පාර්ලිමේන්තුවේ වෙන විදිහටයි මාධ්‍ය මගින් පෙන්වන්නේ. ඉතින් ඒ අවස්ථාවෙන් මන්ත්‍රීවරුත් උපරිම ප්‍රයෝජන ගන්නවා. ඒ අයත් වැඩිපුර අවස්ථාවන් ලබාගෙන කතා කරනවා. හැබැයි පාර්ලිමේන්තුව කියන්නේ ඇත්තටම ඒ විදිහෙ තැනක් නෙවෙයි. අපි විශේෂයෙන් මහජනතාව විදියට තේරුම් ගතයුතුම දෙයක් තමයි පාර්ලිමේන්තුව කියන්නේ ඉතාම වැදගත් තැනක් සහ වැදගත් විදිහේ දේවල් පහුගිය කාලය පුරාම සහ දැනටත් සිද්ධවෙන සිද්ධවෙච්ච තැනක්. එහෙම නැතුව බොහෝ මාධ්‍ය මගින්, නැත්නම් සමාජ මාධ්‍ය තුළින් පෙන්නන විදිහේ විහිළුවට හාස්‍යයට ලක්කරගත යුතු තැනක් නෙමෙයි පාර්ලිමේන්තුව.

ඔබට manthri.lk වෙබ් අඩවියට ගියොත් පැහැදිලිම බලාගන්න පුළුවන්. කොයි කොයි මන්ත්‍රීවරුන්ද කල් තැබීමේ යෝජනාවල්වලට සහභාගි වෙලා තියෙන්නෙ කියලා. ඒක හරි අඩු ප්‍රතිශතයක්. විශේෂයෙන් කල්තැබීමේ යෝජනා වගේ දේවල් මාධ්‍ය තුළින් ආවරණය වෙනවා හරි අඩුයි. අන්න ඒ නිසා ගොඩක් මන්ත්‍රීවරු මේ කල්තැබීමේ යෝජනා මග හරින තත්ත්වයක් අපිට පේනවා. පාර්ලිමේන්තුවේ දී තමන්ගේ දක්ෂතා එහෙම නැත්නම් තමන්ගෙ මතයන් ඉදිරිපත් කරන්න පක්ෂයෙන් අවස්ථාව ලැබෙන්නේ නෑ එහෙම නැත්නම් ආණ්ඩු පක්ෂයේ ඉන්න අයට වැඩි අවස්ථාවක්

ලැබෙනවා විපක්ෂයට ලැබෙන්නේ නැහැ කියන්න බෑ, මොකද තමන්ටම පෞද්ගලික පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම නැත්නම් පෙත්සම්, සභාව කල්තැබීමේ යෝජනා සඳහා ඉදිරිපත් වෙන්න පුළුවන්. අපි අත්දැකීමෙන් දැකලා තියෙනවා එහෙම මන්ත්‍රීවරු ඉස්සරහට ඇවිල්ල තියෙනවා. ඇත්තටම කියන්න සතුටුයි සමහර මන්ත්‍රීවරු ඉන්නවා මුල් කාලේ ඉතාම අඩුවෙන් දායකත්වය දක්වපු. නමුත් ඔවුන් ටිකක් කල් යනකොට ඉහළම දායකත්වය වෙනුවෙන් අපෙන් සම්මාන පවා ලබා ගෙන තියෙනවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/rpEwfDCk5T8

https://www.aithiya.lk/sadisha-dharmaprema-mantri-lk/

# 13. කාන්තාවක් දේශපාලනයට ගෙනා යුත්තේ ඇය කාන්තාවක් වීම නිසාම නොවේ

## සමාජ ක්‍රියාකාරිනී මනු තිසේරා

*කාන්තා දේශපාලනයට කෝටාවක්*



මනු තිසේරා

අපි නිරන්තරයෙන් කතා කරනවා 25% කෝටා ක්‍රමය හරහා කාන්තාවන්ට දේශපාලනයට පිවිසීමට යම් උදව්වක් වුණාද කියලා. නමුත් ඇත්තටම මතුපිට තිබෙන ප්‍රශ්නයට තාවකාලික විසඳුමක් තමයි මේ දීලා තියෙන්නේ. ඒක ආරම්භයක් විදිහට සුභවාදී කටයුත්තක්. ඕනම කාරණයක් සර්ව සම්පූර්ණ විදිහට පටන් ගන්න බැහැ. හොඳම න්‍යායක් වුවත් ක්‍රියාත්මක කිරීමේදී තමයි අභියෝගවලට මුහුණ දෙන්නේ. අභියෝග දැනගෙන ඉදිරියට යෑම තමයි සමාජයේ හැම කෙනාගෙම අභියෝගය වෙන්නේ.

2018 දී පළමු වතාවට 25%ක කෝටා ක්‍රමය පළාත් පාලන මැතිවරණයට එන්නේ. එතනත් පොඩි ගණන් හදා ගැනීමක් තියෙනවා. ප්‍රමුඛ ලැයිස්තුවේ 10%ක් දෙවන ලැයිස්තුවේ 50% ක් විදිහට. අවසානයේදී 25% හදන්නේ ගණිත ගැටලුවක් විසඳලා. ඔය කියන 10%යි 50% යි එකතුකර ගන්න සමහර මහජන නියෝජිතයෝ කාන්තාවන්ගේ ගෙවල්වලට යනකොට ඔවුන් ළමයින්ගේ කිරි හදනවා, එවිට කියනවා ඔබතුමියට මේකට අත්සන් දාල දෙන්න පුළුවන්ද කියලා. ඇයට හිතන්නවත් වෙලාවක් නැහැ, ඇයි මම මේ සඳහා අත්සන් කරන්නේ කියලා. නමුත් ඇය ඒකට එකඟවෙනවා. ඊට පස්සේ ඇය ප්‍රාදේශීය සභාවට ගිහිල්ලා කටයුතු කරනවා. එතැන කාරණා දෙකක් තියෙනවා. එකක් තමයි ඇයට හරි පුහුණුවක් වගකීම පිළිබඳ දැනුමක් නැතිව

තමයි එතනට යන්න වෙන්නේ. කාන්තාවක් වීම හරහාම ඇයට සමහර කාරණාවලට පිවිසීමට නොහැකියාවක් තියෙනවා. ඒ කියන්නේ ගෙදරදොර වැඩ කටයුතු නිසාම ඇයට මේ දේවල්වලට සහභාගිවීමේ නොහැකියාවක් තියෙනවා. අනෙක් කාරණය වන්නේ ඇය කොතරම් කාලයක් මෙහි රැදේද යන කාරණය. ඇය වටා හැදිච්ච පරිසරයට ඇයට සහයෝගය දෙන්න කොතරම් දුරට පුළුවන්ද කියන කාරණය. ඇයට වැටහුණු විට මම මෙතන සිටීමෙන් ප්‍රයෝජනයක් වෙන්නෙ නෑ කියලා, බොහොම ස්වාභාවික විදිහට ඇය එතැනින් පලා යනවා. මෙය දකින අනෙක් කාන්තාවන් ගොඩක් දුරට මේවට සහභාගි වෙනවා අඩුයි. නමුත් අපි සුභවාදීව ගත්තොත් මේක පටන් ගැනීමක් විදිහට හොඳයි.

*නායකත්වය*

කාන්තා නායකත්වය කියන දේ තුළත් ගැටලු තිබෙනවා. දේශපාලන නායකත්වය කියන දේට අපි ලස්සන නිර්නායක දෙනවා. ඒ වගේම අපි දේශපාලන නායකයෙකුට පෞරුෂයක් හදනවා. නායකයෝ කිව්වම අපිට ඔලුවට එන්නේ පුරුෂ පක්ෂයනේ. ඔහුගේ තේජස, ගමන් විලාශය, හිනාව, අඳින විදිහ, ආදිය අපි විශේෂ කොට සලකනවා නායකත්වයට. කාන්තාවක් නායකත්වයට එද්දීත් බලන්නේ කොතරම් දුරට ඇයට පිරිමියෙක් වගේ ඉන්න පුළුවන්ද කියන කාරණය. එතනදිම අපි ඇයගේ භූමිකාව හදනවා ඇයට ස්ත්‍රීත්වය තියාගෙන නායකත්වය ගැනීමේ නොහැකියාව පිළිබඳව. නායකත්වය කියන එක දිහා අපි පුළුල්ව බැලුවොත් නායකයෙක්ට තිබිය යුත්තේ ලිංග භේදයකින් තොරව තිබිය යුතු ගුණාංගයි. තීරණ ගැනීමේ හැකියාව, සමූහයක් එක්ක එකතු වෙලා වැඩ කිරීමේ හැකියාව, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කර හැමගේ අදහස් එකතු කර ගැනීම, විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම, වගවීම වගේ දේවල්. ඒ වගේම සිල්ලර කාරණා කියන ඒවත් තියෙනවා. සංවේදීතාවය, සානුකම්පිත බව, සහකම්පනය ආදී වශයෙන්. ඒවා අපිට පෝස්ටරයකින් වුණත් ගේන්න පුළුවන්.

නමුත් කාන්තාවක් මේ ප්‍රවාහයට එකතු වෙන කොට අපි උත්සාහ කරනවා ඇයට මේ ප්‍රධාන ගුණාංග ටික නැහැ. ඇයට ඒ සඳහා අත්දැකීම් ලබන්න අවස්ථාවක් දීලා නැහැ. ඇයට වැඩිපුරම තියෙන්නේ

අධි සංවේදී බව, සානුකම්පිත බව. මේවා නිසා අපි හැමතිස්සෙම අවතක්සේරු කරනවා, ඇය හොඳයි, ඇය ඉතා කාරුණිකයි, නමුත් ඇය නායකත්වයට සුදුසු නැහැ කියලා. ඇයගෙන් සමාජයට සේවයක්, යම් කාර්යයක් වෙනවා කියන අදහස මතයි කාන්තාව දේශපාලනයට ගෙනආ යුත්තේ. එසේ නැත්නම් කාන්තාවක් වීම නිසාම නෙවෙයි. සමාජයෙ අපි කාලයක් තිස්සේ හදා ගත්ත මතිමතාන්තර තියෙනවා. ඒ තුළින් අපි නිවැරදි චිත්‍රය දකින්නේ නැතිව 25%ක් ඕන නිසා එකතු කරලා දෙනවා නම් අපි හදාගත යුතුයි ඔවුන් කොහොමද මේ දේශපාලන ප්‍රවාහයේ රඳවා ගන්නේ කියන ප්‍රශ්නයට උත්තරයක්. ඒ තුළ පමණයි අපිට කාන්තාවක් දේශපාලනය කිරීම හෝ යම් සමාජ ප්‍රජාවකට නායකත්වය සැපයීම කියන කාරණයේදී, අපි කාලයක් තිස්සේ හිරවෙලා ඉන්න තැනින් ගොඩට එන්න පුලුවන්.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**


https://youtu.be/lIcA1ln2CqE

https://www.aithiya.lk/%e0%b6%9a%e0%b7%8f%e0%b6%b1%e0%b7%8a%e0%b6%ad%e0%b7%8f%e0%b7%80%e0%b6%9a%e0%b7%8a-%e0%b6%af%e0%b7%9a%e0%b7%81%e0%b6%b4%e0%b7%8f%e0%b6%bd%e0%b6-%b1%e0%b6%ba%e0%b6%a7/

# 14. සමාජ විපර්යාසයක් කිරීමේදී බාගෙට කරන්න බැහැ

## සාහිත්‍යවේදී ගාමිණී වියන්ගොඩ

***2015 පැවති රාජපක්ෂ රෙජීමය පරාජය කිරීම සඳහා විශාල වැඩකොටසක් කළේ සිවිල් සමාජය. එහෙම දැවැන්ත ක්‍රියාරීත්වයක් තිබුන සිවිල් සංවිධාන ජාලය මේ වනවිට දිය වෙලා ගිහින්. 2015 බලය ගත්තට පස්සේ සිවිල් සමාජයට මොකද වුණේ ?***



ගාමිණී වියන්ගොඩ

මම හිත්තනේ 2015 යහපාලන ජයග්‍රහණය පිටුපස තිබුණු ප්‍රධාන සාධකය වුණේ සිවිල් සමාජ සහභාගීත්වය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ ඇතිවී තිබූ බරපතල ප්‍රජාතන්ත්‍රවාදී නායයෑම් ගැන මිනිස්සු තදින් කළකිරී සිටියා. ඒ වගේ වෙලාවක මහා පරිමාණයේ සිවිල් සමාජ සහභාගිත්වයක් තියෙනකොට ජනතාව බොහෝ දුරට කන් දුන්නා මේ සිවිල් සමාජය මොකක්ද කියන්නේ, ඒ දේට. ඒ හඬ ඔවුන් විශ්වාස කළා. ජනතාව සිතුවා ඊට කලින් පත්වුණු ආණ්ඩුවලට වැඩිය ප්‍රජාතන්ත්‍රවාදිව යහපත් පාලන ක්‍රමයක් පවත්වා ගෙන යන්නට මේ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය උපයෝගී වේවි කියලා.

බලයට පත්වුණාට පස්සේ යහපාලන ආණ්ඩුවේ ක්‍රියාකලාපය තුළ ජනතාවගේ සිවිල් සමාජය පිළිබඳව තැබූ ඒ විශ්වාසය ක්‍රමක්‍රමයෙන් දුර්වල වෙන්නට පටන් ගත්තා. සමහර අවස්ථාවන්වලදි ඇතිවුණු සිද්ධීන් ගැන සිවිල් සමාජයටම සිද්ධවුණා ජනතාව ඉස්සරහට ඇවිල්ලා විවේචන කරන්න. මේ විදිහට අවුරුදු පහක් යනකොට යහපාලන ආණ්ඩුව කෙරෙහි තිබුණු සියලු බලාපොරොත්තු ජනතාව විසින්

අතහැරලයි තිබුණේ. මහබැංකු බැඳුම්කර වංචාව, පාස්කු බෝම්බ ප්‍රහාරය, නිසා ජනතාව කළකිරුණා. මහබැංකු සිද්ධිය චේතනාන්විතව කරපු දෙයක්, ඊට දේශපාලනඥයන් වගකිව යුතුයි. දෙවැන්න වළක්වා ගත හැකිව තිබූ ත්‍රස්තවාදී ප්‍රහාරයක්. යහපාලන ආණ්ඩුවේ තිබිච්ච නොපෑහීම් නිසා වළක්වා ගන්නට බැරිවුණා. මේ තත්ත්වයන් නිසා සිවිල් සමාජය පිළිබඳව ජනතාව තුළ තිබුණු විශ්වාසය නැති වුණා. ජනතාව හිතුවා දේශපලකයන් කරපු මේ වැරදිවලට සිවිල් සමාජයත් වගකිව යුතුයි කියලා. මොකද දේශපාලකයෝ ගැන කළකිරිලා හිටිය මිනිස්සු ඡන්දපොළට ඇවිත් මේ වෙනස කළේ සිවිල් සමාජය ගැන විශ්වාස කරලා.

***විශාල චෝදනාවක් තියෙනවා රනිල් වික්‍රමසිංහ සහ මෛත්‍රීපාල සිරිසේන මහත්වරුන් අතර පැවතුන බල අරගලය සමනය කරලා, බලාපොරොත්තු වුණ යහපාලන ප්‍රතිසංස්කරණ ආණ්ඩුව වෙතින් කරවා ගන්න සිවිල් සංවිධාන නායකයෝ අපොහොසත් වුණා කියලා.***

සමහර දේවල් තියෙනවා පුද්ගල මැදිහත් වීමකින් වෙනස් කර ගන්න පුළුවන්. තව සමහර දේවල් තිබෙනවා ඒවා වෙනස් කර ගන්න පුළුවන්කමක් නැහැ පුද්ගල මැදිහත්වීම් වලින්. සිවිල් සමාජය කියන්නේ පක්ෂ දේශපාලනයෙන් තොර පක්ෂවලට අයත් නැති පුද්ගලයන්ගේ ක්‍රියාකාරිත්වයක්. පක්ෂලට ආණ්ඩුව මෙහෙයවීමේ වැඩි හැකියාවක් තියෙනවා. නමුත් සිවිල් සංවිධානවලට එහෙම විශාල හැකියාවක් නැහැ, පාලකයන්ගේ ක්‍රියා පාලනය කිරීමට තරම්. යම් යම් කාරණා සම්බන්ධයෙන් එම හැකියාව තිබුණට එය බොහෝ දුරට සීමිතයි.

ඔය කියන කාලයේදී සිවිල් සමාජයට විසඳාගන්න බැරි වූ එකම කාරණය තමයි ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර ඇතිවූ විරසකය. ඒකට හේතු රාශියක් තියෙනවා. පැහැදිලිවම දකින්නට පුළුවන් කාරණා කිහිපයකුත් තියෙනවා. මෛත්‍රිපාල සිරිසේන ජනාධිපති පදවියට පත් වෙන්නේ තමන්ගේම වූ පක්ෂයක සාමාජිකයෙක් වශයෙන් නොවන නිසා, ඔහුට දේශපාලනිකව හුදෙකලා බවක් ඇති වෙනවා. ඔහු ජනාධිපති පදවියට පත්වෙලා දවස් තුනක් යනකොට රහස් සාකච්ඡාවක් පවත්වනවා බැසිල් රාජපක්ෂ

සමග. ඒ තුළින් පේනවා ඔහු සිටි අස්ථාවර ස්වභාවය. ඒ අතරේ අගමැති රනිල් එක්ක වෙනත් හේතුමත ප්‍රශ්න ඇති වනවිට තමන් අතහැර ආ රාජපක්ෂ කඳවුරටම නැවත යන ගමන පටන් අරගෙනයි තිබුනේ. මේ ගමන වළක්වා ගන්නට රනිල් වික්‍රමසිංහගේ පැත්තෙන් කළයුතු ක්‍රියාවන් කළේ නැහැ. මෙවැනි තත්ත්වයක් තුළ සිවිල් සමාජයට ඉතා අසීරු තත්ත්වයක් ඇති වුණා ඒවට මැදිහත් වෙලා නිවැරදි කර ගන්නට. එම නිසා බොහෝ විට අපිට සිද්ධවුණේ මේ දෙන්නත් එක්ක වෙන වෙනම සාකච්ඡා කරන්න, මේ ඇතිවෙන ප්‍රශ්න ගැන. නමුත් අපි අමතක කළ යුතු නෑ, මේ විරසකයන් එසේ තිබියදීත් ඔවුන් දෙදෙනාගේ නායකත්වයෙන් ප්‍රජාතන්ත්‍රවාදය යහපාලනය පැත්තෙන් විශාල වැඩ කොටසක් කරන්න පුළුවන් වුණ බව. ප්‍රධාන වශයෙන්ම 19වන ව්‍යවස්ථා සංශෝධනය ඇති කර ගැනීම සඳහා ජනාධිපතිවරයා සමග අගමැතිවරයා ලොකු කාර්යභාරයක් ඉටු කළා. ඒ වගේම මහින්ද රාජපක්ෂ රජයේ කිහිප විටක්ම ප්‍රතික්ෂේප වී තිබූ තොරතුරු දැන ගැනීමේ පනත සම්මත කර ගන්නට පුළුවන් වුණා.

2010 සිට 2015 දක්වා රාජපක්ෂ පාලන කාලය තුළ ඇතිවූ මහා පරිමාණ දූෂණවලට මෙන්ම ආන්දෝලනාත්මක අපරාධවලට සම්බන්ධ වූවන් නීතිය ඉදිරියට ගෙන ඒමේදී මොවුන් දෙදෙනා වෙන වෙනම ඔවුන් ආරක්ෂා කිරීමට පියවර ගත්තා. මේ හින්දා 2015 ජනතාව බලාපොරොත්තු වූ අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒමේ පොරොන්දු කඩ වීම සිදුවුණා. 2020 වන විටත් දූෂිතයින්ට හා අපරාධකරුවන්ට දඬුවම් නොලැබුනු නිසා 19වන ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රජාතන්ත්‍රවාදී ඵල ලබන්නට ජනතාවට නොහැකි වුණා. එම දූෂිතයන්, අපරාධකරුවන් තමයි 2020 මේ රට අනෙක් අතට හැරෙව්වේ. ඒනිසා 19 සංශෝධනයෙන් ලබා ගත්ත ජයග්‍රහන පරිපූර්ණ කර ගන්න නොහැකිවුණා. සමාජ විපර්යාසයක් කිරීමේදී බාගෙට කරන්න බැහැ. එක බාගයක් කරලා අනෙක් බාගේ කරන්නේ නැත්නම් අර කරපු බාගේ ගඟට කපපු ඉනිවාගේ.

***යහපාලනය පිළිබඳ ජනතා අප්‍රසාදය විශාල ජන බලයක් සහිත ජනාධිපතිවරයෙක් සහ පාර්ලිමේන්තුවක් නිර්මානය කරලා තිබෙනවා. මෙහි කෙළවර කුමක් ද?***

අවසානයේ 2020 විශාල බහුතර බලයකින් රාජපක්ෂ කඳවුර නැවත බලයට පත්වී, දැන් යහපාලනය පිළිබඳ අපගේ පාඩම අනෙක් පැත්තට කියවනවා. අන්න ඒක තමයි මම දකින භයානකම දෙය. එතකොට ඔය විදිහට පාරට එන්න ලැබෙන්නේ නැහැ, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට. වෙනත් අයට ස්ට්‍රයික් කරන්න ලැබෙන්නේ නැහැ. යම්කිසි රටක ජනතාවක් නිදහස භුක්ති විඳීමේදී සීමාව ඉක්මවා ගියොත් ඇතිවන අරාජිකත්වය හේතුවක් වෙනවා, ප්‍රජාතන්ත්‍රවාදය පිටුදකින එයට පටහැනි පාලකයන්ට තමන්ගේ බලය ස්ථාපිත කර ගන්නට. 2015-2020 අතර ඇති වූ කළකිරීම තමයි 2020න් පස්සේ පාලකයන් කුමන ආකාරයට සිය බලය පාවිච්චි කරයිද කියන එක තීරණය කරන මූලික සාධකය. එය හොඳ දෙයක් නෙවෙයි. දිනාගත් ප්‍රජාතන්ත්‍රවාදී ජයග්‍රහණ ආපසු හරනවාය කියනකොට එය තවත් භයානක වෙනවා. සම්පූර්ණ ප්‍රජාතන්ත්‍ර විරෝධී රාජාණ්ඩු ක්‍රමයක් දක්වා යන්න 20වන සංශෝධනය මගින් මඟ සලසා ගෙන තිබෙනවා. එවිට එදා තිබූ අයිතිවාසිකම්, නිදහස ලැබෙන්නේ නැහැ. පාලකයන් කියන විදිහට ජනතාව ඉන්න ඕනෑ. ඊට අමතරව හමුදාව රාජ්‍ය පරිපාලනයට සම්බන්ධ වීම තුළ ඒකාධිකාරී ඒකාධිපති රාජ්‍ය තන්ත්‍රයක් ඇති විය හැකියි කියන අනතුර අප ඉදිරියේ තිබෙනවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/gQCBBXMncF8

https://www.aithiya.lk/%e0%b7%83%e0%b6%b8%e0%b7%8f%e0%b6%a2-%e0%b7%80%e0%b7%92%e0%b6%b4%e0%b6%bb%e0%b7%8a%e0%b6%ba%e0%b7%8f%e0%b7%83%e0%b6%ba%e0%b6%9a%e0%b7%8a-%e0%b6%9a%e0%b7%92%e0%b6%bb%e0%b7%93%e0%b6%b8%e0%b7%9a%e0%b6%af/

# 15. අපි සිවිල් සමාජය විදිහට දේශපාලන බලය අභ්‍යාස කළ යුතුයි

## හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන් රත්නප්‍රිය

***ඔබ නායකත්වය ගත්ත සිවිල් සමාජයට පසුගිය කාලේ චෝදනාවක් ආවා මේක එජාපයේ සිවිල් සමාජය කියලා. ඔබ දැන් එජාපය සමග කටයුතු කරන ආකාරය දැක්කහම එම චෝදනාව සාධාරණයි නේද?***




සමන් රත්නප්‍රිය

ඇත්තටම එහෙම චෝදනාවක් ආවා. සිවිල් සමාජය පසුගිය කාලයේ වැඩ කළේ ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය සහ නිදහස වෙනුවෙන්. එහිදී සිවිල් සමාජයට තනිව එය රට තුළ ක්‍රියාත්මක කරවන්න බැහැ. වෘත්තීය සමිතිවලටත් බැහැ. සටන් කරන්න අපිට පුළුවන්. නමුත් ජයග්‍රහණයේදී දේශපාලනය කියන කාරණය අවශ්‍යයි. එහිදී ජනතා අභිලාශයන්වලට ළඟ කවුද ඔවුන් සමග ක්‍රියාත්මක වෙන්න සිදු වෙනවා. එ.ජා.ප ක්‍රියාකාරිත්වය තමයි දේශපාලන ප්‍රතිසංස්කරණවලට එකඟ වුණේ. විකල්පය විදිහට තිබුනේ රාජපක්ෂ රෙජිමය. ඒක ඇතුළේ අපේ අභිලාෂයන්වලට ඉඩක් තිබුණේ නැහැ. හරි පැහැදිළියි අපිට වැඩ කරන්න පුළුවන් වුණේ කවුරු සමගද කියන එක. ඒ නිසා අපේ සිවිල් සමාජ නායකයෝ බහුතරයක් එ.ජා.ප.ත් එක්ක ගණුදෙනු කළා. ඒතුළ අපිට බොහෝ දේවල් ලැබුණා. 19වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව එයින් එකක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, කොමිෂන් සභා, විගණන පනත, තොරතුරු දැන ගැනීමේ පනත ආදිය ගෙන එමින් ලංකාවේ විශාලම ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට යන්න ඒ තුළින් හැකියාව ලැබුණා.

***ඔබ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය භාරගැනීමත් සමග ජනතාව කරන චෝදනාව ඇත්ත වුණා නේද?***

රටේ දේශපාලන ධාරාවත් එක්ක එකඟව හෝ විරුද්ධව වැඩ කරලා තමයි ප්‍රතිසංස්කරණ දිනා ගන්න පුළුවන්. මෙය තේරුම් ගන්න බැරි සමහර අය යම් යම් කාරණා හදා ගන්නවා චෝදනා කරන්න. නමුත් ප්‍රතිඵල අරන් දුන්නේ අපේ සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය මගින්. සමහරු ඉච්ඡාභංගත්වයට පත්වෙලා ආණ්ඩුවට විරුද්ධවම වැඩ කළා. අපි නිවැරදි දේ ප්‍රශංසාවෙනුත් වැරදි දේ විරුද්ධත්වයෙනුත් ප්‍රකාශ කළා. ඊට පස්සේ අපි සිවිල් සංවිධාන හා වෘත්තීය සමිති එකමුතුව විදිහට පැහැදිලි තීරණයක් ගත්තා දේශපාලන බලය අභ්‍යාස කළ යුතුයි කියලා. කොටසක් දේශපාලන බලය අභ්‍යාස කිරීමටත්, කොටසක් අරගලයේ යෙදීමටත් තමයි අවසානයේ අපි එකඟ වුණේ. ඒ වෙලාවේ තමයි ජයම්පති වික්‍රමරත්න මහත්තයගේ පුරප්පාඩුව එන්නේ. අපි කතාවෙලා හැමෝම එකඟ වෙලා තමයි මම මන්ත්‍රී ධුරයේ දිවුරුම් දෙන්නේ. සමහර අය සම්ප්‍රදායානුකූලව කරන්නේ සාකච්ඡාවලදී එකඟවෙලා කවුරු හරි ගියාම එයා ඒ පැත්තටම තල්ලු කරලා, හුදෙකලා කරලා, එයාගෙන් ගන්න ඕන වැඩේවත් ගන්නේ නැතිව තමන්ගේ සුපුරුදු අරගලය කරගෙන යන එක. එහෙම සම්ප්‍රදායක් අපිට තියෙනවා. ඉස්සරහට අපි හිතනවා මේ අමාරු අලුත් දේවල් කරල පෙන්වන්න පුළුවන් වේවි කියලා. දේශපාලන භාවිතාව සහ එළියේ අරගලය අනාගතයේදීත් එකවිට කරන්න බලාපොරොත්තු වෙනවා.

***ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ අගමැති රනිල් වික්‍රමසිංහ අතර පැවති බල අරගලය සමථයකට පත් කරන්න සිවිල් සමාජ නායකයින්ට නොහැකි වූ නිසා යහපාලන ආණ්ඩුව අවුරුදු පහකින් බිඳ වැටුණා කියලා කෙනෙක් කිව්වොත්..***

ඒ චෝදනාවෙන් කොටසක් අපි භාරගන්නවා. අපේ රටේ සිවිල් සමාජයට ඔය කියන සමතුලිත බව ඇති කිරීම යන කාරණය එතරම් සරල එකක් නෙවෙයි. අපේ විධායක ජනාධිපති ධුරය අති විශාල බලතල සහිත ධුරයක්. එම බලය තමයි අපි කළමනාකරණය කරන්න සූදානම් වුණේ. එය යම් ප්‍රමාණයකට කරන්න පුළුවන් වුණා. පුද්ගල

චරිත ඇතුලේ තියෙන ප්‍රශ්න අපිට පාලනය කරන්න නොහැකි වුණා. මෛත්‍රිපාල මහත්තය පොළොන්නරුවේ ඉඳන් කොළඹට ආවා කියලා කිව්වට එයා මඟ නැවතුනා. එයාට හිතන්න බැරිවුණා රටේ විදිහ සහ ලෝකෙ විදිහ. රටේ මිනිස්සු එකතු වෙලා එයා ලෝකෙට අරගෙන ගියාට එයාට ජාත්‍යන්තර චින්තනයක් තිබුණේ නෑ. එයා තල්ලු කරගෙන තමයි යන්න සිද්ධ වුනේ. තල්ලු කිරීමේ සීමාව තමයි බණ්ඩනය සහ ගැටුම් ඇති වීම. සිවිල් සමාජයටත් මෙය අතහැරුණා. ඒ වගේම එකඟතාවයන්ට පටහැනිව වැඩ කරන කොට අවසානයේ සිවිල් සමාජය තීරණය කරනවා මෙයත් දැන් ඇති කියලා. ඒ තුළ යහපාලනය අර්බුදයට ගියා.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/7_UbaLEn4ng

https://www.aithiya.lk/%e0%b6%85%e0%b6%b4%e0%b7%92-%e0%b7%83%e0%b7%92%e0%b7%80%e0%b7%92%e0%b6%bd%e0%b7%8a-%e0%b7%83%e0%b6%b8%e0%b7%8f%e0%b6%a2%e0%b6%ba-%e0%b7%80%e0%b7%92%e0%b6%af%e0%b7%92%e0%b7%84%e0%b6%a7-%e0%b6%af/

# 16. ලාංකිකයෝ චීනයේ මැදිහත්වීම ආක්‍රමණයක් විදිහට දකින්නේ නෑ

## භූපති නලින් (දේශපාලන විචාරක)



භූපති නලින්

මම හිතනවා ලංකාවේ පශ්චාත් යටත් විජිත දේශපාලන පක්ෂ කියන එක සම්පූර්ණයෙන්ම ඉවර වුණා 2020 මහමැතිවරණයත් එක්ක. විශේෂයෙන් අපි දන්නවා සාම්ප්‍රදායික වම කියනඑක හැත්තෑ ගණන් වනවිට ඉවරවෙලා යම්කිසි විදිහක පරිසමාප්තියකට ආවා. ඉන්පසු මහින්ද රාජපක්ෂ යුද්ධය ඉවර කරලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරිසමාප්තියකට ඇරියා. එක්සත් ජාතික පක්ෂය ඉතාම නරක තත්ත්වයකට මේ මැතිවරණයේදී ගිහින් තියෙනවා. මේ තුළින් අපිට පේන්න තියෙන දෙයක් තමයි නව දේශපාලනයක් කරා ලංකාවේ සාම්ප්‍රදායිත පක්ෂ දේශපාලනය ගමන් කරමින් ඉන්නවා කියන කාරණය. විශේෂයෙන් ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රවේශයත් එක්ක මෙහි ඉතාම සංකීර්ණ, සියුම් වෙනස්කම් බොහෝ දෙනෙක් නිරීක්ෂණය කරලා ඇති. රාජපක්ෂ රෙජීමය පවා යම්කිසි විදිහක පරිවර්තනයක් සිද්ධවෙලා තියෙනවා. අනෙක් පැත්තෙන් ගත්තොත් වාමාංශික දේශපාලනය කියලා මොනවා හරි දෙයක් ඉතිරි වෙලා තියෙනවද කියන එකත් සාකච්ඡා කරන්න පුළුවන්.

### *බෞද්ධ ජාතිකවාදී දේශපාලනය*

අපි හැමෝම දන්නා පරිදි බොහෝ දෙනෙක් මේ දවස්වල අදහස් දක්වන පරිදි සිංහල බෞද්ධ ජාතිකවාදී දේශපාලනය, එහි කූටප්‍රාප්තිය කරා ඇවිල්ලා තියෙනවා. සිංහල බෞද්ධ ජාතිකවාදී දේශපාලනයත් එක්ක බැඳිලා තියෙනවා දේශපාලන ආර්ථික සංවර්ධනය කියන අදහස.

මේ දෙකේ මොඩ්ල් එක ගෝඨාභය රාජපක්ෂගෙන් ආවා කියලා මම හිතනවා. එක පැත්තකින් සිංහල බෞද්ධ සාරාර්ථයක්, සිංහල බෞද්ධ ජාතික රාජ්‍ය කියන සීමාව අභිබවා ගිහිල්ලා Orientalism පෙරදිග වාදයක් කරා ගිහිල්ලා තියෙනවා. උදාහරණයක් විදිහට ලාංකිකයෝ ඒක දකින්නේ ඇමෙරිකාව හෝ බටහිර ඒවා ආක්‍රමණයක් විදිහටත්, චීනයේ මැදිහත් වීම ආක්‍රමණයක් නොවන විදිහටත්. චීන්නු ආසියාවේ එවුන්, ඉන්දීය වුණත් පොඩි පොඩි දේවල් තිබුණට කමක් නෑ වගේ. ඒක දේශපාලනයේ පෙරදිගවාදයක් කියලා කියන්න පුලුවන්.

ලංකාවේ ජාතිකවාදයත් එක්ක බැදිච්ච සංවර්ධනයක් කිව්වම අපි හැමදාම දැක්කේ ගොඩනැගිලි. ගොඩනැගිලි තමයි අපිට සංවර්ධනය විදිහට පෙන්නුවේ. චීනයේ භූ දේශපාලන සැලැස්මත් එක්ක, උදාහරණයක් විදිහට කොළඹ නගරය ගත්තොත් ලංකාවේ මේ වෙලාවේ කූටප්‍රාප්තියකට පැමිණිලා තියෙන ජාතිකවාදී දේශපාලන සංඥා එක්ක, එහි කිසිම අන්තර් සම්බන්ධයක් නෑ. තනිකරම සිංගප්පූරුවක් වගේ බටහිරකරණය වෙලා බුදු පිළිම එන්න එන්නම පුංචි වෙලා බිල්ඩින් විශාල වෙලා. කිසිම සම්බන්ධයක් නැහැ සිංහල බෞද්ධ ජාතිකවාදයත් එක්ක කොළඹ නගරයේ දේශපාලන ආර්ථිකය.

ඒ වගේමයි කොළඹ පෝර්ට් සිටි ව්‍යාපෘතිය, මුළු කොළඹ නගරයම ලංකාවට අයිති නැති භූමියක් බවට පත් වෙමින් යන්නේ. වරාය නැගෙනහිර පර්යන්තය පිළිබඳව විශාල ආන්දෝලනයක් සිදුවුණා. අපි පැය විසිහතරම ජීවිතේ ගෙවන්නේ ළමය කන බොන එක, බිත්ති හතරක් හදලා රෝද හතරක් ගන්න එක, ළමයට උගන්වන එක, හිතමින් මිසක් සිංහල බෞද්ධ ජාතිකත්වය ගැන හිතමින් නෙවෙයි. මේක තමයි අපිට දැනෙන ඇත්ත ආර්ථික ජීවිතයයි දෘෂ්ඨිවාදී ජීවිතයයි අතර පවතින වෙනස. අපි මනසින් මවා ගන්න මොකක්දෝ ලාංකිකත්වයක්, මොකක්දෝ සිංහල බෞද්ධකමත් කොහොමද පාස්සන්නේ කියන තැන තමයි මගේ යෝජනාවේ පදනම තියෙන්නේ.

### *ජවිපෙයි පොහොට්ටුවයි අතර කිසිම මතවාදී වෙනසක් නෑ*

අද තියෙන්නේ මහත්වරුන්ගේ ජාතිකවාදයක්. වියත්මත ගත්තොත් ඒගොල්ලෝ ටයිකෝට් අදින මහත්වරු. ජාතික ඇඳුම ඇඳලා

දේශපාලනය කරන අය නෙවෙයි. එක්දහස්නවසිය හැට ගණන් වල ජපානයේත් ඊට පසුව සිංගප්පූරුවේ වගේ රටවලටත් මේක ආවා. මෙය දේශපාලනිකව අලුත් ව්‍යුහයක් නෙවෙයි. ලංකාවේ මේක අලුත් දශකයක ආරම්භයේදී ආවේ. මෙමගින් එන අලුත් දේශපාලන සටන්පාඨය තමයි ජාතිකවාදය. ආර්ථිකය ජාතිකවාදී කිරීම සහ හොරු අල්ලන එකේ ඉඳලා යම් පිළිවෙලක්, මහත්වරුන්ගේ දේශපාලනයක් කියනඑක තමයි යෝජනා කරන්නේ. මට තියන ගැටලුව තමයි මෙන්න මේ සටන් පාඨ ටික තමයි ජාතික ජන බලවේගය අරන් තියෙන්නෙත්. ජාතික ජන බලවේගයයි පොහොට්ටුවයි අතර මතවාදීව වෙනසක් නැහැ. අපේ අනුර කුමාර මැතිඳුන් කියනඑක තමයි ලංකාවේ ජාතික ආර්ථිකයක් ගොඩනගන්න ඕන කියන එක. බැසිල් රාජපක්ෂ අනුරට වඩා හොඳට මේක කියනවා. ලංකාවේ හොරකම් මැරකම් නැති කරලා දූෂණ වංචා නැති රටක් කරනවා කියලා වසන්ත සමරසිංහලා, නලින්ද ජයතිස්සලා ෆයිල් උස්සන් එහෙ මෙහෙ දිව්වනේ. නමුත් මේ ව්‍යාපෘතිය කවුද ජයගත්තේ. මේකට තමයි සෝටාභය රාජපක්ෂට ලක්ෂ 69ක් ඡන්දය දුන්නේ. පෙරටුගාමී සමාජවාදී පිළ ගත්තත් දේශපාලනික කියවීමක් නැහැ. මේ සමස්ථ දේශපාලන ආර්ථික ව්‍යාපෘතිය පිළිබඳව. උද්ඝෝෂණ, සටන් පාඨ, මාධ්‍ය සාකච්ඡා මූලික දේශපාලනයක් තමයි ඔවුන්ට තියෙන්නේ. බැසිල් රාජපක්ෂ, මංගල සමරවීර තරම්වත්, රට දේශපාලනිකව සංවිධානය කරනවා කියන තැනට වම ඇවිල්ලා නැහැ. දැනට අපිට පේන්න නැහැ පොහොට්ටු දේශපාලනයට අභියෝග කරන්න පුළුවන් තැනක්. අපි නොදන්නා දෙයක් සිද්ධ වෙන්න පුළුවන්. සිංහල බෞද්ධ ඒකමිතියක් තිබ්බ එක දැන් කෑලි කෑලිවලට කැඩිලා යනවා. අපිට හොඳම උදාහරණය කමයි ඥාණසාර හාමුදුරුවෝ, ලංකාවේ බොහෝ දෙනෙකුගේ බලාපොරොත්තුවක්. සති දෙකයි හාමුදුරුවන්ගේ සංකේතීය වටිනාකම ඉවර වෙලා යන්න ගියේ. සිංහල බෞද්ධකම මාර්කට් කරන්න පුළුවන් අවසන් අවස්ථාවට අපි ඇවිල්ලා තියෙනවා. මින්පසුව අපි ඇතුළු වෙනවා ගෝලීය ප්‍රාග්ධනයත් එක්ක බැඳුන ඉතාම සංකීර්ණ බල අරගලයකට.

### *චීන, ඇමරිකා, ඉන්දියා බල දේශපාලනය සහ ලංකාව*

ලංකාව පිළිබඳව තියෙන භූ දේශපාලනික සැලසුම් ගත්තහම මෑත කාලීනව ඉන්දියාව සහ චීනය අතර ඇති අරගලය ඉතාම වැදගත්.

එය මෑත දශක දෙක තුනක් තුළ ක්‍රමිකව වර්ධනය වුණු තත්ත්වයක්. ලංකාවේ දේශපාලන ආර්ථිකය ගත්තහම දේශිය ආර්ථිකයට තියෙන්නේ සේවා ආර්ථිකයක් විතරයි. සැලකිය යුතු නිෂ්පාදන ආර්ථිකයක් ලංකාවේ නැහැ. මේ තත්ත්වය තියෙද්දී ලංකාව වගේ රටක් ගෝඨාභය රාජපක්ෂ නෙවෙයි සුපර්මෑන් ආවත් වෙනස් කරනවා කියන එක සංකීර්ණ ප්‍රපංචයක්. මේ තත්ත්වයේදී ලංකාව භූ දේශපාලනික ගොදුරක් වෙනඑක නවත්වන්න බෑ. මේ සඳහා ජාතික මට්ටමේ දේශපාලන මිෂන් එකක් තියෙනවා කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ. දැන් ප්‍රධාන ධාරාවේ දේශපාලන ව්‍යාපාරය මෙච්චරකල් කරපු ජාතික කොමිස් ආර්ථික දේශපාලනය, දැන් ජාත්‍යන්තර බවට පත් වෙනවා. එතකොට ඔය ටයිකෝට් දාගත්තු මහත්තුරු තමයි හොරකම් කරන්නේ. කොළඹ වරාය නගරයත් එක්ක බැඳුන විශාල කොමිස් ආර්ථිකයක් තියෙනවා. උදාහරණයක් විදිහට ගත්තොත් බම්බලපිටියේ සිට කොල්ලුපිටිය දක්වා ඉඩම්වල අයිතිය කාටද තියෙන්නේ. ඉතාම සුප්‍රකට ව්‍යාපාරිකයෙකුට තමයි 70% ක පමණ අයිතිය තියෙන්නේ. ඒ ඉඩම් වල බිල්ඩින්වල තවමත් වැඩ කරගෙන යන්න ඉඩ හරිනවා. ඒක අනාගත ආයෝජනයක්. ලංකාවේ සුද්දෝ හදපු කොළඹ නගර සැලසුම, ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත වෙමින් යනවා. පළමුවෙනි වතාවට ගෝලීය ප්‍රාග්ධනයත් එක්ක බැඳුන, ගෝලීය ප්‍රාග්ධනයේ අවශ්‍යතා මත කොළඹ නගරයම ප්‍රතිව්‍යුහගත වෙමින් යනවා. එතකොට ඒක වරාය කේන්ද්‍රිය වෙළඳ නගරයක් බවට පත් වෙන්නේ නෑ තවදුරටත්. මුළු ලංකා ඉතිහාසයේම කොළඹ නගරය තිබුණේ වරාය කේන්ද්‍රීය වෙළඳ නගරයක් විදිහට. කොළඹ නගරයෙන් තමයි මුළු ලංකාවම සංවිධානය වුණේ.

ඍජු ගෝලීය ප්‍රාග්ධන සම්බන්ධය තමයි මේ චීන ව්‍යාපෘති. දකුණු ආසියානු ව්‍යාපෘතියේදී ලංකාවේ කොළඹ නගරය ඒ හා සම්බන්ධ කේන්ද්‍රයක් බවට පත් කරගෙන තියෙනවා. මේකට අතදාන්න කාටවත් බැහැ කියන එකයි මගේ අදහස. ඒ තුළින් ලංකාවේ මෙතුවක් රැකිලා තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්, සමානාත්මක අදහස් හා ඕනෑම නූතන ප්‍රජාතන්ත්‍රවාදී අදහස් ඉතාම බරපතල විදිහට අභියෝගයට ලක්වෙමින් තිබෙනවා. චීන අධිකාරිත්වය නව ආකාරයකට දේශපාලනයක් අභ්‍යාස කරන්න ලංකාවට උගන්වන්න නියමිතයි. ඒක බැලූ බැල්මට මතුපිටින් පුපුරා යන එකක් නොවුණත් ඉතාම සංකීර්ණ ක්‍රියාවලියක්.

උදාහරණයක් විදිහට චීනයේ කලාව, ජනමාධ්‍ය, සිනමාකරුවන්, සමාජ ක්‍රියාකාරීන්, බුද්ධිමතුන් ගත්තම හැම කෙනෙක්ම රටින් පිටව යන්න බලාගෙන තමයි විරෝධාකල්ප මතු කරන්නේ. අපිට පරිකල්පනය කළ නොහැකි අලුත්ම ආකාරයකට තමයි මෙය සිදුවෙන්නේ. ඉතිං මේ අධිකාරිවාදී ක්‍රමය මෙම හූ දේශපාලනික රාමුව අස්සේ ලංකාව තුළත් ක්‍රියාත්මක වෙන්න පුලුවන්.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/LzXRFmDCllU

https://www.aithiya.lk/%e0%b6%bd%e0%b7%8f%e0%b6%82%e0%b6%9a%e0%b7%92%e0%b6%9a%e0%b6%ba%e0%b7%9d-%e0%b6%a0%e0%b7%93%e0%b6%b1%e0%b6%ba%e0%b7%9a-%e0%b6%b8%e0%b7%90%e0%b6%af%e0%b7%92%e0%b7%84%e0%b6%ad%e0%b7%8a%e0%b7%80%e0%b7%93/

# 17. රාජපක්ෂ පවුලට හොඳම ටික, අනෙක් අයට රොඩු

## හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කරුණාරත්න පරණවිතාන

***මේ වෙනකොට 20වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගෙන ඉවරයි. අපි මෙතනින් අපේ කතාව පටන් ගම්මු.***



කරුණාරත්න පරණවිතාන

2015 දී 19 වන ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ වුණේ සරත් වීරසේකර මහත්තය විතරමයි. අනෙක් සියලු දෙනාම ඒකට පක්ෂ වුණා. එයින් විශාල පිරිසක් අදත් පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒක ආණ්ඩුව වෙනුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ කවුද? විජේදාස රාජපක්ෂ. මෛත්‍රිපාල සිරිසේන මහත්තයා හවුල් ආණ්ඩුවක් හදන්න හේතුව හැටියට ඉදිරිපත් කළේ මේ 19 වන සංශෝධනය පාස් කරගැනීම. අද 19 වන සංශෝධනය අහෝසි කරන්න කටයුතු කළ සියලු දෙනාමත් එදා මේකට පක්ෂව කටයුතු කළා. සංශෝධන ඉදිරිපත් කළා. එදා දිනේෂ් ගුණවර්ධනලා කතා කළ හැටි අපි දැක්කා. දැන් මොකද හදිසියේ 19 අහෝසි කළේ? එදා ඔවුන් මේකට පක්ෂ වුණේ ඇත්තටම ප්‍රජාතන්ත්‍රවාදියෝ නිසා නෙවෙයි. ඒ අයට තේරුණා වෙන ආණ්ඩුවක් ඇවිල්ලා ඒ අයට බලය නැහැ ඒ නිසා මොකක් හරි එකකට අත උස්සගන්න ඕනෑ කියලා. හැමදාම මහින්ද රාජපක්ෂ කඳවුරට ඕනෑ වෙලා තිබුනේ 1978 ව්‍යවස්ථාව ප්‍රජාතන්ත්‍රීකරණයට ලක් කරන්න නෙවෙයි, ජේ ආර් ජයවර්ධනටත් එහා ගිය ඒකාධිපති ලක්ෂණ ඒකට එකතු කරන්න. ඒකට තමයි ඔවුන් 18 වන සංශෝධනය ගෙනාවේ.

19 වන සංශෝධනයේ අඩු පාඩුකම් තිබුණා. ඒක මමත් පිළිගන්නවා. ඒවා යම් යම් තාක්ෂණික අඩුපාඩුකම්. බලකේන්ද්‍ර හදා ගැනීමේදී යම් යම් ප්‍රශ්න තිබුණා. ඒ වුණාට ඒ තාක්ෂණික ගැටලු විසඳාගන්න අපිට හොඳටම ඉඩ තිබුනා. ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරනවා නම් ඒවා විසඳාගන්න පුළුවන්. දැන් මේ කළේ 19න් ඇතිවුණ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයන් සියල්ල විනාශ කර දැමීම. 1978 ව්‍යවස්ථාව අහෝසි කරනවා කියලා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහින්ද රාජපක්ෂලා, මෛත්‍රිපාල සිරිසේනලා, එක්සත් ජාතික පක්ෂය නොවන රටේ වැඩි දෙනෙක් කිව්වේ. අන්තිමට එක්සත් ජාතික පක්ෂයම තීරණය කලා 1978 ව්‍යවස්ථාවෙන් අයින්වෙලා පාර්ලිමේන්තුවට වැඩි බලය ලැබෙන ව්‍යවස්ථාවකට යනවා කියලා. නමුත් දැන් මේ කරන්නේ 1978 ව්‍යවස්ථාව නැවත ක්‍රියාත්මක කිරීමක්. මේ හදන්න යන්නේ ඒකාධිපති ආණ්ඩුවක් කියලා අපි කිව්වා. ඔහොම තමයි ජේ ආර් ජයවර්ධනලත් කල්පනා කළේ. රටේ ආර්ථිකය සංවර්ධනය කරන්න, රටේ ස්ථාවරභාවය හදන්න, ශක්තිමත් ව්‍යවස්ථාවක් ඕනෑ කියලා හදාගත්තා. අන්තිමට මොකක්ද ඒ පාලනය ඉතිරි කළේ. විශාල තරුණ කැරල්ලක්, තිස් අවුරුදු සිවිල් යුද්ධය, අසහනය, මර්දනය, භීෂණය තමයි ඉතුරු වුණේ. උනුන් කා කොටා ගන්නා ස්වමාංශ භක්ෂක සමාජ රටාවක් තමයි ඒතුළින් අපිට ඉතිරි වුණේ. දැන් අපි ආයෙමත් එතනට ගිහිං. ජනතාවට අපි මේ අනතුර පෙන්නුවා.

***පහුගිය කාලයේ චීන සහ ඇමරිකානු බලවතුන් තරගයට වගේ ලංකාවට ආවා. අනෙක් පැත්තෙන් ඉන්දියාවත් ඇමරිකාව පසුපස ඉන්නවා. මේ තත්ත්වය තුළ රාජපක්ෂ ආණ්ඩුව කෙසේ හැසිරෙයිද?***

මේ ආණ්ඩුව ගෝලීය දේශපාලන බලවතුන්ගේ රූකඩයක් බවට පත් වෙලා ඉවරයි. දැන් තිබෙන්නේ ආර්ථික යුද්ධයක්. එහි ගොදුරක් බවට අපේ රට පත් වෙනවා. එහි ඒජන්තවරයා තමයි ආණ්ඩුව. මේ රට විශාල ණය උගුලකට ඇදලා දැම්මේ රාජපක්ෂලා. එකදහස් නවසිය පනස් ගණන් වල ඉඳලා අපේ රට රාජ්‍යයන්වලින් ණය ගත්තා. ඒ ණය ගත්තේ සහන පොළියට, රාජ්‍යයන් අතර ඇති කරගත් ගිවිසුම්වලින් සහ දීර්ඝකාලීනව ගෙවන පදනම යටතේ. නමුත් රාජපක්ෂ යුගයේ තමයි ඔය වාණිජ ණය ගැනීම ආරම්භ වුණේ. ඒ කියන්නේ විදේශ බැංකු වලින් ගිණි පොළියට ණය ගැනීම ආරම්භ කරලා, ඒවා ක්ෂණික

ආර්ථික ප්‍රතිලාභ ලැබෙන්නේ නැති ක්‍රීඩාංගන හදන්න, විශාල සම්මන්ත්‍රණ ශාලා හදන්න, විශාල වශයෙන් කොමිස් ගන්න පුළුවන් දැවැන්ත යටිතල පහසුකම්වලට ආයෝජනය කළා. ඒ ණය දැන් ගෙවන්න වෙලා තියෙනවා. මේක විශාල ණය උගුලක්. ඒ වගේම ඒ අයගේ වැරදි කළමනාකරණය, පවුල් පාලනය නිසා ශ්‍රීලංකන් ගුවන් සේවය වැනි ආයතන අද සුදු අලි බවට පත්වෙලා. ඊට කලින් ශ්‍රී ලංකන් ගුවන් සේවය රටට වාසි ගෙනාපු ලාභ ලබපු ආයතනයක්. ඒවගේම තමයි මේ අය පැකිලෙන්නේ නෑ රට විකුණන්න. මේ රටේ ඉඩම් සින්නක්කරව විකුණ්නේ රාජපක්ෂ ආණ්ඩුව. උදාහරණයක් හැටියට ගෝල්ෆේස් ඉඩම, හමුදා මූලස්ථාන ඉඩම. පොරොන්දු වෙලා තියෙන දැවැන්ත ව්‍යාපෘති කරන්න තව තවත් ණය වෙන්න සිද්ධවෙලා තියෙනවා. මේ ණය වෙනුවෙන් ඇත්තටම අපේ වරායන්, භූ දේශපාලනික උපක්‍රමික වැදගත්කමක් ඇති වෙරළබඩ ස්ථාන, ලොකු ඉඩම් විකුණනවා ඇරෙන්න වෙන කරන්න දෙයක් ඉතිරි වෙලා නැහැ. මේ අය දේශප්‍රේමයේ නාමයෙන්ම ඒවා කරයි.

### *ඉදිරි දශකය තුළ ලංකාවේ විපක්ෂ දේශපාලනය, කුමන හැඩයක් ගනීද?*

එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ඉතිහාසයේ පක්ෂවලට හිමි කාර්යභාරය අවසන් කරලා වේදිකාවෙන් බැස ගිහින් තියෙනවා. බලවත් පක්ෂයක් හැටියට දැන් තියෙන්නේ පොදුජන පෙරමුණ. ඒකේ ඔය උගත්තු වියත්තු අරවද මේවද කියලා කිව්වට ඒක සකස් වෙලා තියෙන ආකාරය බැලුවොත් එහෙම එකක් නැහැ. ඒක ලොකු පවුලක්. ඒ පවුලේ ආධිපත්‍යය පිළිගන්නා ජාවාරම්කාර පැලැන්තියක් තමයි පොදුජන පෙරමුණ.

එයට එරෙහිව විකල්පයක් හැටියට තියෙන සමගි ජන බලවේගය ගත්තොත් එයට රටේ නැවත බලවත් දේශපාලන පක්ෂයක් හැටියට නැගී සිටින්නට නම්, එක්සත් ජාතික පක්ෂයම වෙලා හරි යන්නේ නැහැ. සමගි ජන බලවේගයට සිද්ධ වෙනවා වෙනත් භාෂාවකින් ජනතාවට කතා කරන්න. වෙනත් ශෛලියක් අත්පත් කර ගන්න.

***වර්තමාන ජනාධිපතිවරයා ඡන්දයට කලින් ජනතාවට පෙන්නුවේ තමන් තමයි ස්මාර්ට්ම නායකයා කියලා. එහෙත් කිව්ව තරම්ම ස්මාර්ට් නැහැ නේද ?***

ගෝඨාභය රාජපක්ෂ මහත්තයත්, එතුමා වටා ඉන්න උගත්තු වියත්තු මොනවා කිව්වත් එහෙම සිස්ටම් චේන්ජ් එකක් වෙන්නේ නැහැ. කලින් තිබුණ රාජපක්ෂ සිස්ටම් එක තමයි නැවත ඇවිත් තහවුරු වෙන්නේ. මුල් රාජපක්ෂ ආණ්ඩුවේ අමාත්‍යාංශ බෙදාහදා ගත්තේ කොහොමද? රාජපක්ෂ පවුලට හොඳම ටික. අනෙක් අයට රොඩු. දැන් වෙලා තියෙන්නෙත් එහෙම. තමන්ගේ පවුලට ඉතාම හිතවත් අයට, විශ්වාසවන්ත අයට, රාජ වංශයට අභියෝගයක් නොවන අයට, තනතුරු වරප්‍රසාද බලය ලබා දෙනවා. යම් හෙයකින් වෙනස්වෙයි කියලා හිතන අය පාටියේ තියා ගන්නේ නැහැ. ඒ ගොල්ලෝ වාටියට දානවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/5kfQeyj7jZc

https://www.aithiya.lk/karunarathna-paranawithana/

# 18. අද ජනමාධ්‍යයට සමාජයේ ඉඩක් නැහැ

## සීතා රංජනී - කැඳවුම්කරු නිදහස් මාධ්‍ය ව්‍යාපාරය



සීතා රංජනී

***මොන පක්ෂයක ආණ්ඩුව ද පත්වෙන්නේ කියන එක තීරණය කරන තැනකට අද මාධ්‍ය පත්වෙලා තියෙනවා. මේකෙන් කියවෙන්නේ ජනතාවගේ පරමාධිපත්‍ය බලයට විශාල බලපෑමක් කරන්නට මාධ්‍යට හැකියාවක් තිබෙනවා කියන එක. මේ තත්ත්වයේ කෙළවර මොනවගේ වෙන්න පුළුවන්ද?***

මට නම් පේන්නේ ජනමාධ්‍ය කියන එකට අද සමාජය තුළ ඉඩක් නැති වෙන තත්ත්වයක් තමයි තියෙන්නේ. මම ඇත්තටම දරුණු විදියට විවේචනය කරනවා නොවෙයි. අතලොස්සක් මාධ්‍ය තියෙන්න පුළුවන් ජනතාවගේ පැත්තෙ ඉඳලා මේ ප්‍රශ්න දිහා බලන. ඒවා ඉතාම සීමිතයි, ඒවායේ හඬ සමාජයට නොඇසෙන තරම්. ඒත් ප්‍රධාන ධාරාවේ මාධ්‍ය කියූවිට විශේෂයෙන් රූපවාහිනි මාධ්‍ය හා පුවත්පත් සියල්ලම පාහේ බොහෝ දුරට කලින් කියූ විදියේ දේශපාලන උවමනාවන් මත හැසිරෙන ආකාරයක් තමයි දක්නට තියෙන්නේ. විශේෂයෙන්ම රූපවාහිනි මාධ්‍ය කියනඑක පවතින දේශපාලන පක්ෂයට නැතිනම් ආණ්ඩුවට හිතවාදී ආකාරයට තමයි හැසිරෙන්නේ.

මොන තරම් ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය වුවත්, පරමාධිපත්‍ය උල්ලංඝනය වුවත්, මානව හිමිකම් උල්ලංඝනය වුවත්, මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වුවත්, ඒ අය ඒවා වාර්තා කරන්නේ වාර්තා කිරීමට එහා ගිහිං ඒවා සාධාරණීකරණය වන ආකාරයටයි. මෙනිසා ආණ්ඩුවක් ලෙස කරන දේවල් සාධාරණීයකරණය වන

ආකාරයට තමයි අදහස් පළ කිරීම්, වාර්තා කිරීම් දක්නට ලැබෙන්නේ. මේ තත්ත්වය දිගටම පැවතිය හොත් අනාගතයේදී මාධ්‍යවේදියා හා දේශපාලනඥයා අතර වෙනසක් දකින්නට ලැබෙන එකක් නැහැ. එතකොට මට හිතෙනවා එනිසාම විකල්ප මාධ්‍ය ධාරාවකට ඉඩකඩක් හැදෙයි කියලා. සමහර විට දැනට තිබෙන ඩිජිටල් මාධ්‍ය හෝ සමාජ මාධ්‍ය වගේ දේවල් වලට අනාගතයේ වැඩි ඉඩක් ලැබෙයි.

***යහපාලන කාලයේ තොරතුරු දැනගැනීම අයිතියක් කලා. ඊට පස්සේ ඒක මිනිස්සුන්ගේ මූලික අයිතිවාසිකම්වලට වැටුණා. ඒකත් එක්ක ඔබ හිතනවාද ජනමාධ්‍යවේදීන් ඒ අයිතිය පාවිච්චි කරලා ජනතාවට සත්‍ය තොරතුරු දෙන්න කටයුතු කරා කියලා.***

මේ වනවිට විසිවන ව්‍යවස්ථා සංශෝධනය එක්ක, තොරතුරු අයිතිය සම්බන්ධයෙන් යම් අනතුරක සේයාවක් තියෙනවා. කොමිෂන් සභා පවතින බව කියනවා. නමුත් ඒවාට පත්කිරීම් කිරීමේ ක්‍රමවේදය සම්පූර්ණයෙන් දේශපාලනිකරණය කරලා තියෙනවා. දැනට තියෙන යෝජනා අනුව ස්වාධීන කොමිෂන් සභා කියනඑක පිළිබඳ විශ්වාසය තියන්නේ කොහොමද කියනඑක අනාගතයට බාරයි. යම් මට්ටමකට තොරතුරු දැනගැනීමේ පනත ඇසුරු කරගෙන ජනතාවට බලපාන සත්‍ය හෙළිදරව් කිරීමට (රජයන් හා පාලකයන් විසින් කරන වැඩසටහන් හෝ වෙනත් දෑ තොරතුරු හෙළිදරව් කරන්න දූෂණ වංචා අක්‍රමිකතා පිළිබඳ) වැඩ කරන යම් මාධ්‍යවේදීන් පිරිසක් බිහිවෙලා තියෙනවා. ඒ අතරේ යම් යම් අභියෝග තියෙන බව දැනගන්නට ලැබී තියෙනවා. තොරතුරු කොමිසමට තම ස්වාධීනත්වය නැතිවෙලා, එම කොමිසමට දේශපාලන බලපෑමක් වුවහොත් එය සමාජයේ අපේ අදහස් ප්‍රකාශ කිරීමට, තොරතුරු දැන ගැනීමට, සිවිල් ජනතාවගේ අයිතිවාසිකම්වලට නරකට තමයි බලපාන්නේ.

***ඔබ විකල්ප මාධ්‍යයේ සෑහෙන කාලයක් වැඩ කරපු කෙනෙක් විදිහට මාධ්‍ය සම්ප්‍රදායන් පිළිබඳ ඔබට විශාල අදහසක් ඇති. එයත් සමග අද සමාජ මාධ්‍ය ගත්තොත්, ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය තමයි ප්‍රමුඛ වෙලා තියෙන්නේ. ඉස්සර විකල්ප පුවත්පතක හෙඩ්මක් වුවත් විශාල සමාජ කතිකාවතක් නිර්මානය කරනවා. අද විකල්ප පුවත්පත් තුළ***

***ගවේෂණාත්මක ලිපි පළ වුණත්, ඒවා ෆේස්බුක් එක හරහා කියවන තැනට ගිහින් තියෙනවා. මේ වෙනස ඔබ අත් දකින්නේ කොහොමද?***

එය හරිම දීර්ඝව සාකච්ඡා කරන්න ඕනෑ මාතෘකාවක්. ෆේස්බුක් හෝ සමාජ මාධ්‍ය ජනමාධ්‍යවේදීන් විසින් හසුරුවන මාධ්‍යයක් නෙමෙයි. ස්මාට් ෆෝන් එකක් තියනව නම් ඕනෑම අයෙකුට ඕනෑම දෙයක් පෝස්ට් කරන්න පුළුවන්. එය වගකීමක් වගවීමක් සහිතව කරනවද කියන එක පිළිබඳව හිතන්න අපිට අමාරුයි. ආචාර ධාර්මික මගපෙන්වීමක් ඒතුළ නැහැ. එම මාධ්‍යකරණයට මාධ්‍ය පිළිබඳ දැනුමක් හෝ කිසිම දෙයක් අවශ්‍ය නැහැ. හැබැයි සම්ප්‍රදායික මාධ්‍යයක අපි වැඩ කරද්දි සමාජ මාධ්‍ය හෝ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය ආචාර ධර්ම පිලගන්නවා ද නැති ද යන්න වෙනම කාරණයක් වුවත් එයට යම් ආචාරධාර්මික මඟ පෙන්වීමක් තියෙනවා. ඒවා නොතකා වැඩ කරන තත්ත්වයන් ඕනෑ තරම් අපට දක්නට තියෙනවා. විකල්ප මාධ්‍ය තුළ දක්නට ලැබෙන විශේෂත්වය තමයි (රාවය, අනිද්දා පත්තර වැනි ) ඒවා ගොඩක් දුරට සමාජය ගැන කැක්කුමක් තියෙන, සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් හා අනෙකුත් අයිතිවාසිකම් ගැන ජනතාවගේ හඬ වාර්තා කිරීම. විශේෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන්, සමාජය වෙනස් කිරීමේ අවශ්‍යතාවය තිබෙන, මේ යන ගමන වෙනස් කරලා යහපත් සමාජයක් ගොඩනැගීමේ කැක්කුම තියෙන පිරිසක් තමයි එදත් අදත් විකල්ප මාධ්‍ය පද්ධතිය තුළ ඉන්නේ. එවිට ඒ අය වැඩකරන විදිය බොහෝ විට පරිස්සම් සහගතයි.

අපි ඒ කාලේ වචනයක් ලිවීමේදී වුණත් සැලකිලිමත් වුණා. උදාහරණයක් කියන්නම්. මුල් කාලේ අනූ ගණන් වල LTTE සංවිධානය ගැන ලියද්දී කොටි සංවිධානය කියලා අපි භාවිතා කළේ නැහැ. ඒ වචනය ගැන අපි සාකච්ඡා කළාම අපි ආපු නිගමනය තමයි ඒ වචනය හරහා සමාජයට යන ආකල්පය නරක එකක් කියන එක. අපි කොටි හෝ කොටි සංවිධානය කියන එක නොකියා LTTE කියලා භාවිතා කළා. ඒ කාලේ ලොකු මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගිලා තිබ්බෙ නැති වුවත් යම් මට්ටමකට අපි එසේ සාකච්චා කර දේවල් කළා. අපි අනිත් අතට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට එරෙහි ආකල්ප මතු නොවන ආකාරයට, යම් විදියකට වැරැද්දක් වෙලා තියෙනවා නම් ඒවා නිවැරදි කරගන්න කර්තෘ මණ්ඩලය විදිහට

සාකච්ඡා කරලා ඒවා නිවැරදි කරගන්න උත්සාහ දැරුවා. ෆේස්බුක් වගේ දේවල් මේ ගොඩට දාන්න බැහැ. ඒකෙ කිසිම සීමාවක් නෑ. ඒක ඕනම කෙනෙක් කරන වැඩක්. ඒ තුළත් වඩා විචාරශීලීව වඩා සමාජ වගකීමක් සහිතව මාධ්‍ය භාවිතා කරන පිරිස් ඉන්නවා. එවැනි පිරිස් වඩා මතු වුණොත් සමාජ මාධ්‍ය හා වෙබ් මාධ්‍ය කියන එකත් අනාගතයේ ජනතාවට වඩා ඵලදායක, ජනතා විසින් පිළිගන්නා තත්ත්වයට පත්වෙයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/RMdWT8sVLWA

https://www.aithiya.lk/media-has-no-place-in-society-today-sita-ranjani-convener-free-media-movement/

# 19. ඉදිරියේදී අසහනකාරී ව්‍යාධීන් සහිත පරම්පරාවක් ඇති වෙන්න පුළුවන්

## රංගන ශිල්පිනී කෞශල්‍යා ප්‍රනාන්දු

***බෞද්ධ සාහිත්‍ය හා සංස්කෘතික වටපිටාවක් තිබෙන රටක් තමයි අපේ රට. නමුත් අපිට දැන් කාලෙක ඉඳලා පේනවා රටේ දරුවන් ලිංගික අපයෝජනයට සහ හිංසනයට වැඩියෙන් ලක්වීමේ ප්‍රවණතාවයක්. ඇයි අපේ දරුවන් මෙච්චර අනාරක්ෂිත වෙලා තියෙන්නේ.***



කෞශල්‍යා ප්‍රනාන්දු

මම කුඩා කාලයේ මා සමග ආච්චි, සීයා, නෑදෑයෝ හිටියා. බොහොම සාමාන්‍ය, නිදහස්, ඉවසීමෙන් යුතු පරිසරයක් තිබුනේ. අපිට කියලා පෞද්ගලිකත්වයක් තිබුනේ නැහැ. ඔය ප්‍රයිවසි කියනඑක බටහිරෙන් ආපු එකක්. නමුත් දැන් අපි පෞද්ගලික වෙලා. අපි වෙන වෙනම න්‍යෂ්ටික පවුල්වලට කැඩිලා. පිට පළාත්වල ගොඩාක් රැකියා කරන අය කොළඹට ඇවිල්ලා ගෙවල් අරගෙන. දෙමව්පියෝ ගමේ එහෙමත් නැත්නම් වෙන තැනක. නෑදෑයෝ විසිරිලා වෙන රටවල්වල. අම්මයි තාත්තයි දෙන්නටම රැකියාවල් කරන්න සිද්ධ වෙච්ච තත්ත්වයක් අද තියෙන්නේ. දෙන්නගෙන් එක් කෙනෙකුට ගෙදර ඉන්න නම් ලොකු කැප කිරීමක් කරන්න සිද්ධ වෙනවා. මේ තත්ත්වයන් යටතේ සෑහෙන දුරට දරුවෝ තනිවෙලා තියෙනවා. දරුවෝ පාසල් යනවා, ඊට පස්සේ උපකාරක පන්තිවලට යනවා, එහෙම නැත්නම් දරුවෝ තනියම ගෙදර. මෙවැනි තත්ත්වයන් යටතේ දරුවෝ අනාරක්ෂිත තත්ත්වයක ඉන්නේ.

වර්තමානයේ තරුණ පිරිමි දරුවෝ සාමාන්‍ය පෙළ ලියපු ගමන් ත්‍රීවීලර් එකක් ගන්නවා. එතකොට අධ්‍යාපනය කියලත් අපි මොකක්ද

දෙන්නේ. අධ්‍යාපනය තුළින්වත් අපේ බුද්ධිය උද්දීපනය කරන්නේ නැහැ. දෙමව්පියන්ගෙන් දරුවන්ට ලැබෙන ආදරය සම්බන්ධයෙනුත් ප්‍රශ්න තියෙනවා. ආදරය ලබන්න වෙලාවක් තියෙනවද? දෙමාපියන්ට දරුවන්ට ආදරය කරන්න වෙලාව තියෙනවද? ඉස්සර පවුල්වල ආදරය කරනවා කියලා අතගගා ඉඹ ඉඹ හිටියේ නැහැ. නමුත් ඒගොල්ලන්ට ආදරය කිරීමේ ක්‍රම තිබුණා. එකට ළිඳට ගිහිල්ලා නානවා. අවුරුදු කාලෙට එකතුවෙනවා. අපිත් දැන් අවුරුදු කාලෙට එකට එකතුවෙනවා තමයි. නමුත් ඒක පොඩි සංදර්ශනයක් විතරයි. බෞද්ධගම තුළින්වත් ඒක හරියට ප්‍රායෝගිකව සිද්ධවෙනවා කියලා මම හිතන්නේ නැහැ. බණ කියනවා වුණාට ඒක අපි හරියට තේරුම් අරගෙන තියෙනවාද? දැන් පන්සලට ගිහිල්ලා සිල් ගන්නෙත් සංදර්ශනයකට. වැඩිහිටියෝ දැක්ක ගමන් වඳිනවා වගේ එයාලට අපි වඳින්නේ තමන්ගේ ඇතුළාන්තයෙන්ම ආ යුතු දෙයක් විදිහට. වැඩිහිටියෙක් වූ පමණින් අපි මැෂින් වගේ කඩාගෙන වැටෙනඑක වැරදියි. අන්න එවැනි තත්ත්වයක් තමයි ආගම සම්බන්ධයෙනුත් තියෙන්නේ. ඉතින් මෙවැනි තත්ත්වයක් යටතේ මිනිස්සු මානසිකවත් ගොඩක් පිරිහිලා ඉන්නේ. ආර්ථිකවත් ලොකු ප්‍රශ්න තියෙනවා. එතකොට ආර්ථික ප්‍රශ්න නිසා ඔවුන් මත්ද්‍රව්‍යයන්ට පෙළඹෙනවා. මත්ද්‍රව්‍ය නිසා ඔවුන්ට කල්පනාව නැහැ. මේ තමන්ගේ දරුවද, වෙනත් කාගෙවත් දරුවෙක්ද, එහෙම නැත්නම් දරුවෙක්ද, ගැහැණියක්ද කියන දෙයවත් ඔවුන්ට මතක නැහැ. මේ හැමදේම තමයි හේතුව.

අපි කලාව රසවිඳින්නවත් ඉගෙනගෙන නැහැ. චිත්‍රපටයක් බලලා රස විඳිනවා මිසක් ඒක අනුකරණය කළයුතු නැහැනේ. එවැනි දෙයක්වත් පාසලේදි උගන්වන්න වෙලා නැහැ. දරුවන්ට ඒකට වාඩි වෙලා විඳින්න වෙලාවකුත් නැහැ. ගුරුවරුන්ට ඒක සාවධානව පෙන්වන්න වෙලාවකුත් නැහැ. නැතිනම් අපිට මේ බේදවාචකයෙන් ගොඩඑන්න නිර්මාණ තුළින් විශාල වැඩක් ගන්න පුළුවන්. නමුත් ඒවා කරන්න, ඒවාට යොමු කරන්න කාටවත් වෙලාව නැහැ. දරුවන්ට වැඩිහිටියන්ට මේ වෙනුවෙන් එක පැයක් යොදා ගන්න, දරුවන්ට දෙමාපියන්ට එකතුවෙලා මෙයට පිළියමක් සොයන්න වෙලාවක් වගේම වුවමනාවක් නැහැ. මොකද අපිට තියෙන ලොකුම වුවමනාව තමයි හම්බ කරලා තමන්ගේ පාරිභෝජන භාණ්ඩ ටික එකතු කරගෙන තමන්ගේ පවුල පමනක් රැකගෙන, තමන් ආරක්ෂා වෙලා ඉන්න එක. හැබැයි ඒ

අස්සේ අපි පමණක් විනාශයට යනවා, අපේ දරුවන් විනාශයට යනවා කියලා කාටවත් පේන්නෙත් නැහැ.

***අපේ අධ්‍යාපන ක්‍රමය පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක් කරන්න ඕනෑ කියන එක නේද මේ කියන්නේ?***

අනිවාර්යයෙන්ම, මනුෂ්‍යයා හඳුනා ගන්න, මනුෂ්‍යයාට ආදරය කරන්න, සලකන්න, ගෞරව කරන්න, අධ්‍යාපනය වැදගත්. නුවර පැත්තේ පොදු වැසිකිළි තියෙන ස්ථානයක අමතර පන්ති යන තරුණ පිරිමි ළමයින්ව සෑහෙන අපයෝජනයට ලක් වෙනවා. ඒ කණ්ඩායම පොලිසිය විසින් අල්ලා ගත්තම එතැන ගුරුවරයෙකුත් ඉන්නවා. ඒ වගේම කොළඹ ප්‍රදේශයෙත් එක්තරා පාසලක ගුරුවරයෙක් මෙහෙම අහුවෙනවා. මේක අඩු වැඩි වශයෙන් හැම තැනකම තියෙන දෙයක්. ඒ අය අරගෙන ගිහිල්ලා දඬුවම් කළ යුතුයි. ඇයි මේ තත්ත්වයට ඔවුන් පත්වෙන්නේ. ඔවුන් ලබන අධ්‍යාපනය තුළ තියෙන්නේ යම්කිසි රාමුවකට කොටුවූ ප්‍රශ්න සහ උත්තර පමණක් තියෙන අධ්‍යාපනයක්. විශ්ව විද්‍යාලයට යන ගොඩාක් ළමයි පොත් කියවන්නේ නැහැ. අද දේශනයට විශ්ව විද්‍යාලයේ මගේ පන්තියේ ළමයි දොළොස් දෙනෙක් හිටියා, මම ඇහුවා නවකතා කියවනවද කියලා. තුන් දෙනයි නවකතා කියවන්නේ. එතනිනුත් ඊයේ පෙරේදා නවකතාවක් කියවලා තියෙන්නේ එක්කෙනයි. අනෙක් අය කැමති නැහැලු. සමහර අයට වෙලාව නැහැලු. ජීවිතය පිළිබඳව තමයි අපි මේවා තුළින් ඉගෙන ගන්නේ. අපිට අත්දැකීම් නෑ. අපි ජීවිතය පිළිබඳව දන්නෙ නැහැ. අපි ඒවයින් ඉගෙන ගන්නේ නැහැ. රස වින්දනයට අපිව යොමු කරන්නේ නැහැ.

***ළමා දූෂණයන් වැඩි වශයෙන් සිද්ධ වෙන්නේ පවුල් ඇතුළතමයි. ඒවා එළියට එන්නෙත් නැහැ. එතකොට මේ අය ජීවිත කාලයම එය දරාග න්නේ විශාල මානසික වේදනාවක් සහ පීඩනයක් සිතේ දරාගෙන.***

චිත්‍රපටයක් ආවා ස්පොට්ලයිට් කියලා. ඇමෙරිකාවේ යම් යම් පල්ලිවල පූජකවරුන්ගෙන් සිද්ධවුණ අපයෝජන ක්‍රියාවන් සම්බන්ධව. එක්තරා පුවත්පතක් ඉතාම නිර්භීතව මේ ප්‍රශ්නය සොයාගෙන ගිහිල්ලා ඔවුන්ව සමාජයට නිරාවරණය කළා. දැන් අපේ රටේ මෙවැනි චිත්‍රපටයක් කරන්න දෙයිද ? සමහරවිට අපි විශ්වාසම කරන තැනින් අපිට

අවාසියක් සිද්ධ වෙනවා. නමුත් අපිට ඒගැන කතා කරන්නත් බැහැ. ඇතැම් වෙලාවට දෙමාපියන් විසින්ම දරුවන් යම් යම් තත්ත්වයන්ට පත් කරනවා. ඒ ඔවුන්ට වාසි ලබා ගැනීම සඳහා. අනෙක් පැත්තෙන් මෙහෙම හිංසාවට ලක්වුණ දරුවන් සමාජයට එනකොට විශාල වෛරී තත්ත්වයකින් තමයි පසුවෙන්නේ. ඊළඟ පරම්පරාවට තමයි ඔවුන් මේදේ සිද්ධකරන්නේ. අපි අනෙක් හැම ප්‍රශ්නයක් දෙසම බලනවා වගේ, මේ ගැන බැලුවෙ නැත්නම් විශාල අසහනකාරී ව්‍යාධීන් සහිත පරම්පරාවක් ඇති වෙන්න පුළුවන් ඉදිරියේදී.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/1uIqAHknPfw

https://www.aithiya.lk/%e0%b6%89%e0%b6%af%e0%b7%92%e0%b6%bb%e0%b7%92%e0%b6%ba%e0%b7%9a%e0%b6%af%e0%b7%93-%e0%b6%85%e0%b7%83%e0%b7%84%e0%b6%b1%e0%b6%9a%e0%b7%8f%e0%b6%bb%e0%b7%93-%e0%b7%80%e0%b7%8a%e2%80%8d%e0%b6%ba%e0%b7%8f/

# 20. ලංකාවේ ප්‍රගතිශීලීන්ට ලිබරල්වාදයයි ප්‍රජාතන්ත්‍රවාදයයි අතර වෙනස වටහාගන්න බෑ

## දේශපාලන විශ්ලේෂක විදර්ශන කන්නන්ගර


විදර්ශන කන්නන්ගර

***පසුගිය ජනාධිපතිවරණය වනවිට ලංකා සමාජයේ තිබුණු මතය තමයි සිංහල ඡන්දවලින් පමණක් ජනාධිපතිවරයෙක් හදන්න බැහැ කියන එක. ඒ වගේම 2/3 ජනවරමක් සහිත පාර්ලිමේන්තුවක් මේ ඡන්ද ක්‍රමය තුළ හදාගන්න බැහැ කියලා කිව්වා. නමුත් ජනතාව එය වෙනස් කරලා පෙන්නුවා. ඒකට පසුබිම වුණේ සිංහල බෞද්ධ මතවාදය.***

ජනාධිපතිවරණය වගේම මහ මැතිවරණයේදීත් අපි දැක්කා අපි නොසිතූ ආකාරයේ විජයග්‍රහණයක් ගෝඨාබය රාජපක්ෂ මහත්තයටත් මහ මැතිවරණයේදී පොහොට්ටු පක්ෂයටත් ලැබෙනවා. සිංහල බෞද්ධ ඡන්ද පදනමෙන් ජනාධිපතිවරයෙක් පත්වීමයි, සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ 2/3ක බලයක් ලබා ගැනීමයි කියන එක අපි කොහොමද දේශපාලනිකව තේරුම් ගන්නේ. සිංහල බෞද්ධ වාර්ගික ජාතිකවාදය කාලාන්තරයක් තිස්සේ මහපොළොව තුළ දියත් කරලා, වාර්ගික පස මිතුරුතාවයන් වඩා සංකීර්ණ කරලා, වාර්ගික ආගමික බෙදීම් උත්සන්න කරලා තමයි මෙම ජයග්‍රහණය ලැබුවේ කියන එක තමයි බැලූ බැල්මට අපිට පේන්න තියෙන්නේ. නමුත් ඊට වඩා සංකීර්ණව මේක අපි තේරුම් ගන්න ඕනෑ. මෙහි ආරම්භය ඇති වෙන්නේ අපි හිතන හැටියට 2015 ඇතිවන යහපාලන සම්මුතිය හා ඒ තුළින් ඇති කළ එක්තරා ආවරණයක් තුළ. 2015 ජයග්‍රහණය අපි වටහා

ගන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ලිබරල්වාදය කියන සංකල්ප දෙක අතර තියෙන ආතතිය තුළ. 2015 වටහා ගන්නේ නැතිව අපිට 2020 වටහා ගන්න බැහැ. යහපාලනය තුළින් සිදුවූ එක දෙයක් තමයි ලිබරල්වාදී වටිනාකම් යම් කිසි විදිහකින් සාකච්ඡා වුණඑක. නමුත් දේශපාලනික වශයෙන් වරනැගුවට ප්‍රජාතන්ත්‍රවාදය කියන කලාපය එයින් නියෝජනය වුණේ නැහැ. ලංකාවේ ප්‍රගතිශීලීන් අතරත් ලිබරල්වාදයයි ප්‍රජාතන්ත්‍රවාදයයි අතර වෙනස ගැන නිශ්චිත අවබෝධයක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ මූලික වශයෙන්ම මහජන ස්වාධිපත්‍යය නියෝජනය වනවාද කියන එකයි, අනෙක් පැත්තෙන් ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් ආර්ථික සමානාත්මතාවය ක්‍රියාත්මක වනවාද කියන එකයි. මේ දෙක තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම් දෙක. 2015දි සිද්ධවුණේ මේ කියන පදනම් දෙක අර්බුධයට යාමක්.

***යහපාලන සමයේ අර්බුද ඇති වුවත් එම අවධියේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් සිද්ධ වෙනවා. නමුත් මේ මැතිවරණයේදී ජනතාව තීරණය කරනවා රටට බලය තියෙන විපක්ෂයක් අවශ්‍ය නැහැ කියලා.***

මම කලින් කිව්ව වගේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ලිබරල්වාදය අතර යම්කිසි ආතතියක් තියෙනවා. අපි මේක වටහා ගන්න ඕනෑ. 2015දී ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නම් කළ සමහර දේවල් ඇත්තටම ලිබරල්වාදී වටිනාකම් එක්ක සම්බන්ධ දේවල්. ප්‍රජාතන්ත්‍රවාදයේ ගැඹුරු අර්ථය ජනතාවගේ නියෝජනය, ස්වාධිපත්‍යය. මෙහිදී ජනතාවාදී ආර්ථිකය කියන කාරණා ඉෂ්ඨවුණේ නැහැ කියල මම කියන්නේ. උදාහරණයක් ගත්තොත් රනිල් වික්‍රමසිංහගේ එක්සත් ජාතික පක්ෂ පාලනය කියලා කියන්නේ ජනතාව මත පදනම් වූ පාලනයක් නෙවෙයි. පැහැදිළිවම එය පාලනය වෙන්නේ නව ලිබරල් ව්‍යාපාරික, ගෝලීය, තාක්ෂණික කළමනාකරණ පන්තියක වුවමනාවන් මත. රනිල් වික්‍රමසිංහට ඕනෑ නැහැ ජනතාව නියෝජනය කරන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයක්. ඔහු කළේ දේශපාලනික නොවන කළමනාකරණ දේශපාලනයක්. ඒ සාධකය බලපෑවා තවදුරටත් ජනතාව එවැනි පාලනයක් විශ්වාස නොකරන්න. විපක්ෂය ඉතාම දුර්වල වීමට බලපෑවේ ඒ අර්බුදය. යහපාලන ව්‍යාපාරය පැහැදිළිවම රනිල් වික්‍රමසිංහගේ නව ලිබරල් න්‍යාය පත්‍රයට ඌනනය වුණාට පස්සේ ඇතිවූ අභ්‍යන්තර බලපොරයත් එක්ක එජාපය අර්බුදයට යනවා. එක් තීරුවක් සමගි ජනබලවේගය

විදිහට එළියට යනවා. මේ සියලු තත්ත්වයන් දිහා බලන, සිංහල බෞද්ධ වාර්ගික පදනම් සහිත ජනතාවගේ පැත්තෙන් අපි හිතුවොත්, එයාලා කාටද ඡන්දේ දෙන්නේ? මේ තත්ත්වය මත තමයි ජනතාව දුර්වල විපක්ෂයක් හදන්නේ. ඒ වගේම ලක්ෂ විසිහතක් වගේ ප්‍රමාණයක් ඡන්දේ ප්‍රතික්ෂේප කිරීම ගැන අපි හරියට බැලුවොත් ඇයි එහෙම වුණේ? ජනාධිපතිවරණයේදී ගෝඨාභයට ලැබිච්ච ඡන්ද ප්‍රමාණය මහ මැතිවරණයේදී වැඩිවීමක් සිදුවුණේ නැහැ. මේ විජයග්‍රහණය සිද්ධ වුණේ විපක්ෂය (එවක ආණ්ඩුව) ජනතාවාදී නොවීමේ ගැටලුව මත. ජනතාවට තෝරා ගැනීමක් තිබුණා නම්, පොහොට්ටුවට මේවගේ ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ.

***චීනලංකා බල දේශපාලනය අස්සේ ඉන්දියාව සහ චීනය, ලංකාව සම්බන්ධයෙන් වැඩ කරන විදිහ අනුව තමයි ලංකාවට ඉස්සරහට යන්න වෙන්නේ. මේ තත්ත්වය තුළ ඔබ කියන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ලැබෙයි ද?***

රාජපක්ෂ පාලනය යටතේ වාමාංශික ප්‍රගතිශීලී කඳවුර බලාපොරොත්තු වන ආකාරයට ආර්ථිකය මූලික කරගත් සහ අනෙකුත් අංශවලටත් විහිදුනු ප්‍රජාතන්ත්‍රවාදයක් ලැබෙන්නේ නැහැ. එයට හේතුව තමයි ක්‍රමයේ අර්බුදය. අපි දන්නවා බලය ලබාගෙන තියෙන්නේ පැරණි ව්‍යාපාරික ප්‍රභූ පන්තියේ එක්තරා අලුත් නියෝජනයක්. ඡන්ද වලින් ඉදිරියට ආපු සියල්ලෝම බිස්නස්කාරයෝ. වාර්ගික ජාතිවාදය මතවාදීව පාවිච්චි කරමින් අලුතින් වර්ධනය වූ කොන්ත්‍රාත් ධනේෂ්වර තීරුවක් මේ. මේ ගොල්ලෝ අතින් ජනතාවගේ පැත්තට බලය ලබාදීමක් හෝ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයක් සිද්ධ වෙන්නේ නැහැ. හැබැයි බැසිල් රාජපක්ෂ මහත්තයා හරහා ආදායම් ප්‍රතිව්‍යාප්ත කිරීමේ හැකියාවක් තියෙනවා. ආර්ථිකයේ සංවර්ධනය නාමයෙන් වෙන්න පුලුවන් දේ තමයි කොන්ත්‍රාත්කාර ප්‍රතිසංස්කරණවල අතපල්ලෙන් වැටෙන ප්‍රතිලාභයන් අන්තිම පහළට කාන්දු වීමේ සූක්ෂම යාන්ත්‍රණයක්, සේවාදායක අනුග්‍රාහක සම්බන්ධයක් වැනි දෙයක් ඇතිවීම. මොකද ඔවුන් දන්නවා සිංහල බෞද්ධ වාර්ගික ජාතිකවාදයෙන් විතරක් ඔවුන්ගේ පාලනය පවත්වා ගන්න බැහැ කියලා. මොකද ඒකට විතරක් නෙවෙයි ජනතාව ආණ්ඩුවක් තෝරන්නේ, ආර්ථිකයේ සංවර්ධන ප්‍රතිලාභ පිළිබඳ බලාපොරොත්තුවකුත් ජනතාවට

තිබෙනවා. රාජපක්ෂ කණ්ඩායම දන්නවා ගමේ ඉන්න පහළ පාන්තික මනුස්සයාට ඒගොල්ලෝ විසින් ලාභය උපයන සංවර්ධන ක්‍රියාවලියේදී අතපල්ලෙන් වැටෙන දේ ඔවුන්ට සම්ප්‍රේෂණය කරන්න. ඒක අපි කියන ජනතාවාදී ආර්ථිකය නෙවෙයි.

***ලංකාවේ ඡන්දවලින් බහුතරය ග්‍රාමීය ඡන්ද. මේ ග්‍රාමීය ජනතාව තමයි මෙම පාලනය තෝරලා තිබෙන්නේ. ඒ වගේම එයාලගේ ප්‍රශ්න ගැන කතා කරන වාමාංශික ව්‍යාපාරය අර්බුදයකට ගෙනැවිත් තිබෙන්නේත් ඔවුන්.***

ලංකාවේ රනිල් වික්‍රමසිංහ වර්ගයේ විපක්ෂයන් පැවතීමේ ප්‍රතිඵලය තමයි රාජපක්ෂ වැනි අන්ත ජාතිවාදීන්ගේ මතුවීමට ඉඩ හදන්නේ. සිංහල බෞද්ධ වර්ගිකවාදය නිසාම නෙවෙයි ජනතාව ඔවුන්ට ඡන්දය දෙන්නේ. ඔවුන්ට තෝරා ගන්න බැහැ රනිල් වික්‍රමසිංහගේ ආර්ථික ඝාතන දේශපාලනය. නව ලිබරල් ආර්ථික මංකොල්ලයට යන්නේ නැතිව ජනතා සුබසිද්ධිය පිළිබඳ යම් මාත්‍රාවක් හරි පෙන්වනවා නම්, ඊනියා විපක්ෂයට පුළුවන් විකල්ප ධාරාවේ විපක්ෂ භූමිකාවක් කරන්න.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/QXee7QUYOnE

https://www.aithiya.lk/%e0%b6%bd%e0%b6%82%e0%b6%9a%e0%b7%8f%e0%b7%80%e0%b7%9a-%e0%b6%b4%e0%b7%8a%e2%80%8d%e0%b6%bb%e0%b6%9c%e0%b6%ad%e0%b7%92%e0%b7%81%e0%b7%93%e0%b6%bd%e0%b7%93%e0%b6%b1%e0%b7%8a%e0%b6%a7-%e0%b6%bd%e0%b7%92/

# 21. 20 වැනි සංශෝධනය සම්මත වුණොත් තොරතුරු අයිතියත් ඉවරයි

## නීතීඥ ජගත් ලියනාආරච්චි

***20වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා තොරතුරු අයිතියට කුමක් වෙයිද?***



නීතීඥ ජගත් ලියනාආරච්චි

19වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් තොරතුරු අයිතිය මූලික අයිතිවාසිකමක් විදිහට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු වෙනවා. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත මගින් මෙය යතාර්ථයක් බවට පත්වෙනවා. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බැලූ බැල්මටම තොරතුරු අයිතිවාසිකම පිළිබඳ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සඳහා බලපෑමක් කරලා නැහැ. එතකොට කෙනෙකුට බැලූ බැල්මටම පේන්නේ 20 වන සංශෝධනය මේ ආකාරයෙන්ම සංශෝධනය වුණත් තොරතුරු අයිතියට කිසිඳු බලපෑමක් සිදුවෙන්නේ නැහැ කියන එක. නමුත් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන හා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතේ ප්‍රතිපාදන එකටගෙන කියවා බලනවිට තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකමට මෙම සංශෝධනය මේ ආකාරයෙන්ම සම්මත වුණොත් බලපෑම් මතු වෙන්න පුලුවන්. මේ බලපෑම් අපට කිහිප ආකාරයකින්ම තේරුම් ගන්න පුලුවන්. එකක් තමයි තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම නියාමනය කිරීම සඳහා තිබෙන තොරතුරු අයිතිවාසිකම් කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසා හානිවෙන්න පුලුවන්. ඊට හේතුව අපේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ සඳහන් වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නිර්දේශ කරනුලබන කොමසාරිස්වරුන්

ජනාධිපතිවරයා විසින් පත්කළ යුතුයි කියලා. එතකොට 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යෝජනා කරලා තියෙනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කරලා, ඒ වෙනුවට කිසිඳු බලයක් නැති පාර්ලිමේන්තු සභාව නැමැති ආයතනක් පිහිටුවන්න. එම තත්ත්වය තුළ කොමිසමට පත්වෙන කොමසාරිස්වරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳව බරපතල තත්ත්වයක් මතුවෙන්න පුළුවන්.

තොරතුරු පනතේ තිබෙනවා තොරතුරු නොදීම, එහෙමත් නැතිනම් තොරතුරු දීමට බාධා කිරීම, යම් ආකාරයකට අකටයුතුකම් කරන නිලධාරීන් සම්බන්ධව තොරතුරු කොමිෂන් සභාවට හැකියාවක් තිබෙනවා එම නිලධාරීන් අයත්වන, ඒ නිලධාරීන් යටත්වන විනය බලධාරියා ට දැනුම් දෙන්නට හා ඒ සම්බන්ධව විමර්ශන සිදුකරලා කොමිෂන් සභාවට වාර්තා කරන්න. එතකොට බොහෝ විට මේ විනය බලධාරීන් වෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අධිකරණ කොමිෂන් සභාව හා ඒ වගේම තිබෙන කොමිෂන් සභා. ඒ කොමිෂන් සභාවලත් ස්වාධීනත්වය ඉතාමත් බරපතළ විදියට උල්ලංඝණය වෙනවා මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ ආකාරයෙන්ම සම්මත වුණොත්. එතකොට ඒ විදිහට බැලූවිට ස්වාධීන නොවන විධායකයට යටත් වූ කොමිෂන් සභාවලින් අර තොරතුරු අයිතිවාසිකම් කොමිෂන් සභාවට උපදෙස් දුන්නට, විමර්ශන සිදුකර වාර්තා කරන්න කියලා කීවට, ඒ ආකාරයෙන්ම සිදුවෙයි කියනදේ අපිට බලාපොරොත්තු වීමට බැරි වෙනවා. ඒ වගේම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට මෙම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකර තියෙන බලපෑම ඍජුවම අධිකරණයට බලපානවා. එතකොට අධිකරණයට බලපානවා කියන්නේ තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ තීරණයකට එරෙහිව අභියාචනා කිරීමේ හැකියාව තියෙන්නෙ අභියාචනා අධිකරණය සහ ඊට පසු ශ්‍රේෂ්ඨාධිකරණයට. එතකොට මේ ආයතනවල ස්වාධීනත්වයට බලපෑම් ඇති වෙනවා නම් එය ඍජුවම තොරතුරු අයිතිවාසිකමට බලපෑමක් ඇතිවෙනවා.

***මේ ව්‍යවස්ථාව සම්පාදනය කරපු පාර්ශ්වය ගෙනඑන තර්කය තමයි මේක මේ ජනාධිපතිවරයාට අවුරුදු එකහමාරක් විතර කාලයක් තුළ වැඩ කරන්න රට දියුණු කරන්න ගේන එකක් කියන එක. අවුරුදු එක හමාරකට පස්සෙ සම්පූර්ණ ව්‍යවස්ථාවම වෙනස් කරලා අලුත් ව්‍යවස්ථාවක් ගේනවා කියලා ඔවුන් කියනවා. ඒකේ ස්වරූපය***

***මොකක්ද කියලවත් සාකච්ඡාවක් නෑ. මේ සම්බන්ධව ඔබතුමාගේ අදහස මොකක්ද?***

නැහැ, මම ඒක විශ්වාස කරන්නේ නැහැ. එහෙම ටෙම්පරි සොලියුෂන් ගේන්න පුළුවන් එකක් නෙමෙයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයක් කියන්නේ පුළුල් විදිහට හිතලා බලලා කරන්න ඕනෑ දෙයක්. ඒක එක්තරා කාලයකට අදාළ විදිහට පුද්ගලයෝ දිහා බලලා කරන්න බැහැ. ඒ වගේම තමයි අපිට ඔය දැඩි බලධාරී නීති, තාවකාලිකව ගෙනආපු අවස්ථා තියෙනවා. ඉතිහාසයේදී තාවකාලිකව ගෙනාපු දැඩි මර්දනකාරී නීති එකක්වත්, ආයෙත් ආපසු හරවලා නැහැ. හොඳම උදාහරණය තමයි 1979 දී ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනත. එය ගෙන එන වෙලාවේ ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අමාත්‍යවරයා කිව්වේ මේකේ දැඩි බව සැබැයි, මේක ඉතාම දැඩි පනතක් අපේ මන්ත්‍රී කණ්ඩායමත් මේකට එච්චර කැමති නැහැ නමුත් මේක සම්මත කරලා දෙන්න, මේක ගේන්නේ වසර තුනක කාලයක් සඳහා පමණයි කියලා. වසර තුනකින් පස්සේ මේක ඉබේම අහෝසි වෙලායන ප්‍රතිපාදන පනතේ ඇතුළත් වෙලා තිබුණා. එවකට තිබුන පාර්ලිමේන්තුව මෙම පනත අහෝසි වෙලා යන තිබ්බ වසර 3 ඉවර වෙන්නේ 1982 මාර්තු මාසේ ඊට මාසෙකට විතර කලින් මේ පනතට සංශෝධනයක් ගෙනල්ලා වසර තුනක බලාත්මක වන කාලය කියන වගන්ති ඉවත් කලා. ඒ අනුව අද දක්වා අවුරුදු හතළිහකට වැඩි කාලයක් මෙම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත දැඩි මර්දනකාරී පනතක් විදිහට අපේ රටේ ක්‍රියාත්මක වෙනවා. මම කිසිසේත්ම එකඟ වෙන්නේ නැහැ දැඩි සංශෝධනයක් ගෙනල්ල අවුරුදු එක හමාරක් පවත්වාගෙන ගිහින් ඉන්පසුව හොඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේනවා කියන තර්කයට.

***නීතිඥවරයෙකු විදිහට දහනම වැනි ව්‍යවස්ථාව සහ විසි වැනි ව්‍යවස්ථාව ඔබ සංසන්දනය කරන්නේ කොහොමද?***

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දහනම වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනඑන්නේ විධායකයේ බලතල අඩු කරලා, එම විධායකයේ බලතල පාර්ලිමේන්තුවට සහ ස්වාධීන ආයතනවලට පවරන්න. නමුත් විසිවන සංශෝධනයයෙන් බලාපොරොත්තු වෙන්නේ ඊට හාත්පසින්ම වෙනස් දෙයක්. එම සංශෝධනය මගින් බලාපොරොත්තු වෙන්නේ විධායකය ශක්තිමත් කරලා, විධායකයට

තියෙන බැඳීම් අඩු කරලා පාර්ලිමේන්තුවේ සහ පෙරකියූ ස්වාධීන ආයතනවල තිබුනු නියාමන බලය ජනාධිපති වටා එකතු කර ගැනීම. එතකොට ඒ එකතු කර ගැනීම හරහා ජනාධිපතිවරයා වටා ඉතාමත් ශක්තිමත් ඒකාධිකාරයක් ගොඩනැගෙනවා. විශේෂයෙන් 1978 ව්‍යවස්ථාවේ මෙතෙක් නොවූ විරූ බලතල සහිත සුපිරි විධායකයක් මේ හරහා ගොඩනැගෙනවා. ඒ සුපිරි විධායකය ගොඩනැගෙනවා කියනඑකේ අනිත් අර්ථය තමයි අනෙකුත් ආයතන ඉතාමත් දුර්වල වෙනවා කියන එක. පාර්ලිමේන්තුව, කොමිෂන් සභා, අනෙකුත් නියාමන ආයතන, අධිකරණ ඉතාමත් දුර්වල අඩියකට පත් වෙනවා. ඒ දේ තමයි මේ ව්‍යවස්ථාවෙන් සිද්ධ වෙන්නේ. පාර්ලිමේන්තුව රබර් සීල් එකක් විතරක් වෙනවා.

***දැන් ගොඩක් දෙනෙක් කියනවා මේක ඇමරිකන් මොඩල් එක සහ ප්‍රංශ මොඩල් එකේ එකතුවක්. මේක සම්මත කරගත්තොත් රට සංවර්ධනය කරන්න පුලුවන් කියලා.***

එක පුද්ගලයෙක් වටා මෙහෙම අසීමිත බලයක් ගොඩනැගෙනකොට තනි තීරණ අරගෙන වේගයෙන් වැඩ කරන්න පුළුවන් කියන එක මම පිළිගන්නවා. හැබැයි ඒත් එක්කම අවශ්‍ය වෙන්නේ ඒකට අදාළ වන නියාමන ආයතන ශක්තිමත් කරනඑක. සරල උදාහරණයක් ගත්තොත් අපි වේගයෙන් පදින මෝටර් සයිකලය තිරිංග පද්ධතිය සහ ගියර් පද්ධතිය ඉතාමත් ශක්තිමත්ව තියෙන්න ඕනෑ. අපි වේගයෙන් යන්න ඕනේ කියලා බ්‍රේක් ගලවන් නෑනේ. අපි වේගයෙන් යන්න ඕනේ කියලා ගියර් පද්ධතිය අකර්මණ්‍ය කරන්නෑ නේ. අපිට වේගයෙන් යන්න ඕනේ නම් නියාමනය ශක්තිමත් ව තියෙන්න ඕනෑ. ඒ වගේම ස්වාධීනව තියෙන්න ඕනෑ. මෙතන ප්‍රශ්නයවෙලා තියෙන්නෙ විධායකයට විශාල බලයක් දෙන අතරතුර ඒ යම් යම් කාර්යයන්, විශේෂයෙන් විගණනය, අධිකරණය, පාර්ලිමේන්තු අධීක්ෂණය, මූල්‍ය පාලනය වගේ අංශ ඉතාමත්ම දුර්වල කරනවා. ඒක කිසිසේත්ම වේගවත් සංවර්ධනයකට හිතකර වෙන්නේ නෑ කියන එකයි මගේ අදහස.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/d75uHlzrXUE

https://www.aithiya.lk/20-%e0%b7%80%e0%b7%90%e0%b6%b1%e0%b7%92-%e0%b7%83%e0%b6%82%e0%b7%81%e0%b7%9d%e0%b6%b0%e0%b6%b1%e0%b6%ba-%e0%b7%83%e0%b6%b8%e0%b7%8a%e0%b6%b8%e0%b6%ad-%e0%b7%80%e0%b7%94%e0%b6%ab%e0%b7%9c%e0%b6%ad//

# 22. ජනතාව පාලකයන්ට බලය දෙන තරම් පහසුවෙන්, එය නැවත ලබා ගැනීමට බැහැ

## සාහිත්‍යවේදී කෞශල්‍ය කුමාරසිංහ



කෞශල්‍ය කුමාරසිංහ

***මුලින්ම අපිට කියන්නකෝ ඔබ කොහොමද මේ යෝජිතය විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ ඒ ආශ්‍රිත දේශපාලන තත්ත්වය තේරුම් ගන්න උත්සාහ කරන්නේ ?***

ව්‍යවස්ථා සංශෝධන සහ ජනතා කැමැත්ත අතර සම්බන්ධතාවයේ ඉතිහාසය හැදිල තියෙන්නෙ කොහොමද කියලා අපි දන්නවා. 1977 අතිවිශාල ජන වරමක් සමග ජේ. ආර් ජයවර්ධන ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත්වීමෙන් පස්සෙ හැදෙනවා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ඒ මොහොතේ තමයි මේ රටේ බලවත්ම පුද්ගලයා ගොඩනැගෙන්නේ. ජනාධිපතිවරයා කියන මේ භූමිකාව අතිශයින් බලවත් භූමිකාවක්. ඒක ගොඩනැගුන තැන පටන් ඒ කාලය පරික්ෂා කරල බැලුවොත්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතිවීමෙන් පසු කාලය උතුරත් දකුණත් ගිනිගත්ත කාලය කියලා අපි දන්නවා. ජන ජීවිතය මුහුණපාන බරපතළම ඛේදවාචකයන්ට මුහුණ දුන්න කාලයක් ඒක. ඊට පසුව එන සියලුම මැතිවරණවලදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම කියනදේ තීරණාත්මක සටන් පාඨයක් බවට පත්වෙනවා. 1978 අති විශාල ජන වරමක් දෙනවා සහ ඒ බලවත්ම පුද්ගලයා හදනවා, ඒ හදන්නේ ජනතාව. ඊට පස්සේ මේ භූමිකාව නැති කරන්න ඡන්දය පාවිච්චි කරනවා. ඉන්පසුව අපි දන්නවා ජනාධිපතිවරණයට තරග කළ කිසිම කෙනෙක් මෙම ධූරය ඉවත් කරන්න කැමති වෙන්නේ නැහැ, පත්වුණාට පස්සේ. අපි දන්නවා 2010

යුද්ධයෙන් පස්සේ ගත්තොත් නැවත වතාවක් අතිවිශාල ජන වරමක් සහිතව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාව බලයට පත් කරන්නේ ජනතාව. ඒ වෙලාවෙ තිබුන ජනතා කැමැත්ත දිහා බැලුවොත් ඒ තිබුණෙ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට අවශ්‍ය තරම් කාලයක් තමන්ගේ ධුරයේ ඉන්න, සැලකිය යුතු තරම් ජනතාවක් කැමතිවෙන වර්ගයේ ජනමතයක්. එහි ප්‍රතිපලය තමයි 18වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. එතකොට ඒකෙ තිබුණෙ අර කලින් තිබුනටත් වඩා ජනාධිපති ධුරයේ බලතල තවත් වැඩි කරමින් ධුර කාලය අසීමිත කරමින් ගෙනඑනු ලැබූ සංශෝධනයක්. එතකොට ඒකටත් අපිට පේනවා ජනතා කැමැත්තක් තියෙනවා.

2015 ජනාධිපතිවරණය සහ ඊට පස්සේ මහ මැතිවරණය ආශ්‍රිතව පාර්ලිමේන්තු මැතිවරණය ගම්මු, මේකෙදි සිද්ධවෙන්නේ යම් විදිහක ප්‍රජාතන්ත්‍රවාදය කේන්ද්‍ර කරගත් බලය බෙදීම, දූෂණ අවසන් කිරීම, මානව හිමිකම් සුරැකීම මේ වගේ දේවල් කේන්ද්‍ර කරගෙන මැතිවරණ ව්‍යාපාරය ගොඩනැගීම. එහි ප්‍රතිපල විදිහට 18වෙනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසිකරලා 19 සංශෝධනය ඇති වෙනවා. ඒක සම්පූර්ණයෙන්ම 18වෙනි සංශෝධනය ඉවත්කරලා ජනාධිපතිවරයාට තිබූ බලතල පාර්ලිමේන්තුව සහ අගමැතිවරයාට බෙදාහරින සංශෝධනයක් බවට පත් වෙනවා. ඊළඟට දැන් මොකද වුණේ, දැන් නැවතත් ජේ ආර්ටත් එහාට ගිය ව්‍යවස්ථාවක් හදාගෙන තිබෙනවා. මම කියන්නේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන්නේ නැවත යම්කිසි විදියකට 18ට සමාන ඉතාම දැඩි විදියට ජනාධිපතිවරයා වෙත බලතල සංකේන්ද්‍රණය කරන, ඒකාධිපති පාලනයක් කරා යා හැකි ව්‍යවස්ථා සංශෝධනයක්. ඒකටත් ජනතා කැමැත්තක් තියෙනවා කියනඑක තමයි අපිට කියන්න පුළුවන්. ලංකාවෙ ව්‍යවස්ථා සංශෝධනයකට අදාළව ජනමතය හැසිරෙන ආකාරය විහිළු සහගතයි. හැබැයි මේක සිද්ධ වෙන්නේ සමාජයක ජනතාවගේ කැමැත්ත නිසාම නෙමෙයි. ඒක සිද්ධ වෙන්න ඒ පාලන තන්ත්‍රයේ ස්වරූපය බලපානවා. විශේෂයෙන්ම 2015 පත්වෙච්ච ආණ්ඩුව හැසිරුණු ආකාරය මේ විදියට 19 සංශෝධනය ඉවත් වෙලා විසිවෙනි සංශෝධනය පැමිණීමට සහ එයට ජනමතයක් ඇති වෙන්න බලපානවා.

මම හිතන්නේ අපි ඉතාම තදින් සිහිය තබාගන්න ඕන එකක් තමයි අපිට මේ විදියට අපි සතු බලය දෙන්න පුළුවන් පාලකයින් වෙත, නමුත් නැවත බලය ලබාගන්න බැහැ ඒ තරම් පහසුවෙන්. අපි හිතමු දහනව වන ව්‍යවස්ථා සංශෝධනය මගින් සිද්ධවෙන්නේ ජනාධිපති සතු බලතල යම් ආකාරයකට සංවරණ සහ තුලන ක්‍රමයකට යටත් කරන එක කියලා. එතකොට දැන් මේ කියා හිටින්නෙ මෙහෙම එකක් අවශ්‍ය නෑ. ඇයි එහෙම කියන්නේ, මූලිකවම එහිදී යම් ආකාරයට යුක්තිය පිළිබඳ ව සමාජ අසාධාරණය පිළිබඳ ව සලකා බැලීම සඳහා වන ප්‍රමාදය සංවර්ධනයට හිතකර නැහැ කියලා තමයි මේ කියන්නේ. එතකොට ඒ දේවල් කරන්න අවශ්‍ය මේ ආකාරයේ අතිශය බලවත් භූමිකාවක්. නමුත් මම හිතන්නේ අපි කවුරුත් දන්නෙ නැහැ අපි මේ ඉල්ලා හිටින සංවර්ධනය මොකක්ද කියලා. ඉතින් මම හිතනවා විසිවෙනි සංශෝධනය කියන එක පොදුජන කැමැත්ත එක්ක ගැට ගැහිලා තියෙන්නේ ස්ථාවර රටක්, ස්ථාවර සංවර්ධනයක් කියන කාරණයත් එක්ක. සංවර්ධනය කියන්නේ හරි මැජික් වචනයක්. අපි කවුරුත් දන්නෙ නැහැ මොකක්ද මේ සංවර්ධනය කියන්නේ කියලා. ඒ වෙනුවෙන් අපි අපේ නිදහස බන්දේසියක තියලා දෙනවා තනි පාලකයකුට. ඒක දෙන තරම් පහසුවෙන් අපිට නැවත ලබාගන්න නම් ලැබෙන්නේ නැහැ.

***පසුගිය ජනාධිපතිවරණය සහ මහ මැතිවරණයේදී විශාල බලපෑමක් කරයි කියලා බලාපොරොත්තු වුණ ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ජාතික ජන බලවේගය, ඇයි ඔබ හිතන විදියට ඔවුන් අපේක්ෂා කරපු තරම් හොඳ ප්‍රතිපලයක් ලබා ගන්න අසමත් වෙන්නේ?***

මම හිතන්නේ ජනතා විමුක්ති පෙරමුණ සතුව තිබුණා නම්, යම් ආකාරයට අපි කියන විදිහේ ඡන්ද පදනමක් ඒකෙ යම් කිසි අඩු වීමක් සිද්ධ වෙලා තිබෙනවා. සමහරවිට ඒක තුළ තිබුණ සංයුතියේ වෙනස් වීමක් සිදුවෙලා තියෙන්න පුළුවන්. වෙනත් සමාජ කණ්ඩායමක් ජනතා විමුක්ති පෙරමුණ සහ ඒ වටා හැදෙන ජාතික ජන බලවේගය වෙත ඇදෙන අතර සමහරවිට සාම්ප්‍රදායිකව එකට සහයෝගය දුන්න යම් සමාජ කණ්ඩායම් ඉවත් වීමක් වෙලා තියෙන්න පුළුවන්. මොකද අපි දන්නවා පහුගිය දේශපාලන ඉතිහාසය දිහා බැලුවම ජනතා විමුක්ති

පෙරමුණ ඉතාම ප්‍රබල විදියට රැඳිලා හිටපු ජාතිකවාදි ස්ථාවරයෙන් ඔවුන් වෙනස් වුණා. එතකොට මේ යුගය ලංකාවේ දේශපාලනය තුළ තාමත් බොහොම අධිපති දහරාව විදිහට තියෙනවා සිංහල බෞද්ධ ජාතිකවාදී දහරාව. එතකොට යම් විදියකට ජවිපෙ සිදුවුණු මතවාදීමය පෙනීසිටීම්වල ඇතිවූ වෙනස්කම් නිසා අර සාම්ප්‍රදායිකව ජවිපෙ වෙත ආකර්ෂණය වෙලා හිටපු සමහර සමාජ කණ්ඩායම් ඉවත් වෙන්නත්, කලින් ආකර්ෂණය නොවී සිටි කණ්ඩායම් මේ තුළට පැමිණීම සිද්ධ වෙන්නත් ඇති කියන එක තමයි අපි විශ්වාස කරන්නේ.

මේ වෙලාවේ ඉතා විශාල මූල්‍ය බලයක් තියෙන කඳවුරකට පුළුවන් මේ මාධ්‍ය ගෝලය හසුරවන්න. ඉතින් එහෙම වෙනකොට යම් විදිහකට ජවිපෙ තුළ ජාතික ජන බලවේගය කියන්නේ මොකක්ද කියන අදහස, ඔවුන් පෙනී ඉන්නේ කුමක් වෙනුවෙන් ද කියන පණිවිඩය පවා ඉතාම දැඩි අන්දමින් වෙනස් කරන්න හැකියාවක් මෙයට ලැබෙනවා. එතකොට සමහරවිට අර ජනතා විමුක්ති පෙරමුණට කලින් ආකර්ෂණය වෙලා හිටපු සමහර සමාජ පන්ති දුරස්වීමක් සිදුවෙන්න පුලුවන්. මේක තදින් සිද්ධ වෙච්ච දෙයක්. ඒකත් එක්ක හැප්පෙන්න තරම් හැකියාවක් ජාතික ජන බලවේගයට තිබුණෙ නෑ. මොකද විද්‍යුත් මාධ්‍ය, පුවත්පත් ගත්තාම ඉතාම සුළු පුවත්පත් කිහිපයක් විතරයි මේකේ සැබෑ තත්ත්වය පැහැදිලි කරන්නේ. එතකොට ඒ පුවත්පත් සමහර වෙලාවට ජනතාව අතරට යන්නෙත් නැහැ. ඉතින් ඔය වගේ තත්ත්වයක් තුළ මම හිතන්නේ මේ ප්‍රතිඵලය ගැන පුදුමයට පත් වෙන්න දෙයක් නැහැ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/eJBqwPYP6MU

https://www.aithiya.lk/kaushalya-kumarasinghe-currunt-poloticle-situation-in-sri-lanka/

# 23. අපි කරන්නේ, කාලෙන් කාලෙට එකතුවෙලා කෑගහන එක

## කුමුදු කුමාරසිංහ (රංගන ශිල්පිනී)



කුමුදු කුමාරසිංහ

අපි 2020 වර්ෂය අරගෙන බැලුවොත් අනෙකුත් අවුරුදු එක්ක සංසන්දනය කරාම අපිට පේනවා ළමා අපයෝජන සිද්ධීන්ගේ පැහැදිලි වැඩිවීමක්. සියලු රටවල් පෙරළගෙන අපේ රට මේ අංශයෙන් ඉස්සරහට ඇවිත් තිබෙනවා. අපි මේ දවස්වල කියනවා වන සම්පත රැකගනිමු, ඊළඟට අපි කියනවා දේශීය කර්මාන්තය නඟා සිටවමු කියලා. මේ වගේ අපි කාලෙන් කාලෙට එක එක දේවල් ගැන කතා කරනවා, ඒ වෙනුවෙන් පෙනී සිටිනවා, මට තියෙන ප්‍රශ්නය තමයි අපි මේවගේ ලොකු වටිනාකමක් දෙනවද කාන්තා ප්‍රශ්නවලට ඔවුන්ගේ ගැටලුවලට, ඊළඟට ළමයින්ගේ ප්‍රශ්නවලට. නැහැ. අපිට සමාජයක් විදිහට හරිම අඩු අවධානයක් තමයි මේ සම්බන්ධයෙන් තියෙන්නේ. අපි මෙහෙම හිතමු, අපි දන්නවා ලංකාවේ මේ වෙනකොට විශාල ප්‍රශ්නයක් තමයි ළමා අපයෝජනයන්, නමුත් කවුද මේගැන බරපතළ විදිහට සංවාදයක් කරන්නේ? ඒ වෙනුවට අපි කරන්නේ, කාලෙන් කාලෙට යම් යම් සිද්ධීන්වලදි කණ්ඩායම් විදිහට එකතුවෙලා කෑගහන එක, උද්ඝෝෂණය කරන එක, ටික කාලෙකින් ඒ හැඬ වියැකී යනවා. ආයි සිද්ධියක් ආවාම ආයිත් මතුවෙලා කෑගහනවා.

ඔබට මතකනම් පහුගිය කාලේ අර කුඩා දරුවෙක් අපයෝජනය කරන වීඩියෝවක් සමාජ මාධ්‍යයේ සංසරණය වුණා, අපි ඒ වෙලාවේ ලොකු හඬක් ඒ වෙනුවෙන් නැඟුවා, ඒක බොහොම හොඳ දෙයක් වගේම ඒ

වෙලාවේ කළයුතු දෙයක්, නමුත් ප්‍රශ්නය තමයි ඊට පස්සේ ඒ සිද්ධියට මොකදවුණේ කියලා අපි සොයා බැලුවද කියන දේ. ඇත්තටම මොකද වුණේ ? ඒ සිද්ධියට කෙනෙක් අත්අඩංගුවට ගත්තා කිව්වා, ඊට පස්සේ කොරෝනා රැල්ල එක්ක ඒකට වුණ දෙයක් නැහැ. ස්ත්‍රීන්, ළමයින් වෙනුවෙන් එන එවැනි ප්‍රශ්න කොහොමද අනෙකුත් ප්‍රශ්න අතර අමතක වෙන්නේ? ඊළඟට කාන්තාවකට හෝ ළමයෙකුට අතවරයක් වුණාම ශාරීරික හිංසනය තමයි ගණනය වෙන්නේ, එතකොට මානසික හිංසනයක් ඒ සිද්ධියේදී ඒ කාන්තාවට හෝ දරුවාට වෙන්නේ නැද්ද? අපි ඇයි ඒක ගැන තක්සේරුවකට නොයන්නේ. මට හිතෙන්නේ මෙවැනි සිද්ධියකදී ශාරීරික හිංසනයට වඩා මානසික හිංසනය ප්‍රබලයි. ඒකනිසා ළමයෙක් හෝ කාන්තාවක් ජීවිත කාලේම අබාධිතයෙක් වෙන්න පුලුවන්. ඒ සිත් තැවුලෙන් ඔහු හෝ ඇය මුලු ජීවිත කාලෙම ගෙවා දමන්න පුලුවන්. ඊට පස්සේ මෙවැනි මානසික පීඩනයකින් ඉන්න දරුවෙක් සමාජයට ආවට පස්සේ සමාජයට මොකද්ද වෙන්න පුලුවන් බලපෑම? ඇයි අපි ඒ ගැන හිතන්නේ නැත්තේ.

අපි දන්නවා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ජනාධිපති වෙන්න තරඟ කරනකොට මොකද්ද කිව්වේ? ඔහු කිව්වේ එක නීතියක් එක රටක් කියලා. ඊළඟට විනය ගරුක රටක් හදනවා කියලා කිව්වා. මෙහෙම කිව්ව නිසා මම පුද්ගලිකව විශ්වාස කළා මේ පුද්ගලයා ජනාධිපති වුණාම ළමා අපයෝජන සිද්ධි අඩුවෙයි, ඔහු මේවට විරුද්ධව යෝධ පියවරක් ඉස්සරහට තියයි කියලා. අඩුම තරමින් මිනිස්සු ඔහුගේ විනයගරුක රටට බයවෙලා හරි මේ දේවල්වලට යොමුවෙන එක අඩුවෙයි කියලා. ඒත් එහෙම වුණේ නැහැ. ඒ වෙනුවට මහපාරේ දෙනෝදාහක් බලාගෙන ඉදිද්දි මිනිස්සු මරණ තැනකට රට ගියා. ඒක තමයි අන්තිමට වුණේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/XsoyRTtZ5Qk

https://www.aithiya.lk/child-abuse-in-sri-lanka/

# 24. ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා කාන්තාවන් ලිංගික හිංසනයට ලක්වෙලා

## විමුක්ති ද සිල්වා (ලා වියා කැම්පසිනා සුළු ගොවි ව්‍යාපාරයේ ජාත්‍යන්තර කමිටු සාමාජිකා)


විමුක්ති ද සිල්වා

ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා මේ වෙනකොට 204ක් පුද්ගලයෝ සියදිවි හානිකරගෙන තිබෙනවා කියලා අපිට වාර්තා වෙනවා. විශාල වාර්තාවීම් ප්‍රමානයක් තිබෙන්නේ උතුරු සහ උතුරු මැද පළාත්වලින්. මුලතිව් වගේ කලාපවල යුද්ධයෙන් අනාථභාවයට පත් වැන්දඹු කාන්තාවන් ණය ගෙවාගන්නට බැරි වුණාම එන ලිංගික අඩත්තේටම්වලට, ලිංගික හිංසනයට ලක්වෙලා තිබෙනවා. මේ තත්ත්වයන් නිසා එන පීඩනය දරාගන්නට බැරුව සමහර කාන්තාවන් සියදිවි හානිකරගෙන තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රිකය අස්සේ මේ ණය ක්‍රමය දැන් හඳුන්වන්නේ 'ඇඳ ණය' කියලා. ඒකෙන් හැඟවෙනවා මේ ව්‍යසනය දැන් සමාජය මත තිබෙන්නේ කුමනාකාර මට්ටමකද කියලා.

කවුද මේ ණය අරගෙන තිබෙන්නේ? ඇයි මේ ණය අරගෙන තියෙන්නේ? මේක වැදගත් ප්‍රශ්නයක්. ග්‍රාමීය කාන්තාව කියන්නේ බොහෝම අමාරුවෙන් ජීවත්වෙන චරිතයක්. ඇය හිටගෙන ඉන්නේ අමාරු උහුලන්නට බැරි ආර්ථික කොන්දේසි රැසක් උඩ. නමුත් ලංකාවේ සමස්ත ආර්ථිකය ගත්තොත් ඔවුන් තමයි ඇත්තටම ගාර්මන්ට්වලට ගිහිං, රැකියා සඳහා විදෙස් ගතවෙලා, මේ ආර්ථිකය දුවවන්නේ. එහෙම කාන්තාවට අද වෙනකොට ක්ෂුද්‍ර මූල්‍ය ණය බරත් දැනෙන්න පටන් අරගෙන. අද ඇය මේ ණය ව්‍යසනයේ

කොටස්කාරියක් වෙලා. මේ වෙනකොට කාන්තාවෝ ලක්ෂ 24ක් මෙම ණය ක්‍රමයට හසුව ඉන්නවා. මේ අතරින් මම මුලින් කිව්වා වගේ 204ක් කාන්තාවෝ සියදිවි හානිකරගෙන තිබෙනවා.

මේ ණය සංකල්පය එන්නේ මොහොමඩ් යූනුස් කියන බංගලිදේශ ආර්ථික විද්‍යාඥයාගෙන්. ඔහුගේ මේ සංකල්පය තමයි ග්‍රාමීන් බැන්ක් කියලා කියන්නේ. මෙහිදී ප්‍රධාන වශයෙන් කාන්තාවන්ට තමයි ණය දෙන්නේ. එතකොට කණ්ඩායමකට තමයි ණය දෙන්නේ. ඔවුන් ණය ලබාගැනීමේදී වගේම ගෙවීමේදී ද එකිනෙකාට වගකිව යුතුයි. එල් ඕ එල් සී, එච් එන් බී ග්‍රාමින්, බිම්පුත්, වගේ සමාගම් එකළොස්දාහත් පහළොස්දාහත් අතර ප්‍රමාණයක් මේ වනවිට ලංකාව තුළ මේ ණය ක්‍රමය ක්‍රියාත්මක කරමින් ඉන්නවා. මෙයින් පේනවා ලංකාව තුළ මේක විශාල ආයෝජන කළාපයක්. මේ ඔස්සේ සමාගම් විශාල ලාභයක් අතපත් කරගනිමින් ඉන්නවා. මේ ණය දෙන්නේ ස්ව-රැකියා අරමුණක් ඇතුව. දුප්පත්කම දුරලීම ප්‍රධාන අරමුණ කියලා තමයි මේ ක්‍රමය හඳුන්වා දුන් මහාචාර්යවරයාගේ අදහස. ඒත් කියන්න කනගාටුයි අද වෙනකොට දුප්පත්කම, දරිද්‍රතාවය තවතවත් වැඩි කරන තත්තවයක් තමයි මේ ඔස්සේ සමාජය තුළ නිර්මාණය වෙලා තිබෙන්නේ.

මෙහිදී ඔවුන් අත්සන් කරන ලියුම් ඉංග්‍රීසි භාෂාවෙන් තමයි මේ ආයතන ලබා දෙන්නේ. ණය කොන්දේසි වගේ දේවල් ගැන, පොලිය ගැන කිසි දෙයක් මේ කාන්තාවන් දන්නේ නැහැ. මේ වෙනකොට ලංකාවේ අයකරගන්න පුලුවන් පොලිය විදිහට රජය කියන්නේ 35%යි. නමුත් මෙම සමාගම් 220%ක වගේ ඉතාමත් ඉහළ පොලියක් මේ ණය සඳහා අයකරමින් ඉන්නවා. මේවා සති ණය විදිහට තමයි ක්‍රියාත්මක වෙන්නේ, එතකොට ඇත්තටම මේ කාන්තාවන්ට පොලිය ගැන අදහසක් නැහැ. තමන් ගත්ත ණයට පොලිය හැදෙන්නේ කොහොමද කියලා මේ කාන්තාවන් දන්නේ නැහැ. ඒ නිසාම ඔවුන් එක ණයක් ගෙවාගන්න තවත් ආයතනයකින් ණය ගන්න මට්ටමට වැටිලා තියෙනවා.

මේක 2017 වෙනකොට තමයි විශාල අර්බුදයක් බවට සමාජයට පේන්න ගන්නේ. ඒක එහෙම වෙන්නේ උතුර සහ උතුරු මැද කාන්තාවන් විශාල වශයෙන් සියදිවි නසාගන්න තත්ත්වයට යැමත්

සමග. මෙහිදී මේ පළාත්වල කාන්තාවන් එකතුවෙලා රජයට කියා සිටිනවා තමන්ට තවදුරටත් මේ ණය ගෙවාගෙන යන්න ශක්තියක් නැහැ කියලා. මේ තත්ත්වය එක්ක තමයි එවක අගමැති රනිල් වික්‍රමසිංහ දිස්ත්‍රික්ක පහක කාන්තාවන් විස්ස බැගින් හමුවෙලා, ඔවුන් සමග මේගැන සාකච්ඡා කරන්නේ. මේ කාලෙදීම, ඒ කියන්නේ 2018 දී ලංකාවට එනවා වොආන් පැබ්ලෝ කියලා ආර්ථික සහ සමාජීය විශේෂඥයෙක්. ඔහු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයෙක්. ඔහු මේ ගැටලුව ලංකාවේ තිබෙන විශේෂම ආර්ථික ප්‍රශ්නයක් විදිහට දකිනවා. ඒ සමග ඔහු අවධාරණය කරනවා මේ ප්‍රශ්නයට ඉක්මන් විසඳුම් අවශ්‍යයි, මේ කාන්තාවන් සවිබල ගන්වන්න නම් වහාම ලක්ෂයක් දක්වා වන ණය කපා දැමිය යුතුයි කියලා. ඒ වගේම ඊට ඉහළ ණය ගෙවීම සඳහා සහන කාලයක් ලබාදිය යුතුයි කියලා. ඒ සමග තමයි මහා බැංකුව දිස්ත්‍රික්ක 12ක 45139ක් දෙනාගේ ලක්ෂයට අඩු ණය කපාදමන්නට පියවර ගන්නේ. නමුත් ප්‍රශ්නය තවමත් එතනමයි.

අපගේ යෝජනාව තමයි රාජ්‍ය බැංකු පරිදියේ ජීවත්වෙන මිනිස්සු වෙත ලං කරන්න කියන එක, ඔවුන්ට ස්ව-ශක්තියෙන් නැඟිටින්න දිරියක් දෙන්න සංකීර්ණ නොවෙන ණය වැඩසටහන් සහ ව්‍යාපෘතීන්වලට යන්න රජය මැදිහත් වියයුතුයි කියලා. ඒ වගේම කාන්තාවන්ටම වෙන්වුණ බැංකුවක් නිර්මාණය කරන්න කටයුතු කළ යුතුයි. අපිට පේනවා ගොවිතැනෙන් ජීවත් වෙන පුද්ගලයන් සහ පවුල් තමයි වැඩි වශයෙන් මේ ණය ව්‍යසනයේ ගොදුරු වෙලා තියෙන්නේ, ඒ නිසා අපිට තිරසර ගොවිතැනක් සඳහා යන ගමනක් අවශ්‍යයි. ඒ සඳහා අපගේ යෝජනාව නම් කාන්තා ගොවි සමූපාකාර ක්‍රමයක් ගොඩනැඟිය යුතුයි. අවසානයේ අපි ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කළේ නැත්තං හැමදාම මේ මිනිස්සුන්ගේ ප්‍රශ්නය එකම තැන තිබේවි. එහෙම වුණොත් තමයි මේ ගිනි පොලී ණයකාරයන්ගේ ගොදුරු බවට මේ කාන්තාවන් පත්වෙන්නේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/TgEz0hC6vRM

https://www.aithiya.lk/women-are-being-sexually-abused-because-of-micro-finance-loans/

# 25. මේ වසංගතය නිසා ඩොලර් බිලියන එකොලහක විදේශ විනිමයක් අහිමිවෙයි කියලා අපි හිතනවා

## බලපත්‍ර ලත් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන සංගමයේ ලේකම් එම්.එෆ්.එම්. අර්ෂාඩ්


එම්.එෆ්.එම්. අර්ෂාඩ්

***කොරෝනා වසංගත තත්ත්වය හමුවේ විදේශ රැකියා ක්ෂේත්‍රයේ අලුතින් ඇතිවී තිබෙන ගැටලු මොනවාද ?***

මැදපෙරදිග කළාපයේ සේවය කරනු ලබන ශ්‍රමිකයන් විසින් වාර්ෂිකව දළ දේශිය නිශ්පාදිතයට 8% ක දායකත්වයක් හා වෙළඳ ශේෂයෙන් 84% ක ප්‍රමාණයක් නියෝජනය කරනවා. කිසිදු රාජ්‍ය හෝ පුද්ගලික ආයතනයක ආයෝජනයකින් තොරව බලපත්‍ර ලත් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන සංගමය විසින් වාර්ෂිකව ඩොලර් බිලියන 7 වැටුප් ප්‍රමාණයක් හා සේවකයින් පිටත්කර හැරීම් වෙනුවෙන් ඩොලර් බිලියන 3ක් වශයෙන් ඩොලර් බිලියන 10 විදේශ විනිමය ප්‍රමාණයක් පසුගිය වසර පහක කාලය පුරාවට මෙරට ආර්ථිකයට ලබාදීලා තිබෙනවා. මේ වනවිට මෙරට ශ්‍රමිකයන් මිලියනයක පමණ පිරිසක් විදේශ රැකියාවක්හි නිරතව සිටිනවා. කොවිඩ් වසංගතය හේතුවෙන් විශේෂයෙන්ම මැදපෙරදිග කළාපයේ සේවයේ නියුතු ශ්‍රමිකයින් නැවත මෙරටට ගෙන්වා ගැනීම හා නිරෝධානය කිරීම සම්බන්ධයෙන් රජය යම් අපහසුතාවයකට පත්ව ඇතිබව පේනවා. මේ ශ්‍රමිකයින් මෙරටට ගෙන්වා ඔවුන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් රජය මෙතෙක් සාධනීය ක්‍රියාමාර්ග යක් අරගෙන නැහැ. අපි අපේ ආයතනය හරහා විදේශ ගතවුණ

ශ්‍රමිකයින්ගේ තත්ත්වය නිරන්තරව සොයා බලමින් සිටිනවා. ඒ අනුව මේ වසංගතය එනකොට ගිවිසුම් කාලය අවසන් වු ශ්‍රමිකයින් සම්බන්ධයෙන් අදාළ සේවායෝජකයන් සමග සාකච්ඡා කරලා ගිවිසුම් අළුත්කර රැකියා සුරක්ෂිත කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරලා තිබෙනවා, අනෙක් පැත්තෙන් ශ්‍රමික පවුල්හි සාමාජිකයන් සමග සාකච්ඡාකර තත්ත්වය පැහැදිලි කිරීම හේතුවෙන් විදේශ රැකියාවන්හි නිරත වූ පිරිස් අතරින් නැවත මෙරටට පැමිණීමට ඉල්ලීම් කරන ලද පිරිස ක්‍රමක් ක්‍රමයෙන් අඩු කිරීමට කටයුතු කළා.

***විදේශ ශ්‍රමිකයින්ගෙන් 70%ක් පමණ ගෘහ සේවික කාන්තාවන්, මේ කොරෝනා වසංගතය නිසා ඔවුන් පත්ව ඇති තත්ත්වය කොහොමද? අපි දිනෙන් දින දකිනවා ඕමානය වගේ රටවල සිටින කාන්තාවන් තමන්ව ගෙන්නගන්න කියලා උද්ඝෝෂනය කරනවා.***

කොරෝනා වසංගතය හේතුවෙන් මෙරට ගෘහ සේවිකාවන් අවදානමකට ලක්වී නැහැ. ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය ආරක්ෂා කරගන්න අපි කටයුතු කරලා තිබෙනවා. මේ වනවිට ඔවුන්ගේ වැටුප් වැඩි කිරීමට පවා සේවා යෝජකයින් එකඟ වෙලා තිබෙනවා. නීත්‍යානුකූල පිටත්වීම් සිදුකර ඇති ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව තහවුරු කරලා තිබෙනවා.

***විදේශ සේවා නියෝජිත ආයතන මැදපෙරදිග කළාපයට ගෘහ සේවිකාවන් පිටත්කර හැරීමේදී සේවා යෝජකයාගෙන් විශාල මුදලක් ලබාගෙන මිනිස් ජාවාරමක නිරතවන බවට පසුගිය කාළයේදී විශාල චෝදනාවක් එල්ලවුණා***

මේ වනවිට ශ්‍රී ලාංකික කාන්තාවන්ට තමයි මැදපෙරදිග කළාපයේ වැඩිම ඉල්ලුම තියෙන්නේ. ඉල්ලුමට සරිලන සැපයුම අඩුවීම හේතුවෙන් ගෘහ සේවය වෙනුවෙන් පිටත්වන කාන්තාවක් පිටත්වීමට ගිවිසුම් ගතවීමෙන් පසුව සේවා යෝජකයා විසින් ලබාදෙනු ලබන මුදලින් 70% පමණ ප්‍රමාණයක් ඔවුන්ගේ ගැටලු යම් මට්ටමකට විසඳාගැනීමේ අරමුණින් ලබාදෙනවා. මේ නිසා මේ කාන්තාවන්ට සේවය කිරීමේදී නිරවුල් මනසකින් සේවය කිරීමට අවස්ථාව ලැබිලා තියෙනවා. ඉතිරි 30%න් ගමන් වියදම් හා පුහුණුවීම් වෙනුවෙන්

වෙන්කර නියෝජිත ආයතනය 10% පමණ ප්‍රමාණයක් ලබාගැනීම සිදු කරනවා.

***නුපුහුණු ශ්‍රමිකයින් වශයෙන් ගෘහ සේවය වැනි ක්ෂේත්‍ර සඳහා පිටත්වන කාන්තාවන් විවිධ අතවරයන්ට හා හිංසනයටන්ට පත්වන බවට වරින් වර වාර්තාවීම් සිදුවන හේතුවෙන් පුහුණු ශ්‍රමිකයින් පිටත් කිරීම සම්බන්ධයෙන් පසුගිය රජයේ අවධානය යොමුවුණා. දැන් එම වැඩපිලිවෙලේ තත්ත්වය කුමක්ද ?***

ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් ගෘහ සේවකයින් හෝ නුපුහුණු ශ්‍රමිකයින් වශයෙන් නැතිව පුහුණු ශ්‍රමිකයින් වශයෙන් වඩා ක්‍රමවත් ශ්‍රමික සැපයුමක් ඇති කිරීම සම්බන්ධයෙන් බලපත්‍ර ලත් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන සංගමය විසින් පැවති සෑම රජයක් වෙතම යෝජනාවන් ඉදිරිපත් කළා. නමුත් කිසිඳු රජයක් සාධනීය පියවරයක් අරගත්තේ නැහැ. යම් ශ්‍රමිකයකුට සේවා ස්ථානයේදී ඇතිවන ගැටලු සම්බන්ධයෙන් නීත්‍යානුකූල මැදිහත්වීම එරට ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිළධාරීන්ගේ සහයෝගය ඇතුව ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒත් කොරෝනා වසංගතය හේතුවෙන් මේ වනවිට තානාපති කාර්යාල කීපයක නිළධාරීන් මෙරටට ගෙන්වීමට කටයුතු කිරීම හේතුවෙන් ශ්‍රමිකයින් දැඩි අපහසුතාවයන්ට පත්වෙලා ඉන්නවා. මේක අද විශාල ගැටලුවක් බවට පත්වෙලා තිබෙනවා. රජය තානාපති සේවයට දේශපාලන පත්වීම් නොකර නිසි පුද්ගලයින් පත් කරනවා නම් මේ ගැටලු බොහෝ ප්‍රමානයක් අවම කරගන්න අපිට පුලුවන්.

ආසියානු කළාපයේ වැඩිම ගෘහසේවිකා ඉල්ලුම තියෙන්නේ ශ්‍රී ලංකාවට. මේ හේතුව නිසා වාර්ෂිකව ලක්ෂ දෙකක් පමණ ශ්‍රමිකයින් පිරිසක් පිටත් වෙනවා. නමුත් 2020 වර්ෂය වෙනුවෙන් මේ වනවිට ලක්ෂ එකහමාරක පමණ ප්‍රමාණයක් පමණයි පිටත්වෙලා තිබෙන්නේ. කොරෝනා වසංගතය සමනය වූ පසු නැවත මෙරටට පැමිණීමට එක්ලක්ෂ පනස්දහසක පමණ ශ්‍රමිකයින් පිරිසක් සිටීම හේතුවෙන් ඉදිරියේදී මෙරටට ඩොලර් බිලියන එකොලහක පමණ විදේශ විනිමය ප්‍රමාණයක් අහිමිවෙයි කියලා අපි හිතනවා. කෙසේ වෙතත් ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදීමේ ක්‍රමවේදයක් ඇති කිරීම තුලින් මෙය වළක්වා ගැනීමට හැකියාව තිබෙනවා. රජය ඒ ගැන සිතිය යුතුයි.

ලබන පාපන්දු ලෝක කුසලානය පැවැත්වෙන්නේ 2022 කටාර් රාජ්‍යයේ, මේ හේතුවෙන් එරට වැඩිවන ශ්‍රමික ඉල්ලුම නිසා ශ්‍රී ලාංකිකයන් ලක්ෂයකට පමණ රැකියා අවස්ථා ලබාගැනීමේ හැකියාවක් තියෙනවා. රජය මේ පිළිබඳව නිරන්තර අවධානයෙන් සිටිය යුතුයි.

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/lactQOevUkY

https://www.aithiya.lk/sri-lanka-bureau-of-foreign-employment/

# 26. ප්‍රජාතන්ත්‍රවාදය රාජපක්ෂවරුන්ට අරහන්

## නීතීඥ රවී ජයවර්ධන

***අධිකරණය සතු බලය විධායකය විසින් තමන් සතුකරගන්නවාට අධිකරණයෙහි විරුද්ධත්වයක් නොමැති බව ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දී තිබෙන තීන්දුවෙන් පෙනෙනවා...***



නීතීඥ රවී ජයවර්ධන

අධිකරණයට බලපෑම් කිරීම 2015ට ප්‍රථම සිදු වුණා. ඒක අපි දැක්කා. අරලියගහ මන්දිරයෙන් තමා නඩු තීන්දු එන්නේ කියන එක නීති ක්ෂේත්‍රයේ ඉන්න අපි සියළු දෙනාම දැනගෙන හිටියා. ශිරානි බණ්ඩාරනායක මැතිනියගේ සිදුවීම වගේ නිදර්ශන ඕනෑ තරම් දෙන්න පුලුවන්. වර්තමානයේදීත් අධිකරණයට එම ආකරයේම බියක් ඇතිවී ඇතිබව අපට හැඟී යනවා.

***20වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ඔබ මොකක්ද හිතන්නේ..***

විස්ස සම්බන්ධයෙන් ඇත්තටම හිතන්නේ, එය මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල වරදක් සිදුකළ ලියවිල්ලක් කියන එක. මේ ආණ්ඩුව බලයට එන්නේ එක ස්ලෝගනයක් උඩ. ඒ තමයි රට හදන්න බලය දෙන්න කියන එක. රටේ ජනතාව ඒ සඳහා ඔවුන්ට ලබා දීලා තියනවා 2/3 බලයක්. ඉතා විශාල බලයක් ඒක. ඒ වගේම රටේ අගමැතිවරයා හා ජනාධිපතිවරයා යන දෙන්නාම සහෝදරවරු. පවුලේ තවත් දෙදෙනෙකුට ඇමතිකම් දීලා තියනවා. බරපතල ප්‍රශ්ණයක් රටේ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි තිබියදිත් ජනතව මේ විදිහට ඔවුන්ට ඉතා විශාල බලයක් දීලා තියනවා. ඔවුන් දැන් එම බලය අභ්‍යාස

කරමින් ඉන්න බවක් තමයි පේන්නේ. එහෙත් මටනම් හිතන්නේ නෑ දැන් ඔවුන්ට 20වෙනි සංශෝධනයක් අවශ්‍යයි කියලා, මොකද වැඩ කල හැකි බලයක් ආණ්ඩුවට මේ වෙලාවෙ තියනවා. එහෙම තිබියදිත් තවත් බලයක් ඉල්ලනවා කියන්නේ, මම නම් හිතන්නේ එකාධිපති පාලනයකට පසුබිම තමයි මේ හදාගෙන යන්නේ. ඒ වගේම තමයි 20වෙනි සංශෝධනය ගේන්න මෙයාලා හේතු දෙකක් කියනවා. එකක් තමා පාස්කු ඉරිදා ප්‍රහාරය සහා 19වන ව්‍යවස්ථා සංශෝධනය. 20 ගෙන්න මේ හේතු දෙක අතර තියන සම්බන්ධය මට තේරෙන්නේ නෑ. පාස්කු ප්‍රහාරය සම්පූර්ණයෙන්ම පසුගිය රජයේ නිළධාරීන්ගේ නොසැලකිලිමත්කම නිසා සිදුවුණ අවාසනාවන්ත සිදුවීමක්.

ඔවුන් කියන තව කථාවක් තමයි 19වන ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ එක පවුලක් ඉලක්ක කරගෙන කියලා. 19වන ව්‍යවස්ථා සංශෝධය ගෙනාවේ 1978 ඉඳලා ව්‍යවස්ථාවට තිබිච්ච විරෝධය නිසා. අපි හැමදාම කතා කළේ ඒකාධිපති ව්‍යවස්ථාව කොහොමද අහෝසි කරන්නේ කියලා. ඒ මත තමයි 19වැනි සංශෝධනය ගෙන එන්නේ. ඒකෙන් පැහැදිලි වෙනවා මේක එක පුද්ගලයකු හෝ පවුලක් සලකා විශේෂයෙන් සැකසුවක් නොවෙයි කියන කාරණය. අනෙක් පැත්තෙන් 1978 කියන්නේ මීට දශක 4කට එහා කාලයක්. ඒකාලේ ලෝකේ තත්ත්වය වෙනස්. අද වගේ මානව හිමිකම් පිළිබඳ අදසක් එම කාලය තුළ තිබුණේ නෑ. තොරතුරු දැන ගැනීමේ පනත ගැන එහෙම මිනිසුන්ට මතයක් තිබුණේ නෑ. ඒ වගේම එකාලේ හිටපු සමාජයේ විශාල මධ්‍යම පංතියක් තිබුනේ නෑ. මීට වඩා වෙනස් සමජායක් තමයි තිබුණේ. ඒ සමාජයට ගැලපෙන්න තමයි 1978 ව්‍යවස්ථාව ජේ. ආර් ජයවර්ධන ජනාධිපතිවරයා ගෙනාවේ. ඒ වෙලාවෙ ලොකේ තිබුණා කඳවුරු දෙකක්. ඒ කඳවුරු දෙකෙන් ධනවාදී කණ්ඩායමට හෙත්තු වෙලා හිටපු අපේ ආණ්ඩුව ඊට සමාන්තරව යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තමයි ගෙනාවේ. මේ දියුණුවත් එක්ක තමයි 19 වන ව්‍යවස්ථා සංශෝධනය දශක හතරකට පස්සේ එන්නේ. යම්කිසි ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් ගොඩක් එක්ක. අද මේ රටට අවශ්‍ය වන්නේ එකාධිපතියෙක් නෙමෙයි.

මං හිතන විදිහට ප්‍රජාතන්ත්‍රවාදය කියන එක රාජපක්ෂවරුන්ට ගැලපෙන්නේ නෑ. ඔවුන් ඒකට කැමතිත් නෑ කියන එක තමයි මගේ

විශ්වාසය. එක තමයි මේ වගේ විනාශකාරී ව්‍යවස්ථා සංශෝධනයක් මේ රටට ඉදිරිපත් කරන්න ඔවුන් කටයුතු කරන්නේ. විශේෂයෙන් මට නොතේරෙන්නේ ඇයි මේ විගණනය සම්බන්දයෙන් බයක් තියෙන්නේ කියලා. තමන් එන්නේ රට පාලනය කරන්නට නම්, තමන් එන්නේ රට සංවර්ධනය කරන්න නම් ඇයි විගණනයට බය. ප්‍රසම්පාදනය කියන්නේ නවතම අදහසක්, ටෙන්ඩර් දූෂණ නැති කරන්න තමයි ප්‍රසම්පාදන කොමිසම බිහි වෙන්නේ. නමුත් මේ රජය එකට පයින් ගහලා, පැත්තකට දාලා තමන්ට ඕනේ විදිහට තමන්ගේ හිතවතුන්ට ටෙන්ඩර් බාර දෙන්න හදනවා. ටෙන්ඩර් නැතුව මේ රට තුළ දූෂණය වපුරන්න තමයි මේ හදන්නේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/hZYfKG2Vwi8

https://www.aithiya.lk/%e0%b6%b4%e0%b7%8a%e2%80%8d%e0%b6%bb%e0%b6%a2%e0%b7%8f%e0%b6%ad%e0%b6%b1%e0%b7%8a%e0%b6%ad%e0%b7%8a%e2%80%8d%e0%b6%bb%e0%b7%80%e0%b7%8f%e0%b6%af%e0%b6%ba-%e0%b6%bb%e0%b7%8f%e0%b6%a2%e0%b6%b4/

# 27. ගෝඨාභයගේ මේ අත්හදා බැලීම විගඩමක් වෙන්න නියමිතයි!

## නීතිඥ ශිරාල් ලක්තිලක


නීතිඥ ශිරාල් ලක්තිලක

***නව ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය ගැන ඔබගේ අදහස කොහොමද?***

20වන සංශෝධනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ මතය විමසීම දැන් අවසන් වෙලා තියෙනවා, එය පුදුමයට කරුණක් වෙන්නේ එම මතය, පාර්ලිමේන්තුවේ කතානායකවරයා අතට පත්වීමට පෙර සමාජ මාධ්‍ය අතට ගිහින් අපි අතට පත්වීම. එය නරක පූර්වාදර්ශයක් බව කිව යුතුයි. මෙම තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණ දුන්න නිවැරදි තීන්දුව ද කියලා අපි බැලිය යුතුයි. කෙසේ වෙතත්, මෙම තීන්දුව දිහා බැලුවම පෙන්නේ එය ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය කියලා. එනිසා ඒ පිළිබඳව යම් මතයක් මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමතියි. ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ලියල තියන විදියට අනුව, 83වැනි වගන්තියට අනුව විතරයි හැමදේම තක්සේරු කරන්න වෙන්නේ. එම 83 වැනි වගන්තිය කියනවා 1, 3, 6, 7, 8, 9, 10, 11 කියන මෙන්න මේ වගන්ති ස්ථාවර වගන්ති කියලා. එතකොට එම වගන්ති යම් විදියට උල්ලංඝණය වෙනවා නම් තුනෙන් දෙකේ බලය ට අමතරව ජනමත විචාරණයකට යන්න ඕනෑ කියලා තමයි කියන්නේ. මේ තත්ත්වය නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය බොහෝ දුරට සීමා සහිතයි. එහිදී බලන්නේ මෙම ව්‍යවස්ථා සංශෝධනය ඔය කියන තුනෙන් දෙකේ බලයෙන් ද සම්මත කරන්න ඕනෑ, ජනමත විචාරණයකට යන්න ඕනෑ ද කියන එක විතරයි. එනිසා පුලුල් අර්ථකතනයක් 120 වගන්තිය යටතේ අපිට බලාපොරොත්තු වෙන්න බැහැ. දැන් ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය කියලා

තියනවා, වගන්ති 4ක් 5ක් ජනමත විචාරණයකට යන්න ඕනෑ, අනික් ඒවා 2/3ක බහුතර බලයෙන් සම්මත කරගන්න පුලුවන් කියලා.

මේක නීති ක්ෂෙත්‍රයේ නොවෙන කෙනෙකුට යම් හාස්‍යයක් දක්වන්නත් පුලුවන්. ඒ හාස්‍යය තමයි, විශේෂයෙන්ම මේ මතය බැලුවාම අපිට හිතෙනවා අධිකරණය සියතින් තමන්ගේ ගෙල සිඳගත්තා ද කියනඑක. අධිකරණයේ ස්වාධීනත්වයට මෙම ව්‍යවස්ථා සංශෝධනය හරහා විධායකය අත තබා තිබෙනවා. ඒ කොහොමද? අපි දන්නවා 19වැනි ව්‍යවස්ථා සංශෝධනය තුළ තිබුන පළමු උපලේඛනය සහ දෙවන උපලේඛනය තුළ පළමු සහ දෙවන කොටස්වලින් රාජ්‍ය නිළධාරීන් පත් කිරීමේ දී ව්‍යවස්ථාදායක සභාවේ මතයෙන් ජනාධිපතිවරයා බැඳිලා හිටියා කියලා. දැන් පාර්ලිමේන්තු කවුන්සිලයෙන් එය ඉවත් කරලා තිබෙනවා.

ඕනෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගත්තාම තිබෙනවා පළමු ප්‍රතිපත්ති රාමුව කියලා දෙයක් තිබෙනවා. ඒක අස්සේ කරුණු 6ක් තිබෙනවා. එකක් තමයි පරමාධිපත්‍ය, ඊළඟට සීමිත ආණ්ඩුව කියන එක, බල විභේදනය, තුලන සහ සංවරණ ක්‍රම, පස්වෙනි කරුණ තමයි අධිකරණ ස්වාධීනත්වය සහ අධිකරණ විමර්ෂණ, හයවෙනි කරුණ තමයි මූල්‍ය ස්වාධිපත්‍ය. මේවා තමයි මූලික කරුණු. මේ මූලික කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වෙනි වගන්තියට තමයි සම්බන්ධ කරලා තියෙන්නේ. එම වගන්තිය හතරවෙනි වගන්තිය හා බැඳෙනවා. මගේ මතය සහ දැනුම අනුව 20 වැනි ව්‍යවස්ථාවේ සියලු වගන්ති ඔය කියපු මූලික ප්‍රතිපත්ති නැත්තං ෆර්ස්ට් ප්‍රින්සිපල්ස් උල්ලංඝණය කරලා තිබුණා. ඒක අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිං කිව්වා. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණය අනෙක් පැත්තට කියලා තියෙන්නේ, රාජ්‍ය නිළධාරීන් පත් කිරීමේදී විශේෂයෙන් ශේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් පත් කිරීමේදී ජනාධිපතිවරයාට පත් කිරීමට සහ ඉවත් කිරීමට පුලුවන් කියලා. මට හිතෙන්නේ ඒකෙන් බලපෑමක්වන ප්‍රධාන ක්ෂේත්‍රය තමයි ඉහළ අධිකරණය. මීට අමතරව විගණකාධිපතිවරයා පත් කිරීම, මැතිවරණ කොමිසමේ සභාපතිවරයා පත් කිරීම. මේ ක්ෂේත්‍රයන් තුනට මේ සංශෝධනය හරහා මරු පහරක් වදිනවා. ප්‍රශ්නය තියෙන්නේ ශේෂ්ඨාධිකරණයට ඒක එහෙම හිතිලා නැති එකයි.

ඒ පිළිගැනීමට යම් ආවරණයක් ලබා දීලා තියෙනවා 35 එක පළවෙනි ව්‍යාතිරේඛයෙන් යම් සීමාවක් දාලා. 35 එක පළවෙනි ව්‍යාතිරේකය මගින් 19වැනි ව්‍යවස්ථා සංශෝධනය තුළ අපිට ලබාදීලා තිබුණා ජනාධිපතිවරයාට මුක්තිය තිබෙනවා හැබැයි ජනාධිපතිවරයාගේ අභිමතයේ පහළ කැලි, යම් යම් දූරස්ථ ක්‍රියා සම්බන්ධයෙන් මානව හිමිකම් නඩුවක් පවරලා නීතිපතිවරයාට එරෙහිව නඩු දැමීමේ හැකියාවක් දීලා තිබෙනවා කියලා. දැන් ශ්‍රේෂ්ඨාධිකරණය කියලා තිබෙනවා ඒක ඉවත් කිරීම වැරදියි කියලා. ඒකෙන් කියවෙන්නේ එම අධිකරණය තර්ක කරන්නේ යම් ඉවත් කිරීමක් සම්බන්ධයෙන් නීතිය ඉදිරියට යන්න පුලුවන් කියනඑකයි. නමුත් ඒක දූරස්ථ තර්කයක්. ඊට වැඩිය ඉතාම පහසු දෙකක් අපි කිව්වා. මෙහිදී අපිට ව්‍යවස්ථාදායක සභාවද පාර්ලිමේන්තු සභාවද කියන එක ප්‍රශ්නයක් නැහැ. ඒ වගේම ඒකේ සංයුතිය හතක් ද පහක් ද කියන එකත් අපිට ප්‍රශ්නයක් නැහැ. හැබැයි අපි කිව්වේ මෙම කවුන්සිලය දෙන තීන්දු තීරණ මගින් ජනාධිපතිවරයා බැඳී සිටිය යුතුයි කියලා. නමුත් එහෙම එකක් මේ සංශෝධනයේ නෑ. ඉතිං මේ ඉවත් කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෆර්ස්ට් ප්‍රින්සිපල්ස් කඩලා බිඳලා දාලා තිබෙනවා. මේ හරහා බල විභේදනයි, තුලනය හා සංවරණය කියන එක, කැලි වලට කුඩු කරලා තිබෙනවා.

ඒකට ඔවුන් පෙරලා තර්කයක් ගේනවා, අපි ආයි 1978 ව්‍යවස්ථාවට යනවා කියලා. මේ තර්කය ගැන කතාකරනවා නම් අපි කියන්නේ, මේක මහා විහිළුකාර තර්කයක්. ව්‍යවස්ථාවක් කියලා කියන්නේ ජීවමාන ලේඛනයක්. ඒක පරිනාමය වෙනවා. එතකොට 1978 ව්‍යවස්ථාව ජේ ආර් ගෙනාවට ඒක අවුරුදු 40ක් විතර වෙනස්වීම්වලට ලක්වෙමින්, හිස් තැන් පුරවමින්, පරිනාමය වෙමින් තමයි තිබුණේ. එතකොට ආයෙත් ඒක ආපස්සට කරකවනවා නම් ඒක පිළිගන්න බැරි දෙයක්. ඒක වැරැද්දක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කරන නීතිවලිනුත් ඒක කියනවා. අපි අර්ථ නිරූපණයක් කරන්න ගියාම ප්‍රගතිශීලී වර්ධනයන් සහ ප්‍රතිගාමී වර්ධනයක් ගැන සලකා බලනවා. තක්සේරු කරනවා. මේ අර්ථ නිරූපණ කාර්යයේදී ශ්‍රේෂ්ඨාධිකරණය හැමවිටම යම් දෙයක් සංවර්ධනය වෙනවනම් ඒකට ජනමත විචාරණයක් අවශ්‍ය නැහැ කියන එක කියලා තියෙනවා. හැබැයි යම්

දෙයකින් අපිට පේන්නේ අපගමනයක් නම් ඒකට ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා තියෙනවා. ඒක තමයි අර්ථ නිරූපණ ඉතිහාසය. මෙහිදී අපි අධිකරණයෙන් අහන්නේ අර කියපු තුලන සහ සංවරණ නීති (checks and balances) ඉවත් කිරීම ප්‍රගතිශීලී සංවර්ධනයක් ද කියලා. අපි දන්න විදිහට නම් ඒක ප්‍රතිගාමී සංවර්ධනයක්. එතකොට ඒක ජනමත විචාරණයක් අවශ්‍ය නැහැ කියන එක තාර්කික නැහැ.

ඒ තර්කයම අපි විගණනය සම්බන්ධ යෝජනාවලට ආදේශ කළොත්, ශ්‍රේෂ්ඨාධිකරණයේම තීන්දුවක් තිබෙනවා, ඒකට අනුව පොදු මූල්‍ය ක්‍රම තුනකට පාලනය වෙනවා. එකක් තමයි මූල්‍ය නීති පැනවීමේ බලය (කොහොමද මුදල් සොයාගන්නේ කියන එක), දෙවෙනි කාරණය තමයි අපි එම මුදල් යම්කිසි තැනකට යොදවන්නේ කොහොමද කියන එක, ඊළඟට ඔඩිටර් ජනරාල් මේක පාලනය කරනවා. එතකොට පාර්ලිමේන්තුවට මූල්‍යමය ස්වාධිපත්‍ය තිබෙනවා. ඒක මෙන්න මෙහෙම තමයි ක්‍රියාත්මක කරන්නේ කියන එක තමයි මේකෙන් කියන්නේ. එතකොට මේ ක්‍රියාවලිය සඳහා 19වැනි සංශෝධනය තුළ අපි යෝජනා කරපු දේ තමයි ස්වාධීන විගණකාධිපතිවරයෙක්, එයාගේ ඔෆිස් එකට සර්විස් එකක් තියෙනවා. ඒ සඳහා එම කාර්යාලයට නිළධාරීන් සිටිනවා, ඔවුන් ස්වාධීන විය යුතුයි. ඒ සඳහා ජාතික විගණන කොමිසමක් පත් කරලා තියෙනවා. එතකොට පරිපාලන සේවාව වගේ විගණන සේවාවක් තිබෙනවා. ඒ සේවාවේ පත්කිරීම් මාරුකිරීම් සහ විනය කටයුතු කරන්නේ එම කොමිසම. ඊළඟට විගණකාධිපති හැම වෙලාවෙම ස්වාධීන වෙන්න ඕනෑ. මොකද ඔහු පාර්ලිමේන්තුවට විගණනය කරන විදිහ පෙන්වන්න ඕනෑ. පර්ෆෝමර්ස් ඔඩිට් (performance audit) එකක් තමයි අපි මෙහෙදී කරන්නේ. ඒකට විගණකාධිපතිට බලය දීලා තිබෙනවා. යම්කිසි ආයතනයක කාර්යක්ෂමතාවය මැනෙන්නේ නිමැයුම් සහ යෙදවුම් අතර අනුපාතයෙන්. එතකොට ඒක බලන්න පුලුවන් වෙන්න ඕනෑ. ඵලදායකතාවය අපි මනින්නේ මෙහෙයුම සහ නිමැවුම අතර පතරතරය මගින්. එතකොට මේ අය කියනවා මේක ලෙඩක්, ඒ නිසා අපි ඔඩිට් එකෙන් අයින් වෙලා ඒක පුද්ගලික අංශයට දෙන්න ඕනෑ කියලා. දැන් මේක සම්මත වුණා කියමු, මේ අංශයට මොකද වෙන්න පුලුවන්. උදාහරණයකට අපි මෙහෙම කියමු අපිට අවශ්‍ය වෙනවා

එයාර් ලංකා එක ගැන විගණනයක් කරන්න, එතකොට ඒ ඔට්ඩ් එක කරන්නේ කොහොමද? ඒ නිසා තමයි ඒ ගොල්ලෝ ජනාධිපති කාර්යාලයයි, අගමැති කාර්යාලයයි, තව රජයේ සමාගම් 125ක් පමණ ඒ විගණනයෙන් ඉවත් කළේ. ඒක අපි අර මුලින් කියපු මූලික පරමාර්ථයන්වලට පටහැනියි. තුන්වෙනුව මෙම සමාගම්වලට මිලදී ගැනීමක් කරනකොට දැඩි කොන්දේසි අවශ්‍ය වෙන්නේ නැහැ. මේ හරහා අපි අවුරුදු ගණනාවක් කතා කළ අන් සොලිසිටඩ් ටෙන්ඩර්ස් දෙන්න පුලුවන්. ඉතිං මේ සමස්ථය ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානයට ලක්වුණාද කියන සැකය අපිට එනවා මේ තීන්දුව කියවනකොට.

***19වැනි සංශෝධනය නිසා රට වළපල්ලට වැටුණා කියන මතය ගැන ඔබගේ අදහස..***

අපේ රටේ දැන් කතාවක් තියෙනවා යහපාලනය ඇතුලේ සිදුවුණ සියලු වැරදි මේ 19වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා ඇතිවුණ දේවල් කියලා. මගේ මතය මේක මිත්‍යාවක්, බොරුවක් කියන එක. හිටපු ජනාධිපතියි අගමැතියි හැප්පුනේ 19වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා නෙවෙයි. ඒක අස්සේ තිබෙන්නේ සංකීර්ණ සමාජ දේශපාලන සංස්කෘතික කාරණයක්. ඒ නිසා කවුරුහරි කියනවා නම් රට ඉස්සරහට යන්නේ නැත්තේ 19 නිසා කියලා ඒක බොරුවක්. ඕනෑම සමාජයක පුරවැසියෝ ගත්තාම ඔවුන් තුළ ජීවීන් තුන්දෙනෙක් ඉන්නවා. එක්කෙනෙක් ආර්ථික ජීවියා. අනෙකා සමාජ ජීවියා. ඊළඟට ඉන්නවා සංස්කෘතික ජීවියෙක්. දැන් මෙයාලා 20න් කරන්න හදන්නේ මේ ජීවීන් තුන්දෙනාගෙන් ආර්ථික ජීවියා නැගිට්ටවලා ගන්න එක. ඒකට තමයි ඔවුන් කියන්නේ, මේ රට සංවර්ධනය කරන්න ඕනෑ, ඒකට 19ය බාධාවක් කියලා. හැබැයි මේ සංශෝධනය නිසා අපේ අනෙක් ජීවීන්ට මොකද්ද වෙන්නේ කියලා අපි කල්පනා කරනවද? පුරවැසියෝ විදිහට අපිට නිදහස ඕනෑ. අපිට ප්‍රජාතන්ත්‍රවාදය ඕනෑ. අපිට ස්ථාවරත්වය ඕනෑ.

අපි සංස්කෘතික ජීවීන්, අපිට නිදහස ඉතාමත් වැදගත්. එතකොට මේ නිදහසට මේ ව්‍යවස්ථා සංශෝධනය හරහා කුමක් වෙන්න පුලුවන්ද? 19 සංශෝධනයෙන් අපි කරපු ප්‍රධාන දේ තමයි මේ සමාජයේ නිදහස ස්ථාවර කරන එක. අපි ඒක නොයෙකුත් උපක්‍රම හරහා කළා. නමුත්

අවාසනාවකට අපේ සමාජයේ මතයක් පැළ කරලා තියෙනවා 19 ඕනෑ නෑ කියලා. ඒකෙන් කියවෙන්නේ නිදහස ඕනෑ නැහැ කියන දේ. ඇත්තටම අපිට නිදහස එපා ද? අපි දන්නවා අපේ සමාජය කවදාවත් නිදහස එපා කියලා, කියන්නේ නැහැ. මේ 20 හරහා නිදහස නැතිවුණාම තමයි අපිට ඕක තේරෙන්නේ.

නිදහස සහ සංවර්ධනය අතර සම්බන්ධය මොකද්ද? ජේ ආර් ජයවර්ධන මහත්තයා 1977 මේ ව්‍යවස්ථාව ගේනකොට ඔය තර්කය ගෙනාවා. ගෝඨාභය මහත්තයා මේ ගේන්නේ අලුත් කතාවක් නෙවෙයි. ඒක ගෙනල්ලා සංවර්ධනය නාමයෙන්, මුල් අවුරුදු කීපය ස්ථාවරව අරගෙන ගියා. නමුත් ඊට පස්සේ මොකද වුණේ? අන්තිමට වුණේ උතුරේ සහ දකුණේ කැරලි දෙකක් ඇතිවීම. අන්තිමට ජේ ආර් ජයවර්ධන ජනාධිපතිවරයා විශ්‍රාම ගියේ ජේ.ආර් එල්ලා මරනු කියලා පෝස්ටර් ගැහුවට පස්සේ.

අපි දේශපාලනයේදී කියනවා එක සැරයක් ඛේදවාචකයක් වුණ දේ තව සැරයක් වුණාම විගඩමක් වෙනවා කියලා. දැන් ගෝඨාභය මහත්තයා මේ අත්හදා බලමින් ඉන්නේ මේ රටේ වැරදුන ක්‍රම දෙකක්. අපි දැන් සිරිමා යුගය වගේම ජේ ආර් යුගයත් පසුකරගෙන ඇවිත් තිබෙනවා. එනිසා මේ යුග දෙකේදී අසාර්ථක වුණ ව්‍යාපෘති දෙකක් නැවත ගෙනඒම හරහා මේක විගඩමක් වෙන්න නියමිතයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/GUQJYlWxW7E

https://www.aithiya.lk/%e0%b6%9c%e0%b7%9d%e0%b6%a8%e0%b7%8f%e0%b6%b7%e0%b6%ba%e0%b6%9c%e0%b7%9a-%e0%b6%b8%e0%b7%9a-%e0%b6%85%e0%b6%ad%e0%b7%8a%e0%b7%84%e0%b6%af%e0%b7%8f-%e0%b6%b6%e0%b7%90%e0%b6%bd%e0%b7%93%e0%b6%b8/

# 28. රාජපක්ෂවරු ගැන අපි හොඳට දන්නවා, අළුත් ව්‍යවස්ථාව ගේන්නේ නෑ

## පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක


පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක

අපි මෙම නව සංශෝධනය ගැන වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය දැක්කා. දැන් මේ සංශෝධනය පිළිබඳව විවාද අවස්ථාවේ තමයි අපි ඉන්නේ. ඒ අනුව නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුළුව තුනෙන් දෙකේ පාර්ලිමේන්තු බලයකින් (150+) අනුමත කර ගැනීම් සඳහා මේ වෙනකොට ආණ්ඩුව ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. මම විශ්වාස කරනවා මේ කටයුත්ත අවශ්‍ය ඡන්දවල අඩුපාඩුකම් තියෙනවා නම් සහ තමන්ගේ කඳවුර තුළින් මෙයට නැගෙන විරෝධතාවට පිළිතුරක් හැටියට විපක්ෂයෙන් කීපදෙනෙක් බාගැනීමේ ක්‍රියාවලියක ආණ්ඩුවේ නායකයින් මේ වෙනකොට සාකච්ඡා පවත්වමින් ඉන්නවා. අපි දන්නවා 2011 අවුරුද්දේ 18 වැනි සංශෝධනය ගෙනඑන වෙලාවෙත් මේකම තමයි සිද්ධ වුණේ. ඒ වෙලාවේ ආණ්ඩුවට 144 යි තිබුණේ. ඒ වෙලාවේ මුස්ලිම් කොන්ග්‍රසයේ 7 දෙනෙක් මේ පැත්තට ගත්තා. එජාපයේ අයත් ආවා. එහෙම අරගෙන තමයි 160ක බහුතරයක් හදාගෙන 18වැනි සංශෝධනය සම්මත කරගත්තේ. ඒ වෙලාවේ ඔය අද වගේම නොයේකුත් පොරොන්දු දුන්නා. විධායක ජනාධිපති ධුරය කප්පාදු කරනවා කිව්වා. අපිව සනසන්න පළාත් සභා ක්‍රමයට සංශෝධන ගේනවා කිව්වා. මේ වගේ බොරු පොරොන්දු ගණනාවක් දීලා තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා 18වැනි සංශෝධනය සම්මත කරගත්තේ. ඊට පස්සේ එතුමා ඒවා ගැන කතා කළේවත් නැහැ. මෙවරත් එහෙම්මමයි. අලුත් ව්‍යවස්ථාවක් සෑදීම සඳහා යැයි කියමින් රොමේෂ් ද සිල්වාගේ නායකත්වයෙන් හදලා

තියෙනවා කණ්ඩායමක්. පසුගිය දා අමරපුර සහ රාමඤ්ඤ කියන නිකායන්වල නායකයින් සහ මේ ආණ්ඩුව බලයට ගේන්න වැඩකරපු ජාතිකවාදී නායකයින් අලුත් ව්‍යවස්ථාවක් ඉල්ලලා තිබෙනවා. ඔවුන්ට මේ නායකයෝ කියන්නේ එම ව්‍යවස්ථාව ගේනවා කියලා. නමුත් රාජපක්ෂවරු ගැන හොඳට දන්න අපිට විශ්වාසයි ඒ ව්‍යවස්ථාව ගේන්නේ නෑ කියලා.

ඒ වෙනුවට 20වැනි සංශෝධනය මගින් විධායකයේ බලය, ව්‍යස්ථාදායකයේ බලය සහ අධිකරණයේ බලය තනි පුද්ගලයෙක් අතට ගැනීම තමයි මෙහි යට තිබෙන සරළම කාරණය. ඇත්තටම මේක ජේ ආර් ජයවර්ධනගේ ව්‍යවස්ථාවටත් එහාට ගිය අවස්ථාවක්. මොකද ජේ ආර් ගෙනාපු ව්‍යවස්ථාවේ නැති දේවලුත් මෙහි තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපතිවරයා ව්‍යවස්ථාව රැකිය යුතුයි කියන වගන්තිය ඇතුලුව වගන්ති හතරක් ඉවත් කරලා තිබෙනවා. එයින් එක වගන්තියකට (මැතිවරණ ක්‍රියාවලියට අදාළ වගන්තියට) ශ්‍රේෂ්ඨාධිකරණය ජනමත විචාරණයක් යෝජනා කරලා තිබෙනවා. නමුත් අනෙකුත් වගන්ති තුන ඉවත්කරලා තිබෙනවා. වැඩිමනත් වශයෙන් ජනමත විචාරණය, නැතිනම් කෙළින්ම ජනතාවගේ මතයෙන් නීති හදන්න පුලුවන් කියන කාරණය ගෙනත් තිබෙනවා. ඇත්තටම මේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ගෙනල්ලා තිබෙන්නේ හැමෝටම නීති හදන්න බැරි නිසා නෙවෙයි, සාමාන්‍ය වශයෙන් ජනතාව මානසිකව ලබන අල්ලස් මාර්ගයෙන් ඒ වෙලාවේ ලැබෙන හැඟීම්වලට වහල්වෙලා ඡන්දය දෙන නිසා එය වැළක්වීම සඳහා තමයි නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ලබාදීලා තිබෙන්නේ. මේ සියල්ල එක්ක තමයි 20වැනි ව්‍යවස්ථා සංශෝධනය එන්නේ.

මෙහි අරමුණ කුමක් ද? රටට වැඩ කරන්න ඕනෑ කියන එක තමයි කියවෙන්නේ. රටට වැඩ කිරීම සඳහා කිසිඳු ගැටලුවක් අපිටනම් පේන්නේ නැහැ. ජනාධිපතිතුමා මල්ලී, අයියා අගමැති, ආර්ථිකය මෙහෙයවන්නේ මල්ලී, ආරක්ෂාව භාරව කටයුතු කරන්නේ පවුලේ ලොකු අයියා, එනිසා මේ පවත්නා ව්‍යවස්ථාව යටතේ වැඩකරන්න බැහැ කියනවනම් ඒක ලොකු බොරුවක්. එනිසා මේ පවුලෙන් පිට රටේ ආර්ථිකය හෝ සමාජය හෝ මෙහෙයවීමේ බලයක් කාටවත් නෑ. ඉතිං ඇයි වැඩ කරන්න බැරි. ඊළඟට මෙමගින් විදේශ ආක්‍රමණවලින්

රට බේරාගන්න පුලුවන් කියන මතයකුත් රටතුළ නිර්මාණය කරලා තිබෙනවා. මේ ජනාධිපතිවරයාම තමයි කැබිනට් මණ්ඩලයටවත් නොකියා ආරක්ෂක ලේකම් විදිහට ඉන්න කාලේ ඇක්සා කියන ගිවිසුම ඇමරිකා එක්සත් ජනපදය සමග අත්සන් කළේ. ඒ වේලාවේ ඔහුට තමන්ගේ අයියා වුණ එවක ජනාධිපති මහින්ද රාජපක්ෂ සිය සහාය දුන්නා. ඊළඟට අපි දන්නවා ජේ ආර් ජයවර්ධන හිටපු ජනාධිපතිවරයා ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළේ පාර්ලිමේන්තුවට දැනුන් දීලා නෙවෙයි. ඒ අනුව ව්‍යවස්ථාවේ 157 වගන්තියේ මොනවා සඳහන් වුණත්, විධායක ජනාධිපතිවරු තමන්ගේ බලය භාවිතා කරලා තමයි මේ කටයුතු කරලා තිබෙන්නේ.

සිංහල බෞද්ධ අනන්‍යතාවය ආරක්ෂා කරන්නට කැපවෙනවා කිව්වට, බලහත්කාරයෙන් අන්‍යාගම්වලට බෞද්ධයින් සහ හින්දූන් හැරවීමට විරුද්ධව ඕමල්පේ සෝභිත හිමියන් ගෙනාපු පනත යට ගැහුවේ මහින්ද රාජපක්ෂ. ඇමරිකා එක්සත් ජනපදයේ තානාපති එක්ක කතා කරලා තනි බලයට. මම මේ කිව්වේ සමහරු මවාපාන කතා තිබෙනවා නේ, මේ සංශෝධනය නිසා සිංහලකම රැකෙනවා, බෞද්ධකම රැකෙනවා කියලා. රට විදේශ ආක්‍රමණවලින් රැකෙනවා කිව්වට ඉතිහාසය පෙන්නලා දීලා තියෙන්නේ ඊට සම්පූර්ණයෙන්ම පටහැනි දෙයක්. මේ ජනාධිපතිවරයා එහෙම නොකරනවා කියන්න කිසිම සහතිකයක් නැති බව ඔහු ඔහුගේ මේ මාස 11ක පාලනය අස්සේ පෙන්නලා ඉවරයි.

බලය තනි පුද්ගලයෙක් වටේ සංකේන්ද්‍රනය වුණාම රට සංවර්ධනය කරන්න ලේසියි කියලා ජේ ආර් ජයවර්ධන මහත්තයාත් හිතුවා, ඒත් එතුමාගේ පාලනය නිමාවුණේ දැවැන්ත ලේ වැගිරීමකින්. ඉතිං මේ රට නැවත ප්‍රජාතන්ත්‍රවාදය හැකිලෙමින් තනි ඒකාධිපති මතයකට යෑමෙන්, එවැනි ලේ වැගිරීමකට පාර කැපෙන, අධිකරණයේ ස්වාධීනත්වය අහෝසි වෙලා නීතිය පිළිබඳ ජනතා විශ්වාසය අහෝසි වෙලා, නීදහස පිළිබඳ අදහස අහෝසි වෙලා, මැතිවරණ ක්‍රමය පිළිබඳ විශ්වාසය අහෝසි වෙලා, ගියොත් නැවත මේ රට සන්නද්ධ බලවේගවලට නතුවෙන රටක් බවට පත්වීමේ අනතුර තිබෙනවා. ඒක ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ. මොකද මේවගේ තත්ත්වයක් මීට සියවස් ගානකට කලින් ප්‍රංශයේ ඇතිවුණා. ප්‍රංශයේ රජ පවුල රාජ්‍යත්වයෙන්

එළවලා දාලා ප්‍රංශ විප්ලවයක් ඇතිවුණා. එහිදී ජනරජයක් බිහි වුණා. එහි අරමුණ වුණේ රජවරුන් නැතුව ජනතාවගේ හැකියාවට කුසලතාවයට, මුල්තැන දීලා රට පාලනය කරන එක. එහි නායකත්වය ගියේ නැපෝලියන්ට. නැපෝලියන් තමයි යුරෝපයට කුසලතාවාදය කියන දේ හඳුන්වා දුන්නේ. නමුත් ටික කාලයක් ගියාම නැපෝලියන් අධිරාජයා වුණා. ඊළඟට ඔහු රට ලෝකය අල්ලගෙන පැරීසියට දැවැන්ත ධනයක් අරගෙන එන වෙලාවේ ඔහුගේ අමාත්‍යවරයෙක් වුණ ටෙලිරාන් ඓතිහාසික ප්‍රකාශයක් කළා. ඒ මොකද්ද? ඔහු කිව්වා බයිනේත්තුවලට බොහෝ දේවල් ලබාගන්න පුලුවන්, හැබැයි ඒවා මත හිඳ සිටීම එතරම් සැහැල්ලු සරළ දෙයක් නෙවෙයි, ඒක විනාශකාරී දෙයක් කියලා. මේ රටටත් මේ ඇතිවෙමින් යන බැරැක්කකරණය හමුවේ, එය ලැබෙන්නට නියමිත බව කිව යුතුයි.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/k_RsBkSBGhE

https://www.aithiya.lk/%e0%b6%bb%e0%b7%8f%e0%b6%a2%e0%b6%b4%e0%b6%9a%e0%b7%8a%e0%b7%82%e0%b7%80%e0%b6%bb%e0%b7%94-%e0%b6%9c%e0%b7%90%e0%b6%b1-%e0%b6%85%e0%b6%b4%e0%b7%92-%e0%b7%84%e0%b7%9c%e0%b6%b3%e0%b6%a7/

# 29. උත්සාහය ආයෙත් රටම ගිනි තියන්න

## මාමන්කඩවල පියරතන හිමි (උතුරු හා උතුරු මැද ද්වීතික සංඝනායක)


මාමන්කඩවල පියරතන හිමි

1977 මැතිවරණයෙන් 5/6ක සුපිරි බලයක් ගත්ත ජේ. ආර් ජයවර්ධන ජනාධිපතිතුමා 1978 දී අලුත් ව්‍යවස්ථාවක් ගෙනාවා කියලා අපි කවුරුත් දන්නවා. ඒක අතිශයින්ම ප්‍රතිගාමී ඒකාධිපති ව්‍යවස්ථාවක්. ඒක තුළ ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය කියන මේ ආයතන තුනේ බලය එක පුද්ගලයෙක් වෙත ඒකරාශී වුණා. ඒක නිසා මේරට ඉතා භායානක අත්තනොමතික පාලනයකට ගියා. ඔහු මේරට විවෘත කරා, ඒවගේම ඊට පෙර ආණ්ඩුව කළ ක්‍රියාවල හොඳම ප්‍රතිඵලය තමා ණය ගෙවා අවසන් කිරීම. ඒ නිසා ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාට විශාල වශයෙන් ණය ගන්න හැකියාව ලැබුනා. එනිසා ණය කන්දරාවකට අපි මුහුණ දුන්නා ඒ ක්‍රියාවලිය තුළ. ඒ විතරක් නෙමෙයි මෙම ව්‍යවස්ථාව නිසා රට තුළ ඇතිවුණ තවත් භයානක දෙයක් තමයි ජේ.වී.පී. කැරැලිකාර තත්ත්වය හා එල්.ටී.ටී.ඊ කැරලිකාර තත්ත්වය. මේ ව්‍යවස්ථාව සමග අවුරුදු 5ක් 6ක් ගතවෙනකොට අපට තේරුණා මුළු රටම ගිනි ගත්තා වගේ මහා විශාල කැරලිකාර තත්වයකට රට පත්වෙනවා. එම කැරලි නිසා දස දහස් ගාණක් ජිවිත විනාශ වුණා. ඉතිං ඒවා තමා එකාධිපති ව්‍යවස්ථාවක් නිසා රටට සිදුවුණ බලපෑම්. අත්තනෝමතික පාලනයකට යටත් වීම, අධිකරණයේ ස්වාධීනත්වය නැති වීම, පාර්ලීමේන්ති මන්ත්‍රීවරු පඹයන් බවට පත්වීම. මේ අත්තනෝමතික පාලයනයන්ට විරුද්ධව තමයි තරුණ තරුණියන් නැගී සිටියේ. ඒ ඉතිහාසය අපි

අමතක කළ යුතු නැහැ. මේ ව්‍යවස්ථාව නිසා උතුරේ සහ දකුණේ තරුණ ජීවිත ලක්ෂයකට වඩා මරු වැළඳ ගත්තා. තරුණ තරුණියන් කී දාහක් අතුරුදන් වුණා ද? අපේ රටේ ආර්ථිකය කොතරම් දුරක් පස්සට ගියා ද? අපිට 1978 ව්‍යවස්ථාවෙන් රටට වුණ නස්පැත්තිය පිළිබඳව නිසි ගණන් හැදීමක් තිබෙනවාද ? එහෙම තියෙනවා නම් අපි මෙහෙම ආයෙත් 1978ට යන්න හිතන්නෙවත් නැහැ.

මේ සියළුම කරුණු සලකා බලනකොට ඒකාධිපති පාලනයක ඇති බරපතලකම අපට තේරෙනවා. එක නිසා තමයි එම ව්‍යවස්ථාව යහපාලන ආණ්ඩුව යටතේ සංශෝධනය කර අළුත් කරේ. හැබැයි එම ව්‍යවස්ථාවේ සැබෑ තත්ත්වය ජනතාවට අවබෝධ වුනෙත් නෑ. එවක ආණ්ඩුව ඒ පිළිබඳව නිසි අවබෝධයක් ජනතාවට දුන්නෙත් නෑ. විශේෂයෙන් මේරටේ සන්නිවේදන මාධ්‍ය, ප්‍රගතිශීලි දෙවල් වෙනකොට එවා ජනතාව අතරට අරන් යන්න ඕනේ. ඒවා පිළිබඳව සාකච්ඡා කරන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වෙන්නේ එවා වුණොත් තමයි. අපේ වෘත්තීය සමිති හා සිවිල් සංවිධාන කරපු ක්‍රියාකරකම් දිහා බලපුවාම, ඊළඟට අපේ ජාතික සංවිධාන කරපු දේවල් දිහා බලපුවාම ජනතාවට හිතුනේ යහපාලන ආණ්ඩුව මහා ලාචෝරු ආණ්ඩුවක් කියලා. එනිසා මේක වැඩක් නෑ ඒකාධිපති දැඩි පාලනයක් අවශ්‍ය යැයි මතයක් හැදුවා. එක පැත්තකින් අස්ගිරි නායක හාමුදුරුවෝ කරපු ප්‍රකාශයත්, ඇතැම් භික්ෂූන් වහන්සේලා කරපු ප්‍රකාශයනුත් ඉතාම තදින් බලපෑවා. ඒ විතක් නෙවෙයි සන්නිවේදන ජාලවලින් දිගින් දිගටම මෙම මතය උලුප්පා දක්වමින් සිදුකළ ක්‍රියාකාරකම්, මේ තත්වය උදා වීමට හේතුවක් වුණා. කොයි යම් හෝ පක්ශයක් පරාජයට පත්කරලා තවත් පක්ශයක් බලයට ගෙන එම මිනිස්සුන්ගේ ස්භාවයක්. නමුත් මේ වගේ බොරු නිර්මාණය කරලා අන්තිමට රටට වෙච්ච දේ ඉතාම භයානකයි.

72 ආණ්ඩුවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය කරපු ප්‍රගතිශීලි ක්‍රියාකාරකම් ඉතාම ඉහළයි. ඒ වගේම මේ රට සංවර්ධනය වන ස්වාධීන රටක් බවටද පත් කරා. නමුත් ජනතාව ජේ. අර් ජයවර්ධනගේ ගැටේට අහුවෙලා ඔහුට 5/6ක බලය ලබා දුන්නා. මේ රට විනාශයට අරගෙන ගියේ එම බලය. ඊළඟට මේ යහපාලන ආණ්ඩුව, යහපාලන ආණ්ඩුවට කිව්වේ යහපාලන නෙමයි වහපාලන ආණ්ඩුව කියලා.

ඇත්තටම ඒකෙන් හම්බුන ව්‍යවස්ථාමය නිදහස කොතනකවත් සඳහන් වුණේ නෑ. දුර්වලකම් තමා සෑම තැන්හිම ඉස්මතු කරලා පෙන්නුවේ. සියලු ප්‍රගතිශීලි ක්‍රියාකාරකම් වසන් කළා. එකෙන් මේ සියල්ල අනිත් පැත්ත ගැහුනා. අද ඒ අයට ඕනේ විදිහට ජේ.ආර්. ජයවර්ධනගේ ව්‍යවස්ථාව ගෙන්න හදනවා. මේක ඉතා කණගාටුදායක තත්ත්වයක්.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/CEIjvbHcZm8

https://www.aithiya.lk/%e0%b6%b8%e0%b7%9a-%e0%b6%8b%e0%b6%ad%e0%b7%8a%e0%b7%83%e0%b7%8f%e0%b7%84%e0%b6%ba-%e0%b6%86%e0%b6%ba%e0%b7%99%e0%b6%ad%e0%b7%8a-%e0%b6%bb%e0%b6%a7%e0%b6%b8-%e0%b6%9c%e0%b7%92%e0%b6%b1/

# 30. ගොවි ජනතාව දැන් භුක්ති විඳින නිදහස ඉදිරියේ දී නැති වේවි

## කවුඩුල්ලේ ජයතිස්ස



කවුඩුල්ලේ ජයතිස්ස

ලාංකීය දේශපාලනය තීරණාත්මක මංසන්ධියකට ආවා කියලයි මම ගොවියෙක් විදිහට දකින්නේ. ඒ තමයි 20වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලගැන්වීම. නමුත් බලය ලබා ගැනීමේ දී ජනාධිපතිතුමා පොරොන්දු වුණේ පවතින ව්‍යවස්ථාව සංශෝධන කරනවා කියලා නෙමෙයි. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා එය සම්මත කර ගැනීමේ ක්‍රියාවලියක නිරත වෙනවා කියලයි. 19වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරගත්තට පසුව පවා එහි ක්‍රියාදාමයන් ක්‍රියාවට නඟද්දී ආණ්ඩුවේ බල තුලනය පිළිබඳව ගැටලු මතුවී තිබුණා. ඒ නිසාම ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව මිනිසුන්ට තිබුණු පැහැදිලිතාවය ටිකෙන් ටික නැතිවී ගොස් ඒකාධිපති එහෙම නැත්නම් රාජාණ්ඩු ක්‍රමයක් වගේ බලයක් තිබිය යුතුයි, එසේ නොමැතිව ජනතාව පැත්තෙන් වාසිදායක වන තීන්දු තීරණ ගත නොහැකියි යන හැඟීමක් මාධ්‍ය විසින් ඇති කරලා තිබුණා.

පෙර පැවති ආණ්ඩුවේ ජනාධිපතිතුමා සහ අගමැතිතුමා අතර තිබුණු මතභේද හේතුකරගෙන තමයි එය විශාල වශයෙන් හට ගැනුනේ. මේ හේතු පාදක නිසා ගෝඨාභය රාජපක්ෂ මහතාට හැටනම ලක්ෂයක විශාල බලයක් ලබාගැනීමට හැකිවුණා. 1978 ජේ ආර් ජයවර්ධන මහතා විසින් ගෙනආ ව්‍යවස්ථාව තවත් ඉදිරියට ගෙනයාමේ ක්‍රියාවලියකට යන්න ලෝකය විසින් මේ රාජ්‍යය කරන අයට බලකරල තිබුන කියලා මට හිතෙනවා. විශේෂයෙන් ඇමරිකාව, අපිට ආධාර දෙන ලෝක

බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන ලංකාවේ ඇති ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන පනත් වෙනස් කිරීමට බොහෝ උත්සාහයන් ගත්තා ඒ වකවානුවල. උදාහරණයක් විදිහට චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය බලයට පත්වුණාට පස්සේ ගොවි ජනතාවට බලපාන ප්‍රධාන ප්‍රශ්න ගණනාවක් අකාමකා දාන වැඩපිළිවෙළක් ක්‍රියාවට නැගුවා.

ලෝක බැංකුව විසින් ඉදිරිපත් කරන ලද ලියවිල්ලට අනුගත වෙමින් චන්ද්‍රිකා මැතිනිය ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග පැත්තකට දමමින් කටයුතු කිරීමට තීරණය කළා. එම ලියැවිල්ලේ සටහන් වී තිබුණා ජලය සඳහා ජල වෙළඳපලක් සෑදීමට සහ ඉඩම් සඳහා ඉඩම් වෙළඳපලක් සෑදීමට. ජනපද ගොවියාට තමන්ගේ ඉඩම ලේ උරුමයෙන් කිසි කෙනෙකුට බැහැර කිරීමට නොහැකි නීතියක් තිබෙනවා. එය හොඳ වාසිදායක දෙයක්.

නමුත් ඒක බැහැර කරලා ඕන කෙනකුට මේ ඉඩම විකුණා දැමීමේ අයිතිය තහවුරු කරන්න පුළුවන් ලෙස ඒ ලියවිල්ල සටහන්ව තිබුණා. වැවිලි නොවන බෝගවලට කියලා තමයි එය සටහන් කරලා තිබුණේ. ඒකෙන් අපිට පෙනෙන දේ තමයි අපේ සියලු දේ වැවේ අයිතිය, කන්න රැස්වීමේ තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය, ඉඩමේ වගා කිරීමේ අයිතිය, මේ ඔක්කොම ක්‍රමක්‍රමයෙන් හීන කිරීමේ වැඩපිළිවෙලවල් ඉදිරියට ගෙන ආවා.

ඒකෙ දිගුවක් විදිහට චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේන්, පසුව එක්සත් ජාතික පක්ෂ රජයත් ඒ ක්‍රියාව වෙනස් විදියකට ගෙනයන තීන්දු අරං තිබුණා. ඒක තමයි යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩසටහන. ඉන් පසුව මහින්ද රාජපක්ෂ මහතාගේ කාලයේ දී ජාතික භෞතික සැලැස්ම යන වැඩසටහන ආවා. කෘෂිකාර්මික රටක්වන ලංකාවේ ගොවිතැනට උරුමකම් කියන බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග අහෝසි කර දැමීමේ ක්‍රියා පිළිවෙතක් දිගටම ආවා.

සංචාරක කර්මාන්තය සඳහා වැව අයිතිකර ගැනීම, අලි පෙන්වීම සඳහා වැවේ වතුර ධාරිතාවය අඩු කිරීම, මේවායින් කෝටි ගණන් උපයන සංඛ්‍යා ලේඛන අපි මේ මෑතකදී දැක්කා. මින්නේරි වැවේ සහ කවුඩුලු වැවේ පමණක් කෝටි පනස් පහක ආදායමක් උපයා තිබෙනවා

වර්ෂයක් තුළ. එතකොට මිනිස්සුන්ට දැනුනා වැව ගොවියන්ට අවශ්‍ය නැහැ, වැව සංචාරක කර්මාන්තයට යොදා ගතහොත් විශාල ආදායමක් උපයාගන්නට පුලුවන් කියලා.

නමුත් ඒවා යම් විදිහකට පරාජය කර ගැනීමේ හැකියාවක් ගොවි ජනතාවට වගේම අනෙකුත් බුද්ධිමතුන්ට තිබුණා. ඒවා බොහොම අමාරුවෙන් අපි දිනා ගත්ත ඒවා.

අපි දිනාගත්ත බොහෝ අයිතීන්, ක්‍රියාත්මක කිරීමට උත්සහ ගැනීමේ දී බොහෝ වෑයමක් දරා අප පරාජය කරගත් ඒවා සියල්ල අහෝසි කරමින්, තනි ඒකාධිපති බලයක් ගොඩනගාගැනීම තමයි 20වැනි සංශෝධනය කියලා කියන්නේ. මේ හරහා ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ඇද වැටෙනවා සහ ඒ ප්‍රජාතන්ත්‍රවාදයේ ගුණාංග නැතිවී යනවා. නමුත් අපි දන්නවා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක අපි හිතන විදිහට බලවතුන්ට යම් වැරදි දෙයක් කිරීමට එතරම් පහසු නැහැ. හැබැයි අපි දන්නවා රාජ්‍යයක ප්‍රධාන කුළුණු තුනක් තියෙනවා. ව්‍යවස්ථාව, විධායකය, අධිකරණය කියලා. මේවායේ බලය තැන් තුනක තිබෙන නිසා ඕනෑම වැරදි දෙයක් ගෙන ආවොත් එය පරාජය කිරීමේ බලය මේ බලාධිකාරයට තිබෙනවා. හැබැයි මෙය එකතුවුණ අවස්ථාවේ මේ සියල්ල අහෝසි කරලා වැරදි දෙයක් ගෙන ඒමේ අවස්ථා සහ ඉඩකඩ තිබෙනවා. මම ගොවි ජනතාව නියෝජනය කරන කෙනෙක් හැටියට මගේ පැත්තෙන් මම දකින්නේ 20වන සංශෝධනය සම්මත විමෙන් පසුව ගොවි ජනතාව දැන් භුක්ති විදින නිදහස, ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග අහෝසි වෙනවා.

මේ නව සංශෝධනය නිසා අපිට වැවේ අයිතිය නැතිවෙන්න පුලුවන්. ඒ අයිතිය විදේශීය බලවතුන්ගේ අතට යන්න පුලුවන්. සංචාරක ව්‍යාපාර සඳහා අපේ ඉඩකඩම් අයිතිවීම වළක්වන්නට බැරි වෙනවා. වැවේ වතුර ටික මීටර් හයි කරල ගන්න තත්ත්වයකට යයි මේ ක්‍රියාවලිය නිසා. අපේ කුඩා ඉඩම් අකුලලා ඒවා මහා ඉඩම් බවට පරිවර්තනය කරන වෙළඳ ව්‍යාපාර ඇති කරන්න, ඔවුන්ගේ බවභෝග එකේ වගා කරන්න ඔවුන් ඉඩකඩ ඇති කරගන්නවා. වීවලට දැන් ඇවිත් තිබෙනවා වඳ බීජ එහෙම නැත්නම් හයිබ්‍රිඩ් බීජ. අනික් බීජවලට මේක ඇවිත් තිබුනත් අපි අවුරුදු දහස් ගණනක කාල පරිච්ඡේදය තුළ

රැගෙන ආව බීජ අදත් සංරක්ෂණය කරමින්, මේ කියන විපරිත ක්‍රමය යටතේ අපට පවත්වාගෙන යන්න පුළුවන්. හැබැයි මේ ඒකාධිපති බලය සමග මේ තියෙන හැම එකක්ම අහෝසි කරලා ඔවුන්ගේ ඕනෑ එපාකම් අනුව විදේශ බලවතුන්ගේ අවශ්‍යතාවයන් අනුව දේවල් ක්‍රියාවට නඟන්න රටේ ඉඩකඩක් විවෘත වුණා. ඒක භයානක තත්ත්වයක්. ඒ නිසා ගොවි ජනතාවගේ පැත්තෙන් මම දකිනවා 20වන සංශෝධණය ඉතාම නරක ව්‍යවස්ථාවක්.


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/JMNHdHm5CuI

https://www.aithiya.lk/kawudulle-piyathisse-problems-faced-by-the-farming-community/

# 31. රජය වෘත්තීය විශේෂඥයින්ට ඇහුන්කන් දෙන්නේ නෑ

## රජයේ හෙද නිළධාරීන්ගේ සංගමයේ භාණ්ඩාගාරික ඊ.ඒ. ජයසිංහ



ඊ.ඒ. ජයසිංහ

***වසංගත තත්ත්වය කළමනාකරණය කරගැනීම විෂයේ ආණ්ඩුවේ හැසිරීම ඔබ දකින්නේ කොහොමද?***

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉන්න විශේෂඥවරු දන්නවා, මේ රෝගී තත්ත්වය මොන විදිහටද පාලනය කරන්න ඕනේ, ඊට අදාළ සම්පත් කොහොමද යොදාගන්නේ කියලා. එතකොට ඊට අවශ්‍ය ප්‍රතිපාදන සපයන්නේ කොහොමද කියනඑක ආණ්ඩුව දැනගන්න ඕනෑ. නමුත් දේශපාලන අධිකාරියේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් දෙපැත්තකට බෙදිලා ඉන්නවා. මේ දෙගොල්ලෝ එක තැනකට ඇවිල්ලා එක තීරණයක් ගන්න ඕනේ. එයාලා හිතන්න ඕනේ මේක දවස් දහයකට ලොක් ඩවුන් කරලා පාලනය කරන්න පුලුවන්ද, එහෙම නැත්නම් දවස් පහක් ලොක් ඩවුන් කරලා මේක පාලනය කරන්න පුළුවන්ද කියලා. ඒ අතර අහඹු PCR පරීක්ෂණ කරලා, මිනිසුන් වෙන්කරගෙන හොඳ කණ්ඩායම කවුද, වෙනම තියාගන්න ඕන කණ්ඩායම කවුද, කියලා තෝරාගන්න ඉක්මනින් වැඩපිළිවෙළක් සකස් කරනවා නම් මෙය පාලනය කරගන්න පුළුවන්. හැබැයි අපිට පේන්නෙ නැහැ එහෙම දෙයක් වෙනවා.

***අපි දකිනවා රජයේ වෛද්‍ය නිලධාරි සංගමය සහ වසංගත රෝග විද්‍යායතනය අතර විශාල මත ගැටුම් තියෙනවා. රජයේ වෛද්‍ය නිලධාරි සංගමය කියනවා සංඛ්‍යාලේඛන දෙන්නෙ නෑ කියලා.***

***අනෙක් පැත්තෙන් විශේෂඥ වෛද්‍ය පබා පලිහවඩන වගේ අය දැන් දකින්න වත් නෑ. මොකක්ද මේ වෙන්නේ? වසංගත රෝග අංශයේ ලොක්කා ඇවිත් දැන් හැමදාම කියන්නේ මේක තවම සමාජගතවෙලා නැහැ කියලා.***

දොස්තර පබා පලිහවඩන දැන් මොකක් හරි විදේශ කටයුත්තකට යවලා තියෙනවා. කොහොම හරි එයාව එතනින් අයින් කරලා. දැන් ඇවිල්ල තියෙනව වැඩබලන වසංගත රෝග විශේෂඥ වෛද්‍යවරයෙක්. එයා තමයි දැන් මේ පිළිබඳව යම් පාලනය කිරීමක් කරන්නේ. හැබැයි ඉතින් අපි දන්නෑ මේ වැඩබලන කියන නාමය යොදාගෙන ඉන්නේ මොන තත්ත්වයේ සුදුසුකම් තියෙන පුද්ගලයෙක් ද කියලා. රජයේ වෛද්‍ය නිලධාරි සංගමය මේ භයානක තත්ත්වය ගැන කියනවා. එයාල මේක පෙන්නලා එක එක දේවල් කියනවා නමුත් රජයට බලපෑම් කරන බවක් පේන්නේ නෑ. අනෙක් කාර්ය මණ්ඩලවල සම්පූර්ණ සහයෝගය එක්ක එයාලා තමයි කලමනාකරණ වැඩපිළිවෙළ කරන්නේ. එතකොට එයාලට වගකීමක් තියෙනවා වෛද්‍යවරු විදිහට මීට වඩා බලපෑමක් කරන්න රජයට. ඒත් එහෙම බලපෑමක් කරල මේක හරි පැත්තට යොමුකරගන්න බවක් පේන්නේ නෑ. එයාලත් මාධ්‍යයට ඇවිල්ල කියාගෙන යනවා විතරයි. නමුත් කියන දේවල් ක්‍රියාවට නැගෙන්නේ නෑ.

***දැන් ලෝකයේ ගොඩක් රටවල්වල antibody - antigen කියන ටෙස්ට් එකත් කරනවා. අපේ රජය මේකෙදිත් කඹ ඇද ඇද ඉන්නවා.***

PCR පරීක්ෂණ අහඹු ලෙස සිදු කිරීම තමයි මේකෙ ප්‍රතිඵල ගන්න පුළුවන් ක්‍රමය. සෙනඟ වැඩිපුර ගැවසෙන තැනකින් PCR පරීක්ෂණ සිදුකරලා එදිනම ප්‍රතිඵල දෙන්න ඕනි. එතකොට තමයි රෝගීන් සොයා ගන්න පුළුවන් වෙන්නේ. තව දුරටත් ව්‍යාප්ත වෙන්නේ නැතුව. නමුත් මේ antigen පරීක්ෂණය ගත්තොත් මේකේ සීයට හැත්තෑවක් පමණ තමයි ප්‍රතිඵල පෙන්නන්නෙ. ඉතුරු 30% පෙන්නන්නෙ නෑ කියන එක තමයි විශේෂඥ මතය. අනිත් එක තමයි මේ antibody test එක. මේක ගැන කලින් IDH රෝහලේ අධ්‍යක්ෂකවරයා කිව්වේ මේක එච්චර සාර්ථක නැහැ කියලා. එහෙම කිව්වේ පළවෙනි රැල්ල

වෙලාවෙදි. මේකෙන් corona පමණක් නොවෙයි වෙන මොකක් හරි රෝගයක් තියෙනවා නම් එතනදිත් මේක positive කියලා පෙන්නනවා. විශේෂඥ වෛද්‍යවරුන් එක කණ්ඩායමක් කියනවා දවස් කීපයක් ගියාට පස්සේ තමයි මේ ටෙස්ට් එක කරන්න ඕනේ කියලා. මොකද antibody ශරීරයේ හැදෙන්න ටික කාලයක් ගත වෙනවා. මේක rapid test එකක්. මේ වෙලාවේ මේක කරන එකේ හොඳ ප්‍රතිඵලයක් තියෙනවා. මේ වෙනවිට මේක සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙන්න පටන් අරගෙන තියෙන්නේ. අපිට ඕනි ක්ෂණිකවම මේක බලාගන්න පුළුවන් ක්‍රමයක්. මම හිතනවා මේ antibody test එක මේ වෙලාවේ මේ රටට යොදා ගැනීම ඉතාම හොඳ දෙයක් කියලා. දැන් positive වෙනවනම් positive වෙන්නේ corona virus එක ශරීරයේ තියෙන පුද්ගලයින් තමයි.

***ආරක්ෂක අංශයේ සෑහෙන්න දෙනෙකුට මේ වෙනකොට මේ රෝගය බෝවෙලා තියෙනවා කියලා තොරතුරු තියෙනවා. රෝහල් කාර්ය මණ්ඩලයටත් මේක ආසාදනය වෙලා තියෙනවද?***

සමහරු කියනවා ආසාදනය වෙලා තියෙනවා, නමුත් තොරතුරු එළියට දෙන්නෙ නෑ කියලා. රෝහල් කාර්ය මණ්ඩලය ගත්තොත් (මෙම සාකච්ඡාව කරන දිනය වනවිට) පනහකට ආසන්න ප්‍රමාණයකට මේ වනවිට රෝගය බෝ වෙලා තියනවා. මේ බෝවෙලා තියෙන්නේ රෝහල්වලින්, වාට්ටුවලින් නෙමෙයි. IDH රෝහලේ කිසිම කෙනෙකු මේ වෙනවිට නිරෝධායනයට ලක්වෙලා නෑ. අනෙක් මධ්‍යස්ථානවලත් කාර්ය මණ්ඩලයේ කිසිම කෙනෙක් වාර්තා වෙලා නෑ. එතකොට වාර්තා වෙලා තියෙන්නේ රෝහලට නොදැනුවත්කමින් පැමිණි රෝගියෙකුගෙන් බෝවුන එකක් හරි, රෝහලෙන් පිටත එළියෙදි කාගෙන්හරි බෝවුන එකක් තමයි. හැබැයි ආරක්ෂක අංශයේ ඊට වඩා ව්‍යාප්ත වෙනවා වැඩියි.

***කොවිඩ් පළවෙනි රැල්ල වෙලාවේ අපි දැක්කා අරමුදලක් පටන් අරගත්තා. ඒකාලේ දේශපාලඥයෝ කතාකළා රෝහල්වල පහසුකම් කොහොමද ඇති කරන්නේ කියලා. දැන් දෙවැනි රැල්ලත් ඇවිල්ල තියෙනවා. හැබැයි අපිට පේන්නේ නෑ පහසුකම්වල කිසිම***

***සංවර්ධනයක්. අරමුදලට වුණ දෙයකුත් නෑ වගේ තමයි දැන් පේන්නේ?***

ඇත්තටම මිනිස්සුන්ටත් මේ අරමුදල මතක් වුණේ දෙවැනි රැල්ලත් ඇවිල්ලා ටික දවසක් ගියාට පස්සේ. මේ අරමුදලට මිනිසුන් කෝටි ගණන් සල්ලි දුන්නා. පළවෙනි රැල්ලෙදි එච්චර වියදමක් යන්න විදිහක් නෑ මේ අරමුදලෙන්. නමුත් අද වෙනකොට මේ අරමුදලට වුණ දෙයක් නෑ. දැන් ප්‍රශ්න කරගෙන යනවා ඒ අරමුදලට ලැබුණ මුදල් කොහොමද වියදම් කළේ කියලා. ඒවට තවම කිසිම උත්තරයක් නෑ. ඒ අරමුදලේ භාරකාරීත්වය දරන පුද්ගලයින්ගෙන් ඒකට පිළිතුරු ලැබුණේ නෑ. මම හිතන්නේ මේ වන විට ඒ අරමුදලේ මුදල් වෙන වෙන කටයුතු සඳහා යොදා ගෙනයි තියෙන්නේ. ඒ පිළිබඳ තොරතුරු එළියට ලබාදෙන්නේ නැහැ. ඒවා හොයාගන්න පුළුවන් වෙයිද කියලා මට සැක හිතෙනවා. මේ අරමුදල තිබුණානම් අද වෙන විට සෑහෙන දෙයක් කරන්න තිබුණා. රෝගීන්ට සත්කාර කරන්න මේ අරමුදල යොදා ගන්න තිබුණා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/cfElX3XNQRA


https://www.aithiya.lk/covid-epidemic-issue-of-the-ministry-of-health/

# 32. වැඩිම මුදල් උපයන අය ගැන හෙව්වොත්, පාස්කු ප්‍රහාරයේ මහා මොළකාරයින් හොයාගන්න පුළුවන්

**චතුර ගලප්පත්ති**

**(දෙව්නුවර ආසන සංවිධායක, සමගි ජන බලවේගය)**

***මාතර දෙව්නුවර ආසනයේ විපක්ෂයේ සංවිධායකවරයා විදියට කොවිඩ් තත්ත්වය ආණ්ඩුව හසුරුවන ආකාරය ගැන ඔබේ පැත්තෙන් නිරීක්ෂණ මොනවද? අපි දන්නවා දෙව්නුවර ධීවරයො විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඔවුනුත් ගැටලුවලට මුහුණ දීලා ඉන්නේ..***



චතුර ගලප්පත්ති

මම හිතන්නේ මීට දවස් කිහිපයකට කලින් දිස්ත්‍රික්කය පුරාම දහනම දෙනෙක් (19) හඳුනා ගෙන තිබ්බා ආසාදිතයන්. ඊට අමතරව නිරෝධායනය කරපු ගෙවල් විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ අය බොහෝවිට දැන් ගෙවල්වලම තමයි නිරෝධායනය වෙන්නේ. රජයෙන් දෙනව කිව්ව රුපියල් දහදාහ, ගෙවල්වල නිරෝධායනය වෙන පවුල්වලට අවශ්‍යය ආහාර ටික තාම ලැබෙන්නෙ නැහැ. එහෙම ප්‍රශ්නයක් තියෙනවා. ඒක පෞද්ගලිකව මිනිස්සු අපිට කතාකරල කියනවා. ඊට අමතරව මරණ සම්බන්ධයෙන් නම් එහෙම තක්සේරුවක් නැහැ. මොකද අපිට මරණ ආරංචි වෙනවා, සමහරවිට හාට් ඇටෑක් කියනවා. අපි දන්නෙ නැහැ කොවිඩ් නිසාද මොකක් නිසාද කියලා. දැන් අපි දැක්කා පහුගිය දවස්වල නිරෝධායන මධ්‍යස්ථානයෙන් එළියට බහින මනුස්සයා පාරේ ඇද වැටිලා මැරෙනවා. ඉතින් එහෙම තියෙද්දි අද දවසේ මේගොල්ලො මේ ඇඳිරි නීතියක් නැති කරලා බස්නාහිර පළාතත් විවෘත කළා. ආණ්ඩුවේ

අසමත්කම නිසා කොවිඩ් වසංගතය දැන් නවත්තගන්න බැරි තැනකට ඇවිල්ලා තියනවා.

***පෑලියගොඩ මාළු පොකුර ගැන මාධ්‍යයේ ප්‍රචාරය වුණාට පස්සේ ලංකාවේ මිනිස්සු මාළු පරිභෝජනය නතරකරලා දැම්මා. ඒ සමගම ධීවර ප්‍රජාව ලොකු ප්‍රශ්නයකට මුහුන දුන්නා. නමුත් රජයට තිබුන යුතුකමක් එතනට මැදිහත් වෙලා කටයුතු කරන්න. රජය පැත්තෙන් මාළුන්ගෙන් කොරෝනා එන්නේ නැහැ කියන මතය හෝ සමාජයට දෙන්න කෙනෙක් හිටියේ නැහැ. ඔබතුමාගේ ආසනය ගත්තොත් සෑහෙන ධීවර ප්‍රජාවක් ඉන්නවා, මොකක්ද ඔවුන්ගේ තත්ත්වය?***

ඔව් දැන් ධීවරයන්ට කර කියාගන්න දෙයක් නැතිව ඉන්නේ. බහුදින යාත්‍රා වගේම දවසේ රැකියා කටයුතු කරන අයත් විශාල අර්බුදයකට මුහුණ දීලා තියෙනවා. අද ඔවුන් ගෙනෙන එළදාව ඔවුන්ට විකුණග න්න බැරිවෙලා තියෙනවා. රජයෙන් මොන දේ කිව්වත් ඔවුන් මේක මිලදී ගන්නවා කියල, ඒක හිතන තරම් කාර්යක්ෂමව වෙන්නෙ නෑ කියල තමයි අපිට පේන්නේ. මේ තත්ත්වය අස්සේ ධීවරයන්ට වියදමවත් පියව ගන්න බැරි ප්‍රශ්නයක් ඇවිල්ල තියෙනවා. මිනිස්සු තුළත් බයක් ඇවිල්ල තියෙනව මාළු නිසා කොරෝනා බෝවෙනවා කියලා. එතකොට අපි දන්නවා මේකෙන් යැපෙන අතර මැදි කණ්ඩායමකුත් ඉන්නවානේ. සාමාන්‍යයෙන් අපි දකිනවා මාළු අරගෙන යන මනුස්සයාටවත් අද වෙළඳාම් කරගන්න විදිහක් නැහැ. ඒ අතරමැදි කණ්ඩායමත් අසරණ වෙලා ඉන්නෙ. ඉතින් මේක විශාල ප්‍රශ්නයක්. ඔවුන්ගේ ආර්ථිකය මුළුමනින්ම කඩා වැටිලා. මේක රජය කතා කරනවා විතරයි.

පෑලියගොඩ වගේ බොහෝ පිරිසක් එකතුවෙන තැනක, අපි දැන් පළවෙනි රැල්ලක් ඇවිල්ලා එයින් පාඩම් ඉගෙනගත්ත කණ්ඩායමක් විදිහට අහඹු PCR පරීක්ෂණ කරලා තිබුණානම් මෙහෙම රැල්ලක් එන්නේ නැහැ. ආණ්ඩුව නිකං උඩ පැන්නා විතරයි හරි ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. හරියට කටයුතු කළානම් මේ පොකුරු දෙකම එන්නේ නැහැ.

***අපිට පේනවා කොවිඩ් මර්දනය කිරීමේදී සෑහෙන දුර්වලතා. ජනාධිපතිවරයා, කාර්යසාධක බලකා ප්‍රධානියා, අගමැතිවරයා විවිධ දේවල් කියනවා. ඔවුන්ගේ අසාර්ථක බව තමයි පෙනෙන්න තියෙන්නේ. 19 නිසා බෑ කියපු අයට 20 නිසාත් බෑ කියලද මේ***

*කියන්නේ ?*

අපේ ආණ්ඩුව පෙරළද්දී මුලින්ම කිව්වෙ 19වැනි සංශෝධනය නිසා තමයි සියලුම ප්‍රශ්න ආවේ කියලා. ඔවුන් එය සමාජගත කළා. 19 නිසා තමයි පාස්කු ප්‍රහාරය වුණේ, 19ය නිසා තමයි මහ බැංකුව කැඩුවෙ, කියලා තමයි ඔවුන් කීවේ. ඇත්තටම ඔය දෙකම වෙන්නෙ 19 නිසා නෙමෙයි, ඔය දෙකම වෙන්නේ ඔවුන් කරපු දේවල් නිසා. පාස්කු ප්‍රහාරය ගැන කල්පනා කරලා බලන්න, මං දන්නෑ මේ රටේ හරියට නීතිය ක්‍රියාත්මක වෙනවා නම් මේ කොමිසම හරහා නිවැරදි පිළිතුරක් ලැබුණ දවසක තේරෙයි කවුද මේක පසුපස හිටියෙ කියලා. පැහැදිලිවම මගේ අවබෝධය අනුව, අද මේ ආණ්ඩුව කරන බොහෝ දෙනෙක්, අද ආණ්ඩුවේ ඉන්න ඉහළපෙළේ බොහෝ දෙනෙක් මේක පිටුපස ඇති කියන විශ්වාසය, මා තුළ තියෙනවා. මොකද ඒව අපිට පේනවා. එක්සත් ජාතික පක්ෂය එදා ආණ්ඩු පාර්ශ්වය විදියට යම්යම් අඩුපාඩු අපි බාරගන්නවා. නමුත් කාරණාව එකේ ප්‍රධාන මොළකරුවො ටිකක් ඉන්නවා. අද මේ වර්තමාන ආණ්ඩුවේ වැඩිම මුදල් උපයන අය ගැන හෙව්වොත්, ඔවුන් පස්සේ පැන්නුවොත් පාස්කු ප්‍රහාරයේ වැරදිකාරයො ටික අපිට අල්ලගන්න හරි පහසුයි. ඉස්සරහට මං හිතන්නේ තවකාරණා අනාවරණය වෙයි. අද කොරෝනා වසංගතය වෙලාවෙදිත් මුදල් හම්බ කරන්නෙ කවුද කියන එක අපි කල්පනා කරල බැලුවොත්, මේ සියල්ල එකට සම්බන්ධ දේවල්. ඒ දේවල් ඉදිරියට අනාවරණය වෙයි.

මං හිතනවා මේ රටේ ජනතාව දේශපාලනඥයා කවුද කියන එක හරියට අඳුර ගන්න ඕනේ. දේශපාලන අත්දැකීම් කියනඑක රටක වැදගත් දෙයක්. ඒක නරක දෙයක් නෙමෙයි. මොකද ගෝඨාභය මහත්තයා රටේ ජනාධිපති කරන්න මේ රටේ මතයක් හැදුවා 225ම එපා, මුන් සේරම මෝඩයෝ මේගොල්ලෝ ඉන්නේ හොරකම් කරන්න, දූෂණ වංචා කරන්න විතරයි කියලා. ඒක පෞද්ගලික මාධ්‍යවලින් දිගින් දිගටම කිව්වා. හෙනයක් ගහනවා නම් පාර්ලිමේන්තුවට හෙනයක් ගහන්න. ගංවතුරක් ගැලුවොත් පාර්ලිමේන්තුව යටවෙන්න. මේකට බොහොම ලේසියෙන් මේ රටේ මිනිස්සුත් එකතු වුණා. හැබැයි අද මේරට යම් හොඳ තැනකට ගිහින් තියනවනම් ඒ ගිහින් තියෙන්නේ හොඳ දේශපාලනඥයෝ නිසා.

***අපි දන්නවා ජනාධිපතිවරයාගේ ධුරයට අවුරුද්දක්. මේ පාලනය අස්සේ රටේ අනාගතය මොනවගේ වෙයිද?***

මම ඉපදිලා නැතිවුණත් 77ට කලින් සිරිමාවෝ මැතිනියගේ පාලන කාලේ හාල් පොල්ල, මිරිස් පොල්ල වැනි දේවල් තිබිලා තියෙනවා. ඉතින් ඒ වගේ කාලෙකට රට නැවත යයි කියල තමා අපේ වැඩිහිටි පරම්පරාව නම් කියන්නේ. මොකද ඒ අත්දැකීම ඔවුන්ට තියෙන නිසා. උදාහරණයක් විදියට අද වාහනයට ටයර් එකක් ගන්න නැහැ. එන්ජින් ඔයිල් ටිකක් නැහැ. මේ අපි කතා නොකරන මාතෘකා. බඩුමිල ගැන හැමෝම කතා වෙනවානෙ. බඩු මිල වැඩියි. මිනිස්සුන්ට ජීවත් වෙන්න බැහැ. වාහනයකවත් යන්න බැරි වෙනවා මේ විදියට. රට විශාල වශයෙන් ණය අරගෙන තියනවා. ණය ගෙවන්නත් ඕනෑ. එතකොට දැන් මෙයාල දේශීය ආර්ථිකය ගැන කතා කරනවා. ඒ ගැන කතා කරාට ඒ සම්බන්ධව ගත්ත කිසිම තීන්දු තීරණක් අපිට තාම පේන්න නැහැ. අනෙක් පැත්තෙන් කැලෑ සුද්ද වෙනවා. අලි මිනිස් ගැටුම් විශාල ප්‍රශ්නයක් වෙලා එදාට වඩා. ප්‍රවෘත්ති බැලුවොත් අනිවාර්යෙන් අලි මිනිස් ගැටුම නිසා මිනිස්සු මැරෙනවා කියන නිව්ස් දකින්න පුලුවන්. මේ රටේ ප්‍රශ්න තියෙනවා ගොඩක්. කොරෝනා ප්‍රශ්නය, අලි මිනිස් ගැටුම, එතකොට මම දැක්කා පත්තරයක තියෙනවා ලංකාව මන්දපෝෂණය අතින් ආසියාවේ දෙවැනි තැනට කියලා. මේ වගේ සෞඛ්‍ය ගැටලු තියෙනවා. වෙනදා නිකන් දීපු බෙහෙත් ටික අද සල්ලි දීලා ගන්න වෙලා තියෙන්නෙ මිනිස්සුන්ට. අද වෙනකොට සංචාරක කර්මාන්තය කඩා වැටිලා තියෙන්නේ. මේ රටට ආදායම් ගෙනඑන ව්‍යාපෘති සම්බන්ධයෙන් මේ ආණ්ඩුවට කිසිම කතාවක් නැහැ. නව නිපැයුම් සම්බන්ධයෙන් ආණ්ඩුව පටන් ගන්නකොට කතා කළා. කෝ ඒකට මොකද වුණේ. ඒකට පත්කරපු ඇමතිතුමියවත් ඒ සම්බන්ධයෙන් අවධානයක් යොමු කරනවා ද කියලා අපිට පේන්නේ නැහැ. තාක්ෂණය පැත්තෙන් අපේ රට ගොඩාක් පහළින් ඉන්නේ. මේ හැම පැත්තෙන්ම පහළට යාමක් තමයි අපිට පේන්න තියෙන්නේ. අද මේ රටට වෙලා තියෙන දේ වචන දෙකකින් කියනවා නම් “ආණ්ඩුව ෆේල්“.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/OCipzitXqeY

https://www.aithiya.lk/chathura-galappaththi-samagi-jana-balawegaya-2/

# 33. ජනාධිපතිගේ "අපි ණය උගුලක අහු වෙලා නෑ" කියලා කියපු වචනේ අපට විශ්වාසයි

## බද්දේගම සමිත හිමි


බද්දේගම සමිත හිමි

***අපි දැක්කා පහුගිය දවසක ඔබ වහන්සේ තනිවම ඇමරිකානු රාජ්‍ය ලේකම්වරයාගේ ලංකා සංචාරයට විරෝධය දක්වා උද්ඝෝෂණයක නිරතවෙනවා. ඔබ වහන්සේ ආණ්ඩු පක්ෂය තමයි නියෝජනය කරන්නේ, ඇයි ආණ්ඩුවට තමන්ගේ විරෝධය කෙළින්ම නොදක්වා මෙහෙම විරෝධයක් දැක්වූවේ?***

කොවිඩ් වසංගත තත්ත්වය තුළ පිරිස් රැස් කිරීම සුබදායක නොවන නමුත් විරෝධතාවයක් නොදක්වා සිටීම අපගේ හෘද සාක්ෂියට එකඟ නොවන නිසා තනියෙන් හෝ සංකේතාත්මකව විරෝධය පෑ යුතුයි කියලා මම විශ්වාස කළා. ඒ වගේම රජයේ පාර්ශවයේ පාර්ශවකරුවෙකු වුණත් අපේ අරමුණ වෙන්නේ අපේ රටේ ස්වෛරීභාවය, රටේ ජනතාවගේ නිදහස, අපේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම. එතකොට මේ ඇමරිකන් විදේශ ඇමැතිවරයා නැතිනම් රාජ්‍ය ලේකම්වරයාගේ පැමිණීම ඉබේ සිදුවූ දෙයක් නෙවෙයි. ඒක හිතා මතා කල්වේලා ඇතිව සංවිධානය සිදු වූ දෙයක්. මැතිවරණය කටළඟ තියෙද්දී ඇමරිකාවේ රාජ්‍ය ලේකම්වරයා මේ විදිහට ආසියානු චාරිකාවක් හදිසියේම සිද්ධ කළේ යම් අරමුණක් ඇතිව. නිකම් කතාබහ කරලා සුවදුක් බලලා යන්න ආවා නෙවෙයි. මෙම සංචාරයේ ප්‍රධානම අරමුණ වෙන්නේ චීන විරෝධී කඳවුරක් නිර්මාණය කර ගැනීම. එතකොට චීන විරෝධී කඳවුරක් ඇති කරගැනීමට ඔවුන් දරන උත්සාහයේදී අපේ රට කිසිවෙකුගේ අතකොලුවක් බවට පත් නොවිය

යුතුය, අපි නොබැඳි පිළිවෙතක සිටිය යුතුය කියනඑක තමයි අපේ මතය.

ඒක අපි දීර්ඝ කාලයක් තිස්සේ විශ්වාස කරන දෙයක්. ඒ අනුව චීනයට හෝ ඇමෙරිකාවට හෝ අනවශ්‍ය බැඳීමකට නොයා යුතුයි කියන කාරණාව තමයි අපි ආණ්ඩුවට බල කරන්නේ. ඒ වගේම MCC, SOFA වැනි ගිවිසුම් අත්සන් කිරීමට කිසිසේත් එකඟ නොවිය යුතුයි කියන පණිවිඩය තමයි අපි අණ්ඩුවට දෙන්නේ. ඉතින් එතනදි අපි විශේෂයෙන්ම කල්පනා කරන්නේ MCC වගේ ගිවිසුමක් වැරදිලාවත් අත්සන් කරොත් අපේ රට අනිවාර්යෙන් බෙදෙනවා. ඇමෙරිකානු කොරිඩෝව හරියටම අපේ රට දෙකඩවෙන විදියට තමයි යන්නේ. ඒ විතරක් නෙමෙයි ඒ කලාපය තුළ තියෙන සියලු ඉඩම්, පුද්ගලික ඉඩම්, රජයේ ඉඩම්, වන සංරක්ෂණ ඉඩම් මේ සියල්ලේම බලය ඇමෙරිකානු කොරිඩෝව සතු වෙනවා. MCC සමාගම අනිවාර්යෙන්ම එහි භාරකාරයා බවට පත්වෙනවා, අයිතිකාරයා බවට පත්වෙනවා. ඊළඟ කාරණය තමයි අපිට චීනය සමග ආරවුල් ඇතිකර ගැනීමේ කිසිදු උවමනාවක් නෑ. දෙගොල්ලොම අපේ මිත්‍රයෝ. හැබැයි චීනය අපගේ ඓතිහාසික මිත්‍රයෙක්. ඒ වගේම ආසියාවේ අපේ අසල්වැසියෙක්. ඒ නිසා අපි සාම්ප්‍රදායික මිතුරා අපිට අතහැර දාන්න බැහැ. නමුත් කෙසේ හෝ මේ ඇමරිකාව මුල්වෙලා සිද්ධ කෙරෙන වෙළෙඳ යුද්ධය හා ඒකෙ අනිවාර්යයෙන්ම ඊළඟ පියවර වෙන්නේ ලෝක යුද්ධයකට සූදානම් වීම. එම නිසා අපි කාගේත් මිත්‍රයෝ. හැමෝම අපිට උදව් කරන්න. අපි රජයට කියන්නේ අපි මධ්‍යස්ථ ප්‍රතිපත්තියක, සිරිමාවෝ බණ්ඩාරනායකගේ නොබැඳි පිළිවෙතේ ඉන්න ඕනෑ කියන එකයි.

***ඔබ වහන්සේ නොබැඳි ප්‍රතිපත්තිය ගැන කතා කරා. විශේෂයෙන්ම අපි දන්නවා 2015 රාජපක්ෂ ආණ්ඩුව පැවතිය කාලේ විදේශ ප්‍රතිපත්තිය වුණේ චීනයට ලැදි චීනයත් එක්ක බැඳුන විදේශ ප්‍රතිපත්තියක්. එතකොට කොහොමද ඒක නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් වෙන්නේ? අපි චීනයට සැහෙන බැඳීමත් එක්ක ඉන්දියාව අපිත් එක්ක විරසක වෙන ස්වරූපයක් තියෙන්නේ. එතකොට කොහොමද මෙක කළමනාකරණය කරගන්නේ?***

මම හිතන්නේ බැලූ බැල්මට අපි චීනයට වැඩි පක්ෂග්‍රාහී බවක් පෙනුනත්, මහින්ද රාජපක්ෂ රජය දක්ෂ වුණා මේ සියලු දෙනාගේම සහයෝගය ලබාගන්න. විශේෂයෙන්ම යුද්ධය අවස්ථාවේදි අපිට අවි ආයුධ නැතිවෙච්චි වෙලාවේ චීනය ඉදිරිපත් වුණා. ඒවගෙ ම චීනය හා සමාන්තරවම වාගේ ඉන්දියාවත් මුල් අවධියේදී යම් යම් පසුබෑම්වල හිටියත් පසුකාලීනව යුද්ධය අවසාන සමය වෙනකොට ත්‍රස්තවාදයට එරෙහිව ඉදිරියට ඇවිත් අපිට ආධාර දෙන්න උදව් දෙන්න කටයුතු කරා. අපි ඉල්ලා සිටින්නේ එහෙම යම් අනවබෝධයක් ඇති වෙලා තිබුණ නම් ඒවා නිවැරදි කරගත යුතුයි. අපට ඉන්දියාව අමතක කරන්න බෑ. අනිවාර්යෙන්ම චීන ව්‍යාපෘති විශාලයි. මේ ව්‍යාපෘතිවලට චීනය බැඳීම්වලින් තොරව විශාල මුදල් ප්‍රමාණයක් දෙනවා. ඉතින් ඒ නිසා මං හිතන්නේ ඒක ඕන කෙනෙක් ඇහැට වැටෙනවා චීනය පැත්තට වඩා පක්ෂග්‍රාහී කියලා. නමුත් අපි ඉල්ලා සිටින්නේ එහෙම යම් අදහසක් ලෝකයට යනවානම් කරුණාකරලා හැකි ඉක්මනින් එකෙන් මිදිලා අපේ විදේශ ප්‍රතිපත්තිය නිවැරදි කරගන්න.

***අපි දැක්කා ජයවර්ධන ආණ්ඩුව කාලේ විශේෂයෙන්ම ඇමරිකාවට ඔහු දක්වපු පක්ෂපාතීත්වයත් එක්ක ඉන්දිරා ගාන්ධිගේ ආණ්ඩුව කොහොමද ඒකට ප්‍රතිචාර දැක්වුයේ කියලා. එක පැත්තකින් උතුරේ ජන වාර්ගික අරගලයක්, යුද්ධයක් නිර්මාණය වෙන්නට ඒක බලපෑවා. ඉන්දියාව ඇතුලේ LTTE සංවිධානයට පුහුණුවීම් පවා ලබාදෙමින් ඉන්දියාවේ දේශපාලනය ඒ වෙලාවේ ඒකට ප්‍රතිචාර දැක්වුවා. නැවත දැන් චීනය දිහාවට අපි ආපහු හැරෙන කොට, අපිට ඒ වගේ ප්‍රශ්ණත් එන්න පුළුවන් නේද? ළඟට අපි චීන ණය උගුලක හසුවෙලා කියලා කතාවක් තිබෙනවා.***

එහෙම චෝදනාවක් තියෙනවා. මම දන්නෑ ඒක කොච්චර දුරට සාධාරණද කියලා. රටේ ජනාධිපතිවරයා කියනවා අපි ණය උගුලක අහුවෙලා නෑ කියලා. ඒ ණය උගුල්වලට අහුවෙලා නෑ කියලා කියන්නේ ඡන්දය ලබා ගැනීම හෝ වෙනත් කාරණාවකට නෙමෙයි. ඇමෙරිකන් රාජ්‍ය ලේකම්වරයාගේ මූණටමත් කිව්වා අපි එහෙම ණය උගුලක පැටලිලා නැහැ කියලා. ඒ නිසා අපට ඒ වචනේ විශ්වාස කරන්න පුළුවන්කම තියෙනවා.

නමුත් අපට හැමදාමත් ණය ලබාගැනීමෙන්ම ජීවත් වෙන්න බෑ. ණය දෙන අය කවුරුවත් එහෙම හොඳ හිතින්ම දෙනවා කියලා අපි හිතන්නේ නෑ. අපි අපේ ආර්ථිකය නිවැරදි කරගන්නට ඔවුන්ගේ උදව් ලබාගන්න ඕනෑ. ඒවගේම අපි අපේ දෙපයින් නැඟී සිටින්නට ක්‍රියා කළ යුතුයි. ඒවගේම අපි අතීතයෙන් පාඩම් ඉගෙනගත යුතුයි. දැන් ඔබම ප්‍රකාශ කළා ඉන්දියාව කෝපකර ගැනීමේ ප්‍රතිවිපාක අපි අවුරුදු තිහක් වින්දා කියලා. ඒනිසා මේ මොහොතේ අපට යම් හිතවත්කමක් තියෙන මෝදි ආණ්ඩුව අපි අමනාප කරනොගෙන, ආසියාවේ බලවතා චීනය තරහකර නොගෙන, ඒ වගේම ඇමරිකාවට ගැති නොවී, මේ සියලු දෙනාම යම් ආකාරයකට සමහන් කරගෙන ක්‍රියා කිරීමට අපි දක්ෂ වෙන්න ඕනෑ.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/jr1E-_p3Z_Y

https://www.aithiya.lk/baddegama-samitha-thero-mcc/

# 34. මේ ව්‍යාජ දේශප්‍රේමීත්වයට භික්ෂූන් වහන්සේලාත් වගකියන්න ඕනෑ

## චන්ද්‍රජෝති හිමි



චන්ද්‍රජෝති හිමි

***පහුගිය කාලයේදී අපි දැක්කා චීන, ඇමරිකානු නියෝජිතයින් ලංකාවේ සංචාරයේ නිරත වුණා. ඒ සමග ආපු චෝදනාව තමයි මේ අය අපේ රටට විවිධ මැදිහත්වීම්, බලපෑම් කරනවා කියන එක.***

අපි කවුරුත් දන්නවා ලෝකයේ ප්‍රබල ආර්ථිකයක් තිබෙන රට හැටියට ඇමෙරිකාව ඉදිරියෙන් ඉන්නවා. ඒකට අභියෝග කරන ඊළඟ බලවන්තයා හැටියට චීනය ඇමෙරිකාවට අභියෝගයක් වෙමින් පවතිනවා. සාමාන්‍යයෙන් ඇමරිකාවේ ආර්ථිකයට වඩා ට්‍රිලියන හතක් අඩුවෙන් චීනය තියෙනවා කියලා තමයි විශ්ලේෂකයො කියන්න. ඒ වගේම මේ මොහොතේ කොරොනා තත්වයත් එක්ක ඇමෙරිකාව බරපතළ විදිහේ ඍණ ආර්ථිකයක් දක්වා පසු බැසීමට ලක් වෙලා තියෙනවා. ඒ බලපෑම එලෙසම චීනයටත් සිද්ධ වුණා. නමුත් මේ ප්‍රශ්නෙදි කොරොනා තත්ත්වයට මුහුණ දීලා නැවත ආර්ථික ශක්තිය ගොඩනගාග න්න චීනයට හැකියාවක් ලැබිලා තියෙනවා. ඉතින් මේකත් එක්ක ඇමෙරිකාව චීනයට එරෙහිව එහෙම නැත්නම් විශේෂයෙන් දකුණු ආසියානු කලාපයේ තමන්ගේ දේශපාලනික, යුධමය මැදිහත්වීම ප්‍රබල කරල තියනවා. ඒකේ ප්‍රතිඵලයක් විදිහට තමයි අපට අමෙරිකානු රාජ්‍ය ලේකම්වරයා ඇතුළු රාජ්‍ය දූත කණ්ඩායමක් ඉන්දියාව, ලංකාව, මාලදිවයින, ඉන්දුනීසියාව දක්වා මේ කලාපයේ රටවල්වලට පැමිණීම තේරුන් ගන්න වෙන්නේ.

***අපි දන්නවා චීනයෙන්, ආධාර මුදල් විදියට, ණය විදිහට විශාල වශයෙන් අපේ රට මුදල් එනවා. ඒ වගේම චීන අනුග්‍රහය යටතේ ලංකාව තුළ විවිධ ව්‍යාපෘති සිද්ධ වෙනවා. විශේෂයෙන් මේ ණය දීම්, චීන ව්‍යාපෘති හරහා චීනයේ උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක වෙන්නෙ කොහොමද ? ඒ වගේම මේ දේවල් ලංකාවේ අනාගත දේශපාලනයට, ආර්ථිකයට ඇති කරන්න පුළුවන් බලපෑම මොකක්ද?***

හම්බන්තොට වරාය, පෝට් සිටි ව්‍යාපෘතිය, අනෙකුත් මහා මාර්ග ව්‍යාපෘති වගේ විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් චීනය කරනවා. ලංකාව තුළ විතරක් නෙමෙයි චීනය ගොඩක් රටවල් තුළ කරපු ව්‍යාපෘතිවල අරමුණු දෙකක් තියෙනවා. එකක් තමයි ආර්ථිකමය අරමුණ, අනෙක් පැත්තෙන් යම් හෙයකින් චීනයට ලෝක යුද තත්ත්වයක් නිර්මාණය වුණොත්, දැන් උදාහරණයකට හම්බන්තොට වරාය ඔවුන් 99 අවුරුද්දකට බදු ගන්නකොට ඒකෙන් රටට ඩොලර් මිලියන ප්‍රමාණයක් හම්බ වෙනවා වගේම යම් හෙයකින් හෙට දවසේ ලෝක යුද්ධයක් ඇති වුනොත් හම්බන්තොට වරාය චීන යුධ මධ්‍යස්ථානයක් හැටියට පාවිච්චි වෙනවා. හෙට දවසේ යම්කිසි යුද්ධයක් හටගත්තොත් අනිවාර්යෙන් පෝට්සිටී භූමිය චීනය භාවිතා කරන්න පටන් ගන්නවා. අපි හිතමු මත්තල ගුවන්තොටුපල ඉන්දියාව ඉල්ලන එක වෙන්න පුළුවන්, එහෙමත් නැත්තං ඇමරිකාව ලංකාවට කරන බලපෑම වෙන්න පුළුවන්, අපිට දේශපාලනඥයෝ කුමන විදියට මේක වර්ගීකරණය කරල කිව්වත් අපිට පේන දැනෙන දේ තමයි මේ කෙටිකාලීනව ලැබෙන ඩොලර් ප්‍රමාණය ගැන විතරයි පාලකයෝ හිතන්නෙ. ඒ ඩොලර් ණය ගන්න ප්‍රමාණයෙන් ඔවුන් රටේ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනගනවා වෙනුවට ඔවුන්ගේ දේශපාලන බල ව්‍යාපෘතිය ශක්තිමත් කරගන්න තමයි ඒ මුදල් යොදවන්නේ. උදාහරණයක් විදියට ගත්තොත් තමන්ට අවශ්‍ය කරන අණපනත් තමන්ට අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගන්න, පාර්ලිමේන්තුව ඇතුළේ බල හුවමාරුවේදී මන්ත්‍රීවරු මිලදී ගන්නට පවා ඔවුන් ඒ මුදල් වියදම් කරනවා. තමන්ගේ දේශපාලන බලය වෙනුවෙන්, පැවැත්ම වෙනුවෙන් ක්‍රියා කරනවා ඇරෙන්න වෙනකිසිවක් ඔවුන් කරන්නේ නැහැ. ඉතින් ඒ හින්දා ආර්ථිකමය වශයෙන්, යුධමය වශයෙන් බරපතළ ලෙස හිරවීමකට ලක්වුණු රටක් ලංකාව. චීනය, ඇමරිකාව ඒ වගේම ඉන්දියාව, රුසියාව

මේ ප්‍රබල රටවල් එක්ක කරන ගනුදෙනුවේදී විශාල ව්‍යසනයක් ඉදිරිපිට සිටින රටක් විදියට ලංකාව අපිට හඳුනගන්න හැකියාවක් තියෙනවා.

***ලංකාවේ අධිරාජ්‍යවාදය කියන මාතෘකාව ගැන කතා කරද්දී දේශපාලනඥයින් වගේම සාමාන්‍ය ජනතාව වුණත් ඒක දකින්නේ එක් පැත්තකින් විතරයි. අපි කිව්වොත් ඇමරිකාව නැත්නම් යුරෝපා බලවතුන්ගෙන් එල්ල වෙන බලපෑම් විදියට තමයි අධිරාජ්‍යවාදය හඳුනාගන්නේ. මේ හඳුන්වාදීම කොයිතරම් දුරට නිවැරදි කියලා ඔබවහන්සේ හිතෙනවා ද?***

අධිරාජ්‍යවාදය කියලා අපි හිතුවට පස්සේ ඇත්තටම කාලාන්තරයක් තිස්සේ ලංකාව තුළ නඩත්තු කරපු, පෝෂණය කරපු ජන මානසිකත්වයට තහවුරු කරපු එකක් තියෙනවා, ඒක තමයි අධිරාජ්‍යවාදීන් නම් ඇමරිකානු අධිරාජ්‍යවාදීන් විතරයි කියන එක. ඇත්තටම ඒක අධිරාජ්‍යවාදය සම්බන්ධයෙන් ලංකාව තුළ කියවා ගැනීම සම්බන්ධයෙන් තිබෙන බරපතළ දෝෂ සහිත කාරණාවක් විදියට තමයි අපි දකින්නේ. විශේෂයෙන් මම හිතන්නේ අධිරාජවාදී කියන එක ඇමරිකානු වෙන්න පුළුවන්, ඒක රුසියාව වෙන්න පුළුවන්, ඒක චීන හෝ ඉන්දියානු වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ජපානය වෙන්න පුළුවන්. ඒ මොන අර්ථයෙන් වුණත් රටක ජනතාවගේ අයිතියට ජනතාවගේ ස්වාධීනත්වයට යම් බලපෑමක් වෙනවා නම් ඒක අධිරාජ්‍යවාදී මැදිහත්වීමත් තමයි.

ලෝකයේ බොහෝ රටවල්වලට ආර්ථික කොන්දේසි යොදමින්, ඒ වගේම ආර්ථික කොන්දේසි වලින් තොරව ණය දීලා ඉතාම බරපතළ ලෙස චීන ණය උගුල්වල හිර කරපු රටවල් අපිට මෑතකාලීනව ඕනෑතරම් හොයා ගන්න පුළුවන්. ඒ හින්දා අපි කවුරුත් දන්නවා මේ මොහොතේ චීනය ඉන්නෙ ලෝකයේ ප්‍රබලත්වයක් ගොඩනගා ගැනීම වෙනුවෙන්, තමන්ගේ ඒ දේශපාලන වුවමනාව වෙනුවෙන් ප්‍රතිපත්තිමය තැනක. එහෙම නැතුව අපි කවුරුත් ඉස්සර කැමති වුණු ඉස්සර කතා කරපු චීනය නෙමෙයි දැන් තියෙන්නේ. චීනය පැහැදිලිවම සමාජවාදී ගමනක්, සමාජවාදී ආර්ථිකයක් එක්ක කටයුතු කරන රටක් නෙමෙයි.

ඇත්තටම සමාජ ක්‍රියාකාරීන් හැටියට දේශපාලන ක්‍රියාකාරීන් හැටියට මේ ව්‍යාජ විරෝධය අපි දන්නවා. මහින්ද රාජපක්ෂ කඳවුර හැමදාම අධිරාජ්‍යවාදීන් කියනඑක තමන්ගේ බල දේශපාලන වුවමනාව වෙනුවෙන් හරි ලස්සනට පාවිච්චි කෙරුවා. මේකට ලංකාවෙ මාධ්‍යය වගේම භික්ෂූන් වහන්සේලා පැහැදිලිවම වගකිව යුතුයි. රාජපක්ෂ දේශපාලන කඳවුරත් එක්ක දේශපාලනික වශයෙන් ගනුදෙනු කරන, පැහැදිලිවම රාජපක්ෂ කඳවුර විසින් නඩත්තු කරන භික්ෂු කඳවුර පැහැදිලි වශයෙන් ම ව්‍යාජ දේශප්‍රේමීත්වය ලංකාව තුළ හදන්න එහෙම නැත්තං මේ දේශප්‍රේමීන් කියලා හඳුනා ගන්න සළුපිළි අන්දන්න විශේෂ කාර්යභාරයක් කළා. එනිසා අපට, සමාජ ක්‍රියාකාරීන්ට, ඇත්ත මහජනතාවට ඇත්ත මිනිස්සුන්ට, ඇත්ත භික්ෂූන් වහන්සේලාට, විශාල කාර්යභාරයක් තියෙනවා මේ මොහොතේදී මෙන්න මේ ව්‍යාජ දේශප්‍රේමීත්වය වෙනුවට ඇත්ත දේශප්‍රේමීත්වය ගොඩනඟන්න.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/sXE2E7ig-t4

https://www.aithiya.lk/false-patriotism-of-the-monks-of-sri-lanka/

# 35. මේ ආණ්ඩුව දැන් කරන්නෙත් 2005-2010 කාලේ කරපු ටිකමයි

## ආනන්ද ලැනරෝල් - බද්දේගම ප්‍රදේශීය සභාවේ හිටපු සභාපති



ආනන්ද ලැනරෝල්

ලංකාව දැනට නිදහස ලබා ගැන වසර 72 ගත වී තියෙනවා, ඒ වසර 72න් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ඔස්සේ වසර 30ක් රට පාලනය කරලා තියෙනවා. ඉතුරු වසර 42 විධායක ජනාධිපතිවරු ඔස්සේ පාලනය වී තියෙනවා. මේ ක්‍රමය සම්පූර්ණ අසාර්ථක ක්‍රමයක්. එනිසා මේක සම්මත කරගත්ත දවසේ ඉඳලම අහෝසි කරන එක ගැන තමයි කතා කළේ. විධායක බලය අඩු කෙරෙන 17වන සංශෝධනය 2001 වසරේ දී සම්මත කරගත්තා, මෙය ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලයේ සිදුවූවක්. ඒ කාලයේ 17වැනි සංශෝධනය ඔස්සේ මේ බලතල කප්පාදුවට මහින්ද රාජපක්ෂ ඇතුළු සියලුම දෙනා පක්ෂව ඡන්දය දුන්නා. නමුත් මහින්දට බලය ලැබුණු අවස්ථාවේදී නැවතත් ඒකාධිපති බලයක් ඇති කර ගැනීමට 18වන සංශෝධනය කරළියට ගෙනාවා. මේ අවස්ථාවේ දී විමල් වීරවංශ, වාසුදේව නානායක්කාර, චමල් රාජපක්ෂ වැනි අය මෙයට පක්ෂව ඡන්දය දුන්නා. ඉන්පසු විමල් වීරවංශ, වාසුදේව නානායක්කාර යනඅය පවසා සිටියා මෙයට පක්ෂව ඡන්දය දී කරගත්තේ ලොකු වැරැද්දක් කියා.

පසුව විශාල ආණ්ඩු පෙරළියක් සිදුකර ගෙනආ යහපාලන රජය තුළින් 19වන සංශෝධනය සම්මත කරගෙන නැවතත් විධායක බලය කප්පාදු කර ඒකාධිපති පාලනයක් බිහිවීම වැළැක්වූවා. මෙහිදී ද විමල් වීරවංශ, වාසුදේව නානායක්කාර යන අය මේ සංශෝධනයට ඡන්දය

ලබා දී පවසා සිටියා 18 වැනි සංශෝධනයට ඡන්දය දී කරගත්ත වැරැද්දට සමාව ගැනීමක් ලෙස මෙම සංශෝධනයට පක්ෂව ඡන්දය දුන්නා කියා. 19 වැනි සංශෝධනය ඔස්සේ විශාල බලතල කප්පාදුවක් සිදුකරනු ලැබුවා. ස්වාධීන කොමිෂන් සභා, තොරතුරු දැනගැනීමේ පනත වැනි ඵලදායි ප්‍රතිසංස්කරණ ඔස්සේ රට විශාල අගාධයක් කරා යන ගමන නැවතුණා. මේක තමයි ලංකා ඉතිහාසයේ සිද්ධවුණ විශාලම ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණය. නමුත් වර්තමාන රජය බලයට පැමිණ විසිවෙනි සංශෝධනය නැමැති ඒකාධිපති ක්‍රමයක් වෙත යන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගත්තා. මේක දෛවයේ සරදමක්. 18 වැනි සංශෝධනයට ඡන්දය දී පසුතැවෙනවා යැයි පැවසූ විමල් වීරවංශ, වාසුදේව නානායක්කාර යන අය මේකට පක්ෂව ඡන්දය ලබා දී සිටියා.

මෙම විසිවන සංශෝධනය ගැන කතා කිරීමේදී මෙය ජේ ආර් ජනාධිපතිවරයාගේ ක්‍රමය පවා ඉක්මවා යන ඒකාධිපති, බලලෝභී ව්‍යවස්ථාවක්. එහි තිබුණ විසකුරු හැඩය අවසන් මොහොතේ මෙම සංශෝධනයට ආ මහජන සහ සිවිල් සමාජ ක්‍රියාකාරී විරෝධය නිසා ඇතැම් වෙනස්කම් සිදුකර එහි ඒකාධිපති ස්වාභාවය මඳක් වෙනස් කරා, නමුත් මේ ව්‍යවස්ථාව ඔස්සේ ලංකාව අපාය කරා යන ගමන නැවැත්විය නොහැකියි. මෙම ව්‍යවස්ථාව ඔස්සේ රටට සුගතියක් වෙනවා කිව්වට කිසිදු සුගතියක් ඇතිවී ඇති බව නම් දකින්නට නෑ. අද වර්තමාන තත්ත්වය දෙස බලද්දී නැවත කොවිඩ් දෙවන රැල්ල හිස ඔසවා තියෙනවා. මේ කාගේ වරදින්ද සිදුවූයේ!. පලමු වර කොවිඩ් පාලනය සාර්ථක වුවත් මෙවර නැවත හිස ඔසවා ඇත්තේ රජයේ වරදින්. ඔවුන් මෙය යට ගැසීමට උත්සාහ කළත් මෙය දැනටමත් හෙළිවෙමින් පවතිනවා. මේ නිසා මේ වනවිට දස ලක්ෂ ගානක් පීඩාවට පත්වෙලා සිටිනවා.

මේ වෙද්දි ණය ගැනීම පිළිබඳව මුද්‍රිත මාධ්‍යයෙන් වගේම සමාජ මාධ්‍යවලිනුත් තොරතුරු දක්නට ලැබෙනවා. මෙය ණය උගුලක්. 2005 වර්ෂයේ විශාල අසාර්ථක ව්‍යාපෘති වලට චීනයෙන් සියයට 8% පොලියට ණය ලබාගෙන තියෙනවා. මීට පෙර ණය ගත්තේ ලෝක බැංකුවෙන්, ආසියානු සංවර්ධන බැංකුවෙන්. ඒවගෙන් ණය ලබාදෙන්නේ වාර්ෂික පොලිය 1.5% ට නැතිනම් 0.5% ට. ඒ වගේම ඔවුන් නිදහස් කාලසීමාවක් දුන්න, ණය ගෙවන්න. එමෙන්ම මෙම

ආයතනවලින් ණය ගැනීමේදී ඔවුන්ට පහදා දියයුතුයි අපි කුමන අවශ්‍යතාවක් සඳහා ණය ගන්නවද කියලා. නමුත් චීනයෙන් ණය ගැනීමේදී අපට වුවමනා වන්නේ නෑ අපි ණය ගන්නේ කුමක් සඳහා ද යන්න පහදා දෙන්න. ඔවුන් අපිට හිතේ හැටියට ඕන දෙයක් කරන්න ණය ලබා දෙනවා, නමුත් ඒ දෙන්නේ 8% පොලියට. ඒක ගිනි පොලියක්. හම්බන්තොට වරාය හදන්න චීනෙන් ණය ගත්තා, වරාය හැදුවා නමුත් ඒකට නැවක් ආවෙ නැහැ අවුරුදු ගණනක් යනකන්. ඒ වගේම මත්තල ගුවන්තොටුපල හදන්න ණය ගත්තා, මෙය ඉදිකළේ සත්ව අභයභූමියක, මෙහි කිසියම් ප්‍රායෝගිකත්වයක් තිබුණේ නැහැ, කිසිම මනුස්සයෙක් මත්තලට ආවේ නැහැ. ඒ වගේම ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයක් හැදුවා සූරියවැව, ඒ වනවිටත් ලංකාවට ඕනේ තරම් ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගන තිබුණා, නමුත් කෝටි දෙසියයක් වියදම් කරලා නැවත ක්‍රීඩාංගනයක් හැදුවා. ඒ වගේම කෝටි 150 ක් වියදම් කරලා හම්බන්තොට සම්මන්ත්‍රණ ශාලාවක් ඉදිකරා, නමුත් මේ අවුරුදු දහයටම එහි සම්මන්ත්‍රණ පවත්වා තියෙන්නේ දෙකයි.

මේ වගේ අසාර්ථක ව්‍යාපෘති රාශියක් මහින්ද රාජපක්ෂ සිදුකරා. මේවගෙන් කිසිදු ආදායමක් ලංකාවට ලැබුණේ නෑ. ඉන්පසු චීනෙන් ණයට කෝටි 6000ක් අරන් ප්‍රයෝජනයක් නැති නොරච්චෝලේ බලාගාරය ඉදිකරා. චීනය මීට අවුරුදු ගානකට කලින් පාවිච්චි කරපු බලාගාරයක් මෙහේ ඇවිල්ලා සවිකළා. එය ඉදිකළ දවසේ සිට අබලන් තත්වයේ පවතිනේ. මේ වනවිට එය 28 පාරක් ප්‍රතිසංස්කරණය කර තිබෙනවා. මෙවැනි කිසිඳු ප්‍රයෝජනයක් නැති දේවල් නිසා අද ලංකාව විශාල ණය උගුලක හිරවී සිටිනවා. මෙම ණය ගෙවා ගන්න ලංකාවේ ලැබෙන මුළු ආදායම ඉතාම අඩුයි, අඩුම තරමේ පොලී ගෙවන්න වත් බැහැ. එසේ තිබියදීත් අපිට දැකගත හැකියි පසුගිය කොරෝනා සමයේ ගල්කිස්ස වෙරළ තීරය වැලි කියුබ් දහ දාහක් දාලා වෙරළ නිර්මානය කරනවා. දවස් දෙකයි, ඒ වැලි ටික ගිහිං වැල්ලවත්තේ තමයි නවතින්නේ. මේකෙන් පේනවා ඔවුන් වර්තමානයේ ආණ්ඩුව අරගෙන වුණත් කරන්නේ 2005-2010 කාලේ කරපු ටිකමයි කියලා. අවසානයේ මේක චීන කොළනියක් වෙලා තමයි නවතින්නේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/Avo6Jv-cw48

https://www.aithiya.lk/this-government-is-doing-what-it-did-in-2005-2010/

# 36. රාජපක්ෂලා හැමදාම කළේ බලය එකතු කරන එක

## උපුල් නිශාන්ත - මාතර මහ නගර සභාවේ විපක්ෂ නායක



උපුල් නිශාන්ත

***ජනාධිපතිවරයා මේ වනවිට ජනාධිපති වී වසරක් ගත වී තිබෙනවා. ඔහු විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන තමා බලයට පත්වෙන්නේ, එනම් විශාල සිංහල ඡන්ද සංඛ්‍යාවකින්. ඔහුගේ ප්‍රධාන තේමා පාඨය වූයේ විනය ගරුක රටක් හා කාර්යක්ෂම පාලනයක් සෑදීම කියන දේ, මේ අනුව ඔබතුමා ප්‍රාදේශීය පාලකයෙක් විදිහට වර්තමාන තත්ත්වය ගැන, ඒ වගේම මේ ප්‍රතිපත්ති ගමට ඒම ගැන මොනවද හිතෙන්නේ?***

මේ පිළිබඳව කතා කිරීමේදී මම හිතනවා අපේ රටේ මිනිස්සුන්ට ප්‍රජාතන්ත්‍රවාදය හා විනය පිළිබඳ නිරවුල් අවබෝධයක් තිබ්බේ නැහැ. ඔවුන් විනය කියලා හඳුන්වන්නේ කෝටුවක් අතේ තබාගෙන තරවටු කිරීම, නමුත් විනය කියන්නේ තමන් විසින්ම තමන්ගේ ජීවිතය කළමනාකරණය කරගෙන තමන් මෙහෙයවීම. පසුගිය යහපාලන ආණ්ඩුවට මෙය සමාජයට කියා දීමට නොහැකි වුණා. ඒ තුළින් ගෝඨාභය ජනාධිපතිතුමාට අවස්ථාවක් ආවා විනයගරුක සමාජයක් හදන්න එය ඉතාම හොඳ ක්‍රියාවලියක්. නමුත් පසුගිය අවුරුද්ද දෙස හොඳින් බැලීමේදී ගැමි ජනතාවට තේරිලා තියෙනවා, මෙය පුස්සක් බව. විනය ගරුක ලංකාවක් තියා නීතියේ ආධිපත්‍ය පවත්වාගන්න බැරිවෙලා තිබෙනවා. නීතිය සැමට සාධාරණව ක්‍රියාත්මක කරන්න ආවට දැන් අපිට පේනවා ඒවා රූවට්ලිකාර කතා විතරයි කියලා. මේ වෙනකොට නීතිය එක පාර්ශවයකට විතරක් සාධාරණව ක්‍රියාත්මක

වෙන බවක් තමයි පේන්න තිබෙන්නේ. මේ සටන් පාඨ එක්ක ඔහු බොහෝ පොරොන්දු ජනතාවට දුන්නා. නමුත් ඒවා දැන් හුදු පොරොන්දුම විතරයි කියලා ජනතාවට තේරිලා.

***විසිවන සංශෝධනය සම්මත කරගැනීමේ දී මේ රජය පැවසුවේ රට හදන්න තනි මනුස්සයෙක් අතට බලය දිය යුතු යුතුයි කියලා. ඒ අනුව මේ වෙද්දි ඔවුන්ට බලය ලැබිලා තියෙනවා..***

තනි මනුස්සයෙක්ට බලය ඒකරාශී කිරීම අද ඊයෙක වූ දෙයක් නොවෙයි නෙවෙයි, රාජපක්ෂවරු දේශපාලන කරපින්නා ගෙන හැමදාම කරේ බලය තමන් වටා ඒකරාශී කරගැනීම. ඔවුන් ඒ සඳහා මහරජ ගැමුණු ආදී විවිධ කතා කිව්වා. මේ නිසා මිනිසුන් විශ්වාස කරා තනි පුද්ගලයෙකුට බලය හිමිවිය යුතුයි කියා. ඒ වගේම මිනිසුන් හිතුව අපිට දියුණු වෙන්න නම් තද පාලකයෙක් අවශ්‍යයි කියලා. සිංගප්පූරුව ගැන ලී ක්වාන් ගැන නිතරම කතා කළා. මේ සංවර්ධන මිත්‍යාවට මිනිස්සු ලේසියෙන් අහුවුණා. පොහොට්ටු දේශපාලනය මේක සූක්ෂම විදිහට කළා. අන්තිමට මේ අදහස ජනමනසට කාවැදුනා. ඒක මේ ඡන්ද ප්‍රතිපල වලින් පේනවා. බහුතර සිංහල බලයකින් ජනාධිපති කෙනෙක් හැදුවා විතරක් නෙවෙයි ඔහුට තුනෙන් දෙකට ආසන්න ජනවරමකින් පාර්ලිමේන්තුවක් ද හදලා දුන්නා. ජනතාව මෙහෙම බලය දුන්නේ වැඩ කරන්න. යහපත් ජීවිතයක් ලබා ගන්න. අන්තිමට සහල් මිල පාලනය කරගන්න බැරි ජනාධිපතිවරයෙක් තමයි ඔවුන්ට ලැබුණේ. මේ වනවිට සියලු දෙනාටම අවබෝධ වී තිබෙනවා බලාපොරොත්තු කිසිම දෙයක් ලැබී නොමැති බව. ඒ වගේම කෝවිඩ් මර්දනය පහසුවෙන් කරගන්න පුළුවන් මහ නගර සභා, ප්‍රාදේශීය සභාවලට බලය ලබාදීමෙන් නමුත් රජය බලය ඒකරාශී කරගෙන කරන මේ ක්‍රියාවලියෙන් තවත් මෙය සංකීර්ණ වී තිබෙනවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/dgIRI9QRZsA

https://www.aithiya.lk/current-political-situation-in-sri-lanka/

# 37. පැරණි ලෝකය අවසන්!

## සුරංජිත් ගුණසේකර (අංශ ප්‍රධානී සමාජ විද්‍යා අධ්‍යයන අංශය රුහුණු විශ්ව විද්‍යාලය)

*ආපදා අභිමුඛ සමාජයක්*



සුරංජිත් ගුණසේකර

අපි දන්නවා අපි මේ ජීවත් වෙන්නේ නව සාමාන්‍ය තත්වයක් යටතේ. ඉන් අදහස් වෙනවා ඉතා පැහැදිලිවම පසුගිය අවුරුද්දේ දෙසැම්බර් මාසය වගේ වෙනකන් ජීවත් වුණ සමාජ පරිසරය අපිට මේ මොහොතේ නෑ කියලා. එමගින් පෙන්නුම් කරන සාධකය තමයි අපි හැමෝම හදිසි සමාජ අවශ්‍යතාවයක තමයි ජීවත් වෙන්නේ කියනඑක. එය තවදුරටත් පැහැදිලි කරනවා නම් ගෝලීය මට්ටමෙන්ම ආපදා අභිමුඛ සමාජ පරිසරයක අපට ජීවත්වෙන්න සිද්ධ වෙලා තියෙනවා. එක පන්තියකට, එක ජනවර්ගයකට, එක ආගමකට නෙවෙයි පොදුවේ ගත්තහම අවදානම් සහිත සමාජයක අපි ජීවත් වෙන්නේ. එය තීව්‍ර කරනවා මේ කොවිඩ්19 කියන වසංගත තත්ත්වය.

මේ වෙද්දි කොවිඩ් මරණ, ආසාදිත වීම් ගෝලිය වශයෙන් සලකා බැලුවොත් ඉතා විශාල අගයක් ගන්නවා. දේශීය වශයෙනුත් ඉතා විශාල සාකච්ඡාවක් තියෙනවා. ඊට උත්තර හැටියට මේ නවීන විද්‍යාව සහ තාක්ෂණය නූතනත්වය විසින් අපිට දීපු පොරොන්දු තියෙනවනේ. හැබැයි අපට පේනවා ඒව එහෙන්ම ක්‍රියාත්මක වෙන්නේ නෑ කියලා. හේතුව අපි අසමත් වෙලා තියෙනවා, අපිට ගොඩක් පොරොන්දු දීපු අපේ විද්‍යාව හා තාක්ෂණය තවම සමත් නොවීම තුළ කොවිඩ් වෛරසයට ප්‍රතිකාරයක් සොයා ගැනීමට. ඒ නිසාම

ඔවුන් අපිට යෝජනා කරන්නේ මේ වගකීම පුද්ගලයා ගන්න ඕනේ කියලා. පුද්ගලයෙක් ගන්න ගියහම ඒ වගකීම පුද්ගලයෝ කියලා කියන්නේ සමාජය සමග ගනුදෙනු කරන කණ්ඩායමක්. සමාජ අන්තර් සම්බන්ධතා කියන එක අපිට ලසු කරන්නත් බැහැ, බැහැර කරන්නත් බැහැ. මොකද අපි සමාජ සංස්කෘතික සත්වයෝ නිසා.

*සමාජ දුරස්ථභාවය සහ සමාජ පන්තිය*

විද්‍යාව තාක්ෂණය අසමත් වෙන තැන අපේ මානව සම්බන්ධතා සීමා කරන්න තමයි ඔවුන් යෝජනා කරන්නේ. පළවෙනි කාරණාව සමාජ දුරස්ථභාවය . සමාජ දුරස්ථභාවය පවත්ව ගන්න ගමන් ගෝලීය පරිමානව නිර්මාණය වෙන අර්බුදයට යම්කිසි තමන් ගැලවීම සඳහා දේවල් යෝජනා කරනවා. මේ සමාජ දුරස්ථභාවය වැනි සංකල්ප නඩත්තු කරන්න පුළුවන් වෙන්නේ එක්තරා පන්තියකට විතරයි. සාමාන්‍යයෙන් අපි ගත්තොත් මුම්බායි වල දාරාවි කියලා කියන ආසියාවේ තියෙන ලොකුම නාගරික පැල්පත් ටික තියෙනවා. ලංකාවෙත් කොළඹ ආශ්‍රිතව අපට පේන්න තියෙනවා ඒ වගේ පැල්පත්. එතකොට ඒ වගේ තැනක සමාජ දුරස්ථභාවය නඩත්තු කරනවා කියනඑක බරපතල ප්‍රශ්නයක්. හැකියාවන් සහිත කණ්ඩායම් ඉතා පැහැදිලිවම මෙම උවදුරෙන් බේරී සිටිනවා. ඔවුන් මෙම උවදුරෙන් මිය නොයන තත්වයට පත්වෙනවා. හැබැයි සාමාන්‍යයෙන් සමාජයේ ආන්තීකරණය වුණ කණ්ඩායම් මෙහි ගොදුරු බවට පත්වෙනවා. ඒ නිසා මෙය එක පැත්තකින් සමාජය තුළ ගත්තහම ආන්තීකරණයට පත්වෙලා තියෙන සමාජය තුළ හයියක් නොමැති ප්‍රජාවන් ගිලගන්න රෝගයක් විදිහටත් අපිට සලකන්න පුළුවන්.

*වසංගතයේ මාධ්‍යය*

ධීවර කර්මාන්තය සමග කොරෝනා පැතිරුණා කියන මතයක් සමාජ ගත කළා, මේක කළේ මාධ්‍ය. තමන්ගේ අසල්වැසියා වරායේ වැඩ කරනවානම් අසල්වැසියාව දකින්නේ හතුරෙක් විදිහට. ඔහුව සැලකෙන්නේ කොවිඩ් ගේන කෙනෙක් විදිහට. අපි දැක්කා තමන් සමඟම ජීවත් වුණ මුස්ලිම් ප්‍රජාව මෙහි ගොදුරු බවට පත්වෙනවා, පළවෙනි අදියරයේදී. ඒ වගේම අපි දැක්කා නාවික හමුදාව ගොදුරු බවට පත්වෙනවා. මාධ්‍යවලින් වියුක්තව අපිට සමාජය පිළිබඳ

රූපකයක් ගොඩනගා ගැනීමට අසමත් ලෝකයක තමයි අපි අද ජීවත් වෙන්නේ. අවම වශයෙන් අපි දියුණු සමාජයක පවත්වාගත යුතු පුද්ගලිකත්වය රැකගැනීමට සහ මිනිස්සුන්ගේ ආත්ම ගෞරවයට හානි නොවී කටයුතු කිරීමට තරම්වත් පරිසරයක් මාධ්‍ය හදන්නේ නෑ. උදාහරණයක් හැටියට කියනවා නම් එක්තරා ප්‍රචලිත නාලිකාවක කොවිඩ් සම්බන්ධව ඇඟලුම් කර්මාන්ත ශාලාවේ තරුණියන් ආශ්‍රිතව වෛරසය පැතිරයාමේ අවස්ථාවේදී අහනවා ඇඟලුම් සේවිකාවන් ඉස්සර පොසිටිව් වීම පිළිබඳ බියක් දැක්වූයේ කුමටද කියලා. ඇඟළුම් සේවිකාවන් පිළිබඳ සමාජ මතයනෙ මේ පෙන්නන්න හදන්නේ!. මාධ්‍ය කියන්නෙ මීට වඩා ඉදිරියට ගිය, විශේෂයෙන්ම ආපදා අභිමුඛ සමාජ පරිසරයක් ඇතුළත සංවේදීව වැඩකරන තත්ත්වයකට යන්න ඕනෑ.

### *කොවිඩ් එක්ක ජීවත් වෙමු*

අපිට ලෝකෙන්ම පේන්න තියෙන තත්ත්වයක් තමයි කොවිඩ් සමග තමයි අපිට දැන් ජීවත්වෙන්න සිද්ධවෙලා තියෙන්නේ. බෙහෙතක් හොයාගත්තත් අපිට විශාල කාලයක් මේකත් එක්ක ජීවත් වෙන්න වෙනවා. එතකොට මේකත් එක්ක විශේෂයෙන්ම මිනිසුන්ගේ නිදහස එක පැත්තකින් අවහිර වෙනවා. නිදහසට වැඩිපුර කැමති ඇමෙරිකාව වැනි රටක මරණ සංඛ්‍යාව වැඩි වීමටත් එක් හේතුවක් මිනිසුන් තමන්ගේ නිදහස කැප කරලා මේකෙන් පරිස්සම් වෙන්න ගියේ නැති එක. කොරෝනා වෛරසය මගින් ඇති කරපු එක් ව්‍යසනකාරී තත්ත්වයක් තමයි මානව අන්තර් සම්බන්ධතාවලට කරනු ලැබූ බලපෑම. ගෝලීය වශයෙන් අද වෙනකොට ආසාදිතයන් මිලියන තුනකට වැඩියෙන් මිය ගිහිං තිබෙනවා. ඇමරිකන් සමාජයේ තමයි අපි දැක්කේ ලිබරල් නිදහස් සමාජයේ මූලික ලක්ෂණ. නමුත් අද වෙනකොට කෝවිඩ් තත්ත්වයත් එක්ක නව සාමාන්‍ය තත්ත්වය යටතේ ඔවුන්ටත් ඒ නිදහස කැපකරන්න සිද්ධ වෙලා තියෙනවා. සාම්ප්‍රදායික සමාජ විද්‍යාව ඇතුළු මේ තත්ත්වයන් විග්‍රහ කරන විෂයන්වල, මිනිසුන් සමාජ සත්වයන් කියපු එක දැන් මිනිසුන් පෞද්ගලික සත්ත්වයින් බවට පත්කරන තත්ත්වයටම ඇවිත් තියෙනවා. එය බරපතළ තත්ත්වයක්.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/__s3rEIZHp0

https://www.aithiya.lk/current-covid-situation-in-sri-lanka-222/

# 38. සමාජයේ නිරෝගීතාවය බිඳ වැටිලා, සමාජයක් ලෙස ප්‍රතිකර්ම සෙවිය යුතුයි

## සමිත උදයංග (සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය, රුහුණු විශ්ව විද්‍යාලය)



සමිත උදයංග

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ප්‍රකාශ කරන ආකාරයට මානව යහපැවැත්මේ විවිධ අංශ දැකගත හැකිවනවා, එහිදී පරිපූර්ණ සෞඛ්‍ය පිළිබඳව කතා කිරීමේ දී අංශ හතරක් දැක ගන්න පුලුවන්, එනම් එහි පළමුවැන්න ජීව විද්‍යාත්මක සෞඛ්‍ය, දෙවැන්න සමාජ සෞඛ්‍යය, තුන්වැන්න මානසික සෞඛ්‍යය, හතරවැන්න අධ්‍යාත්මික සෞඛ්‍යය. මනුස්සයෙකුගේ යහපැවැත්ම පවතින්නේ මේවා මූලික කරගෙනයි. මේ වනවිට පවතින කොවිඩ්19 තත්ත්වය නිසා මිනිසාගේ පූර්ණ සෞඛ්‍යයට එනම් සමස්ත යහ පැවැත්මට බාධා ඇතිවී තිබෙනවා. නමුත් අපිට පැහැදිලිවම දැකගත හැක්කේ ජීව විද්‍යාත්මක සෞඛ්‍යයට බලපාන සාධක පමණයි. එහිදී අනෙක් පැතිවලට වන හානිය අප අමතක කර තිබෙනවා, එනම් විශේෂයෙන්ම සමාජ සෞඛ්‍යයට වන අගතිය, ඉන්පසුව මානසික හා අධ්‍යාත්මික සෞඛ්‍යයට වන අගතිය පිළිබඳව අපි කාගෙත් අවධානයක් යොමු වී නැහැ. මෙම කොවිඩ් තත්ත්වය නිසා පැහැදිලිවම පෙනෙන කායික සෞඛ්‍ය නඟා සිටුවීමට සියලුම ආයතනය ඉදිරිපත් වෙලා තිබෙනවා. එනම් නිරෝධායන ක්‍රියාවලිය, එන්නත් නිපදවීම ආදිය තුළින්. කොවිඩ් ආරම්භ වී දැනට අවුරුද්දකට වැඩි වුණත් මෙයට නිශ්චිත ලෙස ප්‍රතිරෝධකයක් හඳුන්වාදීමට ලෝකය සමත්වී නැහැ. එයට හේතුව ලෙස බටහිර වෛද්‍ය ශාස්ත්‍රයේ තිබෙන යම් යම් අඩුපාඩු හඳුන්වා දෙන්න පුලුවන්.

මෙසේ දුර්වලවීම් මධ්‍යයේ අප සියලු දෙනාටම සිදුවෙනවා මානව ශිෂ්ඨාචාරයක් විදිහට ඉදිරියට යෑමට, මෙතැනදී අපට අනෙකුත් කාරණා කෙරෙහි ද අවධානය යොමු කිරීමට සිදුවෙනවා. විශේෂයෙන්ම මෙම වසංගත සමයේ මිනිසාගේ මානසික සෞඛ්‍යය විශාල ලෙස පරිහානියට පත්වෙලා තිබෙනවා. මෙන්න මෙයට ආගමික කණ්ඩායම්, මනෝවිද්‍යාඥයන්, මනෝ චිකිත්සකවරුන් සම්බන්ධ වෙන්න ඕනේ මානසික සුවතාව නඟා සිටුවීම සඳහා. එය අත්‍යාවශ්‍යයි. එය නොමැති තැන අපේ සාමූහික සමාජ මනස ලෙඩ වෙන්න පුලුවන්. ඒක දැනටමත් සිද්ධවෙලා ඉවරයි. මේ වනවිට යම් සමාජ අස්ථාවරභාවයක් ලෝකයේ හැමතැනකම කොවිඩ් තත්ත්වයත් එක්ක උද්ගතවී තිබෙනවා. වර්තමාන ධනවාදී සමාජ ක්‍රමය තුළ දාර්ශනිකයන් ඉදිරිපත් කර තිබෙන මතයක් තමයි, මෙවැනි සමාජ ක්‍රමයක් තුළ අර්බුද ගොඩනැගෙන බව, මේවා ගොඩනැගෙන්නේ මානවයාගේ තිබෙන ක්‍රියාකාරකම් නිසා. මේ තත්ත්වය අස්සේ අනාගතය ගැන අනාවැකි කීම නිෂ්ඵල දෙයක් වෙනවා. ලෝක බැංකුව ප්‍රකාශ කර තිබෙනවා කොවිඩ් නිසා මිලියන පහකට රැකියා අහිමි වනවා කියා, මෙතැනදී කාගේ රැකියා අහිමිවේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීමේ දී සමාජ ස්ථරය තුළ පහළ ම පන්තියේ, එදිනෙදා වැටුප් ලබන, වතු ක්ෂේත්‍රයේ
රැකියා කරන කණ්ඩායම්වල රැකියා අහිමිවීමේ වැඩි ප්‍රතිශතයක් පවතිනවා. මේ තුළින් ඔවුන්ගේ පවුල් ජීවිතයටත් සමස්ත සමාජ සෞඛ්‍යයටත් විශාල බලපෑමක් සිදුකරනවා.

කොවිඩ් 19 නිසා වැඩි පීඩනයක් ලැබෙන සමාජ කණ්ඩායම් සිටිනවා, එනම් කාන්තාවන් ළමයින් හා වතු සේවකයන්, ආබාධිත කණ්ඩායම් හා මහලු ප්‍රජාව. එමෙන්ම යුනිසෙෆ් ආයතනය පවසනවා මෙම වසංගත තත්වය නිසා ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය තරමක් පරිහානියට පත්වෙන බව. ඒවගේම අප ළඟදී කරපු පරීක්ෂණයකින් ද හෙළිවුණා වතු ආශ්‍රිත පවුල්වල ගැහැණු ළමයි මෙම කාලය අධ්‍යාපනය ට අඩු අවධානයක් යොමු කර ඇති බව. මේ තුළින් පැහැදිලිව පෙනෙනවා කොවිඩ් නිසා ඇතිනැති පරතරය ද පුළුල් වී තිබෙන බව. අනෙක් දේ මෙම වසංගතය අප ගෝලීය ලෙස දකින්න අවශ්‍යයි. මෙහිදී එක් එක් රටවල් මෙයට ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව අධ්‍යයනය කළ යුතුයි. දියුණු රටවල් කෙසේද මෙයට මුහුණ දෙන්නෙ, දියුණු වෙමින්

පවතින රටවල් කෙසේද මෙයට මුහුණ දෙන්නේ කියා මේ තුළින් අපට යම්කිසි ආදර්ශයක් ලබා ගන්න පුලුවන්.

එමෙන් ම අධ්‍යාත්මික සෞඛ්‍ය ගැන කතා කිරීමේදී අධ්‍යාත්මික සෞඛ්‍ය මේ වනවිට කඩා වැටී තිබෙනවා. එහිදී කාන්තා හිංසනය ඉහළ නැග ඇති ආකාරය දක්නට පුළුවන්. ඒ විතරක් නෙවෙයි ළමා අපචාර ද වැඩිවෙමින් පවතිනවා. මේ නිසා අධ්‍යාත්මික සෞඛ්‍ය නඟාසිටුවීම අනිවාර්යෙන් කළ යුතුයි. මෙම වසංගත තත්වය හමුවේ මිනිස් ක්‍රියාකාරකම් අසාමාන්‍ය වී තිබෙනවා. එයට හේතුව ජීවන රටාව වෙනස්වීම. නව තත්ත්වය විසින් ඇතිකරලා තිබෙන මානසික පීඩනය හේතු වෙනවා මේ වෙනසට. මේ සඳහා තනි පුද්ගලයන්ට තනිවම ක්‍රියා කරන්න බැහැ. මෙයට රටක් ලෙස නැඟීසිට විසඳුම් සෙවිය යුතුයි.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/EUAijwqM7I0

https://www.aithiya.lk/health-of-the-society-has-collapsed-and-as-a-society-we-must-seek-remedies/

# 39. පිළිකාකාරක ආහාර සම්බන්ධයෙන් අපි සමාජයක් විදිහට තවමත් සංවේදී නැහැ

## සමාජ ක්‍රියාකාරික නිමල් ද සිල්වා


නිමල් ද සිල්වා

***විසිවෙනි සංශෝධනය තුළින් ඇති කරපු වෙනස්කම් වගේම අලුත් ඉඩම් ප්‍රතිසංස්කරණ වැසටහනකුත් දියත්වෙලා තිබෙනවා. මේ තත්ත්වය කෘෂිකර්මාන්තය කෙරෙහි ඇතිකරල තියන බලපෑම කොයි වගේද?***

අපේ ලංකාවේ විතරක් නෙවෙයි මුළු ලෝකෙම ආහාර නිෂ්පාදනය ගත්තහම සියයට හැත්තෑවක් විතර නිෂ්පාදනය කරන්නේ සුළු ගොවීන්. ලංකාවේ තත්ත්වයත් එයමයි. මහා පරිමාණ ගොවීන් නෙවෙයි සමස්ත ආහාර නිෂ්පාදනය කරට අරන් තියෙන්නේ. නමුත් මේ සුළු ගොවීන් කියන ප්‍රජාව සම්පූර්ණයෙන් මෙම ක්‍රියාවලිය තුළ අතහරලා තිබෙනවා. සුළු ගොවීන් අතාරිනවා කියන්නේ, මහා පරිමාණ ජාවාරම්කාරයන්ට මේකේ ඉඩම් විශාල වශයෙන් දෙනවා කියනඑක. ඒකෙන් අපේ ආහාර ප්‍රශ්නයට ප්‍රතිඵලයක් ගන්න බැරි වෙනවා. මොකද ඒ වගාව නිර්මාණය කරන්නේම බහු භෝග වගාවක් නෙමෙයි ඒක භෝග වගාවක්. එතකොට මේ ඒක බෝග වගාවට රසායනික වගේම ජාන වෙනස් කරපු බෝග තමයි වගාකරන්නේ. එතකොට ඒව තමයි ඉදිරියේදී කන්න වෙන්නෙ. ඒක-බෝග වගාවට යන්න තමයි මේ සැලසුම් කරගෙන යන්නෙ. මං හිතන්නේ ඒක තමයි විසිවන සංශෝධනය හරහා ඒගොල්ලො උත්සාහ කරන්නේ. තමන්ට තනි බලය තියෙන සුළු ගොවීන් අතහැරලා ලංකාවෙ නොවන මහා පරිමාණ බහුජාතික සමාගම්වලට මේ භූමිය ලබාදීලා ලෝක ජනතාවට තනිකර රසායනික මිශ්‍ර බැර ලෝහ මිශ්‍ර ආහාර රටාවක් හුරු කරන්න තමයි මේ උත්සාහ කරන්නේ.

උදාහරණයක් විදියට අපි ඉන්නෙ ගාල්ලෙ දිස්ත්‍රික්කයේ, මේ අවට ප්‍රධාන රෝහල තමයි කරාපිටිය. කරාපිටියෙ හැදෙනවා තට්ටු නමයක වකුගඩු රෝහලක්. දකුණු පළාතට අදාළ ගාල්ල දිස්ත්‍රික්කයේ මෙච්චර විශාල ප්‍රමාණයේ වකුගඩු රෝහලක් හදන්න තියෙන අවශ්‍යතාවය මොකද්ද? මොකද මේක වියළි කලාපයේ වගාවන් කරන ප්‍රදේශයක් නෙමෙයි. අඩුවෙන්ම රසායනික පොහොර, කෘමිනාශක පාවිච්චි කරන ප්‍රදේශයක්. එවැනි ප්‍රදේශයක මේගොල්ලෝ බලාපොරොත්තු වෙනවා නම් මෙච්චර තට්ටු නමයක රෝහලකට වකුගඩු රෝගීන් ගෙන්න ගන්න, ඒක වෙන්නේ මේ බහුජාතික සමාගම්වලින් අපේ ආහාරවලට එකතු කරන රසායනික නිසා. මේ බැර ලෝහ අපේ ජනතාව භුක්ති වින්ඳම ආහාර විදිහට ගත්තාම අනිවාර්යයෙන් ඔවුන් දන්නවා (බහුජාතික සමාගම්) මේකට මේ වගේ රෝහලක් ඕනේ කියලා.

ඒ වගේම පිළිකා රෝහලේ තට්ටු 5ක ගොඩනැගිල්ලක් පහුගිය දවස්වල විවෘත කළා. දැන් තව තට්ටු පහක ගොඩනැගිල්ලක් හදනවා. අද පිළිකා රෝගීන් වැඩිවෙලා තියෙන්නෙ අපි කන ආහාර නිසා. මේ ආහාරවලින් අපි කොච්චර පිළිකාකාරක දවසකට අපේ ශරීරයට ඇතුළු කරගන්නව ද කියන කාරණය ඉතා බරපතළ දෙයක්. අපි සමාජයක් විදිහට තවමත් මේ ගැන සංවේදී නැහැ. විසිවෙනි සංශෝධනය මඟින් සුළු ගොවීන් විනාශ කරල, ලංකාවේ බහුජාතික සමාගම්වලට ඇඳගන්න පුළුවන් ගොවීන් පිරිසක් අනාගතයේ බිහි කරයි. විසිවෙනි සංශෝධනය හරහා මොවුන් ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කරමින් දැන් උත්සාහ කරන්නෙ වෙනදා වන සංරක්ෂණයට මහවැලියට අයිති වාරිමාර්ග ඉඩම් පවා දිසාපතිට බලය පවරලා තමන්ගේ කොට්ඨාශයේ ඉඩම්ටික ඕන කෙනෙකුට විකිණීමට, බදු දීමට. මේකෙන් වෙන්නෙ අපේ තියෙන ගොවි පනත සහ කුඹුරු ඉඩම් පනත සම්පූර්ණයෙන් වෙනස් වෙනඑක.

***අපි දැන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරනවා. විවිධ අයිතීන් ගැන කතා කරනවා. වසවිෂෙන් තොර ආහාරයක් ගැනීමත් මිනිසෙක්ගේ අයිතියක්. ජීවත්වීම සඳහා මිනිහෙකුට තියෙන අයිතිය හා සමානවම තියෙන අයිතියක් තමයි වැඩි කල් ජීවත්වෙන්න පුළුවන් ආහාර වේලක් ගන්න එක. ලෝකය පුරාම දැන් ඒ අයිතිය උල්ලංඝනය වෙමින් තියෙනවා. ලෝකේ අනිත් රටවල් මේ අයිතිය ගැන කතා කරනවා. නමුත් ලංකාවෙ එහෙම සාකච්ඡාවක්වත් නැහැ නේද?***

ඔව් ඉතින් ගැටළුව වෙන්නේ ලංකාවේ අපි කන ආහාර පිළිබඳ, එම ආහාර ආනයනය සම්බන්ධයෙන් අණපනත් ගොඩක් තියෙනවා. උදාහරණයක් හැටියට ලංකාවට සහල් ගෙන්නනවා නම් ඒ පිළිබඳ ප්‍රමිතියක් තියෙන්න ඕනේ. ලංකාවේ මේ වෙනකොට ජනගහනයෙන් සියයට හැත්තෑවක් විතර පාවිච්චි කරන්නේ පාන් පිටි. පාන් පිටි සඳහා වෙනමම නිකුත් කරපු ගැසට් නිවේදනයක් තියෙනවා. ඒ ගැසට් නිවේදනයේ පැහැදිලිව තියනවා ලංකාවට ගෙන්වන පාන් පිටිවල තිරිඟු පිටි තිබෙන්න ඕනෑ. හැබැයි මේ වෙනකොට ලංකාවට ගෙන්වන පාන් පිටි වල තිරිඟු තියෙනවද කියලා ගැටලුවක් තියෙනවා. මොකද මේ දවස්වල ITI ආයතනය මැදිහත් වෙලා පාන් පිටිවල ප්‍රමිතිය පිළිබඳ සහතිකයක් ගන්න උත්සාහ කරනවා, මේකෙ තියෙන්නෙ මොනවද කියලා පරීක්ෂා කරලා.

මට දැනගන්න ලැබුණු හැටියට දැනට කාර්මික තාක්ෂණ ආයතනයට හොයාගන්න බැරි වෙලා තියෙනවා මේකෙ තිරිඟු අංශු කොච්චර තියෙනවද කියලා. එච්චරට හානිදායක පිටි වර්ගයක් තමයි අපිට තිරිඟු පිටි කියලා එවන්නේ. හැබැයි ගැසට් එකේ තියෙනවා පැහැදිලිව තිරිඟු පිටි ගෙන්වනවා නම්, ඒකෙ ග්ලූටන් කියන රසායනිකය 2%කට වඩා වැඩි ප්‍රතිශතයක් තියෙන පාන් පිටි ගෙන්වීම, බෙදාහැරීම, විකිණීම සපුරා තහනම් කියලා. අපිට තියෙන තොරතුරු අනුව දැන ගන්න තියෙන දේ තමයි ලංකාවට ගෙන්වන පාන් පිටිවල සියයට 8ක් 12ක් පමණ ග්ලූටන් තියනවා. එතකොට මේ ග්ලූටන් කියන එක ඉතාම හානිදායක විදිහට දියවැඩියාව වගේ ලෙඩ හැදෙන්න බලපානවා. ඒක කැවොත් අනිවාර්යයෙන්ම කුඩා ළමයාගේ සිට වැඩිහිටියා දක්වා දියවැඩියාව වර්ධනය වෙනවා.

මේ වෙනකොට කුඩා ළමයිනුත් 14% -15% මට්ටමට දියවැඩියා රෝග යට ගොදුරු වෙලා තියෙන්නේ. උදේ ආහාරයට කිරි පිටි දීලා ඊලඟට පටන් ගන්නේ පාන් පිටි මිශ්‍ර ආහාරයක් තමයි කෙටිකෑම විදිහට. උදේට ඉස්කෝලෙ ළමයින්ගේ ආහාර රටාව මේක. එතකොට රජයේ නියාමන ආයතන කිසිම නියාමන ක්‍රමවේදයක නැහැ. ජනතාව මේ පිළිබඳව දන්නේ නැහැ. ජනතාවට පාන් පිටි ගෙනත් දුන්නම ඒක තමයි පාන් පිටි කියලා හිතාගෙන පාවිච්චි කරනවා. හැබැයි ලංකාවේ ජනතාව කන්නේ පිටි කියලා ගෙන්වන තිරිඟු පාන් පිටි නෙමෙයි. හානිකර පිටි වර්ගයක්.

තව ගැසට් නිවේදනයක් තියෙනවා කහටගස්දිගිලිය උසාවියෙන් දීපු තීන්දුවක් අනුව ගහපු. කහටගස්දිගිලියේ විදුහල්පතිවරයෙක් නඩුවක් කිව්වා. ඔහු නඩුව දැම්මේ ලෝකයේ හැම රටකම අවුරුදු 5ට අඩු අයට භාවිතය තහනම් කියලා ලේබලයක් ගහලා මාගරින් විකුණනවා නම් ඇයි අපේ රටේ නැත්තෙ කියලා. මේ නඩුව දිනුවා. උසාවිය තීන්දුව දුන්නා, දීලා මේක ගැසට් එකක් ගැහුවා, අවුරුදු 3ට අඩු අයට භාවිතය තහනම් කියන ලේබලය නැත්නම් මාගරින් විකුනන්න තහනම් කියලා. මාසයක් දෙකක් ඒ ලේබල් එක තිබුණා. දැන් කිසිම වෙළඳපලේ විකුණන මාගරින් එකක මේ අවුරුදු 3ට අඩු අයට භාවිතය තහනම් කියන ලේබලය නැහැ.

අපේ කුඩා ළමයි ඉතා බහුලව මේ මාගරින් පාවිච්චි කරනවා. ඉතින් අපි මාගරින් හැටියට ගත්තම මේක විවිධ කර්මාන්තවලට පාවිච්චි කරනවා. අපේ තියෙන නිෂ්පාදනවලදී. මේ සේරම අවුරුදු 3ට අඩු අය ඕනි තරම් පාවිච්චි කරනවා. එතකොට මේක සහගහන අපරාධයක් නෙවෙයිද?. හැබැයි මේවට සෞඛ්‍ය අමාත්‍යාංශය, පාරිබෝගික සේවා අධිකාරියවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගැසට් නිවේදන ඔහේ පල් වෙවී තියෙනවා. ගැසට් නිවේදනය ගැන කතා කළත් ඒ ගැසට් නිවේදනය අද වෙනකම් එළිදරව් කරන්නවත් බැරි වෙලා තියෙනවා පාර්ලිමේන්තුවේ.

2001 අවුරුද්ද වෙනකොට ලෝකයේ ස්වභාවික සෝයා ඇට අහෝසි වුණා. ජාන තාක්ෂණයෙන් සමහර එළවළු වර්ග අපට ආවට දැන් මේ ජාන විකෘති කරලා තමයි ලෝකයේ සොයා හැදුවේ. ඒ හදන්නේ ආහාර සඳහා නෙමෙයි ඉන්ධන සඳහා. ඒ නිසා ඒ සොයා හදන සමාගම් කියනවා මේක සතෙකුටවත් කන්න දෙන්න එපා කියලා. හැබැයි ඒ සෝයා ටික අපි ගෙනල්ල අපි ඒකෙන් ත්‍රිපෝෂ, සමපෝෂ, යහපෝෂ හදනවා. ත්‍රිපෝෂ කුඩා ළමයින්ට සහ ගැබිනි මව්වරුන්ට සෞඛ්‍ය අමාත්‍යාංශය නිර්දේශ කරලා නොමිලේ බෙදා දෙනවා. මේ සතෙකුටවත් කන්න එපා කියන සෝයා. එතකොට මේක ළදරුවාගේ කාලේ ඉඳන් මේ කට්ටියට සතෙකුටවත් කන්න එපා කියන්න සෝයා අඩංගු ත්‍රිපෝෂ ටික තමයි බෙදන්න. එතකොට මේ පිළිබඳ ලොකු කතිකාවක් ඇති වෙන්න ඕනේ. මේ පිළිබඳ ගැසට් නිවේදනය 2001 පාර්ලිමේන්තුවට ගෙනාවේ. අද වෙනකම් මේක කිසිම කෙනෙක් සම්මත කරන්න උනන්දුවක් දැක්වුවේ නැහැ. ඕනෑ කමක් ඇත්තෙත්

නැහැ. මෙච්චර හානිදායක විදිහට ළමයිට මේක දෙනවා. මේ තුළ තමයි විශාල විදිහට පිළිකාකාරක ළමයින්ට ඇතුළු වෙන්නේ. එතකොට මේ කුඩා ළමයට නොමිලේ බෙදාදෙන ත්‍රිපෝෂ ඇතුලේ ඉතා විශාල පිළිකාකාරක තොගයක් තියෙනවා.

***වසවිෂෙන් තොර දේශීය ආහාර ප්‍රචලිත කරන්න සෑහෙන කාලයක් වෙහෙසිලා වැඩ කරන කෙනෙක් විදිහට කොහොමද මේ පවතින ආණ්ඩුව හරි රජයේ ආයතන හරි මේවට දක්වන සැලකිල්ල සහ දායකත්වය, ඒ ගැන සෑහීමකට පත්වෙන්න පුළුවන්ද?***

රජයේ සහයෝගයක් නැතිව මේක ජනතාව අතරට අරන් යන්න පුලුවන්ද? අපි ස්වාධීනව ස්වේච්ඡාවෙන් තමයි මේ වැඩේ පටන් ගත්තේ. අපිට තේරුණා මේ යන වැඩපිළිවෙළ ඇතුලේ අපේ වෙළඳපොල තුළ දැනට තියෙන ඕනෑම සහල් වර්ගයක්, විශේෂයෙන් වියළි කලාපයේ වවන සහල් වර්ග ගත්තොත් සෑම සහල් වර්ගයකටම අපේ ගොවිජනතාව ඉතා තදබල විදිහට රසායනික පොහොර පාවිච්චි කරනවා. කෘමිනාශක, වල් නාශක, දිලීර නාශක පාවිච්චි කරනවා. ඒ නිසා අපේ පසේ ඉතා බරපතළ විදිහට ආසනික්, කැඩ්මියම්, රසදිය තැන්පත් වෙලා තියෙනවා. දැනට අවුරුදු 9 කට විතර කලින් ආසනික් කියලා ලොකු කතාබහක් ඇති වුණා. මේක ජනගත වුණා. ඒක එදා පාර්ලිමේන්තුවට පවා ගියා. ජනාධිපතිවරයා ලෙස මහින්ද රාජපක්ෂ ඉන්න කාලෙ තමයි මේ සාකච්ඡාව ගියේ. එතකොට මහින්ද යාපා අබේවර්ධන කියන අද ඉන්න කථානායකතුමා තමයි කෘෂිකර්ම ඇමතිවරයා. හැබැයි පාර්ලිමේන්තුවට ගියා වුණත් මේකට විසඳුමක් දුන්නෙ නැහැ.

මේ කතාව එන්න අවුරුදු ගානකට කලින් තමයි අපි අපේ දේශීය වීවල තියෙන වටිනාකම හොයාගත්තේ. ලංකාවෙ තියෙන පරණ (දේශීය) වීවල තියෙන ගුණාත්මකභාවය ගැන කතා කළොත් අද තියෙන හාල් කිලෝ දහයකට වඩා පරණ හාල් කිලෝ එකක් කෑවම ඇති. ඒ නිසා අපි මේක බොහොම අමාරුවෙන් වී ඇට දෙක තුන එකතු කරලා, ගන්නොරුවේ මධ්‍යස්ථානයත් එක්ක එකතු වෙලා ඒ ගොල්ලන්ට බොහොම අමාරුවෙන් පින්සෙන්ඩු වෙලා ගෙනල්ලා තමයි අද ඉන්න තැනට ආවේ. මේ සහල් අද වෙනකොට ප්‍රචලිත වෙලා තියෙනවා. හැබැයි අපි ඒක පටන් ගන්න කාලේ, 1985 විතර බොහෝ දෙනෙක් කිව්වේ අපිට පිස්සු කියලා. හැබැයි අපි එකක්

සතුටු වෙනවා. බොහොම අමාරුවෙන් පැල කරපු මේ දේශීය වී වගාව කියන එක අද ජනගත වෙලා තියෙනවා. ලංකාව පුරා, ලෝකෙ පුරා මේ වීවල තියෙන වටිනාකම ගැන අද කතා කරනවා. මේ නිසා විශාල ප්‍රබෝධයක් ඇතිවෙලා තිබෙනවා. හැබැයි රජය පැත්තෙන් ලොකු සහයෝගයක් දුන්නේ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය ගත්තත් එක්කෙනෙක් දෙන්නෙක් තමයි දහස් ගාණක් නිලධාරීන්ගෙන් මේ වැඩේට කැමති වෙන්නේ. හැබැයි එයාලටත් තමන්ගේ ආයතන ඇතුළේ ලොකු කැපිලි තියෙනවා. එහෙම දෙයක් ඇතුළෙ තමයි අපි මේක කළේ.

පොහොර සමාගම්වලට යටවෙච්ච තැනක තමයි ගොවිජන සේවා සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඉන්නේ. මේකට විරුද්ධව ලොකු කතිකාවතක් ඇති වෙන්න ඕනෑ. අපි රසායනික කෑවහම එයින් අපට කොච්චර හානියක් වෙනවාද කියන කාරණය ගැන නැවත කතිකාවතකට යන්න වෙනවා. දැන් පහුගිය මෛත්‍රිපාල මහත්මයා ඉන්න කාලේ යම් කතිකාවතකට ගිහිල්ලා, මේ වස විෂ නැති රටක් කියන ලොකු සංකල්පයක් ඇති වුණා. හැබැයි ඒක කරගෙන යන්න දුන්නේ නැහැ. අතරමග අඩාල කළා. බහුජාතික සමාගම් ඒක විනාශ කලා. දැන් අලුත් ආන්ඩුවට එවැනි වැඩපිළිවෙළක් නැහැ. දේශීය වගාවට රසායනික පොහොර නැතුව කරන වගාවට එහෙම ලොකු කතිකාවතක් ඇති වෙලා නැහැ. ඒ නිසා අපිට බලාපොරොත්තු වෙන්න බැහැ මේ ආණ්ඩුව ඇතුළේ එහෙම ලොකු වැඩකට යයි කියල. අපි කියන්නේ දේශීයත්වය ගොඩනගන වැඩපිළිවෙලක් තියෙනවා නම් අනිවාර්යෙන්ම අපි කන ආහාර භෝග වගා කරන ගොවියාට යම් සහනයක් සලසා දිය යුතුයි. රසායනික පොහොරවලින් තොරව කොහොමද වගා කරන්න කියලා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/viqr4QI63-s

https://www.aithiya.lk/small-farmers-in-sri-lanka-nimal-de-silva/

# 40. නව සාමාන්‍ය තත්ත්වය තුළ මානව ජීවිතය කෙබඳුද?

## දිනේෂා කංකානම්ගේ (සහාය කතිකාචාර්ය සමාජ විද්‍යා අධ්‍යායන අංශය, රුහුණු විශ්ව විද්‍යාලය)

*සමාජ දුරස්ථභාවය*


දිනේෂා කංකානම්ගේ

අපට මේ තමයි නිරන්තරයෙන් මාධ්‍ය හරහා ඇහුන වචනය. නමුත් අපි දන්නවා මෙතන යම්කිසි නොගැලපීමක් තියෙනවා. මොකද සමාජ දුරස්ථභාවය තබාගැනීම සහ කායික දුරස්ථභාවය තබාගැනීම කියන්නේ සම්පූර්ණයෙන්ම වෙනස් කාරණාවන් දෙකක්. රට වසා දැමීමේ කාල සීමාව තුළ මාස දෙකක් තුනක් ගෙදරටම කොටුවෙලා හිඳීම තුළ කොහොමද මිනිසුන්ගේ මානව සම්බන්ධතාවයන්වලට මේක බලපාන්නෙ කියලා අධ්‍යනය කිරීම මගේ මූලික කාර්ය වුණා. අපි දන්නවා පුද්ගලයා පවුල තුළ පමණක් මානව සම්බන්දතා පැවැත්වීමට සීමාවන කෙනෙක් නෙමෙයි. නිරන්තරයෙන් පවුලෙන් පරිබාහිරව සම්බන්ධතා එක්ක ගැටෙන කෙනෙක්. අපි දන්නවා විවිධ සමාජ ආයතනය එක්ක ගනුදෙනු කරන කෙනෙක්. පවුලත් එක්ක තියෙන සමාජ සම්බන්ධතාවලට එහා ගිය, ඒකෙන් අදහස් කරන්නේ සමාජීය, අධ්‍යාපනික, ආර්ථික, දේශපාලනික සම්බන්ධතාවලට යොමුවෙනවා. මේ කාරණා පිළිබඳ සොයා බලන කොට ඉතාමත් වැදගත් කාරණා කිහිපයක් හොයාගන්නට ලැබෙනවා.

ඒ මොනාද කියලා පැහැදිලි කළොත් කොවිඩ් 19 කාල සීමාව කියන්නේ මිනිසුන් මානසික අවපීඩනයකට පත් කරපු කාලයක්. ඊට හේතුව ඔවුන්ට ඉතාමත් හොඳ මානව සම්බන්ධතා, පවුලත් සමඟ

හොඳ සම්බන්ධතා තිබුනා වුවත්, ඒ සඳහා කාලය ඉඩ ප්‍රස්ථාව තිබුනා වුණත්, ඔවුන් සැහෙන්න මානසික ව්‍යාකූලතාවයන් ට පත්වෙලා තිබුණා, එයින් පරිබාහිර සමාජ සම්බන්ධතා පවත්වා ගැනීමට නොහැකි වීම තුළින්. ඒ ගැන තව ටිකක් පැහැදිලි කළොත් ගෙදර සිට වැඩ කිරීම කියන න්‍යාය ගම්මු, ඒක හැම කෙනාටම එක විදියට අනුගමනය කරන්න පහසුවක් වුණේ නැහැ. අපි හැමෝටම ඒ ගැන අත්දැකීම් තියෙනවා. කාර්යාලට යනවා නම් උදේ 8ට පටන්ගෙන හවස පහෙන් ඉවරයි. නමුත් මේ කොවිඩ් 19 තත්ත්වය තුළ උදේ 8ට පටන් ගන්න සේවා කාලය රෑ 8.30 නමය වගේ යනවා. සමහර දවස්වලට අවසන් වෙන වෙලාවක් නැහැ. එතකොට මේ work-life balance කියන එක නිරන්තරයෙන් පර්යේෂකයන්ගේ සාකච්ඡාවට බඳුන් වෙන කාරණාවක්. නමුත් මේ කොවිඩ්19 තත්ත්වය තුළ එය උඩු යටිකුරු වුණා. මිනිස්සුන්ට තමන්ගේ දෛනික පෞද්ගලික කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න නොහැකි වුණා.

මේ අධ්‍යයන හරහා එළිවුණ ඉතාමත් වැදගත් කාරණාවක් තමයි, මානව සම්බන්ධතා විෂයෙහි අම්මා, තාත්තා, සහෝදර සහෝදරියන්, බිරිඳ, සැමියා අතර ඉතාම සමීප සම්බන්ධතාවයක් ගොඩනැගෙ නවා වගේම, පෙර නොවූ විරූ විදියට සැකය, අවිශ්වාසය, එහෙමත් නැතිනම් එපා වීමේ තත්ත්වයන් දක්නට ලැබීම. පුද්ගලයන් අතර වෙනදා නොතිබුණු ආකාරයේ පරස්පර විරෝධී අදහස්, එපාවීම, අඬදබර දක්නට ලැබුණා. ඒත් එක්කම මේ මානව සම්බන්ධතා විෂය තුළ පුද්ගලයන් දක්වන නැමියාවන් කොහොමද කියලා පැහැදිලි කළොත් අධ්‍යයනය හරහා ඉතාමත් වැදගත් කාරණාවක් හොයාග න්න පුළුවන් වෙනවා. මානව සම්බන්ධතා පැවැත්වීමේදී, පවුලෙන් පරිබාහිරව සමාජ මානව සම්බන්ධතා පැවැත්වීමේදී කාන්තා පාර්ශ්වයට වඩා පිරිමි පාර්ශවය ඉතාමත් උනන්දුවක් දක්වනවා. ජංගම දුරකථනය හරහා, ඊමේල් හරහා, විවිධ සමාජ මාධ්‍ය හරහා කාන්තාවන්ට සාපේක්ෂව පිරිමි අය සමාජ සම්බන්ධතා තවදුරටත් වර්ධනය කරගන්න උත්සාහ කරනවා. එතැනදි වෙනදා සමාජ මාධ්‍ය තුළ හැසිරීම දිනකට පැය එකක් හෝ දෙකක් වූ කාල පරාසය මේ කොවිඩ් 19 තත්ත්වය තුළ දිනකට පැය අටේ සිට පැය දහය දක්වා ඉතා විශාල වෙනස් වීමකට බඳුන් වෙලා තියෙනවා. ඒක විශාල වර්ධනයක්.

පුද්ගලයන්ට ලැබුණු කාල සීමාව තුළ පවුලේ සාමාජිකයන් සමඟ සමීප සම්බන්ධතා පවත්වන්න අවස්ථාව ඉඩකඩ කාල වේලාව ඕනෑ තරම් තිබුණා වුණත්, මේ අධ්‍යයනයේ දී හෙළිවෙනවා මේ පුද්ගලයන් සමාජ සම්බන්ධතා පවත්වන්නේ මේ කියන සමාජ මාධ්‍ය හරහා. ෆෙස්බුක්, වට්ස්ඇප්, වයිබර්, ට්විටර්, මේවාට කැප කරන වේලාව ඉතාමත් අසීමිතයි. ගෙදර ඉඳන් වැඩකරන කෙනෙක් නම් ඒකෙනා දිනකට පැය දහයකට ආසන්න කාලයක් සේවා ආයතනයේ වැඩවලට යොමුවෙලා ඉන්නවා වගේම සමාජ මාධ්‍ය කෙරෙහි යොමුවෙලා ඉන්නවා. මේ කාරණාත් සමග අපට අවසානයේ ලැබුන නිගමනය තමයි මිනිසුන් කිසිම වෙලාවක පවුල මූලික සමාජ සම්බන්ධතාවලින් තෘප්තිමත් වෙන්නේ නැහැ. මිනිසුන් නිරන්තරයෙන්ම පෙළඹෙන්න උත්සහ කරනවා පවුලෙන් පරිබාහිර සමාජ සම්බන්ධතාවලට. මේ කොවිඩ් තත්ත්වය අස්සේත් මිනිස්සු උත්සාහ කළේ මේ තත්ත්වය පවත්වාගෙන යන්න. එහෙම බැරිවුණාම ඔවුන් විශාල වශයෙන් මානසික ව්‍යාකූලතාවන්වලට ලක්වුණා.

ලෝකය පුරා විවිධ විද්වතුන් සමාජ විද්‍යාත්මක පර්යේෂණ වල නියැළෙනවා මේ දිනවල මේ කොවිඩ් 19යේ සමාජ බලපෑම මොන වගේද කියලා සොයා බලන්න. එතකොට මේ මානව සම්බන්ධතා විෂයෙහි ඇති කරන සමාජ බලපෑම් පිළිබඳ විවිධ පර්යේෂණ ලිපි පළවෙලා තියෙනවා. ඒවා කියවලා බලද්දි මම තේරුම් ගත්තු දෙයක් තමයි යුරෝපීය රටවල විශාල අර්බුදයක් වෙතට මේ මානව සම්බන්ධතා ගමන් කරනවා කියන දේ.

ඉන්දියාවෙත් වර්තමාන කොවිඩ් තත්ත්වය අස්සේ මානව සම්බන්ධතාවල දරුණු කඩාවැටීමක් තමයි දක්නට ලැබෙන්නේ. ලංකාවේ නාගරික ජීවිතය මොනවගේ තත්ත්වයකට පත්වෙලා තියෙනවද කියලා මමත් බැලුවා. මම තෝරා ගත්තේ මගේ ප්‍රදේශය දකුණු පළාත වෙන නිසා ගාල්ල, මාතර, හම්බන්තොට යන ප්‍රධාන නාගරික ප්‍රදේශ. එයින් නාගරික පවුල් විස්සක් තමයි පහසුතා අධ්‍යයනය යටතේ මගේ නියැදිය ලෙසට මම තෝරා ගත්තේ. මේකෙ අරමුණ වුණේ මේ හුදකලා නීතිය ක්‍රියාත්මක වෙන කාලයේ මාස දෙක තුනක් තුළ මානව සම්බන්ධතා, අන්තර් මානව සම්බන්ධතා පැවැත්වීමේදී, නාගරික ප්‍රජාව මුහුණ දීපු ගැටලු හොයන එක.

නගරය කියන්න ඉතාමත් සුවිශේෂී කලාපයක්. ගමට සාපේක්ෂව, ග්‍රාමීය සමාජ ජීවිතයට සාපේක්ෂව, නාගරික සමාජ ජීවිතය තුළ පුද්ගලයන් විවිධාකාර ගැටලුවලට මුහුණ දෙනවා. හුදකලා කාල සීමාව තුළ ගමේදී නම් ඇඳිරි නීතිය ක්‍රියාත්මක වුණත් අපිට පුළුවන් ටිකක් එළියට යන්න, මිනිසුන් එක්ක සම්බන්ධතා පවත්වන්න, කතාබහ කරන්න. නමුත් නාගරික ජීවිතේ තුළ මිනිස්සුන්ට ඒ හැකියාව නැහැ. මේ අධ්‍යයනයේ දී මේ පවුල් විස්සෙන් තුන්දෙනෙක් මට හමු වෙනවා, ඇඳිරි නීතිය උල්ලංඝනය කරලා පොලිසිය විසින් අත්අඩංගුවට අරගෙන තියෙනවා. අපට වාර්තා වෙනවා විශාල ප්‍රමාණයක් ඇඳිරිනීතිය කඩ කරනවා. ඇයි මේ ඇඳිරි නීතිය කඩ කරන්නේ? මේ නාගරික ප්‍රදේශ තුළ තමයි ඒක වැඩියෙන් ම දක්නට ලැබෙන්නේ. ඒකට හේතුව මේ මිනිස්සුන්ගෙන් භෞතික භූමි ප්‍රදේශය, නිවස පිහිටා තියෙන භූමි ප්‍රදේශය ඉතාමත් පටුයි. වගාව කරන්න උනත් පුළුවන් වුණේ ඉඩ ප්‍රස්ථාව අනුව. එතකොට මේ මිනිස්සුන්ට වෙනත් විකල්ප නැහැ ගමේදි වගේ. එතකොට එකිනෙකා සමඟ සම්බන්ධ වීමට තිබුණ ජංගම දුරකථනය පමණයි. නමුත් ඒක ප්‍රමාණවත් නැහැ මේ මානසික ව්‍යාකුලතාවයන්ට. වයස අවුරුදු 30ත් 50ත් අතර පිරිස ගැහැණු පාර්ශ්වය මනෝ මනෝවිද්‍යා ප්‍රතිකාර ජංගම දුරකථනය හරහා ගැනීමට තරම් පෙළඹිලා තියෙනවා මේ කාලසීමාවේදී. එයාලට මේක හරි අමාරුයි. පන්සලට යන්න බැහැ, පල්ලියට යන්න බැහැ, තමන්ට කැමති වෙලාවකට සාප්පු සවාරිවල යෙදෙන්න බැහැ. බාහිර සමාජයත් එක්ක තිබ්බ සම්බන්ධතා සම්පූර්ණයෙන්ම ඇන හිටියා. මේක බරපතළ තත්ත්වයක්. බාහිරින් බැලූ අපිට පේන්නේ නගර මිනිස්සුන්ට එළවළු ටික ළඟට එනවා හරිම පහසුයි කියලා. ඒත් ඒකත් එක්තරා ආකාරයක පීඩනයක්.

ආර්. එච්. බෙග් කියන විද්‍යාඥයා ඉතාමත් පැහැදිලිව කියනවා මේ කාර්මීකරණය නාගරීකරණ කියන දෙකේ එකතුවක් විදිහට නිර්මාණය කරලා තියෙන්නේ අවදානම් සහගත සමාජයක් කියලා. ගෝලියකරණ වගේ සංකල්ප එක්ක එන්න එන්නම ලෝකය හැකිලෙනවා. චීනයේ වූහාන්වල තිබ්බ වෛරසය ඉතාමත් ඉක්මනින් ලංකාවට ඇවිල්ල ලංකාවෙ මිනිස්සුන්ට ආසාදනය වෙන්න ලොකු කාලයක් ගත්තෙ නැහැ. එතකොට අපිට තේරෙනවා මේක ග්‍රාමීය ප්‍රජාවට වඩා නාගරික ප්‍රජාව අර්බුදකාරී තත්ත්වයට ඉක්මනින් මුහුණ දුන්නා කියලා. එයාලට

මේකෙන් ගැලවෙන්න පහසු මඟක් නැහැ. එහෙම මාර්ගයක් තිබ්බෙත් නැහැ. මේ කියන්නේ රෝග ආසාදනය වීමේ කාරණාව විතරක් නෙමෙයි. ඊට පෙර රජය අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා මිනිසුන් එක්තරා විදියකට හුදකලා වෙනවා, එක්තරා විදියකට හිර කිරීමකට ලක් වෙනවා. නාගරික ප්‍රජාව මේ හේතුවෙන් විවිධ අපහසුතාවයන්ට මුහුණ දුන්නා.

## *පවුල ඇතුලේ සිදුවූ වෙනස් වීම්*

ඔබත් දකින්න ඇති සමාජ මාධ්‍ය හරහා එහෙට මෙහෙට සංසරණය වුණා, "කොරෝන කාලේ හස්බන්ඩ්ව පොඩ්ඩක් ආශ්‍රය කළා හරි හොඳ මනුස්සයා" මේක ඒ විදිහටම වයිෆ්ටත් කියල තිබ්බා. මේක ඇතුලෙ තියෙනවා යම්කිසි අපි අවධානයට ගත යුතු කාරණාවක්. ඇතැම්විට බාහිරෙන් ඉඳන් බලන කෙනෙකුට පේන්න පුලුවන් අනේ හරි හොඳයි, අපි මේ හැල්මේ දුවන ජීවිතවල හිටියේ, අපේ රස්සාවල් එක්ක අපේ අධ්‍යයන වැඩ කටයුතු එක්ක ළමයි ඉස්කෝලේ දුවනවා ක්ලාස් දුවනවා, මේ කාලසීමාව ඉතාමත් හොඳයි පවුලේ සාමාජිකයන්ට එකට එකතු වෙලා වැඩ කටයුතු කරගන්න කියලා. එකට සමගියෙන් සමාදානයෙන් ආදරෙන් ඉන්න පුළුවන් කියලා. එහෙම අපේක්ෂාවන් තියෙන්න ඇති. නමුත් ඇත්ත අපි දකින මේ චිත්‍රය නෙවෙයි. මේ තත්ත්වය එක්ක හස්බන්ඩ් තමන්ගේ වයිෆ් එක්ක සම්බන්ධතා පවත්වද්දී පෙර නොවූ විරූ ආකාරයට විශාල අර්බුදයන්ට මුහුණ දීල තියෙනවා. මේක අනිවාර්යෙන්ම සඳහන් කරන්න ඕන. ඇතැම් විට මේ දෙදෙනාගේ අවශ්‍යතා මොනවාද, රුචි අරුචිකම් මොනවා ද කියලා අමතක වෙලා තිබ්බ යුගයක තමයි හිටියෙ. නැවත මේවා මතක් කරන්න ගත්තහම අර්බුදයක් නිර්මාණය වෙනවා. ඉන්න දවස්වලවත් මං ගැන බලන්න බැරිද වගේ පුංචි පුංචි වචන හරහා ප්‍රහාර දියත් කිරීමේ තත්ත්වයක් තිබ්බා. ළමයින්ගේ විෂයෙහි බිරිඳ බලාපොරොත්තු වුණා සැමියාගෙන්, මෙච්චර දවස් ඔයා රස්සාවක් කරා ඒ නිසා දැන් මේ දරුවො ටික බලන්න කියලා. ඉතාමත් කැමැත්තෙන් තාත්තා ළමයිත් එක්ක ඉඳපු අවස්ථා තිබ්බා, ඉතාමත් කැමැත්තෙන් දරුවන්ගේ අධ්‍යාපන වැඩකටයුතුවලට තාත්තා සම්බන්ධ වෙන අවස්ථා තිබ්බා.

අනිත් පැත්තෙන් ගෙදර ඉඳන් වැඩ කරන සංකල්පය නිසා කලින් තිබ්බ තරම්වත් දරුවොත් එක්ක ඉන්න වෙලාවක් නැතිවෙලා තියෙනවා දෙමාපියන්ට. මේක තමයි ඇත්තම තත්ත්වය. එතකොට අපට අමතක කරන්න බෑ කාන්තාව ද්විත්ව චරිතයක් රඟ දක්වනවා කියලා. කාන්තාව කියන්න සේවා ආයතනයක වැඩ කරන ගමන් ගෙදර වැඩකටයුතු පාලනය කරන කෙනෙක්. හැබැයි කොවිඩ් 19 කාලසීමාව තුළ කාන්තාවට ගෙදර වැඩක් බලන්න වෙනවා වගේම ගෙදර ඉඳන්ම ඔෆිස් එකේ වැඩ කරන්නත් වෙනවා. පෞද්ගලික ආයතනයක වැඩකරන කාන්තාවක් නම් මේ තත්ත්වය ඉතාමත් බරපතළයි. අනිවාර්යෙන්ම මාර්ගගත ක්‍රමයට වැඩ කරන්න සිද්ධ වුණා. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට වෙලාවක් කලාවක් නැහැ අන්තර්ජාලය ඔස්සේ දේශන පවත්වන්නට සිද්ධවුණා. මේක ඉතාමත් බරපතළ විදියට දකින්න ලැබුණා. බාහිරට පෙනෙන්නේ නැති වුණාට පවුලේ සාමාජිකයො මේ දේවල් වලට විරුද්ධයි. දුරකථනය එක්ක, ලැප්ටොප් එකත් එක්ක මීටින්වල ඉන්න එක ඉතාමත් බරපතළ විදියට අනිත් අය තේරුම් ගන්නේ.

### *ප්‍රචණ්ඩත්වය*

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, කාන්තාව විතරක් නෙමෙයි දරුවන්, වයසින් වැඩි පුද්ගලයන් මේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වෙච්ච අවස්ථා පර්යේෂණය හරහා මට දක්නට ලැබෙනවා. ඊටත් එහාට ගියාම විවිධ පර්යේෂණවලින් හොයාගෙන තියෙනවා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඉතාමත් වැඩිපුර දක්නට ලැබෙන්නේ කාන්තාවට කියලා. කාන්තාවන් විවිධ කාර්යයක් රඟ දක්වන නිසා රැකියාව සමබර කරගන්න ඕනි, ගෙදර පරිසරය සමබර කරගන්න ඕනි, සාමාජිකයන් සියලු දෙනාගේ අවශ්‍යතාවයන් දරුවන් පිළිබඳ සොයා බලන්න ඕනේ, වැඩිහිටි පාර්ශ්වයන් පිළිබඳ සොයා බලන්න ඕනේ, ඒ හැරුණු කොට තමන්ගේ සැමියා පිළිබඳ කායික මානසික අවශ්‍යතා පිළිබඳ බලන්න අවශ්‍යයි. මේ පර්යේෂණයට සහභාගී වූ කාන්තාවන් විසි දෙනාගෙන් දොළොස් දෙනෙක්ම මේ කාලයේ පවත්වපු මේ සම්බන්ධතා නිසා ඇතැම් විදිහට අසීමාන්තික හිරිහැරකාරී ලිංගික චර්යාවන්ට පවා මුහුණ දීලා තිබ්බා. මේක එක්තරා විදියකට වදයක්. කලින් ජීවිතේ මෙයාලා හුරුවෙලා තිබ්බ සාමාන්‍ය ජීවිතේට, වැඩට යනවා ගෙදර එනවා සති

අන්තයේදී එකට පවුලේ සාමාජිකයො එක්ක ඉන්නවා. නමුත් කොවිඩ් 19 තත්ත්වය තුළ මාස තුන හතරක කාලයක් ඒකාකාරී විදිහට මේ තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. තත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වෙනවා. එතකොට කලින් කියන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය මානසික වෙන්න පුළුවන්, කායික වෙන්න පුළුවන් විවිධ විදියට ලක්වෙනවා. ළමයින්ටත් මේක සාමාන්‍යයි. ළමයි වුණත් තමන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව online හරහා යොමු වුණා කියලා අපිට කියන්න බැහැ. මේ පර්යේෂණය කරද්දි පවුල් 20න් 18කම ළමයි අධ්‍යාපන කටයුතුවලට යොමු වෙලා තිබ්බා. මම ළමයින් එක්ක කතා කරද්දී ඔවුන් කියපු දෙයක් තමයි ක්ලාස් එක තියෙද්දි ඔවුන් සෙල්ලම් කරා කියලා.

දෙමාපියොත් තවත් වෙලාවක දරුවන්ට බලහත්කාරකම් කරනවා මේ පන්තිවලට සහභාගි වෙන්න ඉස්කෝලේ පන්තිවලට සහභාගි වෙන්න. පවුල් 18න් 15කම ළමයින්ට දෙමව්පියෝ පස්සෙන් පන්න පන්න ඉතාමත් වද දෙමින් තමයි මේ අධ්‍යාපන කටයුතුවල ළමයි යොදවලා තියෙන්නේ. පවුල් 18න් පවුල් 15ක ම දෙමවුපියන් මේ දරුවන්ට කායිකව පහරදීම් කරලා තියෙනවා අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන්. එතකොට අපට පැහැදිලිවම නිගමනයකට එන්න පුලුවන් ළමයිනුත් ප්‍රචණ්ඩත්වයට ලක්වුණා මේ කාලසීමාව තුළ කාන්තාවන් වගේම.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/zi4QQitCUKs

https://www.aithiya.lk/current-covid-situation-in-sri-lanka/

# 41. කොවිඩ් මර්දනය දැන් යන්නේ ඇමරිකන් ක්‍රමයට, අපිට ගැලවීමක් නෑ

## ජනතා විමුක්ති පෙරමුණු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න



සමන්ත විද්‍යාරත්න

***පහුගිය කාලේ උමා ඔය ව්‍යාපෘතියට රට තුළින් දැඩි විරෝධයක් ආවා. ඒ විරෝධයේ නියමුවෙක් විදියට වැඩකළේ ඔබතුමා. නමුත් දැන් අපිට පේන්නෙ නෑ අරගලයට මොකද වුණේ කියලවත් නැහැ. ඒ තරමට අරගලය දියවෙලා ගිහිල්ලා. ප්‍රශ්නය තාමත් එතනමයි. මොකක්ද ඇත්තටම වුණේ උමාඔය සටනට?***

ව්‍යාපෘතිය පටන් ගත්තට පස්සේ අපි සංවිධානයක් හදලා, එතකොට තිබුණේ අන්තිමට තිබුණු සංවිධානය නෙමෙයි, "උමා ඔය සුරැකීමේ ජනතා ව්‍යාපාරය". මොකද පළවෙනියට තිබ්බේ සුරැකීමනෙ. එයින් අපි ජනතාව දැනුවත් කරන්න මහන්සි ගත්තා. ඉතින් අපේ රටේ ස්වභාවය අනුව ජනතාව එකවරම එළියට එන්නේ නැනේ. එන්නෙ සුළුතරයක්. ඉතිං පොඩි ප්‍රමාණයක් හිටියේ. ඒ සටන අපිට දිගටම ගෙනියන්න ඒ සංවිධානයට ලොකු දෙයක් කරන්න පුළුවන්කමක් ලැබුණේ නෑ. අන්න එතකොට තමයි ව්‍යාපෘතිය ආරම්භ කරලා විනාශය ආරම්භ වුණේ. ළිං හිඳෙනවා, ගෙවල් පුපුරනවා, වගා පාළු වෙනවා. එතකොට ඔන්න ආපහු ජනතාවට අපි ගිහින් අලුතෙන් කියන්න පටන් ගත්තා මේ වෙන්නේ අපි අර මුලින් කිව්ව ප්‍රශ්නෙ. දැන්වත් සංවිධානය වෙමු කියලා. එහෙම තමයි අපි දෙවෙනි සංවිධානය හැදුවේ, ''බහු විනාශකාරී උමාඔය ව්‍යාපෘතියට එරෙහි ජනතා පෙරමුණ'' කියලා.

පළවෙනි සංවිධානය එහෙම තියෙද්දි අලුත් සංවිධානයක් හැදුවා.

ඒකෙන් තමයි අර කියපු සටන රටට පේන්න ගත්තෙ. මොකද විනාශය එනකොට ජනතාව එකතු වෙන්න පටන් ගත්තා. ජනතාවට නායකත්වය දීලා ජනතාවත් එක්ක දැවැන්ත සටන් ප්‍රමාණයක් අපි මහපොළොවේ දියත් කලා. ඒ අනුව අධිකරණයට ගියා. බිමේ සටන් කලා. සාකච්ඡා කරා, පාර්ලිමේන්තුවේ පළාත් සභාවේ ප්‍රශ්න කළා. මේ ඔක්කොම කරගෙන ගියා. එතකොට අපි දන්නවා ලෝකෙ ගත්තත් අපේ රට ගත්තත් එකම ස්වභාවයක් උඝුලන්නේ. මේ සටන් පටන් ගත්තහම දිගට පවත්වා ගෙන යන්න පාලකයෝ බාධා කරනවා. පාලකයෝ මේවට කුමන්ත්‍රණය කරනවා. යටි උගුල් අටවනවා ජනතාව මෙතනින් භේද-භින්න කරන්න. ඒ කට්ටිය යම් යම් උත්සාහයන් ගත්තා. මේ සටනට එකතුවුණේ ජනතා විමුක්ති පෙරමුණේ සමාජිකයෝ විතරක් නෙමෙයි. මේ ප්‍රදේශවල සිංහල, දෙමළ, මුස්ලිම් අය එකතු වුණා. යූ.එන්.පී, ශ්‍රී ලංකා, ජේ.වී.පී මේ ඔක්කොම එකතුවෙලා තමයි මේ සටන අරගෙන ගියේ. ඒකෙ නායකයෝ මණ්ඩලයක් විදිහට හිටියේ. අපේ රටේ ස්වභාවයක් තියෙනවනේ ඡන්දයක් එනකොට මොකක් හරි තමන්ගේ පක්ෂය කියලා එකක් මූලික කරගන්නවනේ. ඒ අනුව ඡන්දෙදි ජනතාව බෙදුණා. බෙදුනට පස්සේ ජනතාව දැන් එකතුවෙන ප්‍රමාණය හරි අඩුයි.

නමුත් අපි සටන නවත්තලා නැහැ. ඔබ කිව්වා හරියටම හරි විනාශය නැවතිලා නැහැ. විනාශය වේගයෙන් සිදුවෙලා තියෙනවා. පාලකයන්ට ඕන දේවල් සිදුවෙමින් තියෙනවා. නමුත් අපි මේක ආපස්සට හරවන්න ජනතාවත් එක්ක සාකච්ඡා කරනවා. මොකද අපි දකිනවා උමාඔය විනාශය වෙච්ච ප්‍රමාණය අඩුයි. ලොකුම විනාශයන් ටික තියෙන්නෙ ඉදිරියට. අපි මධ්‍යම කඳුකරයේ නැගෙනහිර දකුණු බෑවුමේ ජීවත් වෙන්නේ. මේ භූ අභ්‍යන්තරයෙන් දැවැන්ත උමං මාර්ගයක් ඉදිකරල, ඔය ගෙවල් ඉරි තලලා තියෙන්නේ නිකම්ම නෙවෙයිනේ. ඒව මේ අඩි 17, 18 යට උමං මාර්ගයේ ඉඳන් ආපු ඉරි. ඒ කියන්නේ මේ මධ්‍යම කඳුකරය ඒකාබද්ධ වෙලා නෑ. ඉරි තලලා, පුපුරලා තියෙන්නේ. මේ පාලකයන් විසින් මධ්‍යම කඳුකරය දෙදරවල තියෙන්නෙ. ඒව ඉතින් මහ වැහි එනකොට යම් හෝ පුංචි භූමිකම්පාවක් එනකොට, අපි ප්‍රාර්ථනා කරන්නෙ ඒවැනි අවාසනාවන්ත සිද්ධි සිදුවෙන්න එපා කියලා. නමුත් ප්‍රාර්ථනාවලින් විතරක් විනාසයක් නවත්වන්න බැහැනේ. ඒ නිසා යම් මොහොතක දැවැන්ත අනතුරු මේ බිමට සිද්ධ වෙන්න පුළුවන්. අපි මේව කියලා විතරක් නෙමේ නවත්තන්න මහන්සි අරන් තියෙන්නේ. ඉස්සරහටත් ඒ මහන්සිය ගන්නවා.

***පහුගිය මහ මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ජාතික ජන බලවේගය ජනතාවගෙන් බලය ඉල්ලුවේ රටේ විපක්ෂයේ භූමිකාව ඉටු කරන්න. හැබැයි ඒ බලාපොරොත්තුව ඉටුවුණේ නැහැ. අපේක්ෂිත මැතිවරණ ප්‍රතිඵලය ඔබලාට ලැබුණෙත් නැහැ. ඇයි මෙහෙම වුණේ?***

ඔබ කිව්වා වගේ මැතිවරණයෙන් අපිට අපේක්ෂිත ප්‍රතිඵලය ලැබුණේ නැහැ. මොකද ඒකට හේතු වෙච්ච ලොකු කතාවක් තියෙනවා. මේ මැතිවරණය මෙහෙමවුණේ ඇයි කියනඑක අපි දකිනවා. ප්‍රධාන වශයෙන්ම ඡන්ද ප්‍රතිඵලයට බලපෑමක් වුණා ජාතිවාදය සහ ආගම්වාදය ඇවිස්සීම. රාජපක්ෂලා ඒක හොඳින් කළමනාකරණය කරගත්තා. ඒක රටකට නොකළ යුත්තක්. ඇත්තටම කරන්න ඕනේ ජාතිවාදය ආගම්වාදය රටෙන් ඉවත් කිරීම. එතකොට තමයි සංවර්ධනයට දොර ඇරෙන්නේ. ජාතිවාදය ආගම්වාදය තුළින් සංවර්ධනයට නෙවෙයි විනාශයට පාර කැපෙනවා. ඒ පාර දැන් කපලා තියෙන්නෙ. අපි දන්නවා මේ රටේ ඉතිහාසයෙත් පාලකයෝ තමන්ගේ පාලනය පවත්වාගෙන යන්න බැරි වෙනකොට, දුර්වල වෙනකොට, පාවිච්චි කරන්න ගන්නෙ ඔය ජාතිවාදය ආගම්වාදය. තමන්ගේ දුර්වලකම් වසාගන්න පුළුවන් සළුවක් ඒක. රටේ රස්සා ටික දෙන්න බැරිනම්, ආර්ථිකය හදන්න බැරි නම්, සෞඛ්‍ය ප්‍රශ්න, අධ්‍යාපන ප්‍රශ්න විසඳන්න බැරිනම්, ඒවට තියෙන හොඳම උත්තරේ තමයි ජාතිය, ආගම අවුස්සන එක. අපේ රටේ සමහර අයට කන්න නැතත් කමක් නෑ, උමං හාරගෙන ගෙවල් ටික පුපුරලා දැම්මත් ප්‍රශ්නයක් නෑ, ඉඩම්ටික විකුණුවත් ප්‍රශ්නයක් නෑ, ජාතිය රකින කෙනෙක් ඉන්නවනම්. ආගම රකින කෙනෙක් ඉන්නවනම්. මේ වෙනකොට ජාතිය කියලා මිනිස්සු බලාපොරොත්තු වෙච්ච දෙය රකින්නෙත් නෑ. ආගම රකින්නෙත් නෑ. ඒකට පටහැනි දේවල් කරනකොට ඒ මිනිස්සු විසින්ම මේක පෙරළා දැමීමට කටයුතු කරනවා. ඒ නිසා මේ ආණ්ඩුවට එච්චර ආයුෂ නෑ.

පහුගිය ඉතිහාසය පුරාම විපක්ෂ කණ්ඩායම් කියලා හිටපු අය විපක්ෂයේ කාර්යභාරය කළේ නැහැ. ඇත්තටම ගත්තොත් ආණ්ඩුව ඉන්න මතවාදයට එරෙහි මතවාදයක කොටසක් ඉන්නව නේ, ඒක තමයි සැබෑ විපක්ෂය. ජාතිවාදය ප්‍රතික්ෂේප කරන කණ්ඩායමක් ඉන්නවද රටේ, ඒක තමයි සැබෑ විපක්ෂය. රාජපක්ෂවරුන්ගේ ප්‍රතිපත්තිය, ප්‍රේමදාස මහත්තයාලගේ ප්‍රතිපත්තිය දෙකක්ද? දෙකක් නෙමෙයි එකක්. ඉතිහාසයෙම ඒ කට්ටිය පාලන බලය හොබවනකොට

එය පෙන්නුම් කරලා තියෙනවා. ඉඩම් විකිණීම රාජපක්ෂවරුන්ගේ විතරක් ප්‍රතිපත්තියක් ද? නෑ, මේ කට්ටියගෙත් ප්‍රතිපත්තිය. එහෙනම් ඒක විපක්ෂය නෙමෙයි. ඒ හින්දා විපක්ෂයක් තියෙනවා රටේ. ඒ විපක්ෂයෙන් නියෝජනය වෙන්නේ ජනතාව. ජාතිවාදයට එරෙහි ජනතාවක් ඉන්නවා මේ රටේ. දේපළ විකුණනවා ට එරෙහිව ජනතාවක් ඉන්නවා. අධිරාජ්‍යවාදයට එරෙහි ජනතාවක් ඉන්නවා. ඒ අයට නායකත්වය දෙන දේශපාලන ව්‍යාපාරයක් තමයි අවශ්‍යය. ඒකට ජනතා විමුක්ති පෙරමුණ, පුළුල් පෙරමුණක් හැටියට හදාගෙන තියෙනවා ජාතික ජන බලවේගය. මේ ආණ්ඩුව මේ රටේ ජනතාවගේ ඉඩම් වලට අත තියෙනකොට, ජාතිවාදය ආගම්වාදය පතුරවන්න හදනකොට, දැන් මේ කොරෝනා ප්‍රශ්නය ආපු වෙලාවෙත් ජනතාවාදී ලෙස බලන් නැතුව ඒ කට්ටියගේ බලය සහ ධනය දෙස බලාගෙනම ඒක කළමනාකරණය කරන කොට, ජනතාවගෙ පැත්තෙ ඉඳන් ජනතාවට නැඟී සිටිනවා. නැඟීසිටින ජනතාවට අපි නායකත්වය දෙනවා. ඒ වගේම අපි ජනතාව අවදි කරනවා. මේකට අදාල විපක්ෂයේ කාර්යභාරය දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි කරන්න සූදානම්.

***මේ රජය බලයට පත් වුණේ ජනතාවගේ හිතේ විශාල බලාපොරොත්තු ඇති කරලා. ආර්ථිකය කළමනාකරණය කරනවා, පාලනය කාර්යක්ශම කරනවා කිව්වා. හැබැයි එහෙම ආපු රජයට දැන් හාල් මිල පාලනය කරගන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. අනිත් පැත්තෙන් කොවිඩ් තත්ත්වයත් එක්ක ජනාධිපතිවරයා අසාර්ථකයි කියන අදහසක් ඇවිල්ල තියෙනවා..***

ගෝඨාභය අසාර්ථකයි කියලා ජනතාව අත් විඳින්නේ මේ දැන් පේනකොට. දැනෙන කොට තමයි ඔවුන් අත්විඳින්නේ. නමුත් මේ දෙය ගෝඨාභය එන්න පෙර අපි දැනගෙන හිටියා. ඒක අපි රටේ ජනතාවට කිව්වා. රාජපක්ෂ පවුල ගත්තම දුර්වලම සාමාජිකයා ගෝඨාභය කියලා අපි කිව්වා. කොහොමද ජනාධිපතිවරණය වෙලාවේ ගෝඨාභය රටේ ජනතාව ආමන්ත්‍රණය කළේ? තිස් අවුරුදු යුද්ධයක් හමාර කරපු මට මේ රටේ ප්‍රශ්න විසඳනවා කියන එක එච්චර ප්‍රශ්නයක් නෙමෙයි කියලයි කිව්වේ. පසුව ඒ කටින්ම යුද්ධයක් නම් විසඳන්න පුළුවන්, කොරෝනා කියන්නේ සෞඛ්‍ය ගැටලුවක් ඒක විසඳීමට හැකියාවක් තියෙන්නේ සෞඛ්‍ය අංශවලට, කියලා කිව්වා. රටේ නායකයෙක් එහෙම කියනවාද? නැවක කපිතාන් කෙනෙක්

එහෙම කියනවද? ගුවන් යානයේ නියමුවා කිව්වොත් මට කරන්න දෙයක් නෑ කියලා. එහෙම හරි යනවද? නෑ ඔවුන් නායකත්වය දෙනවා. දැන් මේ නායකයා සුක්කානම අතට අරං කියනවනේ මට යුද්ධයක් විතරයි විසඳන්න පුළුවන්. මට කොරොනා විසඳන්න බෑ කියලා. මාර ප්‍රශ්නයක් දැන්. මේකෙ වගකීම කාටද එතකොට? දැන් මේකට වැරදිකාරයෝ ජනතාව. ආරක්ෂා වුණේ නැලු. මාධ්‍යය තමන්ගේ කාර්යභාරය හරියට කරේ නැලු. නෑ ඔය දෙකම නෙමෙයි. ගෝඨාභයලා වග කියන්න ඕනේ. රාජපක්ෂලා වගකියන්න ඕන. සුක්කානම අතට ගත්ත නම් වාහනය අරන් යන්න ඕනේ. හරි විදිහට අරන් යන්න බැරි වුණාට පස්සේ රියදුරාගේ දුර්වලකම් යන මගීන්ගෙ කරේ තියලා හරියන් නැනේ. මේ පාලනයේ හොඳම දේවල් තාම අපි දැක්කෙ නෑ. තව ඉස්සරහට තමයි දකින්න පුළුවන් වෙන්නේ. අපි හිතනවා ලංකාවේ දුර්වලම පාලකයා බලාගන්න පුළුවන් වෙයි කියලා ඉස්සරහට. මෙතුවක් කල් දුර්වලම පාලකයා විදිහට අඳුනගත්තේ මෛත්‍රිපාල සිරිසේන. ඊට එහා ගිහිල්ලා තමයි මේක නවතින්නේ.

පළවෙනි කොරොනා රැල්ල මර්දනය කිරීම ඇත්තටම කළේ මැතිවරණ කොමිෂන් සභාව. ඇත්තටම ගත්තොත් කොරෝනා මර්දන වැඩපිළිවෙල ආණ්ඩු අතහැරලා ඉවරයි. අතහැරිය බවට සාක්ෂි ඕනද? ඒක තමයි ජනාධිපති කිව්වේ මේක ජනතාව ආරක්ෂා වුණේ නෑ. මාධ්‍ය කාර්යභාරය කළේ නෑ. මට යුද්දෙ නම් පුළුවන් මේක බෑ. තමන්ගේ ආරක්ෂාව තමන් සපය ගන්න කියලා ජේ.ආර් කියපු එකේ අනිත් එක තමයි මේ. අර සෞඛ්‍ය අංශවලට වගකීමක් තියෙන නිසා ඔවුන් යම් ප්‍රමාණයකට මේක කරගෙන යනවා. දේශපාලන නායකත්වය මේක අතහැරලා තියෙන්නේ. ඇමෙරිකානු ක්‍රමයට දැන් යන්නේ. මැරෙන එකෙක් මැරියං ඉතුරුවෙන එකෙක් ඉතුරු වෙයන් කියලා යන මට්ටමටක් තියෙන්නේ. ඉතින් මේක හරි සාහසික ක්‍රියාවලියක්.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/xz_0nkeAM34

https://www.aithiya.lk/samantha-vidyaratna-current-political-situation/

# 42. වතු ජනතාවගේ ප්‍රශ්නයට එකම විසඳුම ඔවුන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීමයි

## චාමර නානායක්කාර (ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොණරාගල)

***ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් විදියට සහ විශේෂයෙන්ම මොණරාගල වැනි දුෂ්කර ප්‍රදේශයක් නියෝජනය කරන කෙනෙක් විදිහට මේ රටේ පවතින ආර්ථික අර්බුදය ගමට දැනෙනවද?***



චාමර නානායක්කාර

මොණරාගල දිස්ත්‍රික්කයේ වෙල්ලස්සේ ප්‍රධාන ආදායම් මාර්ගය කෘෂිකර්මය. කර්මාන්තශාලා විදිහට පැල්වත්ත සීනි සමාගම, සෙවනගල සීනි සමාගම තියෙනවා, ඒ වගේම පුද්ගලික අංශය මැදිහත් වෙලා සියඹලාණ්ඩුව සීනි කම්හලක් ආරම්භ කරලා තියෙනවා, ඒත් එක්කම ඩෝල් ලංකා සමාගමේ කෙසෙල් ව්‍යාපෘතියක් තියෙනවා. ඔවුන්ගේ වැකඩ, කුඩාඔය, රන්දම, ෆාර්ම්ස් තියනවා. ඒ වගේ ප්‍රධාන ආදායම් මාර්ගවලට අමතරව ගොඩක් අය හේන් ගොවිතැන්වලින් තමයි ජීවිකාව සරිකර ගන්නේ. මේ අයට තියෙන ප්‍රධානම ගැටලුව තමයි නිෂ්පාදනයට නිසි මිලක් නැති ප්‍රශ්නය. උදාහරණයක් විදියට මතක් කරන්න ඕනේ පහුගිය කන්නයේ දී වට්ටක්කා ගොවියන් විශාල අසරණතාවයකට පත්වුනා. මේක මේ රජයට විතරක් මූණ දෙන්න සිද්ධ වුණ ගැටලුවක් නෙමෙයි. විශාල කාලයක් තිස්සේ අපේ රටේ තියෙන ප්‍රධාන ගැටලුව තමයි ගොවියාගේ නිෂ්පාදනවලට නිසි මිලක් නැති එක. මං හිතන්නේ කොවිඩ් කාලය තුළත් අපේ ගොවිතැන් කටයුතු කරගෙන යනවා. මේ වෙනකොට වැස්ස පටන්ගෙන තියෙනවා. මේ සෑම කෙනෙක්ම තමන්ගේ ගොවිතැන් කටයුතු ආරම්භ කරල තියෙනවා. එතකොට අපට පුලුවන්නම් මේ අයට බලාපොරොත්තුවක් දෙන්න රජයක් විදියට අස්වැන්න මිලට ගන්න වැඩපිළිවෙළක් හදනවා කියලා, ඒක ලොකු දෙයක්.

අද හාල් මිලදී ගැනීමේදී ගොවියාට සාධාරණයක් වෙලා නෑ. අපි කොළඹට ගිහිල්ලා වට්ටක්කා කිලෝ එකක මිල බලද්දි මෙහෙ ගොවියන්ගෙන් මිලදී ගන්න මිලත් එක්ක ලොකු වෙනසක් තියෙනවා. මඤ්ඤොක්කා ගත්තත්, බඩඉරිඟු ගත්තත් මේ සෑම දේකම ලාභ හූරගෙන කන්නේ අතරමැදියා. එතකොට අපට පුළුවන් නම් මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න ඒක වටිනවා. මේක මේ වර්තමානයේ ඇතිවෙච්ච ගැටලුවක් නෙමෙයි. මේක කාලයක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. දැන් තියෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි ජීවන වියදම ඉහළ යාම. අපි දැක්කා පහුගිය කාලේ එක දිගටම හාල් වගේ දේවල්වලට පාලන මිලක් හඳුන්වාදෙනවා. ගැසට් ගහනවා. නමුත් වෙළඳපොළට ගියාම පාලන මිලක් දක්නට ලැබෙන්නේ නෑ.. හාල් ප්‍රශ්නයට ආණ්ඩුව මීටවඩා මැදිහත්වීමක් කළ යුතුයි කියන එක තමයි අපේ අදහස. මොකද අපේ තියෙන ප්‍රධානම ආයතන ටික මේ වනවිට කඩා වැටිලා. අපට තියෙනවා වී අලෙවි මණ්ඩලය. මේ සම්බන්ධයෙන් තියෙන දායකත්වය මදි. ඒත් එක්කම සමුපකාර ව්‍යාපාරය. මේ රටේ සමුපකාර ව්‍යාපාරය හරහා පහුගිය කාලයේ විශාල වශයෙන් වී මිලදී ගැනීම් කළා. හැබැයි මේ වනවිට සමුපකාර ව්‍යාපාරය මේකට දායකත්වයක් නෑ. වී අලෙවි මණ්ඩලයේ දායකත්වය නෑ. ඒත් එක්කම කුඩා පරිමාණ වී මෝල් හිමියන් මේකට ලබාදෙන දායකත්වය මදිවෙලා තියෙනවා. මේ සියලු කාරණාත් එක්ක සමුපකාර ව්‍යාපාරය හා වී අලවි මණ්ඩලයේ දායකත්වය නැතිවීම තුළ කුඩා පරිමාණ වී මෝල් හිමියන්ගේ දායකත්වය නැතිවීම තුළ මහා පරිමාණ වී මෝල් හිමියන් මේ සියලුම වී තොග අරගෙන විශාල මිලක් දෙනවා රටට. ඉතින් මේක විශාල ඒකාධිකාරයක්. මේකට අපට දෙන්න පුළුවන් එකම විසඳුම තමයි වී අලෙවි මන්ඩලයේ තියෙන ගබඩා ටික පිළිවෙලක් කරල රජයෙන් වැඩපිළිවෙළක් හදන්න එක. හැම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයකම වගේ සමුපකාර සමිති තියනවා. මේ සමිති ටික අපට බලගන්වන්න පුලුවන්නම් මං හිතන්නේ මේකට අපිට හොඳ විසඳුමක් ලබාගන්න පුළුවන්. ඔය කාරණා ටික නොකරන තාක්කල්, හාල් අපට මේ වගේ කාලවල්වලදී අධික මිලකට කන්න වෙනවා. දැන් රජයක් විදිහට ඒ ගැන අවධානය යොමුකරලා තියෙනවා. මං දැක්කා පහුග ිය කාලේ ජනාධිපතිතුමා ලොකු උත්සාහයක් ගත්තා මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්න. මොකද ඒ වනවිට සියලු තොග තිබ්බ ප්‍රධාන ව්‍යාපාරිකයන් අතේ. මේ කන්නේ තුළ සියලු නිෂ්පාදන ටික ලබා ගැනීමේ වැඩපිළිවෙළක් සකස් කරන්න එතුමාගේ වැඩපිළිවෙළක්

තියෙනවා. පහුගිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල දිගටම මේගැන සාකච්ඡා කළා. ඒ නිසා මං හිතන්නේ අපට පුළුවන් එන කන්නෙන් පස්සේ යම් විසඳුමකට යන්න.

***ඔබ නියෝජනය කරන ප්‍රදේශයේ විශාල වශයෙන් වතු තියෙනවා. ඉතාමත් දිළිඳු ජීවන තත්ත්වයක් තමයි ඒ ජනතාවට තියෙන්නේ. ඔවුන් මේ තත්ත්වයෙන් ඉහලට ගන්න පුළුවන් කොහොමද? ඒ සඳහා ආණ්ඩුවේ වැඩපිළිවෙළක් තියෙනවද?***

වතු කම්කරුවන්ගේ ප්‍රශ්න ගැන කතා කරද්දි ඉතාමත් සංකීර්ණ ප්‍රශ්නයක්. මොණරාගල දිස්ත්‍රික්කයේ වතු ජනතාව විසිපන්දාහක් පමණ සිටිනවා. මේ දිස්ත්‍රික්කයේ මොණරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, බිබිල ප්‍රදේශීය සභා බල ප්‍රදේශය, ඒත් එක්කම බඩල්කුඹුර ඉහළ කඳුකරයේ මේ කියන ප්‍රදේශවල තමා කම්කරුවන් ජීවත් වෙන්නේ. මේ වතුකම්කරුවන්ගේ අර්බුදය 1940 ගණන්වල ඉඳන් මේ දක්වා පවතින ඒකාකාරී ගැටලුවක් විදිහට තමයි මම දකින්නේ. මේ අයගේ ජීවන තත්ත්වය සම්බන්ධයෙන් අපි සෑහීමකට පත්වෙලා නෑ කියනඑක පිළිගන්නවා. මේකට ප්‍රධානම ගැටලුව වෙලා තියෙන්නේ, එකක් මේ අයගේ අධ්‍යාපන මට්ටමේ තියෙන දුර්වලතාවය. හොඳම උදාහරණය තමයි මොණරාගල ආශ්‍රිතව ඉන්න වතු කම්කරුවන්ගේ සමහර දරුවෝ ඉතාමත් අමාරුවෙන් ඉගෙනගෙන විවිධ ක්ෂේත්‍ර වලට යොමු වෙලා තියෙනවා. ඒ සමග ඔවුන් වත්තෙන් අයින් වෙලා තියෙනවා. වත්තෙන් අයින් වෙලා ගිහිල්ලා ඉතාමත්ම දියුණු මට්ටමක ජීවත් වෙනවා. වතුකරය විනාශ වෙන්න එක හේතුවක් තමයි වතු ජනතාවට හොඳ වැටුපක් නැතිකම. මේ අයට ලැබෙන්නේ සොච්චම් වැටුපක්. තවත් කාරණයක් මේ අයගේ තියෙන වියදම් රටාව. උදාහරණ විදියට ගත්තොත් මේ අය තවමත් ඉන්නේ ලයින් කාමරවල. ලයින් කාමරවලින් එහාට ගිය අය ඉන්නේ ලයින් කාමර ඉස්සරහම හොඳ ගෙයක් හදාගෙන. හැබැයි ඒ ගෙදර පොල් පැලයක් මිරිස් ගහක් හදන්න බැහැ. පොඩි ඉඩක ජීවත් වෙන්නේ. එතකොට හැමදේම එයාලට සල්ලිවලට ගන්නවෙලා තියෙනවා. නාගරික මට්ටමක් තමයි අපට පෙන්නුම් කරන්නේ. මේ දේවල් එක්ක මේ වියදම් රටාව ගැටලුවක් වෙලා තියෙනවා.

අනිත් එක තමයි විශාල වශයෙන් මත්පැන්වලට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තියෙනවා වර්තමාන පරම්පරාව. මත්පැන් ව්‍යාපාරිකයාට පොතක් දාල තමයි මත්පැන් මිලදී ගන්නේ. එතකොට සම්පූර්ණ වැටුප දෙන්නෙ මත්පැන් ව්‍යාපාරිකයන්ට. මේක විශාල ප්‍රශ්නයක්. ගෙදර ජීවත්වෙන්න විදිහක් නෑ, ආහාර මිලදී ගන්න සල්ලි මදි, ළමයින්ට අධ්‍යාපනයට වියදම් කරන්න සල්ලි මදි, ගෙයක් දොරක් හදාගන්න කියල හිතන්නවත් බෑ. එතකොට මේ අය හැමදාම එකම තැන. සමහර තැන්වල සෞඛ්‍ය ගැටලු පැන නැගලා තියෙනවා. මේවා කාලයක් තිස්සේ එන ගැටළු. සමහර අයට ගෙවල් හදලා දුන්නත් මාස හය හතක් ඇතුළත ඒවා විකුණලා ආයේ ලයින් කාමරවලට එනවා. එහෙම තත්ත්වයක් තියෙන්නේ. ඒකට බලපාන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි මේ අයගේ අධ්‍යාපන මට්ටම. හොඳටම අධ්‍යාපනය ලබපු අය කොහොම හරි වත්තෙන් කැඩිලා එළියට යනවා. මැද පන්තියේ අධ්‍යාපන ලබන කට්ටිය කිරි කපන්න යන්නෙත් නෑ, තේ දළු නෙලන්න යන්නෙත් නෑ, මේ අය තමයි මේ ප්‍රදේශයේ කඩවල්වල වැඩ කටයුතු කරන්නේ. ඒ ආයතනවල වැඩ කරන්නේ ඉතාමත් සුළු වැටුපකට. ඒ අයගේ ආර්ථිකය වර්ධනය වෙන්නෙත් නැහැ. මේ අයට වෘත්තියකුත් නැහැ. 95%ක්ම කම්කරුවන් විදිහට තමයි ශ්‍රම බලකායට දායකත්වය ලබාදෙන්නේ. මේ වතුවලින් සේවය දෙන 95%ක්ම කම්කරුවන්, රබර් කිරි කපන්න දන්නවා, තේ දලු නෙළන්න දන්නවා.

මේ අතරින් දක්ෂතා නැති අය බලලා අපි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනි. මේ අයට වෘත්තිමය වශයෙන් ජීවත් වෙන්න පුළුවන් වැඩපිළිවෙළක්. හැම රජයකින්ම පර්චස් 6ගානේ බෙදුවත්, ව්‍යාපෘති ඇවිත් වැසිකිළි හැදුවත් එන්න එන්නම මේ ජනගහනය වැඩි වෙනවා. මේ අයගේ මේ ප්‍රශ්නය එතනමයි. ඒ නිසා මම හිතන්නේ මේකට එකම විසඳුම තමයි, මේ අයගේ අධ්‍යාපන මට්ටම වැඩි කරලා වෘත්තීයමය පැත්තෙන් වැඩපිළිවෙළක් හදන්න එක.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/0rjjlGfyw9E

https://www.aithiya.lk/solution-to-the-problem-of-the-plantation-community-is-to-provide-education/

# 43. අලි මිනිස් ගැටුම ඉර හඳ තියෙන තාක්කල් ම ඉවර වෙන්නෙ නෑ

## බලහරුවේ සිරිසුමන හිමි



බලහරුවේ සිරිසුමන හිමි

***හාමුදුරුවෝ දැන් දීර්ඝ කාලයක් තිස්සේ අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සටන් කරනවා. මේ පිළිබඳව ඔබ වහන්සේගේ අදහස කුමක්ද ?***

මෙම අලි මිනිස් ගැටුම නතර කිරීමට විසඳුමක් විදිහට ප්‍රථමයෙන් ම ගෙනාවේ අලි වෙඩිල්ල, ඒක අසාර්ථක වුණා. ඊට පස්සේ ගෙනාවා අඟල් කැපීම, එයත් අසාර්ථක වනවිට තමයි විදුලි වැට ගෙනාවේ. මේ වෙනකොට පේන්න තියෙන දේ තමයි ඒකත් අසාර්ථකයි කියන දේ. මේ ප්‍රශ්නය ඉර හඳ තියෙන තාක්කල් ම ඉවර වෙන්නෙ නෑ. ඒ කියන්නේ මිනිස්සු ඉන්න තාක්කල් අලියෝ ඉන්න තාක්කල් අලි මිනිස් ගැටුම දිගටම පවතිනවා.

මේකට හොඳම ක්‍රමයක් විදිහට මම යෝජනා කරන්නේ සියඹලා ගස් සිටුවීම. මේ ක්‍රමය නිසා පරිසරයටත් කිසිඳු හානියක් වෙන්නෙ නෑ. ඒ වගේම තමයි ගොවියටත් හොඳයි. අවුරුදු පහලවක් විතර යනකොට සියඹලා ගස් රූස්ස විදිහට වැඩෙනවා, ඒ නිසා මේවා විනාශ කරන්න අලීන්ට බැරි වෙනවා. ඒ වගේම තමයි ගොවියන්ට හොඳ නිෂ්පාදනයක් කරගන්නත් පුළුවන් වෙනවා. නමුත් මෙවැනි සාධනීය යෝජනා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි අලි වැට පස්සෙම තමයි තවමත් යන්නේ. අලියා කියන්නේ හරිම බුද්ධිමත් සතෙක්, ඔහුට විදුලි වැටක් කඩලා දානවා කියන එක ලොකු දෙයක් නෙවෙයි. අනික අපි විදුලි වැට ගැහුවට හරියට නඩත්තු කරන්නෙත් නැහැ. එනිසා

මේවගේ ජෛව වැටක් තමයි අපිට ගැළපෙන්නේ. ඊළඟට රිලවුන්ගෙන් දඬුලේනුන්ගෙන් මොනරුන්ගෙන් වල් ඌරන් ගෙන් ගොවියන්ට දැන් හොඳටම කරදරයි. ඊළඟට සේනා කියන දළඹුවා. මේ සේරම එක පෙළට ඇවිත් ගොවියා ඉන්නේ දැන් හතර ගාතෙන් වැටිලා.

අතීතයේ ඉඳලා බැලුවාම පේනවා අලි මිනිස් ගැටුමේ කිසිම අඩුවීමක් නම් නැහැ කියලා, සංඛ්‍යාලේඛන සමග මට මේවා පෙන්විය හැකියි. ඒ වගේම මේවට රජයේ ගන්න ක්‍රියා මාර්ගවලත් එදා ඉඳලා අද වෙනකම්ම කිසිදු වෙනසක් නෑ. දැන් මනුස්සයෙක් විසින් අලියා ඝාතනය කළොත් අලියා මිහිදන් කරන්න මුදල් පාස් වෙනවා. නමුත් අලියෙක් විසින් මනුස්සයෙක් ඝාතනය කළොත් මේ කිසිඳු දෙයක් නැහැ. ඒ වගේම තමයි දේපළ හානිවලට, වගා හානියට කිසිඳු දෙයක් ලැබෙන්නේ නෑ. වන්දියක් ලැබෙනවා නම් ඒදේ ලැබෙන්න හුඟාක් කාලයක් ගතවෙනවා. රාජ්‍ය පාලකයෝ මේ යාන්ත්‍රනයන් වෙනස්කරලා ගොවියාට සෙත සලසන්න කටයුතු කරලා නැහැ තවම. ඒ නිසා ගොවියාට තියෙන්නේ මාධ්‍ය ඉස්සරහට ඇවිත් හැමදාම අඬ අඬා ඉන්න. මේක හරිම අසාධාරණ තත්ත්වයක්. ගොවියෙක් කේන්තියට අලියෙක් වෙඩි තියලා මැරුවොත් පැයක් යනකොට මිනිහා කුදලන් යනවා. ඒකයි යතාර්ථය. දැන් මේ සත්තු ගම් වදින්නේ ඔවුන්ට කැලේ කන්න දෙයක් නැති කොට නෙවෙයි, ඔවුන් මේ කොමඩු ගෙඩියට බඩ ඉරිඟු කරල ට පුරුදු වෙලා ඉන්නේ. මේ සත්වයින්ට ආහාර නිෂ්පාදනය කරලා දෙන්න පුළුවන් නම් ඒකත් ලොකු දෙයක්, මොකද ඒ කරන්න බැරි දෙයක් නෙවෙයිනෙ. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය වගේම රට වටා තියෙන ආර්ථික මධ්‍යස්ථානවලින් දවසකට විශාල ප්‍රමාණයක් කසල වශයෙන් එළවළු පලතුරු විසික් කරනවා, ඉතින් මේවා සත්තුන්ට බෙදාහරින්න පුළුවන් .

***වර්තමාන ජනාධිපතිතුමාගේ මේ සම්බන්ධයෙන් පවතින ක්‍රියාකාරීත්වය ගැන ඔබවහන්සේ සෑහීමකට පත්වෙනවා ද?***

එතුමන් ක්‍රියා කරන්නේත් පරණ ජනාධිපතිවරු පරණ පාලකයෝ වගේම බව තමයි දැනට පේන්නේ. විදුලි වැට ගැසීම තමයි මේ හැමෝම දකින එකම විසඳුම. ඇත්තටම මේ විදුලි වැටෙන් කරන්න පුලුවන් මඟුලක් නැහැ. ඒක අසාර්ථකයි. ඒ වගේම තමයි වනජීවී

කාර්යාලවල මේවා නඩත්තුවට නිලධාරීන් හිඟයි. සම්පත් සීමිතයි. ඉතිං වැට ගැහුවට වැඩක් නැහැ මාසයක් යනකොට අලි, වැට කඩන් ගමට එනවා. වනජීවී දෙපාර්තමේන්තුව මේ සත්තුටික විදෙස් සංචාරකයින්ට පෙන්නලා දවසකට මිලියන විස්සක් පමණ ආදායමක් උපයනවා. මෙයින් කොටසක් විදුලි වැට නඩත්තුවට යොදවන්න බැරිද? ඒක එහෙම කළොත් විදුලි වැටෙන් යම් ප්‍රයෝජනයක් ගන්න පුලුවන් වෙයි. දැන් මම ජීවත්වෙන මොණරාගල දිස්ත්‍රික්කයේ බලහරුව කියන ගමේ ඊයෙත් අලියෙක් ගහලා පුද්ගලයෙක් මැරුණා. ඔන්න අද තමයි භූමදානය. මේවගේ මාසෙකට දෙන්නෙක් තුන්දෙනෙක් නම් මැරෙනවාම තමයි. ඉතිං කෝ විසඳුමක්. පේන තෙක් මානයක විසඳුමක් නැහැ. අපේ පාලකයන්ට විශේෂයෙන් කොළඹ මහත්වරුන්ට මේවා පේන්නේ නැහැ.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/QkxVGGs4cuI

https://www.aithiya.lk/human-elephant-conflict-in-sri-lanka-is-not-over-balaharuwe-sirisumana-thero/

# 44. අපි ලොකුවට උඩ දැම්මට පරම පවිත්‍ර මාර සිංහල තමයි අපි කියලා, ඒක එහෙම නැහැ

## නිශ්ශංක විජේමාන්න



නිශ්ශංක විජේමාන්න

*හඳ පළුව තනි තරුව කියන්නේ මගේ වේදනාව*

හඳ පළුව තනි තරුව කියන්නේ මගේ ට්‍රෝමා එක නැතිනම් මගේ වේදනාව. මගේ තුවාලය. මම ඉගන ගත්ත පස්සර සෙන්ට්‍රල්එක කියලා කියන්නේ බහු වාර්ගික සහ බහු ආගමික පසුබිමක් තිබුණ පාසලක්. සිංහල අය, ක්‍රිස්තියානි අය, දෙමළ අය, මුස්ලිම් අය ඔක්කෝම එකතුවුණ පන්තියක් මගේ පන්තිය. මේ පොත මම පුදන්නේ ඒ බහු වාර්ගික පන්තියට. කුඩා කාලයේදී අවුරුදු 12 හෝ 13දී අපිට ජනවාර්ගිකත්වයක් නැහැ. මේකා දෙමළ මේකා මුස්ලිම් එහෙම නැහැ. ගහ ගන්නකොට තෝ තම්බියා කියලා එහෙම බනිනවා. ඒක වෙනම දෙයක්. ඒ බනින්නේ අරූ කෝප කරන්න මිසක් වාර්ගික අදහසක් ඒක අස්සේ නැහැ. උෟත් බනිනවා සහා ගහනවා කියලා නමුත් හරිම මිත්‍රශීලීයි. මම හොඳ ෆුට්බෝල් ක්‍රීඩකයෙක්. එතකොට ගොඩාක් ෆුට් බෝල් ගැහුවේ මුස්ලිම් අය, අවුරුදු 16දී මම වෘත්තීය ෆුට් බෝල් ක්‍රීඩකයෙක් ඇත්තටම. පස්සර සෙන්ටර් එකේ ඉඳලා ගෝල්ඩන් ඊගල් ක්ලබ් එකට සෙල්ලම් කළා ඒ කාලේ. එතකොට ඒ අස්සේ එහෙම ප්‍රශ්න තිබුනේ නැහැ. නමුත් මහියංගනයට එනකොට එහෙම නැහැ. එතන තිබුණේ සිංහල සමාජයක්. මහියංගනයේ එක කුඩා නගරයක් තිබුණා පගරගම්මන කියලා, ඒක මුස්ලිම් ගමක්. එතනදී වුණත් එයාලා සහ අපි අතර එහෙම ලොකු වෙනසක් නැහැ. ඔවුන් පොඩි ශාරීරික අනන්‍යතාවයක් පෙන්නුවා. රැවුල දිගට වැව්වා. කුර්තා

ඇන්දා. නමුත් අපි දෙගොල්ලොම කුඹුරට බැස්සාම එකවගේ තමයි. ඒ අතරේ එකට බොනකන ඒවා, ආවාහ විවාහ සිද්ධ වුණා. ඒ අතරේ දී තමයි මේ ජාතිවාදය කියන එක ගොඩනැගෙන්නේ. 1974 අවුරුද්දේ ඔය කුඩා නගරයට සිංහල මිනිස්සු පහර දෙනවා. ඒ ගහන්නෙත් බලවතුන්ගේ උවමනාවට. බුදු පිළිමයක් වඩම්මගෙන යනකොට ගල් ගැහුවා කියලා තමයි ඒ වෙලාවේ මේ කුඩා නගරයට පහර දෙන්නේ. ඊට පස්සේ මුලු නගරයම කොල්ලකනවා. නමුත් ඒ වෙලාවේ සිංහල මිනිස්සු යම් කොටසක් මැදිහත් වෙලා ඒක සමාදාන කරනවා. හැබැයි එක දෙයක් වෙනවා මෙතනදී, ඒ මොකද්ද? මේ මුස්ලිම් ජන ප්‍රජාව අල්ලා දෙවියන්ට අමතරව
"අප්පුහාමි දෙවියෝ" කියලා ප්‍රාදේශීය සිංහල දෙවි කෙනෙකුත් අදහමින් සිටියා ඒවෙනකොට, මේ සිද්ධිය සමග ඔවුන් මේ කියන සිංහල දෙවියාව අතාරිනවා. ඉතාම අඩු ආයු කාලයකින් නැතිවෙන දේවතාවා තමයි අප්පුහාමි දෙයියෝ. මුස්ලිම්වරුන්ගේ හදවතේ හිටපු දේවතාවා ඔවුන්ගේ පිහිටට එන්නේ නැහැ. මේක ඇත්තටම ඛේදවාචකයක්. ඒක තමයි අපේ හදවතේ තුවාලය. ඒක තමයි මම "හඳ පළුව තනි තරුව" හරහා පෙන්වන්නේ.

*වැදි ජනතාව සහ වැදි උරුමය ගැන තමයි "කඳඅරණී" කියන අලුත්ම පොත, මේක විශාල පර්යේෂනයක ප්‍රතිපලයක් නේද?*

ඒක දිග කතාවක්, මම ඒක මෙහෙම පටන් ගන්නම්. මම සාමාන්‍ය පෙළ වෙනකම් පස්සර සෙන්ට්‍රල් ගිහිං, ඊට පස්සේ සයන්ස් කරන්න බණ්ඩාරවෙල සෙන්ට්‍රල් ගිහිං, ඊට පස්සේ විද්‍යා ගුරුවරයෙක් වශයෙන් ඉඳලා, ට්‍රේනින් කොලේජ් ගිහිං චිත්‍ර ගුරුවරයෙක් වෙනවනේ. චිත්‍ර ගුරුවරයෙක් වෙලා ඇවිත් බලනකොට ලංකාවේ සෞන්දර්ය විශ්ව විද්‍යාලය කියලා එකක් තිබෙනවා, ඒකට
මහියංගනයෙන් එකම ළමයෙක්වත් ගිහිං නැහැ, මම ගියෙත් නැහැ නේ. එතකොට උසස් පෙළ උගන්වලා, ළමයි සෞන්දර්ය විශ්ව විද්‍යාලයට යවන එක මගේ හීනය වෙනවා. මම එතනින් පටන් ගන්නවා. එහෙම පටන්ගෙන චිත්‍ර උගන්වන්න පටන්ගත්තාම මෙන්න සෞන්දර්ය විශ්ව විද්‍යාලයට ළමයි තේරෙනවා. ඒ විතරක් නෙවෙයි ඌව පළාතේ මහියංගනය කියලා කියන්නේ අභියෝගයක් බවට පත්වෙනවා. ඌව පළාතෙන් සෞන්දර්ය විශ්ව විද්‍යාලයට වැඩියෙන්ම

ළමයි යන්නේ මහියංගනයෙන් වෙනවා. ඒක අදටත් එහෙමයි. අපොස සාපෙ ගත්තොත් බෙස්ට් රිසාල්ට් මහියංගනය. 90%ක් පාස් වෙනවා. දැන් මම කලාපේ ගුරු උපදේශක. අපි එකතුවෙලා එතනට ගෙනල්ලා තියෙනවා. දැනුත් මම මේ නිවාඩු දවසක් වුණත් ගෙදර නිකං ඉන්න පුලුවන්කම තිබියදීත්, මේ යන්නේ ඉස්කෝලෙකට. මේනිසාම මට චිත්‍ර සඳහා ගෝලයෝ රාශියක් බිහිවෙනවා. මහියංගනයේ චිත්‍ර ගුරුවරු ගොඩාක් දෙනෙක් මගේ ගෝලයෝ. ඔහොම යනකොට දබානෙන් මතුවෙනවා චිත්‍ර කරන්න පුලුවන් දක්ෂ ගැහැනු ළමයෙක්. අපේ උවමනාව වෙන්නේ ඇය කොහොම හරි සෞන්දර්ය විශ්ව විද්‍යාලයට යවන්න. අපිට පේනවා ලාංකේය පරිසරය අස්සේ මේ ජනවර්ග යට ඉගනගැනීමේ බාධාවන් තිබෙනවා. ඉහළට යන්න සංස්කෘතික බාධාවක් තියෙනවා. ආර්ථික බාධාවන් තිබෙනවා. ඉතිං මේ පොතේ චරිතයට වගේම ඇත්ත චරිතයටත් ඒ බාධාවන් ආවා. තව දුරටත් ඉගනගෙන එයාට හොයාගන්න පුලුවන් අලුත් දේ ගැන මම සෑහෙන්න බලාපොරොත්තු සහගත වුණා. මම ඕස්ට්‍රේලියාවේ ඇබෝජියන්ස්ලාගේ ආර්ට්එක දැකලා තියෙනවා. මෙයාලටත් තිබෙනවා නේ ආර්ට් එකක්, ඒක කොහොමද දියුනු කරන්නේ ? එයාගේ ඇහින් කොහොමද ලෝකය දකින්නේ ? ඒක බලන්න මම ආසාවෙන් හිටියා. ඒක අහිමිවුණා. ඒ අහිමිවීම තමයි මේ පොත ලියන්න හේතුව.

රීසර්ච් එක කරන්න පටන් ගත්තාම මට පේන්න ගන්නවා ලාංකේය වැදි ජනතාව කියන්නෙම අරුම පුදුම ජන කණ්ඩායමක් කියන දේ. ඇත්තටම මේ ඉන්නේ කුමන නියැදියක් ද කියනඑක මට තාම හිතාග න්න බැහැ. ඒක ඒතරම් විචිත්‍රයි. මට මේ පර්යේෂනයේදී තේරුණ දෙයක් තමයි, පහළ ඌවම ගත්තාම ඉන්න ජනතාවගේ අති විශාල ප්‍රමාණයක් ඉන්නේ වැදි ගෝත්‍රයෙන් සිංහල ගෝත්‍රයට ආපු අය. මගේ අම්මා හේරත් මුදියන්සේලාගේ සුදු මැණිකා, හේරත් කියන්නේම වැදි සම්බවයක්. ඔවුන් නුවරඑළිය පැත්තෙ හිටපු වැදි ගෝත්‍රයක අයිතිකාරයෝ. මේක මට කිව්වේ සීයා. අපේ අම්මා කතන්දර සාගරයක් දැනගෙන හිටියා. සුද්දන්ට ගහපු ඒවා, ඒ වැදි ගෝත්‍රයේ නායකයෝ සුද්දෝ එක්ක කරපු අරගලය ගැන කතා ගොඩක් එයා මට කියලා තියෙනවා. එයා ඒවා නිකං ඔහේ කියපු දේවල්, පස්සේ තමයි මම දන්නේ එයා සිංහල වුණාට වැදි ජන සම්බවයකින් තමයි එන්නේ කියලා. මේ හැමතැනම ඉන්නේ සිංහල වුණ වැදි වාංශිකයන් තමයි,

නැත්තං නමුනුකුලෙන් මෙහාට හිටපු විශාල වැදි වාංශික ජනතාවට මොකද වුණේ?

***වෙල්ලස්සේ සටන් ඉතිහාසය අස්සේ වැද්දාට නිසි තැන ලැබුනේ නැහැ කිව්වොත්..***

සෝකජනක ලෙස වෙල්ලස්ස සටන් ඉතිහාසයෙන් වැද්දාව අයින් කරනවා. නමුත් මේ ඉතිහාසයේ 1848 මාතලේ කැරැල්ලේදී පවා ප්‍රබලම කාර්ය කළේ වැද්දෝ. හේරත් වැද්දා මාතලේ එක කඳවුරක්ම මුරකළා. දහනක, ගුවන් කුමාරයා, ඕපල්ගම කුමාරයා, ඔවුන් ප්‍රාදේශීය පරිපාලනයේ හිටියේ, එතකොට ඔවුන්ට සිංහලයටන්ට වඩා මේ ප්‍රශ්නය දැනුනා. 1818ත් එහෙමයි 1848ත් එහෙමයි. පොත් පත්වල නැතිවුණාට වඩා නැඟීසිටියේ ඔවුන්. දානිගල මහා බණ්ඩාර හත්සීයක් සෙනඟ අරං යනවා මේ සටනට. සිංහල අයට වඩා වැදි බටයෝ ඉදලා තියෙනවා 1818 කැරැල්ලේ. ඔවුන් සිංහල අය එක්කම කැරැල්ලෙන් පස්සේ වෙල්ලස්ස ගිනි තියනකොට පැනලා ඇවිත් කන්දේගම, අලුකැටියාව, කඳුබැද්ද, වේවත්ත, වගේ වතුර තියෙන කැලෑ මැද සුද්ද කරගෙන ජනපද හදාගත්තා. අදටත් ඔවුන් ඒ තැන්වලම ඉන්නවා. අනික ඔවුන් ඒකාලේ ප්‍රභූ මට්ටමකින් හිටියා. සිංහල ගොවි සංස්කෘතියට හුරුවෙලා හිටියා ගම්වැද්දෝ විදිහට, කිවුලේගෙදර මොහොට්ටාල කියන වැදි නායකයා ගත්තොත් ඔහුට විශාල ගෙයක් තිබුණා, විශාල සේනාවක් හිටියා. ප්‍රභූත්වයෙන් තමයි හිටියේ. බූටාවේ රටේ රාළ කියන වැදි වාංශිකයාත් එහෙමයි. ඒ නිසා අපි ලොකුවට උඩ දැම්මට පරම පවිත්‍ර මාර සිංහල තමයි අපි කියලා, ඒක එහෙම නැහැ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/_xHXN943VDg

https://www.aithiya.lk/literate-nissanka-wijemanna-literary/

# 45. කෝවිඩ් නිසා අසරණ වුණෝ තුන්වෙනි පන්තියේ මිනිස්සු

## කේ. පී සෝමලතා
## (සභාපති, ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය)

*ගැමි කෘෂිකාර්මික ගැහැණියගේ වර්තමානය*


කේ. පී සෝමලතා

අපි ග්‍රාමීය කෘෂිකාර්මික කාන්තාවන් විදිහට 2020 අවුරුද්දේ මාර්තු මාසයේ සිට කෝවිඩ් ප්‍රශ්නය සමඟ ගැටලු රාශියකට මුහුණ දුන්නා. අපෙන් බහුතරයක් එදිනෙදා කුලී වැඩ කරල එදාවේල හම්බකරන් කන කාන්තාවන් සිටිනවා, ඒ වගේම වගා කරන, අත් වැඩ කරන ගෙදර සිට වෙළෙඳාම් කර ජීවත්වෙන්න සල්ලි හොයන කාන්තාවන් සිටිනවා, ඉතින් මේ ගොවි ප්‍රශ්නය නිසා මේ සියලු දෙනා විශාල ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටිනවා. අපප මේ පවුල්වල විස්තර සොයා බැලුවම බොහෝ පවුල්වල දරුවන් හයදෙනා සිටිනවා, ඒ වගේම සමහර පවුල්වල ස්වාමිපුරුෂයා නැහැ කාන්තාවන් දරුවන් සමඟ තනිව දිවි ගෙවන්නේ, එම නිසා මෙම වසංගත තත්වයන් සමග මේ පවුල් විශාල ආහාරපාන හිඟයකට ද මුහුණ දීලා සිටිනවා. ඒ විතරක් නෙමේ වසංගත තත්වයන් සමග පාසල් වසා දැමීමෙන් සියලුම දරුවන් ඔන්ලයින් අධ්‍යාපනය ක්‍රමය වෙත යොමු වී තිබෙනවා, නමුත් මෙම පවුල්වල දරුවන්ට එසේ ඔන්ලයින් අධ්‍යාපනයක් හැදෑරීමට අවශ්‍ය පහසුකම් නොමැති නිසා ඔවුන්ගේ අධ්‍යාපනය ද කඩා වැටී තිබෙනවා.

අප රටේ කිසිම කෙනෙකුගේ අවධානය ග්‍රාමීය කෘෂිකාර්මික ගැහැනියට යොමු වන්නේ නෑ. වාණිජ බෝග වගාකරන මහා ලොකු කර්මාන්ත කරන අය නොවේ, ග්‍රාමීය කෘෂිකාර්මික ගැහැණියක් ඔවුන් ඉතා පිරිසිදුවට කුඩාවට කාබනික ක්‍රමයට එළවළු පළතුරු වගා කරලා වෙළඳපොළට යවන අය, ඉතින් මේ තත්ත්වය ඔස්සේ ඔවුන්ගේ ආර්ථිකයේ විශාල කඩා වැටීමකට ලක්වෙලා තියෙනවා. එපමණක් නෙවෙයි ඔවුන්ගේ වගාවන්වල අස්වැන්න මේ වෙද්දි වෙළඳපොළට යවාගන්න බැරුව ප්‍රවාහන පහසුකම් නැතිව ඒවා ගබඩා කරලා තියෙනවා. මේවා නිරපරාදෙ කුණු වෙලා යනවා, මේ රටේ පවතින තත්ත්වයත් සමග අඩුම තරමේ අසල්වැසියන් සමග වත් ඔවුන්ගේ අස්වැන්න හුවමාරු කරගන්න බැරිවෙලා තිබෙනවා. ඉතින් විශාල එළවළු පලතුරු අතිරික්තයක් නාස්ති වෙනවා.

### *ජීවන වියදම*

සතොස බඩුවල මිල ගණන් ගැන කතා කිරීමේදී මාධ්‍ය ඉදිරියේ පවසන ආකාරයට කිසිඳු ද්‍රව්‍යයක මිල අඩුවීමක් නැහැ. මේවා සියල්ල මාධ්‍ය සංදර්ශන පමණයි. ප්‍රායෝගික ලෙස ගත්තහම සතොස ඇතුලේ තියෙන බඩුවල මිල අහස උසට තිබෙන්නේ. මේවා නාගරික වශයෙන් බැලූ කල තේරුම් යන්නේ නෑ. සහල්වලට පොල්වලට පාලන මිලක් දැම්මට මොකද්ද වෙලා තියෙන්නේ? සහල් මිල එන්න එන්නම දරන්න බැරි මට්ටමට ඉහළ යමින් තිබෙනවා. මේ සියලු දේවල් මුලින්ම දැනෙන්නේ ගෙදර ගැහැණියට. ගෙදරට බඩු ගේන්නේ ඇය. ආහාර පාන සෑදීමේ ඉඳලා ගෘහ පාලනය කරන්නේ ඇය. ඉතිං මේ වර්තමාන තත්ත්වය එක්ක ඇය විශාල මානසික ගැටලුවක සහ දුෂ්කරතාවයක ඉන්නවා

### *කොවිඩ් අර්බුදය සහ අස්වනු අලවිය*

පහුගිය කාලේ අපි අපේ ගොවීන්ගෙන් එකතුකරපු රටකජු අස්වැන්න සෑහෙන්න කාලයක් ගබඩා කරගෙන හිටියා. ඇත්තටම රටකජු ඇට දුඹුරුපාටට හැරුණා. රජයට නිසි වැඩපිළිවෙළක් තිබුණා නම් මේ අස්වනු විනාශ වෙලා යන්නේ නැහැ. ඒ වගේම පසුගිය කාලයේ වට්ටක්කා කොමඩු වගේ දේවල් මිලදී ගත්තේ රජයේ නෙවෙයි විවිධ

කර්මාන්ත කරන ව්‍යාපාරිකයෝ, රජයේ වැඩපිළිවෙලක් තුළින් මේවා මිලදී ගත්තේ නැහැ. ඔවුන් කරන්නේ ඔවුන්ට පක්ෂපාතී වාණිජ අංශයෙන් කර්මාන්ත කරන අයගේ නිෂ්පාදන මිලදී ගන්න එක. මෙන්න මේ දේවල් නිසා විශාල ප්‍රශ්න රාශියක් ඇතිවෙලා තිබෙනවා.

මේ ග්‍රාමීය පවුල්වල ජනතාවගේ දරුවන් කෑම ඉල්ලන්න යන්නේ අම්මා ළඟට, අම්මට ආහාර ගෙනල්ලා දෙන්නේ තාත්තා, ඉතින් අම්මා තාත්ත ළඟට ගිහිල්ලා ආහාර ද්‍රව්‍ය ගැන කතා කිරීමේ දී තාත්තට මේවා ගෙනල්ලා දෙන්න මුදල් නෑ. ඊට පස්සේ මේ තුළින් පවුල් ආරවුල් ඇති වෙනවා. ගෘහස්ථ හිංසනය වැඩි වෙනවා. ඒ වගේම මන්දපෝෂණ තත්ත්වයන් පවා ඇති වෙනවා. සමහර වෙලාවට දෙමාපියන්ගේ මේ ආරවුල් නිසා දරුවන්ට බොහෝ වෙලාවට පියාව එපා වෙනවා. කොළඹ සමාජයට මේවා බරපතළ විදිහට නොපෙනෙන්න පුලුවන් ඒත් වාටියේ ගොවි පවුල්වල වර්තමානය ජීවිතය ඒක. ඔවුන් විශාල ප්‍රශ්න රැසක් එක්ක තමයි හැමදාම ජීවත් වුණේ. කොවිඩ් ආවාට පස්සේ ඔවුන් කබලෙන් ළිපටම වැටුණා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**


https://youtu.be/hkFuXjvqjiM

https://www.aithiya.lk/the-marginalized-women-of-sri-lanka-had-to-face-a-severe-covid-epidemic/

# 46. දේශපාලනික බලපෑම් ලංකාවේ සංස්කෘතිකමය අංගයක් වෙලා

## විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරී අයුබ් ඛාන්

***ඇයි අපට බැරි වදහිංසාවෙන් තොර පොලීසියක් පවත්වාගෙන යන්න?***



විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරී අයුබ් ඛාන්

මේකට ප්‍රධාන වශයෙන් කාරණා තුනක් බලපානවා. ඒකේ පළවෙනි කාරණාව විදිහට මම දකිනවා කෲර වදහිංසාව පැමිණි වීම, එහි නෛතික තත්වය, එය පැමිණ වීමෙන් ඇතිවන ඵලවිපාක ගැන පොලිස් නිලධාරීන් හරියට දැනුවත් නැහැ. මං දන්න අන්දමට යම් මට්ටමක දැනුමක් පොලිස් විද්‍යාලයේ දී ලබා දෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව දැනුම ලබාදුන්නත්, විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 ඉඳන් 15 දක්වා ඒ කොටසේ තියෙන මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ වැදගත්කම පිළිබඳව හරි අවබෝධයක් බොහෝ පොලිස් නිලධාරීන්ට නැහැ. ඒ නැති නිසා බොහෝ වෙලාවට ඔවුන් මේ කෲර වදහිංසාවන් කිරීමට පෙලඹෙනවා. ඔවුන් ඒක ගණන් ගන්නේ නැහැ. දෙවැනි කාරණා විදිහට මම දකින්නේ බොහෝ වෙලාවට පොලිස් දෙපාර්තමේන්තුව තුළ රාජකාරිය හරියට කරන්න ඕනෑ ඉක්මනින් කරන්න ඕනෑ කියන බලපෑම ඇති කරනවා. පොලිස් නිලධාරීන්ට විශේෂයෙන්ම උසස් නිලධාරීන් විසින්. ඒක වරදකට නෙමෙයි. උදාහරණයක් වශයෙන් මිනීමැරුමක් වුණත් සතියෙන් සතිය ඉක්මනින්ම ඒ තියෙන තත්ත්වය වාර්තා කරන්න ඕනෑ ඉහළට. ඒ ගැන උසස් නිලධාරීන් පහළ නිලධාරීන්ට විශේෂයෙන්ම ඕඅයිසීට බලපෑම් කරන්නේ කෝ ඒ මර්ඩර් එක, ඇකියුස්ට්ලට මොකද වුණේ? කියලා.

මේක හොඳ දෙයක් වුණාට, ඒදෙන පීඩනය හේතු කොටගෙන නිලධාරිනුත් කල්පනා කරනවා මේක ඉක්මනට කරන්න. ඒ වැඩි උනන්දුව නිසා ඔවුන් ඉක්මනින්ම තොරතුරු ගන්න පෙළඹෙනවා. ඉක්මනින් තොරතුරු ගැනීමේ එක ක්‍රමයක් විදිහට ඔවුන් දකින්නේ විමර්ශනයේ තිබෙන ස්වභාවයට වැඩිය යම්කිසි පීඩනයක්, යම්කිසි පහරදීමක්, ඒ වගේ දෙයක් තුළින් ඒ තොරතුරු ලබාගන්න.

ඊළඟ කාරණය විදිහට මම දකින්නේ සමහර අවස්ථාවන්වලදී දේශපාලන මැදිහත්වීම් ඇතිවෙනවා පොලීසියට. පොලීසියට දේශපාලන මැදිහත්වීම් ආවහම සිදුවෙන්නේ සැකකරුවෙක් අත්අඩංගුවට ගත්තහම ඒ සැකකරුවාට විරුද්ධ දේශපාලන පාර්ශවයේ කෙනෙක් ඉන්නවා නම් බලපෑමක් කළ හැකි, ඔහු බලපෑමක් කරනවා පොලීසියට මේ සැකකරුවාට මේ විදිහට පහර දෙන්න, මේ විදියට අඩත්තේට්ටම් කරන්න කියලා. පොඩ්ඩක් රිදවන්න කියලා. ඒ වගේ දේවලුත් වෙනවා. ඔය කාරණා තුන තමයි මම පැහැදිලිව දකින්නේ පොලිස් වදහිංසාවන් ඇතිවීමට ප්‍රධාන හේතු විදිහට.

***වර්තමාන තත්වය එක්ක එහෙම සැකකරුවෙක් ගෙන් තොරතුරු ලබා ගැනීමට හිංසනය කියනඑක පාවිච්චි කරන්නම අවශ්‍ය ද?***

පැහැදිලිවම හිංසනය කියනඑක පාවිච්චි කරන්න අවශ්‍ය නැහැ. එහෙම අවශ්‍යතාවයක් ඇති වෙලා තියෙනවා නම් ඒක සම්පූර්ණයෙන්ම මිථ්‍යාවක්. මොකද හරියට විමර්ශනය කරනවා නම් හිංසනයක් අවශ්‍ය වෙන්නේ නැහැ. විමර්ශන ඔස්සේ ඉවසීමෙන්, සමහරවිට යම් කාලයක් ගත වෙන්න පුළුවන් සාක්ෂි හොයන්න. නමුත් ඒ විමර්ශන කටයුතු කරන්නා තමා නිදහසේ කල්පනාකාරීව ඒ කටයුතු කරනවා නම් අපට ඇත්තටම හිංසනය සිද්ධ කරන්න අවශ්‍ය නැහැ. දැන් ලංකාවේ හිංසනය කිරීම පිළිබඳව වාර්තා වුණාට, බොහෝ රටවල්වල කිසිඳු බලපෑමක් අඩු තරමින් වචනෙකින්වත් බලපෑමක් ඇති නොකර සාක්ෂි හොයා ගැනීම ලස්සනට කරනවා. විමර්ශනයකදී අපට වැදගත්ම දේ තමයි සාක්ෂි. මේ සාක්ෂි හොයා ගැනීම කෙනෙකුට අඩත්තේට්ටම් කරලා, ප්‍රශ්නයක් ඇති නොකර හොයාගන්න තරමට තමයි ඒ විමර්ශනය කරන අයගේ වැදගත්කම තියෙන්නේ. විවිධ සාක්ෂි වර්ග තියෙනවා. ඒ සාක්ෂි හොයාගැනීම තමයි පොලිස් නිලධාරියෙක් කළ

යුත්තේ. ඒක තමයි මං අර මුලින් කිව්වෙත්. විමර්ශන පිළිබඳව හරි දැනුමකින් පොලිස් නිලධාරියෙක් වැඩ කටයුතු කරනවා නම් ඔවුන්ට හිංසනය සිද්ධ කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

***විශ්‍රාමික පොලිස් නිලධාරියෙක් විදිහට පොලිසියට දේශපාලනික බලපෑම් එල්ලවීම සම්බන්ධයෙන් මොකක්ද අදහස?***

දේශපාලනික බලපෑම් ලංකාවේ සංස්කෘතිකමය අංගයක් වෙලා. එක රජයක් පත්වුණාම ඊට කලින් රජයේ හිටපු අයට යම් යම් ප්‍රශ්න සිද්ධ වෙද්දී, මේ රජයේ අය ඒකට බලපෑම් ඇති කරනවා. මේ රජය නැතුව වෙන රජයක් පත්වුණාම මේ රජයේ කවුරුහරි පොලීසියට සම්බන්ධ වෙලා යම් විදිහකට අහුවුනාම ඔවුන් බලපෑම් ඇති කරනවා. ආයතනයක් තුළ නොදැකිය යුතු දෙයක් මේක. නමුත් මේක දේශපාලනික වශයෙන් කරනවා. ඒ වගේ සංස්කෘතියක් ඉබේම ලංකාවේ ඇති වෙලා තියෙනවා.

***පහුගිය කාලේ දක්ෂ විදියට විමර්ශනය කරපු පොලිස් නිලධාරියෙක් තමයි ශානි අබේසේකර. මේ නිළධාරියා අලුත් ආණ්ඩුව යටතේ සිරගත කරනවා. සමාජය පිළිගන්නවා ඔහු කරපු විමර්ශනවල ප්‍රතිඵලයක් විදිහට තමයි ඔහුව මේ විදිහට සිරගත කරලා තියෙන්නෙ කියලා. මෙවැනි ක්‍රියා හරහා පොලිස් නිලධාරීන්ට යම් බලපෑමක් සිද්ධවෙනවා නේද, දේශපාලනඥයන් සම්බන්ධව විමර්ශන කරන්න එපා කියලා?***

පැහැදිලිවම ඔව්. හොඳින් විමර්ශන කරන දක්ෂ නිලධාරියෙකුට එවැනි තත්වයක් උද්ගත වුණාම අනිත් අයට වැඩ කිරීම පිළිබඳව ඇතිවෙනවා උදාසීනකමක්. භයක්. නිර්භීතව තමන්ගේ රාජකාරිය කරන්න බැරි වෙනවා. ඉතින් ඒ බලපෑම එතරම් යහපත් නැහැ.

***පොලිස් හිංසනය ඉහළ යනඑකට හේතුවක් තමයි පොලිස් නිලධාරීන් තමන්ගේ රාජකාරිය පිළිබඳව අසතුටෙන් කටයුතු කිරීම. රාජකාරි ස්වභාවය නිසා, නැත්නම් ඒ රාජකාරිය ඇතුළෙ ගොඩනගපු නීති පද්ධතිය නිසා, නැත්තං දේශපාලන සැලකිලි නිසා, නැත්නම් යම්***

***යම් ආණ්ඩු ඒ කාලවලදී ගත්ත ප්‍රතිපත්ති තීන්දු තීරණ නිසා පොලිස් නිලධාරීන්ට තියෙන මේ පීඩනය ඔවුන් පිට කරන්නේ සැකකරුවන් මතින් කියලා කතාවක් තිබෙනවා මේ ගැන ඔබතුමා හිතන්නේ මොකක්ද?***

ඒ තර්කයේ යම්කිසි ඇත්තක් තියෙනවා. සාමාන්‍යයෙන් කෙනෙක් රාජකාරි කරද්දී මානසිකව තමන් හොඳ තත්ත්වෙ ඉන්න ඕනෑ රාජකාරි කරන්න. පෞද්ගලිකව තමන්ගේ ජීවිතේ තියන පීඩන එක්ක රාජකාරි කරද්දි යම් යම් බලපෑම් ඇත්තටම ඇති වෙනවා. ඒ කතන්දරේ හරි. ඒකට කාරණා ගොඩක් තියෙනවා. විශේෂයෙන්ම සුභසාධනය පැත්තෙන් පොලීසියේ යම් ගැටලු ඇති නිලධාරීන්ට. එතකොට වැටුප් පිළිබඳ ප්‍රශ්න ඇති. දැන් හොඳ වැටුපක් ලැබෙනවා ඇති කියලා මම හිතනවා. නමුත් දැන් තියෙන ආර්ථිකයත් එක්ක ප්‍රශ්නත් ඇති. අනිත් එක පහසුකම් සම්බන්ධයෙනුත් ගැටලු තියෙනවා. උදාහරණයක් වශයෙන් පොලිස් නිලධාරියෙකුට බැරකයට ගිහිල්ලා ප්‍රමාණවත් නින්දක් අරගෙන ආවොත් තමයි හොඳ මානසිකත්වයෙන් වැඩ කරන්න පුළුවන් වෙන්නේ. එක්කෝ නිදා ගන්න විදිහක් නෑ පහසුකම් මදි. සමහරවිට රාජකාරි බහුලවීම හේතු කොටගෙන නිදාග න්නට නොලැබෙනවා වෙන්නටත් පුළුවන්. මොනදේ උනත් නින්ද අඩුවීම හේතුකොටගෙන හොඳ විදිහට තමන්ගේ රාජකාරි කරන්නට හම්බෙන්නෙ නැහැ.

***සමහර රටවල පොලිස් නිලධාරීන් ගත්තහම ඔවුන් හරි ප්‍රසන්නයි. මිනිස්සුත් එක්ක ගනුදෙනු කරන විදියත් හරි ප්‍රසන්නයි. එයාලා සමහර වෙලාවට අපිත් එක්ක සම මට්ටමට ඇවිත් තමයි ගනුදෙනු කරන්නේ. අපේ පොලිස් නිලධාරීන් ගත්තහම ඔවුන් විශාල උද්දච්චකමක්, මමත්වයක් නඩත්තු කරනවා. ඒකත් ප්‍රශ්නයක් නේද ජනතාවට සමීප වෙන්න?***

ඔව් පැහැදිලිවම මම ඒකට එකඟ වෙනවා. මං කලින් කිව්වා වගේ මේක අපට සංස්කෘතිකමය වෙලා තියෙන ප්‍රශ්නයක් ද කියලා මට හිතාගන්න බැහැ. මොකද මේ ලංකාවෙ පොලිස් නිලධාරීන් තුළ තියෙනවා එහෙම මානසිකත්වයක්. බොහෝදුරට ඒ මානසිකත්වය

තිබීම හේතුකොටගෙන ඔවුන් කටයුතු කරන්න වෙනත් ආකාරයකට. ඔවුන් කල්පනා කරන්නේ නැහැ මම මේ පොලිසියේ ඉඳලා විශ්‍රාම ගන්නවා, එහෙම විශ්‍රාම ගියාට පස්සේ මට ඇතිවෙන තත්ත්වය මොකක්ද? එහෙම මුකුත් හිතන්නේ නැහැ. පොලිස් නිල ඇඳුම දාගත්තහම තමන් තරම් චණ්ඩියෙක් නැහැ, තමන්ට තරම් බලය තියෙන කෙනෙක් නැහැ, තමන් එතකොට පීඩා කරන්න පටන් ගන්නවා ජනතාවට. මම හිතන්නේ මේක මේ අපේ සංස්කෘතියට සම්බන්ධ වෙලා ඇවිත් තියෙන ප්‍රශ්නයක්.

### *ඒක වෙනස් කරන්න මොකද්ද පොලිස් දෙපාර්තමේන්තුවට කරන්න පුළුවන්?*

ඒක වෙනස් කිරීමට ප්‍රධාන වශයෙන් පොලිස් නිලධාරියාගේ මානසික තත්ත්වය යහපත් කරන්න ඕනෑ. ඒකට කරන ප්‍රධානම කාරණා විදිහට මම දකින්නේ ඔවුන්ට ජීවත්වීමට සරිලන වැටුපක් ලබා දීම. සංසන්දනාත්මකව ගත්තහම විදේශ රටක පොලිස් නිලධාරීන් බොහොම හොඳට ඉන්නවා. විශේෂයෙන්ම ස්වීඩනය වගේ රටවල්වල බොහොම වැදගත් විදියට ඉන්නවා. ඇත්තටම එහෙම වෙලා තියෙන්නේ මොකද පොලිස් නිලධාරීන්ට හොඳ ඉහළම වැටුප් ලබාදෙනවා. ඉහළ වැටුප් ලබා දුන්නම ඔවුන්ට දූෂිත විදිහට හම්බ කරන්න උවමනා වෙන්නේ නැහැ. අනිත්එක ගන්න වැටුපට වැඩ කිරීමට ලොකු උවමනාවක් ඇති වෙනවා. එතකොට මනස සතුටින් තමන්ගේ වැඩ කරන්න පෙලඹෙනවා. ඒත් එක්කම විශේෂයෙන් ඒ වගේ දියුණු රටවල්වල පොලිස් නිලධාරීන්ට සුභසාධනය ද, ඔවුන්ගේ මානසික තත්වය යහපත් කිරීම සඳහා කෙරෙන්න ඕනෑ අනෙකුත් සියලුම කටයුතුද හොඳට සිද්ධ කෙරෙනවා. එතකොට තමන් සතුටෙන් නම් තමන්ගේ රාජකාරි හරි සතුටෙන් කෙරෙනවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/mYxQt-Vg-Pw

https://www.aithiya.lk/some-uniformed-police-officers-are-violent/

# 47. වතුකරයේ ජනතාවට තියෙන්නේ වෙන නීතියක්

## කන්මනී සිවනේෂන් - බදුල්ල ප්‍රාදේශීය සභා මන්ත්‍රී


කන්මනී සිවනේෂන්

***පසුගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ උතුරු නැගෙනහිර තරුණයන් රැසක් පොලිස් අත්අඩංගුවට පත්වුණේ ඔවුන් නැවත එල්ටීටීඊ සංවිධානයට පණ දෙන්නට උත්සාහ කරනවා කියන චෝදනාව සමග. මේ සිද්ධිය වෙලා ටිකක් කල් ගියත් ඒ ගැන ප්‍රමානවත් සංවාදයක් දකුණේ නොතිබුණ නිසා අපි මේ කතාව, මෙතනින් පටන් ගම්මු..***

ඇත්ත වශයෙන්ම කියනවා නම් නොවැම්බර් 6වෙනිදා සිට තිස් වෙනිදා දක්වා කාර්තිකේ දීබම් කියන උත්සවය සමරනවා. ඒක උතුරේ ජනතාවට විතරක් අයිතිවුණ දෙයක් නෙවෙයි. මුළු ලෝකෙම ඉන්න හින්දු ආගමික කටයුතු කරන සියලුම දෙනාට අයිතිවුණ දිනයක්. ඒක අපේ ඓතිහාසික උත්සවයක්. එතකොට ඒක අපි කරනවට විරුද්ධව මේ අත්අඩංගුවට ගන්නවා කියනඑක පිළිගන්නට බැහැ. ඊටත් අමතරව උතුරේ ඉන්න ළමයා අහිමි වුණ අම්මා කෙනෙකුට, මහත්තයා අහිමිවුණ නෝනා කෙනෙකුට, ඒ වගේම නෝනා අහිමි වුණ මහතෙකුට, මේ වගේ තමන්ගේ පවුලේ කෙනෙක් නැති වුණාට පස්සේ අනිවාර්යයෙන්ම අපි අවුරුද්දකට සැරයක් ඔවුන් වෙනුවෙන් පහනක් පත්තු කරලා ඔවුන්ව සිහිකරන එක අපේ සංස්කෘතියේ තියෙන දෙයක්. මේකේ මානව හිමිකම් පැත්ත බැලුවහම පහනක් පත්තු කිරීම දේශපාලනයක් කරලා ඒක තුළින් කොටි සංවිධානයේ ඉස්මතු වෙනවා කියන අදහස මේ රටට දීලා සමරපු අය අත්අඩංගුවට ගත්ත එක වැරදියි. ඒ වගේම මීට අදාළ පුවත් වෙබ් අඩවි තුළින් ෂෙයාර් කරපු

අයව, අත්අඩංගුවට ගත්ත එක, ඉතාමත් දරුණු ලෙස මානව හිමිකම් කඩ කරපු ක්‍රියාදාමයක් හැටියටයි මම දකින්න.

***දැන් ලොකු ප්‍රශ්නයක් නිර්මානය කරලා තියෙනවා ආදාහනය කරනවාද? භූමිදානය කරනවාද කියලා. මේ ගැන ඔබේ අදහස දැනග න්න කැමතියි***

ඇත්ත වශයෙන්ම කියනවා නම් ලංකාවේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මානව හිමිකම් පැත්තෙනුත් අපට මනුස්සයෙක් මිය ගියාට පස්සේ එයාව භූමිදානය කිරීමේ වැඩපිළිවෙළ ගැන කියලා තියෙනවා. ඒ අයිතිය අපට තියෙනවා. අපි කැමතිනම් අපේ සමීපතමයා භූමිදානය කරන්න, ඒක අපට පුළුවන්. ඒ වගේම මට අවශ්‍ය නම් එයාව ආදාහනය කරන්න, ඒකත් පුළුවන්. හැබැයි අද වෙනකොට ඒ අයිතිය ප්‍රශ්නාර්ථයක්.

ආණ්ඩුවේ ඉන්න මැති ඇමතිවරු තමන්ගේ පවුලේ පාලනය තුළ ගන්නා ලද සියලුම තීන්දු තීරණ ජනතාව බේදකරමින් තිබෙන්නේ. මේ තුළින් ඔවුන් බලාපොරොත්තු වෙන්නේ රටතුළ නැවත ජාතිවාදය අවුස්සලා තමන්ගේ ආණ්ඩුව ස්ථාවර කරගැනීම.සිංහල ජනතාව අතර තමන්ගේ ජනප්‍රියතාවය රඳවා ගැනීම.

එහෙම නැත්තං ආණ්ඩු බලය ගන්නඕන කියන පිරිස සතුටු කරලා තමන්ගේ වටේ හැමදාම තියාගන්න තමයි මේ වැඩේ ඔවුන් කරන්නේ. හැබැයි අපි දැක්කා 2015 සිට 2018, 2019 දක්වා මෙවැනි ප්‍රශ්න ලංකාව තුළ තිබුණේ නැහැ. සියලුම ජනතාවට සියලුම අයිතිය දීලා තිබ්බා. හැබැයි ඒ අයිතිය අද වෙනකොට නැතිවෙලා තියෙනවා. හැමදාම මනුස්සයාට තියන අයිතිය තුරන් වෙනකොට තමයි ඒ මිනිහා තවත් පැත්තකින් ඒ අයිතිය ලබා ගන්න උත්සාහ ගන්නේ. ඒ තත්ත්වය ඇතිවෙන්න පුළුවන්. ඒ භයානක තත්ත්වය අද වෙනකොට ලංකාව තුළ තියෙනවා. බෞද්ධ රට කියන මේරට තුළ බෞද්ධ චින්තනය හරි විදියට ක්‍රියාත්මක කළා නම් මෙවැනි දේවල් ඔවුන් කරන්නේ නැහැ කියන එක තමා මගේ මතය. ඒ වගේම මානව හිමිකම් පැත්තෙන් අපි ඉතාමත්ම කනගාටුවට පත් වෙනවා. මේ රට තුළ ඉපදිච්ච දරුවාගේ සිට මරණ ඇඳේ ඉන්න මිනිහා දක්වාම මානව හිමිකම් කියන එක කඩ කරන්නේ නැතුව තිබුනොත් විතරයි රටක් ගොඩනගන්න පුළුවන්.

***වතුකරය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විදිහට මම කැමතියි දැනගන්න වතුකරයේ මානව හිමිකම් තත්ත්වය***

ඇත්ත වශයෙන්ම කියනවා නම් වතුකරයේ ජනතාව මානව හිමිකම් කියන වචනයවත් දන්නැති තත්ත්වයක් තමයි තියෙන්නේ. මොකද මානව හිමිකම් ඒ ගොල්ලො බලාපොරොත්තු වෙන්න ඕනි කාගෙ න්ද? ඒ වතු හාම්පුතාගෙන්. වතු හාම්පුතුන් ළඟට ගිහිල්ලා මානව හිමිකම් සම්බන්ධයෙන් කතා කරන්න බැහැ. මොකද මුළු රටේම ජනතාවට එක නීතියයි, වතුකරයේ ජනතාවට වෙන නීතියක් තමයි තියෙන්නේ. එතකොට වතුකරයේ හාම්පුතුන් ඉස්සරහට ගිහිල්ලා මානව හිමිකම් සම්බන්ධයෙන් කතා කරන්න බැහැ. ඔවුන්ට ලැබෙන පඩියද, ජීවත්වෙන ජීවන ක්‍රමය ද, ඔවුන්ගේ නිවාස සංකීර්ණ ද, ඔවුන්ගේ ටොයිලට් පවා ඒ අයට අහිමි වෙලා තියනවා. එනිසා මේ සියලුම දේ කොටුකරලා තියෙනවා 1991 සමාගම් හා වෘත්තිය සමිති එකතු කරල හාම්පුතුන් හදාගත්ත ගිවිසුම තුළින්. සියලුම මානව හිමිකම් වහලා තියෙන්නේ. හැබැයි අද වෙනකොට රයිට් ටු ලයිෆ් ආයතනය, ඒ වගේම ඌව ශක්ති පදනම වගේ ආයතන වතුකරයේ ජනතාවට යම්කිසි මට්ටමකින් හරි මානව හිමිකම් කඩවීම සම්බන්ධව බුද්ධිය දීලා තියෙනවා. ඒ නිසා අද යම්කිසි මට්ටමකින් මානව හිමිකම් කොතැනකහරි කඩවීමක් සිද්ධ වුණහම අපේ ජනතාව මේ ආයතන දෙකට පිවිසෙන තත්ත්වයක් උදාවෙලා තියෙන බව මම දකිනවා. ඒක හොඳ දෙයක්

***මානව හිමිකම් ඇරුණු කොටගෙන නීතියේ ආධිපත්‍යය, නීතිය සැමට සාධාරණව ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් වතුකරය ආශ්‍රිතව ඇතිවෙලා තියෙන තත්ත්වය ගැන කතා කළොත්..***

වතුකරයේ ජනතාවට ජීවත්වීමට ගෙයක් හදාගන්නට තවමත් ඉඩමක් ලබාදීලා නැහැ. ඒ වගේම තමන් ජීවත් වෙන ප්‍රදේශය තුළ වැසිකිලියක් හදා ගැනීමට වත් අඩි 4, 5 ක පළල ඉඩමක්වත් අයිතිකරලා දීලා නැහැ. එවැනි තත්ත්වය තුළ පානීය ජල ප්‍රශ්න, නිදහස් අධ්‍යාපනය තුළ සම්පත් ලබා ගැනීම වගේ අයිතීන් මේ ජනතාවගෙන් උදුරගෙන තියෙන්නේ. මේක කරලා තියෙන්නෙත් එක්තරා පැත්තකින් දේශපාලඥයන්. එක්තරා පැත්තකින් ආණ්ඩු බලයේ ඉන්න අය.

මේදෙක සම්බන්ධ කරල මේ මිනිස්සුන්ට මේ දේවල් අරන් දෙන්න ඕනේ කියලා හිතෙනකොට හාම්පුත්තුලා මේකට මැදිහත් වෙලා මේ සියලුම අයිතිවාසිකම් කඩාකප්පල් කරලා තියෙනවා. උදාහරණයක් වශයෙන් කියනවා නම් වැසිකිලියක් හදන්න අපි ප්‍රතිපාදනයක් කොහෙන් හරි ගෙනල්ල දුන්නත් හාම්පුතුන්, වතු මහත්වරු ඒ වැසිකිලි හදා ගැනීම සඳහා ඉඩමක් වෙන්කරල දෙන්නෙ නැහැ. එනිසා මෙවැනි දේවල් දිගින් දිගට සිද්ධවෙලා තියනවා වතුකරය තුළ. ඒ නිසා අදටත් ඒගොල්ලෝ අසරණ තත්ත්වයෙන් තමා ඉන්නේ. ලංකාවේ ඉන්න අනෙක් ජනතාවට වගේ මේ මිනිස්සුන්ට ජීවත්වීමේ අයිතිය දීලා නෑ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/bVTwOUEl-tU

https://www.aithiya.lk/plantation-people-have-another-law-kanmani-sivanation/

# 48. මේ රටේ යම් ගැහැණියක් ඉතාම නරක විදිහට අපහාසයට ලක්වුණා නම්, ඒ ගැහැණිය මම තමයි

## සන්ධ්‍යා එක්නැළිගොඩ



සන්ධ්‍යා එක්නැළිගොඩ

*2010 ජනවාරි 24 වෙනිදා කියලා කියන්නේ ප්‍රගීත් එක්නැළිගොඩ කියන මාධ්‍යවේදියා, සමාජ ක්‍රියාකාරිකයා පැහැරගෙන ගොස් අතුරුදන් කරලා දාපු දවස. ඒ කියන්නේ මේ අවුරුද්දේ ජනවාරි 24 වැනිදාට ප්‍රගීත්ගේ ජීවත්වීමේ අයිතිය පැහැරගෙන අවුරුදු 11ක් වෙනවා. පසුගිය යහපාලන අවධියේ ප්‍රගීත්ට මොකද්ද වුණේ කියනදේ සොයාග ැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ෂනයක් කළා. එම විමර්ෂනයට අදාළව ප්‍රගීත්ට මොකද්ද වුණේ? කියන ගැටලුවට, එම උභතෝකෝටිකයට පිළිතුරු ලැබුණා. එහෙත් තවමත් ප්‍රගීත් එක්නැළිගොඩ කියන පුරවැසියාට යුක්තිය ඉටුවෙයි කියන එක පෙනෙන තෙක්මානයකවත් නැහැ. ප්‍රගීත් අතුරුදන් කරලා අවුරුදු 11ක් වුණත් ප්‍රගීත් නාමය ජීවග්‍රහයෙන් මේ සමාජය මත පවත්වාගෙන යන්නට ඇය තවමත් ශක්තිමත්..! ඇය තවමත් ප්‍රගීත් වෙනුවෙන් සටනේ සිටින්නී.. ප්‍රගීත් අතුරුදන් කරලා අවුරුදු 11ක් ගතවෙන්න ඔන්න මෙන්න තියලා මම ඇය මුණ ගැහුණා. ඇය ප්‍රගීත්ගේ ප්‍රිය බිරිඳ සන්ධ්‍යා එක්නැළිගොඩ.*

***මුලින්ම අපි ප්‍රගීත් ගැන මතකයෙන් මේ සාකච්ඡාව පටන් ගනිමු..***

2010 ජනවාරි 24 ප්‍රගීත් අපෙන් උදුරා ගන්නවා. ඔහුව පැහැරගෙන ගිහිල්ලා ඔහුගේ සිරුරත් අතුරුදහන් කරවනවා. හැම දෙනාම දන්නවා ප්‍රගීත් අතුරුදන් කරවන්නේ දේශපාලන පසුබිමක් මත. 2010

ජනාධිපතිවරණයට දවස් දෙකකට පෙර. අපි පැහැදිලිවම දැනගෙන හිටියා මෙය පසුපස තියෙන්නේ දේශපාලන හස්තයක් කියනදේ. මොකද ඒ වෙනකොට ප්‍රගීත්ට පෞද්ගලික හතුරෝ හිටියේ නැහැ. මම දැනගෙන හිටියා මේ පිළිබඳ සත්‍යය හෝ යුක්තිය හොයාගෙන යනගමන ඉතාම දිර්ඝ එකක් කියලා. මොකද ලංකාවේ ඉතිහාසය බැලුවොත් මේ හැම සිදුවීමක් තුළම තියෙන අත්දැකීම තමයි අපරාධකරුවන්ට දණ්ඩ මුක්තිය ලබා දීම. එය තමා මේ රටේ ප්‍රධානම කාර්යය. මොකද දේශපාලකයින්ට අපරාධකාරයන්ගේ සහාය අවශ්‍යයි. එය ලබා ගන්න නම් දණ්ඩ මුක්තිය ලබා දිය යුතුම වෙනවා. ඒ නිසා තමයි මගෙ අරගලය ඉතාමත් දුෂ්කර වුණේ. බොහෝ දෙනෙක් දන්නවා මම ඒ ගමන තුළ කොතරම් අපහස වින්ඳ ද කියලා. මේ රටේ යම් ගැහැණියක් ඉතාම නරක විදිහට අපහාසයට ලක්වුණා නම්, ඒ ගැහැණිය මම තමයි.

*ඔබ හිතන විදියට මේ අරගලය තුළින් ඔබේ අරමුණ ඉටු වුණාද ?*

මේ අරගලය තුලින් මම බලාපොරොත්තු වෙච්ච දේ නම් 100% ඉටුවුණේ නැහැ. හැබැයි අපි 2015න් පස්සේ සිද්ධ වෙච්ච දේවල් පිළිබඳ යථාර්ථවාදීව බැලිය යුතු වෙනවා. ඒක තමා මගේ කියවීම. ඒ තුළ නඩුවක් ගොනු වීම වෙනකන් ආපු ගමන ප්‍රමාණවත් කියන එකයි මගේ හැඟීම. ප්‍රමාණවත් කියන්නේ මොකද ඒකෙදි අපරාධකරුවන්ට දඬුවම් දීම සිද්ධවේවි කියන ඉලක්කය තිබුනත්, අපි දැනගත යුතු වෙනවා මේ අපරාධ වලට සම්බන්ධ කරගෙන තියෙන පුද්ගලයින් මේ රටේ දේශපාලනඥයින්ට අවශ්‍ය පුද්ගලයින්. ඒ දේශපාලන බලපෑම් මත අපිට ලැබුණු දෙය තමයි මේ. මම කැමතියි මේ අපරාධකරුවන්ට දඬුවම් දීලා නඩුව අවසන් කරන තැන දක්වා ගියා නම්. ඒක තමා ඉලක්කය වුණේ.

නමුත් විශේෂයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, නීතිපති දෙපාර්තමේන්තුවට මේ ගමන යන්න සිද්ධවුණේ බලපෑම් එක්ක. ඊළඟට හමුදාව කියන සාධකය, මේවා එක්ක තමයි මේ පරීක්ෂණ ඉස්සරහට ගියේ. මේ අපරාධවලට සම්බන්ධ පුද්ගලයන් අත්අඩංගුවට ගත්තට පස්සේ එවකට හිටපු ජනාධිපතිවරයා ප්‍රසිද්ධියේ කියනවා මේ අපරාධවලට සම්බන්ධ රණවිරුවන් සිරගත කරගෙන ඉන්නවා කියලා. රටේ නීතියට පිටින් මිනිහෙක් පැහැරගෙන ගිහිල්ලා මරලා එයාගෙ සිරුරත් අතුරුදහන් කරපු පුද්ගලයෙක් කොහොමද රණවිරුවෙක්

වෙන්නේ? සමහර විට ඔබට කියන්න පුළුවන් මේ අයට කවුරුහරි දීපු නියෝගයක් තමා මේ කළේ කියලා. නමුත් මම පැහැදිලිවම දන්නවා ඕනෑම පුද්ගලයකුට ඉහළින් එන නියෝග එම පුද්ගලයා ක්‍රියාත්මක කරන්නේ අර ඉහළ පුද්ගලයාගේ බලය තමන්ට ආරෝපණය කරගෙන. එතකොට ඒ පුද්ගලයින් කිසිසේත්ම අහිංසකයින් නෙමෙයි. ඒ නිසා තමයි මේ සියලුම අපරාධ කරපු පුද්ගලයින්ට දඬුවම් ලැබිය යුතුයි කියන තැන මම ඉන්නෙ.

මට හිතෙනවා ප්‍රගීත් ගේ අතුරුදන් වීම පිළිබඳ පරීක්ෂණ තවත් ඉස්සරහට යන්න තිබුණා කියලා. නමුත් හමුදාවේ බලපෑම මත සහ ඔවුන් තොරතුරු සැඟවීම මත මෙම පරීක්ෂණ යම් ආකාරයකට අඩාල වෙනවා. ඒක තමයි ශ්‍රී ලංකාවේ තියෙන විමර්ශනවල ස්වභාවය. යුද හමුදාව කියන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කියන්නේ මේ රටේ රාජ්‍ය ආයතන. ඉතින් අපරාධයක් සොයා ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරනකොට යුද හමුදාව මේ අපරාධ විමර්ශනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙන්නේ නැහැ. අසත්‍ය තොරතුරු දෙනවා. අසත්‍ය තොරතුරු අධිකරණයට ඉදිරිපත් කරනවා. මෙහෙම දේවල් කොහොමද යුද හමුදාවක් කරන්නෙ? මොකද රටක අපරාධයක් සිදුවුණාම ඒ අපරාධය පිළිබඳ සොයනකොට ආණ්ඩුවේම අනික් යාන්ත්‍රණය ඒකට සහාය දෙන්නෙ නැහැ. ඉතින් කොහොමද මේ රටේ පුරවැසියෙකුට යුක්තිය ඉෂ්ට වෙන්නේ?

***මේ වනවිට මේ සම්බන්ධයෙන් නඩුවක් ගොනු වෙලා තියෙනවා අධිකරණයේ. අනිත් පැත්තෙන් මේ අපරාධ පිළිබඳව විමර්ශනය කරපු නිලධාරීන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා.***

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර මහත්මයා සහ අනෙක් නිලධාරීන්ට උරුම වෙලා තියෙන තත්ත්වය ගැන ඉතා ලොකු කම්පනයක මම ඉන්නේ. මොකද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විදිහට ඒ අය යුනිෆෝම් එක ගන්නෙ මේ රටේ අපරාධ හොයන්න. අපරාධ කරන පුද්ගලයා තරාතිරම නොබලා හොයා ගැනීමයි මේ රටේ පුරවැසියන් වෙනුවෙන් ඔවුන්ට තියෙන වගකීම. ඒ වගකීම ඉෂ්ට කිරීම හේතුවෙන් ඒ නිලධාරීන්ට හිරගෙදර තපින්න වෙනවා නම්, ඒක මේ රටේ ඛේදවාචකය.

***අපි පහුගිය කාලේ දැක්කා මේ වගේම හේතු මත අරගල කරපු කාන්තාවෝ. හැබැයි ඒ බොහෝ දෙනෙක් අරගල කළේ තමන්ට ඇබැද්දියක් වුණාම විතරයි. නමුත් ඔබ ලංකාව පුරාම (විශේෂයෙන් අතුරුදහන් වූ පිරිස් සම්බන්ධයෙන්) තිබුණ අරගලවල සක්‍රීය චරිතයක් වුණා. මොකක්ද මේකට හේතුව?***

මම හිතන්නේ මගේ අරගලය අර්ථවත් වෙන්නේ මම පොදු අරගලයෙත් කොටස්කාරයෙක් වුණොත් විතරයි. අනෙක මට ලැබෙන අවස්ථාවක් මම පොදු අරගලයකට කැප නොකළොත් මම ආත්මාර්ථකාමී ගැහැනියක් වෙනවා. මට ඒ තැනට වැටෙන්න ඕනේ නැහැ. උතුර ද දකුණ ද සිංහල ද දෙමළ ද මුස්ලිම් ද මිනිස්සු අතුරුදහන් වෙච්ච අයට දැනෙන දුක වේදනාව එකයි. මේ හැම කෙනෙක්ගේම ගලායන ලේ එක පාටයි. කඳුළු එකයි. ඉතිං එහෙම නම් මට කොතනහරි මොහොතක් ලැබෙනවා නම් ඒ මොහොත මගේ සැමියා විතරක් නෙවෙයි පොදු අරගලය වෙනුවෙන් මම භාවිතා කරන්න පැකිලෙන්නේ නැහැ.

***එළඹෙන 24 වෙනදාට ප්‍රගීත් අතුරුදහන් වෙලා වසර 11 ක් පිරෙනවා. මේ වෙද්දි අපි නැවත වතාවක් වටයක් කැරකිලා හිටපු තැනටම ඇවිදින් නේද?***

අපි වටයක් කැරකිලා නැවතත් හිටපු තැනටම ආව කියලා ඔයා කිව්වා. මම හිතන්නේ අපි 2010 හිටියට වඩා ඉතාම නරක තැනකට තමයි අද ඇවිල්ල තියෙන්නේ. මොකද 2010දී මේ රටේ විශාල වශයෙන් මිනිසුන් අතුරුදහන් වුණා. මරාදැම්මා. දූෂණ-වංචා සිදුවුණා. මේ සියලු දේවල් තිබ්බත් මහින්ද රාජපක්ෂ දේශපාලනඥයෙක්. දේශපාලනය දන්න නායකයෙක්. අනිත් කාරණාව ඒකාලේ මේ රටේ යම් තරමකට ස්වාධීන ආයතන තිබ්බා. ඒ තියෙන පොඩිඉඩ හරි පාවිච්චි කරලා තමන් ස්වාධීනව කටයුතු කරන්න ඕනෑ කියලා හිතන මිනිසුන් හිටියා. ඉතින් ඒ අයට කිසියම් වූ ශක්තියක් තිබ්බා එකට ගොනුවෙලා වැඩකරන්න. අද අපි පත්වෙලා තියෙන තත්ත්වය ඉතාම බිහිසුණු තත්ත්වයක්, මොකද බිහිසුණු කියන්නේ මේ රටේ නායකයා වෙලා ඉන්නේ දේශපාලනය නොදන්න කෙනෙක්.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**


https://youtu.be/a-XL3BeKv8M

https://www.aithiya.lk/sandya-eknelygoda-human-rights-in-sri-lanka/

# 49. කලාකරුවෝ කියන්නේ රම්පේ කරපිංචා

## රංගන ශිල්පී දිලිප් රෝහන

***ඔබ කලාකරුවෙක් වගේම දේශපාලනයේත් සක්‍රීය චරිතයක්...***


රංගන ශිල්පී දිලිප් රෝහන

මම කලාවට සම්බන්ධ වෙන්නේ 1976 වර්ෂයේ ඒ කාලවකවානුවේ සිටම මම දේශපාලනය සමග සිටියා. 1977 තමයි මම ගුරුවරයෙක් වෙන්නේ. 1976 තමයි මම, ප්‍රාදේශීය වශයෙන් හොඳම නාට්‍ය වෙච්චි "ඉවක් බවක් නැති ලොවක්" නාට්‍යයෙන් නාට්‍යකාරයෙක් වෙන්නේ. එතකොට මගේ ගුරු ජීවිතයයි නාට්‍ය ජීවිතයයි අතර අවුරුද්දක පරතරයක් තමයි තියෙන්නේ. 1977 සිටම මම සමසමාජ පක්ෂය එක්ක සම්බන්ධවෙලා හිටියා. එන් එම් පෙරේරලා එක්ක දේශපාලනයේ නිරත වුණා. එතැන් සිට සිදුවුණ දේශපාලන විපර්යාස එක්ක මම දේශපාලනයේ රැඳී සිටියා. කොළඹ ආවට පස්සෙ මම පරාක්‍රමලා එක්ක සම්බන්ධ වෙන්නේ වීදී නාට්‍යකාරයෙක් විදිහට, ඒ ගැලීලියෝ නාට්‍ය එක්ක. ඒ කාලේ අපිට ආධාර ලබා දුන්නේ සෝවියට් සංගමයෙන්. එවක මම සමසමාජ පක්ෂයේ බදුල්ලේ ක්‍රියාදරයෙක් වගේම ඇත්ත පත්තරේ වාර්තාකරුවෙක්. එනිසා මමයි දේශපාලනයයි කියන්නේ දෙකක් නෙවෙයි එකක්. ඒනිසාම මම දන්නවා මොන ආණ්ඩුව ආවත් කලාකරුවන්ව හෝද හෝදා මඩේ දානවා කියලා ඡන්ද කාලයේ දී. ඒ නිසා දැන් පවතිනදේ කියන්නේ අලුත් දෙයක් නෙවෙයි මට. මේක තමයි හැමදාම වුණේ. කලාකාරයෝ කඩේ යනවා, ඊළඟට ඔහේ බලාපොරොත්තු සිඳගෙන පැත්තකට වෙලා ඉන්නවා.

***කලාකරුවන් මහළු වුණහම රජය ඔවුන්ව බලාගන්න ඕනෙ කියලා අදහසක් ලංකාවේ තිබෙනවා, කිසිඳු ආදායමක් නැතුව ඔවුන් පාරට වැටෙන ස්වරූපයක් තමයි තියෙන්නේ...***

ඒ කතාව අහද්දි නම් මට හිනා යනවා. මේක තණකොළ පෙත්තගෙ කතාව වගේ. මොකද පායන කාලෙට හොඳට සින්දු කියකිය ඉඳලා අර කුඹියෝ කියනවනේ වැස්ස කාලෙට කෑම රැස් කරගන්න කියලා, අවසානයේදී වැස්ස කාලෙයේ යන්න තැනක් නැතුව කන්න දෙයක් නැතුව ඉන්නවා තණකොල පෙත්තා. මමත් දැන් වයසට ගිහිල්ලා අවුරුදු 62ක් වෙනවා. මම මට තියන කාලේ ඉතුරු කරගත්තා. ඔය මහළු වුණහම කියන කතාව හුඟක් කියන්නේ ජනප්‍රිය අය, ඒ අය ජනප්‍රිය වෙන්න හුඟක් දේවල් කරත් තමන්ට කියලා දේවල් කරගන්නේ නෑ. ඒ නිසා තමන් දැනගන්න ඕනෙ තමන්ව බලාගන්න. තමන්ගේ අනාගතය හදාගන්න. තමන්ට හම්බෙන දේ කළමනාකරණය කරගන්න. හැබැයි ආණ්ඩුවට කඩේ ගිහින් තමන්ට තැනක් නැති වෙලා අවසානයේ කෑ ගහනඑක ඒගොල්ලොන්ගේ පෞද්ගලික දෙයක්. සමස්තයක් විදිහට මටනම් කියන්න තියෙන්නේ ආණ්ඩුව මේකට වග කියන්න ඕනෙනෑ කියලා.

***ලංකාවේ වේදිකා නාට්‍යකරුවන්ට විශාල දුක්ගැනවිලි ටිකක් තියෙනවා දශක ගණනාවක ඉඳලා. නාට්‍ය පාසලක් නෑ, කොළඹ එද්දී නවාතැන් පහසුකම් නෑ, ජෝන් ද සිල්වා තවම හදලා ඉවරණෑ, ඔයවගේ.***

මං හිතන්නේ කලාකාරයෝ කියන්නේ කරපිංචා වගේ, හොද්ද රස කරන්න කරපිංචා රම්පේ දැම්මට කද්දී මොන ගෙදර වුණත්, රජගෙ දර වුණත්, හිඟන්නගේ ගෙදර වුණත්, ඒක අයින් කරලානෙ කන්නේ, ඉතින් ඒ වගේ තමයි දේශපාලනය කරනකෙනාට කලාකාරයාව ඕනේ වෙන්නේ ඡන්දටික හොයාගන්න විතරයි. ඊට පස්සේ වැඩක් නෑ. ආයෙ අවුරුදු 5කින් තමයි ඕනෑ වෙන්නේ. ඒ ඕනෑ වෙනකොට කලාකාරයෝ ගන්නනම් ප්‍රශ්නත් තියෙන්න එපැයි. ඉතිං ලංකාවේ කලාකාරයන්ගේ ප්‍රශ්න සඳාකාලිකයි.

## *ඇත්තටම කලාකරුවන්ට ප්‍රශ්න නැද්ද?*

පසුගිය කාලයේ නිර්මාණය කරපු ඓතිහාසික චිත්‍රපට වලින් කරේ එක් චරිතයක් ප්‍රබල කරලා පෙන්වපු එක. ඒ වගේම ඒවා ජාතිවාදී නිර්මාණ, ඒවා සාමාන්‍ය මිනිස්සු ඉල්ලපු ඒවා නෙවෙයි. මේ චිත්‍රපට තුළින් එක් ජාතියක් පමනක් ඉස්මතු කරලා පෙන්නනවා. මේ සියල්ල කරලා තියෙන්නේ දේශපාලන චරිත උලුප්පන්න. අපි මිනිස්සු දැනුවත් කරන නාට්‍ය කරගෙන ගියා. එතනදී අපට රඟහලක් තියනවද නැද්ද කියන ප්‍රශ්නය අදාළ වුණේ නැහැ. ඒ වගේම පරාක්‍රම නිරිඇල්ල, H.A. පෙරේරා ප්‍රමුඛ ජනකරළිය අරගෙන ගමට රඟහලක් යන තේමාව යටතේ අවුරුදු 17ක් මේක කරගෙන ගියා. ඊට පස්සේ ඒකටත් ජෝන් ද සිල්වා එක හදලා නෑ වේදිකා නෑ කිය කිය අඬන අය තමයි විරුද්ධ වුණේ. කලාකරුවන් මැසිවිලි නගන එක අඬන එක, ඒකත් කලාවේම කොටසක්ද මන් දන්නේ නෑ, තමන් දෙයක් කරනවා ඇරෙන්න අනෙක් අයගේ ඒවට විරුද්ධ වෙන්න හොද නෑ. ඒ වගේම සමාජය ගැන කතා කරන බර්ටෝල්ට් බ්‍රෙශ්ට්ගේ නාට්‍ය වැනි වර්ගවාදය පිටු දකින චිත්‍රපට බිහිවුනොත් ඒවා දේශපාලන ඇම්බැට්ටයන් යොදාගෙන නවත්තනවා. මේ සියල්ලත් කලාකරුවන් විසින්මයි කරන්නේ.

කලාව අස්සේ තිබෙන ප්‍රධාන ප්‍රශ්න ගැන කතා කරොත් ප්‍රශ්න නම් ගොඩක් තියනවා. පලවෙනි එක කලාකාරයොන්ගේ එකමුතුවක් නැතිඑක, දැන් හිතමු චිත්‍රපටයක් ගත්තහම ඒකෙ ප්‍රධාන චරිතෙට එක තරුණයෙක් පමණයි ඉන්න පුලුවන්, ඒක දහ දෙනෙකුට කරන්න බෑ, අවසානයේ මේ චරිතෙ ඇතුලෙම තරගයක් ඇතිවෙනවා, ඒ තරගය මුදල් බලය මත පදනම් වෙනවා. එනම් සල්ලි ජනප්‍රියත්වය උකහා ගන්න ඕන නිසා එකිනෙකා අභිබවා යන්න තමයි හැමෝටම ඕනෙ. ඉතින් ප්‍රශ්නයක් නෑ කියලා කියන්න බෑ. මේ එකමුතුවක් නැතිකම කුලල් කා ගැනීම වඩාත් වාසිදායක වෙන්නේ දේශපාලකයාටම තමයි. ඒක කලාකරුවොත් හොදින්ම දන්නවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/DjaBk_m__8A

https://www.aithiya.lk/future-of-the-artist-in-sri-lanka-dilip-rohana/

# 50. අද මාධ්‍යවේදීන් ඇමතිතුමාගේ සපත්තු පොලිෂ් කරනවා

## ප්‍රාදේශීය මාධ්‍යවේදී ජනූර් කිච්ලාන්



ජනූර් කිච්ලාන්

***ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට තියෙන ප්‍රශ්න ගැන අපි මුලින්ම කතාකරමු..***

ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හැටියට මුළු ලංකාවේම ඉන්න ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මාධ්‍ය ආයතනය සමග ගනුදෙනු කරන ආකාරය දැක්කහම හරිම දුක්ඛිතයි. ශෝකජනකයි. විශේෂයෙන් වරප්‍රසාද වරදාන සන්තෝශම්වලට යටවෙලා හැමදේම. තෝරාගත් එක කොටසකගේ ප්‍රවෘත්ති පළ කරනවා. අනිත් කොටස යවපුවහම ඒ අයගේ අඩුපාඩු කියනවා, අඩුපාඩු හොයනව ඒවා පළ කරන්නේ නැහැ. ඒ සම්බන්ධව කර්තෘ මණ්ඩලයට, කර්තෘවරුන්ට, කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂවරුන් දැනුවත් කළොත් ඊට පස්සේ ඒ මාධ්‍යවේදියාට ආයේ කවදාවත් ඒ ආයතනයේ ප්‍රවෘත්ති පළ කරගන්න බැහැ. ඒක තමයි මේ ප්‍රාදේශීය මාධ්‍යවේදියාගේ අද ඇත්ත තත්ත්වය. විශේෂයෙන්ම කොවිඩ් වසංගත තත්ත්වයත් එක්ක ගොඩක් මාධ්‍ය ආයතන පිටු අඩුකරල සේවකයෝ අඩුකරල මාධ්‍යවේදීන්ගේ තොරතුරු ගන්න එකපවා අඩුකරල තියෙනවා. ඉන්න පිරිසෙන් ප්‍රවෘත්ති ආවරණය කරනවා. ඒකත් එක්ක දැඩි අපහසුතාවයට පත්වෙලා තියනවා ප්‍රාදේශීය මාධ්‍යවේදීන්.

***ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය අයිතිවාසිකම් නැහැ කියලා කතා කරනවා. ඒ ගැන ඔබගේ අදහස.***

ලංකාවේ ඉන්න කිසිම ප්‍රාදේශීය මාධ්‍යවේදියකුට අයිතිවාසිකම් ලැබිලා තියෙනවා කියලා කියන්න බෑ. 1948 නිදහස ලැබිල මේ සමරන්නේ 73

වෙනි නිදහස. ඒත් කිසිම ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකුට කිසිම අයිතියක් ලැබිලා නැහැ. කිසිම කෙනෙකුට ආයතනයේ සේවකයකු කියලා මේ වෙනකන් පත්වීම් ලිපියක් දීලා නැහැ. එතනින්ම අපි අවලංගු කාසියක් වෙලා. මම අවුරුදු විසි පහකට වැඩිය ප්‍රාදේශීය මාධ්‍යවේදියෙක් හැටියට කටයුතු කරනවා, අනෙක් සියලු ආයතනවල කම්කරුවෙක් හැටියට වැඩකලත් අර්ථසාධකය ඇතුළු දීමනා තිබෙනවා. විශේෂයෙන් මාධ්‍යවේදීන් කියන්නේ රටේ හතරවෙනි ආණ්ඩුව, රටේ නැති කතන්දර සම්පූර්ණයෙන්ම බොරු. ප්‍රාදේශීය මාධ්‍යවේදීන් කියන්නේ අද පේමන්ට් එකට වැටිච්ච අවලංගු කාසි. කිසිම දේකට හිමිකමක් නැති කණ්ඩායමක්. මේ තියෙන ආර්ථික ප්‍රශ්නත් එක්ක අඩුම අපිට ණයක් ගන්න බැහැ. බැංකුවට ගියාම ඉල්ලනවා වැටුප් විස්තරයක්. පඩි පතක් දෙන්නේ නැහැ ආයතනවලින්. ඔබ කෑලි ගානට ප්‍රවෘත්ති ලියන නිදහස් මාධ්‍යවේදියෙක් කියලා කියනවා. ඉතිං පඩි වාර්තාවක් නැහැ. බඳවා ගත්තා කියලා ලිපියක් නැහැ. මේක මම මාධ්‍යවේදියෙක් හැටියට කිව්වට ආයතනවලට කඩේයන අල්ලස් දීලා ප්‍රවෘත්ති දාගන්න එකෙක් කටක් හොලවන්නේ නැහැ. ඕක තමයි ඇත්ත තත්ත්වය.

***ප්‍රාදේශීය මාධ්‍යවේදීන් එවන නිවුස් හෝ ඡායාරූප කොළඹ ඉන්න මාධ්‍ය ආයතනවල කට්ටිය තමන්ගේ නමින් යවනවා කියලා චෝදනාවක් තියෙනවා. ඒ වගේ අවස්ථා තියනවද?***

තියෙනවා අනිවාර්යෙන්ම. කොළඹ ඉන්න කට්ටියට දුරකථන පහසුකම් ඔක්කොම නොමිලේ ආයතනයෙන් ලබා දීලා තියෙනවා. එතකොට මේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දුක්විඳලා, බෑග් මල්ලක් අරගෙන ගිහින්, කන්නත් නැතුව මොනවා හරි කරලා තොරතුරු ටිකක් හොයා ගෙන ෆැක්ස් එකක් ගහලා, ඊමේල් එකක් ගහලා දැම්මම ඒ ආයතනවල ඉන්න මාධ්‍යවේදියෝ මොකද කරන්නේ, ඔවුන් කරන්නේ අදාල දිස්ත්‍රික්කය, අදාළ පළාතේ ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා, එහෙම නැත්තං එස් එස් පී මහත්තයා, එහෙම නැත්නම් පොලීසියේ ඉහළ නිලධාරියෙකුට කතා කරලා විස්තර ටිකක් අරගෙන මේ මොනවත් දැකපු නැති පුද්ගලයෝ අපේ ප්‍රවෘත්තිවල මුලින් නම දාගන්නව. මෙහෙම නම් කිහිපයක් තියෙනකොට මුලින් තියෙන නමකට දෙකකට විතරයි ගෙවන්නේ. ඉතුරු නම් තිබ්බට සතපහක් ගෙවන්නේ නැහැ. ඒක බලලා අපට සතුටු වෙන්න පුළුවන් ප්‍රවෘත්තියේ නම තිබ්බා

කියලා. ඒ ඇරෙන්න සාක්කුවට ලැබෙන සෙතක් නැහැ. විශේෂයෙන් ඊට පස්සේ ඒ වගේ සිදුවීම් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වාර්තා කරපුවහම හා රූපවාහිනී නාලිකා වල දැක්ක ගමන් තමන් දැක්කා වගේ ලියනවා. ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නම් පස්සට දාලා ඒ අයගේ නම් ඉස්සරහට දාලා ප්‍රවෘත්ති මංකොල්ලකෑමක් මේ සෑම මාධ්‍ය ආයතනයක්ම සිද්ධ වෙනවා.

***හිඟ වැටුප් ප්‍රශ්නය ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා නේද?***

විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය නාලිකා කිහිපයක්ම අපේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට වසර ගණනාවකින් සතපහක් වත් ගෙවලා නැහැ. ගෙවපු නැති රූපවාහිනී නාලිකා ආයතන තියෙනවා. ඒ වගේම මුද්‍රිතත් එහෙමයි. අවුරුදු දෙක තුන ගෙවලා නැහැ. ඒ වුණාට රටේ වෙන තොරතුරු, දේශපාලනඥයන්ව පුම්බන්න මේ අහිංසක මිනිසුන්ගේ තොරතුරු පාවිච්චි කරනවා. එහෙම පාවිච්චි කරාට ඔවුනට මුදල් ගෙවන්නේ නැහැ. අපි දැක්කා මුහුණුපොතේ හොඳම වැඩකාරයෝ කියාගන්න ප්‍රාදේශීය මාධ්‍යවේදියෝ අභියෝග කරනවා කිසිම කෙනෙක් ලියන්න එපා අහවල් පත්තරේට, අහවල් ටීවී චැනල් එකට ප්‍රවෘත්ති යවන්න එපා කියලා. ඔවුන් අභියෝග කරනවා. ඔවුන් එහෙම අභියෝග කරනකොට තව කොටසක් ඒක නොලැබුණත් කමක් නැහැ කියලා ප්‍රවෘත්ති සපයන, මාධ්‍යවේදීන් පාවාදෙන කණ්ඩායමකුත් අපි අතරේ ඉන්නවා.

***ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට තියෙන ලොකුම චෝදනාවක් තමයි ප්‍රාදේශීය දේශපාලකයොත් එක්ක එකට එකතු වෙලා ගේම් ගහනවා කියන එක. පොලීසිය සමග සම්බන්ධ වෙලා යම්යම් ගේම් ගහනවා කියලත් චෝදනාවක් තිබෙනවා..***

ගොඩක් ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට පොලීසියත් එක්ක සම්බන්ධකමක් නැහැ. ඇතැම් පිරිස් පොලිසිය සහ උසාවි අල්ලගෙන කරන අසික්කිත අශීලාචාර වැඩේනිසා සමස්ත ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ටම මේ ලේබලය වැදිලා තියෙනවා. ඒක මම පිළිගන්නවා. පොලිස් නිලධාරීන්ව පුම්බන, පොලිස් නිලධාරීන්ගේ උසස්වීම්වලට ප්‍රයෝජනවත් වන ආකාරයට

ප්‍රවෘත්ති ලියන අපේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ඉන්නවා. ඒක මම පිළිගන්නවා. ගොඩක් දේශපාලනඥයෝ එදා මාධ්‍යවේදීන්ට ගරු කරා. අද දේශපාලනඥයො මාධ්‍යවේදීන්ට ගරු කරන්නේ නැහැ. මොකද හුඟක් ප්‍රාදේශීය මාධ්‍යවේදින් වගේම මාධ්‍ය ආයතනවල ඉන්න අයත් දේශපාලනඥයින්ගේ මාධ්‍ය ලේකම් හැටියට යන්න පොර කනවා. ඒ පොරකාලා ගිහින් ඔවුන් මාධ්‍ය කටයුතු නෙමෙයි කරන්නේ. දේශපාලඥයගේ ගෙදර මිදුල අතුගානවා, බිරිඳගේ රෙදි හෝදනවා, ඇමතිතුමාගේ සපත්තු පොලිෂ් කරනවා, ඒ තත්ත්වයට අද මාධ්‍යවේදියෝ වැටිලා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/S2yc-Kg-gpQ

https://www.aithiya.lk/journalism-in-sri-lanka-media-organizations/

# 51. විදුලිබල මණ්ඩලය ගිවිසුම් උගුලේ පැටලිලා ඉන්නේ

**බන්දුල චන්ද්‍රසිරි**

**හිටපු සභාපති ලංකා විදුලි පුද්ගලික සමාගම**

***අපි කාලයක ඉඳලා විදුලිබල ක්ෂේත්‍රයේ අර්බුදයක් පිළිබඳව කතාකරනවා, අපි මුලින්ම මේ අර්බුදය සරළව පැහැදිලි කරගම්මු..***



බන්දුල චන්ද්‍රසිරි

ලංකාවේ විදුලි බල ක්ෂේත්‍රය ඇතැම් ජයග්‍රහණ ලබලා තියෙනවා. විශේෂයෙන්ම අපි කලාපයේ අනෙක් රටවල් එක්ක සංසන්දනය කළොත් මේ කුඩා දිවයිනේ පැය 24 පුරාම විදුලි බලය තිබෙන රටක් හැටියට, අපි ජයග්‍රහණය ලබා තිබෙනවා. ඒ ලැබෙන විදුලිය අඛණ්ඩව ලබාගන්න පුළුවන් තත්ත්වයකුත් තියෙනවා. නමුත් අර්බුදය තමයි කලාපීය රටවල් එක්ක ගත්තහම විදුලි බලය සඳහා අපි වැය කරන මුදල, එහෙම නැත්නම් ජනතාව විදුලි ඒකකයක් සඳහා ගෙවන මුදල බොහෝ වැඩි වීම. මේක තමයි මූලිකම ප්‍රශ්නය. විදුලි ජනනය සඳහා අපි වැයකරනවා වාර්ෂිකව බිලියන 300ක්, 350ක් විතර මුදලක්. විදුලිබල මණ්ඩලය තමයි ඒකාධිකාරී රාජ්‍ය ආයතනයක් හැටියට මෙතන කටයුතු කරන්නේ. මේ ආයතනය විදුලි ජනනය සඳහා දරන පිරිවැය, විදුලිය පාරිභෝග කයා වෙත විකිණීමෙන් ලැබෙන ආදායමෙන් රිකවර් කරගන්න බැරි තත්ත්වයක් තියෙනවා. ඒ නිසා විදුලි බල මණ්ඩලය දිගින් දිගටම පාඩු ලබන තත්වයක් අපිට පහුගිය වසර කිහිපය තුළම දකින්නට පුළුවන්. මේ නිසා රජයේ භාණ්ඩාගාරයට බරක්වෙලා තියෙනවා මේ ආයතනය. රාජ්‍ය බැංකුවලට මේ පිරිවැය බරක් වෙලා තියෙනවා. විදුලිබල මණ්ඩලය වගේ දැවැන්ත

ආයතනයක් නඩත්තු කිරීම, විදුලි ජනනය සඳහා වැය කරන විශාල මුදල. මේ අර්බුදයට ප්‍රධාන හේතුව මේක.

ඇත්තටම මම පිළිගන්නේ නැහැ මේ රටේ විදුලි බලය පිළිබඳව ප්‍රතිපත්තියක් නැහැ කියලා. කලින් කලට විවිධ ආණ්ඩු විසින් එවැනි බලශක්ති ප්‍රතිපත්ති සකස් කරලා තියෙනවා. ඒවා ඉතාමත් දියුණු, ක්ෂේත්‍රය පිළිබඳව සමස්ත දැක්මක් සහිතව සකස්කරපු ප්‍රතිපත්ති. නමුත් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීමේදී නොයෙකුත් අඩුපාඩු තියෙනවා. උදාහරණයක් හැටියට විදුලි ජනනය ගත්තොත් විදුලිබල මණ්ඩලය හැම වර්ෂ දහයකට සැරයක් අනාගත විදුලි ජනන සැලස්ම සකස් කරනවා. මේ විදුලි ජනන සැලස්ම අවුරුදු පහකට සැරයක් නැවත සලකා බැලෙනවා. එහි තියෙන අඩුපාඩු සකස් කරනවා. නමුත් විදුලි ජනන සැලැස්ම අනුව අපේ රටේ විදුලි බලාගාර ඉදිකිරීම, එහෙම නැතිනම් ඒ ජනන කටයුතු සිදුවීම සිදුවෙන්නේ නැහැ. විදුලිබල මණ්ඩලය මේ ජනන සැලැස්ම සකස් කිරීමේදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙතක් තියෙනවා. ඒ ක්‍රියා පිළිවෙතේ අරමුණ අඩු වියදමෙන්, අඩු පිරිවැයෙන් විදුලිය නිෂ්පාදනය කිරීම. විදුලිය අපට විවිධාකාරයෙන් නිෂ්පාදනය කරන්න පුළුවන්. අඩු පිරිවැයෙන් විදුලිය නිෂ්පාදනය කරන්න හදන ජනන සැලැස්ම ක්‍රියාත්මක කරගන්න බැරිවෙන ආර්ථික කාරණා, තාක්ෂණික කාරණා, දේශපාලන, සමාජ කාරණා, පාරිසරික කාරණා මතු වීම නිසා විදුලිබල මණ්ඩලයට සිදු වෙනවා වැඩි මුදලට පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී අරගෙන ජනතාවට සපයන්න. මෙන්න මේ විදුලි මිලදී ගැනීම් නිසා, ඒ සඳහා දරන මුදල, ඒ පිරිවැය වැඩි නිසා ඒ දරණ පිරිවැයට සමානව විදුලිය විකුණන්න සිදු වෙනවා. සමස්තයක් විදියට ගත්තොත් විදුලි ඒකකයකට රුපියල් 16.50කට වගේ මුදලක් විදුලිබල මණ්ඩලය දරනවා. නමුත් ඒ ගානට නෙමේ විදුලි ඒකකයක් විකුණන්නේ. ඒ ලැබෙන ආදායම අඩු නිසා ඒක රාජ්‍යය භාණ්ඩාගාරයට බරක්වෙලා තියෙනවා. මේ තත්ත්වය තුළ අර්බුදයක් ඇති වෙනවා. ඒ නිසා සමහර විට සමහර කාලවලට රටේ විදුලි අර්බුදයකුත් පැන නගිනවා. සාමාන්‍යයෙන් වාර්ෂික විදුලි ඉල්ලුම 5% - 7% අතර ප්‍රමාණයකින් වැඩිවීමක් සිද්ධ වෙනවා. ඉල්ලුමට සරිලන ප්‍රමාණයට විදුලි ජනනය ඇති නොවීම නිසා විදුලි කප්පාදු කිරීම්, අනෙකුත් තාක්ෂණික ගැටලු පැන නගිනවා. මේක තමයි සමස්තයක් හැටියට තියෙන අර්බුදය.

***කතාබහක් තියෙනව දැව් තෙල් බලාගාරවලින් විදුලි මිලදී ගැනීමේදී ලොකු මාෆියාවක් තියෙනවා කියලා. මේ මාෆියාව හින්දා තමයි අලුතින් බලාගාර හැදෙන්නේ නැත්තේ කියලා කතාවක් තිබෙනවා. මේ කතාව ඇත්තද?***

ඇත්තටම 2000 - 2002 වගේ මේ රටේ හදපු ජනන සැලැස්ම ක්‍රියාත්මක කරගන්න බැරිවුණා. විදුලිබල මණ්ඩලය අඩු වියදමින් විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා එවකට බලාපොරොත්තු තැබුවේ ගල් අඟුරු බලාගාර වෙත. නමුත් ඒ ගල් අඟුරු බලාගාරය නිසි කලට ඉදිකර ගන්න බැරි වුණා. මේ බලාගාරවලට විරුද්ධව විශාල ජනතා උද්ඝෝෂණ ඇතිවුණා, පාරිසරික ප්‍රශ්න නිසා. එනිසා බලාගාර විවිධ ස්ථානවල ගොඩනගන්න උත්සාහ ගත්තා කිහිප වතාවක්ම. ඒ හැම අවස්ථාවකම රජයට මුහුණ දෙන්න සිද්ධවුණා ජනතාවගේ විරෝධයට. අවසාන වශයෙන් නොරොච්චෝලේ ඉදිකළා. ඒක ඉදිවුණේ සෑහෙන ප්‍රමාදයක් වෙලා. අවුරුදු දහයක් විතර ප්‍රමාද වුණා. මේ අවුරුදු 10ක ප්‍රමාදය තුළ විදුලිබල මණ්ඩලයට සිද්ධවුණා අර මං කලින් කිව්ව වගේ විදුලි ඉල්ලුම සපුරාලීමට පෞද්ගලික බලාගාරවලට, විශේෂයෙන්ම පෞද්ගලික දැව් තෙල් තාප බලාගාරවලට ඉඩදීලා ඒ අයගෙන් විදුලිය මිලදී ගන්න. මෙන්න මේ පුද්ගලික සමාගම් සමග විදුලි බල මණ්ඩලය එළැඹුන ගිවිසුම්වල තියෙන මූලික තාක්ෂණික ගැටලු නිසා විදුලිබල මණ්ඩලයට සිද්ධවෙලා තියෙනවා විශාල මුදලක් දැව් තෙල් බලාගාර සඳහා ගෙවන්න. සාමාන්‍ය විදුලි ඒකකයක් සඳහා රුපියල් 23 සිට 45 ත් අතර මුදලක් ගෙවන්න. අර මං කලින් කිව්වා වගේ සාමාන්‍ය විදුලිය ජනනය කරන්න යනවා රු. 16.50ක්. හැබැයි රුපියල් 23 ත් 40 ත් අතර පරාසයක ගෙවීම් සිද්ධ කරන්න වෙලා තියෙනවා.

දැන් මේ පුද්ගලික බලාගාර සමග ඇතිකරගත්ත ගිවිසුම් අවුරුදු පහළොවකට වැඩි කාලයක් තිස්සේ ක්‍රියාත්මක වෙනවා. පළමුවෙන්ම මේ ගිවිසුම් අවුරුදු දහයකට වගේ තමයි සකස්කෙරුණේ. කලින් කලට නැවත මේ ගිවිසුම් දික් කලා. නැවත ගිවිසුම්වලට එළඹුණා. මේ නිසා විශාල විදිහට විදුලිබල මණ්ඩලය මේ උගුලේ පැටලිලා තියෙනවා. හැබැයි මෙහි ගිවිසුම් පිළිබඳව, විශේෂයෙන්ම රජයේ විගණකාධිපතිවරයා, ඒ වගේ මේ ගැන උනන්දුවක් දක්වපු විදුලිබල ක්ෂේත්‍රයේ විශේෂඥයෝ, හැමතිස්සෙම ප්‍රශ්න කරපු දෙයක් තමයි

මේ ගිවිසුම් විදුලිබල මණ්ඩලයට පාඩුවන ආකාරයට, අලාභයක් වෙන ආකාරයට සැකසුනේ ඇයි කියන එක. ඒ නිසා විදුලිය නිෂ්පාදනය කරනවාටත් විදුලි බලාගාරවලට ගෙවනවා, ඒ වගේම මේ බලාගාරවලට මුදල් ආයෝජනය කරපු නිසා ප්‍රාග්ධන වියදමත් විදුලිබල මණ්ඩලය ගෙවන විදිහට තමයි මේ ගිවිසුම් සකස්වෙලා තියෙන්නේ. ප්‍රශ්නය වෙන්නේ අවුරුදු දහයක් විතර යනකොට සමාගම් තමන්ට ගිය ප්‍රාග ්ධන වියදම් සම්පූර්ණයෙන්ම කවර් කරගෙන තිබියදීත් මණ්ඩලය ඒ සඳහා ගෙවීම.

විදුලි බල මණ්ඩලයේ ඇතැම් ඉහළ නිලධාරීන්, මේ විෂය පිළිබඳව වගකීම් දරන ඇතැම් දේශපාලඥයන් සහ මේ සමාගම් අතර නිල හෝ නිල නොවන මට්ටමේ ඇතිකරගත් අවබෝධයක් උඩ තමයි මේ විදුලි මාෆියාව ක්‍රියාත්මක වෙන්නේ. අපි දිගින් දිගටම දැක්ක දෙයක් තමයි විදුලි ජනන සැලැස්ම ක්‍රියාත්මක කරන්නට පුළුවන් තත්වයක් ඇති වුණත්, ඒ සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, නියාමන ආයතන, යම් පරිසරයක් ගොඩනගලා දුන්නත්, විදුලිබල මණ්ඩලයේ ඇතැම් නිලධාරීන් මේ සමාගම්වල තියෙන බලපෑම, දේශපාලන වශයෙන් තියෙන බලපෑම අනුව අර පෞද්ගලික අංශයටම විදුලි මිලදී ගැනීමේ කොන්ත්‍රාත් ලබා දෙනවා. සමහර විට ක්ෂේත්‍රයේ විවිධ අර්බුද මවලා මේ මාෆියාව දිගටම කරගෙන යනවා.

***පර්යේෂකයෝ කියනවා ලෝකයේ විදුලිය සඳහා වැඩිම මිල ගෙවන්නේ අපි කියලා. විදුලිය නිෂ්පාදනය කරන්න එච්චර විශාල පිරිවැයක් දරන්නේ නැහැ කියලා. මේ නවීන තාක්ෂණය දියුණු ලෝකයේ අපට ලේසියෙන් යන්න පුළුවන් දේවල් මොනවද? මේ ප්‍රශ්නයට තිබෙන විසඳුම මොකක්ද?***

ඕනෑම රටක විදුලි ජනන සැලැස්ම එක ප්‍රභවයක් මත නොරැඳිය යුතුයි. විදුලි බලය ජනනය සඳහා ස්වභාවිකම අපට ලැබිලා තියෙනවා ජල සම්පත. අපි ජලයෙන් උපරිම මට්ටමෙන් ප්‍රයෝජන අරන් තියෙනවා. මං හිතන්නේ නෑ තව දුරටත් විශාල ජලාශවලින් විදුලිය නිෂ්පාදනය කරන්න පුළුවන් වෙයි කියලා. ඊළඟට අපි මොනාවුණත් ගල් අඟුරු බලාගාර හදලා තියෙනවා. තෙල් බලාගාර තියෙනවා අපිට. දැන් අපි සුළං බලාගාර, ඒ වගේම සූර්ය බල පද්ධතියෙන් සූර්ය බලාගාර, ඒ

වගේම ස්වභාවික වායු විශේෂයෙන්ම විදුලි බලයට විතරක් නෙමෙයි ප්‍රවාහනයටත් යොදාගන්න පුලුවන් දීර්ඝකාලීන සැලැස්මක් ඇතුව යොදා ගත්තොත්. එතකොට මේ හැම ප්‍රභවයකින්ම පිරිපුන් පද්ධතියක් තමයි ඕනෑම රටකට තියෙන්න ඕන. එහෙම තිබුණොත් විතරයි අපිට අඩු වියදමින් විදුලිය දෙන්න පුලුවන් වෙන්නේ. මේ තත්ත්වය අස්සේ අපි අපේ ජනන සැළස්ම නිසි විදිහට ක්‍රියාත්මක කළොත් අපිට මේ ප්‍රශ්නයෙන් ගැලවිලා අඩු මුදලකට පාරිභෝගිකයාට විදුලිය දෙන්න පුලුවන් වෙයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/SndYtQMFgbk

https://www.aithiya.lk/ceylon-electricity-board-ceb-is-in-a-contract-trap/

# 52. අධිකරණය තමන්ගේ ගෞරවය රැක ගන්න කටයුතු කරන්න අවශ්‍යයි

## අනිද්දා සංස්කාරක නීතිඥ කේ. ඩබ්ලිව්. ජනරංජන

***රන්ජන් රාමනායක මහත්මයාට මේ වනවිට අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් සිරදඬුවම් නියමවෙලා තියෙනවා. මේ සම්බන්ධයෙන් නීතිමය තත්ත්වය සහ මේ ලැබුණු දඬුවම ගැන ඔබේ අදහස කුමක්ද?***



**නීතිඥ කේ. ඩබ්ලිව්. ජනරංජන**

රංජන් රාමනායක මන්ත්‍රීවරයා උසාවියට අපහාස කිරීම පිළිබඳව අපි හැමෝම දන්නවා ඔහුට අවුරුදු හතරක සිර දඬුවම් ලැබිලා තියෙනවා. එතකොට ලංකාවේ අධිකරණයට අපහාස කිරීම පිළිබඳව නීතිය ගැන දැන් නැවතත් අලුත් සාකච්ඡාවක් ඇතිවෙලා තියෙනවා. ඇත්තටම උසාවියට අපහාස කිරීම පිළිබඳ චෝදනා ලබලා යම් යම් පුද්ගලයින් මීට පෙර වරින්වර සිරගත කරපු අවස්ථාවලදී, අධිකරණ අපහාස නීතිය පිළිබඳ මෙවැනිම සාකච්ඡා ඇතිවුණා. නමුත් අවාසනාවකට ඒ හැම අවස්ථාවකම ඒ සිද්ධිය යට ගියාට පස්සෙ, ඒ සිද්ධියේ කාලය ඉකුත් වුණාට පස්සේ, ඒ සාකච්ඡාවත් එහෙමම යටපත් වුණා. දැන් නැවතත් ඇවිල්ල තියෙන්නේ ඒ පැරණි සාකච්ඡාව.

ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අධිකරණයට අපහාස කිරීම පිළිබඳව නඩු විභාග කරලා දඬුවම් දෙන්න අභියාචනාධිකරණයටත් ශ්‍රේෂ්ඨාධිකරණයටත් බලය දීල තියෙනවා. හැබැයි ඒ බලය මොන සීමාවකද තියෙන්නෙ කියනදේ ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොහේවත් සඳහන් වෙලා නැහැ. එතකොට එයින් පෙනීයනවා අධිකරණයට පුළුවන් තමන්ගේ අභිමතය අනුව මේ සඳහා දඬුවම්

නියම කරන්න. සාමාන්‍යයෙන් කරන්නේ අධිකරණයට අපහාස කිරීම පිළිබඳව චෝදනාවක් ලැබුනහම ඒ අදාළ පුද්ගලයා අධිකරණයට කැඳවලා අධිකරණය විමසනවා ඔබට දඬුවම් නොකිරීම සඳහා මොනවාද තිබෙන හේතු කියලා. එතකොට ඒ පුද්ගලයා තමන්ගේ ප්‍රකාශය හෝ තමන්ගේ ක්‍රියාව සම්බන්ධයෙන් අධිකරණයට සෑහීමකට පත්වෙන තොරතුරු ඉදිරිපත් කරන්න ඕනේ. එසේ නොවුණහොත් ඔහු අර චෝදනාවට වැරදිකරු බවට පත්වෙනවා. දැන් රන්ජන් රාමනායක මහත්මයා සම්බන්ධ කාරණාව ගත්තොත්, රන්ජන් රාමනායක මහත්මයා අරලියගහ මන්දිරය ඉදිරියේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ රැස්වීමකට පස්සේ එළියට ඇවිල්ල මාධ්‍යවලට කරපු ප්‍රකාශයක් තමයි මේ චෝදනාවලට පදනම වුණේ. එහිදී අධිකරණය ඇහුවා ඔබට මේගැන මොනවද කියන්න තියෙන්නේ සහ ඔහුගේ ප්‍රකාශය තහවුරු කරන්න කරුණු තියෙනවද කියලා. එතකොට අධිකරණය තමන්ගේ තීන්දුවෙන් කියන්නේ අධිකරණය ඉදිරියේ රන්ජන් රාමනායක මහත්මයාගේ පාර්ශවයෙන් තමන්ගේ ඒ ප්‍රකාශය තහවුරු කරන්න කරුණු ඉදිරිපත් නොවුණු බව. ඒ වාගේම අධිකරණය නිරීක්ෂණය කරනවා අධිකරණයට රන්ජන් රාමනායක මහත්මයා පැමිණිලා නඩු විභාගයට මුහුණ දීලා එළියට ගිහිල්ලා නැවත වාරයක් මාධ්‍යවලට වරින්වර තමන්ගෙ ප්‍රකාශය තහවුරු වෙන විදියට ප්‍රකාශ නිකුත් කරනවා. ඒ කාරණාව මත තමයි ඔහුට වසර හතරක සිර දඬුවමක් අධිකරණය විසින් නියම කරන්නේ.

දැන් අපි අර පරණ සාකච්ඡාවට ගියොත් අධිකරණයට තමයි ඒ බලය තියෙන්නේ, අධිකරණයට අපහාස කිරීම පිළිබඳව යම්කිසි පුද්ගලයෙක් චෝදනාවක් ලැබුවාම ඒ චෝදනාව සම්බන්ධයෙන් නඩු විභාග කරල දඬුවම් දීමට. එතකොට අපිට පේනවා මෙතැන දී සාමාන්‍යයෙන් පිළිගන්න ස්වාභාවික යුක්තියේ මූලධර්මය උල්ලංඝනය වෙනවා. මොකක්ද ස්වාභාවික යුක්තියේ මූලධර්මය, තමන්ගේ නඩුව තමන් නොඇසිය යුතුයි කියන කරුණ තමයි ඒක. ඒ කියන්නේ තමන් නඩුවක යම් පාර්ශවයකට සම්බන්ධයක් තියෙනවා නම් ඒ නඩුව අහන්න තමන්ට සුදුසුකමක් නැහැ කියන කරුණ. නමුත් අධිකරණය, අධිකරණ පද්ධතියට අපහාස කිරීම පිළිබඳ නඩු තමන්ම අහනවා. හැබැයි එයට නීතියෙන් පිළිගැනීමක් හිමිවෙලා තියෙනවා. මෙහිදී ස්වභාවික යුක්තියේ මූලධර්මය කඩවීමට නීතිමය අවකාශයක් අපේ

රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ම දීලා තියෙනවා. එතකොට අපි තේරුම් ගත යුතුයි එසේ නම් අධිකරණය මේ පාවිච්චි කරන්නේ රටේ ඉහළම නීතියෙන් තමන්ට ලැබුණු බලය. ඒ වගේම ඒ බලයට සීමාවක් පනවල නැහැ. උදාහරණයක් හැටියට රන්ජන් රාමනායක මහත්මයාට දෙන්න ඕනෙ මොන වගේ දඬුවමක් ද? වසර කීයක් ද? කියන දෙය සම්බන්ධයෙන් අපේ නීතියේ කොහෙවත් සඳහන් වෙන්නේ නැහැ. වෙන ආකාරයකට කිව්වොත් ඒක අපිට තේරුම් ගන්න පුළුවන් වැරදිකරුවෙක්වන පුද්ගලයකුට අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් සමහරවිට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් දෙන්න තරමට අවශ්‍ය නම් අධිකරණයට බලයක් තියෙනවා.

දැන් එක් පසෙකින් අධිකරණය තමන්ම පාර්ශවකරුවෙක් වන නඩුවක් අහනවා. දෙවැනි කරුණ ඔවුන්ට දෙන්න පුළුවන් දඬුවම ගැන සීමාවක් නැහැ. මෙහිදී මම හිතන ආකාරයට නම් අධිකරණයට ඉතාම බරපතළ වගකීමකින් තමයි කටයුතු කරන්න වෙන්නේ, එක් පසෙකින් තමන් මේ සිදුවීමේ පාර්ශවකරුවෙක්, දෙවනුව තමන්ට අසීමිත බලයක් තියෙනවා. එතකොට මේ බලය කොහොමද භාවිතා කරන්න කියන එක අධිකරණය හිතන්න ඕනෑ. මම හිතන්නේ හැමතිස්සෙම සැලකිලිමත් වෙන්නඕන කාරණයක් තමයි ඒක. අනිත් කරුණ අපි තේරුම් ගත යුතු දේ තමයි අධිකරණය මේ දඬුවමක් නියම කරනවිට මේ තීන්දුව ගන්නකොට එක් පසෙකින් අර පුද්ගලයා වැරදිකරුවෙක් කරනවා වගේම අධිකරණයත් පරීක්ෂාවට ලක් වෙනවා තමන්ගෙ තීන්දුව සම්බන්ධයෙන්. වෙනත් ආකාරයකට පැහැදිලි කළොත් අධිකරණය තමන්ට අපහාස කිරීම, තමන්ට අගෞරව කිරීම පිළිබඳවයි මෙය පුද්ගලයකුට වරදකාරීත්වය පටවන්නේ.

එහිදී ඊළඟට මතුවන ප්‍රශ්නය තමයි අධිකරණය තමන්ගෙන් ගෞරවය පවත්වාගෙන තියෙනවද කියනඑක, අධිකරණය තමන්ට අපහාස නොවෙන පරිදි වැඩ කටයුතු කරලා තියෙනවාද කියනඑක. එතකොට ඒක ගැන අපිට විවිධ මත තියෙන්න පුළුවන්, නමුත් මම මතු කරන්න කැමති කාරණය තමයි අධිකරණය තමන්ට අපහාස වෙනවයි කියලා තීන්දු ගන්න කොට, අධිකරණය තමන්ගේ ගෞරවය රැක ගන්න කටයුතු කරන්න ඕනේ කියන කාරණය. ඒක එකක්. දෙවෙනි කාරණය ලෝකේ පොදු නීති ක්‍රමය, ඒ කියන්නේ බ්‍රිතාන්‍ය යටතේ යටත් විජිත

හැටියට හිටපු රටවල භාවිතා කරපු නීති ක්‍රමය අපි භාවිතා කරන්නේ. මේ පොදු නීතිය යටතේ උදාහරණයක් ලෙස ඉන්දියාව, පකිස්ථානය වැනි රටවල් සැලකුවොත් ඒ රටවල පවා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ අධිකරණය තමයි නඩු අහන්නෙ. නමුත් ලංකාවට වඩා ඉදිරියට ගිහිල්ලා, විශේෂයෙන්ම ඉන්දියාව සැලකුවොත් එහෙම තවත් මණ්ඩලීය වෙනත් රටවල් සැලකුවොත් එහෙම ඒ අය නීති නිර්මාණය කරලා තියෙනවා කොයි ආකාරයෙන් ද මේ බලය පාවිච්චි කරන්නේ කියලා. එහිදී අත්තනෝමතික බලයක් නෙමෙයි අධිකරණය පාවිච්චි කරන්නේ. නීතිය අනුව නිර්මාණය කරපු බලයක්.

ලංකාවෙ තියෙන සාකච්ඡාව තමයි ඇත්තටම දිගින් දිගටම මෙවැනි සිදුවීම් ඇති උනාම අධිකරණය මේ බලය පාවිච්චි කළ යුත්තේ කොහොමද කියන කරුණ සම්බන්ධයෙන් අපි නීතියක් පාර්ලිමේන්තුව අරඹයා සම්මත කරගත යුතුයි. අපි දන්න විදියට නොයෙක් අවස්ථාවල ඒ සඳහා කෙටුම්පත් ඉදිරිපත් වෙලා තියෙනවා. හැබැයි එකම දේ ඒ කිසිම දෙයක් නීති බවට පත්වෙලා නැහැ. ඉතින් ඒ නිසා ඉතාම වැදගත් කාරණය තමයි මේ මොහොතේ පවා අධිකරණය කල්පනා කරලා බලන්න ඕනේ මේ නීතිය ඉස්සරහට ගේන්න මොකක්ද ගන්න ඕනේ ඊළඟ පියවර කියලා. ඒ වගේම ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ශ්‍රී ලංකා නීති කොමිසම වගේ ආයතන බලයක් සහ හැකියාවක් වගේම දැනුමක් සහිත ආයතන දැන් මැදිහත්වෙලා වහාම සලකා බලන්නට ඕනෑ අධිකරණයට අපහාස කිරීම පිළිබඳව නීතියක් නිශ්චිතව පනවන්නේ කොහොම ද කියන කරුණ ගැන.

ලෝකෙ වෙන රටවල්වල මේ වගේ අවස්ථාවල අධිකරණයට අපහාස කිරීම පිළිබඳව අරගෙන තියෙන පියවර මොනවද? දීලා තියෙන දඬුවම් මොනවද? හොඳම උදාහරණය එන්නේ ඉන්දියාවෙන්, ඉන්දියාවේ පහුගිය කාලේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක් අධිකරණයට අපහාස කරා කියලා චෝදනා ඉදිරිපත් කරලා ඔහු අධිකරණය ඉදිරියට කැඳෙව්වා. තමන්ගේ ට්විටර් පණිවිඩයක් මගින් ඔහු අධිකරණයට අපහාසයක් සිදුකළා කියලා. ඒ සඳහා ඔහුට හේතු දක්වන්න කිව්වා. ඒ වගේම අධිකරණය අවස්ථා කිහිපයකදී ම ඔහුට සමාව ගන්න, එහෙම වුණොත් මේ නඩුව අවසන් කරන්න පුළුවන් කියලා දැන්වූවා. නමුත් ඔහු සමාව ඉල්ලුවේ නැහැ. සාමාන්‍ය තත්වයන් යටතේ අධිකරණය

කියනවා සමාව ගන්න කියලා. මේ පුද්ගලයා සමාව ගන්නේ නැහැ. අවස්ථා කීපයක් ලබා දෙනවා. එවැනි අවස්ථාවක සමාව දෙන්න හදන පුද්ගලයින් කෝපයට පත් වීම සාමාන්‍ය දෙයක්. එතකොට අධිකරණය තමන්ගෙ ගෞරවය ගැන නැවත වතාවක් හිතලා මේ පුද්ගලයා සමාව ඉල්ලන්නේ නැති නිසා අවසානයේ නඩු විභාගයක් පැවැත්වුවා. මේ පුද්ගලයා ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක්. ඒ වගේම සමාජ ක්‍රියාකාරිකයෙක්. අවසානයේ අධිකරණය තීන්දු කළා නඩු විභාගයකින් පසු මේ නීතිඥවරයා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ චෝදනාවට වැරදිකරු කියලා. හැබැයි ඒකට ඒ අධිකරණය දීපු දඬුවම අපි හැමෝම දන්නවා දැන්. රුපියලක දඩයක් ඔහුට නියම වුණේ. ඒ වගේම අරුන්දතී රෝයි, අධිකරණය දීපු නඩු තීන්දුවක් විවේචනය කිරීම සම්බන්ධයෙන් ඇයට දවසක සිරදඬුවමක් තමයි ඉන්දියානු අධිකරණය නියම කළේ. ලංකාවේ වගේම නීති ක්‍රමයක් තමයි ඉන්දියාවේ තියෙන්නේ. ලංකාව වගේම එංගලන්ත යටත් විජිතයක් බවට ඉන්දියාව පත්වෙලා තිබුණා. පොදු රාජ්‍ය මණ්ඩලීය රටක්. පොදු නීති ක්‍රමය ක්‍රියාත්මක වෙන්නේ. හැබැයි ඔවුන් නීතියක් නිර්මාණය කරගෙන තියෙනවා අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන්. ඒ වගේම ඒ නීතිය යටතේ කටයුතු කරන විට, ඔවුන් තීන්දුවක් දෙන විට, ඒ තීන්දුවෙන් සලකා බලනවා වැරදිකරුවෙක් කරන පුද්ගලයා සම්බන්ධයෙන්. ඇතැම් විට ඉතා දූරදර්ශීව සලකා බලා තමයි දඬුවම් නියම කරලා තියෙන්නේ.

මේ විදියට බලද්දී අධිකරණයට අපහාස කිරීමට අදාළව නීතියක් නැති තත්වයක් යටතේ ලංකාවේ අධිකරණය ඉතාම තර්කානුකූලව, මොකට ද අපි දඬුවම් දෙන්නේ? ඒ දඬුවමින් ඇතිවන ප්‍රතිඵලය මොකක් ද? කියන කාරණා සම්බන්ධයෙන් බලවත් ලෙස සලකා බැලිය යුතුයි. විශේෂයෙන් මේ කාරණයේ දී නැවත වාරයක් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් නීතියක් ඇතිකර ගැනීම සම්බන්ධයෙන් අපි බර යොදා කටයුතු කරන්න ඕන. මොකද ලංකාවේ අධිකරණය ඉන්දියාවේ අධිකරණයට වඩා යම් ආකාරයකට වෙනස් විදියටයි කටයුතු කරලා තියෙන්නේ. අපිට හොඳ උදාහරණ තියෙනවා. ටෝනි එමැනුවෙල් ප්‍රනාන්දු, අග්‍ර විනිශ්චකාරවරයා හිටපු අධිකරණ ශාලාවකදී විනිශ්ච මණ්ඩලයක් ඉදිරියේ ශබ්ද නගා කතා කිරීම සම්බන්ධයෙන් ඒ මොහොතෙම ඔහුව විත්තිකරුවෙකු හැටියට නම් කරල, ඒ මොහොතෙම ඔහුට අවුරුද්දක සිර දඬුවමක් නියම කළා. අධිකරණය

මේ පුද්ගලයාගේ ක්‍රියාව නිසා ප්‍රකෝපයට පත්වෙලා ඉන්න වෙලාවක ඒ ප්‍රකෝප වූ විනිශ්චයකාරවරු විසින්ම සිර දඬුවම් නියම කළා. එතකොට ඉතාම පැහැදිලියි නීතියක් නොමැති තත්වයක් යටතේ මේ බලය කාටහරි අපයෝජනය කරන්න පුළුවන් පහසුවෙන් කියන එක.

මෙහි තියෙන ඉතා භයානක තත්ත්වය තමයි මෙතනින් පසු මොකක්ද කරන්නේ කියන එක ගැන තියෙන අවිනිස්චිතතාවය. වැඩිබර සාක්ෂි තියෙන්නේ ඇත්තටම මින් එහාට ගත හැකි පියවරක් නැහැ කියලා. ඉතින් එහෙම නම් අභියාචනා අවස්ථාවකුත් නැත්නම්, රටේ ඉහළම අධිකරණය නම් මේ දඬුවම දීලා තියෙන්නේ, ඒ අධිකරණය කොයිතරම් වගකීමකින් වැඩ කළ යුතු ද?. ඒ නිසා එක් පසෙකින් චෝදනා ඉදිරිපත් කරන්නේ අධිකරණය. නඩු විභාග කරන්නෙත් අධිකරණය. දඬුවම් නියම කරන්නේ අධිකරණය. සමහරවිට අලුගෙ ්සුවා බවට පත්වෙන්නෙත් අධිකරණය මේ මුළු ක්‍රියාවලිය තුළම. ඒ නිසා තවත් අවස්ථාවක මෙවැනි සාකච්ඡාවක් ඇතිවීමට පෙර, ඒ කියන්නේ තවත් පුද්ගලයෙක් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවෙක් වෙලා සිර දඬුවම් ලබන්නට පෙර මේ බලය නිශ්චය කරන, ඕනෑම අයෙකුට පැහැදිලි වෙන නීතියක් පනවන්න වහාම පියවර ගන්න ඕනි කියලා නැවත නැවත අවධාරණය කළ යුතුයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/9Atq-9qFIJg

https://www.aithiya.lk/janaranjana/

# 53. දැන් මාධ්‍යයේ ප්‍රධාන රාජකාරිය ජනමතය ගොඩනැගීම

## මාධ්‍යවේදී අජිත් පැරකුම් ජයසිංහ



අජිත් පැරකුම් ජයසිංහ

සමාජ මාධ්‍ය යුගය කියන්නේ එක්තරා විදිහකට පස්සේ අර අතීතයේ තිබිච්ච මාධ්‍යකරුවන් වූ මාධ්‍යවේදියා සහ පුරවැසියා අතර වෙනස අවම වෙන කාලයක්. සමාජ මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳව ඇත්තටම ගැටලුවක් තියෙනවා. ගැටලු ඇතිවෙන්න හේතුවක් තමයි මේ සමාජ මාධ්‍ය යුගයේ මාධ්‍යකරුවෝ සහ පුරවැසියන් අතර පරතරය නැත්තං වෙනස අවම වෙලා තියෙන එක. අද වෙනකොට සමාජ මාධ්‍යවල තියන පහසුකම් නිසා ඕනෑම පුරවැසියෙකුට මාධ්‍යකරුවෙක් බවට පත්ව තමන්ගේ ප්‍රකාශනය කරන මට්ටමෙන්ම එහාට ගිහිං ඒක වඩා වැඩි පිරිසක් වෙත සමීප කරන්න පුළුවන්කම ලැබිලා තියෙනවා.

*පුරවැසි මාධ්‍ය*

මේක පුරවැසි මාධ්‍ය කියලා හඳුන්වන්න පුළුවන්. සමාජ මාධ්‍ය කියලා හඳුන්වන්නත් පුළුවන්. මේ මාධ්‍ය හසුරුවන්නේ බොහෝ වෙලාවට මාධ්‍ය පිළිබඳ පුහුණුවක් තියෙන අය නෙවෙයි. ඒ අය මාධ්‍ය සම්බන්ධ අවම මූලික කාරණාවත් සමහර විට ඉගෙනගෙන නැහැ. තමන්ගේ ඉවකින් සහ තාක්ෂණික දැනුම මත පදනම්වෙලා සහ මාධ්‍ය පරිහරණය කරල මාධ්‍ය ඇසුරු කරලා ලබාගත් අත්දැකීම් ඔස්සේ තමයි කටයුතු කරන්නේ. මෙතන අර මාධ්‍ය යුගයේ තියෙන සංස්කාරක භූමිකාවේ අඩුව නිසා පුරවැසියාගෙ මොකක් හරි අන්තර්ගතය සංස්කරණය කරන්න කෙනෙක් නෑ. එම පුරවැසියා

විසින්ම සංස්කරණයකින් තොරව තමන්ට හිතෙන පරිදි ඒදේ ප්‍රචාරය කිරීම ඇත්තටම ගැටලුවක්. මේ නිසා සමාජ මාධ්‍ය යුගයේ පළවෙන දේවල්වල අන්තර්ගතය පිළිබඳ අවුල් තියෙනවා. හැබැයි ඒක පාලනය කරන්න බැරි දෙයක් නෙමෙයි. මේ සඳහා එක පැත්තකින් අධ්‍යාපනය අවශ්‍යයි. පොදුවේ මාධ්‍ය පිළිබඳව අධ්‍යාපනයක් ලබා දෙනවා නම් සහ විශේෂයෙන්ම මේ හඳුනාගත හැකි කැපීපෙනන සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකර පුහුණු කරනවා නම්, වෙලාවට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා නම්, ඒක කරන්න බැරි කමක් නෑ. සමාජ මාධ්‍ය යුගයේ තියෙන ගැටලු විසඳාගැනීම සඳහා මේක දැඩි පාලනයකට ලක් කරන්න අවශ්‍යතාවක් නෑ. මේ නිදහස ඇතුලෙම තියෙන දේවල් පාවිච්චි කරල ඒ තියෙන ගතිකයන් පාවිච්චි කරල යම්කිසි ආකාරයේ ගුණාත්මක අන්තර්ගතයක් නිකුත් කරන කෙනෙක් බවට පුරවැසි මාධ්‍යවේදියා පත්කරන්න පුළුවන්.

### *දේශපාලන රැකවරණ*

ලංකාවෙ තියෙන ආර්ථික සමාජ දේශපාලනික අවිනිශ්චිතභාවය නිසා ලංකාවෙන් පිටතට සංක්‍රමණය වීමේ ප්‍රවණතාවක් තියෙනවා. විශේෂම තරුණ පරපුර මේ සංක්‍රමණය සඳහා විවිධ ක්‍රම පාවිච්චි කරනවා. එක ක්‍රමයක් තමයි අධ්‍යන වීසා ලබාගෙන සංක්‍රමණය වීම, එහෙම නැත්නම් වෘත්තිකයන්ට සංක්‍රමණය වෙන්න පුළුවන් ක්‍රම තියෙනවා. ඔය අතරේ තව එක් ක්‍රමයක් තමයි දේශපාලන රැකවරණ ලබාගෙන සංක්‍රමණය වෙන එක. විදේශවලට සංක්‍රමණය වීම තමන්ගේ ජීවිතයේ අරමුණු කරගත් අය (මේ අය මාධ්‍යවේදියෝ නෙමෙයි) නමුත් මාධ්‍යවේදීන් විදිහට රඟපාමින් තමන් මර්දනයට ලක් වුණයි කියමින් නාට්‍ය ජවනිකා නිර්මාණය කරමින් හෝ එහෙම නැත්නම් පිටතට ගිහිල්ලා යම් යම් ආකාරවලට ඒවා නැවත ප්‍රතිනිර්මාණය කරමින් දේශපාලන රැකවරණ ඉල්ලීම ගැටලුවක් වෙලා තියෙනවා. ඇත්තටම ඉතින් ඒක වැඩිපුර කරන්නේ මාධ්‍යවේදීන් නෙමෙයි. අද තියන ප්‍රශ්න ඇවිල්ලා මාධ්‍ය එක්ක සම්බන්ධයක් නැතිකෙනෙක් සොයා ගැනීමට අසීරුවීම. හැම කෙනෙක්ම මාධ්‍යවේදියෙක් නිසා ඕන කෙනෙකුට කියන්න පුළුවන් බ්ලොග් එකක් පටන් අරගෙන මගේ බ්ලොග් ලිපි නිසා මට මෙහෙමවුණා කියලා. මොකක් හරි එහෙම දෙයක් නිර්මාණය කරන්න පුළුවන්. එක වළක්වන්න අමාරු ප්‍රශ්නයක්.

### *ජනමාධ්‍ය සහ ජනමතය*

ජනමාධ්‍ය විෂයේ මේ කාලයෙ දකින්න ලැබෙන දෙයක් තමයි ජනමාධ්‍ය තමන්ගේ ප්‍රධාන භූමිකා බවට පත්කරන තිබෙන එක ජනමතය ගොඩනගන්න. ජනමාධ්‍ය සහ ජනමතය ගොඩනැගීම අතර ඉතිහාසයක් පුරාම සම්බන්ධයක් තියෙනව. මේ දෙක වෙන්කරන්න පුළුවන්ද බැරිද කියන එකත් ප්‍රශ්නයක්. නමුත් අද වෙනකොට ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම පවා එහාට ගිහිල්ලා ප්‍රවෘත්තියත් එක්කම මතය ඉදිරිපත් කරනවා. සමහරවිට ප්‍රධාන ප්‍රවෘත්ති විකාශවල අපි දකිනවා ප්‍රවෘත්ති නෙමෙයි යන්නේ මතයක් ඉදිරිපත් ඉදිරිපත් කරන එක තමයි යන්නේ. රජයේ මාධ්‍යවලින් ආරම්භ වෙලා අද වෙනකොට පෞද්ගලික මාධ්‍ය රජයේ මාධ්‍යවලටත් වඩා ආන්තික විදියට මේක ප්‍රධාන කාර්යය බවට පත් කරගෙන තිබෙනවා.

මාධ්‍ය ආචාර්ය ධර්ම නොසලකා හැරලා, යම් ප්‍රශ්නයක් දෙස හැම පැත්තකින්ම බලලා කරුණු ඉදිරිපත් කරලා තීරණ ගැනීම පාඨකයාට හෝ ප්‍රේක්ෂකයාට ලබාදෙන මාධ්‍ය සාම්ප්‍රදාය දැන් ලංකාවේ දක්නට නැහැ. ආසන්න උදාහරණයකින් ගත්තොතින් මේ ආණ්ඩුව බලයට ගේන්න දෙරණ, හිරු, මාධ්‍ය ජාලා කරපු කාර්යභාරය ගන්න පුලුවන්. අනෙක් අතට මේ වෙනකොට සිරස මාධ්‍ය ජාලය විසින් නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් කරපු මාධ්‍ය කාර්යභාරය, එයත් නිදර්ශනයක්. බොහොම සියුම් විදිහට ආණ්ඩුවට විරුද්ධ සියලු මත, ජනමාධ්‍යයෙන් එහාට ගිහිල්ලා එක්තරා විදිහක සංවිධානයකට යටත් කරන්න සිරස කටයුතු කළා. එහෙම එකතු කරල ඒගොල්ලො ලොකු ජනමතයක් හැදුවා ආණ්ඩුවට විරුද්ධව නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන්. අවසානයේ දී ආණ්ඩුවේ ආර්ථික උපාය මාර්ගවලට බරපතළ ගැටලු සහගත තත්ත්වයක් නිර්මාණය වෙලා තියෙනවා මේ වෙනකොට. එහෙම වුණායින් පස්සේ එන ගැටලුව තමයි ඊළඟට ආණ්ඩුව මොකක් කරයිද කියන එක. එක්තරා විදියකට දුර්වල චරිත ලක්ෂණ තියෙන අය බිත්තියට හේත්තු කරනවයි කියන එක, ඒක හරි අවදානම් සහගත දෙයක්. මාධ්‍යවලින් ඒක ඇත්තටම කරමින් ඉන්නවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/u73IRrnbCac

https://www.aithiya.lk/ethics-of-social-media-in-sri-lanka-ajith-parakum-jayasinghe/

# 54. අපනයන ආර්ථිකය වැඩි කළ යුතුයි

## වරලත් ගණකාධිකාරී හර්ෂ ගුණසේන

*රාජ්‍ය ණය*


වරලත් ගණකාධිකාරී හර්ෂ ගුණසේන

ලංකාවේ රාජ්‍ය ණය ප්‍රතිශතය ගත්විට 50%කට ආසන්න ප්‍රමාණයක් තියනවා වෙළඳ ණය. එයින් චීනය 10%ක්, ආසියානු සංවර්ධන බැංකු 13%ක් දීලා තියනවා, ජපානය 10%ක්, ලෝක බැංකුව 9%ක්, ඉන්දියාව 2%ක්, ණය දීලා තියෙනවා. නමුත් මතයක් තියනවා ලංකාවේ විදේශ ණය නිසා මුහුණ දීලා තියන අර්බුදයට බලපාන්නේ චීන ණය කියලා, එහෙම එකක් නෑ. චීනය ගත්විට ඔවුන් 10%ක් පමණ තමයි ණය දීලා තියෙන්නේ, මුළු ණය වලින්. හැබැයි මෙතන විශේෂ කාරණයක් තියනවා, ශ්‍රී ලංකාව දැන් මැදි ආදායම් ලබන රටක්. අඩු ආදායම් ලබන රටක ඉඳන් මැදි ආදායම් ලබන තත්ත්වෙකට ලංකාව පත්වුණේ 2007 වගේ කාලයේදී. එතකොට අඩු ආදායම් ලබන රටක් විදිහට තිබුණු කාලයේදී අපට හම්බුනා දීර්ඝ කාලීන ණය, අඩු පොළියකට. ඒ වගේම සහන කාලයකුත් සමග තමයි ඒ ණය ප්‍රධානයන් ලැබුණේ. මේ කාලය තුළ සමහර විට පොළිය පමණක් ගෙවලා ණය නොගෙවා ඉන්න පුළුවන් තත්ත්වයක් තිබුනා. මේ සහන කාලය අවුරුදු 25ක් පමණ කාලයක් වෙනවා. නමුත් ලංකාව මැදි ආදායමක් ලබන රටක් බවට පත්වුණාට පස්සේ මේ වාසි සහගත ණය අපට ලැබෙන්නේ නෑ.

මේ තත්ත්වෙට පත්වුණාට පස්සේ අපිට සිදුවුණා විශේෂයෙන් 2007 කාලයේදී තමයි මේක පටන් ගත්තේ, වෙළඳ ණය වලට යන්න. එනම්

අපි ආණ්ඩුව බැඳුම්කර නිකුත් කරා ඩොලර්වලින්, එවිට බැඳුම්කර මිලදී ගන්නවා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොලේ සිටින ගැනුම්කරුවන්, එත්කොට ඒ බැඳුම්කර පොලිය ගත්විට සමහර වෙලාවට ඇමරිකන් ඩොලරයට 6%ක වගේ ප්‍රමාණයක්, මෙය ටිකක් වැඩි ප්‍රමාණයක්, ඒ වගේ ප්‍රමාණයකට තමයි ණය හම්බෙන්නේ. අනිත්එක මේ ණය ගෙවීමේ කාල සීමාව අවු. 5ක් හෝ 10ක් වෙන්න පුළුවන්. එමනිසා අර කාලේට වඩා අසීරු කාලෙකට මුහුණ දෙනවා 2007 කාලයෙන් පස්සේ. 2007 වගේ කාලය ගත්විට අපේ රටේ වෙළඳ ණය 5%කට වඩා අඩු ප්‍රමාණයක් තමයි තිබුනේ. නමුත් දැන් එය මුළු ණයෙන් 50% ක් හෝ ඊට වඩා වැඩි තත්ත්වයකට පත් වෙලා තියනවා.

## *විශාල ප්‍රශ්න දෙක*

අපේ රටේ ආර්ථිකය විශාල ප්‍රශ්න දෙකකට මුහුණ දීලා තියනවා. එකක් අයවැය හිඟය. එනම් නිදහසෙන් පස්සෙ අවුරුදු දෙකක හැර අනිත් හැම අයවැයක් ම හිඟ අයවැයක්. ඒ කියන්නේ රජයක් හැටියට රජයට ලැබෙන ආදායමට වඩා වැඩියෙන් වියදම් කරනවා. එවිට ඒ වැඩිපුර කරපු වියදම පියවගන්න රජය ණය ගන්නවා. එතකොට මේ ණය නැවත පියවන්න අවස්ථාව එනවිට ඊළඟ අවුරුද්දෙත් ආදායමට වඩා වියදම වැඩි අයවැයක් ඉදිරිපත් කරනවා, ඊට පස්සේ නැවතත් ගත්ත ණය පියවන්න නැවත ණයක් ගන්නවා. මොකද ලැබෙන ආදායමෙන් ණය පියවන්න බෑ වියදම වැඩි නිසා. නමුත් මේ තත්ත්වය ටිකක්දුරට සමනය වෙනවා අපි වැඩිපුර වියදම් කරන මුදල් සුදුසු පරිදි ආයෝජනය කරලා ආර්ථික වර්ධනයක් ඇති කරගත්විට.

අනෙක් කාරණය තමයි, අපේ රටේ දීර්ඝ කාලීනව අපනයනවලට වඩා ආනයනය වැඩී, එම නිසා ආනයනය සඳහා වෙන වියදම් වැඩී. උදාහරණයක් විදිහට 1990 ගත්විට රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 30%ක් පමණ වුණා අපනයන ආදායම. 2019 වෙද්දී ඒක 23% දක්වා අඩු වෙලා. ඒ වගේම අනිත් අතට රටේ බදු ආදායම ගත්විට 1990 දී රටේ බදු ආදායම දළ දේශීය නිශ්පාදිතයෙන් 19%ක් වුණා, නමුත් 2019 වෙනකොට ඒක 11.55%ට අඩු වුණා. එවිට දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අපනයන අඩු වෙලා තියනවා. ඒ වගේම බදු ආදායම අඩු වෙලා තියනවා. එතකොට මේ වගේ තත්ත්වයක් දිගින් දිගටම

පවතිනකොට අපි දැනගන්න ඕනෑ අපේ රට විශාල ණය අර්බුදයකට ගමන් කරන බව. දැන් මේ තත්වය ඉතා අවාසනාවන්ත විදිහට අපේ රටේ ආණ්ඩු භාවිතා කරනවා, පහුගිය ආණ්ඩුවේ ක්‍රියාකලාපය නිසා මේ ආණ්ඩුවට මෙහෙම වෙලා තියනවා පහුගිය ආණ්ඩුවට කලින් ආණ්ඩුවේ ක්‍රියාකලාපය නිසා මෙසේවෙලා තියනවා යනුවෙන් ප්‍රකාශ කරන්න.

### *කෙටි කාලීන ණය*

මේ ආණ්ඩුව මුහුණ දෙන බරපතල අර්බුදයට හේතුව මේ ආණ්ඩුවේම වැරදි නෙවෙයි. පහුගිය ආණ්ඩුවෙත් යම් යම් වැරදි තියනවා, එක උදාහරණයක් නම් ගිය ආණ්ඩුව කාලේ ආර්ථික වර්ධනය හුඟක් අඩුයි නමුත් ඒ ආණ්ඩුව උත්සහකරා එක අවස්තාවක ආර්ථිකයේ තියන මේ ව්‍යුහාත්මක ගැටලුවලට පිළිතුරක් දෙන්න. එනම් බදු ආදායම වැඩි කරන්න. නමුත් මේ ආණ්ඩුව බලයට පත්වුණාට පස්සේ මේ බදු ආදායම ඉවත් කරා. මේ නිසා ආණ්ඩුවේ ආදායම බරපතළ විදිහට පහත වැටුණා. ඒවගේම කොරෝනා නිසා තවත් මේ තත්ත්වය දුෂ්කර වෙලා තියනවා. මේ තත්ත්වය යටතේ වර්තමාන ආණ්ඩුව පවසලා තියනවා ජ්‍යාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඔවුන් කිසිඳු ආධාරයක් ලබාගන්නේ නෑ කියලා. කලින් වතාවල් ගණනාවක දීම එනම් 2015 හා 2019 ආණ්ඩුව මෙයින් මුදල් ණයට ලබාගත්තා කෙටි කාලීනව, මොකද ගිණුම් ශේෂ අර්බුදය පියාවා ගැනීමට. ඉතින් මේ අවස්තාවේ දී වර්තමාන රජය සඳහන් කරනවා ජ්‍යාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබා ගන්නේ නෑ කියලා.

මීට අමතරව මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා ගන්න තවත් ක්‍රමවේදයක් තියනවා, චීනය හා ඉන්දියාවෙන් කෙටි කාලීන ණයක් ගැනීම තමයි ඒක. නමුත් ඉන්දියාව මේ ක්‍රමවේදයට ණය දීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පවරලා තියනවා. එනිසා දැන් චීනයෙන් බලාපොරොත්තු වෙනවා ඩොලර් බිලියන 1.5ක ණයක්. අනෙක් කාරණය තමයි පසුගිය කාලේ ජ්‍යාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම වලින් ලංකාව පහළට ඇද දැමීම, ඒවටා අපිට එරෙහි වෙන්න පුළුවන් නමුත් එහි ඵලදායිතාවක් නෑ. මේ පහළට දැමීම නිසා බැඳුම්කර තුළින් ණය දෙන්නේ වැඩි පොලියකට, එම නිසා අපි මෙයින් ගොඩ එන්න ඕන,

ඒ සඳහා අපනයන ආර්ථිකය වැඩි කරලා ආනයන අඩු කරන්න ඕනි. මෙය කෙටිකාල විසඳුමක් මෙයින් ප්‍රථිඵලයක් ලබා ගන්න පුළුවන් ඒ වගේම දීර්ඝකාලීන විසඳුම් විදිහට නිෂ්පාදන වැඩි කරගන්න ඕනි. රාජ්‍ය ආදායම වියදමට වඩා වැඩි කරගන්න අපනයන වැඩිකරගන්න ඕනි. කොහොමද අපනයන වැඩිකරගන්නේ, ඒ සඳහා කුඩා ප්‍රමාණයේ ව්‍යවසායකයන්ට මූලික ප්‍රාග්ධනයක් සපයා දීලා අපනයන වැඩි කරන්න ඕනෑ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/zZjxe1Aq1aU

https://www.aithiya.lk/current-conomic-crisis-in-sri-lanka-harsha-gunasena/

# 55. මේක දුප්පතුන්ට මරණය ගේන ණය ක්‍රමයක්

## පර්යේෂිකා අමාලි වෙදගෙදර

***ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රචලිත වෙන්නෙ දුප්පතුන් දිරිගැන්වීමේ ක්‍රමයක් විදිහට. මේ ක්‍රමය හරහා අද වනවිට බොහෝ දෙනෙක් ණය උගුලක හිර වෙලා තියෙනවා. මේ පිළිබඳ ඔබේ පර්යේෂණ අත්දැකීම කොහොමද?***



අමාලි වෙදගෙදර

අපි දන්නා ආකාරයට ක්ෂුද්‍ර මූල්‍ය ණය කියන්නෙ ව්‍යවසායකයින් බිහිකිරීම අරමුණු කරගෙන විවිධ ගෘහාශ්‍රිත ව්‍යාපාරවලට දෙන ණයක්. ඉතින් මුල්වරට 2017දී පමණ මම කතා කළා මඩකළපුවෙ සහ නුවරඑළියෙ කාන්තාවන් පිරිසකට. මම දැකපු දේ තමයි මේ ණය ලබාගන්නා පවුල් දරිද්‍රතාවයේ පතුළේ සිටින්නේ. මේ පුද්ගලයින් ණය ගන්නේ ව්‍යාපාරයක් කරන්න කියලා. හැබැයි ණය අරගෙන ඊළඟ මාසයේ ඉඳලා ණය ගෙවීම පටන් ගන්නවා. ඉතින් මිනිසුන්ට ආදායම් උත්පාදනය කරගන්න කාලයක් ඉතුරු කරන්නේ නැතුව තමයි මේ ණය නැවත අයකිරීම කරන්නේ. අපි සාමාන්‍යයෙන් ජනප්‍රිය කතිකාව තුළ කතා කරන්නේ ව්‍යවසායකයන් ඇති කරන්න ණය දීම ගැන. ඒ කතිකාවත ඇතුළත නොකියවෙන කාරණා තමයි මේ ණය ක්‍රමය සකසලා තියෙන්නේ කොහොමද? ඒ ක්‍රමය සකස්වෙලා තියෙන ආකාරයත් එක්ක ණය ලබාගන්නා ආදායම් කාණ්ඩය කොතරම් අවදානම් ජන කොට්ඨාශයක් ද වැනි දේවල්. මම කියන කණ්ඩායම්වල බොහෝ දෙනෙක් ගොවියන්, ධීවරයන් නැත්නම් ගෘහාශ්‍රිතව කුඩා නිෂ්පාදන සිදු කරන කාන්තාවන්. ඉතින් මිනිස්සු තමන් කරගෙනයන ආර්ථික කටයුතු දියුණු කරගන්න බලාපොරොත්තුවෙන් තමයි මේ ණය ගැනීමට පෙළඹෙන්නේ.

***මිනිස්සුන්ට ඇයි ඇත්තටම මේ ණය ගෙවාගෙන යන්න බැරිවෙන්නේ..***

මේ මිනිස්සු ණය ගන්නකොට අරකියන මුදල් අවශ්‍යතාවයන්ට අමතරව, ඒ ණය ගැනීම මොනතරම් බැරෑරුම් කාර්යයක් ද කියන දේ ගැන අදහසක් නැහැ. ඔවුන් හිතන්නේ තමන්ට ලැබෙන ආදායමින් ණය ගෙවාගෙන යන්න පුළුවන් වෙයි කියලා. නමුත් සමහර ණය තියෙනවා සති වාරික. සමහර ණය මාසික වාරික. ආර්ථික ක්‍රියාකාරකමක් සඳහා ණයක් ඉල්ලුම් කරනවා, රුපියල් ලක්ෂයක් අවශ්‍යයි කියලා. නමුත් ඒ පුද්ගලයාට ණය ලැබෙන්නේ පළමු වාරිකය කපාගෙන, නැත්නම් රක්ෂණය සඳහා තියෙන මුදල කපාගෙන, එතකොට අවශ්‍යකරන 100,000 ක මුදල අතට ලැබෙන්නේ නැහැ. අවශ්‍යතාවයට සරිලන ණය මුදලක් නෙවෙයි පුද්ගලයාගේ අතට ලැබෙන්නේ. මේවගේ බොහෝ දේවල් මේ ණය ක්‍රමය එක්ක ගැටගැහිලා තියෙනවා.

මේ ණය ගත්තට පස්සේ අසනීප තත්ත්වයන් කාලගුණ තත්ත්වයන් පවා බලපාලා තියෙනවා ණය ගෙවීම නොහැකිවීමට. මොකද සහන කාලයක් නැහැ. ව්‍යාපාරයක් පටන් ගත්තට ඒක සාර්ථකවෙලා ආදායම් උපද්දන තත්ත්වයට එන්න ටිකක් කල් යනවා. එහෙම වුණාම ණය වැලක හිරවෙන එක තමයි වෙන්නේ. ඊට පස්සේ ඉතිං ඇඟ කනකර ආභරණ පවා උගසට යනවා මේ ණය ගෙවන්න. එහෙම කරලත් ගෙවාගන්න බෑ.

*අපි මොනවා කිව්වත් මේක අන්තර්ජාතිකව පිළිගත් ණය ක්‍රමයක් නේද?*

ක්ෂුද්‍ර මූල්‍ය කියන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන අරමුදල වැනි ලෝක මට්ටමේ අන්තර්ජාතික සංවිධාන දරිද්‍රතාවය දුරලන, කාන්තාවන් බලගන්වන ක්‍රියාවලියක් ලෙස පිළිගැනීමට ලක්කළ දෙයක්. 2006 දී දුප්පත්කම දුරලීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය හඳුන්වා දුන් මොහොමඩ් යුනුස් කියන බංග්ලාදේශ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයාට 'ග්‍රාමීන්' බැංකු මාදිලිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නොබෙල් ත්‍යාගය හිමි වෙනවා. එයින් පේනවා මෙයට හිමිවුණු පිළිගැනීම. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් "ක්ෂුද්‍ර මූල්‍ය වසරක්" පවා නම් කරනවා. මම හිතන්නේ ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ පවතින, සංවර්ධන ක්‍රියාවලියට උරදිය හැකි ක්‍රමයක්ය යන මේ ජනප්‍රිය මතය තමයි මේ ප්‍රකාශ වෙන්නේ.

ඇත්තටම මේ ජනප්‍රිය මතය පිටුපස සැඟවුණු යතාර්ථය තමයි සැහෙන ලොකු ප්‍රාග්ධනයක් ගලා එනවා මේ ක්ෂේත්‍රයට මුදල් ආයෝජන විදිහට කියන එක. මම කිව්වොත් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන ජාලය, වාණිජ බැංකු, ධනවත් පුද්ගලයින් තමන්ගේ කොටස් ලෙස ආයෝජනය කරන මුදල්, උතුරු යුරෝපයේ සංවර්ධිත රටවල්වල විශ්‍රාම වැටුප් අරමුදල් ආයෝජනය කරන ක්ෂේත්‍රයක් විදිහට ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය අද වනවිට වර්ධනය වෙලා තියෙනවා. ස්වීඩනය වැනි රටවල් විශ්‍රාමික අරමුදල් LOLC වැනි ආයතනවල ආයෝජනය කරලා තියෙනවා.

තත්ත්වය මේක වුණාට මේ වෙනකොට මානව විද්‍යාඥයින්, සමාජ විද්‍යාඥයින්, ආර්ථික - දේශපාලන විද්‍යාඥයින් මේ පිළිබඳ සමීක්ෂණ කරලා ඔවුන් ප්‍රකාශ කරනවා මේ ක්‍රමය සම්පූර්ණයෙන්ම අසාර්ථකයි කියලා. එක් උදාහරණයක් තමයි මොහොමඩ් යුනුස් පළමුවෙන් "ග්‍රාමීන් බැංකුව" බංග්ලාදේශයේ අත්හදා බැලීමට පටන් ගත් ගම, ඒකෙත් අමීනෝ රහ්මාන් කියන පුද්ගලයා ඒ ගැන කරපු පර්යේෂණයකට අනුව ඒ ගම තුළවත් මේක සාර්ථක වෙලා නැහැ. බංග්ලාදේශයේ එවැනි පර්යේෂණ කිහිපයක් සිදු කරලා තියෙනවා. ඒ වගේම ඉන්දියාවේ කල්කටාවල, ඊට පස්සේ 2010 දී පමණ ආන්ද්‍ර ප්‍රදේශයේ. ආන්ද්‍රා කියලා කියන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරය සාර්ථකව මෙහෙයවගෙන යනවකියල පෙන්වපු ප්‍රදේශයක්. හැබැයි ඊට පස්සේ කෙටි කාලයක් තුළ ආන්ද්‍රා ප්‍රදේශයෙන් සැහෙන වාර්තාවෙන්න පටන්ගත්තා කාන්තාවන්ගෙන් සියදිවි නසාගැනීම්. දැන් අද වෙනකොට අපි ඒ අවධිය නම් කරනවා ආන්ද්‍රා ප්‍රදේශයේ ක්ෂුද්‍ර මූල්‍ය අර්බුදය කියලා. පසුව ආන්ද්‍රා ප්‍රාන්තයේ ආණ්ඩුවට මේ ප්‍රශ්නයට සෘජුව මැදිහත් වෙලා, ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන ආයතන දැඩි ලෙස නියාමනයට ලක් කරලා, ලබා දීපු ණය පවා අහෝසි කරන්න සිදුවුණා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/_c7u5bnMpco

https://www.aithiya.lk/microfinance-crisis-in-sri-lanka-amali-wedagedara/

# 56. රඹකැන් ඔය ඉඩම් දීලා තියෙන්නේ ගජ මිතුරන්ට

## පරිසරවේදී තිලක් කාරියවසම්



තිලක් කාරියවසම්

රටේ විශාල වශයෙන් පරිසර විනාශයක් වනබව මේ වෙනකොට ජනමාධ්‍ය ඔස්සේ පේනවා. නමුත් ඇත්තටම කියනවා වාගේ වෙනවද කියලා බොහෝ අයට සැකයක් තියනවා. මොකද හිතාගන්නවත් බැරි විදිහට විශාල ආකාරයේ පරිසර විනාශයන් සිදුවෙනවා. උදාහරණයක් හැටියට මේ රජය බලයට පත්වුණ දවසේ ඉඳලා පස් වැලි වගේ දේවල්වලට එතෙක් තිබුණ බලපත්‍ර අහෝසි කරලා කිසිඳු සීමාවකින් තොරව වැලි කනින්න, පස් කනින්න , ගල් කඩන්න, ඒවා ප්‍රවාහනයට නැවත අලුත් බලපත්‍ර ක්‍රමයක් ඇති කරා.

### *බලපත්‍ර අහෝසි කිරීම*

මේ බලපත්‍ර ක්‍රමය අහෝසි කිරීමත් එක්ක රටේ රක්ෂිත ඇතුලේ ගස් කපන්න පටන් ගත්තා, පස් කපන්න පටන් ගත්තා, ගල් කඩන්න පටන් ගත්තා, මොකද ඒවා ප්‍රවාහනය කිරීමේදී තිබුණ බලපත්‍රය අඩුම ගානේ ඉදිරිපත් වුණහම කොහෙන්ද මේවා ගෙනාවේ කියලා හොයලා බලන්න පුළුවන්කම තිබුණා . දැන් මේක අහෝසි වීමෙන් එවැනි පසු විපරමක් කිරීමට තිබුණ හැකියාව නැතිවෙලා ගියා. ඊට පස්සෙ අපි බලමු රටේ තැන් තැන්වල ඉඩම් තමන්ගේ දේශපාලන හිතවතුන්ට ලබාදීම නිසා විශාල පරිසර හානියක් සිදුවෙනවා. උදාහරණ ලෙස මහවැලි යෝජනා ක්‍රමය යටතේ මහවැලි ඉඩම් තෝරාගත්ත පිරිස්වලට ලබාදීම සඳහා රජය යම් තීරණයක් අරගෙන තියනවා,

ඒවායේදී විශේෂයෙන්ම බලාපොරොත්තු වෙන්නේ බඩඉරිඟු වවන්න. බඩඉරිඟු වැවීම සඳහා අවශ්‍ය කරන භූමිය කියලා අඳුරගෙන දැනට පොලොන්නරුව දිස්ත්‍රික්කයේ කන්දකාඩු, අනෙක් පැත්තෙන් මාදුරු ඔය, ඒ වගේම හම්බන්තොට වගේ ස්ථානවල මහවැලි අධිකාරියට අයත් ඉඩම් අසීමිත විදිහට තමන්ගේ දේශපාලන හිතවතුන්ට ලබාදීම සඳහා අලුත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.

දැන් අපි දන්නවා ප්‍රසිද්ධ ආකාරයට රඹකැන් ඔය ජලාශය ආශ්‍රිතව විශාල පරිසර හානියක් වෙලා තියනවා. ඒවා ආදිවාසීන්ගේ ඉඩම්, ඔවුන්ට අවශ්‍ය වැඩකටයුතු කරන්න දෙනවා කියාලා තමයි මහවැලි අධිකාරිය ඒ ඉඩම් පවරා ගත්තේ. නමුත් අද ආදිවාසීන්ගේ ඉඩම්ටික තමන්ගේ කොළඹ හා වෙනත් ප්‍රදේශවලින් ගියපු ව්‍යාපාරිකයන්ට අක්කර 300ක් 200ක් 500ක් වගේ විශාල භූමි ප්‍රදේශයන් වශයෙන් ලබා දීලා තියනවා. මේවා බඩඉරිඟු වවන්න තමයි ලබාදීලා තියෙන්නේ.

### *ඇවන්ගාර්ඩ් ඉඩම්*

වර්තමානයේ මෙවැනි ඉඩම් අල්ලා ගැනීමේ ප්‍රමුඛයෙක් වෙලා ඉන්නේ ඇවන්ගාඩ් අධිපතිවරයා. ඒ වගේමයි දැනට අපි දන්න කාරණාවක් තමයි කොළඹට ආසන්නයේ මුතුරාජවෙල තෙත්බිම නින්දිත ආකාරයෙන් අත්පත් කරගනිමින් ඉන්නවා. විශේෂයෙන්ම මේක කරන්නේ මල්වත්ත වැවිලි සමාගම. මේ රටේ පරිසර විනාශයන් බොහොමයකට වගකියන්න ඕන සමාගම් අයිතිකාරයෙක් තමයි මේක පිටුපස ඉන්නේ. අපි දන්නවා රතුපස්වල, ඊට පස්සේ කුණු කන්ටේනර් ලංකාවට ගෙනාපු එක, ඊළඟට රබර් ෆැක්ටරි එකේ සිද්ධිය, මේ හැම සිද්ධියක් පිටුපසම ඉන්නේ ධම්මික පෙරේරගේ ව්‍යාපාරය. මේ මල්වත්ත වැවිලි සමාගම කියන්නෙත් ඔහුගේ ව්‍යාපාරයක්. මුතුරාජවෙල තෙත්බිම ආශ්‍රිතව අක්කර 600ක් පමණ ප්‍රමාණයක ගොල්ෆ් පිටියක් හා හෝටල් සංකීර්ණයක් සෑදීමට මේ ඉඩම් භාවිතා කරනබව කියනවා. එක පුද්ගලයෙකු රකින්න බොහෝ පිරිසක් අසහනයට පත් කරලා ඔවුන්ගේ අයිතීන් උල්ලංඝනය කරලා. ඒ එක්කම කාදිනල්තුමා වගේ අය මේක ගැන ඉතා බරපතල විදිහට අදහස් ප්‍රකාශ කරලා තියනවා. මෙවැනි පරිසර හානියක් කරන්න එපා කියලා.

### *විල්පත්තුවෙන් ආපු ආණ්ඩුව*

රජය ආවේ විල්පත්තුවට පෙළපාලි ගිහින් පරිසරය රකිනවා යනුවෙන් හඬනගලා. නමුත් සම්පූර්ණයෙන්ම ඒ කාරණාවලට පිටුපාලා තමයි දැන් කටයුතු කරන්නේ. අමාත්‍යවරු මේ පිළිබඳව දැනුවත්ව කාරණා සිදුවෙද්දී ඒවා නොඇසෙන බීරන් ලෙස කටයුතු කිරීම පුදුම සහගතයි. මොකද පරිසරය වෙනුවෙන් හඬනගපු අය දැන් ඒවා ඇහෙන්නේ නැති ගානට පරිසර විනාශය හමුවේ මුනිවත රකිමින් සිටිනවා. ඒ වගේම කියන්න ඕනි සිංහරාජයේ පාරක් පිළිබඳව කතාවක් මතුවෙලා තියනවා, මේ කාරණව ඉතා බරපතළ කාරණාවක්, මේක ලංකාගමින් නතර වෙන්නේ නෑ, මෙය දෙණියාය දක්වා දිවෙන මාර්ගයක් වෙනවා. මේක තනිකරම කරන්නේ නිල්වලා හා ගිංගඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් හැටියට.

උමා ඔය යටතේ බලාපොරොත්තු වුණ ජල ප්‍රමාණය හම්බන්තොටට ගෙනඑන්න බැරි වුණහම දැන් හදනවා නිල්වලා හා ගිං ගංගාවල වැඩි වතුර ප්‍රමාණය හම්බන්තොට ට හරවනවා කියලා විශේෂ ව්‍යාපෘතියක් කරන්න. ඒකට අවශ්‍ය කරන ජල උමඟ හා ජලාශය ඉදිවෙන්නේ දෙණියායට පහළ ප්‍රදේශයේ. ඒ ප්‍රදේශයට අවශ්‍ය ගමනාගමනය සකස් කරන්න තමයි දැනට ලංකාගමින් නතරවෙලා තියන පාර දෙණියාය දක්වා දිගු කරන්න මේ අය බලාපොරොත්තු වෙන්නේ. එක කරුණක් ජනතාවට කියමින් සැබෑ කරුණු හංගමින් කරන මේ පරිසර විනාශය ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා ඉතා විශාල අන්දමින් සිදු වෙනවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/i2tItIFrK7M

https://www.aithiya.lk/rambakan-oya-deforestation-in-sri-lanka-thilak-kariyawasam/

# 57. සුරංගනා කතා කියලා කාන්තාවන් අන්දන්න එපා

**තමාරා දයානි හෙට්ටිමුල්ල**
**ජාතික වෘත්තීය සමිති පෙරමුණ හා වැඩ කරන ජන බලය සංවිධානය**


තමාරා දයානි හෙට්ටිමුල්ල

ඇත්තටම වර්තමාන දේශපාලන තත්ත්වය හා රටේ පවතින මේ ජීවන වියදම පිළිබඳව මං හිතනවා මේ අවස්තාවේ කථා කිරීම කාලෝචිත දෙයක් කියලා. මේ වනවිට සමස්ත රට වැසියන්ටම ඉතාම අවිනිශ්චිත තත්ත්වයකට පත්වෙලා ඉන්නවා, මොකද බහුතර බලයෙන් පත් කරගත්ත නායකයා රටවැසියාව පහත් කොට සලකනවා, නැතිනම් නොසලකා හරිනවා. ඒනිසාම මං හිතන්නේ වැඩ කරන ජනතාව විදිහට රාජ්‍ය සේවය, අර්ධ රාජ්‍ය සේවය, පෞද්ගලික අංශවලින් සමස්තයක් විවිධ දුෂ්කරතාවලට, අපහසුතාවලා ලක්වෙලා තියනවා.

*ජීවන වියදම*

ජීවන වියදම ගත්තහම මේ රජය ඇවිල්ලා දැන් අවුරුදු එකහමාරක් පමණ වෙනවා, කිසිම දිරි දීමනාවක් වැටුප් වැඩි වීමක්, සමස්ත සේවාවන්වලටම කරලා නෑ. ඒ මදිවට කොරෝනාවත් සමග මිනිස්සු විශාල දුෂ්කරතා මැද්දේ ජීවත් වෙන්නේ. ඒ වගේම පෞද්ගලික අංශයේ 50%කට ආසන්නව රැකියා අහිමි වෙලා තියනවා. ඒ විතරක් නෙවෙයි සමහර සේවා ස්ථානවල වැටුපෙන් අඩයි ගෙවන්නේ. දීමනා කප්පාදු කරලා තියනවා. රාජ්‍ය ආයතනයවලත් තත්ත්වය එහෙමයි. අතිකාල දීමනා පවා කප්පාදු කරලා තියනවා. ඒ වගේම අනෙකුත් පහසුකම් මේ වෙද්දී ඉවත් කරලා තියනවා.

ඉතින් මේ හේතුමත දිනෙන් දින මිනිස්සුන්ට ලැබෙන්න තියන දේවල් අහිමි වෙමින් තියනවා. ඒ වගේම බඩු මිල අහස උසට නගිමින් තියනවා. බොහොම සුන්දරව අපේ බන්ධුල ගුනවර්ධන මැතිතුමා පවසනවා හාල් 98ට දෙනවා, පොල් 100ට අඩුවෙන් දෙනවා, කිරිපිටි මිල අඩු කරනවා කියලා, නමුත් කිසිම වෙළෙඳසැලක සතොසක පවා ඔය සඳහන් කරන මිලට නම් බඩු ගන්න ලැබෙන්නේ නෑ. ලංකාවේ ජනගහනයෙන් වැඩිම ප්‍රතිශතයක් ඉන්නේ කාන්තාවෝ, අපි දැක්කා ඔවුන් පසුගිය දවස්වල කාන්තා දිනය සමරනවා, මං ඔවුන්ගෙ න් අහන්නේ හිරිකිතයක් නැතුව මෙහෙම කාන්තා දිනය සමරන්න පුලුවන්ද කියලා. මොකද මේ වෙනකොට අපි දන්නවා හැමතැනම කාන්තාවන්ගේ දුක් ගැනවිලි. ආර්ථිකයේ වේදනාකාරී හැඟීම් දැනෙන්නේ කාන්තාවන්ට. අගහිඟකම් දැනෙන්නේ කාන්තාවන්ට, එහෙම නම් උපයන වැටුපට සරිලන ජීවත් වෙන්න බැරි තත්වයක් උදා වෙලා තියනවා.

අද දෙමාපියන්ට ළමයින්ගේ අධ්‍යාපනයට මුදල් යොදන්න බැරි තත්වයක් උදාවෙලා තියනවා. රැකියා නැතිකම, තමන්ගේ ස්වයං රැකියා කරගන්න බැරිකම, දීමනා අඩුකම නිසා විශාල වශයෙන් කාන්තාවෝ දරිද්‍රතාවට පත් වෙලා තියනවා. මට මේ සම්බන්ධයෙන් තියෙන්නේ විශාල කලකිරීමක්. අපි වෘත්තීය සමිති වශයෙන් ආණ්ඩුවට බලකර සිටිනවා රටේ ආර්ථිකය ගැන මීට වඩා පුළුල්ව හිතලා ජනතාවට පිහිට වෙන්න කියලා. මිනිස්සුන්ගේ දුක හඳුනන රජයක් අපිට ඕනෑ. කාන්තාවගේ දෑත් ශක්තිමත් කරනවා කියලා, රටේ ආර්ථිකය ස්වයංපෝෂිත කරනවා කියලා, දුන්නු පොරොන්දු ඉටු කරන්න. ණය ගන්න තත්ත්වයට ඔවුන් පත්කරන්න එපා. අපි දන්නවා මේ වෙලාවේ ඇඟළුම් අංශවල තියෙන දුක් වේදනාව, ඒ වගේම මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය පිළිබඳව තියන අඳෝනාව, ඒ විතරක් නෙවෙයි වතුකරේ මිනිස්සුන්ගේ අඳෝනාව. අපි රජයට කියන්නේ සුරංගනා කතා කියලා මිනිස්සුන්ව රවට්ටන්නේ නැතුව මේ පිළිබඳව හොයා බලලා කටයුතු කරන්න කියලා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/aCbciA_qs2c

https://www.aithiya.lk/cost-of-living-in-sri-lanka-economy-issues/

# 58. මේකට අවශ්‍ය මහජන සෞඛ්‍යය ප්‍රතිචාරයක්

## පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හරිනි අමරසූරිය

*මර්දනය කැඳවා ගන්නේ අපි*



පාර්ලිමේන්තු මන්ත්‍රී
ආචාර්ය හරිනි අමරසූරිය

අපි හරියට ප්‍රශ්නෙ තේරුම් ගන්න එක අත්‍යවශ්‍යයි, අපේ ඉතිහාසය තුළම රාජ්‍ය පිහිටවෙලා තියෙන්නෙ එහෙම නැත්නම් රාජ්‍ය ක්‍රියාත්මක වෙන්නේ කා වෙනුවෙන් ද කියනඑක ගැන අපි හිතන්න ඕනේ. අපේ රාජ්‍ය ව්‍යුහය, රාජ්‍ය ස්වභාවයම තියෙන්නෙ බලවතුන්ව ආරක්ෂා කරන තැනක. ඒක පිළිගන්න සමාජයක් අපි තුළ තියෙනවා. එතකොට අර බලවතුන් එක්ක තියෙන සම්බන්ධතාවය හරහා තමයි අපිට යුක්තිය ළඟා කරගන්න පුලුවන් කියන එකතමා පොදුවේ හිතන්නේ. නැත්තං අපිට පුරවැසියන් හැටියට කෙලින්ම අයිතියක් තියෙනවා යුක්තිය වෙනුවෙන්, යුක්තිය ඉල්ලා සිටින්න කියන ඒ ආකල්පයක් අපේ තුළ නැහැ කියලා මට හිතෙනවා. පුරුදුවෙලා තියෙන්නෙ රජය තියෙන්නේ, නීතිය තියෙන්නෙ, ආයතනය තියෙන්නේ බලවත්තු රැකගන්න. එතකොට අපේ මොකක්හරි අවශ්‍යතාවයක් ඉටු කරගන්න පුළුවන් වෙන්නේ ඒ අය හරහා සම්බන්ධතාවයක් හදාගෙන කියලා අප තුළ අදහසක් තිබෙනවා. ඔන්න ඕක වෙනස් වෙන්න ඕන. මේ තුළින් තමයි අපේ මර්දනකාරී, අත්තනෝමතිකව හැසිරෙන දේශපාලනඥයින්යින් සහ මේ රාජ්‍ය ව්‍යුහය පවත්වාගෙන යාමට සමාජ අනුමැතිය ලැබිලා තියෙන්නේ. මං හිතන්නේ අපි වෙනස් කළ යුත්තේ මේ සමාජ අනුමැතියයි.

## හැමෝටම ආපහු එන්න පුලුවන් වැඩසටහනක් ඕනෑ

රට ඉඳලා එන්න ගියාම ටිකට් එකයි නිරෝධායනය, පීසීආර් ටෙස්ට්එක, ඔක්කොම ගත්තහම ලක්ෂ 4ක් 5ක් යනවා. ඒක ගෙවන්න පුළුවන් උදවියට තමා වැඩි අවස්ථාවක් තියෙන්නේ ආපහු රටට එන්න. ගෙවන්න බැරිඅයට ඒ අවස්ථාව නෑ. අපි හැමෝම ගෙන්නනො කියලා කියනවා. හැබැයි ඇත්ත වශයෙන්ම ප්‍රායෝගිකව සිද්ධවෙන්නේ ගෙවන්න පුළුවන් අය තමයි ගෙන්න ගන්නෙ. අපි මතු කරන්න හදන්නේ මේක ගෙවන්න පුළුවන් අය නෙවෙයි හැමෝටම ආපහු එන්න පුලුවන් වැඩසටහනක් තමයි අවශ්‍ය වන්නේ කියනඑක. විශේෂයෙන්ම මුදල ගෙවන්න බැරි අයට මොකද්ද ගන්න ක්‍රියාමාර්ගය කියලා රජය පැත්තෙන් කියන්න ඕනෑ.. විදේශගත ශ්‍රමිකයන්ගේ මුදල් සහ ආයෝජනවලින් තමයි මේ රට දුවන්නේ. කම්කරු අමාත්‍යංශයට සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශයට සල්ලි නැතුව නෙවෙයි. මුදල් තියෙනවා. මුදල් තියාගෙන ඉඳලා හරියන් නෑනේ මේ අපදාව වෙලාවේ, ඒ සල්ලි මේ වෙලාවේ මිනිස්සු වෙනුවෙන් වැයවෙන්නේ නැත්නම් වැඩක් නෑ.

## මේක සෞඛ්‍ය ප්‍රශ්නයක්

ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්ණයක් නෙවෙයි මේක, මේක සෞඛ්‍ය ප්‍රශ්නයක්. වසංගත තත්ත්වයකට අපි මුහුණ දෙන විදිය වෙනස් විය යුතුයි. සමාජයීය පැත්තක් තියෙන, මානුෂීය පැත්තක් තියෙන දේකට, public health crisis එකට ආරක්ශිත security response එකක් දෙනවා කියන එකේම තියෙනවා ලොකු ප්‍රශ්නයක්. මේකේ තියෙන සංකීර්ණත්වයවත් තේරුම් ගන්න බැරුව, මේකේ තිබෙන විවිධ පැතිකඩ තේරුන්ගන්න බැරුව ඒවාට ප්‍රතිචාර දක්වන්න බැහැ. මේකට අවශ්‍ය ඇත්තටම මහජන සෞඛ්‍යය ප්‍රතිචාරයක්. ඒක තමා මුලින්ම විය යුත්තේ. අවාසනාවකට ඒක වෙන්නේ නෑ. ඒ නිසා තමයි මේක මෙච්චර ජරමරයක් බවට පත්වෙලා තියෙන්නෙ. සෞඛ්‍ය පද්ධතිය සහ ආරක්ෂක පද්ධතිය අතර තියෙන නොගැලපීම නිසා මේක ව්‍යාකූල වෙලා. අපි ආරක්ෂක අංශවලට දොස් කියලා බැහැ. මේක ඔවුන්ගේ කලාපය නෙවෙයි, සෞඛ්‍ය අංශවලින් කියනඑක ක්‍රියාත්මක කිරීම මිසක් ඒක පිළිබඳව තීරණ ගැනීම ආරක්ෂක අංශවලට කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. ඒක අපි පිළිගන්න ඕනෑ.

ඔබ ඇහුව ප්‍රශ්නය තමයි මේකට මධ්‍යම පාන්තික විරෝධයක් නැත්තේ ඇයි කියලා, ඒක දැනටමත් ඇවිත් තියෙන්නේ. මධ්‍යම පන්තියට මේක දැනෙන්නෙ බොහොම වෙලාවට ඔවුන්ට බලපාන මොහොතේ. දැන් ඒකත් තමන්ට බලපාන තැනට ඇවිල්ලා. අපිට පිළිගන්න වෙනවා මේක දැන් official අපිට කිව්වද නැද්ද, මේක අර පොකුර ද නැද්ද, පෑලියගොඩ පොකුර ද? මොන පොකුණ ද? කියලා වැඩක් නැහැ. මේක දැන් ව්‍යාප්තවෙමින් යනවා, ඒ කියන්නේ තවදුරටත් මේක පැතිරෙන්නේ විශේෂ ප්‍රජාවන් අතර විතරක් නෙවෙයි, පොදුවේ අපි ඕන කෙනෙක්ට දැන් මේකට මුහුණ දෙන්න වෙලා තියෙන්නේ. දැන් මධ්‍යම පන්තියට තේරෙන්න පටන්ගනී මේකෙ තියෙන බැරෑරුම්කම. මේකට මේ විදියට ප්‍රතිචාර දක්වලා අපිට මේක විසඳන්න බැහැ කියලා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/dfh9TihJqGE

https://www.aithiya.lk/sri-lankan-migrant-workers-harini-amarasuriya-npp/

# 59. පුවත්පත් මණ්ඩලය මොකද්ද? කුමක් සඳහා ද?

## නීතිඥ විරංජන හේරත්


නීතිඥ විරංජන හේරත්

මේ වනවිට ආණ්ඩුව ප්‍රකාශ පත් කරලා තියෙනවා ඔවුන් විසින් කැබිනට් තීරණයක් අරගෙන තියෙනවා කියලා 1973 ස්ථාපිත කරනලද පුවත්පත් මණ්ඩල පනත, විද්‍යුත් සහ සමාජ මාධ්‍යයටත් බලපාන පරිදි සංශෝධනය කරන්න. මෙතනදී පැහැදිලි නැහැ කුමක්ද මෙහි අදහස කියලා. නමුත් අපි දන්නවා පුවත්පත් මණ්ඩල පනත ක්‍රියාත්මක වෙන්නේ, පුවත්පත් නියාමනය කිරීම සහ ඊට අදාල ආචාරධර්ම පවත්වාගෙන යෑම, මාධ්‍ය නිදහස පවත්වාගෙන යෑම ආදී වශයෙන් වූ වචනවලට මුවාවෙලා. මෙමගින් පුවත්පත් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී තිබෙනවා. පුවත්පත් මණ්ඩලයක් ඒ සඳහා හඳුන්වා දී තිබෙනවා. ඉතින් මේ සංශෝධනය කුමන ආකාරයට ක්‍රියාත්මක වෙනවාද කියන එක පැහැදිලි නැතිවුණත් මේ පැවසෙන ආකාරයට අපට පෙනීයන්නේ මේ පුවත්පත් මණ්ඩලය යම් සංශෝධනයක් කරල සමාජ මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය ආවරණය කිරීමේ අවස්ථාවක් ලබාදෙන්න තමයි මේ හදන්නේ. ඒ අර්ථයෙන් මෙහි තිබෙන බලතලවල පුලුල් කිරීමක් තමයි මේ කරන්න හදන්නේ.

*මොකක්ද?*

මෙතන තියෙන ගැටලුව තමයි මේ පුවත්පත් මණ්ඩල පනත කියනඑක මොකක්ද කියලා අපි හරියට අඳුරගෙන තිබෙනවද කියන කාරණය. මේක හරි සරලව ගත්තොත් 1973 ගෙනාපු පනතක්. 1973 වෙනකොට කිසිම මාධ්‍යයක් තිබුණෙ නැහැ පුවත්පත් හැර. ගුවන් විදුලිය රාජ්‍ය

මට්ටමින් තිබුණා රූපවාහිනිය තිබුණෙ නැහැ, සමාජ මාධ්‍ය තිබුණෙ නැහැ. ඉතින් පුවත්පත් සඳහා ගෙනාපු පනතක් ඒ විදිහටම පොඩි සංශෝධනයකින් සමාජ මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍යවලට අදාළ කරගන්න පුලුවන්ද කියන කාරණය මූලිකවම බලපානවා මෙතනදි. ඇත්තටම එහෙම බැරි කාරණා ගොඩක් තියෙනවා මේ පනත ඇතුලේ. අදහස මෙයනම් එය නොගැළපෙන බව තමයි කියන්න තියෙන්නේ. සුළු සංශෝධනයකට මෙය යටත් කරගන්න බැහැ. ඒ වගේම මේ පනත ගත්තම මෙහි ගොඩක් ගැටලුකාරී තැන් තියෙනවා.

අපි තියෙන අයහපත් ලක්ෂණ ගැන කතා කරනවා නම් පුවත්පත් මණ්ඩලයක් පවත්වා ගෙනයෑම ප්‍රධානයි. මේ පුවත්පත් මණ්ඩලයට පුද්ගලයන් 7 දෙනෙක් පත් කරනවා සාමාජිකයන් ලෙස. එක්කෙනෙක් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා. සෙසු හයදෙනා පත් කරන්නේ ජනාධිපතිවරයා. එයින් එක් පුද්ගලයෙක් මාධ්‍යවේදීන් නියෝජනය වෙන්නත්, අනිත් කෙනා මාධ්‍ය සංවිධාන නියෝජනය වෙන්නත් පත් කරනවා. නමුත් මේ හයදෙනාම පත්කරන පත්වීම් බලධාරියා වෙන්නේ ජනාධිපතිවරයා. ඊළඟට අපි දන්නවා ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා නිළ බලයෙන් පත්වෙන බව, ඔහු එම තනතුරට පත්කරන්නේ කවුද? ඔහු පත්කරන්නේ ජනාධිපති. ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන හයදෙනෙකු, රජයේ නිලධාරියෙකුගෙනුත් සමන්විත රජයේ මණ්ඩලයක් තමයි මේ මණ්ඩලය. අවසන් විග්‍රහයේදී ජනාධිපතිවරයා විසින් පත් කරන මණ්ඩලයක් කියලා කියන්නත් පුලුවන්.

*මොකටද?*

එතකොට පැමිණිලි විභාග කිරීම, අදාළ තීන්දු තීරණ ගැනීම, සියල්ල කරන්නේ මේ මණ්ඩලය. ඉතින් මේවගේ මණ්ඩලයකට විද්‍යුත් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය පාලනය කරන්නට නියාමනයට ඉඩදීම කොච්චර දුරට මාධ්‍ය නිදහස පැත්තෙන් ගැළපෙන කාරණාවක් ද කියනඑක අපි අමුතුවෙන් සඳහන් කරන්න ඕනේ නැහැ. ඒ වගේම අපි පනතට අදාළව තියෙන වගන්ති දිහා බැලුවොත් මෙහි එක වගන්තියක සඳහන් වෙනවා මෙහි නියෝග, ඒ කියන්නේ පුවත්පත් මණ්ඩලය මගින් සිදුකරන නියෝග/නියෝගයක් අවසානාත්මක නියෝගයක් කියලා. එහි අදහස තමයි මේ නියෝගය වෙනත් කිසිඳු අධිකරණයක

ප්‍රශ්න කරන්න බැහැ කියලා කියනඑක. එහෙම අභියාචනා ඉදිරිපත් කරන්න අවස්ථාවක් තියෙන ක්‍රමයක් මේක තුළ නැහැ. ඒ වගේම අවසානාත්මක නියෝග දෙන්න පුළුවන් මණ්ඩලයකට මේ වගේ මාධ්‍ය නියාමනය භාර කරනඑක කොච්චර දුරට සාධාරණ ද?

ඊළඟ කාරණාව, මේකට පුළුවන් එක්තරා ආකාරයකට තියෙන වැරදි සම්බන්ධයෙන් තම තමන්ට ඉදිරිපත්වෙලා හරි, නැත්නම් ලැබෙන පැමිණිලි මත හරි නඩු ආරම්භ කරන්න සහ විභාග කරන්න. පැමිණිලි විභාග කිරීමේ බලයේ දී ඔවුන්ට අවස්ථාව තියෙනවා යම් යම් නියෝග දෙන්න, වැරදිකරුවන් බවට පත් කරන්න පුද්ගලයින්ව, තීන්දු තීරණ ක්‍රියාත්මක කරගන්න නියෝග දීමේ බලයක් තියෙනවා. උදාහරණයක් විදියට කියනවා නම් සදාචාරයට විරුද්ධ දෙයක් සම්බන්ධයෙන් පුවත්පතක යම් තොරතුරක්, ලිපියක් විශේෂාංගයක්, පළ වුණොත් ඒ සම්බන්ධයෙන් වැරදි දෙයක් වෙලානම් එය සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ නියෝගයක් නිකුත් කරන්න පුළුවන්. ඒවගේම ඒ සම්බන්ධයෙන් දඬුවම් ලබා දෙන්නත් පුලුවන්. එතනදී කියනවා මේ මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යන්නේ දිසා අධිකරණයක බලතල සහිතව කියලා.

### *දරුණු ස්වභාවය*

මේ මණ්ඩලයට දෙන්න පුලුවන් දඬුවම් ගැන තවත් කතා කළොත්, වසර දෙකකට නොවැඩි සිරදඬුවම් නියම කිරීමේ බලය එහෙම නැත්නම් රුපියල් 5000කට නොවැඩි දඩයක්, එහෙම නැත්නම් මේ දෙකම හෝ නියම කිරීමේ බලය මේ පනත මගින් මේ මණ්ඩලයට තියෙනවා. ජනාධිපතිවරයා පත්කරන මණ්ඩලයක් වීම, මේ වගේ බලතල තියෙන එක, තීන්දු තීරණ ගැන අභියාචනය කරන්න බැරි වීම, වැනි කාරණා එක්ක බලනකොට අපිට පෙනෙන්න ඕනෑ මේ පනත තිබෙන දරුණු ස්භාවය ගැන. මේ මණ්ඩලය දෙන නියෝගවලට අවනත නොවුනොත් එය ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කිරීමක් සේ සලකා කටයුතු කිරීමට අවස්ථාව තියෙනවා. අපි දන්නවා ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කිරීම වුවත් විධිමත් ලෙස නීති පද්ධතියකින් ස්ථාපිත කළ තත්ත්වයක් නෙමෙයි. එයට දෙන දඬුවම ගැන වුණත් නිශ්චිත නීතියක් නැහැ. ඉතින් එහෙම පසුබිමක් ඇතුලේ

මම පැහැදිලි කළේ සරලවම අපට හඳුනා ගන්න පුළුවන් අඩුපාඩු සහ තියෙන දුර්වලතා. ඒ වගේම මාධ්‍ය නිදහසට අහිතකර බවට හඳුනා ගන්න පුලුවන් තැන් කිහිපයක්. ප්‍රකාශනයේ සහ භාෂණයේ නිදහසට, මාධ්‍ය නිදහසට, බලපාන ඒවා අහිමි කරවන තත්ත්වයන් මේ පනත ඇතුලෙ තියෙනවා. සමස්තයක් විදිහට ගත්තහම මේ පනත යල්පැන ගිය ඉතා පැරණි අදට නොගැළපෙන පනතක්. ඉතින් පුවත්පත් සඳහා 1973 ගෙනාපු මේවගේ පනතක් අද විද්‍යුත් මාධ්‍යයටත් අදාළ වෙන පරිදි, ඒ වගේම සමාජ මාධ්‍යයටත් අදාළ වෙන පරිදි, යම් සංශෝධන කිහිපයක් ගෙනල්ලා සංශෝධනය කිරීම තුළ තියෙන්නේ, හොඳකට වඩා අනතුරක්. ඒ නිසා මගේ ස්ථාවරය නම් මේ පනත සංශෝධනය කිරීම නෙමෙයි කළ යුත්තේ අහෝසි කිරීමයි කරන්න අවශ්‍ය.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**


https://youtu.be/2giv3kk1DXg

https://www.aithiya.lk/sri-lanka-press-council-viranjana-herath/

# 60. මාධ්‍ය සංවිධානවල නිදහස ගැන විතරක් කතා කරන්න එපා

## මාධ්‍යවේදී කපිල එම් ගමගේ

*ජඩ මාධ්‍ය ද? ජන මාධ්‍ය ද?*



කපිල එම් ගමගේ

ලංකාවේ මාධ්‍ය තේරුම් ගැනීමේදී, මාධ්‍යයේ ස්වරූපය ඉස්සෙල්ලාම අවබෝධ කරගන්න ඕන. ඒ තමයි ලංකාවේ මාධ්‍ය ප්‍රධාන වශයෙන්ම ධාරාවන් දෙකක් තියෙනවා. ආණ්ඩුව සතු මාධ්‍යය සහ පෞද්ගලික ව්‍යාපාරිකයන් සතු මාධ්‍යය. මේක පුවත්පතේ, ටෙලිවිෂනයේ සිට වර්තමානය වෙනකොට නව මාධ්‍ය දක්වාම විහිදෙනවා. දැන් මේවා හැමවෙලේම වැඩ කරන්නේ ඒගොල්ලො විසින් ගොඩනගන ලද න්‍යාය පත්‍රයකට අනුව. ආණ්ඩුවේ මාධ්‍ය අපි උදාහරණයකට ගත්තොත් ඔවුන් හැම වෙලාවෙම බලයේ ඉන්න රජයේ බල ව්‍යාපෘතිය වෙනුවෙන් බලය තහවුරු කරගැනීම කියන කාරණය පදනම් කරගෙන තමයි වැඩ කරන්නේ. පෞද්ගලික මාධ්‍ය ගත්තොත් මේවට ආයෝජකයින් විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරන්නේ නිකමට නෙමෙයි. ඒකෙන් කිසියම් ආකාරයක ප්‍රතිලාභයක් බලාපොරොත්තුවෙනවා ඔවුන්. ඊළඟ කාරණය තමයි ඔවුන් සමාජ පිළිගැනීමට අවශ්‍ය උපකරණක් හැටියට මේක පවත්වාගෙන යනවා. එතකොට මේකේ තියෙන්නේ ජනතා කේන්ද්‍රීය එහෙම නැත්නම් ග්‍රාහක කේන්ද්‍රීය අරමුණක් නෙමෙයි. ඒ අරමුණු දෙකම ග්‍රාහක ප්‍රතිවිරෝධයක් හදන අරමුණු දෙකක්.

මේ නිසා තමයි ලංකාවේ සමාජයේ අපි දකින්නේ නැත්තේ ග්‍රාහකයාගේ පැත්ත එහෙමත් නැත්තම් අසන්නා, කියවන්නා,

නරඹන්නාගේ පැත්තේ ඉඳලා මාධ්‍ය ආයතන වැඩ කරනවා. සමාජය තුළ ඒ කියන්නේ මේවා පිළිබඳව කිසියම් අවබෝධයක් තියෙන කණ්ඩායම් ටිකෙන් ටික මේ මාධ්‍යවලට තමන්ගේ විරෝධය පාන්න ගන්නවා. ඒ නිසා තමයි ජනමාධ්‍ය, ජඩමාධ්‍ය කියන තැනකට වචනය පවා විකෘති කරන්නේ. මේ ආයතනවල මාධ්‍යකරණයන් ගැන හිතන්නකෝ, මොවුන් යම් යම් සිද්ධි වාර්තා කරන්නේ හරිම මානව විරෝධී විදිහට. ඒකේ ඇත්තකුත් තිබෙනවා. උදාහරණයක් ගත්තොත් කිසියම් නාළිකාවක ප්‍රවෘත්ති ප්‍රකාශයක් ගම්මු. ඒක කොච්චර දුරකට හානි කරනවද මිනිස්සුන්ට කියනඑක හරිම ගැටලුවක්. බලන්න මේ වසංගත තත්ත්වය අපේ මාධ්‍ය කොහොමද වාර්තා කළේ? ඒ වාර්තා කළ විදිහ හරිම වැරදියි නේ. මානව විරෝධී විදිහට නේ ඔවුන් මේ තොරතුරු ජනතාව වෙත අරගෙන ගියේ. වෛරස් එක වැළඳුන මිනිස්සු පිටිපස්සේ එළවගෙන යනවා, ඒ මිනිස්සුන්ව මාධ්‍යට නිරාවරණය කරනවා, මාධ්‍යයේ තිබෙන මූලික ආචාර ධර්මීය කාරණාවත් පිළිපදින්නේ නැති තැනකට ආවානේ මේ මාධ්‍ය. මේක අඩු වැඩි වශයෙන් දීර්ඝ කාලයක් පුරා තිබ්බ දෙයක්, දීර්ඝ කලයක සිට වර්ධනය වුණ දෙයක්. අතීතයෙත් මේක මෙහෙම තමයි. හැබැයි මෙතරම්ම උඩුදුවපු ප්‍රශ්නයක් වුණේ නැහැ. දැන් තත්ත්වය බරපතළයි. යම් නියාමන යාන්ත්‍රණයකට නොගියොත් මෙතනින් එහාට මේකට යන්න බැහැ.

### *මාධ්‍ය නියාමනයක් අවශ්‍යයි*

අවුරුදු 35ක් විතරවෙන මගේ මාධ්‍ය ජීවිතේ මම ලබපු අත්දැකීම් එක්ක මගේ ස්ථාවරය තමයි ලංකාවේ මාධ්‍ය නියාමනය විය යුතුයි කියන එක. ඒ සඳහා යම් ආයතනයක් බිහිවිය යුතුයි. මම මේක දැනට අවුරුදු 10ක 15ක ඉඳලා කියමින් ඉන්න දෙයක්. ඒ වගේම මම ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා. ලංකාවට අයිති 86 ඉඳලා 108 දක්වා වන සංඛ්‍යාත වර්ණාවලිය මහජන දේපලක්. මේක නඩුවකිනුත් ඔප්පු වුණා. තිලක් ජයරත්න මහත්තයා අධ්‍යාපන සේවයේ ඉන්නකාලේ අධ්‍යාපන සේවය වැහුවහම අසන්තෙක් නඩුවක් දැම්මා, මේ නඩුව අසන්නා දිනුවා. ඒ දිනීම හරහා කිව්වේ මේ සංඛ්‍යාත, මේවා කුළියට ගන්න මිනිස්සුන්ට ඕනෑ විදිහට භාවිතා කරන්න බැහැ කියලා. ඒ භාවිතාවන් ප්‍රශ්න කිරීමේ ශුද්ධවූ අයිතියක් පුරවැසියාට තියෙනවා කියනදේ තමයි

ඒ නඩු තීන්දුවෙන් කියවුණේ. ජනතාවට මේවා ගැන අවබෝධයක් නැහැ. ජනතාව මාධ්‍යයේ තියෙන විසිතුර දකින්න විතරයි කැමති. මේ විසිතුරට යටින් තියෙන සත්‍ය අපි ඉක්මනින් තේරුන් ගත්තේ නැත්තං අපි අගාධයට තමයි යන්නේ. මාධ්‍යයේ නිදහස වෙනුවෙන් පෙනී සිටින ආයතන සහ සංවිධානවලට වුණත් මේක නැහැ. මම මේ මාධ්‍ය සංවිධානවලට කියන්නේ මාධ්‍ය සංවිධානවල නිදහස ගැන විතරක් කතාකරන්න එපා, ඒක ඒකපාර්ශිකයි. මහජනතාවට නිවැරදි තොරතුරු දැනගැනීම තිබෙන අයිතිය වෙනුවෙන් මාධ්‍ය සංවිධාන පෙනී සිටිය යුතුයි. එහෙම පෙනී සිටින මාධ්‍ය සංවිධානයක් කෝ තියෙනවද?

### *වල් බූරු නිදහස*

ජනමාධ්‍ය ආයතන මාධ්‍ය නිදහස අද වල් බූරු විදිහට තමයි භාවිතා කරන්නේ. කවුරු හරි මනුස්සයෙක් මේක ප්‍රශ්න කරපු ගමන් ඔහුගේ මුහුණ රවුම් කරලා දානවා එච්චරයි. ඒ විදිහට තමයි ඔවුන් ඒක කවුන්ටර් කරන්නේ. ස්ත්‍රී දූෂණයක් වගේ දෙයක් ජනමාධ්‍ය වෙත ගෙන ඒමේදී ඒකට යම් ආකාරයක සීමාවන් තබාගත යුතුයි. ළඟම රට ඉන්දියාවවත් මේ තරම් ජරාවිදිහට මාධ්‍ය භාවිතා කරන්නේ නැහැ. අඩුම වශයෙන් දූෂණයට ලක්වුණ කාන්තාවකගේ රූපයක්වත් පෙන්වන්නේ නැහැ. සැබෑ නමවත් කියන්නේ නැහැ. අන්වර්ථ නාමයකින් තමයි ඔවුන් කරුණු වාර්තා කරන්නේ. ඉන්දියාවේ වෛද්‍ය ශිෂ්‍යාවක් දූෂණය කරලා මරපු වෙලාවේ තාත්තා තමයි දුවගේ සැබෑ නම හෙළිකරන්නේ, මාධ්‍ය නෙවෙයි. ලංකාවේ එහෙමද? මියගිය මිනිස්සු විනාශ වුණ මිනිස් සිරුරු පෙන්වනවා, ලෝකයේ පිළිගත්ත ජනමාධ්‍ය ආචාර ධර්මවලට අනුව වින්දිතයා නිරාවරණය කරන්න එපා වින්දිතයාගේ ආශ්‍රිතයන් නිරාවරණය කරන්න එපා කියලා තමයි කියන්නේ. ජන මාධ්‍ය ආචාර ධර්මවල එක තැනක තියෙනවා කිසිම තැනක කැමරාවක් හෝ මයික් එකක් ඉදිරියේ මිනිහෙක් අඬවන්න එපා කියලා. මේවා එක්ක අපේ මාධ්‍ය භාවිතාවන් ගැන හිතලා බලන්නකෝ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/J-b7hSxK08A

https://www.aithiya.lk/journalism-and-media-ethics-in-sri-lanka-kapila-m-gamage/

# 61. සිවිල් සමාජය තරුණ ප්‍රජාව අතරට යා යුතුයි

## මානවහිමිකම් ක්‍රියාකාරී සුරේෂ් නඩේෂන්

***මානව හිමිකම් ක්‍රියාකාරිකයෙක් විදිහට සමාජය එක්ක ගණුදෙනු කරන කොට ඔබට අත් දකින්න ලැබුණ දේවල් මොනවාද ?***



සුරේෂ් නඩේෂන්

ඡන්දදායකයාට වගකියන වගකීමෙන් යුතු දේශපාලන සංස්කෘතියක් තමයි රට තුළ බිහි වෙන්න ඕන. 19වන ව්‍යවස්ථා සංශෝධනය ගේන්න පුරවැසියාගේ සහභාගිත්වය 85%ක වගේ ප්‍රමාණයක් තිබුණා. නමුත් ඒ ගැන අපි වැඩි කතාබහකට ගියේ නැහැ. මේ ක්‍රියාවලියේදී ප්‍රායෝගිකව අපි කරපු දේවල් බොහෝ දුරට අඩු ප්‍රමාණයක්. දැන් ආණ්ඩුව පාර්ලිමේන්තුවට වගකියන ක්‍රමයෙන් ඈත් වෙලා එක්තරා විදිහකින් වැඩි බලයක් සහිත අධිකාරියක් උඩ පාලනය කරන ක්‍රමයකට ලංවෙලා තියෙනවා. අපි වගේ පුංචි රටකට එවැනි තත්ත්වයක් අවශ්‍ය නැහැ. මං හිතනවා මේ 20වැනි සංශෝධනය නිසා නැවතත් අපි පසුගාමී තත්ත්වයකට පත්වෙනවා. ඒත් අපේ අරගලය වෙනස් වෙන්නේ නැහැ, අපි බලන්න ඕනේ මේ රටේ සුළුතර ජනතාව කොහොමද සහභාගීත්ව ප්‍රවේශයට ගේන්නේ කියලා. එයාලගේ අයිතිවාසිකම් පැත්ත බලන්න අවශ්‍යයි. එක එක ව්‍යුහයන් හරහා බලන්න ඕනේ ඒ අයිතිවාසිකම් පැත්ත කොහොමද දියුණු කරන්නේ කියලා. 20වැනි සංශෝධනයේ අරමුණ මේවා නැවත යථා තත්ත්වයට ගේන්න බැරි පරිසරයක් ගොඩ නැගීම. දිගු කාලයකට පස්සේ 2016 - 2019 කාලසීමාව තුළදී තමයි සුළු ජන කණ්ඩායම්වලට හොඳ අවස්ථාවක් ලැබුණේ. එක්තරා විදිහකින් සුළුතර ජන කණ්ඩායම සංවර්ධන ප්‍රවේශයකින් හා රට

ඉදිරියේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින්න පුළුවන් කැමැත්ත ඔවුන්ගේ වැඩිපුර තිබුණා. මම සුළුතර ජන කණ්ඩායම නියෝජනය කරන කෙනෙක්, මම වතු කම්කරුවෙක්ගෙ දරුවෙක් විදිහට අවුරුදු දෙසීයකට එහා ඉතිහාසයක් තිබෙන ප්‍රශ්නයක කොටස්කාරයෙක්. කාලෙකට පස්සේ වතුකරයේ ජනතාව තමන්ගේ අභිලාෂ ඇතුලු කරන්න පුළුවන් ව්‍යවස්ථාවකට අදහස දුන්නේ ප්‍රථම අවස්ථාවට, ඒ 19 වැනි සංශෝධනයට. එතකන් එයාලට ව්‍යවස්ථාවකට තමන්ගෙ අභිලාෂයන් ඇතුල් කරන්න වේදිකාවක් තිබුණෙ නැහැ. 2018 - 2019 කාලෙ තමයි එයාලට ඒ අවස්ථාව ලැබෙන්නේ. මේක ඓතිහාසික මොහොතක්. විශේෂයෙන්ම එක්තරා ජන කණ්ඩායමකට ආර්ථික සමාජීය සංස්කෘතික වශයෙන් ඒගොල්ලොන්ගේ අදහස් ව්‍යවස්ථාවට ඇතුල් කරගන්න පුළුවන් වේදිකාවක් නිර්මාණය වීම තමයි මං හිතන්නේ රටට ගැළපෙන ව්‍යවස්ථාව. මං හිතන ඒ අවස්ථාවත් දැන් ඉවරයි.

*නැවතත් අලුත් ව්‍යවස්ථාවක් සඳහා අලුත් කමිටුවක් ජනාධිපතිවරයා විසින් පත්කරලා තිබෙනවා ඒ කමිටුව ගැන විශ්වාසයක් නැද්ද?*

අපි ඉස්සෙල්ලා බලන්න ඕනෑ මේ කමිටුව ගැන. ඒකෙ ඉතිහාසය පිළිබඳව. ඒ ප්‍රධානීන්ගේ ප්‍රතිරූපය හා ඒ කමිටුව තුළ ඔවුන් වැඩකරන ආකාරය. අපට හොඳටම පැහැදිලියි කලින් තිබුණු ලාල් විජේනායකගේ කමිටුව, විවෘතව සුළුතර ජනතාවගේ අදහස් එකතු කරන්න පුළුවන් පරිසරයක් තමයි ඒ කමිටුවේ තිබුනේ. නමුත් මෙතැනදී අපට පේනදෙයක් තමයි අවුරුදු එකහමාරකින් ව්‍යස්ථාවක් පාර්ලිමේන්තුවට ගේනව කියනකොට කරන සාකච්ඡාව කෙටිකාලීනයි. දකුණු අප්‍රිකාව වගේ තැනකට පරිවර්තනය වෙලා ඉතාමත් දියුණු මට්ටමේ ව්‍යවස්ථාවක් හදනවා නම් මේ කාලය මදි අපට. විශේෂයෙන් මෙයාලා බලාපොරොත්තු වෙනවා මේ කොරෝනා තත්ත්වයත් එක්ක ඉතාමත් ඉක්මනින් ජනතාවගේ අදහස් ගන්න. සීයට 55ක ඡන්දයක් හම්බ උන කෙනෙක් රටේ ජනාධිපති වෙනවා නම් 60% ක වත් ජනතාවගේ අදහස් තියෙන්න ඕනේ ව්‍යවස්ථාවට. එතකොටයි ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් හැදෙන්නේ. මං හිතනවා මෙතැනදී එහෙම තත්ත්වයක් නැහැ.

***20වන ව්‍යවස්ථාව දැන් ක්‍රියාත්මකයි. මේ රටේ විශාල ජන ප්‍රවාහයක් ඉන්නවා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පහුගිය කාලේ හඬ නගපු, ඒවගේම 2015 වෙනසට කැපවුණු ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දිගින් දිගටම පෙනී හිටපු. ඔවුන්ගේ අරගලය කුමනාකාර වෙන්න ඕනෑද?***

මේ වෙලාවේ දී සිවිල් සමාජය ශක්තිමත් විය යුතුයි. සිවිල් සමාජය නිදහස්ව වැඩකළ යුතුයි. එයාලගේ ස්වාධීනත්වයට ප්‍රශ්නයක් ඇතිවෙලා තියෙනවා. අපි බලන්න ඕනේ මේ රටේ අපි කියනවා අපි සතුටින් ජීවත් වෙන්න ඕනේ, ඒ වගේම අපි සංහිඳියාව පැත්තෙන් දියුණු වෙන්න ඕනේ කියලා. ඔබ දන්නවද අද අපේ රටේ තියෙන ජාතිකත්වය දේශපාලන ක්‍රමය තුළ අද තරුණ ප්‍රජාවට ඉන්න මිත්‍රයෝ ටික බලන්න. එකම සමාජ මිත්‍රයෝ තමයි ඉන්නේ. 70%ක එක නියැදියක් ගත්තොත් එයාලගේ යාළුවෝ එකම සමාජයක අය. සිංහල ගත්තොත් සිංහල විතරයි. එහෙම පරිසරයක් තුළ දෙමළ ගත්තත් එහෙමයි. උතුර ගත්තත් එහෙමයි. මේක බිඳ දමන්න ඕනේ. අපි අඩුම තරමින් 40%ක්වත් වෙනස් වෙන්න ඕනේ. තරුණ ප්‍රතිපත්තියක් නැතුව මේ රටේ තියෙන ජාතිකත්වය මානසිකත්වය, යුද මානසිකත්වය, යුධ ජයග්‍රහණ මානසිකත්වය, මේවා වෙනස් කරන්න අමාරුයි. වෙනස් කරන්න උත්සාහ කරන්න ඕනේ. තරුණ ප්‍රජාව 30% ක් මේ රටේ. මේ සාකච්ඡාව ඔවුන් අතරට යන්න ඕනෑ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/e3ykRgNSRrw

https://www.aithiya.lk/civil-society-in-sri-lanka-must-reach-out-to-the-youth-community/

# 62. වෙඩි තියන තැනට නොසන්සුන්තාවය හැදුවේ බන්ධනාගාර නිළධාරීන්

## මානව හිමිකම් ක්‍රියාකාරික සුදේශ් නන්දිමාල්



සුදේශ් නන්දිමාල්

***සිරකරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කතා කිරීමේදී අද තියෙන තත්ත්වය ගැන මොකද හිතන්නේ ?***

බන්ධනාගාරය තුළ තිබෙන වදහිංසා තදබදය මෑත කාලයේ පටන් ගත්ත එකක් නොවේ. එය ඈත අතීතයේ සිටම පවතින එකක්. අපිට ඒ ගැන කතා කරද්දී මතකයට නැගෙනවා නිමල රූබන්ලා තමන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කරද්දී අනුරාධපුර බන්ධනාගාරයේ අධිකාරි ඔවුන්ට සළකපු හැටි. එම සිරකරුට නොයෙකුත් වදහිංසා කරලා අන්තිමේදී ඔහු ඝාතනයට ලක්කරා. මේ සියල්ලටම සම්බන්ධ වූ අයෙක් වර්තමාන බන්ධනාගාර අධිකාරියේ ද සිටිනවා. ඒ වගේම වැලිකඩ බන්ධනාගාරය තුළ අගුණකොළපැලැස්ස බන්ධනාගාරය තුළ අමානුෂික ලෙස සිරකරුවන්ට කෙරෙන වදහිංසා පිළිබඳ වීඩියෝ පටපවා අපි පහුගිය කාලේ දැක්කා. ඒ පිළිබඳව අපි මාධ්‍යයටත් වාර්තා කළා .

ඒ වගේම මහර බන්ධනාගාර සිද්ධිය පිළිබඳව කතා කිරීමේ දී අපි දැක්කා කොරෝනා පළවෙනි රැල්ල අස්සේ කාවින්ද ඉසුරු කියන රැඳවියා ආහාරපාන නිසියාකාරව ලබා දෙන්නේ නැති අවස්ථාවන්වල දී ඒ පිළිබඳව ඉස්සරහට ඇවිත් කතා කරනවා. ඉන්පසු එදාම රාත්‍රියේ මොහු සිරකුටියෙන් පැනලා යන්න උත්සාහ දැරුවා කියලා ඔහුව වදහිංසාවට ලක්කර ඝාතනය කරනවා. මෙය නාටකයක් බව හොදාකාරවම සැමටම වැටහෙනවා. ඒ විතරක් නෙවෙයි මේ මෑත කාලයේ සිදුවුන මහර බන්ධනාගාර සිද්ධිය තවම පරීක්ෂණ කෙරීගෙන යනවා, මෙහිදී ද විශාල සංඛ්‍යාවකට වදහිංසා වෙලා තුවාල සිදුකරලා තිබෙනවා. ඒ වගේම ඝාතනයට ලක්වෙලා තියෙනවා.

කොරෝනා වසංගතයක් සමග ප්‍රමාණය ඉක්මවූ රැඳවියන් සංඛ්‍යාවක් එක කුටියකට ගාල්කරලා තිබෙනවා. මේ තුළින් කොරෝනා රෝගීන් විශාල සංඛ්‍යාවක් බන්ධනාගාර තුළින් හමුවෙනවා. ඒත් සමගම ඔවුන්ට ලැබුණු පහසුකම් සියල්ල අඩාල වනවා. අඩුම තරමේ ආහාර පානවත් ඔවුන්ට නිසියාකාරව ලැබෙන්නේ නැහැ. මේ පීඩනයත් සමග තමා මහර බන්ධනාගාරයේ එක කුටියකින් රැඳවියන් දෙදෙනා බැගින් ගිහිං අධිකාරීවරුන් සමග කතා කරන්නේ. එහිදී ඔවුන්ට දැඩි හිංසාවන්ට ලක්වන්න සිදු වෙනවා. ඉන් පස්සෙ තමයි මෙම රැඳවියන් වහල උඩ නැග උද්ඝෝෂණ ව්‍යාපාරයක් සිදු කරන්නේ. එහිදී බන්ධනාග ාර නිලධාරීන් ඉතාම අසාධාරණයි. මෙම සිද්ධිය සමග ඝාතනය වුණු සිරකරුවන්ගේ මෘත දේහය ඥාතීන්ට පෙන්වීමේදී ඔවුන් කියා සිටියේ මරණයට පත්වූවන්ගේ ශරීරයේ වෙඩි සළකුණු නැහැ කියලා. නමුත් පස්සේ ඔප්පුවුණා ඒ සේරම බොරු කියලා.

***මහර බන්ධනාගාරයේ සිද්ධිය වෙන්න කළින් ඒකවුණේ කොහොමද කියනඑක කියන්න බන්ධනාගාරය මාධ්‍යට වීඩියෝ පටයක් නිකුත් කරනවා. මේ ගැන ඔබේ අදහස.***

මහර බන්ධනාගාර සිද්ධිය ගැන මාධ්‍යට මුදා හැරපු වීඩියෝ දර්ශනය පිළිබඳ කතා කිරීමේදී, අප මාධ්‍ය ආයතන මගින් විමසූවිට ඔවුන් පැවසුවේ මේක බන්ධනාගාර අමාත්‍යාංශයෙන් ලබාදුන්නා කියලා. නමුත් මෙම වීඩියෝවේ පසුබිමෙන් ඇහෙන හඬවල් සියල්ල කපාදමා තමයි මාධ්‍යවෙත මුදාහැරලා තියෙන්නේ. මෙහි මුල් වීඩියෝ දර්ශනය බලද්දි හොඳාකාරවම තේරුම් යනවා බන්ධනාගාර නිලධාරීන් පිරිසක් මේ වීඩියෝව කරන්නේ ඉතා විනෝදජනක ලෙස කතා කරමින් කියලා. මේ සිද්ධිය වෙලාවේ ඒක සමනය කරනු වෙනුවට රැඳවියන්ගේ උද්ඝෝෂනය, ඔවුන් ඝාතනය වන ආකාරය ඉතා රස විඳිමින් තමයි මේ නිළධාරීන් මේක වීඩියෝ කරලා තියෙන්නේ. ඒකේ හඬපටය ඇහුවාම චියර් කරනවා පවා ඇහෙනවා. ඔවුන් එම ගැටුම නැවතීම සඳහා පියවරක් ගත්තේ නෑ. ඒ වෙනුවට ඔවුන් රැඳවියන් උසි ගන්වමින් වැඩේ නඟලා ගන්නවා. ඊට පස්සේ තමයි ඔවුන්ට අණ ලැබෙන්නේ වෙඩි තියන්න කියලා. ඉතින් මේක තමයි වර්තමානයේ බන්ධනාගාර තුළ තිබෙන තත්ත්වය.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/h3dEaCGBhg0

https://www.aithiya.lk/committee-for-protecting-rights-of-prisoners-mahara-prison-mosque/

# 63. දේශීය වශයෙන් මේවා ගැන හොයලා බැලුවනම් ජාත්‍යන්තරයට යන්න අවශ්‍ය නැහැ

## මානව හිමිකම් ක්‍රියාකාරික රුකී ප්‍රනාන්දු



රුකී ප්‍රනාන්දු

***ජිනීවා මානව හිමිකම් කොමිසමේ සැසිවාරය ආරම්භ වීමට නියමිතයි. ඊට පෙර සුපුරුදු පරිදි මානව හිමිකම් කොමිෂන් සභා වාර්තාව එළි දක්වලා තියෙනවා. එහි සෑහෙන කරුණු ගණනාවක් අඩංගුයි. නමුත් ආණ්ඩුව, ආණ්ඩුවට හිතවත් මාධ්‍යය පාවිච්චි කරමින් මේවා දේශද්‍රෝහී ක්‍රියාමාර්ග විදිහට වෙනත් ප්‍රතිරූපයක් මවමින් ඉන්නවා. ඇත්තටම මෙම වාර්තාවේ සඳහන් කරුණුවල ස්වරූපය කුමක්ද ?***

මෙහි දී අපි කතාකරනවා ජිනීවාවල තියෙන ප්‍රධාන ආයතන දෙකක් ගැන. පළමුවැන්න මානව හිමිකම් කවුන්සිලය. මානව හිමිකම් කවුන්සිලයේ කියන්නේ රටවල් 47කින් සැදුම්ලත් කවුන්සිලයක්. එම සංවිධානයේ එහි සාමාජිකයින් වෙන්නෙ රටවල්. රටවල් නියෝජනය කරන්නේ රටවල්වල සිටින ආණ්ඩු. දෙවෙනි එක එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්තුමියගේ කාර්යාලය [The Office of the UN High Commissioner for Human Rights (OHCHR)] එහි සේවය කරන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිලධාරීන්. එහි ප්‍රධාන නිලධාරියා තමයි මහ කොමසාරිස්තුමිය.

එතකොට මං හිතන්නේ 2015 ඉඳන් මානව හිමිකම් කවුන්සිලය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්තුමියට

පවරලා තියෙනවා වගකීමක්. ඒ ලංකාවේ තියෙන මානව හිමිකම් තත්ත්වය පිළිබඳව සොයා බලා මානව හිමිකම් කවුන්සිලයට වාර්තා ඉදිරිපත් කිරීම. ඒ කියන්නේ මේක කරන්නෙ හිතුමතේට නෙමෙයි, අර සාමාජික රටවල් 47 ඉල්ලීම මත. ඔවුන් තමයි එතුමියට ඒ වගකීම පවරලා තියෙන්නේ. ඒ වගකීමෙන් කොටසක් විදියට තමයි එතුමිය මේ වාර්තාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයට පිළිගන්වන්නේ මේ පෙබරවාරි - මාර්තු මාසයේ තියෙන සැසිවාරය වෙනුවෙන්. ඒ වාර්තාව සකස් කිරීම විතරයි මහ කොමසාරිස්තුමිය කරලා තියෙන්නේ. ඒ පිළිබඳව යම්යම් නිර්දේශ එතුමිය ඉදිරිපත් කරලා තියෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්න මානව හිමිකම් කවුන්සිලයට සියලුම රටවල් එකතු වෙලා එහෙම නැත්නම් තනි තනි රටවල් විදිහට ඒ අයට තීරණ ගන්න පුළුවන්. එහිදී ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක නොවී තියෙන්නත් පුළුවන්. එනිසා, සාමාජික රටවල්වලින් සැදුම්ලත් මානව හිමිකම් කවුන්සිලය, ඒ වගේම නිලධාරීන්ගෙන් සැදුම්ලත් මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය වශයෙන් මෙම ආයතන දෙක වෙන් වෙන් ව හඳුනා ගැනීම ඉතා වැදගත්. එතකොට මේ වාර්තාවේ ඇතුළත් කරුණු තමයි මං හිතන ආකාරයට මාධ්‍යවල සාකච්ඡා වෙන්නේ. සමහර මාධ්‍යවල මේක වැරදි විදියට අර්ථ දක්වලා තියෙනවා මානව හිමිකම් කවුන්සිලයේ වාර්තාවක් කියලා.

ඒක වැරදියි. මේක මානව හිමිකම් කවුන්සිලයේ ඉල්ලීම අනුව මහ කොමසාරිස්තුමිය පිළියෙල කරපු වාර්තාවක් විදිහටයි ඉදිරිපත් වෙලා තියෙන්නේ. මෙවැනි වාර්තා බොහොමයක් මානව හිමිකම් කවුන්සිලය වෙත ඉදිරිපත් වෙනවා. ලංකාව විතරක් නෙමෙයි විවිධ රටවල් ගැන. ඒ වගේම විවිධ තේමාවන් ඔස්සේ විශේෂ නියෝජිතයින් විවිධ කණ්ඩායම්වලට ඒ වගකීම් පවරලා තියෙනවා, මානව හිමිකම් කවුන්සිලය විසින් තමන් වෙත වාර්තා ඉදිරිපත් කිරීමට. ඒ සියල්ල සාකච්ඡාවට භාජනය වෙනවා මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයේදී. එතකොට ලංකාව කියන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රාජ්‍යයක්. එමනිසා මේ යාන්ත්‍රණ ඇති කිරීමට ලංකාවත් දායකවෙලා තියෙනවා. මානව හිමිකම් කවුන්සිලය එක්සත් ජාතීන්ගේ ප්‍රධාන කොටසක්. ඒ වගේම මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයත් එහි ප්‍රධාන කොටසක්. ඒවා ඇති කරන්න සාමාජික රටක් විදිහට ලංකාවත් සහභාගීවෙලා තියෙනවා.

ඒ වගේම මේ වාර්තාවේ ඇතුළත් වෙලා තියෙන නිර්දේශ ලංකාවේ මාධ්‍යන්ට තරමක් ආන්දෝලනාත්මක වෙලා තියෙනවා. මේකෙදි අපි සිතා බැලිය යුතු වැදගත් කාරණාවක් තමයි ඇයි මේ විදිහේ නිර්දේශ ඉදිරිපත් වෙලා තියෙන්නෙ කියනඑක. මෙහිදී ලොකු අවධානයක් යොමුවෙලා තියෙන්නේ වගවීම කියන කාරණය පිළිබඳව. ඒ කියන්නේ යම් කිසි වැරැද්දක් සිදුවුණොත් ඒ වැරදි කරපු අයට නීත්‍යානුකූලව දඬුවම් ලැබිය යුතුයි කියන කාරණාව සම්බන්ධයෙන්. එතකොට මේ දඬුවම් ලැබීම කියන දේ සිද්ධ වෙලා නැහැ කියන දේ, මේ වාර්තාවේ බරපතළ ලෙස සඳහන් වෙලා තියෙනවා උදාහරණත් සමඟ. මේවා මේ වාර්තාවේ තියෙන දේවල් විතරක් නෙමෙයි අපි වුණත් දන්න දේවල්. උදාහරණයක් වශයෙන් මාධ්‍යවේදීන් ඝාතනය කිරීම් සම්බන්ධයෙන් කිසිම අයෙක් වරදකරුවෙක් වෙලා නැහැ, ලංකාවේ අධිකරණයෙන් මෑතකාලීනව. මම දන්න පරිදි එක් නඩුවක් විතරයි චෝදනා පවරලා මහාධිකරණයට ඉදිරිපත් වෙලා තියෙන්නෙ. ඒ ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන්වීම සම්බන්ධයෙන් නඩුව. අනිත් සිදුවීම්වලට නඩු පවරලා හෝ චෝදනා කරලාවත් නැහැ. තාම මහේස්ත්‍රාත් අධිකරණයේ පොලිස් විමර්ශන කරන මට්ටමේ තමයි ඒ නඩු තියෙන්නේ. එතකොට මේ සමහර සිදුවීම් ඇති වෙලා අවුරුදු දහයක්. සමහර සිදුවීම් අවුරුදු පහළොවක්. ලංකාවේ පොලිසිය, ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුව, ලංකාවේ අධිකරණය හමුවේ මේවට යුක්තිය ඉෂ්ට වෙන්නේ නැත්තම් අපි මොකක්ද මේ වින්දිතයන්ට සහ වින්දිතයන්ගේ පවුලේ අයට කියන්නේ, අසාධාරණයට ලක්වූ පිරිස් වශයෙන් ජාත්‍යන්තරයේ හරි යුක්තිය ඉෂ්ඨ කරගැනීමට උත්සාහ කිරීම ගැන.

ඒ වගේම මං හිතන්නේ මේ වාර්තාවෙ සඳහන් වෙනවා යම් යම් ඒකාධිපති ලක්ෂණ ලංකාවේ තියෙනවා කියලා. ඒක එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ කොමසාරිස්තුමිය විතරක් නෙමෙයි ලංකාවේ විවිධ මාධ්‍යවේදීන්, මානව හිමිකම් ක්‍රියාධරයින්, විපක්ෂ දේශපාලනඥයින් විටින් විට ප්‍රකාශ කරලා තියෙනවා. ඒක අපිටත් නිරීක්ෂණය කරන්න පුළුවන්. ඉතින් එවැනි කාරණා තමයි මං හිතන්නේ මේ වාර්තාවේ හුඟක් ඇතුළත් වෙලා තියෙන්නේ. මේ වාර්තාවේ තියෙන නිර්දේශ සම්බන්ධයෙන් මොනවද කරන්නේ කියනඑක සාමාජික රටවල් පෙබරවාරි, මාර්තු මාසයේ දී තීරණය කරයි.

***දැන් අපි වින්දිතයන්ගේ යුක්තිය ගැන කතා කරනවා. ඒ වගේම දණ්ඩ මුක්තිය සංස්කෘතියක් බවට පත්වන ලකුණු ඇති වෙමින් තියෙනවා. ඒ පසුබිම තුළ ජනාධිපති කොමිෂන් සභාවක් පත්කරලා තියෙනවා 2020 ජනවාරි 09 වෙනි දා. ඒකට අනුව ප්‍රධාන මානව හිමිකම් ක්‍රියාකාරීන්ට සහ මාධ්‍යවේදීන්ට එරෙහිව ගෙන ගියපු මර්ධනයන් ගැන වගේම ඔබ පෙර සඳහන් කළ එක්නැලිගොඩ අතුරුදන් කිරීම, ලසන්ත වික්‍රමතුංග ඝාතන පරීක්ෂණ සහ නඩු කටයුතු සියල්ල නවත්වන්න, ඒ සම්බන්ධව පැමිණිලි කරපු, පරීක්ෂණ කරපු නිලධාරීන්ට විරුද්ධව චෝදනා ගොනු කරන්න කියලා නිර්දේශ ඉදිරිපත්වෙලා තියෙනවා. මෙවැනි වටපිටාවක ලංකාව ජාත්‍යන්තර තලයේ කුමන ආකාරයෙන් ස්ථානගත වෙයිද?***

මම හිතන ආකාරයට මෙවැනි කොමිෂන් සභාවලින් තීන්දු ගන්න බැහැ. එවැනි නඩුවක් අයින් කරනවද නැද්ද කියනඑක තීරණය කරන්න පුළුවන් නීතිපති දෙපාර්තමේන්තුවට. එහිදී අධිකරණය තමයි තීන්දුව දෙන්නේ අවසාන වශයෙන්. කොමිෂන් සභාවලට පුළුවන් මේ සම්බන්ධයෙන් යම් යම් නිර්දේශ ඉදිරිපත් කරන්න විතරයි. ඉතින් එහෙම නිර්දේශ කරද්දිත්, යම් යම් ප්‍රකාශ කරද්දිත් එයින් දේශපාලන වශයෙන් ලොකු බලපෑමක් ඇති වෙන්න පුළුවන්. මං හිතන්නේ ඒක වැදගත්. එතකොට නීතිමය වශයෙන් බලයක් නැති වුණත් මේගැන තීරණ ගන්න ඒ කොමිෂන් සභා විසින්, සමාජයීය දේශපාලන වශයෙන් ඇති කරන බලපෑම ගැන අපි හිතල බලන්න වෙනවා. මේවත් අහිතකර ලෙස බලපාන්න පුළුවන් වගවීම කියන කාරණයෙදි. නීත්‍යානුකූලව වගවීමට මේ කරුණු අහිතකර ලෙස බලපානවා. එහිදී වින්දිතයෝ, මේකෙන් අසාධාරණයට පත්වෙච්ච අය තවතවත් ජාත්‍යන්තර වශයෙන් තියෙන යාන්ත්‍රණවලට යනවා යුක්තිය ලබා ගැනීම වෙනුවෙන්.. මොකද ඒ අයට අවශ්‍ය යුක්තිය ලබා ගැනීම. ඒක දේශීය වශයෙන්ද ජාත්‍යන්තර වශයෙන් ද කියනඑක නෙවෙයි. දේශීය වශයෙන් එය ඉටුවෙලා තිබුනා නම් ජාත්‍යන්තර වශයෙන් යුක්තිය සොයාගෙන යාමේ ගමන මේතරම් දුර දිග යන්නේ නැහැ.

***ලංකාවේ මෑතකදී වැලිකඩ බන්ධනාගාරය සහ මහර රිමාන්ඩ් බන්ධනාගාරයේ ඇති වූ සිදුවීම් ගත්තොත් බොහෝ විට රජය මේ***

***දේවල් වලට ප්‍රතිචාර දක්වන්නෙ කරුණු සැඟවීමේ පරමාර්ථය ඇතිව. ඒ සම්බන්ධයෙන් කමිටු පත් කරලා තිබුනත්, වාර්තා එළිදක්වලා තිබුනත් ඒවා යම් ආකාරයකට යටපත් කිරීමේ අවශ්‍යතාවයක් තමයි තියෙන්නෙ. ඒ වගේම පහුගිය කාලේ ගෙන ගියපු war on drugs ප්‍රතිපත්තිය තුළ සිරකරුවන් පිරිස විශාල ලෙස සංඛ්‍යාත්මකව වැඩි වෙලා තියෙනවා. මේ තත්ත්වයන් අනාගතයේ කොයි ආකාරයෙන් බලපායිද?***

මේ දේවලුත් ලංකාවට ඉතාම අහිතකර විදිහට තමයි බලපාන්නේ. ලංකාව කියන්නේ රාජ්‍යය විතරක් නෙවෙයිනෙ. පුරවැසියනුත් එයට අයත්. ඉතින් පුරවැසියන්ට වූ අසාධාරණකම් හා අයුක්තිය ගැන තමයි අපි කතා කරන්නේ. මේකෙන් අගතියට පත්වෙලා තියෙන්නෙ ලංකාවෙ ඉන්න ප්‍රජාවන්. ඒක සිරගෙදරක සිදුවන ඝාතනයක් වුණත්, පොලිසියක සිදුවන පහර දීමක්, හිංසාවක් වුණත්, මාධ්‍යවේදීන්ට කරන පහරදීමක් වුණත් මේ හැම දෙයක්ම ලංකාවේ පුරවැසියෙකුට විරුද්ධව සිදුවෙන දේවල්. මේ වගේ දේවල් දිගින් දිගටම වෙද්දි සහ මේවා සඟවන්න උත්සාහ කරද්දී, යුක්තිය ඉෂ්ඨ වීමේ ගමන තවත් කඩාකප්පල් වෙනවා කියලා දකිද්දී, මං හිතන්නේ ලංකාව තවදුරටත් අපකීර්තියකට තමයි භාජනය වෙන්නේ.

මීට කලින් ලංකාවේ පැවති රජය 2015 දී යම් යම් දේවල් ඉෂ්ට කරන්න පොරොන්දු වුණා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයට. එය තමයි සම අනුග්‍රාහකත්වය කියලා අපි හැඳින්වූයේ. එතැනදි සිදුවුණේ ලංකාවේ අගතියට පත් පාර්ශවයන්ට, වින්දිතයන්ට ලංකාව තුළම යම් යම් දේවල් සිදුකිරීමට පොරොන්දුවීම පමණයි. උදාහරණයක් වශයෙන් ලංකාව තුළ අතුරුදහන් වූ ලාංකීය පුරවැසියන් පිළිබඳ සොයා බැලීම සඳහා ලංකාවේ නිලධාරීන්, සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කාර්යාලයක් මේ රට තුළ ක්‍රියාත්මක කරන්න පොරොන්දු වෙලා තියෙනවා. මම හිතන්නේ ඒ කාර්යාලයට දැන් වසර තුනක් වෙනවා මේ පෙබරවාරි මාසය අවසාන වෙද්දී. තවත් එවැනිම විවිධාකාරයේ පීඩාවට පත්වූවන්ට, අගතියට පත්වූවන්ට හානිපූර්ණය සඳහා වන්දි ගෙවීම සඳහා යම් යම් දේවල් කරන්න පොරොන්දු වෙලා තියෙනවා. හානිපූර්ණය වෙනුවෙන් විශේෂ කාර්යාලයක් ඇති කරන්න.

ඒකත් ලංකාවේ පුරවැසියන්ගේ අවශ්‍යතාවයට තමයි සිදු වෙන්නේ. නැතුව ස්විට්සර්ලන්තයේ හෝ ඉන්දියාවේ හෝ ඇමරිකාවේ ඉන්න පුද්ගලයන් වෙනුවෙන් නොවේ.

මේ පොරොන්දු ඉටු වුණේ නැත්තම් එයින් නැවත වරක් අගතියට පත් වෙන්නෙ ලංකාවේ පුරවැසියෝ, ලංකාවේ ජීවත් වෙන අය. ඉතින් මේ ලංකාවේ ඇතිකරන ආයතන අඩපණ කරනවා කියන්නේ, ලංකාවේ ඇතිකිරීමට පොරොන්දු වෙලා තියෙන ආයතන ඇති කරන්නේ නැහැ කියලා කියන්නේ ලංකාවෙ පුරවැසියන්ට තමන්ට අවශ්‍ය හානිපූර්ණය, යුක්තිය සහ සත්‍ය දැනගැනීමේ අයිතිය ඉටුකර ගැනීමට තව තවත් ජාත්‍යන්තර ක්‍රියාදාමයන් වෙත එළඹීම තමයි සිදුවෙලා තියෙන්නේ. මෙයට හොඳ උදාහරණයක් මම හිතන්නේ ලසන්ත වික්‍රමතුංග ඝාතනය. වසර ගණනාවක් තිස්සේ බලාගෙන ඉඳලා කිසිම දෙයක් සිදුනොවුන නිසා ඔහුගේ දියණිය උත්සාහ කරලා තියෙනවා ඇමරිකානු අධිකරණයේ ඒ සම්බන්ධයෙන් නඩුවක් පවරන්න. ඒ වගේම මෑතකදී ඇය උත්සාහ කරලා තියෙනවා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කමිටුවට පැමිණිල්ලක් යොමු කරන්න. ඉතින් ඒ වගේ තව හුඟක් වින්දිතයෝ මෙවැනි ජාත්‍යන්තර ක්‍රියාදාමවලට යොමුවෙයි ලංකාව තුළ මේ යුක්තිය ඉෂ්ටවීම වගවීම සිදුවුණේ නැත්නම්.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/tbQJqMT2D7o

https://www.aithiya.lk/united-nations-human-rights-council-ruki-fernando/

# 64. මේක ඇවිල්ල ඩොලර් උල්පතක්

## ස්වාධීන වරාය සේවක සංගමයේ සභාපති ලාල් බංගමුවගේ


ලාල් බංගමුවගේ

නැගෙනහිර පර්යන්තය මීටර දහ අටක් ගැඹුරයි. එතනට ඕනෑම නැවක් අල්ලන්න පුළුවන්. ඒ විතරක් නෙමෙයි 2029 දී නැගෙනහිර පර්යන්තයට එහා පැත්තේ තිබෙන AGT ජෝන් කීල්ස්ලගෙ ජැටියත් අපට අයිති වෙනවා. එහෙම අයිති උනාම මේ පෝර්ට් එක සම්පූර්ණයෙන්ම අපිට බැක් ටු බැක් මෙහෙයුමක් කරන්න පුළුවන්. මොකද ඒ වගේ පෝර්ට් ලෝකෙ තියෙන්නෙ කිහිපයයි. එතකොට අපට දෙපැත්තෙන්ම නැව් අල්ලන්න පුළුවන්. එතකොට ට්‍රාන්ස්පෝට් වියදම නැති වෙනවා. අපිට ලෝකෙ අඩුවෙන් සහනදායි මිලකට මේකේ වැඩ කරන්න පුළුවන්. එතකොට මේ ලෝකෙ තියෙන බිස්නස් එක අපි කෙරෙහි ඇද ගන්න පුළුවන්. ඒක තමයි මේකෙ තියෙන ලොකුම වැදගත්කම. වෙනත් පර්යන්තයක එකක ඉඳලා බහාලුම් නැවත මෙතනට ගෙන්න කරන්න ඕනේ නැහැ. මේක බොක්ස් පෝර්ට් එකක් වෙනවා. ඒකෙන් දෙපැත්තෙන්ම නැව් අල්ලන්න පුළුවන්. එතකොට ඒ වාසිය ලෝකෙ කොහේවත් නැහැ. අපිට ආසියාවේ තරගකාරීත්වයකින් වැඩ කරන්න පුළුවන්. අඩු මුදලකට වැඩ කළාම අපට බිස්නස් එකත් වැඩි වෙනවා. අපේ ආදායමත් වැඩි වෙනවා. අපේ රට ලෝකයේ ඉහළ තැනකට යනවා. විශේෂයෙන්ම මේ වනවිට අපේ විදේශ විනිමය ඉතාමත් දුර්වල මට්ටමක තියෙන්නේ. රට ආගාධයට පත්වෙමින් තියෙනවා. එහෙම තත්ත්වයකදී මේ වගේ විදේශ විනිමය උපයන්න පුළුවන් ස්ථාන අපි රැකගන්න ඕනේ. ඒක මේ වරාය අධිකාරියට විතරක් නෙවෙයි මේ මුළු රටටම වැදගත් කාරණයක් වෙනවා.

### නැගෙනහිර පර්යන්තය වාර්ෂික ආදායම

කියන්න කණගාටුයි පහුගිය වසර 5ක් පුරාවටම නැගෙනහිර පර්යන්තය ක්‍රියාත්මක වුණේ නැහැ. පසුගිය යහපාලන ආණ්ඩුව ඇවිත් මේ නැගෙනහිර පර්යන්තයට ඇනවුම් කරතිබූ දොඹකර කැබිනට් පේපර් එකක් මගින් අහෝසි කරා. ඒ තුළ නැගෙනහිර පර්යන්තය වැඩ කළේ, සාමාන්‍යයෙන් යකඩ පොහොර වගේ සාම්ප්‍රදායික නැව් බඩු. ඊට පස්සේ JCT 5 කියන ස්ථානයට ගෙනයන ලද දොඹකර 3 පසුගිය මැතිවරණ සමයේ අපි විශාල උද්ඝෝෂණයක් කරල නැගෙනහිර පර්යන්තයට ගොඩබාල ස්ථාපිත කළා. ඊට පස්සේ මෙතන නැව් තිස්තුනක් පමණ අපි වැඩ කරලා තියෙනවා. මේ වනකොට අපි කෝටි පනහකට වඩා මුදලක් මේ මාස දෙක තුන ඇතුළත අපි වරාය අධිකාරියට, රටට හම්බ කරල දීලා තියෙනවා. ඒක මේ නියම විදියට හම්බ කරල නෙමෙයි. මේක වැඩ අවසන් කරලා උපයන්න පටන් ගත්තොත් ඩොලර් මිලියන 700ක් පමණ උපයගන්න පුළුවන්. සෑම වර්ෂයකම අපට ඩොලර් මිලියන 50ක් හොයන්න පුළුවන්. අදියරින් අදියර මේකෙ වැඩ නිම වෙනකොට අවසාන වශයෙන් ඩොලර් මිලියන හත්සීයක් ආදායමක් අපට ගන්න පුළුවන් වාර්ෂිකව. එතකොට අපි මේ අවුරුදු 35ට ම මේක බදු දෙන්න ගියේ ඩොලර් මිලියන හත්සීයකට මේවා තමයි. අපට තිබුණ ප්‍රශ්න.

### චීන ඉන්දියානු බල දේශපාලනය

ඉන්දියාව එක්ක තියෙන ප්‍රශ්නවලට රටක මෙවැනි මර්මස්ථානයක් පාවා දෙනවා නම් ඒක ජාතියට කරන විශාල හානියක්. මොකද ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ලක්ෂ 69ක් එක්ක ජන බලයකින් ආවේ මේ වගේ දේවල් විකුණන්න නෙමෙයි නේ. රටට පොරොන්දු වුණේ දේශීයත්වය රකිනවා විකුනපු දේවලුත් අපි ආපහු ගන්නවා කියලා. දේශපාලන ප්‍රශ්නයක් විසඳාගන්න කියලා අපේ රටේ සම්පත් විකුණනවා නම් අපේ රට තවත් දුප්පත් වෙලා දිළිඳුභාවයට පත්වෙලා විනාශවෙන තත්ත්වයට තමයි යන්නේ. ඒ නිසා තමයි අපි මේකට විරුද්ධ වුණේ. එහෙම රට රටවල්වල තිබෙන දේශපාලන ප්‍රශ්න මෙතනට ගෙනල්ලා විසඳගන්න ඉඩදීලා බලන් ඉන්නවා නම් අන්තිමේදී අපිට ඉතුරු වෙන දෙයක් නැති වෙයි.

## *දියුණුවට සැලසුම*

විශේෂයෙන්ම අපේ සැලසුම් මේ වනවිට ඇමතිතුමාට බාරදීලා තියෙනවා. අපේ වරාය ඉංජිනේරුවරුන්, වරායේ විධායක නිලධාරීන් සහ අපේ වරාය වෘත්තීය සමිති 23ම මේක කරන්න ඕනෑ විදිහ පෙන්නල තියෙනවා. සංවර්ධනයට සත පහක් වත් ණය ගැනීමට අවශ්‍ය නැහැ. අපි හම්බකරන මුදලින් ම 2023 වනවිට අදියර තුනකින් මේ සංවර්ධනය කිරීම් නිමා කරන්න පුළුවන්. එහෙම නිමාකරල 2027 වනවිට මිලියන හත්සීයක් අපිට හොයාගන්න පුළුවන්. එනිසා අපි ඒ කරුණු කාරණා ඔක්කොම ඉදිරිපත් කළ තියෙනවා. සේවකයෝ අලුතින් ගැනීමට අවශ්‍ය නැහැ. අපේ තියෙන පරිගණක පද්ධතිය හදලා තියෙන්නේ විශේෂ වියදමක් යන්නේ නැහැ. අපිට කරන්න පුළුවන් මේ වරාය. මේකෙ බොරු බිල්ලෙක් මවල බොරුවට රටවල්වල බලපෑම්වලට යටත් වෙලා භූ දේශපාලනය ගැන කයිවාරු ගහලා මේ දේශීය සම්පත් විකුණන්න අවශ්‍ය නැහැ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/QcHj8g9Veok

https://www.aithiya.lk/eastern-terminal-of-the-port-of-colombo/

# 65. ලංකාව කියන්නේ අතුරුදහන්වීමේ දිවයිනක්

## හිටපු මානව හිමිකම් කොමසාරිස් රමණී මුත්තෙට්ටුවේගම



රමණී මුත්තෙට්ටුවේගම

***අපේ රටේ මේ සිදුවන අතුරුදහන් කිරීම්, ඝාතන අපිට එදිනෙදා හොඳින් හුරු පුරුදු සාමාන්‍ය තත්ත්වයක් වෙලා. දැන් අලුතින් ඒ පිළිබඳ සොයා බැලීම් කරන්න නැවත වතාවක් රජය විසින් කොමිසමක් පත්කරලා තියෙනවා. මෙතෙක් කලක් ඇතිවූ සිදුවීම් සහ ඒ පිළිබඳව පරීක්ෂණ කරපු ආකාරය බලනකොට මොනවද මේ සම්බන්ධයෙන් කියන්න තියෙන්නේ?***

මුලින්ම කියන්න ඕනේ අවුරුදු ගණනාවක් අපි කතා කරමින් හිටියේ දණ්ඩ මුක්තිය (impunity) ගැනයි. අපි කිව්වේ අතුරුදහන්වීම පිළිබඳ තියන දණ්ඩ මුක්තිය නිසා මේක තවදුරටත් කරගෙන යනවා කියලා. ඒ වගේම අපි කිව්වා මේ අතුරුදහන් වීම් නිකම්ම සිදුවෙන දෙයක් නෙමෙයි. විශාල යාන්ත්‍රණයක් අවශ්‍යයි යම් පුද්ගලයෙක් පැහැරගෙන ගිහින් එයාව අතුරුදහන් කරවන්න. එම යාන්ත්‍රණය කවදාවත් වෙනස් වුණේ නැහැ. ඒක තමයි ප්‍රශ්නය. මම හිතන්නේ වසර 50ක් විතර දැන් අපි මේ සිදුවීම් දැකලා තියෙන නිසා අපිට කියන්න පුළුවන් මේක මේ පවතින යාන්ත්‍රණයවත්, දණ්ඩ මුක්තියවත් පමණක් නොවෙයි. මම හිතන්නේ මේක අපේ සංස්කෘතියෙම කොටසක්. ඇත්තටම ලැජ්ජා වියයුතුයි මේක කියන්න, ලංකාව කියන්නේ අතුරුදහන්වීමේ දිවයිනක් (Island of Disappears). ලංකාවේ එක ජන කණ්ඩායමක්වත් නැහැ අතුරුදහන් වීමට ලක්නොවුණු. එක යුද්ධයක්වත් තිබුණේ නැහැ අතුරුදහන්වීම් සිදුනොවුණු. හැබැයි මෙතන පොඩි වෙනසක්

තියෙනවා. අපි බැලුවොත් 2019 බෝම්බ පිපිරීම. කොයිතරම් අයව අත්අඩංගුවට ගත්ත ද? මම ඒ කාලෙදි හිටියේ මානව හිමිකම් කොමිෂන් සභාවේ. එතනටයි බොහෝ අය පැමිණිලි කළේ. ඒ සිදුවීමට පස්සේ දිගටම සිදුවන අතුරුදහන්වීම් දැනට නැහැ. ඒක ඉතාමත් ලොකු සිදුවීමක්නේ අපේ රටේ. ඉතින් මම හිතන්නේ සමහරවිට සංඥාවක් තියනවනම් රජයකින් මේක ඇති කියලා, පළමුවෙන්ම අපි පටන් ගන්න ඕනෑ එතැනින්. දැනට සිදුවෙන දෙයයි අපි නවත්තන්න ඕනෑ. ඒක නවත්තන්න පුළුවන්. අපි උසාවියේ දී කියන්නේ තහනම් නියෝගයක් (enjoining order) හෝ ගත යුතුයි පළමුවෙන්ම.

දැන් මේ කොමිෂන් සභාව බැලුවොත් එක අතකින් මේක විහිලුවක්. අද ජනාධිපති තමයි ඒ කාලයේදී ආරක්ෂක ලේකම්. වර්තමාන ජනාධිපතිගේ සොහොයුරා තමයි ඒ කාලේ හිටපු ජනාධිපති. ඒකාලෙ හිටපු ජනාධිපති, ආරක්ෂක ඇමැති සහ ආරක්ෂක ලේකම් (අද දින ජනාධිපති) මේ අය එකතුවෙලා තමයි එල්.එල්.ආර්.සී සහ දෙවෙනි කොමිෂන් සභාව පත් කළේ. ඒ පත් කිරීමෙන් පසු එහි තිබුණු නිගමන සහ නිර්දේශයන් හොයන්න අවුරුදු දහයක් ඉන්න අවශ්‍ය නැහැ නේ? මොනවට හිටියද කියනඑක මට පැහැදිලි නැහැ. අනෙක් අතට බැලුවොත් ඒ කොමිෂන් සභා සියල්ල පත් කරත් දිගටම මේ තැනැත්තන් දේශපාලනික වශයෙන් ප්‍රකාශ කළේ මානව අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුවුණෙත් නැහැ යුද්ධයේ එම කාලය තුළ කියලා. සාපරාධී මනුෂ්‍ය ඝාතන සිදුවුණෙත් නැහැ, යුද අපරාධ සිදුවුණෙත් නැහැ කියලා තමයි දිගටම කිව්වේ. දැන් නැවත මේ අයම කියනවා, අලුත් කණ්ඩායමකට අර පැරණි කොමිෂන් සභා කියපු දේවල් හොයා බලන්නලු එවැනි දේවල් සිදුවුණාද කියලා. දැන් මේක එක අතකින් විහිලුවට කාරණයක්. ඒක බලන්න පුළුවන්නේ. කොමිෂන් සභාවක් අවශ්‍ය නැහැනේ. මේ වාර්තාව කියෙව්වාම ඇතිනේ.

***පෙබරවාරි මාසයේදී පැවැත්වීමට නියමිත ජිනීවා මානව හිමිකම් සැසිවාරයට අදාළව මානව හිමිකම් කොමසාරිස්වරියගේ වාර්තාව ඉදිරිපත් වෙලා තියෙනවා. ඒක රජයට ඉදිරිපත් කරලා තියෙනවා. රජය තවමත් ප්‍රතිචාර දක්වලා නැහැ. ඒ වාර්තාව තුළ අන්තර්ගත යෝජනා ගැන මොකක්ද අදහස?***

දැනට ඒක තියෙන්නේ කෙටුම්පත් තත්ත්වයේ. ඒ සඳහා රජයේ ප්‍රතිචාර ඉල්ලලා තියෙනවා. රජය ප්‍රකාශකර තිබුනා මම දැක්කා පහුගිය දවස්වල ළඟදි තමන්ගෙ ප්‍රතිචාරය ලබාදෙනවා කියලා. ඒ අතරතුර මාධ්‍ය මාර්ගයෙන් අපිට දැනගන්න ලැබුන දේවල්වලින් මට පේන හැටියට, දැන් හැම කවුන්සිල් සැසිවාරයකටම පෙර මානව හිමිකම් කොමසාරිස් වාර්තාවක් සැපයිය යුතුයි මානව හිමිකම් කවුන්සිලයට. ලංකාවට දැනට යෝජනා සම්මතයක් (resolution) තියෙන නිසා එයින් පසුව ගත්ත පියවර මොනවාද මේ දේවල් වෙනස් කරන්න කියන කාරණය පිළිබඳව. මට පේන විදිහට, සියල්ලම කියන්න බැහැනේ, තාම මේක ප්‍රකාශයට පත්වෙලා නැති නිසා. මට දැකගන්න ලැබුනෙ නිර්දේශ දෙක තුනක් විතරයි, දැනට මාධ්‍ය මගින් ඉදිරිපත් කරපු. ඒ නිර්දේශ මානව හිමිකම් මහකොමසාරිස් නිර්දේශ කළා නම් මීට පෙර තියෙන නිගමනයන් ගැන නීතිමය වශයෙන් බැලුවොත් තියෙන්නේ ඉතාමත් බැරෑරුම් නිගමන කිහිපයක්. ඒ කියන්නේ රටේ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව සංචාරක තහනමක් ඉල්ලලා තියෙනවා. රටෙන් පිට සාමාජික රටවල්වලින් වත්කම් ඇවිරීම (asset freeze) වැනි දේවල්. මීට පෙර පිලිපීනයේ හිටපු ජනාධිපති මාර්කෝස් ට එරෙහිව එවැනි වත්කම් ඇවිරීමක් තිබුනා. ලෝකයේ පිළිගැනීම අනුව ඉතාමත් දරුණු අපරාධකරුවන්ට පමණයි මේ වගේ ජාත්‍යන්තර අවහිරතා, සීමා කිරීම් කරලා තියෙන්නේ. ඒ අනුව මම හිතන්නේ මේ නිගමනයන් අනුව පේන්නෙ මේ සම්බන්ධයෙන් ගත් පියවරවල් බොහොම සීමිතයි. ඒ විතරක් නෙමේ මේ ඇතැම් පියවරවල් තිබුණු තත්ත්වය තවත් පසුපසට යාමක් වගේ. මේ ගැන නිවැරදි නිගමනයකට එන්නනම් එම නිර්දේශයන් සම්පූර්ණයෙන්ම කියවා බලන්න අවශ්‍යයි.

***අපි දුටුවා පහුගිය දිනවල මානව හිමිකම් කොමිසම විසින් ප්‍රබල මාධ්‍ය ප්‍රකාශයන් සහ නිර්දේශ ඉදිරිපත් කරනවා. විශේෂයෙන් මහර සිරකරුවන්ගේ ප්‍රශ්නය සහ මේ වනවිට රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින අයගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය වෙනුවෙන්. මෙහි වර්තමාන ප්‍රගතිය කොහොමද?***

දැන් බන්ධනාගාර ප්‍රශ්නය කියන්නේ එක ප්‍රශ්නයක් නෙමෙයි. විශාල ප්‍රශ්නයක් එය. ලොකුම ප්‍රශ්නය ජනගහනය වැඩිවීම. අපේ රටේ

මහේස්ත්‍රාත්වරුන් වර්තමානයේ හිතන්නේ මේ ඇප ලබාදීම වැරදියි කියලා. ඉස්සර ඇප නොලැබී යාම බොහොම දුර්ලභ අවස්ථාවක්. දැන් හැමෝම හිතන්නේ මේ ඇප ලැබෙන්නේ බොහොම දුර්ලභ අවස්ථාවකදි කියලා. එතනින් පටන් ගත්ත ප්‍රශ්නයක් අපේ බන්ධනාග ාර තුළ තියෙන්නේ. ඊට අමතරව දැන් අපි අත්දකින දෙයක් තමයි ඕනෑම කෙනෙක් සති දෙකකට බන්ධනාගාර ගතකලාට පස්සේ අපිට දැන් මුදාගන්න බැහැ. මොකද කොවිඩ් නිසා සති දෙකක් ඒ අය නිරෝධායනයට යවනවා. එතනට ගියාට පස්සේ අපි ඇප ගත්තත් එයාට එලියට එන්න බැහැ ඒ දවස් 14 තුළ. ඒ වගේ ප්‍රශ්න තියෙනවා.

අපි මහර සිදුවීම ගත්තොත් මට පේන හොඳම දේ තමයි මේ කොරෝනා පාවිච්චි කරලා අපේ රටම පාලනය කරන්න පුළුවන් කියලා කෙනෙක් හිතුවා. නිරෝධායන නීති කියලා අලුත් රෙගුලාසි ගෙනාවා. ඒ රෙගුලාසි හරිද වැරදිද කියලා නිශ්චය කරන්නවත් කවුරුත් නැහැ. ඇඳිරි නීතිය පැනෙව්වේ ඇඳිරි නීතිය දාන්න අයිතියක් නැති අය. මොකද පාර්ලිමේන්තුව තිබුණු නැති කාලෙදී ඇඳිරි නීතිය පැනෙව්වේ. ඒකත් වැරදියි. ඒ වගේ නොයෙක් නොයෙක් දේවල් මට පෙන්වා දෙන්න පුළුවන්. ඒ වගේම පසුගිය අප්‍රේල් මාසයේ අග වෙනකොට අපේ රටේ හිටපු බන්ධනාගාර ගත කණ්ඩායම විසිඑක් දහස (21000) දාහතර දහසට (14000) අඩු කළා. මොකද මේ කොරෝනා තත්ත්වය මත තදබදය වැඩිවන නිසා. නමුත් මැයි මාසයේ මේ රටේ ඇඳිරිනීතිය ඉවත් කරලා ඊට පස්සේ අපේ රටේ ආරම්භ වුණා war on drugs. හැබැයි ඒක ඇත්තටම ක්‍රියාත්මක වුණේ War on drug addicts and War on drug users විදියට. ඒක නිසා අර පාරේ තැනින් තැන ඉන්න තරුණයෝ ටික එකතු කරලා, ඒ අයව අරන් ඇවිල්ලා අපි රිමාන්ඩ් කළා. මේ අය ගංජා භාවිතා කරන, හෙරොයින් භාවිතා කරන මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අය වෙන්න පුළුවන්. ඉතින් මොකදවුණේ සැප්තැම්බර් මාසය වෙනකොට දාහතර දහසකට අඩුවෙච්ච සිර කණ්ඩායම තිස් හතර දහසකට (34,000) වැඩි වුණා. ඒක හිතන්න බැහැ ඒ තරම් අමානුෂික වැඩපිළිවෙළක්.

මට බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්ගෙන් දැනගන්න ලැබුණා එක දවසක ජනගහනය දහසකින් වැඩිවුණා කියලා බන්ධනාගාරය තුළ. ඒ

වගේම එදින එක් අයකුවත් නිදහස් වුණෙත් නැහැ කියලා. මොනවද මෙතන වෙන්නේ? එවැනි දෙයක් කොහොමද වෙන්නේ? ඒක තමයි මෙතන තිබුන ප්‍රශ්නය. එතනින් පස්සේ කොවිඩ් තත්ත්වය තුළ පවුලේ අයට යන්න බැහැ. නීතිඥවරුන්ට යන්න බැහැ. අපි ඇප අයදුම්පත් ඉදිරිපත් කළත් ඒවා සලකා බැලුවේ අමුතුම ක්‍රමයකට. අපිට ඒ ගැන සාකච්ඡාවක්වත් පවත්වන්න බැහැ. ඒ සියල්ල සිදුවන අතරෙදි මහර මේ සිදුවීම ඇතිවුණේ. දැන් 100%ක් පැහැදිලියිනේ මේ තත්ත්වය. වාර්තා දෙකක් මේ පිළිබඳ ඉදිරිපත් වෙලා තියෙනවා. කුමක් හෝ උද්ඝෝෂණයක් තිබුණා. මේ උද්ඝෝෂණය කරපු අයට බන්ධනාග ාර නිලධාරීන් හෝ වෙන කවුරු හරි (මොකද ඒක තාම අපැහැදිලියි, තාම අධිකරණ වෛද්‍ය වාර්තාවේ ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් නැහැ) හෝ මේ අයට වෙඩි තිබ්බා. පළවෙනි වතාවේ වෙඩි තිබ්බා. එතකොට මේ සිරකරුවන් පසු පසට ගියා. නැවත එළියට ආවම නැවත වෙඩි තිබ්බා. ඒ අතරතුර හැමෝම කෑ ගැහුවා. ගහගත්තා. නොයෙක් නොයෙක් දේවල් බන්ධනාගාරය තුළ සිදුවුණා. නමුත් එකොළොස් දෙනෙක් (11) එදා මරුමුවට පත්වුණා. ඒ ඔක්කොම වෙඩි උණ්ඩවලින් මරුමුවට පත්වුණේ. ඒ කියන්නේ අපේ නිලධාරීන් නේද ඒක කරේ එහෙනම්. එදා මම මහරට විතරක් නෙමෙයි, රෝහලට වගේම ඉන් පසුව වැලිකඩටත් ගියා. ඔබ දුටුවානම් ඒ මිනිසුන්ගේ ඇඟේ තියන වෙඩි උණ්ඩ තුවාල ගැන, මම කතා කරන්නේ ඔලුව, බෙල්ල, උරහිස, පපුව, කොන්ද උඩු කොටස ගැන, අවම බලය පාවිච්චි කිරීම කියන්නේ මේවගේ වෙඩි තැබීමේ ක්‍රමයක් නම් එහෙමනම් අපි අසමත්. අපේ පුහුණුව බොහොම මදි. එහෙම නැතිනම් කවුරු හරි කෙනෙක් තරහින් වෙඩි තැබුවා. ඔබ දකින්නැති එදා නිලධාරීන් අදහස් පළ කරපු විදිහ. අපි හැමෝම සමාජ මාධ්‍ය ජාල තුළින් දුටුවා ඒ සිදුවීම. අපේ මාධ්‍යවේදීන් පවා පළකරපු අදහස්. එහෙමද අපි කතා කළ යුත්තේ? නිලධාරීන් ඔවුන්ව හඳුන්වපු විදිහ. මාධ්‍ය කිව්වා මේ අය මත්ද්‍රව්‍ය භාවිතා කරලා හිටියා කියලා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/52jxE4Ys2PY

https://www.aithiya.lk/what-is-the-situation-of-geneva-ramani-muttetuwegama/

# 66. මේ ආණ්ඩුව කොරෝනාව ගරානාවක් කරගත්තා

## පාර්ලිමේන්තු මන්ත්‍රී මනූෂ නානායක්කාර

### *කෝවිඩ් දේශපාලනය*



පාර්ලිමේන්තු මන්ත්‍රී මනූෂ නානායක්කාර

කෝවිඩ් පළවෙනි රැල්ල මර්දනය කරන්න රජය වෙච්ච වෙහෙසවීම මේ අවස්ථාවේදී අපිට දකින්නට පුළුවන් කමක් නෑ. ඒ වෙලාවේ කොවඩ් මර්දනය දක්ෂ විදිහට කරපු රාජ්‍ය නිලධාරින් වෙන තැන්වලට යොදවලා සම්පූර්ණම දේශපාලනීකරනය කරන්න සහ කොරෝනාව ගරානාවක් බවට පත්කරන ව්‍යාපාරය තමයි දැන් මෙතන ක්‍රියාත්මක වෙන්නේ. පළවෙනිම කාරණාව මේ වෙලාවේ කෝවිඩ් පොසිටිව් වෙනවාද නැද්ද කියන එක හරියට බලාගන්න පුළුවන් වෙන්නේ වැඩි පරීක්ෂණ සංඛ්‍යාවක් සිද්ධකිරීම මගින්. වර්තමානේ පරීක්ෂන සිදුකිරීම අත්හැරලා දාලා තියෙනවා. හමුදාව ඇතුලේ පරීක්ෂණ කරන අයගෙන් සියයට පනහකට ආසන්න සංඛ්‍යාවක් පොසිටිව් වෙච්ච ගමන් හමුදාව තුළ නීතියක් දැම්මා මෙතනින් පස්සේ පීසීආර් කරන්න එපා කියලා. අපට ලැබෙන ආරංචිවල හැටියට එක තමයි වර්තමාන තත්ත්වය.

රෝගීන් අහුවෙන නිසා පොසිටිව් වෙනනිසා මේ වෙලාවේ පරීක්ෂණ සංඛ්‍යාව පුළුවන් තරම් අවම කර ගැනීමක් සිද්ධ කරනවා. ඒ විතරක් නෙමෙයි පරීක්ෂණ සංඛ්‍යාවක් කරලා ඒකේ ප්‍රතිඵල ආවම ඒ ප්‍රතිඵල එදා දවසෙදි නිකුත් කරන්නේ නෑ. නියමිත ප්‍රමාණයට නොදී හංගනවා. මොකටද මේක හංගන්නේ, හංගන්නේ මේකෙ තියෙන සැර බාල කරන්න. ආන්ඩුවට යෙදෙන පීඩනය වළක්වා ගැනීම සඳහා මේ සංඛ්‍යාලේඛන යට ගහනවා. පැහැදිලිවම කියනව මේ වෙලාවේ මේ

රැල්ල පාලනය කර ගැනීමට රජය අපොහොසත් වෙලා තියෙනවා. රජයට කරන්න දෙයක් නැති නිසා තමයි මුලින් මුට්ටි ගඟට දාලා ජනතාව අන්ඳන්න උත්සාහ කළේ. පළවෙනි දේ මුට්ටි ගඟට දැම්මා, දෙවනියට කාලිගේ පැණිය කියලා එකක් රාජ්‍ය අනුග්‍රහයෙන් ගෙනාවා. එසේ තියෙද්දී කාලිපැණි බීපු අයටත් පොසිටිව් වෙලා තියෙනවා.

*ලංකාව දූපතක්, මර්දනය කරන්න තිබුණ*

ලංකාව දූපත් රාජ්‍යයක් මේ දූපතට කොරෝනා එන්නඕනේ පිටින් තමයි. ඒ නිසයි අපි ගිය අවුරුද්දේ පෙබරවාරි මාසේ මතක් කළේ මේ වෙලාවේ ගුවන් තොටුපළ වහන්න කියලා. ගුවන්තොටුපළ නැව්තොට වහලා පළවෙනිම රට ආරක්ෂා කරගතන්න, ඊට පස්සේ බලමු කියලා. හැබැයි ඒක කරේ නෑ. මොකද්ද කිව්වේ ගුවන් තොටුපළ වහන්න පිස්සුවක් නෑ කිව්වා. මේ කොරෝනා ආපු වෙලාවේ ගුවන්තොටුපොළෙන් හෝ පළවෙනි අවස්ථාවේදීම හරියට සති දෙකක් එකසැරේ රට වහල සම්පූර්ණ නිරෝධායනය සිද්ධ වුණානං මේක වෙන්නේ නෑ. දෙවැනි වතාවේ ආපු වෙලාවේ වුණත් ඒ තීරණ ක්ෂණිකව ගත්ත නම් වලක්වා ගන්න තිබුණා. රටවල් ගණනාවක් කොරෝනාවලින් බේරුණා තමන්ගේ නිසික්‍රම උපායන් පාවිච්චි කරපු නිසා. ඒ වගේම චීනය, කොරෝනා හැදිච්ච තැන, ඔවුනුත් සාර්ථකව මේක මර්දනය කළා. මේ කිසි රටක් ආදර්ශයට ගත්තේ නැහැ.

*ආර්ථිකය*

මේ වෙලාවේ ආර්ථිකය හදාගැනීම වගේම මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කිරීමත් පළමුව කළ යුතුයි. රටේ ජනතාවගේ ජීවිත බේරගන්න ලබාදෙන ප්‍රමුඛස්ථානය පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා. ඒකට අවශ්‍ය ප්‍රමුඛස්ථානය දෙන්නේ නෑ. ප්‍රමුඛස්ථානය දෙනවා නම් අර සීනිවලින් ලාභ ගරන්න දීපු සල්ලි වැක්සීන් ගේන්න දෙනවනේ. කුළුනු හදන්න ඕනේ නැනේ, අලුතෙන් අධිවේගී මාර්ග හදන්න පටන්ගන්න ඕනේ නැනේ. මොනවද මේ කරන්නේ, තමන්ට ව්‍යාපාරික වශයෙන් ලාභ ලබන්න පුළුවන් අවස්ථා ඉක්මනින් ක්‍රියාත්මක කරනවා. ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්න මේ ආණ්ඩුවට අපි අත් දෙකම උස්සලා ඕනෑම අවස්ථාවක සහයෝගය දෙන්න සූදානම්.

### *වඳ කොත්තු වඳ යට ඇඳුම්*

2019 ජනාධිපතිවරණයට සූදානම් වෙන්නත් වඳ කොත්තු වඳ යටඇඳුම් ඇවිල්ලා අවසානයේදී බුදු පිළිමවලට ගල් ගහන තැනින් පටන් අරගෙන පාස්කු ප්‍රහාරයෙන් අවසන් කිරීම දක්වා වූ වැඩපිළිවෙළ මේ ආණ්ඩුව ඉතාමත්ම ක්‍රමානුකූලව ක්‍රියාත්මක වෙන්න ඉඩ හැරියා. බලයට ඒමේ අවශ්‍යතාව වෙනුවෙන්, එතකොට මාවනැල්ලේ බුදු පිළිමවලට ගල් ගහන කණ්ඩායමත් ඒ ගල් ගහපු කණ්ඩායමට විරුද්ව මාවනැල්ලේ කඩ කඩන්න ගියපු කණ්ඩායමත් එකම කණ්ඩායම කියනඑක අද හැමෝම දන්නවා. ඊට පස්සේ ආයි 20වැනි සංශෝධනය සම්මත කරගන්න ඕනෑ වුණහම මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ ඡන්දටික අරගෙන මුස්ලිම් ජනතාව දීපු ඡන්දවලින් පත්වෙච්ච මන්ත්‍රීවරු ටික අරගෙන ඒක සම්මත කරගත්ත. දැන් තවදුරටත් මේ පරණ කතා කියවලා වැඩක් නෑ කියලා ඉන්නකොට තමයි මුස්ලිම් මරණ භූමදාන ප්‍රශ්නය ආවේ. මේක ආපු ගමන් මේගොල්ලන්ගේ අර ඡන්ද පදනමේ ඉන්න සිංහල බෞද්ධයින්ට මේක දරාගන්න බැරිවුණා. ඒකත් එක්ක මේ මතවාදය හදලා බලයට ආපු මේ ආණ්ඩුවට කරගන්න දෙයක් නැතිවුණා. අන්තිමට මේ ප්‍රශ්නය ජිනීවාවලටත් ගියා. ජාතිවාදය පාවිච්චි කරලා බලයට ආවාම එහෙම තමයි.

### *ස අසමත්..*

ආණ්ඩුවේ අසාර්ථකභාවය මේ අයට දරාගන්න බැහැ. හේතුව තමයි රටේ ප්‍රධාන පුරවැසියා දේශපාලනඥයෙක් නෙවෙයි. රටේ මිනිස්සු අතර මතයක් හැදුවා 225ම එපා කියලා. රටේ ප්‍රධාන පුරවැසියා දේශපාලනඥයෙක් නොවේ සහ ප්‍රායෝගික දේශපාලනය පිළිබඳ අත්දැකීම් නෑ. ඒකත් එක්ක අසමත් වුණා විතරක් නෙමේ මේ අසමත්වීම වළක්වාගන්න ඔහු දැන් තමන්ගේ සුපුරුදු මර්දනය ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තියෙනවා. හමුදාව කරපු සේවයට ඔවුන්ගේ කැපවීම්වලට අපි බොහොම ආදරෙයි. හැබැයි එහෙම කියලා හමුදාව කරන වැරදිවලට අපි විරුද්ධයි. ඉතිහාසයේ අපිට ආපු එක චෝදනාවක් තමයි අපි හමුදා නිලධාරීන්ට විරුද්ධව කටයුතු කළා කියලා. අපි විරුද්ධවුණේ හමුදා විනය මත කටයුතු කළ නියම රණවිරුවන්ට නෙවෙයි අපි විරුද්ධ වුණේ, දේශපාලන අවශ්‍යතා මත

මාධ්‍යවේදීන් පැහැර ගත් අයට, හමුදා බලය පාවිච්චි කරලා කප්පම් ගන්න ගියපු අයට, දේශපාලන අවශ්‍යතා මත හමුදා සේවය ගණිකා සේවයක් කරපු අයට.

ඒ අනුව රටේ මතයක් ගොඩනැගුවා අපි හමුදාවට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරනවා කියලා. හාමුදුරුවොන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරනවා කියලා. හැබැයි හාමුදුරුවෝ වුණත් පුරවැසියෙක් නම් ඔහු රටේ වැරදිකරලා තියෙනවා නම් නීතිය ක්‍රියාත්මක කරන්න බයවෙන්න ඕනේ නෑ. මං කියන්නේ හරිදේ කරලා හරි විදිහට ක්‍රියාත්මක කිරීම තමයි වඩා වැදගත් වෙන්නේ. දැන් ආණ්ඩුව ක්‍රියාත්මක කරනදේ තමයි තමන්ගේ අසමත්වීම වහගන්න තමන්ගේ මතයට විරුද්ධ අදහස් ප්‍රකාශ කරන අයට විරුද්ධව කටයුතු කිරීම. රන්ජන් රාමනායක උසාවියට අපහාස කිරීමක් සිද්ධ කරලා තියනවා කියලා ගරු අධිකරණය තීන්දු කරලා තියෙනවා. ඒකට දිය යුතු දඬුවමේ ප්‍රමාණය පිළිබඳව අද ප්‍රශ්න මතුවෙලා තියෙනවා. පාර්ලිමේන්තුවට ගෙනඒම පිළිබඳව ප්‍රශ්න මතුවෙලා තියෙනවා. එතුමාව පාර්ලිමේන්තුව ගෙනඒම පිළිබඳ ප්‍රශ්නය තියෙන්නෙ කථානායකවරයාගේ අතේ, ඒක අධිකරණය තීන්දුවක් නෙවෙයි. ඔහුගේ මන්ත්‍රී ධුරය පිළිබඳ තීන්දුව ගන්න තියෙන්නෙ කතානායකවරයාට. අධිකරණයකින් මිනීමැරුම් චෝදනා සහිත අයෙක් විදියට පත්වෙච්ච කෙනා පාර්ලිමේන්තු ඇවිත් ඉන්නවා. වචනයක් වැරදිච්ච කෙනා අද හිරගෙදරට දාලා තියෙනවා. ජනාධිපතිවරයා ආරක්ෂක ලේකම් කාලේ තමයි සිරසට බෝම්බ ගහලා සියතට ගිනි තිබ්බේ. ලසන්ත වික්‍රමතුංග ඉඳලා එක්නැලිගොඩගේ ඉඳලා මරා දැමීම් අතුරුදහන් කිරීම්, පහරදීම්, අඩත්තේට්ටම්, මේ දේවල් සේරම සිද්ධවුණේ. ඒක අපිට අමතක නැහැ. ඒ කාලේ ජනාධිපතිවරයා මහින්ද රාජපක්ෂ, එතකොට ඒ චරිතය රඟපාන්න පුළුවන් කියන එකනේද මේ අනියමාර්ථයෙන් කිව්වේ. මේ අනියමාර්ථය තර්ජනයක් නෙවෙයි ද? අද ජනාධිපතිවරයා තමන්ගේ අසමත්වීම වහගන්නේ තර්ජනය කරලා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/q5HhHWS1TVw

https://www.aithiya.lk/manusha-nanayakkara-current-political-situation-in-sri-lanka/

# 67. ඔන්ලයින් අධ්‍යාපනය අසමානයි, ගමේ ළමුන්ට අසාධාරණයක් සිද්ධ වෙනවා

## ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝෂප් ස්ටාලින්



ජෝෂප් ස්ටාලින්

***රටේ තියෙන කොවිඩ් තත්ත්වය එක්ක පාසල් ආරම්භ කිරීම සම්බන්ධයෙන් විවිධ විවේචනයන් එල්ලවුණා. හැබැයි රජය දැන් විරෝධතා නොසලකා පාසල් පටන් අරගෙන පවත්වාගෙන යනවා. ඒ වගේම පාසල් තුළින්ද ආසාදිතයන් වාර්තා වෙනවා. මේ සම්බන්ධයෙන් මොකක්ද ඔබේ අදහස?***

ආණ්ඩුව පාසල් පටන් ගත්තේ යම්කිසි සැලැස්මක් අනුව වැඩ කරනවා කියලා. නමුත් අපිට එහෙම සැලැස්මක් පේන්න නැහැ. විශේෂයෙන්ම පාසල්වල සනීපාරක්ෂාව සම්බන්ධයෙන් 2021 අවුරුද්දට කිසිඳු මුදලක් අධ්‍යාපන අමාත්‍යාංශයට ලබාදීලා නැහැ. රජයේ ප්‍රධාන වගකීමක් තමයි සනීපාරක්ෂක ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. මේ කොවිඩ් රෝග ව්‍යාප්තිය පාසල් පද්ධතිය තුළ ඇති නොවේ කියන සහතිකය ඇති කරන්න රජය කිසිම කටයුත්තක් කරල නැහැ. අපි දන්නවා පාසල් පටන් ගත්ත දවසෙම ළමුන්ගේ පැමිණීම 51% ක් තිබුණා. අද වෙද්දි ඒක 60%-70%ත් ආසන්න ප්‍රමාණයට වර්ධනය වෙලා තියෙනවා. හැබැයි මේ ළමයි පැමිණීම තවදුරටත් වර්ධනය කරගැනීම රජයේ වගකීමක්. ඒකෙදි මේ තියෙන අඩුපාඩු ඔවුන් නිවැරදි කරගත යුතුයි. අපට පේන්නේ නැහැ ඒකට කිසිම සැලැස්මක් තියෙන බව. පාසල් පද්ධතියේ අඩුමගානේ අතපය පිරිසිදු කරගන්න සැනිටයිසර්, ඒ වගේ පහසුකම්වත් නැහැ. මේ වගේ සනීපාරක්ෂක ද්‍රාවණ සැනිටයිසර් වගේ දේවල් තියෙනවා නම් හොඳයි. අඩුම තරමේ පාසල් ආරම්භ

වෙනකොට ළමයෙකුට දාගෙන එන්න මාස්ක් එකක් වත් ලබාදෙන වැඩපිළිවෙලක් නැහැ. එකම මාස්ක් ටික හැමදාම ළමයිට පාවිච්චි කරන්න බැහැනෙ. අඩුම තරමේ මාස කිහිපයකට සැරයක් වත් මුව ආවරණ ලබාදෙන්නවත් කිසිම සැලැස්මක් නැතුව පාසල් පටන් අරගෙන තියෙන්නේ.

ළමයින්ට ආසාදිත වෙන්නට තියෙන ඉඩකඩ වැඩියි ප්‍රවාහනය නිසා. ගෙදර ඉඳන් ළමයා කොහොමද ප්‍රවාහනය පරිහරණය කරන්නේ. ඒකෙදි රජය මාධ්‍ය නිවේදන නිකුත් කරලා තිබ්බා. චක්‍රලේඛ නිකුත් කරලා තිබ්බා. ඒවායින් කියැවෙන්නේ දෙමාපියෝ ළමයගෙ වගකීම ගන්න ඕනේ. ප්‍රවාහනය කරන පාර්ශවය ප්‍රවාහනයේ දී වගකීම ගන්න ඕනෑ, විදුහල්පතිවරුන් පාසල පවත්වාගෙන යාමේ වගකීම ගන්න ඕනේ කියලා. එතකොට ආණ්ඩුවට තියෙන වගකීම මොකද්ද? ආණ්ඩුවට කිසිම වගකීමක් නැහැ. ඒ නිසා මේකෙදි වගකීම් සහගතව ආණ්ඩුව කටයුතු කරන්න ඕනෑ. මොකද එක සැරේකට හතළිස් තුන් ලක්ෂයක් ළමයි සමාජයට නිරාවරණය වන අවස්ථාවක් මේ.

***මේ වසර පුරාම අධ්‍යාපනය අඩාල වුණා. විශේෂයෙන් අගනුවර සහ නගරබද පාසල් ඔන්ලයින් අධ්‍යාපනය කරගෙන ගියා. නමුත් ගම්බදව ජීවත්වන දරුවන්ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම ගිය අවුරුද්දේ කඩාවැටුණා. එතකොට මං හිතන්නේ මේ අවුරුද්දෙත් මේ ටිකම තමයි වෙන්නේ. ඒ ගැන මොනවද කියන්න තියෙන්නේ?***

පැහැදිලිව ඔන්ලයින් අධ්‍යාපනයේ තියෙන ප්‍රශ්නය තමයි ඩේටා අවශ්‍යතාවය. ඩේටාවලට මුදලක් අවශ්‍යයි. අඩුගානේ රජයට තිබ්බා මේ දූරකථන සමාගම් සමග සාකච්ඡා කරලා යම් විදිහක දැනට ඔන්ලයින් අධ්‍යාපනය කරගෙන යන්න පුළුවන් ඇප්එකක් හඳුන්වා දීලා ඒකෙන් ඒ අධ්‍යාපනය නොමිලේ ලබා දෙන්න පහසුකමක් හදන්න. එවැනි දේවල් කලේ නැහැ. සමාගම්වලට මුදල් හම්බ කරන්න තමයි ඉඩ දීලා තියෙන්නේ.

නගරාශ්‍රිතව ඉන්න සමාජ- ආර්ථික වශයෙන් යම් හැකියාවක් තියෙන පුද්ගලයින්ගේ දරුවන්ට ඔන්ලයින් අධ්‍යාපනය ලැබුනා. සාමාන්‍ය දූරකථනයක් තිබුනත් මේක කරන්න බැහැනේ. ඒකට තියෙන්න

ඕනේ ස්මාර්ට් ජංගම දූරකථනයක්වත්. එතකොට පවුලක ළමයි කිහිප දෙනෙක් ඉන්නවා නම් කොහොමද එකම අවස්ථාවේ පවුලේ තුන් හතර දෙනා, ගුරුවරු පාඩම් එවනකොට ළමයි ඒක කරන්නේ. එතකොට ගුරුවරුන්ගේ පැත්තෙන් ඒ සඳහා ඒ අයට පහසුකම් තිබුණේ නැහැ. ගුරුවරු ඒ දේවල් කරන්නෙත් අතින් සල්ලි වියදම් කරගෙන. ඒගොල්ලන්ට ඩේටාවලට සල්ලි දීලා තිබුණෙ නැහැ. ඇත්තටම මේකෙන් යම්කිසි සමාජ පන්තියක් තමයි හැදෙන්නෙ. කන්නන්ගර ප්‍රතිසංස්කරණවල තියෙන්නේ සම අධ්‍යාපනයට මොකද වෙන්නේ? ගිය අවුරුද්ද තුළ අසමාන අධ්‍යාපනයක් ලබමින් සමාන ප්‍රශ්න පත්‍රයකට ළමයි මුහුණ දෙන තත්ත්වයක් තමයි දැන් නිර්මානය වෙලා තියෙන්නේ. කැබිතිගොල්ලෑව ළමයත් රාජකීය විද්‍යාලයේ ළමයත් එක ප්‍රශ්න පත්‍රයට මුහුණ දෙන්නේ සාමාන්‍ය පෙළ විභාග යේ දී, මෙවැනි අසමාන අධ්‍යාපනයක් ලබාගෙන කොහොමද විභාග යට වාඩිවෙන්නේ. රජයේ වගකීමක් එවැනි තත්ත්වයන් වළක්වා ගැනීම. ඒවාට සැලසුම් කරලා කිසිම දෙයක් ආණ්ඩුව කළේ නැහැ. ඒක ඇත්තටම කනගාටුදායක තත්ත්වයක්.

පරිධියේ ජීවත්වන ජනතාවගේ දරුවන්ට විශාල අසාධාරණයක් මේකෙන් සිද්ධ වෙලා තියෙන්නේ. පැහැදිලිවම ගත්තොත් ලංකාවේ පාසල්වල 87%කට වැඩිය ළමුන් රූපවාහිනී මාධ්‍යය භාවිතා කරනවා. පෞද්ගලික රූපවාහිනී මාධ්‍ය සමඟ වුණත් සාකච්ඡා කරලා අඩුග ානේ ජනතාව වැඩිපුර රූපවාහිනිය නොබලන වෙලාවල් හෝ තෝරාගෙන අධ්‍යාපනය දෙන්න තිබුණා. එවැනි දෙයක් ගැන පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට සැලසුමක් තිබුණේ නැහැ. ඒගොල්ලො වැඩිබරක් තිබ්බේ ඔන්ලයින් ඉගැන්වීමට. ඒක අසාර්ථකයි. ලංකාවේ සමානව සිග්නල් ව්‍යාප්තියක් නැහැ. මේ දූරකථන සමාගම්වල දැන්වීම් බැලුවහම ලංකාවම ආවරණය කරනවා කියලා කියනවා. හැබැයි ඔන්ලයින් අධ්‍යාපනය කරන්න ගියාම තේරෙනවා ළමයි කඳු උඩ නගින හැටි. ඇත්තටම මේ ප්‍රශ්නවලට රජය විසඳුම් ලබා දුන්නේ නැහැ. ජනමාධ්‍යවලින් කොහේ හරි තැනක් පෙන්නුවහම එතනට ගිහිල්ලා කුළුණක් සවි කරලා ඒකෙන් දේශපාලන වාසියක් ගන්න එක තමයි පහුගිය දවස් වල කළේ.

***පළමුවැනි ශ්‍රේණියේ ළමයි ගත්තොත් මේ පහුගිය අවුරුද්දේ ම පාසල් යන්න බැරි වුණා. එතකොට සෑහෙන වැඩ ටිකක් මේ දරුවන්ට මඟ ඇරෙනවා. අකුරු හුරුව වගේ දේවල්.***

මේක නිසා තමයි අපි කිව්වේ ජාතික අධ්‍යාපන කොමිසමක් තියෙනවා. ජාතික අධ්‍යාපන ආයතනය තියෙනවා. ඊට පස්සේ විශ්ව විද්‍යාලවල අධ්‍යාපනඥයින් ඉන්නවා. ගුරු අධ්‍යාපනය විද්‍යාලවල, විද්‍යාපීඨවල ගුරු අධ්‍යාපනඥ නිලධාරීන් ඉන්නවා. එතකොට පහුගිය කාලයේ මේ සියලු ආයතන වහලා තිබ්බේ. දැන් මේ ඔක්කොම එකතු කරගෙන සැලැස්මක් හදලා, විෂය මාලාව සංශෝධනය කරලා, වැඩසටහනක් හදන්න කියලා අපි යෝජනා කළා. ඔවුන්ට ඒ පිළිබඳ වගේ වගක් නැහැ. අපි දකිනවා විදේශ රටවල අධ්‍යාපනඥයෝ කොහොමද ළමයින්ට අධ්‍යාපනය දෙන්නෙ, කඩා වැටිච්ච අධ්‍යාපනය කොහොමද ගොඩනගන්නෙ කියලා. විවිධ විකල්ප ක්‍රියාමාර්ග ඔවුන් තම දරුවන් වෙනුවෙන් භාවිතා කරමින් ඉන්නවා. අපේ අයට කෝකටත් තෛලය වගේ හැමදාම ඔන්ලයින් විතරයි.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/R2FkQCveyQM

https://www.aithiya.lk/online-education-in-sri-lanka-ceylon-teachers-union/

# 68. කැබිනට් ඇමති කියන්නේ දැන් බෝඩ් ලෑල්ලක් විතරයි

## මහාචාර්ය එච් ඩබ්ලිව් සිරිල්


මහාචාර්ය එච් ඩබ්ලිව් සිරිල්

***මුලින්ම අපි කතා කළොත් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනකුට රටේ ජනතාව තුළ නව බලාපොරොත්තුවක් ඇති වුණා. දැන් එතුමා ධුරයට පත්වෙලා වසරකට වැඩි කාලයක් ගතවෙලා. නැවත හිතලා බැලුවොත් මේ තිබුණු බලාපොරොත්තු ගැන මොකක්ද කියන්න තියෙන්නේ?***

අවුරුද්දකට පස්සේ අපි ආපසු හැරිලා බලනකොට ඒ අවුරුද්ද අපිට එච්චර සතුටු වෙන්න පුළුවන් වාතාවරණයක් නැහැ. 69 ලක්ෂයක් ජනතාව ඡන්දෙ දීලා මේ රජය බලයට පත් කරගත්තේ විශාල බලාපොරොත්තු රාශියක් එක්ක. ඒ ගොල්ලන් රට වෙනත් මගකට අරගෙන යනවා කියලා කිව්වා. රට සංවර්ධනය කරනවා, නීතිය හැමෝටම එක විදිහට ක්‍රියාත්මක කරනවා කියලා කිව්වා. ඒ වගේ දහසක් බලාපොරොත්තු දීලා, නව නායකයෙක්, එඩිතර, දූෂණයෙන් - භීෂණයෙන් තොර අවංක නිලධාරියෙක් කියලා, වැඩ කරපු කෙනෙක් කියලා, තමයි බලයට ආවේ. දැන් දේවල් සිද්ධ වෙන්නේ කොහොමද? ඔහු තීන්දු තීරණ ගන්නේ කොහොමද? ඒවා දිහා බැලුවාම ඡන්දය දීපු කාටවත් සතුටක් නැහැ.

ඊට අමතරව ගෝඨාභය මහත්තයාට එකතුවුණා වියතුන් කියලා කොටසක්, ඒ අයත් සිස්ටම් චේන්ජ් එකක් ගැන තමයි කතා කළේ. හැබැයි එයාලගේ කතාත් නිකන් බොරු වෙලා ඉවරයි. පාර්ලිමේන්තුව

ගත්තොත් මේ රටේ පාර්ලිමේන්තුවේ උගතුන්, අත්දැකීම් බහුල පුද්ගලයින් ඉන්න පාර්ලිමේන්තුවක් ද කියලා කියන්න බැහැ. ලැජ්ජයි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු ඇමැතිවරු කියන පිරිස හැසිරෙන විදිහ දිහා බැලුවහම. පහුගිය දවස්වල අයවැය තිබුණා. මම නම් දැක්කේ නැහැ එකම කෙනෙක්වත් අය - වැය ගැන කතා කරනවා. මේ රටේ සංවර්ධන වැඩපිළිවෙළ ගැන කතා කරනවා. එක්කෙනෙක් තව කෙනකුට මඩ ගහනවා. එයා අනිත් කෙනාට මඩ ගහනවා. අසභ්‍ය වචනවලින් බැන ගන්නවා. පාර්ලිමේන්තුව කියන්නෙ රටේ සංවර්ධනය, පැවැත්ම, දියුණුව වෙනුවෙන් ප්‍රතිපත්ති හදලා ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ඉතාම වැදගත් ආයතනයක්. හැබැයි ඒ කිසිම කෙනෙක් ප්‍රතිපත්ති ගැන කතා කරන්නෙ නැහැ. මං කියන්නේ එහෙම කතා කරන්න දැනුමක් තියෙනවද නැද්ද කියලා හිතාගන්න බැහැ. දැන් මේ උගතුන් ගිහින් ඉන්නවනෙ. ඒගොල්ලන්ගේ දායකත්වයක් අද වෙනකම් මටනම් පෙනිලා නැහැ. පාර්ලිමේන්තුවේ රැස්වීමක් තියනකොට ඒක නිකන් කාලගෝට්ටියකට සමානයි.

*වර්තමානයේ ඇතිවුණ සිදුවීම් බලද්දි රජය පැත්තෙන් වුණත් සාමූහික තීරණ ගැනීමක් දකින්න නැහැ නේද? මේ ප්‍රශ්න වලට රජයේ නිසි මැදිහත් වීමක් සිදුනොවන එක ඔබ කොයි ආකාරයට දකින්නෙ?*

අපි බැලුවොත් එහෙම, පහුගිය කාලේ කරපු දේවල් පරිසරය පැත්තෙන් ගත්තොත් ඉතා විශාල හානියක් කරගෙන යනවා. රජය නොදැනුවත්ව වෙන්න නම් බැහැ. මොකද කැලේ කපනකොට ඉඩම් විශාල වශයෙන් එළිපෙහෙලි කරගෙන යනකොට එක නොපෙනෙන්න විදිහක් නැහැනේ. ඒ වගේම තියෙන ආරංචි අනුව, ලැබෙන තොරතුරු අනුව රජයට සම්බන්ධ කමක් තියෙන පුද්ගලයෝ රජයේ හයිය අරගෙන තමයි පරිසර හානිය කරන්නේ කියලා පැහැදිලිව පෙනී යනවා. සිංහරාජය හරහා පාරක් නිර්මාණය කරනවා කිව්වා. පාරවල් තියෙන්න ඕනේ. ඒ දේවල් දියුණු කරන්න ඕනේ තමයි. හැබැයි සිංහරාජය සලකන්නෙ ලෝක උරුමයක් හැටියට. ඒ වගේ තැනකට හානියක් නොවෙන හැටියට තමයි ඒ වැඩ කටයුතු කරන්න ඕන. සියලු දෙනාගේම සහභාගීත්වය අරගෙන පරිසරවේදීන්, පරිසර හිතකාමී පුද්ගලයෝ, ඒ රජයේ නිලධාරීන් එකතුවෙලා තමයි මේ

කාර්යය කරන්න ඕන. එහෙම නෙමෙයි දැන් දේවල් සිද්ධවෙන්නේ. රටේ නායකයා ගිහින් කියනවා. ඔව් මේක කරන්න. ඒ වගේ දෙයක් අපි ජනාධිපතිතුමාගෙන් බලාපොරොත්තු වුණේ නැහැ. ඔහු ඇවිල්ලා සියලු දෙනාගේම අදහස් අනුව සර්ව-සාධාරණව වැඩ කරයි කියලා බලාපොරොත්තු වුණේ. නමුත් දැන් පේන්නේ එහෙම නෙමෙයි. ඔහුට ඕනෑදෙය තමයි කරන්නෙ. ඒක ඉතාම අයහපත් තත්වයක්. දැන් බැලුවොත් සිංහරාජය, එතකොට රැම්සාස් සම්මුතියට අයත් ආනවිලුන්දාව තෙත් බිම්, දහයියාගල, සීතලවන්නිය පැත්තේ කෙරෙන වන විනාශයන්, මේවා විනාශ කරන විට පරිසරවේදීන් කොයිතරම් හඬ නැඟුවත් ඒවා නවත්වන්න කිසිම උත්සාහයක් නැහැ. ඊළඟට හන්තාන කැලෑ එළිපෙහෙළි කරලා එනසාල් වවන ව්‍යාපෘතියක් යනවා. විල්පත්තුවේ කැලෑ එළි කරනවා. හොරොව්පතාන රත්මලේ රක්ෂිතය. දැන් සමාජ මාධ්‍ය ඔස්සේ මේවා ප්‍රසිද්ධියටත් පත්වෙනවා. හැංගි හොරා නෙමෙයි මේ දේවල් සිද්ධවෙන්නේ.

මේ දේවල් වෙන්න එක හේතුවක් තමයි මං කියන්නේ විසිවෙනි සංශෝධනය ගෙනල්ලා තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී ගති ලක්ෂණ වෙනස් කරල විධායක බලතල නැවත වතාවක් ජනාධිපතිවරයා වෙත පවරා ගැනීම. දැන් පාර්ලිමේන්තුවට බලයක් නැහැ මේවා නවත්වන්න. මොකද තනිකර ජනාධිපතිතුමාට ඕන විදිහට තමයි මේ දේවල් වෙන්නෙ. ඇමතිවරු හිටියට අර බෝඩ් ලෑල්ලකට සීමා වෙච්ච ඇමතිවරු තමයි ඉන්නේ. ඔවුන්ට හැකියාවක් නැහැ මේවා ගිහින් හොයල බලල අවශ්‍ය කරන තීන්දු තීරණ ගන්න. ඒ කියන්නේ ඇත්තටම පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයින්ට කරන්න කාර්යක් නැති මට්ටමට පත් වෙලා තියෙනවා. ඒ විසිවෙනි සංශෝධනය හින්දා. කිව්වේ මේ රටේ නායකයාට සියලු බලතල දුන්නොත් මේ රට සුරපුරයක් කරන්න පුළුවන්, රට වේගයෙන් සංවර්ධනය කරා යන්න පුළුවන් කියලා. හැබැයි එහෙම දෙයක් වෙන්නෙ නැහැ. මේ කරන වැරදි වැඩවලට වග කියන්න ඕනේ මේකට දායක වුණ කට්ටිය.

***රටේ නීතිය ක්‍රියාත්මක වීමේ දී විවිධ පුද්ගලයන්ට විවිධ ආකාරයෙන් නීතිය ක්‍රියාත්මක වෙනවා කියලා චෝදනාවක් තියෙනවා. ඒ වගේම බරපතළ චෝදනා තියෙන පුද්ගලයින් හිරෙන් නිදහස් කිරීම ගැනත්***

***කතාබහක් ඇතිවෙලා තිබෙනවා. මේ දේවල් එක්ක බලද්දි ඉදිරියට මොනවගේ තත්ත්වයකට මුහුණ දෙන්න වෙයිද?***

මේක විහිලුවක් කියන්නේ අපිට සාමාන්‍ය ජනතාව වශයෙන් සාධාරණ සැකයක් එනවා මොකක්ද මේ වෙන්නේ කියලා. අර පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් ඉන්නවා රත්නපුර දිස්ත්‍රික්කයේ මිනීමැරුම් චෝදනාවකට හිරේ ගියපු. එයා පාර්ලිමේන්තුව ඉන්නවා. එතකොට පාර්ලිමේන්තුව කියන්නේ මොකක්ද? පාර්ලිමේන්තුව තමයි නීති සම්පාදනය කරන්නේ, ඒවට දායක වෙන්නේ. එතකොට හිරේ ඉන්න කෙනෙක් ඇවිල්ලා පාර්ලිමේන්තුවේ වාඩිවෙලා ඉන්නව නම් මොකක්ද පාර්ලිමේන්තුවේ තත්ත්වය. සිල් රෙදි නඩුවේ කට්ටිය නිදහස් වුණා. බැසිල් රාජපක්ෂ මහත්මයා නිදහස් වුණා. ජනක බණ්ඩාර තෙන්නකෝන් මහත්මයා නිදහස් වුණා. අපිට සැකයක් තියෙනවා ඔයනම් කියවෙන අනික් අයත් ඉදිරියේදී නිදහස් කරයි කියලා. මේ වෙන්නේ මොකද්ද මිනිස්සු පුදුමයෙන් තමයි අධිකරණය දිහා බලාගෙන ඉන්නේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/RMEvDGAC-00

https://www.aithiya.lk/current-political-situation-in-sri-lanka-professor-h-w-siril-nldb-chairman/

# 69. කුල සාධකය රාජ්‍ය ප්‍රතිපත්තියක්..!

## මංජුල ගජනායක - මාර්තු 12 ව්‍යාපාරය

***පහුගිය ආණ්ඩුවට එල්ල වෙච්ච විශාලම චෝදනාවක් තමයි මැතිවරණ කල් දැමීම, එදා චෝදනා ගොනුකළ පාර්ශවය අද බලයට පත්වෙලා ඉන්නවා. එහෙත් ඔවුනුත් පළාත් සභා ඡන්දය පවත්වන්න සූදානම් බවක් පෙනෙන්නේ නැහැ..***



මංජුල ගජනායක

ලංකාවේ ප්‍රධානතම මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් විදිහට කතා කිරීමේදී මේ වෙද්දි අපි පවත්වලා තියෙනවා මැතිවරණ 74 ක් 1947 පළමු මැතිවරණයත් එක්ක. එය 1947 ඉඳලා වර්තමානයේ දෙස බැලීමේදී අපිට කියන්න තියෙන්නේ මැතිවරණ විෂය කාරණාවේදී එක් පක්ෂයක්වත් අවංකව කටයුතු කරලා නැහැ. මැතිවරණයක් කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ මහා උත්සවය ලෙස හඳුන්වනවා, නමුත් 1977 න් පස්සෙ පත්වෙච්ච ලංකාවේ සියලුම පාලක පක්ෂ මැතිවරණවලදී කටයුතු කරලා තියෙන්නේ තමන්ගේ දේශපාලන අභිමතාර්ථ සඵල කර ගැනීමට පමණයි. බොහෝ වේලාවට එක් පුද්ගලයෙකුගේ හෝ කිහිපදෙනෙකුගේ අභිප්‍රායන් සඵල කරගැනීමට මැතිවරණ කල් දමනවා. 2015ට කලින් එවකට ප්‍රධාන ආණ්ඩු පක්ෂය වෙච්ච ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමයි පළාත් සභා මැතිවරණය කල් දැම්මේ, නමුත් 2015 බලයට පත්වෙලා ආපු යහපාලන රජයටත් පළාත් සභා ඡන්ද තියන්න එච්චර උවමනාවක් තිබුණේ නෑ. යහපාලන රජයට පළාත් සභා ඡන්දය තියන්න සුදුසු වාතාවරණයක් ඇතිවෙලා තිබුණු කාලයේ පවා ඔවුන් ඡන්දය කල් දැම්මා. ඒ වගේම තමයි වර්තමානයේ සිටින ආණ්ඩුවටත් පළාත් සභා ඡන්දය තියන්න කිසිඳු උවමනාවක් නෑ.

මෙන්න මේ නිසා පැහැදිලි වෙනවා කිසිදු පක්ෂයක් මැතිවරණයකදී අවංක ලෙස කටයුතු කරන්නේ නැහැ කියලා.

***ඔබ සඳහන් කළ පරිදි මැතිවරණ පවත්වන්නේ ආණ්ඩු පක්ෂය ජනප්‍රිය කාලවලදී පමණක් ද එහිදී මැතිවරණ කාල වේලාවට නොපැවැත්වීමෙන් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය මොකද වෙන්නේ?***

මෙය ඉතාම හොඳ ප්‍රශ්නයක්. නව මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේදී ඊට සහභාගි වුණා ස්වාමීන් වහන්සේලා කිහිප දෙනෙක්, ඒ අතරින් එක ස්වාමීන් වහන්සේ නමක් පැවසුවා මැතිවරණවලටට යන වියදම් පාලනය කරන්න, ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ සල්ලි තියෙන මනුස්සයා බලයට පත්කර ගැනීම නෙවෙයි කියලා. මෙය ඉතාම සතුටට කාරණයක් වුණත් මැතිවරණ කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවක් වුණත් ඔවුන්ට කෙලින් තීරණයක් ගන්න නොහැකිවෙලා තියනවා. 19වෙනි වැනි ව්‍යවස්ථා සංශෝධනය මැතිවරණ කොමිෂන් සභාව ස්වාධීන එකක් කරත් එය සමහර අවස්ථාවලදී ප්‍රායෝගික වුණේ නෑ. ඒ වගේම තමයි 20වන ව්‍යවස්ථා සංශෝධනයෙන් තිබුණ බලයත් කප්පාදු කරලා තියෙන්නේ, ඉතින් මේ ආකාරයට මැතිවරණ කොමිෂන් සභාවට තනි තීරණයක් ගැනීමට නොහැකි වන ආකාරයට කටයුතු යොදා තිබෙන තාක්කල්, මැතිවරණ නියමිත කාලවලදී පවත්වන්නට නොදෙන තාක්කල්, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු වන්නේ නෑ. ඒ වගේම තමයි මේ රටේ පාලකයෝ මැතිවරණය තමන්ගෙ මෙවලමක් විදියට යොදාගන්නවා. ඒකත් ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල ප්‍රශ්නයක්.

***මේ විදිහට ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය කඩවෙනකොට ඔවුන් ඒ පිළිබඳව දැනුවත් ද? ඔබලා සංවිධාන විදිහට ජනතාව දැනුවත් කළාද?***

ඔබ අහනවා අපි මොනවද කළේ කියලා, අපි ලොකුවට අරමුදල් ලබාගන්නා සංවිධාන නොවේ නමුත් අපට පුළුවන් ආකාරයට අපි සමාජය තුළ දැනුවත් කිරීම් සිදු කරගෙන යනවා. පසුගිය පාර්ලිමේන්තු

මැතිවරණයේදී සුනිල් හඳුන්නෙත්ති මහත්මයා පරාජය වෙනවා ඒ වගේම තමයි ඩලස් අලහප්පෙරුම මහත්මයා ඡන්ද ලැයිස්තුවේ තුන්වැනි ස්ථානයට පත් වෙනවා. මම මැතිවරණ නිරීක්ෂකයෙක් විදිහට බයනැතුව කියනවා එම ඡන්ද ලැයිස්තුවේ පත්වෙච්ච පළවෙනි හා දෙවෙනි පුද්ගලයන් දෙදෙනාම මුදල් වැයකරලා තමන්ගේ ඡන්දය ලබාගත්තා කියලා. ඒ වගේම මිනිස්සු පවසනවා මාතර කියන්නෙ බුද්ධිමත් ජනතාව ඉන්න නගරයක් කියලා. නමුත් බුද්ධිමත් ජනතාව සිටින නගරයක් වුවත් ඔවුන් ද තමන්ගේ බඩු මල්ලට තමන්ට ලැබෙන රුපියල් පන්දාහට තමන්ගේ ඡන්දය දීලා තිබෙනවා. මම මැතිවරණ නිරීක්ෂකයෙක් විදිහට කියන්නේ සුනිල් හඳුන්නෙත්ති වැනි මන්ත්‍රීවරයෙක් හිටියට කමක් නෑ පාර්ලිමේන්තුවේ. ඒ වගේම තමයි ඩලස් අලහප්පෙරුම වැනි හොරකම් කරන්නැති මන්ත්‍රීවරයෙක් පවා ලයිස්තුවේ ඉහළින් හිටියට කමක් නෑ. නමුත් කිසිඳු දවසක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්වත් නොවෙච්ච කෙනෙක් පාර්ලිමේන්තු මැතිවරණයේදී එම ඡන්ද ලැයිස්තුවේ ඉහළටම පැමිණීම ආශ්චර්යයක් නොවේද? ඇත්තම පැවසුවොත් එය ආශ්චර්යයක් නොවෙයි, ජනතාවගේ පවත්නා අඩු දේශපාලන සාක්ෂරතාව තමයි ඒකට හේතුව.

*මාතර ලැයිස්තුවේ පලවෙනියට ආවේ රාජපක්ෂ පවුලට සම්බන්ධ අයෙක් නේද ?*

ඔව් ඡන්ද ලයිස්තුවේ පළවෙනි ස්ථානය ගත්තේ මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ පවුලට සම්බන්ධ අයෙක්. අපි මැතිවරණ කාලයේ සමීක්ෂණයක් කළා දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන්ගේ මැතිවරණ වියදම් පිළිබඳව, මෙහිදී අපි දැක්ක ඇත්තටම එක් දිනක් තුළ ඔවුන් කෙතරම් වැය බරක් දරනවාද කියලා. ඔවුන් එක අවස්ථාවක ජනාධිපතිතුමා සමග රැස්වීමක් කළා එහිදී බස්රථ 170 ට වඩා වැඩි ප්‍රමාණයක් යොදාගෙන තිබුණා, එහිදී ලක්ෂ විසි හතක් බස්රථ සඳහා පමණක් වැය කරලා තිබුණා . අපි දන්නේ නැහැ ඔහුට මේ සඳහා මුදල් කවර මූලාශ්‍රයකින් ලැබුණ ද කියලා, අඩුම තරමේ ජනතාව අහන්නෙත් නෑ, ඔබට මේ තරම් මුදල් කොහෙන්ද කියලා. මං හිතන්නේ මැතිවරණය සඳහා ඔවුන් කෝටි දහයක් පමණ වැය කරලා තිබෙනවා.

***ගාල්ල මාතර ඡන්ද දායකයන් පිළිබඳ කතා කිරීමේ දී ඔවුන් කුල සාධකය සලකා බලනවා, මැතිවරණය කියලා කියන්නේ රටක් ඉස්සරහට යන්න අවශ්‍ය කරන දෙයක්, මේ අවස්ථාවට ගෝත්‍රිකවාදය සම්බන්ධ වීමගැන ඔබතුමා දරන අදහස කුමක්ද?***

ඔව් ඔබ කියන එක හරි. ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමයට විශාල අභියෝග රාශියක් තිබෙනවා. එක් අභියෝගයක් තමයි ගියවර ලියාපදිංචි ඡන්ද හිමියන් මිලියන දහසයක් පමණ හිටියා නමුත් මිලියන හතරක් තමන්ගේ ඡන්දය පාවිච්චි කළේ නැහැ. මෙහි දී මිලියන හතරක්ම තමන්ගේ ඡන්දය ප්‍රකාශ කරන්නෑ කියද්දී සිවිල් සංවිධාන මැතිවරණ නිරීක්ෂකයන් වගේම මැතිවරණ කොමිෂන් සභාව, ජනමාධ්‍යවේදීන් වගේම දේශපාලනඥයන්ද ලැජ්ජවෙන්න ඕනෑ. මේ ඡන්දය නොදමන්න එක් හේතුවක් ලෙස කුල සාධකයත් බලපාලා තියෙනවා. බොහෝ වෙලාවට දකුණේ සහ උතුරේ තමයි මේ කුල සාධකය වැඩි වශයෙන් බලපාන්නේ. වර්තමානයේ තරුණ පරම්පරාව අතර මෙය එච්චර දකින්නට නොලැබුනත් ගමට ගිහාම ගමෙන් ඉල්ලන මන්ත්‍රීවරයා පවා තමන්ගේ කුලයට අයත් ඡන්ද ටික ඩැහැග ැනීමට තමයි කටයුතු කරන්නේ. ඒ වගේම සීමා නිර්ණය කොමිෂන් සභාවේ සීමා නිර්ණය කිරීම් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී අතීතයේ කුල සාධකය පදනම් කරගෙන සීමා නිර්ණය කිරීම් දක්නට ලැබිලා තියෙනවා. ඉතින් මෙහිදී කුල සාධකය රාජ්‍ය ප්‍රතිපත්තියක් විදිහටම දකින්නට පුළුවන්. නැතිනම් කුල අනුව සිමා නීර්ණය කරන්නේ නැහැ නේ.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/8RuxzyYNujA

https://www.aithiya.lk/manjula-gajanayake-election-monitoring-paffrel/

# 70. වෙන එකම දේ කඩාගෙන වැටීම විතරයි

## විශ්‍රාමලත් විදුලි අධිකාරී අජිත් මුණසිංහ


විශ්‍රාමලත් විදුලි අධිකාරී අජිත් මුණසිංහ

***ඔබතුමා මේ ආණ්ඩු පෙරළිය සහ වර්තමානය ගැන මොකද හිතන්නේ?***

මම හිටපු රාජ්‍ය සේවකයෙක් හැටියටත්, වෘත්තීය සමිති ක්‍රියාධරයෙක් හැටියටත්, මේ මැතිවරණය ගැන මගේ අත්දැකීම කියන්නම්. පසුගිය ජනාධිපති මැතිවරණය හා මේ 2019 මැතිවරණයත් ශ්‍රී ලාංකික ජනතාව කරපු අත්හදාබැලීමක් ලෙසට තමයි මම වටහා ගන්නේ. මිනිසුන්ට දැඩි පාලනයක් අවශ්‍යයි, එක් පුද්ගලයකුට බලය ඒකරාශී වෙච්ච පාලනයක් අවශ්‍යයි කියන දේ සමාජගත කරල තිබ්බා. නමුත් අපි බලාපොරොත්තු විය නොහැකි තරම් බලයක් ඒකරාශී වුණා. මේ නිසා ඇතිවන තත්ත්වයට දැන් අපි මුහුණ දීලා ඉන්නවා. දැන් අසීමිත බලයක් සංකේන්ද්‍රනය වුණාට වැඩක් සිද්ධ වෙන්නේ නැහැ. ඇත්තටම මොකද්ද වෙන්නේ? කඩාගෙන වැටීම විතරයි සිද්ධ වෙන්නේ.

***අපි දැක්කා පසුගිය කාලේ මහජන උපයෝගිතා කොමිෂන් සභාව අහෝසි කරන්න හැදීම ගැන විශාල සංවාදයක් ආවා. ඇත්තටම මේ කොමිසමෙන් ජනතාවට වැඩක් වුණාද ?***

විදුලිබල මණ්ඩලය කියන්නේ තනිකර බලය ඒකරාශි වෙච්ච තැනක්, මොකද විදුලි ජනනය, බෙදාහැරීමේ සියල්ල අයිති විදුලිබල මණ්ඩලයට. නමුත් මේ වනවිට මෙය විශාල මාෆියාවක් වෙලා

තියෙනවා. ඒ කියන්නේ දූෂිත දේශපාලකයො, කුට ව්‍යාපාරිකයන් මෙම සේවාවන් ග්‍රහණය කරගෙන ඉන්නවා. ඊට සම්බන්ධ කළු මාධ්‍ය සංස්කෘතියකුත් ආගමික වටපිටාවකුත් සකස්වෙලා තියෙනවා. මේවට ජනතාව නතු කරගෙන ඉන්නවා. මේ තත්ත්වය අස්සේ මෙම කොමිෂන් සභාව පිහිටුවීමෙන් අපේක්ෂා කළේ පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට හා යුක්ති සහගත මිලකට විදුලිය ලබා දීම. ඒ වගේම පරිසරයට අවනත වෙමින් විදුලිය ලබාගන්නේ ගන්නේ කෙසේද යන්න නියාමනය කිරීම, මේ සියල්ල සඳහා පූර්ණ අයිතිය තිබෙන්නේ මෙම මහජන උපයෝගිතා කොමිෂන් සභාවට. ඉතින් මේ තුන්වෙනි බලයක් විදියට ක්‍රියාත්මක කොමිෂන් සභාව නැතිවුණොත් මේ ක්‍රියාත්මක වෙන මාෆියාව මැඩ පවත්වා ජනතාවට සාධාරණයක් ඉටු කිරීමට කිසිඳු අයෙක් නොමැති වෙයි.

***ජනතාවගේ ජීවන වියදම ඉහළයාම පිළිබඳව ඔබතුමා මොකද හිතන්නේ ?***

මම කලින් සඳහන් කළාවගේ මහජන උපයෝගීතා කොමිසම ආරම්භ කළත් එහි වැඩ කටයුතු පුළුල් කිරීමට නොහැකිවුණේ ඒක ගෙනාපු 2002 ආණ්ඩුවේ බලය සීමාවුණ නිසා. ඒ නිසා ඔවුන්ට ඛනිජතෙල් සම්බන්ධ පැහැදිලි නියාමනයක් ඇතිකරන්න නොහැකි වුණා. නමුත් පසුගිය අවුරුදුවල ඔවුන් ලෝක වෙළඳපොලේ ඛනිජ තෙල් මිල පහළ බැසීමේ දී ජනතාවට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරා. නමුත් මේ වෙද්දි මේ අසීමිත ලෙස ගොනු වෙලා තියෙන බලය නිසාත් ස්වාධීන කොමිෂන් සභා තිබීමෙන් වැඩක් හරියට කරගන්න බෑ කියන අදහස සමාජගත වීම නිසාත් මේවා අහෝසි වෙලා ගිහිල්ලා ඒකාධිපති බලයක් නිර්මාණය වීම තුළින් මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය ගිලිහී ගොස් තියනවා. ප්‍රථිඵලය තමයි 20වන ව්‍යවස්ථා සංශෝධනය. නමුත් අපි උගත් පාඩම්වලට වඩා මිනිසුන් සිහිනෙන් වගේ හිතනවා එක් පුද්ගලයකු වටා බලය ඒකරාශි වීමෙන් ලොකු සංවර්ධනයක් සිදුවෙයි කියලා. ඉතිං දැන් බලන් ඉන්න තියෙන්නේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/XYEQzXvZEC0

https://www.aithiya.lk/electricity-crisis-in-the-ceb-ceylon-electricity-board/

# 71. චෝරනාගව පුටුවෙන් ඇදලා දාලා අනුලා බිසව රාජත්වයේ පිහිටෙව්වේ ඇයි?

## ලේඛක සුජිත් අක්කරවත්ත

***එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද වනවිට කඩාවැටිලා තියනවා, කෙටියෙන්ම කිව්වොත් මේ පක්ෂ දෙකම අවසන් වෙලා තියනවා. මේක වුණේ සජිත්ගේ රනිල්ගේ හෝ මෛත්‍රීගේ මහින්දගේ පෞද්ගලික දේශපාලන අරමුණු නිසා ද?***



සුජිත් අක්කරවත්ත

ඉතිහාසය දිහා බැලුවාම ලංකාවේ දේශපාලන ධුරාවලි දෙකක් අඳුරගන්න පුලුවන්. මහාවංශය සහ චූලවංශය නමින් අපිට තිබෙන ද්විත්ව ඉතිහාස ග්‍රන්ථ දෙකෙන් දහරා ගතකරලා තියෙන්නේ මේක. මේක තමයි ලංකාවේ අතීතයේ ඉඳලා එන දේශපාලන ධුරාවලි දෙක. විශේෂයෙන්ම ඩීබී ජයතිලක මහාවංශික චින්තාව නියෝජනය කළා. ඔහු තමයි එජාපය ආරම්භ කරන්නේ, අයිතිකාරයා ඩී එස් සේනානායක වුණාට. ඔහුට මේක අහිමිවීම අස්සේ තමයි මේ ප්‍රශ්නය එන්නේ. එජාපයේ මේ අවසානය දක්වා දුවන්නේ මෙන්න මේ දාර්ශනික අවුල උඩ කියලා තමයි මට හිතෙන්නේ. මේකෙම ප්‍රතිපල තමයි සී ඩබ්ලිව් ඩබ්ලිව් කංනන්ගර පක්ෂය තුළ රඳවා ගන්න බැරිවෙන්නේ. මේවා ජනතාවට පෙනුනේ නැහැ. මහාවංශ ජානයෙන් උපත ලබන සමාජ දේශපාලන නායකයෙක්ට එජාපය අස්සේ ඉස්සරහට එන්න බැරිවුණා.

එතකොට ශ්‍රීලනීපයට උනෙත් මේකෙම අනික් පැත්ත. ශ්‍රිලනීපය නිර්මානය කිරිමේ මතුපිට නායකයා එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක උනාට ඒක මුණිදාස කුමාරතුංගයන්ගේ දේශපාලන සැලැස්ම. ඔහුගේ

හෙලහවුලේ වැඩේ වුණේ, මහාවංශයට එරෙහිව චූලවංශය විසින් ලංකාවේ දේශපාලන දහරාවට ඇතුල්කරපු ඒ මතවාදය, භාෂාවේ ඉඳලා සමාජගත කිරීම. එහෙත් මේ ව්‍යාපාරය බණ්ඩාරනායක මහත්තයා ඉක්මනින් ඩැහැ ගත්තා. අන්තිමට මේක බණ්ඩාරනායක පවුලෙන් එළියට ගියේ පිටමං වුණ රාජපක්ෂ සහ සහමුලින්ම පිටමං වුණ සමාජ බලවේගයක් නියෝජනය කළ සිරිසේනට. එජාපයෙත් අපි දැක්කේ මේ දෙකටම නැති සම්භාව්‍ය ප්‍රභූ පන්තියටත් නැති ඓතිහාසික ප්‍රවාහයටත් අයිති නැති ප්‍රේමදාස විසින් පක්ෂය දෙවතාවක් අත්පත් කරගැනීම. ඇත්තටම මේ පක්ෂ දෙකම අහෝසි වෙන තත්ත්වයට එන්නේ මේ උප්පත්තියේම තියෙන දාර්ශනික විසංවාදය නිසා කියලා තමයි මට හිතෙනේ. මේ පක්ෂ දෙකටම පුළුවන් වුණා අවුරුදු 60 ක් නැත්තන් 70ක් මේ දාර්ශනික විසංවාදය තියාගෙන පවතින්න.

***මෙරටේ පවතින මේ පවුල්වාදය අපි කොහොමද තේරුම් ගන්නේ.***

එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහිවුණාට ඓතිහාසික ධාතුන් විසින් පවරපු විඥානයක් අපි ඔළුව ඇතුලෙ තියෙනවා. මොකද වෙන රටවල්වල විදිහට මේක විග්‍රහ කරන්න හැදුවොත් ටිකක් වරදිනවා. උතුරේ දකුණේ හැමතැනම අපි දකින දෙයක් තමයි ඉතා නූතනයි කියන වාමාංශික දේශපාලනයත් ගෝත්‍රයක් හෝ පිය පුතුන් විසින් තමයි මෙහෙයවන්නේ. මෙය රුසියාව, චීනය, කියුබාව ආදී සියලුම රටවල්වල දකින්නට ලැබෙනවා. ඉතින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බිහි වුණාම අපේ ඓතිහාසික විඥානය කියනවා මේක පියාගෙන් පුතාට අයියාගෙන් මල්ලි ට උරුම වෙන්න ඕනි කියලා. මෙන්න මේ වගේ දේවල් නිසා තමයි පාලකයෝ අසාර්ථක වෙන්නේ. ලංකාවේ අසහාය නායකයෙක් වෙන්න තිබ්බ ඩී එස් සේනානායක මහත්මයා තමන්ගේ පුතාට බලය පවරන්න ගිහිල්ලා තමයි අසාර්ථක වෙන්නේ. ඔහු තමන්ගේ පවුල පැලැන්තිය බලන්නේ නැතුව කටයුතු කරානම් මේ වෙද්දී රටට හිටපු අසහාය නායකයෙක්. මෙන්න මේ දේවල් නිසා එක්සත් ජාතික පක්ෂය පවුලක් වටා වට ගැහෙන්න ගත්තා. එක්සත් ජාතික පක්ෂය අස්සේ ටීඞී ජයතිලක විසින් ඇති කරපු චින්තනයක් තියෙනවා, පොඩි බහුවිධ සැකැස්මක් ගතික ගුණයක් තියෙනවා එහි. මේ බහුවිධ සැකැස්ම ඇතුලේ ආර් ප්‍රේමදාස ජයග්‍රහණය කරනවා. කන්නන්ගර මහත්මයා පරාජය වෙනවා. සමහර

විට ටිබී ජයතිලක අකාලයේ මිය ගියේ නැත්නම් මේක ජයග්‍රහණය කරන්න තිබ්බා. ඒ වගේම නූතනයේ තියෙන ප්‍රශ්නයක් තමයි චම්පිකවගේ නායකයෙක්ට එක්සත් ජාතික පක්ෂයේ තැනක් නැති උනාද කියන එක, නැතිනම් පළවා හැරියාද කියන එක, මේක ලලිත් ඇතුලත්මුදලි ගාමිණී දිසානායක වගේ ඉඳලා මැද පාන්තික අධ්‍යාපනය ලැබූ නායකයන්ට එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත්වෙන්න සිද්ධවෙලා තියෙනවා. මේකට හේතුව ඓතිහාසික චින්තාව තේරුම් නොගැනීම.

*දැන් මේ රට පාලනය කරන්නේ රාජපක්ෂවරු එතකොට මොකක්ද ඔවුන්ගේ සම්ප්‍රදාය ?*

ඔවුන්ගේ සම්ප්‍රදාය චූලවංශය, මොකද චූලවංශයට විශාල රජ පවුලක් අවශ්‍යයි. බණ්ඩාරනායකගේ ඉඳලා රත්වත්ත දක්වා එක්සත් ජාතික පක්ෂයට ප්‍රතිපක්ෂව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දුන්න එක, ඒක තමයි. ඒ කියන්නේ රාජකීයත්වය අනුක්‍රමයෙන් ආපු තාත්තගෙන් පුතාට ආපු එකක්. ඒක නිතරම දේශමාමකත්වය හා වර්ගවාදී ව්‍යුහයකට ලක් කරනඑක තමයි ඔවුන්ගේ දේශපාලන ව්‍යුහය. මේක දුටුගැමුණු ලංකා ව්‍යුහයට එකතු කරපු දෙයක්, නමුත් ඒකට ඔහුට ඇඟිල්ල දික් කරන්න බැහැ. ඒක මාගම් රාජ වංශයට අයත් දෙයක්. ඒ මොහොතේ ඒක ඔහුට අනුව සාධාරණයි . මෙන්න මේ නිසා තමයි චූල වංශය හා මහා වංශය වගේ එකිනෙකට ගැලපීමක් නැති කෘති දෙකක් නිර්මාණය කරන්න වුණේ. මෙන්න මේ ඓතිහාසික ධාතුවට රාජපක්ෂවරු තමන්ගේ පවුල බැස්සුවා.

*මහින්ද රාජපක්ෂ වගේ නායකයන්ට ඇයි මිනිස්සු කැමතියි ?*

ඒකට හේතුව මෙතෙක් කල් එවැනි නායකයෝ බිහි නොවිච්ච එක. ඒ කියන්නේ මිනිස්සුන්ට තමන්ගේ තත්වයට පොදු රුචියක් තියෙන මනුස්සයෙක් ඕන වෙනවා. ඒකනේ චෝරනාගව පුටුවෙන් ඇඳලා දාලා අනුලා බිසව රාජත්වයේ පිහිටවන්නේ. ඉතින් මේවා ඒකාලේ ඉඳන් අද වෙනකම්ම එනවා. මිනිස්සු ඒකාකාරීත්වය බිදෙන්න මේ දේවල් කරනවා. ඒ වගේ මිනිස්සු කැමති තමන්ගේ චින්තාවට සමීප චින්තාවක් තියෙන මනුස්සයෙක් තමන්ගේ රජා වෙනවට. ඒ වගේම ඓතිහාසික විජේවීර, විජය කුමාරතුංග හා වේලුපිල්ලේ ප්‍රභාකරන් කියන අය

දුන්නු සමාජ විඥානික අවදි කිරීම් එකට අරගෙන රඟදැක්වූයේ මහින්ද රාජපක්ෂ.

*ඊට පස්සේ දැන් මොකක්ද මේ චින්තාවට වෙන්නේ ?*

ජනාධිපති ධූරය ස්ථාපිත කරාට පස්සේ ඒක බොහෝ අය දැක්කෙ භයානක දෙයක් විදියට, නමුත් එයින් එකදෙයක් වුණා, ලංකාවේ මේ සාම්ප්‍රදායික දහරා බිඳවැටුනේ ජනාධිපති ධූරය නිසා. මොකද පක්ෂයකින් නැවත නායකයෙක් ජනාධිපති කරන්න බෑ කියලා ඔප්පු වුණා, 2010 වසරේ සරත් සරත් ෆොන්සේකා මහත්මයා අපේක්ෂකයා විදිහට පිළිගැනීම නිසා. ඒක ජනතා විමුක්ති පෙරමුණේ රෝහණ විජේවීර සහෝදරයා ඒ කාලේ ඉඳන්ම කියපු දෙයක්. 2010 ලංකාවේ මිනිස්සු පොදු අපේක්ෂකයෝ දිහා බැලුවා. 2019 ජනාධිපති වුණෙත් පොදු අපේක්ෂකයෙක් වෙච්ච ගෝඨාභය රාජපක්ෂ. ගෝඨාභය මහත්මයා පක්ෂයකට අයිති වෙච්ච කෙනෙක් නෙමෙයි. ඒ උනාට ජයග්‍රහණය කළා. මේ ජනාධිපති ධූරය කියනඑක යහපාලනයට වත් අයින් කරන්න බැරිවුණා. ඒකේ අනෙක් පැත්ත තමයි යහපාලනය විසින්ම ජනාධිපති ධූරය බලසම්පන්න තැනකට තල්ලු කළා. ඒකෙන් පැහැදිලි වුණේ ලංකාවේ සමාජය බලවත් පුද්ගලයෙක් යටතේ හැසිරවිය යුතුයි කියනඑක.

ලංකාවේ කුල 362ක් තියනවා, ඒ වගේම ජාතීන් 8 ක් ඉන්නවා, භාෂා ව්‍යවහාරයන් 43ක් තියනවා, මේවා ඔක්කොම මගේ ගණනය කිරීම්වලට අනුව, ඒවා අඩු හෝ වැඩි වෙන්න පුළුවන්, එක එක්කෙනාගේ ගණනය කිරීම අනුව, ඉතින් මේ විවිධත්වය තුළ ඒකීයත්වය තියාගෙන යන්න පුළුවන් ඔටුන්න තමයි මේක. ලංකාවේ ඒකියත්වය රඳා පවතින්නේ සිංහල භාෂාව හා ජන සම්මතය ඒකාධිපතිත්වය තුළින්. මේක නිර්මාණය කළේ ජේ ආර් ජයවර්ධන ජනාධිපතිතුමා. ඉතින් මේ ආකාරයට ඊළඟ ජනාධිපතිවරණයට පවා තේරී පත්වෙන්නේ ප්‍රධාන පක්ෂ දෙකෙන් නෙවෙයි කියලා මට ස්ථිර වශයෙන් කියන්න පුළුවන්. ප්‍රධාන පක්ෂ දෙකට මොකක් හරි ආල වට්ටමක් දාලා ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන් වෙයි. නමුත් ජනාධිපතිවරණය තුළින් හිස ඔසවන්න නම් හම්බ වෙන්නේ නැහැ .

කුලයකට ජාතියකට භාෂාවකට පවුලකට අනුව අපේක්ෂකයන් තෝරාපත් වුණ කාලේ 2024න් ඉවර වෙනවා. මේකට සමාජයේ මුහුණ දෙන ආකාරය ඒක වෙනම දෙයක්. මේ වෙලාවේ ජයවර්ධනලා විජේවර්ධනලා වික්‍රමසිංහලා නැති ජනසම්මත පාර්ලිමේන්තුවක් බිහිවෙලා තියෙනවා. මම මේ පවුල්වාදයන් ගැන කතාකරනවා නෙවෙයි මම කියන්නේ ලංකාවේ ධනවාදය නැතුව ජන චින්තනය තුලින් බිහි වෙච්ච පාර්ලිමේන්තුවක් අද ඉන්නවා. සම්භාව්‍ය වාමාංශිකයෙක් නැති පාර්ලිමේන්තුවක් අද බිහිවෙලා තියෙනවා. එක ජනමතයක් නියෝජනය වෙන පාර්ලිමේන්තුවක් තමයි අද තියෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය අවසාන ඉරණමට ලක්වෙලා තියෙනවා කියනඑක විසින් පළවෙනි වතාවට ඉඩක් හදලා තියෙනවා [සීගිරි කාශ්‍යපට ඉඩ හම්බුනා වගේ තමයි] කිසිම පක්ෂයකට අයත් නැති කෙනෙකුට ජනාධිපතිවෙන්න. ඒ අවස්ථාව ගන්නවද නැද්ද කියන එක වෙනම කතාවක්. නමුත් 2024 කියන්නේ ඒ ඉඩ විවර වෙනවා.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/_jrtpzhGP3w

https://www.aithiya.lk/sujith-akkarawatta-current-political-situation-in-sri-lanka/

# 72. ජීවන වියදම ගැන කතා කරලා වැඩක් නැහැ

## මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි


මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැන කතා කරන්න මම තරම් පුද්ගලයෙක් නැහැ. මම එහෙම කියන්නේ කියන්න 1966 ඉඳලා අද දක්වා මම සෞඛ්‍ය අංශ සමග ඇලී හිටපු පුද්ගලයෙක් නිසා. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දුර්වලකම් ගොඩක් තිබුනා ඉස්සර. සේවකයින්ට කිසිම ප්‍රශ්නයක් විසඳා ගන්න බැරුව හිටිය. හැමදේටම අල්ලස් දෙන්න සිදුවෙලා තිබ්බා. මේ ඔක්කොම දශක ගණනකට ඉස්සර. අපි මේවට විරුද්ධව කටයුතු කරලා සෞඛ්‍ය ක්ෂේත්‍රය ගොඩගත්තා. අද අපිට ඇතිවෙලා තියෙන්නේ පරිපාලනයේ දුර්වලතා. ඒ වගේම වගකීම් හරියට ඉටුකරන්නේ නැති අයවලුන් නිසා ඇතිවන ප්‍රශ්න. මීට පෙර සියලුම දෙනා අධ්‍යක්ෂක ජෙනරාල්වරු, වෛද්‍යවරු, හෙදියෝ වගකීමෙන් සාමකාමීව තමන්ගේ වැඩකොටස අකුරටම ඉටු කළා. වර්තමානයේ දී අපි එක ප්‍රශ්නයක් ඔවුන් වෙත ගෙන ගියොත්, නැවත එම ප්‍රශ්නය සියපාරක් විතර ගෙනියන්න වෙනවා විසඳ ගන්න.

*ආණ්ඩුවට බනින්නේ ඇයි?*

මිනිස්සු හිතනවා මම ආණ්ඩුවට බනිනව කියල, නමුත් මේ බනිනවා නෙවෙයි ඕනෙම කෙනෙක්ගේ වැරදි දෙයක් පෙන්නලා ඇඟිල්ල දික්කරලා කතා කරන්න පුළුවන් ශක්තියක් මට තියෙනවා. 1966 ඉඳලා වර්තමානය දක්වා බැලීමේදී අද වනවිට සෞඛ්‍ය ක්ෂේත්‍රය විශාල කඩා වැටීමකට ලක්වෙලා තියෙනවා. ඒ නිසා මම කියන්නේ

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මේ ඇතිවෙලා තියෙන ප්‍රශ්න නිරාකරණය නොකරගත්තොත්, පරිපාලනය දුර්වලකම් හදා නොගත්තොත්, පවිත්‍රා වන්නිආරච්චි අමාත්‍යවරියට මෙය ගොඩගැනීම එතරම් පහසු දෙයක් නෙවෙයි. මේ ප්‍රශ්නය ශිවා ඔබේසේකර මහත්මයගෙ කාලෙ වගේම, රේණුකා හේරත් මහත්මියගෙ කාලෙත් පැවතුනා. නිමල් සිරිපාල ද සිල්වා ඇමැතිතුමා සහ තව පස්සේ ආපු ඇමතිවරුන්ගේ කාලෙත් මේ ප්‍රශ්නය පැවතුනා. රාජිත සේනාරත්න ඇමතිතුමාගේ කාලෙත් මෙය පැවතුනා නමුත් ඔහු වෛද්‍ය සංගමය කියන දේවල් ඇසුවෙ නෑ, එය නිසා ඔහුට කැපිල්ල ආවා. හැබැයි ඔහු වෛද්‍යවරුන් සමග හැප්පෙමින් වුණත් විශාල වැඩකොටසක් කළා. පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමියට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හොඳ තත්ත්වයකට ගන්න උවමනාවක් තියෙනවා නමුත් ඇය වඩාත් අවධානය යොමු කරන්නේ වෛද්‍ය සංගමයේ අදහස්වලට. එතුමිය තවදුරටත් වෛද්‍ය සංගමය කියන විදිහට නටන්න ගියොත් මේ ප්‍රශ්න තවත් උග්‍ර වෙයි.

### *වෛද්‍ය ඒකාධිකාරය*

මේ ඒකාධිකාරය අදක ඊයෙක පටන් ගත දෙයක් නෙවෙයි. ඒත් එක කාලෙක බාලසිංහම් කියන ලේකම් කෙනෙක් හිටිය ඔහුගේ කාලයේ නම් මේ එක අධිකාරියක්වත් තිබුණේ නැහැ. ඒ වගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ කාලයේ මාත් ඇතුළුව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිය සමිති සමගිව කටයුතු කළා. සුනිල් රත්නප්‍රිය වෛද්‍යවරයා වගේම දිනේෂ් ගුණවර්ධන මැතිතුමා රාජිත සේනාරත්න ඇමැතිතුමා වගේ අය ලොකු වැඩ කොටසක් කළා ඒ කාලේ. නමුත් අද තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා. අද වෛද්‍ය සංගමය තනිග මනක් තමයි යන්නේ.

### *රටේ සම්පත් විකිණීම*

අභයාරාමයේ, දේශීය සම්පත් විකුණා දැමීමට එරෙහි ව්‍යාපාරය කියන පුවරුව තාම තියනවා. මම කියන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට මිනිස්සු බහුතර කැමැත්ත ඔබට දුන්නේ නැවතත් රට විකුණන්න නෙවෙයි. ආයෝජකයා ආවට කමක් නෑ නමුත් සම්පත් විකුණලා ආයෝජකයෝ ගෙන්න ගන්න එපා. 49% 50% කියලා සම්පත්

විකුණන්නෙ නැතුව ආයෝජකයෝ ගෙන්නගෙන රට සංවර්ධනය කරන්න කියලා මම ගෝඨාභය ජනාධිපතිතුමාගෙන් ඉල්ලනවා. සුදුසු පුද්ගලයන්ගෙන් උපදෙස් නොගෙන තමන්ගේ හිතුමතයට කටයුතු කරලා වැඩ කිරීමේදී සමහරවිට ජනාධිපතිතුමා අපකීර්තියට පත්වෙන්න පුළුවන්. ඒනිසා එතුමා බලයට ගේන්න විශාල වැඩකොටසක් කරපු අපි එතුමාට කියන්නේ හිතලා බලන්න කියලා. අපි ඉන්දියාව තරහා කරගන්න ඕනී නෑ. ඔවුන් අපේ අසල්වැසියා. බුදුන් ඉපදිච්ච රට. නමුත් එහෙම කියලා අපි ඉන්දියාවේ කියන කියන දේට ඔළුව නමන්න අවශ්‍යතාවයක් නැහැ. තුනෙන් දෙකක් බලය ලබාදීලා මිනිසුන් ඡන්දය දුන්නේ රටේ සම්පත් ආරක්ෂා කරයි කියන විශ්වාසයෙන්. නිසා ඒ විශ්වාසය රකින එක ආන්ඩුවේ යුතුකම.

### *දැන් ආණ්ඩුව හතර පස් දෙනෙක්ගේ*

ආණ්ඩුව ගේන්න දාඩිය බින්දුවක්වත් හෙලපු නැති අය දමයි අද ජනාධිපතිවරයා ළඟට වෙලා ඉන්නෙ. නැව ගෙනියන කපිතාන්ගෙන් සුළු වැරැද්දක් වුණොත් නැව කොහේයයිද දන්නේ නෑ. ඒ වගේ මම කියන්නේ ගෝටාභය ජනාධිපතිතුමා නිවැරැදි අයගේ උපදෙස් ලබාගෙන කටයුතු කළොත් මහින්ද රාජපක්ෂ මැතිතුමා වගේම පුදුම ජනාදරයට ලක්වෙයි. නමුත් මේයන විදිහ ගැන අපි සතුටු නැහැ කියන එක අපි ජනාධිපතිතුමාට කියන්න ඕනෑ. බලන්න හැමතැනම ප්‍රශ්න. කඩාවැටීම්. කවුරුවත් දැනෙන වැඩක් කරනවා පේන්නේ නැහැ. අද අපිට ජනතාව අහන ප්‍රශ්නවලට දෙන්න උත්තරයක් නැහැ. ජීවන වියදම ගැන නම් ඉතිං කතා කරලා වැඩක් නැහැ. මම ආර්ථික විද්‍යාඥයෙක් නෙවෙයි, නමුත් මට මිනිසුන්ගේ දුක්ගැනවිලි හොඳින් තේරෙනවා. මේකට හරි සැලැස්මක් ඕනේ. නිසි සැලැස්මක් නැතිව ජනතාවගේ අවශ්‍යතාවය ට පිළිතුරු නැහැ. මේ නිසා තමයි ගෝඨාභය ජනාධිපතිතුමා ගැන ජනතාව කලකිරිලා සිටින්නේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/O1QtnUAJ_v4

https://www.aithiya.lk/muruththettuwe-ananda-currunt-poloticle-situation/

# 73. මේක තනිකරම අධිකරණයට අපහාස කිරීමක්

## නීතිඥ හර්ශන නානායක්කාර



නීතිඥ හර්ශන නානායක්කාර

ජනාධිපති කොමිසමක් පත්කරන්න රටේ නීතියට අනුව පුළුවන්. ඒ අනුව යම් තොරතුරක් පිළිබඳ අධීක්ෂණය කිරීමට තමයි ජනාධිපති කොමිෂන් සභාවක් පත් කරන්නේ. මේ ගැසට් පත්‍රයට අනුව ජනාධිපති කොමිෂන් සභාව පත්කලා තිබෙන්නේ 2015 -2019 අවුරුදුවල එනම් යහපාලන ආණ්ඩුව කාලයේදී සිදුවූ දේශපාලන පළිගැනීම් සොයාබැලීම සඳහා. එනම් පොලිස් නිලධාරීන්ට, හමුදා නිලධාරීන්ට, රාජ්‍ය සේවකයන්ට, ආදියට සිදුවූ පළිගැනීම් සොයා බැලීමට. මම දන්න තරමින් මෙම කොමිෂන් සභාව නඩු 150ක් දින තුන්සියයකට අඩු කාලයකින් කියවලා විභාගයට අරගෙන නිර්දේශ ඉදිරිපත් කරලා තියෙනවා.

*මල්වානේ ගෙදර රාජ්‍ය සේවකයෙක්ගෙද?*

මේ කොමිසම රාජ්‍ය සේවකයන්ට ඕපන්වුණත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අධි චෝදනා ලබා සිටින අයපවා මේ කොමිසම ඉස්සරහට ආවා. තමන්ට සිර දඬුවම්, මරණ දඬුවම්, ලැබිලා තියෙන්නේ දේශපාලන පළිගැනීම්වල ප්‍රතිඵල විදිහට කියමින්. දුමින්ද සිල්වාගේ තාත්තා මෙහි පැමිනිල්ලක් දමා තිබෙනවා දේශපාලන පළිගැනීම් සම්බන්ධව. අපි හැමෝම දන්නවා දුමින්ද සිල්වා භාරත ලක්ෂ්මන් ඝාතනය නිසා මහාධිකරණයෙන් වගේම ශ්‍රේෂ්ඨාධිකරණය හරහා ද වැරදිකාරයා වූ බව. නමුත් මේ කොමිෂන් සභාව කියනවා නැවත මෙම නඩුව

සමාලෝචනය කරන්න කියලා. මේ කොමිසමට කෙසේද එහෙම බලයක් තියෙන්නෙ? ලංකාවේ ඉහළම උසාවිය දෙන තීන්දු නැවත සමාලෝචනය කරන්න. ඒ වගේම පිල්ලෙයාන්ගෙ නඩුව, පිල්ලෙයාන් කියන්නේ ත්‍රිවිධ හමුදාවේ හෝ පොලීසියේ අයෙක් ද, නැතිනම් රාජ්‍ය සේවකයෙක් ද, එසේ නොමැති නම් ඇයි මෙම කොමිෂන් සභාව මෙම නඩුව ඇසුවේ, අනෙක් එක තමයි මල්වානේ ගෙදර පිළිබඳව තියෙන පැමිණිල්ල. බැසිල් රාජපක්ෂ කිසිඳු අවස්ථාවකදී මෙම කොමිෂන් සභාව හමුවේ පෙනී සිටියේ නෑ. නමුත් මෙම කොමිසම නිර්දේශ කරනවා මෙම නඩුව අවසන් කරලා දාන්න. ඒ වගේම යෝෂිත රාජපක්ෂගේ නඩුව, සී එස් එන් නාලිකාව ගැන, ජනාධිපති කොමිසම කියනවා මෙම චෝදනාව ද අයින් කරලා දාන්න කියලා. ඉතින් මේ අනුව වක්‍රාකාරයෙන් පෙනීයනවා තමන්ගේ හිතවතුන් ආරක්ෂා කරගන්න ජනාධිපති කොමිසම වෙහෙසෙන බව.

*එතකොට නීතිපතිද වැරදි?*

මේ සියලූ නඩු පවරන්නේ නීතිපතිතුමා විසින් ඒ අනුව ඔහු කටයුතු කරන්නේ ද දේශපාලන පළිගැනීම් වෙනුවෙන් වෙන්න ඕනෑ. අනික මේ කොමිසමට පැමිණෙන්නේම හිටපු යහපාලනයේ ඇමැතිවරු ලොකු ලොක්කෝ, එහෙම බැලූවාම පෙනී යනවා මෙය දේශපාලන පළිගැනීම් සඳහා පිහිටවපු කොමිසමක් කියලා. මම දන්නවා අපේ රටේ ජනතාවට අධිකරණය පිළිබඳව විශ්වාසයක් නැති බව ඒකට හේතුව වෙන්නේ දේශපාලන අතපෙවීම් තියෙන නිසා. අපේ රටේ නීති වෘත්තිය අධිකරණ වෘත්තිය අවුරුදු දෙසියයක් පමණ පැරණි එකක්. මේවා පිළිබඳව යම් විශ්වාසයක් කාලයත් එක්ක හැදිලා තියෙනවා, ඕනෑම රටක මිනිසුන් පාලනය කිරීමට හා යම් යම් ක්‍රියා පාලනය කිරීමට යම් මිනුම් දණ්ඩක් අවශ්‍යයි, ඉතින් මේ නිසා නීතිඥවරු හැටියට අපි කියන්නේ දේශපාලනඥයන්ට නීතියට අත ගන්න එපා සහ නීතියට පිටින් යන්න එපා කියලා.

මේ ජනාධිපති කොමිසමෙන් වෙන්නේ අධිකරණයට බලපෑම් කිරීමක් නෙමෙයි, මේකෙන් වෙන්නේ අධිකරණය මඟහැර යෑමක්. ඒ කියන්නේ මේක තනිකරම අධිකරණයට අපහාස කිරීමක්. මොකද ලංකාවේ ඉහළම අධිකරණයෙන් දෙන තීන්දු මෙම කොමිසම මගින්

නැවත සමාලෝචනය කරනවා. මෙහෙම කොමිසම් පිහිටුවන්න ගිහාම ඊළඟට එන ආණ්ඩුවත් කරන්නේ තවත් කොමිසමක් පත් කරනඑක. ඊළඟට ඔවුනුත් දේශපාලන පළිගැනීම් යටතේ විභාග වුණ නඩු, විභාග වෙන නඩු ගැන කතා කරන්න පටන් ගනියි. මේක ඉවරයක් දකින්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මේක ලංකාවේ අධිකරණ පද්ධතියට විශාල හානියක්.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**


https://youtu.be/a4afyaPRDDA

https://www.aithiya.lk/presidential-commission-of-inquiry-to-investigate-incidents-of-political-revenge-3/

# 74. අපි සමස්තයම කිලුටු කරගත්ත ජාතියක් කියලා

## සිනමාවේදී සුදත් මහදිවුල්වැව

***ලංකාව විශාල සංස්කෘතික අර්බුදයක ඉන්නවා. ඒක මේරටේ දේශපාලන අර්බුදයෙම තවත් පැතිකඩක් කියලා කියන්න පුළුවන්. අපි ආධ්‍යාත්මිකව විශාල අර්බුදයක කරවටක් ගිහිල්ලා ඉන්නේ. සිනමාවට හෝ වෙනත් දෘශ්‍ය කලාවකට පුළුවන්ද මේකට විරුද්ධව කුඩා හෝ පහන් එළියක් දල්වන්න.***



සුදත් මහදිවුල්වැව

මම හිතනවා ඒකට පිළිතුර සොයද්දී තමයි, අපි හිටගෙන ඉන්න පොළොව කොහෙද කියලා පේන්න පටන් ගන්නෙ. මම දකින්නෙ අපි අපේ ඇස්, කන්, නාසය ඇතුළු සමස්ථයම කිළුටු කරගත්ත ජාතියක් කියලා. එතකොට කොහොමද අපි මේ කිළුටුවුණ දේවල් ටික ආයෙමත් පොහොසත් කරගන්නේ. ඒකට අපි බලන්න ඕනෑ, දකින්න ඕනෑ. ඒ පිළිබඳව අධ්‍යයනයක් කරන්න ඕනෑ.

ඒ කියන්නේ සිනමාව ගත්තොත් ලෝකය පුරා සිනමාවට වාරණ ආවේ, සිනමාව සම්බන්ධව මිනිස්සු විශාල විදිහට කල්පනා කරන්න පටන්ගත්ත නිසා. සිනමා කෘතියක තියෙන බලපෑම එතරම් වැඩි නිසා. උදාහරණයක් විදිහට රුසියාවේ ලෙනින් තමයි පළමු සිනමා පාසල පටන් ගත්තෙ. ඔහු ඔහුගේ බිරිඳ තමයි එහි ප්‍රධානියා විදියට පත් කරන්නෙ. ඔහු සිනමාව පිළිබඳ අධ්‍යනය කරපු කෙනෙකුත් නෙවෙයි. නමුත් තමන්ගේ දේශපාලන ඥානය තුළ ඔහු වටහා ගත්තා මෙහි තියෙන ප්‍රබලතාවය සුළුපටු නැහැ කියලා. විශේෂයෙන් විශාල

සාක්ෂරතාවක් නොමැති මිනිසුන් හිටපු රටක පොතක් කියවීමට වඩා සිනමාවට කරන්න පුළුවන් බලපෑම ගැන දැඩි විශ්වාසයක් ඔහුට තිබුණා.

සිනමාව අපට තවදුරටත් විෂයක් කියලා පැත්තකින් තියන්න බැහැ. සිනමාව කියන්නේ ජීවිතයම තමයි. ජීවිතයේ ම දිගුවක්. මම හිතනවා ගැඹුරු සිනමාවකට සහ ගැඹුරු ප්‍රේක්ෂකාගාරයකට පැහැදිලිවම පුළුවන් මීට වඩා හිතන්න පුළුවන් මිනිස්සු පිරිසක් බිහි කරන්න සහ පවතින ක්‍රමය ගැන මීට වඩා වෙනස් විදියට ඇස් වලින් බලන්න, කන් දෙකින් අහන්න පුළුවන් අවකාශයක් නිර්මාණය කර ගන්නට.

සිනමාවෙ තියන ප්‍රබලබව නිසා තමයි ලෝකය පුරා සිනමා කෘති තහනමට ලක් වෙන්නේ. ඒ සිනමා කෘතිවලට පුළුවන් මිනිස්සුන්ගෙ හිතන විදිය වෙනස් කරන්න. මිනිස්සුන්ගෙ ඔළුව ඇතුලට රිංගන්න. වෙන ඇස් දෙකක් දෙන්න. ඇස් පියාගෙන ඉන්න මිනිස්සුන්ගෙ ඇස් ඇරවන්න. මේක ඉතාම ප්‍රබල මාධ්‍යයක් මේ මොහොතේ. කාට හෝ පුළුවන් සිනමාව නරක විදිහට පාවිච්චි කරන්නත්. අපි හොඳටම දන්නවා හිට්ලර්ගේ කාලේ කොහොමද චිත්‍රපටි ඒ කරපුදේවල් අනුමත කරන්න පාවිච්චි කළේ කියලා. ඒකේ අනෙක් පැත්ත යහපත් වැඩ කරන්නත් මේක පාවිච්චි කරන්න පුළුවන්. මේ අර්ථයෙන් ගත්තම මම හිතනවා මේ මොහොතේ අපි ශීඝ්‍රයෙන් ජාතියක් විදිහට නරක තැනකට තල්ලු වෙමින් පවතින මොහොතක, ආයෙ අපිව ආපහු පරණ පාරට ගේන්න පුළුවන් වෙන්නේ කලාවට. ඒක චිත්‍රයට වෙන්න පුළුවන්, වේදිකා නාට්‍යකට වෙන්න පුළුවන්, කවියකට වෙන්න පුළුවන්. මේ ඔක්කොම අතරින් සිනමාව කියන්නේ ප්‍රබලම මැදිහත්කාරක මාධ්‍යය.

එනිසා මම හිතනවා මේ මොහොතේ සිනමාව කියන දේ අහිංසක නැහැ. සිනමාවට පුළුවන් ඉතාම ප්‍රබල විදියට මිනිසුන්ව නැවත දීර්ඝ නින්දෙන් අවදි කරන්න. කවුරුහරි ඇස්වලට පාට කන්නාඩි දෙකක් දාලා තියෙනවා නම් ඒක ගලවන්න බල කරන්න. වෙන විදිහකට ලෝකය දකින්න, කියවන්න සහ මිනිස්සු පිළිබඳ ගනුදෙනු මීට වඩා වෙනස් යහපත් විදිහකට කරන්න හිතවන්න.

*මම කැමතියි දැනගන්න දැන් ඔබ වෙනස් විදිහේ සිනමාවක් කරපු සිනමාකරුවෙක්. ඒ වගේම ටෙලිනාට්‍ය ගත්තොත් ඒකත් වෙනස් විදියේ ටෙලි නාට්‍යයක් හඳුන්වා දීපු ටෙලි නාට්‍යකරුවෙක්. නමුත් අපිට පේනවා මේ මාධ්‍ය දෙකින්ම දැන් ඔබ ටිකක් ඈත් වෙලා වගේ. සමහරු කියනවා ඔබගේ සිනමා නිර්මාණවලට ආපු ප්‍රශ්න නිසාම එයින් දුරස් වෙලා ඉන්නවා කියලා.*

සෝප් ඔපෙරා නැතුව ඒක ඇතුළෙ ගැඹුරකට යන්න පුළුවන් තැනකට අපි ටෙලිනාට්‍ය අරගෙන ආවා. හැබැයි දැන් ආපහු හැරිලා බැලුවහම හිතෙනවා නැවතත් කැරකිලා ගිහින් නතරවෙලා තියෙන්නේ අපි පටන් ගන්න කොට තිබුණු ප්‍රාථමික තැනම නේද කියලා? එතකොට මේ කාරණාව ඇතුලේ තියෙන විදිහකට අනුගත වෙලා, එන විදිහකට බලනවා වගේ තැනකට මම ලෑස්ති වුණේ නැහැ. ඒ නිසා විශාල වශයෙන් මම ටෙලිනාට්‍යයෙන් ඈත් වුණා. ඒ වගේම සංඛ්‍යාත්මකව ගත්තොත් මම ටෙලිනාට්‍ය තුනයි කරල තියෙන්නෙ. හැබැයි මම හිතන්නේ ටෙලි නාට්‍ය වංශ කතාව ලියන කෙනෙකුට එම ටෙලි නාට්‍ය තුන, විශේෂයෙන් දණ්ඩෙහි ලූ ගිනි සහ වනස්පති අතහැරලා ඒ ඉතිහාසය ලියන්න අමාරු වෙයි. ඉතින් මට සතුටක් තියෙනවා අපි කොහේ හරි කාලෙකදි පඩි නගින්න අමාරු තැනකදී පඩියක් වෙලා තියෙනවා කියලා. ඒක ඉදිරියට රැගෙන නොයාම වෙනම අර්බුදයක්. ඒකට අපිට වග කියන්න බැරි වෙයි. නමුත් එක්තරා විදිහකට ප්‍රශ්නෙකුත් තියෙනවා අපි එයින් අයින් වීම නිසා හිඩැසක් ඇතිවුණා කියන කාරණාවේදී.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**


https://youtu.be/v5uWLA91HZ4

https://www.aithiya.lk/cultural-and-political-issues-in-sri-lanka-filmmaker-sudath-mahadiulwewa/

# 75. මේ මිනිසුන් කුඩා තේ වතු අයිතිකාරයෝ කරන්න පුළුවන්.

## පාර්ලිමේන්තු මන්ත්‍රී වඩිවෙල් සුරේෂ්

***මුලින් අයවැයෙන් කිව්වා වතු කම්කරුවන්ට වැටුප රුපියල් දාහක් දෙනවා කියලා. හැබැයි ඊට පස්සේ කියන්නෙ වෙන කතාවක්, දාහක් දෙන්න විදිහක් නැහැ කියලා. ඇත්තටම මේක දෙන්න බැරිද? මොකක්ද මෙහි ඇත්ත තත්ත්වය..***



පාර්ලිමේන්තු මන්ත්‍රී වඩිවෙල් සුරේෂ්

ඇත්තටම ලංකාවෙ ජීවන වියදම අනුව බලනකොට රුපියල් දාහක් කියන්නේ සාධාරණ මුදලක්. දැන් තියන බඩු මිල අනුව බැලුවම. රජය අයවැයක් ඉදිරිපත් කරනකොට, යෝජනාවක් ඉදිරිපත් කරනකොට, ඒ අවශ්‍ය සැලසුම් ඔක්කොම කරලා මුදල් වෙන් කරලා තමයි කියවන්නෙ. දේශපාලන පොරොන්දුවක් හැටියට ජනාධිපති මැතිවරණයේදී, 2019 නොවැම්බර් මාසය වෙනකොට අතිගරු ජනාධිපතිතුමා වතුකරයේ ජනතාව ඉදිරියට ගිහින් කිව්වා රුපියල් දාහක් දෙනවා කියලා, එතුමා ජනාධිපති වුණාට පස්සේ. 2020 ජනවාරි කිව්වා අලුත් අවුරුද්දට දෙනවා කියලා. හැබැයි එහෙම දුන්නෙත් නැහැ. කෙසේ නමුත් ගරු අග්‍රාමාත්‍යතුමා මුදල් ඇමති හැටියට නොවැම්බර් මාසයේ 2021 අයවැය ඉදිරිපත් කරද්දී, එතුමගේ කතාවෙදි කිව්වා 2021 ජනවාරි මාසේ පළවෙනිදා ඉඳලා වතුකර ජනතාවට රුපියල් දාහක් පොරොන්දු වූ පරිදි ලබා දෙනවා කියලා. පාර්ලිමේන්තුවේදී අත්පුඩි ගහල ලොකු පිළිගැනීමක් ඒකට ලැබුණා. දැන් එහෙම කිව්වට පස්සෙ මේ පිළිබඳව කම්කරු ඇමතිතුමා වෘත්තීය සමිතිත් එක්ක සාකච්ඡා කළා. මමත් ඒකට කිහිප සැරයක් ගියා. අපි ඒ පිළිබඳව සාකච්ඡා කළා. දැන් වතු හාම්පුතුන් කියනවා අපි දාහක් දෙන්නම් කියලා පොරොන්දු වුණේ නැහැ කියලා.

දැනට ලැබෙන පඩිය රුපියල් 700. රුපියල් 50ක් තේ මිල. එතකොට 105ක් EPF/ETF ලැබෙනවා. මුළු වැටුප රුපියල් 855 ක් දෙනවා. ඒ තමයි කතාව. 855 ගෙව්වට පස්සේ රුපියල් දාහක් වෙන්න තියෙන්නෙ තව රු. 145යි. මේකදීම ලොකු ගැටලුවක් නෙවෙයි. දෙලක්ෂ ගණනයි කම්කරුවෝ ඉන්නේ. එතකොට මේකට සල්ලි වෙන්කරන්න බැරිකමක් නැහැ, පුළුවන්. සමාගම් සමග සාකච්ඡා කරලානෙ මේ තීරණ ගන්නෙ. මිනිස්සු ඉල්ලුවෙ නැහැ, වෘත්තීය සමිති ඉල්ලුවේ නැහැ, රජය තමයි කිව්වේ රුපියල් දාහක් දෙනවා කියලා. මේගැන අපි සාකච්ඡා කළා. වතු හාම්පුතුන්ගේ සංගමය බැහැ කියනවා. අපි කිව්ව රුපියල් දාහක් රජය දෙනවා කිව්වා, දෙන්න කියලා පළවෙනිදා ඉඳලා. මේ සාකච්ඡාව වට දෙකක් තුනක් විතර තිබුණා. ඒක සාර්ථක වුණේ නැහැ. ඊට පස්සේ ගරු කම්කරු ඇමැතිතුමා කිව්වා අපි මේක සාකච්ඡා කරලා බැලුවා, මේක සාර්ථක වුණේ නැහැ කියලා. ඊටපස්සේ කිව්වා මේක පඩි පාලක සභාවට දාලා රුපියල් දාහක් දෙන්න සැලසුම් කරනවා කියලා. රුපියල් 900ක් මූලික ගෙවීම ලෙසත් ජීවන වියදම ලෙස රුපියල් 100කුත් දෙන්න අවශ්‍ය කටයුතු කරනවා කියලා අන්තිම සාකච්ඡාවේදී ඇමතිතුමා කිව්වා. මම එතන දි ඇහුවා කම්කරු අයිතිය කොහෙද එතකොට කියලා. දැනට බුක්තිවිඳින කම්කරුවන්ගේ අයිතිය කප්පාදු කරන්නේ නැතුව දෙන්න ඕනේ. ඒක කප්පාදු කරලා දීලා වැඩක් නැහැ. 100% නැති වුණත් ඔවුන්ට යම්කිසි අයිතියක් තියෙනවා සාමාන්‍ය මිනිසුන් හැටියට ජීවත් වෙන්න.

සාමාන්‍යයෙන් අපි දන්නවා ලංකාවෙ කාලගුණය, මාස හයකට වැස්ස. මාස හයකට අව්ව. වැස්ස කාලෙදි රබර් ප්‍රශ්න තියෙනවා. රබර් වැඩිපුර ගන්න බැහැ. නමුත් දළු එනවා. අව්ව කාලයේදී දළු අඩු වෙනවා. රබර් ගන්න පුළුවන්. මේක සාමාන්‍යයි. එතකොට ඒ ඔක්කොම අරගෙන අපි ගානක් හදනවා අවුරුද්දකට දවස් තුන්සියයක් වැඩ දෙන්න ඕනේ. ඊ.ටී.එෆ් ඔක්කොම ගෙවන්න ඕනේ. රිටයර් වෙන වයස කොහොමද? ඒ ඔක්කොම තියෙනවා. එහෙම නැතුව එයාලට ඕන විදිහට කරගෙන යන්න ගියොත් එහෙම, පස්සේ ඒ අහිංසක කම්කරුවන්ගේ බෙල්ල මිරිකයි. දවසට කිලෝ 50ක් අරගෙන එන්න කියයි. කොහෙන් හරි ගිහිල්ලා දළු කඩාගෙන එන්න කියයි. දවස් දහයක් තමයි මාසෙකට වැඩ දෙන්න පුළුවන් කියලා කියයි. නොයෙක් විදියේ ප්‍රශ්න ඇති වෙයි. එතකොට අපිට උදේ පාන්දර යන්න වෙන්නෙ පොලීසියට. ඒ වගේ

දෙයක් කරන්න බැහැ. අපි මේ රටට ආදරෙයි. අපි මේ ක්ෂේත්‍රයට ආදරෙයි. මේ ක්ෂේත්‍රය රැකගන්න ඕනේ. සිලෝන් ටී එක රැකගන්න ඕනේ. ශල්‍යකර්මය සාර්ථකවෙලා ලෙඩා මැරිලා වැඩක් නැහැනෙ. ශල්‍යකර්මයත් සාර්ථක වෙන්න ඕන, ලෙඩත් ජීවත් වෙන්න ඕනේ. එතකොට මේ රට සහ සිලෝන් ටී දෙකම රැකෙන්න ඕනේ.

සමහර විට දවස් තිහක් වැඩකරන්න කියයි. දවස් තිහක් වැඩ කරොත් තමයි රුපියල් දාහක් දෙන්නෙ කියයි. අම්මා, නෝනා, දුව ඔක්කොම කාන්තාවන් ඉන්නේ. දවස් තිහක් කාන්තාවකට වැඩ කරන්න පුලුවන්ද? සෞඛ්‍ය ප්‍රශ්න තියෙනවා නේ. ගෙවල් තියෙන්නේ දුරින්. හැතැක්ම 5ක් 6ක් ගියාට පස්සේ තමයි දළු කඩන තැන තියෙන්නෙ. එතන බාත්රූම් එකක් තියෙනවද? එතන වැසිකිළි-කැසිකිළි පහසුකම් තියෙනවද? නැහැ. එතකොට හැමදාම වැඩට යන්න බැරි වෙයි. බබා හම්බෙන්න දවස් ගානක් තියෙන අම්මලා, බබාලාට කිරි දෙන්න ඉන්න අම්මලා, කොහොමද මේ ටාගට් එක කවර් කරන්නේ. මේ ඔක්කොම දිහා මනුස්සකමින් බලලා කල්පනා කරන්න ඕනේ නේද?. ලෝක කම්කරු සංවිධානයෙ මේ ඔක්කොම නීති රීති තියනවනෙ. කම්කරු අයිතිවාසිකම් තියෙනවා. ඒ කම්කරු අයිතිවාසිකම් ටික ඔක්කොම රැකගෙන, මිනිස්සු හැටියට අපි කල්පනා කරලා එයාලගේ සුභසාධනය ගැන කල්පනා කරලා ඉවරවෙලා, මේ රුපියල් දාහක් දෙන ක්‍රමය හදන්න ඕනේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/ut3xWVKxxKg

https://www.aithiya.lk/vadivel-suresh-state-workers-plantation-workers-rs-1000-struggle/

# 76. සතියෙ දවස්වල නමින් තමයි මේ මිනිස්සු ණය හඳුන්වන්නේ

## සමාජ ක්‍රියාකාරික දේවා ක්‍රිෂ්නන්



සමාජ ක්‍රියාකාරික දේවා ක්‍රිෂ්නන්

***වව්නියාවෙ ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්බුදයෙ අලුත්ම තත්වය මොකක් ද කියන තැනින් අපි මේ සංවාදය ආරම්භ කළොත්..***

යුද්ධෙ ඉවර වුණාට පස්සෙ වව්නියාවෙ ඉන්න අය ඒ අයගෙ ආර්ථිකය වැඩි දියුණු කරගන්න විවිධ සමාගම්වලින් ණය ගත්තා. ඊට පෙර අපි කියන්න ඕනේ මේ වගේ ණයදෙන ක්‍රමයක් තිබුණා ලංකාවේ. රජයේ ආයතන යටතේ පැවති එම ක්‍රමය කඩාකප්පල් කළ නිසා තමයි මේ මූල්‍ය ආයතන සමග මිනිස්සුන්ගෙ සම්බන්ධතාවයක් ඇතිවුණේ. මේක ඉස්සර සෙලින්කෝ ග්‍රාමීන් හරහා තමයි පටන් ගත්තෙ. යුද්ධයෙන් පස්සෙ ගොඩක් සමාගම් මේ ණය ව්‍යාපාරයට සම්බන්ධ වෙලා තියෙනවා. මේ අයගේ ශාඛා ප්‍රමාණය වව්නියාවෙ ජනගහනය තරමට ඉතා වැඩියි. මේ අය තරඟයට ණය ලබා දුන්නෙ. මිනිසුන්ගෙ ආර්ථික මට්ටම නොසලකා, ණය ගෙවීමේ හැකියාව ගැන නොසිතා අපරික්ෂාකාරීව ණය ලබාදීම නිසා මේ සමාගම් විශාල හානියක් සිදු කරලා තියෙනවා. දැනට වව්නියාවෙ පවුල්වලින් 75%ක් විතර ණය අරගෙන තියෙනවා.

අපි පොඩි සමීක්ෂණයක් කළා එක ගමක. 56 දෙනෙකුට අපි කතා කළා. 6 දෙනෙක් ඇරෙන්න ඉතුරු 50 දෙනා කෝටියකට වැඩි මුදලක් ණය වශයෙන් අරගෙන තියෙනවා. ඒ අයට ස්ථිර ආදායමක් නැහැ. කුලී වැඩ කරන මිනිස්සු. ඒ අයගෙ ඉඩම් වගාවකට සුදුසු නැහැ. එක පුද්ගලයෙකුට සමාගම් පහක් විතර ණය දීලා තියෙනවා. ණය දීපු සමාගමේ නමවත් මේ අය දන්නෙ නැහැ. සඳුදා ණය, අඟහරුවාදා ණය, බදාදා ණය,

විදිහට සතියෙ දවස්වල නමින් තමයි ඔවුන් ණය හඳුන්වන්නේ. එතරම් බරපතල විදිහට නිසි දැනුවත් කිරීමකින් තොරවයි මේ අයට ණය දීලා තියෙන්නෙ. මේක ග්‍රාමීය ආර්ථිකයටත් විශාල හානියක්. ඒනිසා අපි රජයෙන් ඉල්ලීමක් කරලා තියෙනවා මෙවැනි ණය දෙන සමාගම් වෙනුවට රාජ්‍ය යාන්ත්‍රණය තුළ තියෙන සමෘද්ධි, ගොවි සමිති, සමූපකාර සංගම්, වැනි ආයතන හරහා අඩු පොළියට ණය දෙන ක්‍රමය සංවර්ධනය කරන්න කියලා. ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන්නෙ දරිද්‍රතාවය අවම කරන්න. ඒ නිසා සමාගම්වලට මේක භාර දෙන්න බැහැ. සමාගම් බලන්නෙ ඒ අයගෙ සංවර්ධනය. ග්‍රාමීය සංවර්ධනයක් ඇති වෙන්නෙ නැහැ. කොවිඩ් තත්ත්වයෙන් පස්සෙ ග්‍රාමීය ආර්ථිකයේ සංවර්ධනයක් ඇති කරනවා නම් ග්‍රාමීය පවුල්වල ආර්ථික සුරක්ෂිතතාව ඇති කරන්න ඕනේ. දැන්තියෙන දත්ත අනුව රටේ ආර්ථිකය සංවර්ධනය ඇති කරන්න බැහැ. ග්‍රාමීය ආර්ථිකය, පවුලේ ආර්ථිකය කඩාකප්පල් කරනකොට රටේ ආර්ථිකය සංවර්ධනය වෙන්නෙ නැහැ කියලා දැන් අපිට පේනවා.

*මේ විදිහට ග්‍රාමීය ආර්ථිකය කඩා වැටෙන්න හේතුව මොකක්ද ඇත්තටම?*

එක හේතුවක් තමයි යුද්ධය අවසන් වුණාට පස්සෙ මිනිස්සු නැවත ගම් බිම්වලට එද්දි ඒ අයට ගොඩක් ප්‍රශ්න තිබුණා. මේ අය නැවත පදිංචි කරවීම සඳහා රජයෙන් ඔවුන්ට නිවාස හදලා දුන්නා. එතනදී ගැටලුවක් වුණා. නිවාස ලබා දෙනවිට සමහර ගෙවල්වලට ලක්ෂ 5යි. නමුත් ඒ ගෙවල් සාදා නිමකරද්දි ලක්ෂ 8 1/2ක් වත් අනිවාර්යෙන් අවශ්‍යයි. ඊට අමතරව ඒ අය කුලී වැඩ කරනවා ජීවත්වීමට. නිවස හදද්දි ඒ අයට කුලී වැඩට කිරීමේ හැකියාවක් නැහැ. එතකොට කෑම වියදමට අවශ්‍ය මුදල් ගෙවල් හදන මුදලින් ලබා ගන්නවා. අවසානයෙ ගෙවල් සෑදීමට මුදල් ප්‍රමාණවත් නැහැ. එතන තමයි ණය ගැනීමේ ආරම්භය. ඊට පස්සෙ ඒ ණය ගෙවන්න තව තව ණය මුදල් ලබා ගන්න වෙනවා. එහෙම තමයි ඔවුන් ණය අර්බුදයක පැටලුණේ. ණය ගෙවා ගන්න බැරිව වස බොන තැනට පත්වුණේ.

වව්නියාවේ වැඩිපුරම ඉන්නේ වෙනත් දිස්ත්‍රික්කවලින් පැමිණි අය. සිදම්බරපුරම්, චෙට්ටිකුලම් වගේ පැතිවලින් ඇවිත් මෙහෙ පදිංචි වෙලා ඉන්නවා. මේ අයට ස්ථිර ඉඩම් නැහැ. ඉඩම් වැඩිපුර තියෙනවා නම් ඒ අයට ගොවිතැන් කරන්න පුළුවන්, ස්වයං රැකියා කරන්න පුළුවන්. ඒවගේ

තත්ත්වයක් නැහැ. ඔවුන් වැඩිපුර කුලී වැඩ තමයි කරන්නේ. නැත්නම් මිනිස් බල ශ්‍රමිකයන් විදිහට වැඩ කරන්නේ. එවැනි අයට මුදල් අවශ්‍යතා එද්දී ණය ගන්න ක්‍රමයක් නැහැ. රජයේ බැංකුවලින් ණය ගන්නකොට ඇපයක් ඉල්ලනවා. ඒ වගේ තත්වයක් තුළ මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය සමාග ම්වලින් ණය ගන්න ඔවුන් පෙළඹෙනවා. එයින් තමා මේ ගැටලු ඇති වෙන්නේ. සමහරවිට අසනීප වෙලා ඒ සතියේ ණය ගෙවන්න බැරි වෙනවා. ඊට පස්සේ ණය එකතු වෙලා ගෙවන්න නොහැකි වෙනවා. ඒ විදිහට ඔවුන් විශාල ප්‍රශ්නවලට මුහුණපානවා ඉන්පසු.

*වව්නියාවේ කී දෙනෙක් විතර දැනට සිය දිවි නසාගෙන තියෙනවද?*

දැන් තියෙන තත්ත්වය අනුව දොළොස් දෙනෙක් විතර. සමහර මරණවල මරණ පරීක්ෂණ වාර්තාවල සඳහන් වෙන්නේ ගෙවල්වල ප්‍රශ්න නිසා සියදිවි හානි කරගත්තා කියලා. නමුත් මේ ණය ගෙවා ගන්න බැරිවීම නිසා තමයි ගෙදර රණ්ඩු - සරුවල් ඇති වෙන්නෙ. පන්ඩිකේත්තකුලම් කියන එකගමක අවුරුදු දෙකකට ඉස්සර කාන්තාවක් එයාගේ දරුවන් එක්ක ළිඳට පැනලා සියදිවි හානි කරගැනීම විශාල කතාබහක් ඇති කළ සිද්ධියක්.

*ඔබ හිතන විදිහට මේ ගැටලුවලට විසඳුම කුමක් ද?*

ඇතැම් පිරිස් මේ අපි කියන දෙයට වැරදි කියන්න පුළුවන්, ණය ගත්තා නම් ඒක ගෙවන්න ඕනේ කියලා කියන්න පුලුවන්, එය ඇත්තක්. නමුත් මේ ණය ලබාදෙන ක්‍රමවේදයේ පවතින වරද, නැත්නම් නිසි සොයා බැලීමක් නොකර ණය ලබාදීම නිසා මිනිසුන්ට පීඩනයක් ඇති වෙලා තියෙනවා. මෙහි ලොකු වංචාවක් තියෙනවා. සමහරු විශාල පොලියක් අය කරනවා. මිනිස්සුන්ව රවටලා වැඩි පොලියට ණය දෙනනිසා තමයි මේ ගැටලු. කාන්තාවන් පවා මේ ණය උගුලෙන් ගැලවෙන්න ක්‍රමයක් නැතිව ඉන්නවා. ඒ නිසා රජය මැදිහත්වෙලා තීරණ අරගෙන මේ ණය දීම වහාම නතර කරන්න.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/qdIQ-e7S7JY

https://www.aithiya.lk/microfinance-crisis-in-sri-lanka-grameen-bank/

# 77. ජිහාද් කියන වචනය පාවිච්චි කරලා මාව හිරේ දැම්මා

## මාධ්‍යවේදී රම්ෂි රාසික්



මාධ්‍යවේදී රම්ෂි රාසික්

ඇත්තම කියනවනම් මම සාමාන්‍යයෙන් අවුරුදු 10ක විතර ඉඳලා මුහුණු පොතේ දේශපාලන ප්‍රශ්න ගැටලු ගැන ලියනවා. ඒක මම අවුරුදු 10ක් තිස්සෙම කරගෙන ආවා. මගේ ෆෙස්බුක් පෝස්ට් තුළින් මම හුඟක්ම සමාජයට බලපෑම් කරන දේශපාලන සංස්ථාවන් සහ ආගමික සංස්ථාවන් යන දෙක තමයි විවේචනය කළේ. ඒ මොකද ඒ තීරු දෙක තමයි සමාජයට තීරණාත්මක සාධකයක් වෙලා තියෙන්නේ. ඉතින් ඒ දේශපාලන සංස්ථාවට සහ පූජක සංස්ථාවට මම කෙලින්ම මගේ පෝස්ට් තුළින් අභියෝග කරලා තියෙනවා. මේ නිසාම මා ගැන කලින්ම සමාජය තුළ යම් මතයක් තිබුණා සම්මතයට මම පහර ගහන කෙනෙක් හැටියට. ඇත්ත වශයෙන්ම මාව අත්තඩංගුවට ගත්තේ අවසාන වශයෙන් මම ලියපු පෝස්ට් එකක් නිසා. මම ඒ පෝස්ට් එකෙන් කිව්වේ සහ ඒ පෝස්ට් එකට පසුබිම් වෙච්ච කාරණය මේකයි.

බෝම්බ පුපුරවා ගැනීමට සහරාන්ට එහෙම අදහසක් ආපු හේතුව මොකක්ද කියලා ඔහු සඳහන් කරලා තිබ්බා කරුණු කීපයක්. එක කරුණක් විදිහට ඔහු කියනවා බේරුවල, අලුත්ගම, දිගන කියන ප්‍රහාරවලට ප්‍රති-උත්තරයක් දියයුතුයි කියන මතයෙන් තමයි ඔහු මෙය කරේ කියලා. මම මගේ පෝස්ට් එක තුළින් කිව්වා ඇත්තටම සහරාන් කියන්නේ ජිහාද් වාදියෙක්. ඔහු කියන්නේ ජිහාද් කරන්න ඕනේ කියලා. ඔහුට ඒ සම්බන්ධයෙන් තියෙන්නේ වෙනම අර්ථකතනයක්, නියම

අර්ථකතනය නෙවෙයි ඔහුට තියෙන්නේ. මගේ පෝස්ට් එකෙන් මම කියන්න ගත්තේ අපි ජිහාද් එක කරනවනම් ඒක කරන්න ඕනේ ආයුධ සන්නද්ධව නෙවෙයි පෑන සහ කීබෝර්ඩ් එක පාවිච්චි කරලා මතවාදී අරගලයක් විදිහට කියලා. ඒක තමයි මම කිව්වේ. මම එතනදි පාවිච්චි කරා චින්තන ජිහාදය කියන වචනය. මම ඒ පෝස්ට් එකේ පැහැදිලිවම සඳහන් කරා පෑන සහ කීබෝර්ඩය පාවිච්චි කර සිදු කරන ලද චින්තන ජිහාදයක් තමයි අපිට අවශ්‍යය කියලා.

නමුත් ඒ පෝස්ට් එක දැම්මට පස්සේ මට ගොඩාක් තර්ජන එන්න පටන් ගත්තා, මරණ තර්ජන පවා එන්න පටන් ගත්තා. මම ඒ පිළිබඳව පොලිස්පතිට ඊමේල් හරහා පැමිණිල්ලක් කරා. පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිම ප්‍රතිචාරයක් මට තිබ්බෙත් නෑ. මම පැමිණිල්ල කරලා ඊළඟ දවසෙම සී.අයි.ඩී එකෙන් මාව අත්තඩංගුවට ගන්නවා. ඔවුන් කියන්නේ මේ ජිහාද් කියන වචනය මට යොදන්න බෑ එය සාහසික වචනයක් කියනඑක. නමුත් ඉස්ලාමය ඉස්ලාම් ආගම ගැන සාමාන්‍යය දැනුමක් තියන කෙනෙක් වුණත් දන්නවා ජිහාද් කියන්නේ සාමන්‍යයෙන් යොදන වචනයක් කියලා. එතන කියන්නේ සාමන්‍යය අරගලයක් ගැන කතාවක් විතරයි.

*ජිහාදය යනු..*

ජිහාදය ගැන පොඩි විස්තරයක් කියනවානම් ජිහාදය කොටස් තුනකට බෙදෙනවා. පළවෙනි කොටස අපේ හිතේ ඇතිවෙන චිත්ත ආවේග නැතිනම් හිතේ ඇතිවෙන නපුරු හැඟීම්වලට විරුද්ධව කරන ජිහාදය. අපේ සිත තුළින් කරන ජිහාදය. මම ඉස්ලාම් ආගමිකයෙක් විදිහට ඉස්ලාමයේ වැඩිපුර කරන්නේ තමන්ගේ හිතතුළ ඇතිවෙන නපුරු සිතුවිලිවලට විරුද්ධව තමන්ගේ සිතතුළ කරන ජිහාදය. ඒක තමයි ප්‍රධානම අරගලය ලෙසට ඉස්ලාමය පවසන්නේ. දෙවනුව සමාජය තුළ පවතින යම්යම් සමාජ අසාධාරණය, අයුක්තියන්ට එරෙහිව මතවාදී අරගලයක් ඒක දෙවෙනි අරගලය ලෙසට ඉස්ලාමය පවසනවා. ඒ කියන්නේ එතනදි භාශනයේ නිදහස, භාෂණය පාවිච්චි කරලා ලිවීම, කතා කිරීම හා ඒ තුළින් අයුක්තියට අසාධාරණයට විරුද්ධව අපි අරගල කළ යුතුයි කියනඑක. ඒ කියන්නේ එයට විරුද්ධව අපි ජිහාදය කළ යුතුයි කියන එක දෙවෙනි කාරණය. තුන්වෙනි කාරණය ඉස්ලාමයේ

කියනවා යම්කිසි සමාජ අසාධාරණයක් සීමාව ඉක්මවා ගියවිට එතනදි ආයුධ සන්නද්ධ අරගලයක් උනත් කළ හැකියි කියලා. ඒකට පලස්තීන අරගලය, වියට්නාම අරගලය වගේ අරගල උදාහරණ විදිහට කියන්න පුලුවන්. නමුත් මේ අරගලය ගැන ඉස්ලාමය පවසන්නේ ඉතාමත් අඩුවෙන් සහ අවසාන විසඳුම ලෙස. බොහෝ ඉස්ලාමීය විද්වතුන් පවා කියන්නේ මේ තුන්වන ජිහාදය, ආයුධ සන්නද්ධව කරන ජිහාදය කළ හැක්කේ නීත්‍යානුකූල රජයකට හෝ නීත්‍යානුකූල හමුදාවකට පමණයි කියලා. සාමාන්‍යයෙන් පුද්ගලයෙකුට මේ ජිහාදය කරන්න ඉස්ලාමය තුළ ඉඩක් නෑ. මම ඒ කරුණය අල්ලලා තමයි ඒ පෝස්ට් එක නිර්මාණය කරේ.

නමුත් ඔවුන් ජිහාද් කියන වචනය විතරක් අල්ලගෙන මාව අත්අඩංගුවට ගත්තා. අරගෙන ඊළඟ දවසෙම මාව මහේස්ත්‍රාත්වරිය ළඟට මාව ඉදිරිපත් කරහම ඇයත් මගේ පෝස්ට් එක බලලා තෙරුම් ගත්තා මගේ පෝස්ට් එකේ කිසිම ගැටලුකාරී තත්ත්වයක් නෑ, මාව අත්තඩංගුවට ගන්න තරම් හේතුවක් නෑ කියලා. නමුත් ඇයට කිසිම දෙයක් කරගන්න බෑ, මොකද අයි සී සී පී ආර් පනත යටතේ තමයි මට විරුද්ධව පැමිණිල්ල දාල තිබ්බේ, ඒ යටතේ නඩු පැවරුවම මහේස්ත්‍රාත්වරයෙකුට බැහැ ඇප දෙන්න. අනිවාර්යයෙන්ම හයිකෝර්ට් එකට යන්න වෙනවා. ඒ අනුව මාව බන්ධනාගාර ගත කරා. පස්සේ මස පහකට වැඩිය බන්ධනගාරේ ඉන්න වුණා. මට ඇප ලබාදීම සඳහා කටයුතු කරා හයිකෝර්ට් එකෙන්. හයිකොර්ට් එකෙදී ඇප දීමේදී විනිසුරුවරයා පැවසූ විශේෂම දෙයක් තමයි භාෂණයේ අයිතිය සම්බන්ධයෙන් අදහසක් ඉදිරිපත් කිරීමම නොවේ භාෂණයේ නිදහස කියන්නේ, මතයකට විරුද්ධ වීම හා මතයකට විරුද්ධව අදසක් දැක්වීමත් එයට ඇතුළත් කියලා. ඒ නිසා මොහු කරලා තියෙන්නේ යම්කිසි මතයකට විරුද්ධව මතයක් ඉදිරිපත් කරලා තිබෙනඑක, ඒ නිසා ඒ මතයේ ඉඳන් මට ඇප ලබා දුන්නා විනිසුරුවරයා.

මම අත්තඩංගුවට පත් වුණාට පස්සේ මුලින්ම මාව පල්ලන්සේන සිර කඳවුරේ සති 3ක් පමණ රඳවාතබා තිබුණා. ඊට පස්සේ මාව වැලිකඩ රිමාන්ඩ් බන්ධනාගරයට දැම්මා. මම කාලයක් තිස්සේ ආතරයිටිස් රෝගයෙන් පෙළෙනවා. ඒ හේතුව නිසා මට හිරගෙදර අපහසුතා විඳ දරාගැනීමට ලොකු අපහසුතාවයක් තිබුණේ. මගේ හන්දි කැක්කුම්

නිසා වැසිකිළි අවශ්‍යතාවලදී කොමඩ් පහසුකම් නැතුව කොහොමටවත් කරගන්න බැරි තත්ත්වයක් තිබ්බේ. බන්ධනාගාර වැසිකිළිවල කොමඩ් පහසුකම් නෑ. ඒත් එක්කම සිමෙන්තියේ නිදාගන්න තත්ත්වයක් තමයි තියෙන්නේ. මගේ රෝගී තත්ත්වය අනුව ඒ වගේ තත්වයක් මට විඳ දරා ගැනීමේදී ලොකු අපහසුවක් තිබුණා. මම ඉල්ලීම් කිහිපයක් කිරීමෙන් පසු මාව බන්ධනාගාර රෝහලට ඇතුළත් කරා. එහිදී මට යම්තාක් දුරට ප්‍රතිකාරයක් ලැබුණා. නමුත් බන්ධනාගාරය තුළ ඇද වැටීමක් නිසා මගේ අත කැඩුණා. අත කැඩුණායින් පස්සේ ඔවුන් ප්‍රතිකාර කළා නමුත් ඒ ප්‍රතිකාර නියමාකාරයෙන් සිදුවුණේ නෑ. එනිසා මගෙ අත දැන් සාමාන්‍ය තත්ත්වයෙන් නෙවෙයි තිබෙන්නේ. ඒක වෙනත් ශල්‍ය කර්මයක් කරලා හරිගස්සන්න ඕනේ කියලා වෛද්‍යවරු පැවසුවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/0svy30dmoB4

https://www.aithiya.lk/ramzi-razik-jihad-iccpr-human-rights-in-sri-lanka/

# 78. මේක අලුත් ආරම්භයක්

## සිනමාවේදී අසෝක හඳගම

***ඔබ දැන් විශ්‍රාමිකයෙක්, අපි විශ්‍රාම දිවියෙන් මේ කතාව පටන්ගම්මු..***



අසෝක හඳගම

මෙහෙමයි තාමමට ඒ විශ්‍රාමික දිවිය කියන එක ලොකුවට දැනෙන්නෙ නැහැ. හේතුව මම විශ්‍රාම ගත්තෙ අවුරුදු එක හමාරක විතර සැලැස්මක් එක්ක. පළවෙනි එක තමයි මම විශ්‍රාම ගන්න තීරණය කරනකොටම මම කරන්න හිටපු චිත්‍රපටිය කරන්න සැලසුම් කරන් හිටියා. ඒ එක්කම මේ නාට්‍යය කරන වැඩෙත් ඒ ඇජෙන්ඩා එකේම තිබ්බා. ඒ හින්දම විශ්‍රාම පූර්වක නිවාඩු ගියේ අප්‍රේල් පළවෙනිදා ඉඳන් අද වෙනකල් එහෙම විශ්‍රාම ගත්තා වගේ හැඟීමක් තිබ්බෙ නෑ. ඒ බිසීකම එහෙමම තිබ්බා. සමහර විට ඊටවඩා බිසීකමක් තිබ්බා මේ ජීවිතේ ඇතුළේ. ඒ හින්දා විශ්‍රාමික හැඟීමක් දැනටනම් දැනෙනේ නෑ, බැංකු කටයුතුවලින් අයින් වෙලා ඉන්න එක ඇරුනහම.

***අවුරුදු 30කට පස්සේ ඔබ අලුත් නාට්‍යක් කළා..***

ඔව් අවුරුදු 32ක්

***ඒ අත්දැකීම ගැන කතාකරමු...***

ආපහු මහගෙදරට යනවා වගේ හැඟීමක් තියෙනවා, මොකද අපි පටන් ගත්තෙ වේදිකාවෙන් හින්දා. ආපහු එතනට යනවා කියන එක ඇතුලේ වෙනම හැඟීමක් තියෙනවා. මොකද එකදිගට කන්ටිනිව්

වෙන්නෙ නැතුව ඉඳලා කාලයක්, ඒකෙන් බැහැරව ඉඳලා, රටින් පිට ඉඳලා ගෙදර එනවා වගේ හැඟීමක් දැනෙනවා එක පැත්තකින්.. අනිත් පැත්තෙන් පොඩි අභියෝගාත්මක හැඟීමක් දැනෙනවා. මොකද මේ වෙනකොට වේදිකාව අපි ඒ කාලේ කරපු නාට්‍යය භාවිතයට වඩා වෙනස් වෙලා තියෙනවා. එතකොට ඒ වෙනසත් එක්ක කොහොමද ඒ වෙනසට අනුගත වෙලා ඒ වෙනස අවශෝෂණය කරගෙන වැඩක් කරන්නේ කියන එක එක්තරා විදිහක අභියෝගයක්. ඒ දෙකම විඳගනිමින් තමයි මේ ව්‍යාපෘතියට අත ගහන්නේ.

***ඔබගේ චිත්‍රපට ගත්තහම ඒ චිත්‍රපටවල හඳගම කියලා ලකුණක් පේන්න තියෙනවා අනිත් පැත්තෙන් වේදිකාවේ ඔබ කරපු නිර්මාණවලත් එහෙම එකක් තිබ්බා...***

ඒකයි මේකයි අතරනම් වෙනසක් තියෙයි. දැන් උදාහරණයක් විදිහට ගත්තොත් එහෙම මගේ සිනමා ජීවිතයෙත් චන්ද්‍රකින්නරී එකත් මේ මගේ සඳයි අතරත් වෙනසක් තියනවනේ. මේ මගේ සඳයි එකෙන් පටන් ගත්ත ගමන චන්ද්‍රකින්නරී එකෙන් නිරූපණය වුණේනෑ. එතකොට වේදිකාවෙත් මම හිතනවා එතෙක් 87නේ මාගත නාට්‍යය කරේ 89 වෙනකල් කරපු වේදිකා නාට්‍යවල මොනව හරි ලක්ෂණයක් තියෙනවා නම්, ඒවයෙන් ගොඩාක් දුරට බැහැර වෙච්ච භාවිතයක් තමයි මේ නාට්‍යය ඇතුළේ තියෙන්නේ. ඒ හින්දා මේක ඇත්තටම කියනවනම් එහෙම දිගුවක් නෙවේ අලුත් ආරම්භයක් විදිහට හඳුන්වන එක හොඳයි කියලා මට හිතෙනවා.

***80 ගණන්වල නාට්‍ය සහ දැන් නාට්‍ය අතර පරතරය ඔබ කොහොමද හඳුනාගෙන තියෙන්නේ..***

දැන් ලංකාවේ ඇත්තටම කියනවා නම් වෘත්තීය නාට්‍ය කලාවක් නෑනේ. ලංකාවේ නාට්‍ය කලාව කියනඑක සාර්ථකව පවත්වාගෙන ආපු 60/70 කාලේ පවා කිසියම් වෙනත් වෘත්තියක නියැලුන පිරිසක් තමන්ගේ ආසාවට කරගෙන ආපු දෙයක් තමයි නාට්‍ය කියන්නේ. එතකොට ඒ නිසාම ඒ නාට්‍ය භාවිතාවේ වෙනස් හැඩයක් තිබ්බා. නමුත් මේ වෙනකොට වේදිකාවේ අලුත් දේ ඉගෙන ගන්න, අලුත් තරුණයන්ට පොඩි අවස්ථාවක් හම්බවෙලා තියෙනවා. විශ්ව විද්‍යාල

විෂයයක් විදිහට නාට්‍ය හා රංග කලාව කරනවා සහ සෞන්දර්යය හා ප්‍රසාංග කලා විශ්වවිද්‍යාලවලින් විශාල පිරිසක් නළු නිළියන් හැටියට අධ්‍යයනයක් එක්ක එළියට එනවා. ඔවුන් අතින් තමයි අද නාට්‍ය බිහිවෙන්නේ. ඔවුන්ගේ නාට්‍ය, පැරණි නාට්‍යයෙන් වෙනස්. ගොඩක් අය දකිනවා එය නාට්‍ය කඩා වැටීමක් කියලා. මම එය කඩාවැටීමක් විදිහට දකින්නේ නෑ. අවාසනාවට ප්‍රේක්ෂකාගාරය හැකිලිලා තියෙනවා තමයි, ප්‍රේක්ශකාගාරය හැකිලෙන්නේ නාට්‍යයේ තියෙන ප්‍රශ්නයක් නිසා නෙවේ, ප්‍රේක්ෂකයාගේ ප්‍රමුඛතා ලැයිස්තුවෙන් නාට්‍යය හැලීම තමයි ප්‍රධානම ප්‍රශ්නය.

පිටරටක නාට්‍යයක් රඟ දැක්වෙනකොට රංග ශාලාවක නාට්‍යය සතියක් 2ක් 3ක් නැත්නම් මාසයක් විතර එකතැනක රඟ දැක්වෙනවා. ඒ කියන්නේ අඛණ්ඩ ප්‍රේක්ෂක පිරිසක් ඒ කාලය ඇතුලත ඇවිත් නාට්‍යය නරඹමින් ඉන්නවා. අපේ රටේ එහෙම නෑ. අපි නාට්‍යය අරගෙන යනවා තැන් තැන්වලට. පුංචි පුංචි නගරවලට. ඒ නගරවල තිබ්බ වේදිකා නාට්‍යය රඟ දක්වන ශාලාවන් දැන් වෙන්දේසි මධ්‍යස්ථාන හා ප්‍රදර්ශන ස්ථාන වෙලා වෙනස්වෙලා තියෙන්නේ. ඒ හින්දා නාට්‍යය රඟ දක්වන්න තිබ්බ ඉඩ ප්‍රස්ථාවන් ඇකිලිලා. ඉස්සර මට මතකයි මාසාත නාට්‍ය 89 නිශ්පාදනය කරලා 1993 විතර වෙනකල් උතුරු පළාතේ ඇරුනහම ලංකාවේ අනිත් හැම පළාතකම ගිහිල්ලා රඟ දක්වලා තියෙනවා. එහෙම පරිසරයක් නැහැ අද. ඒ හින්දා විශේෂයෙන්ම නාට්‍ය කියනඑක කොළඹ කේන්ද්‍රීය එකක් බවට පත්වෙලා අවාසනාවකට. මේ තත්ත්වය තමයි ලොකුම බලපෑම අපේ ප්‍රේක්ශකාගාරය කඩා හැලෙන්න. මං හිතනවා අපිට පුලුවන්කම තියෙනවනම් එක රඟහලක එක නාට්‍යයක් සතියක්වත් අඩුමගානෙ පවත්වාගෙන යන්න, ඒක තමයි ලොකුම වැඩේ. ඒ අත්හදාබැලීම කරන්න මට වුවමනාවක් තිබ්බා මේ නාට්‍ය සමග. ඒත් මේ කොරෝනා තත්ත්වය නිසා ඒක ඒ විදිහට කරගන්න පුලුවන් වෙයිද කියලා සැක සහිතයි.

***කොවිඩ් එක අස්සෙ කොහොමද වැඩ කරේ සහ ඒ අත්දැකීම කොහොමද?***

මම කෝවිඩ් ලොක්ඩවුන් එක අස්සෙත් චිත්‍රපටියක් කරා. කොවිඩ්

එක මැද්දේ තමයි චිත්‍රපටිය රූගත කරේ. ඒක අපි කොහොම හරි කරා. කොවිඩ් කාලය දිහා ආපහු හැරිලා බලද්දි මට පසුතැවෙන්න කාරණාවක් නෑ. සෑහෙන්න වැඩ කොටසක් කරන්න පුලුවන් වුණා. මේ නාට්‍යත් පුහුණුවීම් පටන් ගන්නකොට ඇත්තට කොවිඩ් දෙවන රැල්ලත් ආවා. ස්ටේජ් එකට එන්න හම්බුනේ නෑ. මූලික පුහුණු සූම් තාක්ෂණයත් එක්ක තමයි කළේ. ජනවාරි 11 ඉඳන් තමයි භූමියේ පුහුණු වීම් කටයුතු පටන් ගත්තේ. ඒක ඉතින් වෙනම අභ්‍යාසයක්. කොවිඩ් අස්සේ නාට්‍යයක් කරනඑක මොකද, ලොකු අවධානමක් එක්ක මේ වැඩේ කරන්නේ. ඉතින් ඒ අවධානම අපිට ගන්න සිද්ධ වෙනවා සහ ඒත් එක්කම ලොකු වැදගත්කමක් තියෙනවා මේ මොහොතේ මේක කරනඑක. කල්නොදා අපි කරන්න හිතුවේ ඒකයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/4KaRhQSasG8

https://www.aithiya.lk/stage-drama-in-sri-lanka-filmmakers-artist-ashoka-handagama/

# 79. අයි.සී.සී.පී.ආර්. ලංකාවේ භාවිතයක් නෙවෙයි වෙන්නේ, අවභාවිතයක්

## සිනමාවේදී නීතිඥ විසාකේස චන්ද්‍රසේකරම්



නීතිඥ විසාකේස චන්ද්‍රසේකරම්

අහ්නාෆ් ජසීෆ් කියන තරුණයා අත්අඩංගුවට අරගෙන මේ වෙනකොට මාස 8කට අධික කාලයක් ගතවෙලා තියෙනවා. ඔහුව අත්තඩංගුවට පත් වෙන්නේ කවි ලිවීමේ වරදට. අපි නිර්මාණකරුවෝ හැටියට හැමදාම කරන්නේ අපේ අදහස් ප්‍රකාශ කිරීම. එයට බාධක දැම්මොත් සීමා දැම්මොත් අසාධාරණ විදිහට අපිව යටපත් කරොත් අපිට නිර්මාණ කරන්න හම්බෙන්නෙ නෑ. මම හැමදාම කියන උදාහරණයක් තමයි සීගිරි බිතු සිතුවම් ඇඳපු චිත්‍රකරුවාට අප්සරාවන් අඳින්න පුළුවන් වුණෙත්, මෑත කාලීනව අපේ සිනමාකරුවන්ට සිනමා සම්මාන ලබන්න පුලුවන් වුණෙත්, උදාහරණයක් විදිහට ලෙස්ටර් ජේම්ස් පීරිස් වගේ සිනමාකරුවෙකුට ඉන්දියාවේ රජත මයුර සම්මානය ලබන්න පුළුවන් වුණෙත්, මේ නිදහස් අදහස් ප්‍රකාශ කරන්න අපිට තිබ්බ අයිතිය අපි භාවිතා කරපු නිසා. දැන් මේ අයිතියට අකුල් හෙලන්න පාවිච්චි කරන්නේ ලංකාවේ තියෙන මර්ධනීය නීති.

### *අයි.සී.සී.පී.ආර්.*

අහ්නාෆ් කවියාව අත්අඩංගුවට ගනු ලබන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ, ඒ වගේම ඔහුට විරුද්ධව චෝදනා ඉදිරිපත් වෙනව කියලා කියන්නේ අයි.සී.සී.පී.ආර් පනත යටතේ. අපි බලන්න ඕනේ මේ නීති ඇත්තටම පාර්ලිමේන්තුව මගින් පනවන ලද්දේ කුමන අරමුණක් සඳහාද කියලා. මේ නීති පනවන ලද්දේ ඉතාමත් බරපතල

ත්‍රස්තවාදීන්ව අත්අඩංගුවට ගන්න පුළුවන් වීමටත්, ඒ වගේම බරපතල අන්තගාමීන් එක් එක් ආගම් අතර හා වාර්ගිකයන් අතර ප්‍රචණ්ඩත්වය පැතිරීම වැළැක්වීමටත්. එහෙම නැතුව අහිංසක කවියෙකු, අහිංසක කතාකරුවෙකු තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට, නිර්මාණශීලී ක්‍රමයක් උපයෝගී කරගැනීම වළක්වන්නට නෙවෙයි. ඒනිසා එවැනි බරපතල අරමුණක් සඳහා පනවනු ලබන නීති අගතිගාමී ලෙස ඉතාමත් අසාධාරණ ලෙස ලංකාවේ නිර්මාණකරුවන්ව මර්දනය කිරීමට යොදා ගැනීම මම හෙළා දකිනවා.

අපේ රටේ කවියෝ, කතාකරුවෝ, සිනමාකරුවෝ, ගායකයෝ මේ හැම කෙනෙක්ම සියළුම කලාකරුවෝ එකතුවෙලා මේ ආකාරයට මේ මර්ධනයේ නීති තමන්ගේ සහෝදර නිර්මාණකරුවන්ට එරෙහිව භාවිතා කිරීමට විරුද්ධව හඬක් නැඟිය යුතුයි. මේක අද මුස්ලිම් කවියෙකුට වෙන්න පුළුවන් හෙට දෙමළ ගායකයෙකුට වෙන්න පුළුවන්. අනිද්දා සිංහල චිත්‍රපටකරුවෙකුට වෙන්න පුළුවන්. එහෙම වෙලත් තියෙනවා. ඉතින් අපි හැම තිස්සෙම වටහාගන්න ඔනේ නිර්මාණකරුවෝ හැටියට ඉතාමත් වගකීමෙන් යුතුව අපේ ප්‍රකාශනයේ අයිතිය භාවිත කිරීමට අවශ්‍යය කරන පරිසරය අපි විසින් සාදා ගත යුතුයි කියනඑක. එයට බාධාකරන අකුල්හෙලන සියලුම ආකාරයේ මර්ධනීය නීති, මර්ධනීය රාජ්‍යය මැදිහත්වීම්වලට විරුද්ධව අපි හඬක් නැඟිය යුතුයි.

***පැම්ණිලි***

මේ පැම්ණිලි එන්නේ බොහොම සුළු පිරිසකගෙන්. මේ වගේ නිර්මාණයක් කෙරෙනකල්, මේ වගේ නිදහස් අදහසක් ප්‍රකාශ කරනකල් බලන් ඉන්න ඊට විරුද්ධ පිරිසක් ඉන්නවා. ආයතන කිහිපයක් තියෙනවා. ඒගොල්ලො තමයි ඉදිරිපත් වෙන්නේ. ඒගොල්ලෝ ඉදිරිපත් වෙලා පළමුව කරනදෙයක් තමයි නිර්මාණය සන්ධර්භයෙන් පිටතට ගෙනල්ලා මේක අර්ථ නිරූපණය කරලා, මේක බොහොම හානිකර නිර්මාණයක් හැටියට හැඳින්වීම. එතකොට දෙවනුව වෙන්නේ ඒ පැම්ණිල්ල කරාට පස්සේ පොලීසිය විසිනුත් අනිකුත් රාජ්‍ය නිලධාරීන් විසිනුත් මේක ඉතාම හානිකර නිර්මාණයක් විදිහට හැඳින්වීම. ඊට පස්සේ අධිකරණයටත් මේ මතයම ඇතුළත්

කරන්න මේ පාර්ශවයන් උත්සාහ කරනවා. අපි දැකලා තියෙන එක කාරණයක් තමයි හුඟක් වෙලාවට මෙසේ මෙම නිර්මාණ විවේචනය කරන, නිර්මාණවලට එරෙහිව පැමිණිලි කරන ගොඩක් අයට, පළවෙනි කාරණය ඒවා කියවලා බලලා හරියට තේරුම් ගන්න බැහැ. දෙවෙනි කාරණය ඒවා කියවලා බලලා වටහා ගැනීමට, සාහිත්‍ය රසවින්දනයක් ඇතිකරගැනීමට ශික්ෂණයක් ඔවුන්ට නෑ. තුන්වෙනි කාරණය ඔවුන්ගේ ඔලුගෙඩි ඉතාමත් අගතිගාමී මතවලින් පිරිලා. ඔවුන් නිවැරදි, යහපත්, විශිෂ්ටයි කියලා විශ්වාස කරන යම් කිසි ප්‍රමිතියක් ඔවුන් විසින්ම හදාගෙන තියෙනවා. ඊට එරෙහිව නිදහස් අදහස් ප්‍රකාශකරන හැම කෙනෙක්ටම විරුද්ධවීමට ඔවුන්ට උවමනාව තියෙනවා. නමුත් මම හිතන්නේ නෑ මේක තමයි අපේ රටේ බහුතර ජනතාවගේ මතය කියලා. මේක අපේ රටේ ජනතාවගේ මතය නෙවෙයි, අපේ රටේ ජනතාවගේ මතය මීට වඩා වෙනස්.

අයි.සී.සී.පී.ආර් පනත බැලුවොත් ඒ කියන්නේ ජත්‍යන්තර සම්මුතියක් ලංකාවේ ක්‍රියාත්මක කිරීමට ලංකාවට හඳුන්වා දුන් පනතක් මේක. ඇත්තටම මේ සම්මුතියේ තියෙන්නේ මොනාද කියල ගොඩක්අය දන්නේනෑ. පුළුවන්නම් ඒක කියවලා බැලුවොත් වැටහෙයි ඒ මුළු සම්මුතියේම තියෙන්නේ ඒ සම්මුතියට අත්සන් කරන සියලුම රාජ්‍යයන් විසින් එකගවුණ, අපි අපේ රටේ පුරවැසියන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලට ගරුකරනවා කියන දේ. එතනදි ඔවුන් පිළිගන්නවා හැම රටකම පුරවැසියන්ගේ ප්‍රකාශනයේ, සමානාත්මතාවයේ, අත්තනෝමතිකව අත්තඩංගුවට ගැනීමෙන් වැළකී සිටීමේ නිදහස. ඒ වගේම අධිකරණමය කාර්යය පටිපාටියක් තුළදී ඉතාම සාධාරණ නඩු විභාගයක් ලබා ගැනීමේ අයිතිවාසිකම, වදහිංසාවෙන් තොරව ජීවත් වීමේ අයිතිවාසිකම, කැමති දෙයක් ප්‍රකාශ කිරීමට නිර්මාණකරුවෙකුට ඇති අයිතිවාසිකම මේ අයුරින් අයිතිවාසිකම් පිළිඅරන් තියෙනවා මේ පනත හරහා.

### *මර්දනීය නීතිය*

නමුත් අවාසනාවට අපේ රටේ අයි.සී.සී.පී.ආර් පනත ගේන්නේ මේ සියලුම අයිතීන් ක්‍රියාත්මක කිරීමට නෙවෙයි. මේවායින් තෝරාගත් පුංචි කොටසක් පමණක් ක්‍රියාත්මක කිරීමට. අපේ රටේ ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් දිහා බැලුවොත් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ තියන ශිෂ්ට සම්පන්න ප්‍රතිපාදනවලට එරෙහිව යාමක් තමයි අයි.සී.සී.පී.ආර් පනත කියලා කියන්නේ. නමුත් අවාසනාවකට මේක ප්‍රශ්න කෙරෙන වෙලාවල් ඉතාම අඩුයි. දැන් ඔබගේ ප්‍රශ්නය මේකනිසා අත්තඩංගුවට පත්වෙන අය මුහුණ දෙන ප්‍රායෝගික ගැටලුව දිහා බැලුවහම අපිට පේන්නේ මෙන්න මෙහෙම දෙයක්. සාමාන්‍යයෙන් අපි දකින එක ප්‍රවණතාවයක් තමයි කොයි ආකාරයට පොලිසිය කටයුතු කරත් ප්‍රගතිශීලී මතයක් දරන විනිශ්චයකාරවරු ඉන්න අවස්ථාවන්වලදී යහපත් තීන්දු ලැබිලා තියෙනවා කියන දේ. උදාහරණයක් තමයි ශක්තික සත්කුමාරට විරුද්ධව අයි.සී.සී.පී.ආර් පනත යටතේ පවරපු නඩුව විසිකිරීම. එහෙම වුණත් ශක්තිකට බරපතල ගැටලු ගණනාවකට මුහුණපාන්න සිද්ධවෙනවා. ඉතාමත් අසාධාරණකම් ගණනාවකට මුහුණපාන්න සිද්ධවෙනවා. ඔහුට සිදුවූ දේ නිසා පවුලේ අයට බොහෝ අපහසුතාවයකට පත්වෙන්න සිද්ධ වෙනවා. ඒ දරුවෝ ගොඩාක් දුක්වෙනවා. ඒ විතරක් නෙවෙයි ඔහුගේ සහෝදර කලාකරුවෝ බය වෙනවා. මම කියන්නේ මේ සිද්ධවෙන හානියට කවුද වන්දි ගෙවන්නේ. මාස ගණන් රිමාන්ඩ් ගතවීම විතරක්ම නෙවෙයි මෙතන තිබෙන ප්‍රශ්නය. නමුත් අයි.සී.සී.පී.ආර් පනත ඇතුළු මර්ධනකාරී නීති මගින් කෙරෙන්නේ, පරීක්ෂණය කරන්න ලබාදී ඇති රිමාන්ඩ් බන්ධනාගාර ගත කිරීමේ ප්‍රතිපාදන, නිර්මාණකරුවන් ඇතුළු ප්‍රගතිශීලී මත දරන්නන්ගේ අදහස් ප්‍රකාශ කිරීම වළක්වාලීමට සහ ඔවුන්ට දඬුවම් කිරීමට යොදාගැනීම කියනඑක. ඒකයි මේක ලංකාව අස්සේ මර්ධනීය නීතියක් වෙන්නේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/Xh72RDi-m5E

https://www.aithiya.lk/dr-visakesa-chandrasekaram-iccpr-act/

# 80. ඉන්දියාව මට මගේ ගම වගේ

## ප්‍රවීන ලේඛිකා සුනේත්‍රා රාජකරුණානායක



සුනේත්‍රා රාජකරුණානායක

මම ඉස්සර හිතුවේ හැමෝටම ලියන්න පුළුවන් කියලා. නිසඟ හැකියාවක් තියන කොට එළියෙන් දේවල් වැඩිය ඕනෑ වෙන්නේ නැහැ. නමුත් තමන්ගෙ ජීවිතේ තමන් උකහා ගත් සමහර දේවල්, භාෂාව, සිරිත් විරිත්, භූගෙ ්ලීය ප්‍රදේශ ඒවා කෙනෙකුගේ ලියවිල්ලට, සිතුවිලි ආරට බලපානවා. දැන් මට ඉන්දියාව මගේ ගම වගේ. ඉන්දියානු පසුබිමේ කතා ලියන්න මට හරි ලේසියි. ශ්‍රී ශාන්ත් වගේ කතාවක්, ඒක හරි ලේසියි. ඒක සම්මාන වගේ දේවල්වට යෝජනා වුණේවත් නැහැ. මොකද ඒක විනිශ්චය මණ්ඩලවල ඉන්න අයට ගෝචර වෙන්නැති විෂයක්. ඒගොල්ලන්ට මෙහෙම හිමාලයේ ගියඒවා දැනෙන්නේ නැතුව ඇති. නමුත් ඒ පොත ලිවීමෙන් මම විශාල සතුටක් ලැබුවා. ඉන්දියාව, මම දන්නේ නැහැ, මට හිතාගන්න බැහැ, ඇයි අර නාඳුනන මිනිස්සු මට ගෙවල් දීලා ඒ තරම් සලකන්නේ. මම මේ බොරු කියනවා නෙමෙයි. මගේ ගෝලයෝ සමහරවිට මගෙත් එක්ක ගිහිල්ලා තියෙනවා. ඒ ගොල්ලො එතකොට දැකලා තියනවා මට ඔවුන් ඔවුන්ගේ සොහොයුරියකට වගේ සලකනවා. ඉතිං මේ ගමන් මගේ ලියවිල්ල සරසවනවා.

### *චීන සවාරිය*

චීනයට ගියේ මම දෙදාහෙදි විතර. ඒ චීන ගුවන් විදුලියට. ඒක මම යන්න හිතපු ගමනක් එහෙම කිසිමදෙයක් නෙමෙයි. ඒකාලේ මම සයිමන් නවගත්තේගම එක්ක ''සයිමන් සමග'' කියලා වැඩසටහනක්

කරනවා. ඒකෙ පිටපතක් තිබුණෙ නැහැ. අපි දෙන්න ඒ වෙලාවට, උදේ මේකප් දානකොට මම හිතාගෙන එනවා මොනාද කරන්නේ කියලා? මම සයිමන්ට කියනවා අද මේක කරමු කියලා. ඊළඟට මම නිකන් කියනවා මම ඔයාගෙන් මෙහෙම අහන්නම්. එතකොට එයා කියනව මම මෙහෙම කියන්නම් කියලා. එහෙම තමා පිටපතක් නැතුව ඒක කෙරුණෙ. එහෙම කර කර ඉන්න අතරේ එක දවසක් මට අශෝක ඩයස් කිව්වා, "අක්කේ ඔයා ආස නැද්ද චීනෙ යන්න කියලා" මම කිව්වා, "මම ආසයි. මට හොඳ අත්දැකීමක්නෙ කියලා." එහෙනම් අයදුම්පතක් දෙන්න කිව්වා. ඉතින් මම නිකන් මගේ බයෝ ඩේටා එකක් ලියලා දුන්නා. සම්මුඛ පරීක්ෂණයක්වත් නැතුව මාව තෝරාගත්තා. තෝරා ගෙන මම 2000දි චීනයට ගියා.

මම චීනයට යනකොට චීන ගුවන්විදුලියේ වැඩසටහන් තිබුණේ ඉතාම දුර්වල තත්ත්වයක. ඒනිසා මම මගේ නම කිව්වෙ නැහැ. මම නම කියන්නෙ නැතුව ප්‍රවෘත්ති කිව්වේ. වැඩසටහන් කළේ. අදට සමුග න්නවා කියලා ඉවර කළා. හැබැයි මගේ නම, කවුද සමුගන්නෙ කියලා කියන්නේ නැහැ. එතකොට අහන මිනිස්සු හිතන්න ඇති මේ චීන කෙනෙක් තමයි මෙච්චර චතුර විදිහට කතා කරන්නේ කියලා සිංහල. ඒක මට මහා වාසියක් වුණා. මම පොත් හතක් ලියාගත්තා ඒ අවුරුදු 4 ඇතුළත. අනිත් එක මට හොඳ සැප පහසු හොඳ තැනක, ආසියාවේ ලොකුම ගාඩ්න් හොටෙල් එකේ එපාර්ට්මන්ට් එකක ඉන්න ලැබුණා. මම හැම සතියෙම පොත් සාප්පු තියෙන වැන්ග්ෆුජිං වීදියට (Wangfujing Street) ගිහින් පොත් ගන්නවා. තව පෞරාණික වෙළඳපොලක් තියෙනවා. එයින් පරණපොත් හොයාගෙන එනවා. එතකොට මම පොත් පරිවර්තනය කළා. නාඩගම් කතා දෙකක් අනුවර්තනය කළා, නවකතා විදිහට.

*උතුරට ගියා*

මම ලංකාවට එනකොට ගුවන් තොටුපළට පනිවිඩයක් එවලා තිබුනා රැකියාවක් සම්බන්ධව. ජනමාධ්‍ය අංශයේ. තිලක් ජයරත්න ඒක එවල තිබුනේ. මම පස්සෙ ඒ රැකියාව ගත්තෙ නැහැ. නමුත් මම වෙන තැනකට ඉල්ලුම් පත්‍රයක් දැම්මා කොහෙද කියලා දන්නේ නැතුව. බලනකොට ඒ ගොල්ලො උතුරේ වැඩ කරන ජාත්‍යන්තර ආයතනයක්.

ඒකෙ වැඩ කරපු නිසා මට කිලිනොච්චියෙ, බිම්බෝම්බ නිෂ්කාශනය කරන තැන්වලට එහෙම යන්න ලැබුණා. එතකොට එල්.ටී.ටී.ඊ කාන්තා බලකාවල ඉඳලා ඒවායින් අයින් වෙලාආපු අය බිම්බෝම්බ නිෂ්කාශන කණ්ඩායම්වල හිටියා. මගේ ඔය එස්.එම්.එස් කියන කෙටි කතාව ලියවුනේ ඒ අත්දැකීම් පදනම් කරගෙන. ඒක දැන් ඉන්දියාවේ විශ්ව විද්‍යාලයකත් උගන්වනවා සහ ඒක දෙමළ බසටත් පරිවර්තනය වෙලා තියෙනවා. ඒක හින්දු, කණ්ණඩ සහ වියට්නාම භාෂාවලටත් ඇවිත් තියෙනවා මම හිතන්නෙ. ඒ අත්දැකීම මට හරි වාසියක්. වෙන කෙනෙකුට නොලැබෙන අවස්ථාවක්නෙ ඒක. ඒ කාලෙ සටන් විරාමයක් තිබුණට එල්.ටී.ටී.ඊ ය යන්න දෙන්නෙ නැහැ ඒ පැතිවලට. අපේ වීඩියෝ ටීම් එකක් අරගෙන ගියා මම රූගත කිරීමකට. ඒ හැම කෙනාවම එල්ටීටීඊ එක ප්‍රශ්න කළා හරියට. හැබැයි මාව ප්‍රශ්න කළේ නැහැ. "පොදු පුරුෂයා" ලිව්වෙ බිම්බෝම්බ ඉවත්කරන ඒවා බලලා ඇවිත්. ඒකෙ තියන විදිහටම ඔය විදේශිකයො ඉන්න ගෙයක් තිබුණා. අපි ගිහාම ඒ ගෙදර නවතිනවා. හරිම රස්නෙයි. රෑට ඉන්න බැහැ. රෑ 12 - 1 වෙනකොට ආයෙ ගිහින් නාන්න ඕනෑ. ඒ තරමට රස්නය. මට හිතුණා කොහොමද යුද්ධ කළේ කියලා මේ තරම් උණුසුමක් මැද?

### *වෙල්ලෝරයේ කැන්ඩි මහල්*

ශ්‍රී වික්‍රම රාජසිංහ වෙල්ලෝරයේ හිඳීම මට හරි සිත් ඇදගන්නාසුළු දෙයක්. මොකද මම කීප සැරයක් වෙල්ලෝරයේ ගිහින් තියෙනවා. ඔහු හිටපු ගෙදරට අදටත් කියන්නෙ කැන්ඩි මහල්. ඊට කලින් හිටපු විජය රාජසිංහගේ කට්ටිය තංජෝරයෙ සිටියේ. ඒකට අදටත් කියන්නේ කැන්ඩි ආරම්මනය. ඒක විකිණුවා, පස්සේ ණය වෙලා. ඒ කියන්නේ මේ අය එහේ ගිහිල්ලා රාජකීය ලීලාවෙන් ඉන්න ගියා. දුප්පත් නෑදෑයොත් එහෙට ආවා.

එතකොට රාජසිංහගෙ ගෙදරට ගියහම මට හරිම දුකක් හිතෙනවා. නිකන් අර එයා අපේ කෙනෙක් වගේ. මේක ඔස්සේ සිංහලයෝ කවුද? මේ අය මලබාර් නෙමෙයි. ඒ අය තෙළිඟු. නමුත් ලංකාවෙ සමහර අය හිතන්නේ මේ අය මලබාර් කියලා. එතකොට මේ දූර්මත. ඊළඟට ආමේනියන්වරු ගැන මම හොයන්න ගත්තා. මොකද ඒ චෙන්නායිවල මිනිස්සුත් ආමේනියන්වරු ගැන වැඩිය දන්නෙ නැහැ. ආමේනියන්

පල්ලියක් තියෙනවා. එතකොට චෙන්නායිවල ගොඩක් සමාජ සේවය කලේ ආමේනියන්වරු මුල් කාලයේ. ශ්‍රී වික්‍රම රාජසිංහ වෙල්ලෝරයේ ඉන්නකොට මට එයාගේ කතාව ලියන්න පහසුයි. නමුත් පරිවාරයේ එයාව හිර කරගෙන හිටපු අය, එයාට නීති දාපු අය, එතකොට මදුරාසි ආණ්ඩුකාරයා, මේ ඔක්කොම බලපානවනෙ රාජසිංහගෙ කතන්දරයට. එතකොට මට රාජසිංහගෙ කතන්දරය භාවාත්මක ආදර කතා එක්ක ලියන්න තිබුණා. නමුත් එහෙම ලියන්න මට ඕනෑවුණේ නැහැ. මට ඕනෑවුණේ ඓතිහාසික සත්‍යයක හැකි තරම් දුරට කිමිදෙන්න. ඒකේ ප්‍රතිඵලය තමයි සිලෝනාගමනය.

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/Ezn740SMNbE

https://www.aithiya.lk/art-and-literature-of-sri-lanka-sinhala-poetry-books-novels/

# 81. ආදායම් උපයන්න තියෙන අවස්ථා පුද්ගලික අංශයට දීලා

## සෞඛ්‍ය වෘත්තීයවේදීන්ගේ විද්වත් සංගමයේ සභාපති රවි කුමුදේශ්



රවි කුමුදේශ්

දැනට කෝවිඩ් රෝගීන් වාර්තා වීම අඩුවීමක් දක්නට ලැබෙන්නේ රෝගය අඩුවීම නිසා නොවේ මේ වෙනකොට රෝගීන් හඳුනා ගැනීම සඳහා සිදුකරන පීසීආර් පරීක්ෂණ ප්‍රමාණය අඩු කිරීම නිසා. එතකොට මේ පරීක්ෂණ ප්‍රමාණය අඩුවීම රෝගීන් අඩුවීමකි කියලා අපි හිතා ගත්තට, ඒ කතාවට කිසිඳු විද්‍යාත්මක පදනමක් නෑ, අපේ රටේ රෝගීන් අඩුවෙන්න හේතුවකුත් නෑ. මොකද සමහර අය උත්සහ කරනවා මේ ප්‍රතිශක්තිකරණ එන්නත විදගෙන යන නිසා තමයි මෙහෙම වෙන්නේ කියලා කියන්න. ඇත්තටම covishield එන්නතේ බොහොම පැහැදිලිව තියනවා එන්නත විදගෙන දෙවන මාත්‍රාවක් ලබාගත්ත කෙනෙක්ට පවා කෝවිඩ් වැළඳීමේ සම්භාවිතාවක් පවතිනවා කියලා. රෝගය වැළඳීමේ සම්භාවිතාව නෙවෙයි මෙම එන්නතෙන් නවත්තන්නෙ, රෝගය වැළඳුන කෙනෙකුට රෝගය උත්සන්න වීමට තිබෙන හැකියාව තමයි නතර කරන්නේ. එතකොට අපි තාම පළවෙනි මාත්‍රාව පමණක් විදපු කණ්ඩායමක් හැටියට කිසිසේත්ම කෝවිඩ් එන්නත නිසා කෝවිඩ් වැළඳීමේ සම්භාවිතාවය, ව්‍යාප්ත වීමේ අඩුවීමේ තත්ත්වයක් වාර්තා වෙන්න විදිහක් නෑ.

කෝවිඩ් එන්නතේ නියම ප්‍රයෝජනය ගන්නනම් අපේ ආවේක්ෂණ ක්‍රියාවලියේ සහ පර්යේෂණ ක්‍රියාවලිය ඉතා සාර්ථකව කරන අතරතුර තමයි අපි ප්‍රතිශක්තිකරණ ක්‍රියාවලිය සිදුකළ යුතුවන්නේ. එහෙම

කරොත් විතරයි අපේ රටේ සමස්තයක් හැටියට මේ ප්‍රජාව ඇතුලෙ ප්‍රතිශක්තිය වර්ධනය වෙලා ප්‍රතිශක්තිය නැති කෙනාව ආරක්ෂාවෙන herd immunity තත්ත්වයක් ඇති වෙන්නේ. අපි උත්සාහ කරනවා නම් එක්කෙනෙක්ට දෙන්නෙක්ට විදලා ඉවරවෙලා herd immunity එකක් හදාගන්න, ඒක කවදාවත් වෙන එකක් නෙවෙයි. මේ ආවේක්ෂණ ක්‍රියාවලියයි, පරීක්ෂණ ක්‍රියාවලියයි, ප්‍රතිශක්තිකරණ ක්‍රියාවලියයි, තුනම එක්ම වේගයෙන් ගියොත් තව මාස හයක් හතක් යනකොට යම්කිසි පාලනමය තත්ත්වයක් සහිත, රෝගයත් එකක ජීවත්වීමේ ක්‍රමවේදයක් හැදෙයි. එහෙම නැත්තං ඉන්දියාවේ වුණාවගේ මේක නැවත රැළි විදිහට හිස ඔසවයි. මේක වළක්වා ගන්නනම් දැනට කරගෙන යන විදිහට වසංගත විද්‍යා ඒකකය බල්ලගේ වැඩේ බූරුවා නොකර ඉන්න ඕනෑ. එන්නත් ක්‍රියාවලිය ශක්තිමත්ව කරන්න අපිට විශාල රෝහල් ජාලයක් වගේම සෞඛ්‍ය ආයතන පද්ධතියක් තිබෙනවා. අපි ඉතිහාසයේ සාර්ථක එන්නත්කරණයන් කරපු රටක්. හැබැයි මේ කෝවිඩ් එන්නත ලබාදුන්න ක්‍රමවේදය නිසා මේ සියලු දේවල් අවුල්වුණා.

රෝහල්වල දැනට තියෙන තත්ත්වයයි, යාන්ත්‍රණයයි, රෝහල්වලට ලැබෙන ප්‍රතිපාදන පිළිබඳව විශාල අර්බුදයක් තියෙනවා. ඖෂධ පමණක් නෙවෙයි අපි පීසීආර් පරීක්ෂණ ගැන කතා කළොත් ප්‍රතික්‍රියක වෙලාවට ලැබෙන්නේ නෑ. අපිට පර්යේෂණාගාරයක් පැය 24 ම දුවවන්න ඕන වුණොත් ඒකට සාමාන්‍ය අතිකාල දීමනාවක් ගෙවන්න බැරිවෙලා තියෙනවා. රෝහල් අධ්‍යක්ෂකවරු ප්‍රතිපාදනයක් ඉල්ලුවාම සෞඛ්‍යය අමාත්‍යාංශයට ලියනවා, දෙන්නෙ නැතුව වැඩේ නතර කරලා දානවා වගේ ප්‍රතිපාදනවල ගැටලුවක් තියෙනවා. ප්‍රතිපාදනවල ගැටලුව නිසාම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හිඟතාවයන් ගණනාවක් මතුවෙලා තියෙනවා. මේ හිඟතාවයන් සාමාන්‍ය පරිදි ගත්තොත් සාධාරණ හිඟතාවයන් පවතිනවා. ඒ වගේම කළමනාකරණ දුර්වලතා නිසා සිදුවන සියයට අසූවක් හිඟතාවයන් ගණනාවකුත් තියෙනවා. අපිට මුදල් හම්බ කිරීමට තියෙන සෑම අවස්ථාවක්ම, මුදල් නාස්තියෙන් තොරව රැකගැනීමට තියෙන සෑම අවස්ථාවකදීම, ඒක ව්‍යාපාරිකයෝ කීප කීපදෙනෙක් අතට පත්කරලා තියෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සම්පූර්ණයෙන්ම රජයේ වියදමින් තොරව පවත්වා ගැනීමේ හැකියාව තියෙනවා. මොකද

අපි සංචාරකයන්ගෙ සහ විදේශ ශ්‍රමිකයන්ගේ පීසීආර් කරන්නේ ඩොලර් පනහකට වඩා වියදම් කරලා. කෙනෙක්ගෙන් සාමාන්‍යයෙන් පීසීආර් පරීක්ෂණ හතරක් විතර කරනවා. ඉතින් මේ සියල්ල දීලා තියනවා පෞද්ගලික අංශයට. ඉතින් අපි විවිධ පරීක්ෂණ කරමින් රසායනාගාරයක් නඩත්තු කරමින් ඉන්නවා. ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණ කට්ටල ගෙන්වද්දීත් ඒක ව්‍යාපාරික ක්‍රියාවලියක් විදිහට සැලකුවේ. ඒක නිවැරදි වෙලාවට ගෙනල්ලා කටයුතු කළානම් එයින් ආදායමක් ලබන්න පුළුවන්කම තිබුණා. ප්‍රතිශක්තියකරණ එන්නතටත් මේ වෙනකොට විශාල වශයෙන් පොරකනවා විශාල වෙළඳ ව්‍යාපාරිකයෝ. අපි විශ්වාස කරනවා එක එන්නතයි තාම ලියාපදිංචි කරලදීලා තියෙන්නේ. ලෝකයේ මේ වෙන්කොට එන්නත් ලබාදීම පිළිබඳ තියෙන්නේ බුෆෙ එකක් වගේ තත්ත්වයක්. මහජනතාව තමන්ගෙ එන්නත තෝරාගන්නේ අර බුෆේ එකෙන්. නමුත් අපේ රටේ තාම ලියාපදිංචි කරල තියෙන්නෙ covishield එන්නත පමණයි. මේවා වටේ තියෙන්නෙ ව්‍යාපාරික උවමනාවන් කියලා අපි විශ්වාස කරන්නේ. රජයට අපි කියන්නේ සල්ලි නැත්තං නෑ කියන්න කියලා. මේවා ව්‍යාපාරිකයින්ගේ වුවමනාවට කරන්න දෙන්න නැතුව, මුදල් නාස්තිය නවත්තලා ආදායම් ලැබිය හැකි තත්වයන් තියෙනවා, ඒවා පෞද්ගලික අංශයට යවන්නේ නැතුව රාජ්‍ය අංශයෙන් කරන්න කියන එකයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/XCJ9mwhybQY

https://www.aithiya.lk/astrazeneca-covishield-vaccine-ministry-of-health-ravi-kumudesh/

# 82. සංස්කෘතික ජීවියා අහිමිවීම ඇතුලෙ තියෙන්නේ ලොකු ඛේදයක්

## චිත්‍රශිල්පී ප්‍රගීත් රත්නායක


ප්‍රගීත් රත්නායක

සංස්කෘතික ජීවිතය, සංස්කෘතික මනුස්සයා කියනඑක මට තේරෙන්නෙ අපේ ජීව විද්‍යාත්මක ශරීරයට, නඩත්තු කරන්න අවශ්‍යම ප්‍රධාන සත්වයා විදිහට. සංස්කෘතික සත්වයෙක් අප අස්සේ නැත්තං ඇත්තටම අපි ජීව විද්‍යාත්මකවත් මැරිලා. අපි ජීව විද්‍යාත්මකව ඇඳුම් ඇන්දට ආහාර ගත්තට රමණය කරාට වැඩක් නෑ අපේ මේ සංස්කෘතික තත්ත්වය අපි තුළ නැත්නම්. ජාතකයෙන් නෙමේ අපේ නරුමවාදය පටන් ගන්නේ අපි තුළ සිටින සංස්කෘතික ජීවියා අහිමිවීම තුළින්. අපේ මේ ළඟම කෙනා මඟහැරෙන්නේ සංස්කෘතික ජීවිතය මොකක් හෝ හේතුවක් උඩ නැතිවුණාම. මෙය ධනවාදය කරපු වැඩක් හැටියට තමයි මේ මොහොතේ ඉස්මතු වෙන්නේ. එය ගෝලීය වශයෙන් අර්ථකථනය කරාට දේශපාලනමය තත්ත්වයන් යටතේ රාජ්‍ය යාන්ත්‍රණය යටතේ අපේ සංස්කෘතිය යම් ආකාරයකින් හකුළුවාගෙන තියෙනවා. දැන් අපි මේ සාකච්ඡාව කරන්න නිදහස් අවකාශයක් වුණ නිදහස් චතුරස්‍රයට ආවා, එහෙම ආවාම අපිට පේනවා, තියෙන නිදහසත් අපිට නැති වෙලා නේද තියෙන්නේ කියලා.

### *වෙළඳපොළ*

වෙළඳපොළ ඇවිල්ලා අපේ සංස්කෘතික ජීවිතය උදුරගෙන වෙන විනෝදයක් අපට දීලා අපේ ළඟම කෙනා මඟහරවනවා, ඉතින් ඕකට සිහියෙන් අපි මුහුණ දුන්නේ නැත්නම් අපිට සංස්කෘතික ජීවිතයක් කෙසේ වෙතත් මෙන්න මේ ජීව විද්‍යාත්මක ශරීරයත් ඉවරවෙනවා.

ඒක ඉවර උනාට පස්සේ ඉතින් මුකුත් නැහැ. එනම් අපේ මේ ජීව විද්‍යාත්මක ශරීරයට තමයි අපේ මේ අනිකුත් ශරීර සියල්ල කාන්දුවෙලා තියෙන්නේ. ඒක දරාගන්න මේක නිරෝගිමත්ව තියෙන්න ඕනි. දැන් අපිට ලොකු හිස්කමක් දැනෙනවා, සමාජය ඒක හදනවා, ඉතින් සංස්කෘතිකව අපි හිස් උනාට පස්සේ මගේ ඉස්සරහ ඉන්න කෙනාව මට අදාළ වෙන්නේ නැහැ. මම තවදුරටත් හොයන්නේ පවතින ශරීරයක් විතරයි, මට මනසක් ඕනේ නැතිවෙලා තියෙනවා, සංස්කෘතික ජීවියා අභිමිවීම ඇතුලෙ තියෙන්නේ ලොකු බේදයක්.

*ආදරය*

ආදරය හා ලිංගිකත්වය කියන විෂය මනුෂ්‍යයන්ගේ හැඟීම් ඇතුළෙ සංවිධානය වන ලොකු මෙවලම් දෙකක් නේ. ඉතින් ඕවට මේ කතාකරන නිදහස සීමාවීම, සංස්කෘතික බලහත්කාරකම නැතිනම් ධනවාදය පොළාපැනීම කියන දෙය, මේවගේ ගොඩක් දේවල් ඇතුලේ අපි යම්කිසි විශ්වාස පද්ධතියක් ඇතුලේ සාරයක් ඇතුලේ නඩත්තු කරපු දේවල් අභියෝගයට ලක් වෙනවා. ඉතින් එය ඇතුළෙම තමයි ආදරය කියනදෙයත් අපිට නිර්වචනය කර ගන්න වෙන්නේ. මේක නිර්වචනය කරගන්න අමාරු වෙන්නේ සමකාලීනව. එම නිසා අපි එයට 70, 80 දශකයේ තියෙන දේ ගළපන්න උත්සහ කරනවා. නමුත් එය ප්‍රායෝගික වෙන්නේ නැහැ. මොකද ඒ දෙක අතර ලොකු හිඩැසක් තියෙනවා. එනම් අපිට නොස්ටැල්ජියානු තැනකින්ම මේ දේවල් මේ මොහොතට ගලපගන්න අමාරුයි. නමුත් මේ මොහොතට කියවග න්න ඒ ප්‍රමාණවත්. මොකද ඒ තත්ත්වයන් දෙක ඇතුලේ වෙනස් අර්ථයන් තියෙන්නේ. ආදරය සුන්දරයි කියලා ගත්තට එය මේ කාලයට ගැලපෙන්නේ නැහැ. මේ මොහොතේදී ආදරයේ භාෂාව අහිමිවෙලා තියෙනවා. ආදරයේ භාෂාව තේරෙන්නේ නැහැ. එනම් ආදරයේ උණුහුම කෙනෙකුගේ නැතිනම් කෙනෙකුගේ body language එක මගහැරිලා තියෙනවා. ඒ තරමට අපි ශික්ෂණය වෙලා නෑ, අනිකාව දරාගන්න ආදරේ ඇතුලේ. ආදරේ පරිත්‍යාගයක් කියනඑක, අනෙකාට ඉඩ දෙනව කියනඑක, මේ මොහොතේ අපෙන් ගිලිහෙමින් යනවා. නිසියාකාරව ආදරය මොකක්දැයි කීමට අපේ භාෂාව අසමත් වෙලා තියෙනවා.

### *දේශපාලනය*

ක්ෂුද්‍ර දේශපාලනය හා මහා දේශපාලනය කියන මේ ක්‍රියාවලිය ඇතුලේ සැවොම මහා දේශපාලනේට තමයි ඇඟිල්ල දික් කරන්නේ. එය සූත්‍ර ගතකරපු යාන්ත්‍රණයක්, ඒ යාන්ත්‍රණය ඇතුලේ පුටුමාරු වෙනවා, පුද්ගලයෝ මාරු වෙනවා, පාට මාරු වෙනවා මිසක සමාජය මාරු වෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම ගත්තොත් දේශපාලනය කියන්නේ සමාජය වෙනස් කිරීමනේ, ඒ අනුව සමාජය වෙනස් කිරීම කියන කාරණාව තුළදී පුද්ගල චින්තන ලෝකය අතිශය වැදගත්, ඒ චින්තන ලෝකය තුළ අපට ගරිල්ලා ප්‍රහාරයක් ගහන්නේ නැතුව සමාජයක් වෙනස් කිරීම කරන්න බැහැ. පක්ෂයකට එය පවරලා අපිට නිකන් ඉන්න බැහැ පුද්ගලයෝ හැටියට සහ කලාකාරයො හැටියට. මම විශ්වාස කරනවා චිත්‍ර ශිල්පියෙක් හා මනුෂ්‍යයෙක් විදිහට එකවර මම මේ සමාජයේ හුස්ම ගන්නවා කියලා. ඉතින් ඒ හුස්ම ගැනීම සවිඥ්ඥාණික ක්‍රියාවලියක්. එයින් කියවෙන්නේ නෑ හිත හිත හුස්ම ආශ්වාස කරනවා කියලා. මම කියන්නේ මේ සමාජයේ, මේ භූමිය නැතිනම් මේ මහාපොළොව තුළ එහා මෙහා යාම සිහියෙන් කරනවා කියන දෙයයි මට මේ වෙන සිදුවීම් කිසිවක් අහිංසක නෑ. මොකද ඒ අර්ථයෙන් ගත්විට මට අහිංසක ලෙස චිත්‍ර අඳින්නත් බැහැ සහ අහිංසක ලෙස සිතන්නත් බෑ. මොකද නරුම සමාජයක් ඇතුලේ එහෙමත් නැතිනම් යම්කිසි යාන්ත්‍රණයක් ඇතුලේ මිනිස්සුන්ව එක්තරා තැනකට රාමු කරද්දී මට හිතෙන්නේ නිදහස් මනුස්සයෙක් හැටියට අපි ලොකු අනතුරක ඉන්නවයි කියන එක. මම විශ්වාස කරන්නේ මේ භූමියට අදාලව මේ මොහොත තේරුම් ගැනීමේ දී, නරුම විදිහට ඉතා භයංකර, චිත්‍රයක් අපෙ ඉස්සරහා තියනවා. අපි මේවා සංස්ලේශනය කරගත්විට මිනිස් චින්තනය ඇතුලේ අපිව හෙල්ලෙනවා. එහම නැත්තම් කම්පනයට ලක් වෙනවා. ඒක දනෙන්න අපි පොඩ්ඩක් පොළොවට බර තියලා ඇවිදින්න ඕනේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/0RxXJbkdaFI

https://www.aithiya.lk/art-and-culture-of-sri-lanka-prageeth-rathnayake/

# 83. රටේ පොදු ප්‍රශ්න දිහා වාර්ගික ඇහැකින් බලන්න එපා

## පාර්ලිමේන්තු මන්ත්‍රී ඉම්තියාස් බාකිර් මාකර්



පාර්ලිමේන්තු මන්ත්‍රී
ඉම්තියාස් බාකිර් මාකර්

***මුස්ලිම් මළ සිරුරු භූමදානය ආණ්ඩුව විශාල ප්‍රශ්නයක් කරගත්ත බවක් අපි පහුගිය කාලේ දැක්කා. මේ තත්ත්වය ගැන ඔබ මොකද හිතන්නේ..***

මේක ඇත්තටම සිංහල, දෙමළ, මුස්ලිම් ප්‍රශ්නයක් කරගන්න අවශ්‍යතාවය තිබුණේ නෑ. මේක විද්‍යාත්මක පදනමක් අනුව පරීක්ෂණවලින් නිගමනවලට ඇවිල්ල තියෙනව, ඒක ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගෙන තිබෙනවා. මේක බොහෝ දෙනා දේශපාලන වාසි සඳහා උපයෝගී කරගෙන තියෙනවා . ඒ තුළින් ඔවුන් ප්‍රශ්න ඇති කරනවා, විවිධ න්‍යාය පත්‍ර ගේනවා, මේක මහා විහිළුවක්. ලෝක සෞඛ්‍ය සංවිධානයේ මතය පිළිගන්නවා නම් මේ දේවල් ඇති වෙන්නේ නැහැ.

***ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගායනා නොකිරීම පිළිබඳව ඔබගේ අදහස කුමක්ද ?***

අපේ රටේ මොකක් හරි වාර්ගික ප්‍රශ්නයක් ආවහම සිංහල පත්තර මවන්නේ එක ලෝකයක්, දෙමළ පත්තර මවන්නේ එක ලෝකයක්. මෙහෙම රට යන්න හොඳ නෑ. වාර්ගික එකමුතුවක් තියෙන්න ඕන. විවිධත්වයෙන් යුතු සමාජයක් ස්ථාපිත වෙන්න ඕනේ. ජාතික ගීය ගායනා කිරීමේ දී එහි කියා ඇති අර්ථය හැමෝටම තේරෙන්න ඕනේ. ජාතික ගීය නිර්මාණය වුණ කාලවකවානුවේ ම තමයි ඒක දෙමළ

භාෂාවට පරිවර්තනය වෙලා තියෙන්නේ. දැන් පරපුර හුඟක් වෙනස්, ඔවුන් සිංහල දෙමළ ඉංග්‍රීසි භාෂා තුනම භාවිතා කරනවා. නමුත් උතුරු නැගෙනහිර බොහෝ ජනතාවට තේරෙන්නේ දෙමළ භාෂා විතරයි, එතකොට ඔවුන්ට රට ගැන හැඟීමක් ඇති කරගන්න කරන්න පුළුවන් ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගැයුවොත්.

***සුළු ජාතීන්ට තර්ජනයක් වෙන මේ විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්නේම මුස්ලිම් ජනතා නියෝජිතයන් ගේ ඡන්දයෙන්.***

මම කිසිම ප්‍රශ්නයක් වාර්ගික විදිහට බලන්නේ නැහැ. මේ වගේ කරණම් ගැසීම අපි ඕනතරම් දැකල තියෙනවා. එක පාරක් දාහත් දෙනෙක් අනෙක් පැත්තට ගියා. එතන සිංහල මුස්ලිම් ප්‍රශ්නයක් තිබ්බේ නෑ. ඒ ඔක්කොම සිංහල කට්ටිය. එක පුද්ගලයෙක් පමණයි මුස්ලිම් අයෙක්ට හිටියේ. මේ කරණම් ගැසීම මොවුන් කියන්නේ රට වෙනුවෙන් කියලයි. නමුත් මේවා ඔක්කොම ඔවුන්ගේ පෞද්ගලික අරමුණු සාක්ෂාත් කර ගැනීමට. ඒ වගේම ඔවුන්ගේ බලය තහවුරු කර ගැනීමට. ඉතින් මේ සම්බන්ධව ජනතාව කල්පනාකාරී විය යුතුයි.

***වර්තමාන ආණ්ඩුවේ හැසිරීම පිළිබඳව මුස්ලිම් ප්‍රජාව ගේ ආකල්පය කුමක්ද ?***

මේ ගැන කතා කිරීමේ දී මුස්ලිම් සිංහල කියලා වර්ග කරන්න අවශ්‍ය නැහැ, මේක අද රටම දැනෙන ප්‍රශ්නයක්. ලෝකයේ 99ක් රටවල් වර්ග දෙකටම භූමදානය කරන්න ඉඩ සලසලා දීලා තියෙනවා. මෙහිදී ලංකාව එසේ නොකිරීමෙන් අනෙක් ජාතීන්ට එය විශාල පීඩනයක්. ඉතිං ඒ අනුව ආණ්ඩුව පහුවෙලා හරි ගත්ත ක්‍රියාමාර්ගය හරි. මෙහිදී අනෙක් පක්ෂත් වාර්ගික ඇහැකින් මේක බලන්නේ නැතුව මෙයට සහාය දෙන්න ඕනෑ.

---


**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/OX7m9oaO3jw

https://www.aithiya.lk/imtiaz-bakir-marker-current-political-situation-samagi-jana-balawegaya/

# 84. ඇඟලුම් කර්මාන්තය කිසිසේත්ම බිඳ වැටීමක් නැහැ

## නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සංගමයේ සම ලේකම් ඇන්ටන් මාකස්



ඇන්ටන් මාකස්

*කොවිඩ් වසංගතය නිසා මෙරට ඇඟලුම් කර්මාන්තයට උදාවුයේ නරක කළ දසාවකි. විශේෂයෙන්ම මෙයින් පීඩාවට පත්වුයේ ඇඟලුම් කර්මාන්ත සේවක සේවිකාවන්ය. ඒ අතරින්ද මෑන් පවර් ක්‍රමයට රැකියා කළ පිරිස පත්වුයේ අන්ත අසරණ තත්ත්වයකටය .නමුත් මේ වනවිට ඇඟලුම් කර්මාන්තශාලා යළි නැඟී සිටිමින් ඇත. ලාබ ලබති. නමුත් ඔවුන් එය සේවක සේවිකාවන්ට අඟවන්නේ නැත. ඔවුන් තවමත් පවසන්නේ කොවිඩ් නිසා කර්මාන්ත ඇද වැටී බවය. නමුත් සත්‍ය එයමද? මේ පිළිබඳව අප සාකච්ඡා කීරිමට නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සංගමයේ සම ලේකම් ඇන්ටන් මාකස් මහතාව සම්බන්ධ කර ගත්තෙමු.*

***කොවිඩ් නිසා ඇඟලුම් කර්මාන්තය පහුගිය කාලයේ බිඳ වැටුණා. මෙහි වර්තමාන තත්ත්වය ගැන පැහැදිලි කළොත්?***

2020 මාර්තු මාසයේ ගෝලීය කොවිඩ් වසංගතය පැමිණීමට පෙර මෙරට යන්ත්‍ර ක්‍රියාකරවන්නියන්ගේ පුරප්පාඩු පමණක් 74,000 ක් තිබුණා. නමුත් කවුරුත් ඒවට ඉදිරිපත් වුණේ නැහැ. පඩි අඩුයි, අඩු සැලකිලි ලැබෙන්නෙ, සේවා ස්ථානවල ප්‍රශ්න ආදිය නිසා මේ ඇබෑර්තුවලට කවුරුත් ඉදිරිපත් වුණේ නැහැ. අතීතයේ නම් වෙළඳ කලාපයට අක්කා වැඩට ආවොත් තමන්ගේ නංගීව, ඥාතියෙක්ව

එක්කන් එනවා තවත් රැකියාවලට. ඒත් අද එහෙම නැහැ. මොකද මේ කර්මාන්තශාලා හිමියන් තමන්ගේ සේවකයින් ආකර්ශනය කර ගන්න උත්සහ කරන්නේ නැහැ. ඔවුන් සේවක සේවිකාවන්ට සලකන්නේ අඩු පඩියකට. අඩු සැලකිලි. යහපාලන සමයේ ඇතැම් මන්ත්‍රීවරුන් විදේශයෙන් මෙරටට සේවක සේවිකාවන් ගේන්න පවා කැබිනට් ප්‍රතිකා ඉදිරිපත් කරලා තිබුණා. ඒ අඩු පඩියට වැඩි වැඩක් කරගන්න.

කොවිඩ් පළමු රැල්ලෙදී කර්මාන්තශාලා වසන්න එහි අයිතිකරුවන්ට සිදුවුණා. රජය ගත් හදිසි තීරණය නිසා සේවක සේවිකාවන් 10,000 කට ආසන්න සංඛ්‍යාවක් අසරණ වුණා. නවාතැන්වල සිර වුණා. ඇඳිරි නීතිය දාපු නිසා කන්න බොන්න ගන්න තැනක් තිබුණේ නැහැ. පසුව මේ පිළිබඳව මාධ්‍ය මඟින් අනාවරණය වීමත් සමඟ අප වෘත්තිය සමිති එක්වෙලා යුද්ධ හමුදාපතිවරයා සමඟ සාකච්ඡා කරලා මේ සේවක පිරිස හමුදා බස්වලින් නිවෙස්වලට යවන්න සැලැස්සුවා. එතනදී වඩාත් අසරණ වුණේ මැන් පවර් සේවකයින්. ඔවුන්ගේ වගකීම ගන්න ආයෝජන ප්‍රවර්ධන කලාප නිලධාරීන් පසුබැවා. ඒ විදිහට තමා මේ මැන් පවර් සේවකයින්ට සැලකුවේ. නැවත අප්‍රේල් මාසයේ කර්මාන්තශාලා විවෘත කරද්දි සෞඛ්‍ය නිර්දේශ වුණේ 50% ක් සේවයට කැඳවන්න කියලා. එතෙන්දි මතුවුණ ගැටලුව තමා සේවකයින් අඩක් සේවයට කැඳවද්දි නිවසේ සිටින අනෙක් පිරිසට වැටුප් ගෙවන්න බැහැ කියලා. එතනදීත් අපි මැදිහත් වෙලා කියාහිටියා තට්ටුමාරු ක්‍රමයට කට්ටියව වැඩට ගෙන්වන්න කියලා. මෙතනදි අපි කම්කරු අමාත්‍යාංශය, කර්මාන්තශාලා හා වෘත්තිය සමිති එක්ව ත්‍රෛයිපාර්ශික ගිවිසුමක් අත්සන් කළා. ඒ කොවිඩ් නිසා කිසිඳු කම්කරුවෙක්ගේ රැකියාව අහිමි වෙන්න බැහැ කියලා. ඒ අනුව බොහෝ සේවකයින්ගේ රැකියා සුරක්ෂිත කරන්න අපට හැකි වුණා. විශේෂයෙන් ජනාධිපතිවරණය ආසන්නයේ තිබු නිසා මේ යෝජනාව සාර්ථක වුණා.

*අද ඇඟලුම් සේවිකාවකගේ තත්ත්වය ?*

ඇත්තටම මේ ඇඟලුම් ක්ෂේත්‍රයේ අවම වැටුප රුපියල් 10,000 ක් පමණයි. පැමිණීමේ දීමනාව, ටාගට් දීමනාව, ප්‍රවාහන දීමනාව, අතිකාල ආදිය එකතු වෙලා තමා ඔවුන්ට වැඩි වැටුපක් ගන්න වෙන්නේ.

කොරෝනා සමයේ මොවුන්ට අවම වශයෙන් රුපියල් 14500 ක් හෝ ගෙවිය යුතුයි කියලා කම්කරු දෙපාර්තමේන්තුව කිව්වහම මේක ඇතැම් කර්මාන්ත ශාලා හිමියන්ට ආශිර්වාදයක් වුණා. ඔවුන් මේ සේවිකාවන්ගේ ප්‍රවාහන දීමනා, ටාගට්, පැමිණීමේ දීමනා, ආහාරවේල පවා කප්පාදු කරන්න ගත්තා. ඒ මොවුන්ට පල නොකියා පලා බෙදන්න. එතකොට මොවුන් එපාවෙලා රැකියාව අතහැර දාලා යනවා. ආයේ අස් කරලා වන්දි දෙන්න අවශ්‍ය නැහැනේ. අනෙක් ක්‍රමය තමා පත්වීම් ලිපිය භාවිතා කරලා ඇයට හෝ ඔහුට යන්න බැරි දුර අමාරු තවත් ශාඛාවකට මාරු කිරීම. මොවුන් මේ වැඩ කරන්නේ කණ්ඩායම් ලෙස. ටීම් වර්ක් ලෙස වැඩ කරද්දි එක සේවිකාවක් පැමිණියේ නැති වුණොත් මුලු ලයින් එකම අඩපණ වෙනවා. එහෙම වැදගත් පිරිසකට තමා අද මෙහෙම සලකන්නේ.

මේ කොවිඩ් සමයේ සේවක සේවිකාවන් 55,000 කට අධික පිරිසකගේ රැකියා අහිමි වෙලා කියලා අපට වාර්තා වෙලා තියෙනවා. නමුත් දැනට කම්කරු දෙපාර්තමේන්තුව සතුව ඇත්තේ පැමිණිලි 12,000 යි. හැම මාසේකම සේවක සේවිකාවන්ගේ සේවක අර්ථසාධක අරමුදල් කැපිලා එන්නේ මෙතෙන්ට. ඒ හරහා ලේසියෙන්ම රැකියා අහිමි වු පිරිස් හොයා ගන්න පුලුවන්. ඒත් මොවුන් කළේ ඒ ගැන තොරතුරු ඉල්ලලා පත්තරේ දැන්වීමක් දාපු එක. ඔවුන් අදටත් දන්නේ නැහැ කී දෙනෙකුට රැකියා අහිමි වෙලාද කියලා.

***දෙවැනි කොවිඩ් රැල්ල ආරම්භ වුණු බ්‍රැන්ඩික්ස් ආයතනය පිළිබඳ වාර්තාව තාම එළියට ඇවිත් නැහැ. ඒ ඇයි?***

දෙවැනි කොවිඩ් රැල්ලෙදී සේවක සේවිකාවන් 4000 කට අධික පිරිසක් අසාදිත වුණා. නමුත් මේ ආයතන මේවා ගැන සැලකිලිමත් වුණේ නැහැ. ඔවුන්ට අවශ්‍ය වුණේ ටාගට් එක. මේ බ්‍රැන්ඩික්ස් පොකුරේ ව්‍යාප්තිය ගැන හොයන්න කම්කරු අමාත්‍යාංශය වෙනම විමර්ශනයක් ආරම්භ කළා. නීතිපති නියමයෙන් පොලිසිය විමර්ශනයක් ආරම්භ කළා. ඒත් මේ දෙකේම වාර්තා අද වෙනතුරු ප්‍රසිද්ධ කරලා නැහැ. ඒ මේ ආයතනවලට ගැටලුවක් වෙයි කියන බයට. මොකද මේවා එළියට දැම්මොත් විදේශයේ ගැණුම්කරුවෝ මේ ඇණවුම් ගන්නේ නැහැ, අපිරිසිදු රෙදි කියලා. මන්ද ඔවුන්ට අවශ්‍ය සේවක සේවිකාවන්ට

හොඳට සලකමින් ගන්නා පිරිසිදු ඇඳුම්. ඔවුන්ගේ දහඩිය කඳුළු තියෙන ඇඳුම්වලට විදේශිකයින් කැමති නැහැ.

***ජිනීවා නිසා ඇඟලුම් කර්මාන්තයට බාධාවක් වෙයිද?***

ඒක බොරු බිල්ලෙක්. ජිනීවා නිසා මේ පද්ධතිය බිඳ වැටෙන්නේ නැහැ. අද කරගන්න බැරි තරමට නිෂ්පාදන ඇණවුම් ලැබෙනවා. එයයි ඇත්ත. ඇත්තටම තවම අපේ රටේ තියෙන්නේ ඇඟලුම් කර්මාන්තශාලා නෙමේ. ටේලර් ෂොප්. ඔවුන් ඉදිකටුවේ සිට සියල්ල ගෙන්වන්නේ විදේශයෙන්. මේ නිසා ඇණවුමක් දෙන්න මාස තුනකට වඩා ගත වෙනවා. නමුත් චීනය වගේ රටවල සියල්ල තිබෙන නිසා ඔවුන් දින 14 කින් වැනි කෙටි කාලයකින් ඇණවුම ලබා දෙනවා. මේ පහුගිය කොවිඩ් කාලයේ මාර්තු සිට මැයි දක්වා පමණක් ඩොලර් මිලියන 24 ක් මේ සේවකයින්ට අහිමි වෙලා තියෙනවා. අපි කියන්නේ මේ අවුරුදු සමය තුළවත් එය සේවකයින්ට ලබාදෙන්න පියවර ගන්න කියලා. සේවකයින්ට හොඳ සැලකීමක්, ගෞරවයක් ලබා දෙන්න මේ කර්මාන්තශාලා හිමියන් පියවර ගන්නේ නැත්නම් අපි මෙය ජාත්‍යන්තරයට පවා ගෙනයන්න සූදානම් බව අවසාන වශයෙන් කියන්න කැමතියි.

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/Ly0JVUMQEf8

https://www.aithiya.lk/garment-industry-in-sri-lanka-trade-zone-anton-marcus/

# 85. අද දෙමළ ඊළමක් නෑ, අද තියෙන්නේ චීන ඊළමක්

## හිටපු අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න


පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න

අප්‍රේල් මාසේ වෙනකොට දෙවෙනි ඩෝස් එක දෙන්න ඕනී නමුත් දැන් ඒක මැයි මාසෙට ගිහිං තියෙනවා. මේ වෙනකොට රජය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විශාල අර්බුදයක ඉන්නවා, මොකද අවශ්‍ය එන්නත් ප්‍රමාණය ගෙනල්ලා නැහැ. ලංකාවේ ලක්ෂ 216ක් මිනිස්සු ඉන්නවා. මේකෙන් අවම වශයෙන් ලක්ෂ 130කට එන්නත් දෙන්න ඕනෑ. එතකොට එන්නත් ලක්ෂ 260ක් ලංකාවට ගේන්න ඕනී. මේ ලක්ෂ 260න් දැනට කීයක් ගෙනත් තිබෙනවාද? ලංකාවට ප්‍රධානයක් විදිහට ලැබුණා ඉන්දියාවෙන් එන්නත් ලක්ෂ 5ක්, ඒක නිකං ලැබුණේ. ලෝක සෞඛ්‍ය සංවිධානය ලක්ෂ 40ක් මේ රටට දෙන්න පොරොන්දු වුණා. ඒකෙන් ලක්ෂ 16ක් මාර්තු මාසේ වෙනකොට දෙනවා කියලා ඔවුන් කිව්වා. ඒ ලක්ෂ 16යෙන් මාර්තු මාසයේදී මේ රජයට ලැබුණේ 2 64 000යි. ඒ වගේම රජය කියන විදිහට ඉන්දියාවෙන් තව ලක්ෂ 5ක් එන්නත් අරගෙන තියෙනවා. එතකොට මේ ඔක්කෝම ගත්තත් ලංකාවට තියෙන්නේ ලක්ෂ 12ක විතර එන්නත් තොගයක්. එතකොට ලක්ෂ 260ක් අවශ්‍ය එකෙන් ලංකාවට දැන් ලැබිලා තියෙන්නේ ලක්ෂ 12යි.

### *ලක්ෂ 260ක් එන්නත් අවශ්‍ය රටකට ලැබිලා තියෙන්නේ ලක්ෂ 12යි*

මම 2020 කෝවිඩ් විවාදය වෙලාවේ තමයි ඇමතිතුමියට කිව්වේ කෝවිඩ් සඳහා එන්නත් කිහිපයක් දැන් රටවල්වල නිශ්පාදනය වෙමින් තිබෙනවා තව මාස දෙක තුනක් යනකොට ඒවා වෙළඳපොළට එනවා.

මතක තියාගන්න ඒ වෙනකොටත් මිලියන 322ක ජනග්‍රහනයක් ඉන්න ඇමරිකාව එන්නත් බිලියනයක් ඒ වෙනකොටත් ඇනවුම් කරලා ඉවරයි. කැනඩාව තමන්ගේ ජනග්‍රහනයෙන් එක්කෙනාට 10 ගානේ ඇනවුම් කරලා ඉවරයි. එන්ගලන්තය බිලියනයක් ඇනවුම් කරලා ඉවරයි. ඉන්දියාව බිලියන 1.8ක් ඇනවුම් කරලා ඉවරයි, අනෙකුත් රටවලුත් ඇනවුම් කරගෙන යනවා ඒ නිසා මේ පිළිබඳව වහාම ක්‍රියාත්මකවෙලා දැන්මම ඇනවුම් කරන්න, නැත්තන් 2021 එන්නත් නිකුත් කළත් අපිට 2022 මැද වෙනකම් එන්නත් ලැබෙන එකක් නැහැ කියලා. ඒ වෙලාවේ ඇමතිතුමිය ඔලුව වැනුවා. මම දන්නේ නෑ එතුමිය මොන ක්‍රියාමාර්ගය ගත්තද කියලා. ඊට පස්සේ මම නොවැම්බර් මාසයේදී සෞඛ්‍ය වැය ශීර්ෂයේදී නැවතත් මේ ඉල්ලීමම කළා. නිකං ලැබෙන එන්නත් දිහා බලාගෙන හිටියා ඇනවුම් කළේ නැහැ. දැන් මොකක්ද වෙලා තියෙන්නේ?

දැන් ඇනවුම් කරන්න ගියාම මොකද වෙන්නේ, දැන් ලෝකය පුරාම එන්නත් සඳහා විශාල ඉල්ලුමක් තියෙනවා, ඒ නිසා දැන් එන්නත් නැහැ. නිශ්පාදනය කරන ප්‍රමානය ඉල්ලුමට සරිලන්නේ නැහැ. දැන් විශේඥ කමිටුවල මතයටත් පරිබාහිරව අපේ ජනපතිතුමා චීන ජනපතිතුමා එක්ක කතා කළා කියලා, දැන් චීන එන්නත [සිනෝෆාම්] ගේන්න හදනවා. ඒක ගෙනාවා ලංකාවට. ඒ ගෙනාපු වෙලාවේ මමම ප්‍රවත්ති සාකච්ඡාවක් තියලා කිව්වා ඇයි විශේෂඥ කමිටුව මේ එන්නත හොඳ නෑ කියන්නේ කියලා. ඒ ඔවුන්ගේ විශේෂඥ වාර්තාවත් එක්ක. ඒ වාර්තා සමග මාධ්‍යයේ විශාල කතාබහක් ඇතිවුණා. ඒ සමග රජය ඒ එන්නත අපේ ජනතාවට දුන්නේ නෑ. ඒ වෙනකොට අපේ ඖෂධ අධිකාරියත් එන්නතට අනුමැතිය දීලා තිබුණේ නැහැ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතියත් එන්නතට තිබුණේ නැහැ. ඒ අනුමැතිය තවමත් නැහැ. නමුත් මේකට කරපු බලපෑම නිසා අවසානයේදී මොකද වුණේ ? ඖෂධ අධිකාරියේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය ගෙදර යැව්වා. පහළ මට්ටමේ කට්ටියක් දැන් මේ තැන්වලට පත්කරලා තිබෙනවා. මේක තමයි අද රටේ තත්ත්වය.

මතක තියාගන්න ලංකාව තමයි එන්නත්කරණයෙන් ලෝකයේ පළවෙනි රට. ලෝකයේ කීර්තිනාමයක් තියෙන පළවෙනි රට. අපි 99.9%ක් එන්නත් කරණයේ ඉන්නකොට ඇමරිකාව ඉන්නේ 99.2%

කට විතර. එතකොට මේ තරම් කීර්තිමත් ඉතිහාසයක් තිබුණ රට අද වැටිලා තිබෙන තැන බලන්න. ලක්ෂ 260ක් එන්නත් අවශ්‍ය රටකට තවම ලැබිලා තියෙන්නේ එන්නත් ලක්ෂ 12යි. එතකොට දැන් මේ කීර්තිමත් ඉතිහාසය වෙනස් වෙලා 99.9%කට තිබුණ එන්නත්කරණය 10%කට 15%කට වැටිලා තියෙනවා. මේක ඛේදනීය තත්ත්වයක්. මේ තත්ත්වයත් එක්ක ලෝක සෞඛ්‍ය සංවිධානයේ අපි ගැන තිබෙන පිළිගැනීම අහෝසිවෙලා යනවා.

*දෙදරීම් පටන් අරං*

මේ වෙනකොට ආණ්ඩුවේ ඉරිතැලීම් පටන් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම මේ රජය බිහිකිරීමට විශාල කාර්යභාරයක් කළ, අපේ රජය තුළ දී මේ ජනාධිපතිවරයා ආරක්ෂා කරපු, මම අධිකරණ ඇමතිකමේ ඉන්නකම් ගෝඨාභයව අත්අඩංගුවට ගන්නට ඉඩ දෙන්නේ නෑ කියපු, විජේදාස රාජපක්ෂම අද ගෝඨාභය රාජපක්ෂට විරුද්ධව කතා කරනවා. ගෝඨාභය රාජපක්ෂ පඹයෙක් ය කියන මට්ටමට අද ඇවිත් තිබෙනවා. එතුමා කියනවා ජනාධිපති පඹයෙක්, බැසිල් රාජපක්ෂ කියන්නේ ටුවෙන්ටි ප්‍රශන්ට්, බැසිල් රාජපක්ෂ කියන්නේ පල් හොරෙක් කියලා. එතුමා පහුගිය දවසක මාධ්‍ය සාකච්ඡාවක් තියමින් මුලු රටටම ප්‍රකාශ කළා මේ ටික. මේ රජයට ඉස්සරහට යන්න බැහැ, මේ රජයට දැක්මක් නැහැ, අවුරුදු දෙකකින් මේ රජය කඩාගෙන වැටෙනවා, කියලා මහා ප්‍රකාශයක් ඔහු නිකුත් කළා. මේ ප්‍රකාශය නිකුත් කළාට පස්සේ මේකෙන් කැළඹුන ජනාධිපතිවරයා, මුරුත්තෙට්ටුවේ ආනන්ද හාමුදුරුවන්ට කතාකරලා උන්වහන්සේටත් දොස් කියලා, ඊට පස්සේ විජේදාස රාජපක්ෂ මහත්තයාටත් දොස් කියලා තියෙනවා. එතකොට ජනාධිපතිවරයා තමන්ට කතාකරලා දොස් කියපු එක ගැන මාධ්‍යට කියන විජේදාස රාජපක්ෂ මහත්තයා කියනවා ඔහුත් ජනාධිපති තමන්ට කතාකරපු භාෂාවෙන්ම කතා කළා කියලා.

විජේදාස රාජපක්ෂ එක්ක අපිට ප්‍රශ්න රාශියක් තිබෙනවා, මම එක්ක තමයි ඔහු ගොඩක් ගැටුණේ, මගේ මන්ත්‍රී ධුරය අහෝසිකරන්න උසාවි ගියේ ඔහු, පහුගිය කාලේ ඇවන්ගාර්ඩ් එකත් එක්ක සම්බන්ධ වෙලා ආණ්ඩුව ඇතුලේ ඉඳිද්දී පවා අපි එක්ක විශාල ගැටුම් ඔහුට තිබුණා. මේ සේරම තිබුණත් මම මේක කියන්න ඕනෑ, දැන් අපි

දන්නවා මේ රටේ එක මිනිහෙක් හරි ඉන්නවා ජනාධිපතිට ඇඟිල්ල දික්කරලා පඹයෙක් කියලා කියන්න. ආණ්ඩුව ඇතුලෙම මන්ත්‍රීවරයෙක් විදිහට ඉඳිමින් තමන්ගේ ආණ්ඩුවේ ලොකුම වැඩකාරයා යැයි කියන බැසිල් රාජපක්ෂ පල් හොරෙක්, මිස්ටර් 20% කියලා කියන්න තරම් ඔහුට කොන්දක් තිබුණා. ඒ විතරක් නෙවෙයි ජනාධිපති කතාකරලා බැන්නාම ඒ බාසාවෙන්ම ජනාධිපතිට අමතන්න ඔහුට කොන්දක් තිබුණා, අපි ඒ ගැන සතුටු වෙනවා.

## *රටවල් දෙකයි නීති දෙකයි*

ඊළඟට දැන් එනවා වරාය නගරය, මේ අය තමයි හැමදාම බලය බෙදීමට විරුද්ධව කතා කළේ. පළාත් සභා ගේන්න දෙන්නේ නැහැ කියලා කියන්නෙත් මෙයාලා තමයි. මේ ගොල්ලෝ ෆෙඩරල් කියන නමටත් බයවුණ කට්ටිය. හැබැයි ඔන්න දැන් වරාය නගරයට ෆෙඩරල්වලටත් එහාට ගිහිං බලය දෙන්නයි හදන්නේ. මේ බලය කාටද මේ දෙන්නේ, මේ දෙන්නේ චීනයට. මේ පෝට්සිටී පනත මගින් මෙරටේ අනපනත් 21කක් අහෝසි කරනවා. ඒ එකක්වත් චීනයට බලපාන්නේ නැහැ. ඇත්තටම මේක වෙනමම ඊළමක් වෙනවා එදා යහපාලන රජයක් ආවේ නැත්තං. රාජපක්ෂලා මේ ඉඩම්වල තනිකර සින්නක්කර අයිතිය තමයි චීනයට දුන්නේ. ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම අයින්කරලා ඒක බදු ක්‍රමයක් බවට හැරෙව්වේ අපේ යහපාලන ආණ්ඩුව. දැන් මේක බදු ක්‍රමයට ඔවුන්ට දීලා මේකේ මුලු මහත් පරිපාලනයම ඔවුන්ට දෙනවා. මේකේ පත් කරන්නේ එක කොමිසමක්, කවුද පත් කරන්නේ? තනි මතයට ජනාධිපති. ඒ පත් කිරීමේදී පත්වෙන පුද්ගලයින් ස්වදේශිකයො වෙන්න ඕනී නැහැ. ඕනී නම් චීන සමාග මේම අය පත් කරන්න පුලුවන්. ඒකේ අධ්‍යක්ෂ ජනරාල් ඕනෑ නම් විදේශිකයෙක් වෙන්න පුලුවන්. ඔවුන්ගේ පඩිනඩි ගෙවන්නේ කවුද? චීන සමාගම. එතකොට ජනාධිපති පත්කරනවා ඔවුන්ගේ පඩිනඩි චීනය ගෙවනවා. එතකොට ඔවුන් චීන සමාගම වෙනුවෙන් වැඩ කරන්නේ. මෙතන මේ ක්‍රියාත්මක කරන්න හදන්නේ තනිකරම වෙනම නීතියක්. ආවේ එක රටයි එක නීතියයි කියලා දැන් එක රටයි නීති දෙකයි ද? එහෙමත් නැත්තං රටවල් දෙකයි නීති දෙකයි ද? අපි දන්නේ නෑ.

එදා දෙමළ ඊළමට විරුද්ධව තමයි කතා කළේ, අද දෙමළ ඊළමක් නෑ අද තියෙන්නේ චීන ඊළමක්. අපිත් එක්ක අවුරුදු 2000ක් එකට හිටිය මිනිස්සුන්ට ඊළමක් දෙන්න බෑ කියපු අය අද චීන සමාගමකට ඒ ඊළම දෙනවා. එතකොට කෝ අපේ දේශප්‍රේමය. කෝ ඊළාම් විරෝධී ගරුතර මහා සංඝරත්නය. අපේ රටේ මිනිහෙක් ගිහිං බඩුවක් ගත්තොත් බදු ගෙවලා එන්න ඕනී, විදේශිකයෙක් බඩුව ගත්තාම නිකං යන්න පුලුවන්, ගෙවන්න අවශ්‍ය නෑ. ලෝකයේ තියෙන ඕනෑම විදේශීය මුදල් ඒකකයකින් බඩු ගන්න පුලුවන් හැබැයි ලංකාවේ රුපියල්වලින් බෑ. එතකොට මොකද්ද මේක..

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/UnDpHjq9k-g

https://www.aithiya.lk/rajitha-senaratne-samagi-jana-balawegaya-political-situation/

# 86. වතු ආර්ථිකය කඩා වැටිලා නෑ ඒක බොරුවක්

## චතුර සමරසිංහ ලේකම්, වතු සේවා සංගමය

***කාලෙකදි ලංකාව ලෝකයම අඳුරගත්තේ වතු ආර්ථිකයත් එක්ක. ඒ කාලේදී ලංකාවේ අපනයන ආදායමෙන් විශාල කොටසක් ලැබුණේ වතු ආර්ථිකයෙන්. වතු ආර්ථිකයේ කඩා වැටීම ගත්තොත් ඇත්තටම වතුවලට මොකද වෙලා තියෙන්නේ?***



චතුර සමරසිංහ

අපි 1948 බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබන යුගය වන විට ලංකාවේ සමස්ත අපනයන ආදායමෙන් 90% ක් ලබා දුන්නේ වතු ක්ෂේත්‍රය. නිදහසෙන් වසර ගණනකට පස්සේ අද වුනත් මේ තරම් හැල හැප්පීම් මැද පවා අපේ රටේ සමස්ත අපනයන අදායමේ විශාල පංගුකරුවෙක් වෙන්න වැවිලි කර්මාන්ත අංශයට හැකිවෙලා තියෙනවා. අදත් සමස්ත අපනයන අදායමෙන් 15% ක් වගේ ප්‍රමාණයකට වැවිලි ක්ෂේත්‍රය හිමිකම කියනවා. ආර්ථිකයේ ප්‍රසාරණය වන විවිධ ක්ෂේත්‍ර පවතින තත්ත්වයක් යටතේ වුණත්, විශේෂයෙන් කෝවිඩ් වසංගතය එක්ක ලෝකය පුරා ඇති වෙන විවිධ ආර්ථික ප්‍රවණතා එක්ක මෑත කාලයේ රටේ ආර්ථිකයට එක්වූ බොහෝ ක්ෂේත්‍රවල කඩා වැටීමක් අපි දකිනවා. නමුත් වතුකරයේ වසර 150ක් විතර ඉතිහාසය තුළ මේ රටේ ආර්ථිකයේ කොඳුනාරටිය බවට පත්වෙලා මේ කාලය පුරාවට ආර්ථිකයේ තිරසාර බව රඳවා ගන්න වැවිලි අංශයට හැකි වෙලා තියෙනවා. ඒ නිසා තවදුරටත් ලංකාවේ අනාගතය ගැන අපි කල්පනා කරනවා නම් ආර්ථිකයේ තිරසාර බව තව දුරටත් නොනැසී පවත්වාගෙන යන්න ලංකාවේ වැවිලි කර්මාන්තයට හැකියාව තියෙනවා.

***ඉතාම සමෘද්ධිමත් විදිහට තිබුණු වතු දැන් කඩා වැටිලා. එතකොට මේ තත්ත්වය වතු සම්බන්ධව වැඩකරන වෘත්තීය සමිතියක් විදිහට අඳුරගෙන තියෙනවද? විශේෂයෙන් වතු තිබුනොත් තමයි වෘත්තීය සමිතිවලටත් පැවැත්මක් තියෙන්නේ. මේ වතු ආරක්ෂා කර ගැනීමට මොකද්ද තියෙන වැඩ පිළිවෙල?***

ඔව්. ඉතාම පැහැදිලිව ලංකාවේ වතු අද මේ පවතින තත්ත්වයට එන්න බලපාපු ප්‍රධාන කරුණු කිහිපයක් තියෙනවා. ඇත්ත වශයෙන්ම මේ රටේ මහජනයා, මාධ්‍ය ඇතුළු සියලු දෙනා ඉන්නේ - විශේෂයෙන් තේ කර්මාන්තය හා රබර් කර්මාන්තය එක්ක - මේ රටේ වැවිලි ක්ෂේත්‍රය පාඩු ලබන නඩත්තු කල නොහැකි ආර්ථිකයේ නොවැදගත් අංශයක්ය කියන අදහසක. ඇත්තටම ඒක වැරදියි. අදත් ලංකාවේ වැවිලි ආර්ථිකය හරහා ජනිත වන මුදල් ප්‍රමාණය ගත්තොත් අපි 2019 වසරේ අවසන් තත්ත්වය ගත්තත් රු. බිලියන 250ක් විතර අපනයන අදායමක් තේ, රබර්,පොල් ආශ්‍රිතව උපයනවා. මේ මුදල මේ රටේ ආර්ථිකයේ විශාල පංගුවක්.

අපි දන්නවා 1956 බණ්ඩාරනායක රජය යටතේ මේ රටේ බ්‍රිතාන්‍ය අත්පත් කරගත් බොහෝ දේවල් ජනසතු වුණා. නමුත් වතු ක්ෂේත්‍රයේ ඉතා කුඩා කොටසක් තමයි ජනසතු වෙලා තිබුණෙ ඒ වෙද්දි. ඉතින් 1970 මැතිවරණය වෙනකොට විශාල හඬක් විශේෂයෙන්ම වතු ක්ෂේත්‍රය රජයට පවරා ගන්න කියලා තිබුණා. ජනසතු කරන්න කියන හඬ අපේ සංගමය, නායකයෝ විසින් මතු කළා. ඒ විදිහට වතු ජනසතු වෙනවා. ජනසතු වෙලා මුල් දශකය වගේ කාලය තුළ ලාභ සහිත ඉතාම හොඳ වතු සංස්කෘතියක් ඇති වෙනවා. මෙරටින් විදේශයන් වෙත ඇදී ගිය ධනය ප්‍රති ආයෝජනය කරන්න, රටේ සම්පතක් ලෙස භාවිතා කරන්න හැකියාව ලැබුණා ඒ මුල් අවධියේ.

එතකොට 1977 ඇති වුණ නව ආර්ථික ප්‍රවණතා එක්ක මේ රටේ දේශපාලන සංස්කෘතිය, වතු සංස්කෘතිය, වැනි අනාදිමත් කාලයක් තිස්සේ පැවති බොහෝ දේවල් අහෝසි වෙලා නව සංස්කෘතියක් මේ රටේ ඇති වුණා. ඒ සංස්කෘතිය ජරා-ජීර්ණ වෙලා අද අපිට පේනවා අන්ත දූෂිත දේශපාලන සංස්කෘතියක්. එතකොට මේ ජනසතු දේපළ පාලනයට දේශපාලන හෙංචයියන් පත් වෙනවා. මේ අවර ගණයේ දේශපාලන සංස්කෘතිය රටේ අතිකුත් පොදු දේපල විනාශ

කල ආකාරයට වතු ක්ෂේත්‍රයටත් ඇතුළු වෙනවා. ඇත්තටම වතු පිළිබඳ අවබෝධය, කළමනාකරණ හැකියාව නැති මේ ගැන කිසිවක් නොදන්නා පාලකයෝ දේශපාලන හෙංචයියන් මේවායේ මුල් පුටුවලට පත් වෙනවා. තීන්දු තීරණ ගන්න ප්‍රතිපත්ති සම්පාදකයන් බවට පත් වෙන්නේ ඔවුන්. එතකොට ක්‍රමිකව 1990 ආසන්නය වන විට වතු අංශය විශාල අලාභ ලබන තත්වයකට පත් වෙනවා. ඒ හරහා මහා භාණ්ඩාගාරය වතු ක්ෂේත්‍රයේ වැටුප් ගෙවන්න, මුදල් ගෙවන තත්වයට පත් වෙනවා.

1993න් පස්සේ නැවත මේ වතු පුද්ගලික අංශයට පැවරෙනවා. එසේ පවරලා අද අවුරුදු විසි ගණනක් ගීහින් ආපසු හැරිලා බලද්දී විශාල කඩා වැටීමක් තියෙනවා. එදා වතු අංශයේ ලක්ෂ 5ක් පමණ රැකියාවල නිරත වෙලා හිටියා. අද එය ලක්ෂ එකහමාරකට වඩා අඩු වෙලා. අනික් පැත්තෙන් නිෂ්පාදනයේ ඵලදායිතාවය විශාල පසුබෑමකට ලක් වෙලා තියෙනවා. 2013 අය-වැය විවාදයේදී මුදල් ඇමතිවරයා කියනවා පවරා දුන්න වතුවල අක්කර 40,000 ක් මුඩු බිම් බවට පත්වෙලා තියෙනවා කියලා. එතකොට අපිට පේනවා කර්මාන්තශාලා සිය ගණන් වැසිලා ගිහින්. නිල නිවාස සිය ගණන් බිම්බත් වෙලා තියෙනවා. සේවකයන්ගේ රැකියා අවස්ථා අහිමි වෙලා තියෙනවා. නිෂ්පාදනය දිගින් දිගට පහත වැටිලා. ඒ වගේම බ්‍රිතාන්‍යය යුගයේ ගෙනාපු තාක්ෂණය ඇරෙන්න වතු අංශයේ මහලොකු තාක්ෂණික දියුණුවක්, පරිවර්තනයක් ඇති වෙලා නැහැ. ඒ වගේම එයින් යැපුණු මිනිස්සු විශේෂයෙන් අපි වතු නිලධාරීන්, කාර්යමණ්ඩලය හැටියට සාපේක්ෂව යමක් අපි භුක්ති වින්දා වුණත් අපිට පේනවා වතු ක්ෂේත්‍රයේ ඉන්න විශාලම කොටස වන වතු කම්කරුවන්ගේ ජීවන තත්ත්වය. ලංකාවේ අනිකුත් ප්‍රදේශවල තියෙන ජීවන තත්ත්වය විශේෂයෙන් මන්දපෝෂණය වගේ සැලකුවහොත් එම ප්‍රතිශතය දෙගුණයකින් වැඩියි වතුකරයේ. දරිද්‍රතාවය ලංකාවේ සෙසු ප්‍රදේශවලට වඩා දෙගුණයකින් ඉහලයි. ඒ වගේම සමාජ-ආර්ථික-සංස්කෘතික වශයෙන් පවා වතු ක්ෂේත්‍රය බිඳ වැටිලා තියෙනවා.

***වතු කම්කරුවන්ට ජීවත් වෙන්න අවමය දෙන්න බැරි තරමට වතු අංශය කඩා වැටිලා. ඒක සත්‍යය ද?***

වතු සේවා සංගමය හැටියට අපි කියන්නේ එය සත්‍යය නෙවෙයි.

මේ රටේ සැඟවුන දේ බොහොමයි. මේ තේ කර්මාන්තය පාඩු ලබන කර්මාන්තයක් නෙවෙයි. අපි පැහැදිලිව කියනවා එය ලාභ ලබනවා. අපි ඒක කරුණු සහිතව ඔප්පු කරන්න සූදානම්. විශේෂයෙන් තේ කර්මාන්තය පාඩුයි කියලා කියන මිත්‍යාව තුළ හංගන මහා කාරණයක් තියෙනවා. ඒ තමයි හැම විටම මේ පාඩුව ගණනය කරලා පෙන්නන්නේ අපිට මේ තේ නිෂ්පාදනය සඳහා යන වියදමත් කොළඹ තේ වෙන්දේසියේදී තේ විකුණන මිලත් අතර වෙනස පෙන්වලා. ඇත්තටම මේක බොරුවක්. මෙතන තියෙන්නේ විශාල වෙළඳ මාෆියාවක් තියෙනවා. 2019 දත්ත රැගෙන බැලුවොත් රු. 475ක් තමයි මහා බැංකු වාර්තාවේ සඳහන් නිෂ්පාදන වියදම තේ කිලෝවක. එතකොට කොළඹ තේ වෙන්දේසියේ රු. 475ට නිපදවන තේ කිලෝව මිල වෙන්නේ රු. 528ක් වගේ. එයින් පේනවා රු. 50-55 වගේ ඉතා සුළු ලාභයක් තමයි තියෙන්නේ. එතකොට මේක පෙන්වලා තමයි මේ කතාව කියන්නේ. නමුත් 2019 මහා බැංකු වාර්තාවට අනුවම රු. 820ක් වෙනවා තේ කිලෝවක අපනයන මිල. ඒ කියන්නේ ලංකාවෙන් තේ කිලෝ එකක් එළියට යන මිල. ඒ මිලෙන් නිෂ්පාදන වියදම අඩු කළොත් එන අගය 50%කට ආසන්නයි. එවැනි ලාභයක් උපයනවා. එතකොට කොළඹ තේ වෙන්දේසියේ මිල සමඟ සැසඳුවත් 40%කට වැඩි ලාභ ප්‍රතිශතයක් එක්ක තමයි මෙරටින් තේ අපනයනය කරන්නෙ. ඇයි නිෂ්පාදන සමාගම් තමන්ට කොළඹ තේ වෙන්දේසියෙන් ලැබෙන මිලත් අතරමැදියන් හරහා තේ මිලට ගන්න බලපත්‍රලාභී තේ අපනයන සමාගම් අපනයනය කරන මිලත් අතර තියෙන මේ පරතරය පිළිබඳ කතා නොකරන්නේ කියලා. ඔවුන් කිසිම සාකච්ඡාවකට නොයන්නෙ ඇයි? ඒ පිළිබඳව හඬක් නගන්නෙ, අරගලයක් කරන්නෙ නැත්තෙ ඇයි? ඒකට විශේෂ හේතුවක් තියෙනවා. ඒ හේතුව තමයි ප්‍රාදේශීය වැවිලි සමාගම්වල මව් සමාගමත්, බලපත්‍රලාභී අපනයන සමාගම්වල මව් සමාගමත් බොහෝවිට එකක් වීම. එහෙම බැලුවාම එකම සමාග මකට තමයි අවශානයේ මේ ලාභය ගිහිං තියෙන්නේ. මේක තමයි මේ පාඩු කතාවේ ඇත්තම ඇත්ත. එනිසා අපි වහාම මේ පංගුවෙන් සාධාරණ කොටසක් මේ ක්ෂේත්‍රයේ පහළින්ම ඉන්න ප්‍රජාවට යන ක්‍රමයක් සෑදිය යුතුයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/EJT3XSnwAm8

https://www.aithiya.lk/plantation-economy-of-sri-lanka-tea-estate-workers-jedb/

# 87. රෑ 12න් පස්සේ තමයි වැඩිපුර ඔන්ලයින් පන්ති තියෙන්නේ

## ගුරු උපදේශිකා රේණුකා පද්මිණී



රේණුකා පද්මිණී

***නයිට් ටයිම් ඩේටා සාමාන්‍යයෙන් හම්බෙන්නේ රාත්‍රි 12 සිට උදෑසන 8 දක්වා කාලය තුළයි. ඒ වගේම මේ වෙලාවට බෝනස් ඩේටා ලැබෙනවා. මේ වන විට අපිට අහන්න ලැබෙනවා, මෙම පැකේජ්වලට තමයි ළමයි හුරු වෙලා තියෙන්නෙ ඔන්ලයින් අධ්‍යාපනයේදී, ඒක කොයිතරම් දුරට සත්‍යයක්ද? රෑ 12ට ටියුශන් පන්තියකට සම්බන්ධ වුණාම මේවා අවසන් වෙද්දි පාන්දර 3 4 වෙනවා. ඔබ මේ ගැන කුමක්ද සිතන්නේ?***

මගේ අත්දැකීම අනුව මම සිතන්නේ මෙහෙමයි. දරුවන්ගේ පැත්තෙනුත් දරුවන්ට ප්‍රශ්ණ තිබෙනවා. සූම් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වෙද්දි ඩේටා විශාල ප්‍රමාණයෙන් වැය වෙනවා. එවිට දරුවන් හා ගුරුවරුන් යන දෙගොල්ලන්ටම මෙම ගැටලුව තියෙනවා. ඩේටා පැකේජ්වල නයිට් ටයිම් ඩේටා ඉතුරු වෙන හින්දා රාත්‍රී කාලයේ පන්ති පවත්වනවා. ඒක සත්‍යක්. මේ ආකාරයට උපකාරක පන්තිවලට සම්බන්ධ වන මගේ ඥාති දරුවොත් ඉන්නවා. මෙහි දෙපැත්තක් මම දකිනවා. අඩු ආදයම්ලාභී පවුල්වල දරුවන්ට මෙම ලැබෙන ෆ්‍රී ඩේටාවලින් ප්‍රයෝජනයක් ගත හැකි නම් එය වටිනවා. බොහෝ විට දරුවෝ රාත්‍රියේ සම්බන්ධ වන්නේ ඔන්ලයින් ටියුශන් පන්ති සඳහා. ඉන් පසු උදෑසන සිට දහවල් කාලය දක්වා පාසලෙන් පවත්වනු ලබන පන්තිවලට සම්බන්ධ වෙනවා. එතකොට දරුවෝ කියන දේවල් සහ ගුරුවරු කියන දේවල් එක්ක මට මේක සාර්ථක ක්‍රමයක් කියලා පිළිගන්න බැහැ.

දරුවන්ට පාඩම් කරන්න පුලුවන් ධාරිතාවයක් තියනවා. දවස පුරාම ඔවුන් මේවා කරනවා කියන්නේ ඒක ඔවුන්ට ලොකු පීඩනයක්. මම දුටුවා මේ මෑතක වෛද්‍යවරයෙක් කියනවා ළමයි මේ ආකාරයෙන් පරිඝනක හා ජංගම දුරකථන භාවිතය වැඩිවීම නිසා දෘෂ්ටි ආබාධවලට ලක්වෙනවා කියලා. පාඩම් කටයුතු සහ මේ ආකාරයට ඔන්ලයින් පන්තිවලට අඛණ්ඩව සම්බන්ධ වීම දරුවන්ට අධික පීඩනයක් ගෙනදෙනවා. රෑ එළි වෙනකන් ඉගැන්වීම් කරන්න පුළුවන්. දරුවනුත් සහභාගී වෙයි කාගේ හරි කටේ බලේට. නමුත් මේ ක්‍රමය සාර්ථකයි කියලා කියන්න අමාරුයි. හේතුව තමයි දැන් මට මෑතකාලීනව, මගේ අත්දැකීමක් කියන්න පුළුවන්. මම මේ පිළිබඳව සොයා බැලුවා. එතකොට මට හිතවත් ගුරුවරුයෙක් කියපු සිද්ධියක්. එක දරුවෙක් දිවා - රාත්‍රි සීමා රහිතව ඔන්ලයින් පන්තිවලට සම්බන්ධ වෙලා. එක් දිනක් එම දරුවා ෆිට් එක හැදිලා හොඳටම අසනීප වෙලා. ඉන්පසු ඒ දරුවාව රෝහල් ගතකරලා තමයි ගොඩ අරන් තියෙන්නේ.

මෙම ඔන්ලයින් ක්‍රමයට ඉගැන්වීමේ හොඳ පැත්තකුත් තියෙනවා. රටේ පවතින තත්ත්වය තුළ මෙම ක්‍රමය හොඳයි. නමුත් අසීමාන්තිකව පාඩම් කටයුතු සිදු කිරීම වෙනම පීඩනයක් වෙලා තියනවා දරුවන්ට. මෙයට නිසි ක්‍රමවේදයක් හැදෙන්න අවශ්‍යයි. දැන් ඔන්ලයින් අධ්‍යාපන ක්‍රමවේදය ඇතුලේ තව ගොඩාක් පැති තියනවා. ඩේටා, පරිඝනක හා දුරකථන තියන දරුවෝ සහා ගුරුවරු පහසුකම් එක්ක මේ වැඩේ හොඳටම කරගෙන යනවා. නමුත් ඒවා නොමැති දරුවන්, දෙමව්පියන් සහ ගුරුවරුන් පවා ඉන්නවා අපේ රටේ. එතකොට දැන් එයාලගේ පැත්තෙන් සෑහෙන අඩුවක් තියනවා. මම දැක්කා එක ආර්ටිකල්, එකක් විදුහල්පතිවරයෙක් කියල තියනවා එයාලට මේ විදිහට ඔන්ලයින් අධ්‍යාපනය කරගෙන යන්න කිසිම පහසුකමක් නැහැ කියලා. අපි මේ විදියට කරාට, ඔන්ලයින් අධ්‍යාපනය ඔස්සේ දරුවෙකුට පාඩමක් කරන්න එවැනි පහසුකම් කිසිම දෙයක් නැති පිරිසක් ඉන්නවා. එවැනි විශාල ගැටලු ප්‍රමාණයක් තියෙනවා. ඔන්ලයින් අධ්‍යාපනය සාර්ථකයි කියලා කතාබහ කලාට අපි නොදන්න පැතිවල විශේෂ ගැටලු තියෙනවා. මගේ අත්දැකීම් අනුව අපි උගන්වන අවස්ථාවේ දරුවන්ගේ ප්‍රතිචාර ගැනීම හරිම අසාර්ථකයි. ඒක අපිට නිවැරදියි කියන්න බැහැ. ඩේටා ප්‍රශ්න නිසා ගොඩක් දරුවෝ වීඩියෝ අක්‍රීය කරනවා. හඬත් (audio) අක්‍රීය කරනවා බොහෝ වෙලාවට. බොහෝ ගුරුවරු

කියන දෙයක් තමයි අපි දන්නේ නැහැ දරුවෝ පාඩමේ ඉන්නවාද, නැද්ද කියලා. එතකොට පන්ති කාමරයක උගන්වනවා වගේ මේ දරුවන්ගේ සක්‍රීය දායකත්වය ඇත්තටම ලැබෙනවද කියලා ප්‍රශ්නයක්. ඒ කියන්නේ එක පන්ති කාමරයක ළමයින් 45ක් පමණ ඉන්නවනම් පාසල් ගුරුවරුන්ගේ ඔන්ලයින් පාඩම්වලදී පවා පැමිණෙන්නෙ ළමයි 10ක් 20ක්. එතකොට අනිත් ළමයින්ට මොකද වෙන්නේ? ඒක විශාල ගැටලුවක්.

***සාමාන්‍ය පෙළ විභාගය පැවැත්වූවා, එතකොට දරුවන්ට අවුරුද්දක පමණ කාලයක් අධ්‍යාපන කටයුතු අඩාල වුණා. ඒ කාලය පුරා සිදුවුණේ ඔන්ලයින් අධ්‍යාපන ක්‍රමය. ග්‍රාමීය ප්‍රදේශවල ළමයින්ට මේ ඔන්ලයින් පහසුකම් නැහැ. කොළඹ වුණත් එවැනි ළමයි ඉන්නවා. අසමාන අධ්‍යාපනයක් තුළින් තමයි ළමයි සමාන ප්‍රශ්න පත්‍රයකට මුහුණ දුන්නේ. මේක අසාධාරණ තත්ත්වයක් නේද?***

ඇත්තටම එවැනි ගැටලුවක් තියෙනවා. දැන් අපි මෑත කාලීනව දකිනවා, මං හිතන්නේ මේක සාකච්ඡාවට ලක් වෙලත් තියෙනවා, අපේ අධ්‍යාපන ආයතන සහ නිලධාරීන් අතර. ඇත්තටම ගුරුවරු දරුවන් සමග අදහස් හුවමාරු කර ගනිද්දි කියන දේ තමයි, ඔන්ලයින් මාර්ගයෙන් ඉගෙන ගන්න පුළුවන් ළමයි ඇවිල්ලා කිසියම් මට්ටමකට මේක කරගන්නවා. එහෙම බැරි දරුවොත් ඇවිත් එක සමානව එකම ප්‍රශ්න පත්‍රයකට මුහුණ දෙනවා. වාර විභාග ලකුණු පවා මීට පෙර වසරවල සංසන්දනය කරලා බැලුවොත් ඇතැම් දුෂ්කර පැතිවල දරුවන්ගේ මේ වසරේ ලකුණු අඩුයි. දුර්වල මට්ටමක ඉන්නවා දරුවෝ. මොකද ඒ අධ්‍යාපනය සමහර පැතිවල හරියට කෙරිලා නැහැ. ඒක ඉතාම පැහැදිලිව දකින්න පුළුවන්. සමහර වෙලාවට අවුරුද්දක් ඉගැන්නුවා කියල කිව්වට ග්‍රාමීයව ඉතා දුෂ්කර ප්‍රදේශවල කිසිම අවස්ථාවක් නැති දරුවන්ට අවුරුද්දක් ඇතුළත කිසිඳු පාඩමක් සිදුකෙරිලා නැහැ. අදාළ පාඩම මොකක්ද කියල දන්නෙ නැති දරුවො පවා මේ සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දුන්නා. ඒක අසාධාරණයක් තමයි.

***අනික් පැත්තෙන් ගුරුවරුන්ට මොනවද තියෙන ගැටළු? දැන් දිගු කාලයක් මේ ඔන්ලයින් ඉගැන්වීම කරගෙන යනවා. රජය ඩේටා සඳහා***

***කිසියම් සහනයක් ලබා දෙනවද? ඒ වගේම තාක්ෂණය සඳහා ප්‍රවේශය ලබා ගන්න ගුරුවරුන්ට කොයිතරම් හැකියාවක් තියෙනවද?***

ඉතාම සාර්ථකව මේ තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතය කරලා, හොඳින් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේද භාවිතා කරමින් වැඩ කරන ගුරුවරු ඉන්නවා. මං ඒ අයව ඉතාම අගය කරනවා. ඒත් ඒ වගේම තව පැත්තකින් මම අත්දකිනවා සමහර ගුරුවරුන්ට ඒ දැනුම වෙනම ලබාදිය යුතුයි. මෙම දැනුම ලැබිය යුතුයි කියලා සමහරවිට ඒ අයම කියනවා. මොකද මෙච්චර කාලෙකට ඒ ක්‍රමවේද විතරක්ම භාවිතා කරලා අධ්‍යාපනය සිදුවුණේ නැහැ නේ. මේකෙදි වෙනස් වෙන්න සිද්ධවෙලා තියෙන්නෙ හැමෝටම. එතකොට දරුවන්ටත් එහෙමයි. දරුවන්ටත් විවිධ ගැටලු තියෙනවා. මට මෑතකදී එක ගුරුතුමියක් කියනවා. ඇය වැඩ කරන්නේ ඉතාම දුෂ්කර දරිද්‍රතාවෙන් පෙළෙන සිසුන් සිටින පාසලක. එතුමිය කියනවා ඔන්ලයින් පාඩමකට දරුවෝ ගන්න ගියාට පස්සේ වෙනම දුරකථන ඇමතුම් දීලා ඒ දරුවන් ගෙන්න ගන්න ඕනේ කියලා. මොකද ළමයි හතළිහක් ඉන්නවනම් දහයක්වත් පන්තියට පැමිණෙන්නේ නැහැ. ඉන්පස්සෙ පාඩමේ අවධානය තියාගන්න ඇය වෙනම මහන්සියක් වෙන්න ඕන. සාමාන්‍ය පන්ති කාමරයක වගේ නෙමෙයි. දරුවන්ගේ අවධානය තියා ගැනීම අපහසුයි. තාක්ෂණික ගැටලු ඇතිවෙනවා. එවැනි ප්‍රායෝගික ගැටලු විශාල ප්‍රමාණයකට ගුරුවරුන් මුහුණ දෙනවා.

අහන්න ලැබෙන ප්‍රධානම ගැටලුවක් තමයි මේ ඔන්ලයින් පන්තිවලට ළමයි සහභාගි වෙන්නේ නැහැ කියනඑක. ගුරුවරු අවුරුද්දක් පුරා ඉගැන්නුවට සමහර දරුවන් ඇහැටවත් දැකල නැහැ. ඒ දරුවෝ පන්තිවලට සහභාගි වෙලා නැහැ. සමහර දරුවන්ගේ අම්මට තාත්තට විතරයි දුරකථනයක් තියෙන්නේ. ඒ අය රැකියාවට යනවා. ගිහින් හවස පැමිණුනාට පස්සේ තමයි ළමයට ඔන්ලයින් පන්තියට එන්න පුළුවන් වෙන්නේ. එවැනි ගැටලු ගොඩක් තියෙනවා. අනෙක් පැත්තෙන් ප්‍රායෝගික විෂයන්, සෞන්දර්ය විෂයයන් වැනි දේවල් ඔන්ලයින් මාර්ග යෙන් ඉගැන්වීම අපහසුයි, ගුරුවරු ඒකට විශාල උත්සාහයන් යෙදුවත් ඒක තමයි ඇත්ත.

**ඔබ පාසල් ගුරු උපදේශිකාවක්. ගුරු උපදේශිකාවකගේ කාර්යභාරය කුමක්ද මේ කාලේ...**

ඇත්තටම මම මේක කිවයුතුමයි. පාසල් ක්‍රියාකාරීත්වය පාසල් භූමිය තුළ අඩු වෙලා තිබුණත්, ඇතැම් පාසල් මාර්ගගතව සතියේ දවස් පහම සාමාන්‍ය පරිදි පවත්වමින් යනවා. ඇතැම් පාසල් සියලුම සිසුන් සම්බන්ධ කරගෙන මාර්ගගතව දවස් පහම පවත්වාගෙන යනවා. ඉතාම සාර්ථක විදිහට. අපි ඒවා අධීක්ෂණය කරනවා. අපිට කරනවනම් මේ කාලය තුළ බොහෝ වැඩ තියෙනවා. එකක් තමයි අපි මාර්ගගතව මේ අයගේ වෙබ් අඩවිවලට ගිහිල්ලා අධීක්ෂණය කරනවා කොහොමද ඒ ක්‍රියාවලිය වෙන්නේ, එහි තියෙන ගැටලු මොනවාද? ඒ ගැටලු විසඳන්න අපි මැදිහත් වෙන්නෙ කොහොමද? විදුහල්පතිතුමාට, ගුරුවරුන්ට, දෙමාපියන්ට දැනුවත් කරලා ඒවාට අපි මැදිහත් වෙලා, ගැටලුව දරුවෝ නොපැමිණීම නම් අපි ඒ සම්බන්ධව යෝජනා ඉදිරිපත් කරලා කටයුතු කරනවා. අපි හැම පාඩමකදීම මාර්ගගතව ගුරුවරුන් කරන වැඩ අධීක්ෂණය කළා. ඒ වගේම පෞද්ගලිකව ගත්තොත් මම සමහර පාසල්වලින් ඒ ගුරුවරියන් ආරාධනා කළා හෝ නැතුව ගිහින්, මට තාක්ෂණය භාවිතා කරන්න යම්කිසි හැකියාවක් තියෙනවා නම්, එයින් දරුවන් එක්ක වැඩ කටයුතු කරන්න උත්සාහ කළා. වැඩමුළු කළා. ඒ කරද්දි මතුවෙන ගැටලු මැඩ පවත්ව ගන්න උත්සාහ කළා. එයින් තමයි අපිට මේ ගැටලු නිසියාකාරව හඳුනා ගන්න හැකි වුණේ. එයින් පසුව අපි අධීක්ෂණ වාර්තා පිළියෙල කරලා යෝජනා සහ අදහස් ඉහළ නිලධාරීන් වෙත ඉදිරිපත් කරලා තියෙනවා. ඒ වගේම විභාග අධීක්ෂණය සිදුකළා. එහිදී මම දැකපු දෙයක්, එක පාසලක සිසුන් තුන්සිය ගණනක් අතරින් එකසිය ගණනක් විභාගයට පාසලට ඇවිත් පෙනී හිටියා. ඒ වගේම තවත් දරුවන් ඒ වෙලාව තුළම මාර්ගගතව විභාගයට පෙනී සිටියා. ඒ තාක්ෂණය යම් දියුණු මට්ටමක තියෙන පාසල්වල. ඒවා දකින විට තමයි අපිට හිතුනේ එසේ කරන්න බැරි පාසල්වල දරුවන්ට අසාධාරණයක් සිදුවෙනවා නේද? ඒ අයටත් මේ දේ ලබා දෙන්න කුමක් හෝ මැදිහත්වීමක් සිදු කළ යුතුයි කියන යෝජනාව අපි සිදු කළේ මේ අධීක්ෂණයෙදි දැකපු දේවල් හරහා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/bne-dxEV1rk

https://www.aithiya.lk/covid-situation-of-online-education-in-sri-lanka-school-teacher/

# 88. වරදක් කළත් සිතකින් නොවේ කියලා, මේ බදු වංචාවෙන් පැනලා යන්න හදන්න එපා

## පුබුදු ජයගොඩ - පෙරටුගාමී සමාජවාදී පක්ෂය



පුබුදු ජයගොඩ

ලංකාවේ බදු ප්‍රතිපත්තිය පිළිබඳව ඉතාම බරපතල ප්‍රශ්නයක් තියෙනවා. සාමාන්‍යයෙන් බදුවල ක්‍රම 2ක් තියෙනවනේ, ඍජු සහ වක්‍ර බදු කියල. දැන් ලෝකේ ගොඩක් රටවල්වල ඍජු බද්ද තමයි ලොකු බද්ද, ඒ කියන්නේ ඉහළ ආදායම් ලාභින්ගෙන් ආදායම් මත අයකරන බද්ද එහෙම නැත්නම් ප්‍රාග්ධනය මත අය කරන බද්ද. අනිත් එක වක්‍ර බද්ද. වක්‍ර බද්ද කියනනේ භාණ්ඩ හා සේවා මත අයකරන බද්ද. ඒක හුඟක්විට වැටුප මත බද්දක් විදිහට තමයි ක්‍රියා කරන්නේ. ලංකාවේ මේකේ ප්‍රතිශත තියෙන්නේ, ලංකාවේ බදු ආදායමෙන් 85%ක් භාණ්ඩ හා සේවා බද්ද, 15%ක් තියෙන්නේ ඍජු බද්ද එහෙම නැත්නම් ආදායම මත අයකරන බද්ද. එතකොට මේක අර දේශපාලන විද්‍යාවේ නිර්වචනත් අවුල් කරලා තියෙන්නේ. රාජ්‍ය ගැන නිර්වචන හැදෙද්දී තියෙන්නේ වැඩවසම් රාජ්‍ය කියන්නේ මොකද්ද අහුවම කියන්නේ රදලයන්ගේ බදු මගින් නඩත්තු වන රාජ්‍යයක්. ඊට පස්සේ ආසියාතික රාජ්‍ය යනු කුමක්ද කියලා ඇහුවම කියන්නේ යටත්වැසියාගේ බදු මගින් නඩත්තු වන රාජ්‍යය කියලා. ධනේශ්වර රාජ්‍ය කිව්වම සාමාන්‍යයෙන් පොත්වල ලියලා තියෙන්නේ ධනපතියන්ගේ බදු මුදල්වලින් නඩත්තු වන රාජ්‍ය කියලා. ඉතින් ලංකාව තාම දුවන්නේ යටත්වැසියාගේ බදුවලින්.
85%ක් වක්‍ර බද්ද.

පසුගිය කොවිඩ් වසංගත කාලෙදි බරපතල ප්‍රශ්නයක් ආවා බදු අය කිරීම සම්බන්ධයෙන්. ඒ ප්‍රශ්නෙදි ආණ්ඩුව කළේ ලොකු සමාගම්, ධන කුවේරයෝ සඳහා බදු අඩුකලා. විශේෂයෙන් බැලුවොත් අයවැය මගින් 50%කින් කපා හැරියා කොටස් වෙළඳපොළ ලියාපදිංචි සමාග ම්වල බද්ද. නමුත් ජනතාවගේ අත්‍යාවශ්‍ය සේවාවන් මත බද්ද, ඒවා දශමයක්වත් අඩුකරේ නෑ. ඇත්තටම ඒවා වැඩිකරා. 2021 ගත්තොත් 2020ටත් වඩා වැඩියි භාණ්ඩ හා සේවා හරහා අය කරන්න යන බද්ද. පොදුවේ භාණ්ඩ හා සේවා මත අයකරන බද්ද ලංකාවේ පවුල් සංඛ්‍යාවෙන් බෙදුවම සමාන්‍යයෙන් එක පවුලක් මාසෙකට රුපියල් 20000ක් වගේ ගෙවනවා වෙළඳපොළට ගිහිල්ලා ආණ්ඩුවට බදු විදිහට. ඇයි අපි ආණ්ඩුවට විසිදාහක් වගේ බදු ගෙවන්නේ කියන ප්‍රශ්නය එනවා.

### *සීනි බදුවලින් ගැහුවේ කොහොමද?*

ජනතාවට සහන දෙන්න කරන බදු සංශෝධනයන් වලිනුත් අවසානෙදි වෙලා තියෙන්නේ කවුරුහරි ධන කුවේරයෙක්, ලොකු පවුලක කෙනෙක් පෝසත්වෙලා ජනතාවට ආපහු සැරයක් පීඩාවම උරුම වෙන තත්වයක්. ඒකට හොඳම උදාහරණයක් තමයි සීනි ප්‍රශ්නය. සිනීවලදි වුණේ, 2020 ඔක්තොබර් 13 වැනිදා ගැසට් එකක් ගැහුවා සීනි කිලෝවක් සඳහා තිබුනු රුපියල් 50ක බද්ද සත 25ට අඩු කරලා. ඒ වෙනකොට ලංකාවේ 2020 ජනවාරි පලවැනිදා ඉඳලා ඔක්තොබර් 13 වැනිදා වෙනකම් කාලය අතුලේ ලංකාවට ගෙන්නපු සමස්ථ සීනිවලින් 96.75%ක් ගෙන්නලා තිබුනේ පිටකොටුවේ ඉන්න තොග වෙළෙන්දෝ 14 දෙනෙක්. ඒ අය දේශීය වෙළෙන්දෝ. එතකොට පිරිමිඩ් විල්මා කියන බහුජාතික සමාගමක් තිබුනා, සිංගප්පූරු සම්භවයක් සහිත ඒ සමාගම ලංකාවේ සමස්ථ සීනි වලින් 3.25%ක් ගෙන්නලා තිබුනා. ඔහොම තමයි පොදු චිත්‍රය තිබුනේ. එතකොට අපි කාටත් තේරෙනවා පිටකොටුවේ තොග වෙලෙන්දෝ 14ක් තමයි ලංකාවේ සිනී ආනයනය සම්බන්ධයෙන් ඒකාධිකාරය හිමිකරගෙන තිබුනේ.

එතකොට ඔක්තොබර 13 මේ ගැසට් එක ගහනකොට මේ වෙළෙන්දෝ 14 දෙනා මෙට්‍රික් ටොන් 80000ක් රුපියල් 50ක ගානේ බදු ගෙවලා ගෙනල්ලා පිටකොටුවේ ගබඩා කරලා තිබුනා. පිරමිඩ් විල්මා සමාගම

මෙට්‍රික් ටොන් 7000ක් ගෙනල්ලා වරායේ නවත්තගෙන හිටියා මේ ගැසට් එක ගහනකන්. ඒ කියන්නේ මේ ගැසට් එක ගහනවා කියලා පිරමිඩ් විල්මා සමාගම කලින් දැනගෙන හිටියා. ඒකේ දේශීය නියෝජිතයා විදියට ඉන්න සජාඩ් මවුසුන් දැනගෙන හිටියා. ඊට පස්සේ ගැසට් එක ගැහුවට පස්සේ තමයි සත 25ගානේ බද්ද ගෙවලා සීනිටික බෑවේ. සමාන්‍යයෙන් ඔක්තොබර් මාසේ වෙද්දී සුදු සීනි කිලොවක තියෙන්නේ සාමාන්‍ය වෙළඳපොළ මිල රුපියල් 125 වගේ ගානක්. එතකොට රුපියල් 45යි ශත 75න් ම බද්ද අඩුකරාට පස්සේ රුපියල් 75ට දෙන්න පුලුවන් සීනි කිලෝවක්. නමුත් රජය නැවත ගැසට් නිවේදනයක් නිකුත්කරා සුදු සීනි කිලොවක් උපරිම සිල්ලර මිල රුපියල් 85යි කියලා. හරි රුපියල් 75 පැත්තකින් තියලා 85 ගන්නකෝ. නමුත් කිසිඳු තැනක 85ට සීනී තිබුනේ නෑ. සමාන්‍යයෙන් අපි ඒ දවස්වල සීනි ගත්තේ රුපියල් 105ට 107ට. පස්සේ ඒක 112ක් 114ක් වුණා. දැන් මේ වෙද්දී සුදු සීනි රුපියල් 120කට අසන්න වෙලා තියෙනවා. සතොසේ අඩු මිලට දෙනවා කියන සීනි පවා දෙන්නේ රුපියල් 99ට. ඒ කියන්නෙ සීනිවල බද්ද අහෝසි කරපු එකෙන් ජනතාවට වාසියක් වුණේනෑ. ජනතාවට අඩු මිලට සීනි ලැබුනේ නැහැ. කාටද මේකේ වාසිය ආවේ. එතනින් පස්සේ ගෙවිච්ච මාස 3 ගත්තට පස්සේ ඔක්තොබර් සිට ජනවාරි 13 දක්වා ගෙවිච්ච මාස තුන ඇතුලේ ලංකාවට ආනයනය කරපු සීනිවලින් 59%ක් ආනයනය කරලා තිබුනේ පිරමිඩ් විල්මා සමාගම. සියයට 41ක් පමණයි අර පිටකොටුවේ තොග වෙලෙන්දෝ 14 දෙනා ආනයනය කරලා තියෙන්නේ. ඒ නිසා මේකෙන් එකක් වුණා. පළවෙනි එක එතෙක් කල් දේශීය වෙළෙන්දෝ අතේ තිබුන ලංකාවේ සීනි ආනයන ඒකාධිකාරය පිරමිඩ් විල්මා කියන බහුජාතික සමාගම සතුවුනා. බද්ද අඩු කරාට අද අපි සීනි කන්නේ කලින් තිබුන ගානට වඩා රුපියල් පහක් විතර අඩුවෙන් බදු අඩු කරන්න කලින් තිබුන ගානට. ඒ නිසා සීනි බද්දේ අඩුව ජනතාවට ලැබුනේ නෑ. අනිත් එක මේ හරහා රජයට විශාල වශයෙන් බදු ආදායමක් අහිමි වුණා. අහිමි වුණ බදු ආදායම රුපියල් කෝටි 1600කට ආසන්නයි කියලා විගනකාධිපති දෙපාර්තමේන්තුව මූලාශ්‍ර කරගනිමින් මුදල් අමාත්‍යංශය කියලා තියෙනවා.

දැන් වෙලා තියෙන්නෙ පිරිමිඩ් විල්මා සමාගමට සජාඩ් මවුසූඩ්ලාට ලංකාවේ සීනී ආනයන ඒකාධිකාරය හිමිවන අතර මහජන මුදලින්

රුපියල් කෝටි 1600ක් රජයට හිමිව තිබූ මුදල් සමාගම විසින් අත්පත් කරගෙන තියෙනවා. ඉතින් මේක වංචාවක්, හොරකමක් කියලා කියද්දී ඒක එහෙම නොවයි කියලා එක එක තර්ක ගෙන්න පුලුවන්. නමුත් සාමාන්‍ය සිහි බුද්ධිය තියෙන ඕන කෙනෙක්ට තේරෙනවා මෙතන වංචාවක් වෙලා තියෙනවා කියලා. ඒ වගේ වංචාවක් සම්බන්ධ එකක්නේ පොල්තෙල් වංචාව. පිරිපහදු කළ පොල්තෙල් ලංකාවට ගෙන්නද්දී සාමාන්‍යයෙන් පොල් තෙල් කිලෝවක් සඳහා රුපියල් 125ක් බද්දක් අය කරනවා. දෙසැම්බර් මාසේ 13 රෑ 12ට ගැසට් එකක් ගැහුවා බද්ද රුපියල් 100 කරා කියලා. රුපියල් විසි පහකින් අඩුකරලා. ඒ වෙනකොට පොල්තෙල් ගෙන්නන කිසිඳු ව්‍යාපාරිකයෙකුගේ නැව් වරායේ තිබුනේ නෑ. සජාඩ් මවුසූඩ්ගේ නැව තිබුනා. ඊට පස්සේ විශාල පොල්තෙල් ප්‍රමාණයක් අඩුවෙන් බදු ගෙවලා කොළඹට බෑවා. බාලා ඉවර වුණාට පස්සේ නැවත 14 වෙනිදා ගැසට් එකක් ගැහුවා නැවත බද්ද රුපියල් 125 කියලා. දැන් පැහැදිලියි පැය 24ක් ඇතුලේ ගැසට් ගහලා බද්ද අඩු කරේ සජාඩ් මවුසූඩ්ට සල්ලි හොයාගන්න කියලා.

### *ගජ මිතුරෙක්*

සජාඩ් මවුසූඩ් කියන්නේ රාජපක්ෂ පවුලේ සමීපතමයෙක්. මෙතන ගජමිතුරු ධනවාදයකුත් යනවා. පොදුවේ රාජ්‍ය මුදල් කාබාසිනියා කරමින් ජනතාව පෙලන ගමන් සමාගම්වලට බදු සහන දෙනවා. එහෙම බදු සහන දෙද්දී ගජමිතුරන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනවා. රාජපක්ෂ පවුලේ උත්සවවල අපි දැක්කා සජාඩ් මවුසූඩ් ඉන්නවා. ඔහු වියත්මගේ සාමාජිකයෙක්. ෂැංග්‍රිලා හෝටල් සමූහයේ ලංකාවේ සභාපතිවරයා විදිහට ඉන්නවා. ඒ හෝටල්වල තමා වියත්මගෙ රැස්වීම් ජනාධිපතිවරණය දී පැවැත්වූයේ. එතකොට ප්‍රශ්නේ තියෙන්නේ දැන් කවුරුහරි විශ්වාස කරනවානම් ගජමිතුරු ධනවාදය නැතුව සම්භාව්‍ය ධනවාදී ආකෘතියකින් ලංකාවේ ධනවාදය යනවා කියලා, ඒම යන්නෙ නැහැ. ලංකාවේ ධනවාදය දුවන්නෙම මේම තමයි. ඒකේ සංයුක්ත රූපය තමයි මේ. ඒක යන්නෙ ගජ මිතුරු ධනවාදයක් හරහා. මේක හරහා දැවැන්ත අලාභයක් සිදුවුනා රජයට, ජනතාවට. ඒ විතරක් නෙවෙයි මේ අලාභය ඇතුලේ තව ප්‍රශ්නයක් තියෙනවා. මේගොල්ලෝ ජාතික ආර්ථිකයක් හදනවා කියලා බලයට ඇවිල්ලා ලංකාවේ සීනි ආනානයනය බහු ජාතික සමාගමකට නතු

කළා, දේශීය වෙළෙන්දෝ පසුබැස්සා. මේ අහිමි වූ කෝටි 1600ක මුදල කියන්නෙ ලංකාවට කොවිඩ් වැක්සීන් එක ගෙන්න පවා ප්‍රමාණවත් මුදලක්. එතකොට කොවිඩ් වැක්සීන් සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය ගන්න සිද්ධ වුනෙත් රටවල් ගානේ වැක්සීන් දෙන්න කියලා හිඟාකන්න සිද්ධ වුනෙත් මේ මුදල් අහිමි වුණ නිසා. මේක සම්බන්ධයෙන් බරපතලවම වගකීම බාරගත යුතුයි ආණ්ඩුව.

අපි දැක්කා මහින්ද අමරවීර ආමාත්‍යවරයා කියලා තියෙනවා බැඳුම්කර වංචාව කරේ නරක සිතින්, සීනි වංචාව කරේ හොඳ හිතින් කියලා. නමුත් දැන් මෙතන හොඳ හිතින් නරක සිතින් කියන සිතිවිල්ල අදාල නෑ. වෙලා තියෙනදේයි වැදගත්. මෙයින් බරපතල අසාධාරණයක් වෙලා තියෙනවා ජනතාවට, ආර්ථිකයට, රජයට. ඉතින් ඒක සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් කරන්න අවශ්‍යයි. මේකට වගකිය යුත්තන් සියලු දෙනාටම දඬුවම් නියම කල යුතුයි. පවතින අධිකරණය ඇතුලේ පුලුවන් විදියට මේකට ක්‍රියාමාර්ග ගත යුතුයි. ඒ නිසා මහින්ද අමරවීර මහත්තයා කියනවා වගේ වරදක් කලත් සිතකින් නොවේ රිදවන්නේ පළිගන්නේ ඇයි වගේ දේවල් කියලා මේ ප්‍රශ්නය යටපත් කරන්න බැහැ. මේක බරපතල ප්‍රශ්නයක්, මේක සම්බන්ධයෙන් ජනතාව පෙළගස්වන්න අපේ පැත්තෙන් හැකි උපරිමය කරමින් ඉන්නවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/h1ZqNaDRx9I

https://www.aithiya.lk/tax-policy-in-sri-lanka-pubudu-jagoda-frontline-socialist-party/

# 89. ගොකරැල්ල උසස්පෙළ සිසුවාට වූ අසාධාරණය පිළිබඳ ජාතික පොලිස් කොමිසමෙන් යළි විමර්ශනයක්



කංචන ප්‍රදීප් ධර්මතිලකගේ මව

අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටිමට නියමිත සිසුවෙකු ගොකරැල්ල පොලිසිය විසින් නීති විරෝධි ලෙස අත්අඩංගුවට ගෙන මත්ද්‍රව්‍ය යොදා සාවද්‍ය නඩු පැවරීම සම්බන්ධයෙන් යළි විමර්ශනයක් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව තීරණය කර ඇත. තෙළඹුගල්ල, දොඩම්ගස්ලන්ද පදිංචි කංචන ප්‍රදීප් ධර්මතිලක (19) නමැති අයව ගොකරැල්ල පොලිසියේ ප්‍රධාන පොලිස් පරික්ෂක රත්නායක, වික්‍රමසිංහ, ගුණරත්න යන නිලධාරීන් විසින් 2020-10-10 වෙනි දින නීති විරෝධි ලෙස අත්අඩංගුවට ගෙන තිබුණි. ඒ ඔහු තම නිවසේ සිට මිතුරෙකුගේ නිවසට යන අතර තුරදීය. නිවසට මීටර් 500ක පමණ දුරින් සිවිල් ඇඳුමින් සැරසී සිටි පොලිස් නිලධාරින් පිරිසක් විසින් ඔහු හදිසියේම නවතා පහර දෙමින් ගංජා ඉල්ලා ඇති අතර එහිදි ඔහුගේ ඥාතීන් එම ස්ථානයට ගොස් විමසිමේදි ප්‍රධාන පොලිස් පරික්ෂකවරයා පවසා ඇත්තේ තමුන් ගොකරැල්ල පොලීසියෙන් බවත්, ගංජා කැල්ලක් තිබූ නිසා ඔහු අත්අඩංගුවට ගත් බවත් ය. ඥාතීන් ඒය පිළිනොගනමින් ඒසේ අත්අඩංගුවට ගත් ගංජා පෙන්වන ලෙස අදාළ නිලධාරීන්ගේ ඉල්ලා සිටියත් පොලීසිය කිසිවක් ඉදිරිපත් කර තිබුණේ නැත.

පසුදින මෙම සිසුවා අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ ගංජා නොව, හෙරෝයින් මිලිග්‍රෑම් 2280ක් ළඟ තබා ගැනීමේ චෝදනාවන් යටතේය. එසේම මත්කුඩු යතුරු පැදියකින් ප්‍රවාහනය කිරීම සහ පොලිස් නිලධාරියෙකු වෙත සාපරාධී බලහත්කාරය පෑම යන චෝදනාත් ඔහුට එල්ල කර තිබේ. මෙම අසත්‍ය චෝදනා හේතුවෙන් ඇපලබා ගැනීමට

නොහැකිව මාස 4කට වැඩි කාලයක් මෙම සිසුවා පසුවන්නේ කෑගල්ල රක්ෂිත බන්ධනාගාරයේය.

මේ අතර මෙම සිසුවාගේ මවවන යමුනා කුමාරි මහත්මිය විසින් මේ සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට හා ජාතික පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි කළාය. මෙහිදී ජාතික පොලිස් කොමිෂන් සභාවේ වයඹ පළාත් අධ්‍යක්ෂක කාර්යාලය වෙත කළ පැමිණිල්ල අනුව ගොකරැල්ල පොලීසිය සම්බන්ධයෙන් විමර්ශනයක් කර ඇත. එහිදී මෙම පැමිණිල්ලට අදාලව 2020-012-09 සහකාර පොලිස් අධිකාරි 111 වෙතින් විමර්ශනයක් කර 12-31 ට ප්‍රථම වාර්තාවක් කැඳවා ඇත. නමුත් එම වාර්තාව නොලද හෙයින් නැවත 2021-01-07 පළමු සිහි කැඳවීමද 2021-02-09 දෙවැනි සිහි කැඳවීමද යොමු කර ඇත.

මේ අතර කුරුණෑගල දිස්ත්‍රික් 111 විසින් 2021-01-24 දිනට අදාළව වාර්තාවක් වයඹ පොලිස් කොමිසම වෙත ලබාදී ඇත. ඔහු කියා ඇත්තේ පැමිණිලිකාරිය පොලිස්පති සහන මැදිරිය වෙතද පැමිණිල්ලක් කර තිබූ හෙයින් ඒ සම්බන්ධව විමර්ශනයක් පවත්වා ඇති බවය. එහිදී සියලු කරුණු විමර්ශකයින්ගේ අවධානයට යොමු කර, නිරීක්ෂණයට ලක්කර ඇති බවත් එහිදී පෙනී ගොස් ඇත්තේ සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා විසින් සෙනඟ රැස්ව සිටි අවස්ථාවේ ඔහුව අත්අඩංගුවට ගත්තේ ගංජා නිසා බව කීවත් පසුව ඔවුන් විසිර ගිය පසු තනිවම සැකකරු පරීක්ෂා කිරිම, එහිදී හෙරොයින් හමුවීම, මොහුට පෙර වැරදි නොමැති වීම, දින 02 කින් උසස් පෙල විභාගයට මුහුණ දීම, 54 වගන්තියෙන් අධිකරණයට ඉදිරිපත් කිරිම යන ආදි කරුණු නිසා මෙම වැටලීම් රාජකාරීය විනිවිදව සිදුනොවූ බැවින් පැමිණිලිකාරිය මෙසේ පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බවය.

එසේම පිරිස විසිර යාමෙන් පසු කංචන සතුව තිබී සොයා ගත්තේ හෙරොයින් බව වැටලීම් කළ නිලධාරින් තිදෙනා හැර අත්අඩංගුවේ සිටි කංචනවත්, දීලිප නුවන්වත් දැන නොසිටීම හා කංචන විභාග යට මුහුණ දීමට සිටින බව එම අවස්ථාවේදී පැමිණිලිකාරිය කියා සිටියත් මෙම නිලධාරින් ඉහළ කිසිඳු නිලධාරියෙකුගෙන් උපදෙස් පතා නොතිබීම යන කරුණු මෙහිදී නිරීක්ෂණය වී ඇත. ඒ අනුව

සහකාර පොලිස් අධිකාරිවරයා විසින් නිර්දේශ කර ඇත්තේ මෙම වැටලීම සිදුකළ ප්‍රධාන පොලිස් පරික්ෂක රත්නායක ඇතුලු නිලධාරීන් තම වැටලීම් රාජකාරිය විනිවිදභාවයකින් තොරව සිදුකිරිමෙන් හා අත්අඩංගුවට ගත් කංචනගේ ජීවිතයේ වැදගත් කඩඉම් විභාගයක් සම්බන්ධයෙන් සැලකිල්ලක් නොදැක්වීමෙන්, අපකීර්තිදායක හැසිරීම, මහජනයාගෙන් කෙනෙකුට අවිනීත අන්දමින් හෝ පීඩාකාරී අන්දමින් හැසිරීම යන වැරදි සිදුකර ඇති බැවින් ප්‍රධාන පොලිස් පරික්ෂක රත්නායකට අවවාද පත්‍රයක්ද, වැටලීමට සහාය වු අනෙක් නිලධාරීන් දෙදෙනා විනය ශාලාවට ගෙන්වා අසාදු සටහන බැගින් ලබා දීමටය.

නමුත් මෙම සිසුවාගේ ජීවිතයේ වැදගත් කඩඉමක් අහිමි කිරිම, පොලිස් නිලධාරින් ප්‍රසිද්ධියේ ගංජා යැයි පවසා පසුව හෙරොයින්වලට නඩු පැවරීම පිළිබඳව මෙහිදි ප්‍රමාණවත් නිර්දේශයක් සහකාර පොලිස් අධිකාරිවරයාගෙන් ලැබී නොමැති වීම නිසා ජාතික පොලිස් කොමිසමේ පළාත් අධ්‍යක්ෂකවරයා විසින් ඒ පිළිබඳ විමර්ශන ගොනුව ජාතික පොලිස් කොමිෂමේ සභාපති, හිටපු පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහතා වෙත යොමු කර ඇත. එහිදී පොලීසිය සිදුකළ විමර්ශනවලදි දුර්වලතා සහ අඩුපාඩු කිහිපයක් ඇති බවට නිරික්ෂණය වී ඇති බැවින් ඒ පිළිබඳව යළි කුරුණෑගල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගෙන් විමසීමට ජාතික පොලිස් කොමිසම තීරණය කර ඇත. ඒ අතර ගංජා හෙරොයින් වුයේ කෙසේද යන්න අවධානයට ලක් කර ඇත.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/qdnS07idqMs

https://www.aithiya.lk/national-police-commission-sri-lanka-2/

# 90. මළමිනී සොයාගෙන යන මාධ්‍ය සංස්කෘතියක් අපේ රටේ තියෙන්නේ

## මාධ්‍යවේදී චන්දන සිරිමල්වත්ත

***දැන් ලංකාවෙ ජන මාධ්‍යය භාවිතය පිළිබඳ ප්‍රබල විවේචන ඉදිරිපත් වෙලා තියෙනවා. ඝාතනයක් හෝ සමාජ සංවේදී සිදුවීමකදී මාධ්‍යය හැසිරෙන ආකාරය බොහෝවිට ගැටලු සහගතයි. ඔබ මේ විවේචන ගැන දරන අදහස මොකද්ද?***



**චන්දන සිරිමල්වත්ත**

ලංකාවේ මාධ්‍ය භාවිතය සම්බන්දයෙන් මම බොහෝ වතාවල අදහස් දක්වලා තියෙනවා. මේ මෑතකදී තරුණියක් ඝාතනයට ලක් වූ සිද්ධිය සම්බන්ධයෙන් මාධ්‍යය හැසිරුණ ආකාරය පිලිබඳ නොයෙක් අදහස්, විවේචන පළවුණා. තවමත් මළමිනී සොයා ගෙනයන මාධ්‍ය සංස්කෘතියක් අපේ රටේ තියෙන්නේ. මේක මේ පළවෙනි සිදුවීමත් නෙවෙයි. අවසාන සිදුවීමත් නෙවෙයි කියන දෙය අපි දන්නවා. ඇතැම් අවස්ථාවල සේයා සදෙව්මි සිදුවීම වගේ අවස්ථාවක් ගත්තොත් මාධ්‍යය මොන තරම් වගකීම් විරහිතව කටයුතු කළා ද කියන කරුණ පැහැදිලියි. එතකොට මාධ්‍යවේදියෙක් විදිහට වැඩකරන අය සමාජය තුළ ඉදගෙන කරන්නේ මොනාද? වාර්තාකරන දේවල් ගැන වගකීමක් තියෙනවද? මාධ්‍යවේදියෙක්ට ආයතනගත රාමුවක් තියෙනවා, මාධ්‍ය ආයතන වෙළඳ ව්‍යාපාර සමඟ බද්ධ යි. ඔවුන් වාණිජ පරමාර්ථයෙන් ඇතැම් පුවත් හිතාමතාම අවධාරණයට ලක් කරනවා. ඒ වගේම ඇතැම් පුවත් මගහරිනවා. මෙවැනි තෝරා ගත් දේවල් වෙළෙඳපොළට ඉදිරිපත් කරන මාධ්‍යය සංස්කෘතියක් තමයි මේ රටේ තියෙන්නේ.

මේ තත්ත්වය වටහාගෙනයි අපි මාධ්‍යය දෙස බලන්න ඕනේ. ඒ වගේම ජනමාධ්‍ය තුළ ඉන්නෙත් අපේ රටේ සමාජය නියෝජනය කරන සාමාන්‍ය පුද්ගලයො. එනිසා මාධ්‍යවේදීන්ටත් අපේ විවේචනයක් තියෙනවා. ඔවුන්ව වෘත්තිකයන් විදිහට වැටුප් ගෙවලා, නඩත්තු කරමින් තමන්ගේ අවශ්‍යතා වෙනුවෙන්, වෙළඳපොළ නිර්මාණය කරගන්න කටයුතු කරන මාධ්‍ය ව්‍යාපාර ගැනත් අපේ විවේචනයක් තියෙනවා. මේ දෙපැත්තම අපි බලන්න ඕනෑ . ඒ වගේම අපි තේරුම් ගන්න ඕනෑ අපේ සමාජය මුහුණ දෙන ප්‍රශ්ණ මොනවද? සමාජයේ ඉරණම මොකද්ද? අපේ සමාජයේ මිනිස්සු මේ ආකාරයට අමානුෂිකව ඝාතනයට ලක්වීම, ඒ පුද්ගලයා මුහුණ දෙන තත්ත්වය. මේ හැමෝම අවසානයේ යම් අයුරක ගොදුරක්. එසේ වෙන්නේ අපේ සමාජය ඉතාම පහත්, මානව වටිනාකම් මිනිසත්කම බිඳ දමන ලද සමාජයක් වීම නිසා.

මනුෂ්‍යත්වය බිඳ දැමීම තුළ ඇති කරපු කම්පනය එක පැත්තකින් තියෙනවා. මිනිස් ජීවිතය ඇතුළෙ එක් එක් පුද්ගලයා අනිකුත් මිනිසුන් කෙරෙහි දක්වන ගෞරවය, ආදරය, බිඳ වැටීමට ලක් වෙලා තියෙනවා. මනුෂ්‍ය ප්‍රේමය, ලිංගිකත්වය ඉතා නරක උපයෝගිතා තත්ත්වයකට පත් වෙලා තියෙනවා. මිනිසුන් ගොදුරු කරගන්න ආකාරයේ, තරුණයෙක් හෝ තරුණියක් අතර ප්‍රේමය අවසානයේ ඔවුන්ව ගොදුරක් බවට පත්වෙන තත්ත්වයක් ඇති වෙලා තියෙනවා. අනික් පසින් මේ සිදුවීම්වල එක් එක් පාර්ශව ගොදුරු කර ගන්න මාධ්‍ය සංස්කෘතියක් බිහිවෙලා තියෙනවා. මේ සියල්ල එක්ක තමයි මේ සිදුවීම්, මේ ප්‍රවෘත්ති අපිට එදිනෙදා අහන්න දකින්න ලැබෙන්නේ. අපේ සමාජය තේරුම් ගන්නේ නැහැ මේ දේවල් යම් වෙනත් අරමුණු සමඟ බැඳුනු කාරණා කියලා. අපි එක්කෝ ඒ සිදුවීමට අදාළ පුද්ගලයා කුරුසියේ තියලා ඇණ ගහනවා. එහෙම නැත්නම් ඔවුන් වැරදිකරුවන් කරනවා. ඇතැම්විට මේ මාධ්‍යය විසින් දෙන තොරතුරට වඩා වෙනස් දේවල් පසුකාලීනව අනාවරණය වෙනවා. ඒ නිසා මෙය සබුද්ධිකව තේරුම් ගන්න ඕනෑ. අනිත් කරුණ මේ තත්ත්වය වෙනස් කරගන්න කටයුතු කරන්න ඕනෑ.

මම මාධ්‍යවේදියෙක් වශයෙන් උත්සාහ කරන්නේ ඇත්තටම මේ තත්ත්වය එක පැත්තකින් ජන සමාජයට අවබෝධ කරලා දෙන්න.

ඒ වගේම ජන සමාජය තුළ මේ තියෙන පසුගාමී, නරුම තත්ත්වය වෙනස් කිරීමේ දේශපාලන ක්‍රියාවලියක් අවශ්‍යයි. ඒක දැනුවත් වීමේ ක්‍රියාවලියක්, ක්‍රියාත්මක වීමේ ක්‍රියාවලියක්. ඒ වගේම එය යම් අයුරකින් මීට වඩා මනුෂ්‍ය පරමාර්ථ පදනම් කර ගත් ව්‍යාපාරයක් විය යුතු බවයි මම විස්වාස කරන්නේ.

***මාධ්‍යය නියාමනය කිරීම වෙනුවෙන් ඇතිකළ පුවත්පත් මණ්ඩලය නැවත වතාවක් සක්‍රීය කිරීමේ කතිකාවක් මේ වෙනකොට ඇති වෙලා තියෙනවා. හැබැයි අපි දන්නවා මේ නියාමනය පිටුපස යම් ආකාරයකින් ක්‍රියාත්මක වෙන්නෙ මර්දනය, මේ ගැන ඔබේ අදහස කිව්වොත්?***

මේ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ සිදුවන දේවල්, අනිත් පැත්තට දැන් සමාජ මාධ්‍ය තුළ ඒ වගේම පුවත්පත් හෝ විද්‍යුත් මාධ්‍යය පැත්තෙන් සිදුවන දේවල් පාලකයන් විසින් භාවිතා කරනවා තමන්ගේ අවශ්‍යතා ඉටු කර ගන්න. මාධ්‍ය වාරණය ස්ථානගත වෙන්නේ එතන. 1973 මර්ධනකාරී පියවරක් ලෙස ආරම්භ කළ පුවත්පත් මණ්ඩලය යම් අයුරකින් අක්‍රීය වුණා, මාධ්‍යය සමාජය තුළම ස්වේඡාවෙන් තමන්ව නියාමනය කරන ක්‍රියාවලියක් ඇති වීම නිසා. නමුත් දැන් වෙනකොට පාලකයන්ට, විශේෂයෙන් වත්මන් ආණ්ඩුවට අවශ්‍යය වෙලා තියෙනවා පුවත්පත් මණ්ඩලය නැවත බලාත්මක කරලා එහි නීති මගින් ජනමාධ්‍යය වාරණයට ලක් කරන්න. මෙතෙක් කල් මුද්‍රිත මාධ්‍යය වාරණය කිරීමේ අවශ්‍යතාවය යම් ආකාරයකට පුවත්පත් මණ්ඩලයෙන් ඉටු වුණා ද එය දැන් විද්‍යුත් මාධ්‍යය, සමාජ මාධ්‍යය වාරණය දක්වා ගෙනියන්න උත්සාහයක් ගන්නවා. එතකොට නීති සංශෝධන එන්නෙ පාලකයන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් ජනමාධ්‍යය පාලනය කරන්න. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, තොරතුරු දැන ගැනීමේ අයිතිය මේ සියල්ල පාගා දමන පියවරකට තමයි මේ එන්නේ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/jzUNB7l84Ig

https://www.aithiya.lk/ethics-of-media-freelance-journalist-chandana-sirimalwatte/

# 91. හාල් මාෆියාව නැතිකරන්න ආපු අය ඩඩ්ලි ඉස්සරහා දණ ගැහුවා

## උදේනි දිසානායක - සභාපති සමස්ථ ලංකා කළමනාකරණ සේවා නිළධාරී සංගමය


උදේනි දිසානායක

***රජය නැගෙනහිර ජැටිය පෙන්නලා බටහිර ජැටිය දුන්නා නේද ඉන්දියාවට. වෘත්තීය සමිතිවල අදහස මොකද්ද මේ ගැන..***

මේ රටේ පුරවැසියන් වගේම වෘත්තීය සමිති රැවටීමක් තමයි මේ ආණ්ඩුව කළේ කියලා දැන් අපිට තේරෙනවා. කොහොම නමුත් මම හිතන්නේ අපි නැගෙනහිර ජැටිය රැක ගත්තා. චීනෙට දීලා තියෙනවා එක ජැටියක 85% ක්, අපිට එන්නේ ආදායමෙන් 15% යි. නැගෙනහිර ජැටිය පිළිබඳ සටන දියත් වෙනකොට ආණ්ඩුව බටහිර ජැටිය අදානි සමාගමට දෙන කතාවක් තිබුණේ නැහැ. නමුත් මම හිතන්නේ ආණ්ඩුව ඊයේ පෙරේදා මාධ්‍යට කරපු ප්‍රකාශවලින් පෙනෙනවා කොයි වෙලාවක හරි මේ බටහිර ජැටිය ඉන්දියාවට දෙනවා කියලා. මොකද මේ ඉන්දු මුහුදු කලාපයේ බල දේශපාලනයේ තිබෙන ප්‍රශ්න ආණ්ඩුව සමනය කරගන්න හදන්නේ රටේ එක් එක් කොටස් විදේශයන්ට ලබාදීම මගින්. ඇමරිකන් අධිරාජ්‍යවාදීන් විසින් තමයි ඉන්දියාව දැනට මෙහෙයවන්නෙ,ඒ අනුව තමයි මේ බල තුලනය ක්‍රියාත්මක වෙන්නේ, එහිදී ලංකාව සන්ධිස්ථානයක් විදිහට ඔවුන් හඳුන්වා තියෙනවා. රටේ වර්තමානයේ පවතින ආර්ථිකයේ කඩාවැටීම වළක්වා ගන්න ආණ්ඩුව තමන්ගේ එකම විසඳුම විදිහට දකින්නේ රටේ වටිනා දේවල් සහ ඉඩම් විකිණීම. මේ තත්ත්වය අස්සේ වෘත්තීය සමිති මොන අරගලය කළත් ඒවා තාවකාලිකව ජයග්‍රහණය කළත් මේ විකිණීමේ අනතුර තිබෙනවා.

***පසුගිය කාලේ අපි දැක්කා සීනී ගෙන්වීමෙන් ආණ්ඩුවට හිතවත් සමාගම් බදු වංචා කරමින් රාජ්‍ය මුදල් තමන්ගේ පසුම්බියට දමා***

***ගන්නවා. මේවා වෘත්තීය සමිති දකින්නේ නැද්ද?***

මේ ආණ්ඩුව, තමන්ගේ මුදලාලි හෙන්චයියලා ට මුදල් හම්බකර ගන්න ඉඩදීලා බලං ඉන්න වැඩපිළිවෙලක ඉන්නවයි කියනඑක අපිට පහුගිය කාල සීමාවේදී පෙනුනේ මේ සීනි වංචාව නිසා. එතකොට ආණ්ඩුව පැහැදිලිවම කියනවා බදු අඩු කිරීම තුළ සීනි මිල පහළ දානවා කියලා නමුත් ඒ මිලට කවදාවත් මේ රටේ ඉන්න මහජනතාවට සීනි මිලදී ගන්න හැකියාවක් ලැබුණේ නැහැ. එතනදිත් කළේ මහා පරිමාණයේ මුදලාලිලාට අවශ්‍ය මුදල් හම්බ කරගන්න පාර කපලා දුන්න එක විතරයි. ඒ වගේම අපි දැක්කා විශාල ණය මුදලක් සිගරැට් මිලදී ගෙන ගබඩා කරගැනීම සඳහා බැංකුවක් හරහා ලබා දුන්නා මේ ආණ්ඩුවේ හෙංචයියෙකු ට. අයවැයෙන් සිගරට් මිල වැඩි වීමක් සිද්ධවෙයි කියලා හිතලා තමයි මේ මුදල ඔහු ඉල්ලන්නේ. එයින් පේනවා මේ බදු පැනවීම වගේම බදු ඉවත් කිරීමත් මුදල් හම්බ කරන්න පුලුවන් සුදුවක් කියලා මේ ආණ්ඩුව පෙන්නුවා. අපි කියන්න ඕන මේ රටේ සහල් මිල කවදාවත් නියම විදිහට අඩු කරන්න මේ රජයට උවමනාවක් නෑ. පොලොන්නරුවේ ඩඩ්ලි සිරිසේන ව හම්බ වෙන්න ගිය මේ රටේ නායකයෝ, දේශපාලනඥයො මං හිතන්නේ ඩඩ්ලි සිරිසේන ඉස්සරහා දණ ගහලා තමයි ආවේ. ඒ කියන්නේ මාෆියාවට ඔලුව පාත් කරන ආණ්ඩුවක් තමයි මේක.

***රටේ හැම තැනම වෘත්තීය අරගල. කෝවිඩ් අර්බුදයේ ඉඳලා හැමතැනම අර්බුද.. මේ තත්ත්වය තුළ වෘත්තීය සමිතිවල හැසිරීම කොහොමද?***

ඔව් දැන් රටේ තියෙන ප්‍රශ්න දවසෙන් දවස උග්‍ර වනකොට වෘත්තීය සමිති විදිහට අපේ සේවාවල ප්‍රශ්නත් දවසෙන් දවස උග්‍ර වෙනවා. විශේෂයෙන් සඳහන් කරන්න ඕන මේ ආණ්ඩුව පත්වෙලා වසර දෙකකට වැඩි කාලයක් වෙනවා, හැබැයි ඔවුන්ට පක්ෂපාතී නොවන එක වෘත්තීය සමිතියකටවත් ජනාධිපතිතුමා අගමැතිවරයා මේ වෙනතුරු සාකච්ඡාවක් දීලා නැහැ. අපි හිතනවා වෘත්තීය සමිති විදිහට මේ රටේ රාජ්‍ය නායකයා හෝ දේශපාලන නායකයෙක් ප්‍රශ්නයක් ආවාම මැදිහත් වෙලා සාකච්ඡාවක් ලබාදීලා විසඳුම් ලබා දුන්නා නම් මෙච්චර ප්‍රශ්න ඇතිවෙන්නේ නැහැ. නමුත් මේ ආණ්ඩුවේ ක්‍රියාකලාපය නිසා වෘත්තීය සමිතිවලට දැවැන්ත අරගලයක් ක්‍රියාත්මක කරන්න වෙනවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/I-b2H9oRFC8

https://www.aithiya.lk/rice-mafia-dudley-sirisena-eastern-terminal-port-of-colombo/

# 92. ණය ගෙවාගන්න බැරුව ගෙට ගිනි තබාගත් සෙල්වි



සෙල්වි

*ක්ෂුද්‍ර මූල්‍ය ණය කියන්නේ ව්‍යසනයක්. මේ ණය අරගෙන ජීවිතේ ගොඩදාගත්ත මිනිස් ප්‍රාණියෙක් සොයා ගැනීම හරිම අමාරු වැඩක්. හැබැයි මේ ප්‍රශ්නය නිසා සියදිවි හානිකරගත් පුද්ගලයින් සොයාගැනීම අසීරු නැහැ. අධික පොලියක් මත ලබාදෙන මෙම ණය මුදල් දුප්පතුන් තවත් දුප්පත්කමට හෙළනවා. හැටන් කොටගල නගරයට ආසන්න වතු ගමකදී තමයි අපිට එස් සෙල්වි මහත්මිය හමුවන්නේ. ඇයට සහ දරුවාට නොතෙමී ඉන්න අඩුම තරමින් ගෙයක් හෝ නැහැ. ගෙදර වෙනුවට තිබෙන්නේ සිමෙන්ති ගල් උළු කැබලි ලෑලි හේත්තුකරලා හදාගත්ත කුඩාරමක්. ඉතිං සෙල්විගේ කතාව අහන්න..*

මම මෛදිලී කියලා කෙනෙක්ට ණය අරගෙන දුන්නා. එයා කිව්වා මට ණයක් අරගෙන දෙන්න, මම ඔයාටත් ණයක් අරන් දෙන්නම් කියලා. එයාට දෙවතාවක් ණය අරන් දුන්නා. එයත් මට ණයක් අරන් දුන්නා. ඒක මම ගෙවලා ඉවරයි. ඊට පස්සේ තව සතියක ණයක් ගත්තා. නමුත් මම ණය අරන් දුන්න කෙනා ඒ ණය දෙකම ගෙවල නැහැ. එයා මට නොකියම කොළඹ ගියා. මම එයාගෙ ගෙදරට යද්දී අම්මා, දුව තමයි හිටියේ. ඒ අයට පණිවිඩේ කිව්වා. ණය එකතු කරන්න එන 'සර්' ලා බනිනවා, මම මොකද කරන්නේ කියලා මම එයාලගෙන් ඇහුවා. ඒ අය කිව්වා අපිට නෙවෙයිනෙ ණය අරන් දුන්නෙ එයාටම කතා කරන්න කියලා. ඊට පස්සේ මම කතා කරද්දී එයා මගේ ඇමතුම්වලට පිළිතුරු දුන්නේ නැහැ. වෙන අයගේ ඇමතුම්වලට පිළිතුරු දෙනවා. මම ඒක ණය එකතු කරන්න එන 'සර්'ලට කිව්වා. එයාලා මාව විස්වාස කළේ නැහැ. ඔවුන් හැමදාම ගෙදර ඇවිත් මට කරදර කරනවා. පස්සේ මම

ඒ අයට කිව්වා " සර්, මට කරදර කරන්න එපා. අපේ ගෙදර මහත්තයා ප්‍රශ්න ඇති කරනවා. එයා මේවට අකමැතියි කියලා." ඔවුන් කිව්වේ "ඒක අපිට වැඩක් නැහැ. අපේ සල්ලි දෙන්න. අපි යන්නම් කියලා." එක දවසක් මේ අය රෑ 8.30-9ට විතර ආවා. එදා මහත්තයා ගෙදර හිටියා. මහත්තයා මගෙන් ඇහුවා, "කාට ද ණය අරන් දුන්නේ?" කියලා. මම ඇත්තම විස්තරය කිව්වා.

ඊට පස්සේ ණය එකතු කරන්න එන 'සර්' ලා ගෙදර ඇවිත් හිටියා. මම ගෙදර ළමයි නිදි කරවලා සල්ලි දුන්න ගෙදරට එයාලව (ණය එකතු කරන අය) එක්කන් ගියා. මේ අය මට කිව්වා ඒ වෙලාවේම සල්ලි දෙන්න කියලා. මට රස්සාවක් නැහැ. මහත්තයා කුලී වැඩ කරන්නේ. අපිටම කන්න බොන්න අමාරුයි කියලා මම කිව්වා. ඒක එයාලා ඇහුවේ නැහැ. "දැන්ම සල්ලි රු. 25000 ක් තියන්න. අපි උදේටත් එනවා." කියලා බැනලා ගියා. ඊට පස්සේ පහුවදා 'හෙඩ් ඔෆිස්' එකෙන් ඇවිල්ලා තිබුණා. ආවම මම කිව්වා "මට සල්ලි ඉල්ලලා කරදර කරනවා. මහත්තයා ළමයිනුත් එක්ක ගෙදරිනුත් එලවයි මාව" කියලා. එයාලාට ඒවා වැඩක් නැහැ. කොහොමහරි මේ සල්ලි ගෙවන්න කියලා කිව්වා. මම එතකොට කිව්වා මට ගෙවන්න විදිහක් නැහැ සර් කියලා. ඊට පස්සේ තමයි මම ඇහුවේ, මම මොනා හරි කර ගත්තොත් ණය අවලංගු කරනවද කියලා. මේ ණය ගෙවලා කර ගන්න ඕන දෙයක් කර ගන්න කිව්වා. පස්සේ මම කිව්වා ගිනි තියා ගෙන හරි වහ බීලා හරි මැරෙනවා කියලා. එයාලා විශ්වාස කළේ නැහැ ඒක. එයාලා කිව්වේ හෙටත් එනවා. සල්ලි දෙන්න කියලා. මම රෑ එළිවෙනකම් කල්පනා කළා. මොකද කරන්නෙ කියලා. ගෙදරත් රණ්ඩු. පස්සෙ මම සිරුරට ගිනි තියා ගත්තා. මට හොඳටම අමාරුවුණා. දැන්නම් සනීපයි. ඒත් මේ ලප කැලැල් හැමදාම තියෙයි. මොනාකරන්නද? තවමත් මම ණය ගෙවනවා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/O3QdFMDgxrM

https://www.aithiya.lk/microfinance-crisis-plantation-workers-central-bank-of-sri-lanka/

# 93. මේක ළමා හිංසනයට විරුද්ධව ලබාදුන් සුවිශේෂ නඩු තීන්දුවක්

## වෛද්‍ය තුෂ් වික්‍රමනායක



වෛද්‍ය තුෂ් වික්‍රමනායක

හොඳට ගුටි කාලා, හොඳට හැදෙන මේ රටේ තවමත් අපේ දරුවෝ සමාන කරලා තියෙන්නෙ කිරි හොද්දකට. අපි මේ කිරි හොද්ද හැඳි ගාමින් ඉන්න නිසා තමයි අපේ රටේ ප්‍රචණ්ඩත්වය, යොවුන් ප්‍රචණ්ඩත්වය, වැඩිහිටි ප්‍රචණ්ඩත්වය මේ තරම් වැඩි. ශ්‍රී ලංකාව ඇතුළුව ලෝකයේ ළමා අපයෝජන වලින්, ශාරීරික දඬුවම් තමයි බහුලවම සිදුවෙන ළමා අපයෝජනය. ඒ අතින් ශ්‍රී ලංකාව ලෝකයේ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අත්සන් කළ රටවල් 196න් කෲරත්වයට එරෙහි ආරක්ෂාව අවම රටවල් 10 දක්වා පහත වැටිලා තියෙනවා. අපි ඇත්තටම මේ ගැන කණගාටු වෙන්න ඕනෑ. ලැජ්ජා වෙන්න ඕනෑ.

මෑතකදී මේ චක්‍රය කැරකීම මඳක් අඩුකිරීමට අපේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඓතිහාසික සහ ස්වර්ණමය තීන්දුවක් ලබාදුන්නා. ඒ 2017 දී පාසල් ගුරුවරයෙක්, දරුවෙකුගේ අපි ව්‍යවහාරයේ කියන ආකාරයට "කනපැලීම" සම්බන්ධයෙන්. එම නඩුවේ තීන්දුව ලබාදුන්නේ 2021 පෙබරවාරි. එම අවස්ථාවේදී එතුමන්ලා අංශ පහක් ඔස්සේ මේ නඩු තීන්දුව ලබාදුන්නා. එකක් තමයි මේ රටේ ව්‍යවස්ථාව. ඒක සාමාන්‍යයෙන් කරන දෙයක්. සෑම පුරවැසියෙකුටම ඇති ස්වෛරීව, ස්වාධීනව බියෙන් සැකෙන් තොරව ජීවත් වීමේ අයිතිය. ඒක අලුත උපන් බිළිදෙකුට, අවුරුදු හතක දරුවෙක්ට, අවුරුදු 90 ක සීයා කෙනෙකුටත් එක වගේ. දෙවැන්න තමයි අධ්‍යාපන

අමාත්‍යාංශයෙන් නිකුත් කළ අපේ චක්‍ර ලේඛන තියෙනවා. දරුවන්ට ගහන්න එපා කියලා. එම චක්‍ර ලේඛන එක් දහස් නවසිය විසි ගණන්වල ඉඳලා අලුත් වෙමින් 2016 නවතම චක්‍ර ලේඛනය නිකුත් කරලා තියෙනවා. ඒක විධිමත් කළ යුතුයි කියන එක. තුන්වෙනුව සාමාන්‍යයෙන් නඩු තීන්දුවක් දෙන්නේ සමාජ මතයට අනුව. සමාජයේ ආකල්ප ඔස්සේ යන නඩු තීන්දුවක්. බොහෝවිට අපේ දරුවෙක්ට කරන අපරාධ අපේ සමාජම සාධාරණීකරණය කරනවා. අපිට ගහපු නිසා අපි හොඳින් ඉන්නවා කියන මතයක් තියෙනවා. නමුත් මේ අවස්ථාවේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයත් හැඳි නොගා හදන හොද්දයි නොගහ හදන දරුවයි කියන ඒ යල් පැන ගිය මතය ප්‍රතික්ෂේප කරලා, මේ නඩු තීන්දුව සිංහලෙන්ම ලියලා දීලා තියෙනවා. මේක අපිට දැන් භාරගන්න බැහැ කියලා.

හතරවෙනි කරුණ සාමාන්‍යයෙන් රටක නීතිය. විශේෂයෙන් ළමා ආරක්ෂණය සම්බන්ධව අපේ රට තුළ නීතිය අපි සම්පාදනය කරලා තියෙන්නේ 1991 දී ළමා අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියට අත්සන් කරපු නීතිය අනුව. එහිදී මුල් ඛණ්ඩයේම සඳහන් වෙනවා දරුවෙකුට එරෙහි හිංසනය අපිට පිළිගන්න බැහැ. එම හිංසනය කෙතරම් සියුම් වුණත් අපිට පිළිගන්න බැහැ කියලා. ඒ කියන්නේ කනට ගැහුවත්, එහෙම නැත්නම් කන පැලෙන්න ගැහුවත්, ටොක්කක් ඇන්නත්, නැත්නම් දණ ගැස්සුවත්, වේවැලකින් ගැහුවත් ඒ සියල්ල එක හා සමානයි කියන දේ. ඒ කිසිවක් පිලිගන්න බැහැ කියලා. ඒ වෙනුවට ධනාත්මක විනය පාලනය තමයි ඔවුන් නිර්දේශ කරලා තියෙන්නෙ. එම නිසා මේ අවස්ථාවේදී ගරු අධිකරණයත් එය අනුමත කළා.

අවසාන වශයෙන් බොහෝ විට වෙන්නේ අපේ රටේ නීතිය උල්ලංඝනය කරොත් මොනාහරි වුනොත්, එක එක ආණ්ඩු ඇවිල්ලා කියනවා ඒක ඒ කාලේ සිදුවුණ දෙයක්. ඒ ගොල්ලන්ගෙ කාලේ සිදුවුණ දෙයක් නෙවෙයි. කලින් ආණ්ඩුව කාලේ සිදු වෙච්ච දෙයක්. ඒ විදිහට මගහරිනවා. නමුත් මේ අවස්ථාවේදී වග උත්තර පාර්ශවකරුවන් හැටියට 2017 හිටපු අධ්‍යාපන ඇමති අකිල විරාජ් සහ එතුමාගේ ලේකම් වගේම ඒ ගුරුවරයා සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ඒ වගේම නඩු තීන්දුව ලබා දුන් 2021 දැන් සිටින අධ්‍යාපන ඇමති මහාචාර්ය ජී.එල්. පීරිස්, එතුමාගේ ලේකම්තුමා මේකට වග උත්තර

පාර්ශවය හැටියට යොදාගෙන තියෙනවා. මොකද ඒ තමන්ගේ වගකීම, වගවීම පැහැර හරින්න බැහැ කියනඑක අවධාරණය කරලා.

ඉතින් ඒ නිසා මේක අතිවිශිෂ්ට, සුවිශේෂී, ඓතිහාසික, නඩු තීන්දුවක්. අනිත් කරුණ තමයි ඒ ගුරුවරයාට පෞද්ගලිකව ගෙවන්න දඩ මුදලක් නියම කළා. ඒ වගේම ප්‍රථම වරට මෙහිදී අධ්‍යාපන අමාත්‍යංශයට රජය වශයෙන් රු. ලක්ෂ 5 ක දඩ මුදලක් ගෙවන්න නියම කළා. එහෙම කළේ ඇයි? ඔය දඩ මුදල ගෙවන්නේ පෞද්ගලිකව, අධ්‍යාපන ඇමතිතුමාගේ පොකැට්ටුවෙන් නෙවෙයිනෙ. අපේ බදු මුදල් තමයි මේ විදිහට ගෙවන්නේ. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ මෙහෙම දෙයක් සිද්ධ වෙන්න, මුළු සමාජයම වග කියන්න ඕනෑ, ඒ වගකීම තමයි එතුමන්ලා ඒ අවධාරණය කරන්නේ. මම හිතන්නේ අපි වඩාත් කැපවීමෙන්, බොහොම සහකම්පනයෙන්, ආදරයෙන් මේ දරුවන්ව රැක බලාගත යුතුයි. මේ ප්‍රචණ්ඩත්වය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළ යුතුයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/4z_ahzpLWLU

https://www.aithiya.lk/child-abuse-in-sri-lanka-dr-tush-wickramanayake/

# 94.පොදු යහපත වෙනුවෙන් කැප 10ක් හිටියොත් මේක ගොඩදාන්න පුලුවන්

## නාට්‍යවේදී එම් සෆීර්

*අපි හරි පටුයි නේද?*



එම් සෆීර්

රජයක් විසින් කළ යුතු දේවල් ටිකක් තියෙනවා. උදාහරණයක් වශයෙන් යටිතල පහසුකම් ගොඩනැගීම. මට බැහැ රඟහලවල් හදන්න. මට බැහැ අති විශාල මහජන අරමුදලක් ගොඩනගන්න. මට බැහැ රජයකට තරම් පොදු වැඩ කරන්න. එතකොට රජය විසින් කළ යුතු වන්නේ යටිතල පහසුකම් ගොඩනැංවීම. මහජන අරමුදල් ගොඩනැගීම. හැමකෙනාටම සමානව දේශපාලන පක්ෂ භේදයකින් තොරව මිනිස්සුන්ට කලාකරුවන්ට යන්න පුළුවන් ක්‍රමයක් හැදීම. හැබැයි නාට්‍යකරුවෝ හිතනවා නම් මම නාට්‍යයක් හදනකොට රජය විසින් මට සියල්ල දෙන්න ඕනෑ. මම නාට්‍යයක් හැදුවට පසු මගේ වගකීම ඉවරයි. රජය තමයි ඉතිරි සියල්ල කරන්න ඕනෑ කියලා, ඒ අදහස හරි පටුයි කියලා මම හිතනවා.

රාජ්‍ය නාට්‍ය උළෙල තියෙන්නෙ රජයේ ප්‍රචාරණය (ප්‍රොපගැන්ඩා) කරන්න තියෙන එක ව්‍යාපෘතියක් වශයෙන් විතරයි. නාට්‍යකරුවෝ සිහින දකින්නේ රාජ්‍ය සම්මාන ගන්න නම්, සම්මාන ලැබුන මිනිස්සු හොඳයි කියනවා. නොලැබිච්ච මිනිස්සු ඒක අසාධාරණයි කියනවා. ඊට පස්සේ අහනවා විනිශ්චය මණ්ඩලවල ඉන්න මිනිස්සු කවුද කියලා? ප්‍රශ්නය වෙන්නේ ඕක දැන් දශක තුනක් තිස්සේම එකම ඇඬියාව. නමුත් නාට්‍යකරුවො හැටියට "අපිට ලංකාවේ ප්‍රමුඛ නගර 1ක එක හා සමාන රංග ශාලා දහයක් හදලා දෙන්න, අපි නාට්‍ය කරන්නම්" කියලා

කියන්න කවුරුත් ඉදිරිපත් වුනේ නැහැ. අපි කවුරුත් ඒකට උත්සාහ කළේ නැහැ. ලංකාවේ නාට්‍යකරුවන්ට අදාළව මහජන අරමුදලක් පිහිටුවන්න, ඒකෙන් හැමෝටම සමාන වරප්‍රසාද දෙන්න කියලා නාට්‍යකරුවෝ ඉල්ලුවේ නැහැ.

*කලා මණ්ඩල පනත*

නාට්‍ය කලාවට අදාළව ප්‍රතිපත්තිමය සහ තීරක බලය සහිත මූලයක් හදන්න කවුරුත් සූදානම් වුණේ නැහැ. උදාහරණයක් විදියට කලා මණ්ඩල පනත තාම තියෙන්නෙ අපිට සුද්දා දීලා ගිය විදියට. යටත් විජිත කලා කවුන්සිල පනත තාම තියෙන්නෙ. ඒක අවස්ථා දෙකක දී කුඩා සංශෝධන දෙකක් ඇරෙන්න කලා මණ්ඩල පනත ලංකාවට ගැලපෙන විදියට පූර්ණ සංශෝධනයක් ඇතිවුණේ නැහැ. අවම වශයෙන් කලා මණ්ඩලය කියන මූලයට මේ රටේ නිශ්චිත කාර්යාලයක්වත් නැහැ. කලා මණ්ඩලයට පත්වෙන මිනිස්සු ගරු තනතුරු හැටියට පත්වෙනවා ඇරෙන්න වැටුප් ලබන තනතුරක් නෙමෙයි. ඒ ගොල්ලො වෙන කරන්න දෙයක් නැති උනහම රැස්වීම්වලට එන තත්ත්වයට පත් වෙනවා එක්තරා කාලයකදී. කලා මණ්ඩලය යටතේ තියන නාට්‍ය අනු මණ්ඩල, සංගීත අනු මණ්ඩල, සාහිත්‍ය අනු මණ්ඩල මේ සියල්ල තමයි ලංකාවේ කලාව සම්බන්ධයෙන් පද්ධතික තීරණ ගන්න පුළුවන් හරි හෝ වැරදි මූලයන් ටික. හැබැයි මේ මූලයන් ශක්තිමත් කරන්න කිසිම දෙයක් වුණේ නැහැ. නාට්‍ය අනු මණ්ඩලය කියන තැනට මේසයක්වත් නැති රටක් මේක.

*අපේ ඉල්ලීම් දියව්..*

ඉතිහාසයේ මොන නාට්‍යකාරයද පාරට බැස්සේ අපේ ඉල්ලීම් දියව් කියලා. එතකොට කවුද ඒවා දෙන්නෙ? අනික මැතිවරණ කාලයට එකතු වෙන පිරිස සිහින දකිනවා ඒගොල්ලන්ගෙ පාලන බලයක් ආවහම මෙතෙක්නොවූ විරූලෙස කලාව තුළ දේවල් වෙයි කියලා. මාස හයක් යනකොට ඒගොල්ලෝ කියනවා “මාර වැඩේ අපිත් හිතුවා. දැන් අපිට ඒ මිනිස්සු හම්බ වෙන්නවත් වෙලාවක් නැහැ කියලා.” ඒකට හේතුව තමයි මෙහෙම ශක්තිමත් ප්‍රතිපත්තිමය

තීරණ අරගෙන වැඩ කරන්න පුළුවන් මූලයක් හැදුණෙ නැතිඑක. තව අවුරුදු පනහකටවත් අපෙන් දශක හතරකට පහකට පස්සේ එන නාට්‍යකරුවන්ටත් මේ ඇඩියාව තියාගන්න වෙනවා. ඉතින් නාට්‍යකරුවො කියන්නේ හිඟන්නො කියන සංකල්පය තව තවත් තහවුරු කරන්නේ නාට්‍යකරුවෝම මිසක් වෙනඅය නෙමෙයි. මම කියනවා මම නාට්‍යකාරයෙක් කියලා. මට කවුරුත් පිළිගැනීමක් දීලා නැහැනේ මම නාට්‍යකරුවෙක් කියලා. මම නාට්‍ය කරලා තියෙනවා, සම්මාන අරගෙන තියෙනවා. හැබැයි මමයි කියන්නේ මම නාට්‍යකරුවෙක් කියලා. පිළිගත්ත කිසිවෙක් කියන්නෙ නැහැනෙ මම නාට්‍යකරුවෙක් කියලා. එතකොට එතන ඉඳලම අපිට තියෙනවා ගැටලුවක්.

***කෝ හඳුනාගැනීම..***

ලංකාවේ සාමාන්‍යයෙන් ලේසියෙන් කරන්න පුළුවන් ක්ෂේත්‍ර දෙක, තුනයි තියෙන්නේ. ලංකාවේ ඕනෑම කෙනෙකුට පොතක් ලියන්න පුළුවන්. ලංකාවේ ඕනෑ කෙනෙකුට ගායකයෙක් වෙන්න පුළුවන්. ඕනෑ කෙනෙකුට චිත්‍රපට හදන්න පුළුවන්. ඕනෑ කෙනෙකුට නාට්‍යයක් කරන්න පුළුවන්. ඒකෙ වැරැද්දක් නැහැ. නමුත් කිසිම තැනක මේක පද්ධතිගත වෙලා නැහැ. හැබැයි ප්‍රශ්නේ තියෙන්නේ එහෙම භාවිතයකට හුරු වෙච්ච කෙනෙකුට ලැබෙන්න ඕනෑ හඳුනා ගැනීම කොහේහරි ව්‍යවස්ථාපිතව තියනවද? අවුරුදු එකේ සිට පහ දක්වා ඕනෑම කලා ක්ෂේත්‍රයක් ඇතුලෙ නියෝජනය කරන පුද්ගලයෙක්ව හඳුන්වන්න පුළුවන් ගෝලීය වචනය තමයි ආධුනිකයා (amateur). වසර 6 ඉඳන් 10 වෙනකම් වැඩ කරද්දි එයා වෘත්තිකයෙක්. වසර 10 සිට 20 දක්වා වැඩ කරද්දි එයා ප්‍රවීණයෙක්. අවුරුදු 30ක් විතර වැඩ කරද්දි එයා කෘතහස්ත කලාකරුවෙක්. අවුරුදු 40 හෝ ඊට එහා වැඩ කරන පිරිස් ජ්‍යෙෂ්ඨ කලාකරුවන්. අවම වශයෙන් එහෙම නිර්ණායක ටිකක්වත් නැති රටක් ඇතුළෙ මේ මැසිවිලි නගනකොට පෙරළා අපිට අපිව කණ්නාඩියකින්
බලාගන්න වෙනවා.

විජය රජ්ජුරුවන්ගේ ඉඳන් 2012 තිබුණු මහින්ද රාජපක්ෂ පාලනය දක්වාම ජාත්‍යන්තර නාට්‍ය උළෙලක් කරන්න බැරිවුණේ

නාට්‍යකරුවෝ ඉල්ලීමක් කරපු නැති නිසාද, නැත්නම් ඒ අදාළ පද්ධතියෙ හිටපු සංස්කෘතික අමාත්‍යාංශයට උවමනාවක් තිබුණේ නැති නිසාද කියන ප්‍රශ්නය තියෙනවා. මේ එකතු වෙන්නෙ නැතුව ඒකරාශී වෙන්නෙ නැතුව තනියම කරන ක්‍රීඩාව නැවැත්තුවේ නැත්නම් තව දශක ගණනාවක් නාට්‍යකරුවන්ට හෝ කලාකරුවන්ට මේ ඇඩියාවම තියාගෙන ගිහිල්ලා අසරණ වුණාම, එක්තැන් වුණාම, ලෙඩ හැදුනාම, අනේ ජනාධිපතිතුමනි! අනේ අගමැතිතුමනි! මම රටට විශාල සේවයක් කරපු කලාකරුවෙක්, මම ගැන අනුකම්පා කරන්න කියන ප්‍රකාශයට යන එක ඉතාම අසික්කිතයි. අපේ අභිමානය තමයි අපි අවසානයේ විකුණන්නෙ. අපිට කලාකාරයෙක් වෙන්න කියලා කවුරුත් කිව්වේ නැහැ. අපි නම් කලාකාරයෙක් වෙන්නේ, ඒකත් අපි භාරගත යුතුයි.

### *එකතුවෙමු නැත්තන් ආත්මයක් නෑ*

ලංකාවේ කිසිම ක්‍රමවේදයක් නැහැ නාට්‍යකරුවෙක් මංගල දර්ශනයක් ඉදිරිපත් කරන කොට ශාලාව 50% ක වට්ටමකටවත් ලබා දෙන්න. ලංකාවේ ශාලා තියනවා හාරදාහක්. නාට්‍ය ශාලා විස්සක් නැහැ. දැනට අපට කොළඹ තියෙන්නෙ ටවර්, එල්ෆින්ස්ටන්, ලයනල් වෙන්ඩ්ට්, බිෂොප්, ලුම්බිණි සහ ජෝන් ද සිල්වා කියන රඟහලවල් ටික. නෙළුම් පොකුණ රඟහලක් විදියට සලකන්න බැහැ. ඒක ශාලාවක්. දැන් එයිනුත් ලුම්බිණිය වහලා. ජෝන් ද සිල්වා වහලා. ලයනල්වෙන්ඩ්ට් පෞද්ගලික ආයතනයක්. බිෂොප් රඟහල එම පාසලෙන් පවත්වා ගෙන යන්නේ. රජය සන්තකව තියෙන්නේ ටවර්, එල්ෆින්ස්ටන් වගේ රඟහලවල් කිහිපයක් විතරයි. මෙන්න මේ ටික ඇතුළත වැඩ කරන්න තමයි අපි ඔක්කොමලා පොරබදන්නේ.

කියන්න තියෙන්නෙ එකම දෙයක්. එකතු වෙන්නෙ නැතුව මේ කාර්ය කරන්න බැහැ කියන තැනයි මම ඉන්නේ. අවුරුද්දක් නාට්‍ය කලාවේ පොදු යහපත වෙනුවෙන් කැපවෙන්න පුළුවන් මිනිස්සු දහ දෙනෙක් එකතුවුණොත් මේ ප්‍රශ්න ගොඩක් ඒවට විසඳුම් හොයන්න පුළුවන් කියන එකයි මගේ අදහස.

දැන් අපි ඉන්නේ අපේ සතුට වෙනුවෙන් නාට්‍යයක් කරලා සම්මාන ලැබුණාම හොඳයි කියන, සම්මාන නොලැබුනහම අපේ නාට්‍යට විශාල

අසාධාරණයක් කරනවා කියන කලාකාරයො පිරිසක් එක්ක. ඔවුන් සමගයි අපිට වැඩ කරන්න වෙලා තියෙන්නේ. මට තේරෙන ආකාරයට මම හොඳ උදාහරණක්.

***මේක කුහකකම***

මම ජාත්‍යන්තර නාට්‍ය උළෙලක් කළා. මේ රටේ කිසිම කෙනෙකුට කරන්න බැහැ කියලා අභියෝග කරද්දී. මට මතකයි 2001දි මගේ "ඔය දොර අරින්න" නාට්‍යය ඉන්දියාවේ එන්.එස්.ඩී නාට්‍ය උළෙලට ඉදිරිපත් කරන්න, එම නාට්‍ය උළෙලට ගිය ප්‍රවීණ නාට්‍යකරුවන් හය දෙනෙක්ගාව මම වැඳවැටුණා මට ඊ-මේල් ලිපිනය දෙන්න කියලා. මට ඒ කිසි කෙනෙක් ඒක ලබාදුන්නෙ නැහැ. දැන් ඒ එන්.එස්.ඩී එකේ මම උගන්වනවා. මම තනිවම හොයාගෙන ගියේ. මේ රටේ විශ්ව විද්‍යාලවලට මාව ඕනෙ නැහැ. හැබැයි ඉන්දියාවට, රුමේනියාවට, බංග්ලාදේශයට, ප්‍රංශයට මාව ඕනෑ. ඇයි? මොකක්ද මේ අවුල? කුහකකමයි අනිකාගේ දැනුම ලබා ගන්න තියෙන මහ අසික්කිත අකමැත්තයි අපි මේ අත් විඳින්නෙ. මේක මම විතරක් නෙමෙයි. සියලු දෙනා අතීතයේ ඉඳන් අත්විඳිනවා. සුගතපාල ද සිල්වා වගේ මිනිස්සුන්ටත් මේ අවස්ථාව අපේ රටේ ලැබුණේ නැහැ. හෙන්රි ජයසේනලා වගේ මිනිස්සුන්ව මම දන්න තරමින් විශ්වවිද්‍යාලවලට කතා කළේ නැහැ. මේ රට ඇතුළේ. ගෝත්‍රයයි කුලයයි එක්ක තමන්ගේ පැවැත්ම හදා ගත්තට පස්සේ, තමා ස්ථාවර වුණාට පස්සේ, අනෙකාට කෙලවීම තරම් තවත් සතුටක් මේ ගොඩක් අයට නැහැ.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/680I0WkFSe4

https://www.aithiya.lk/arts-council-act-playwright-in-sri-lanka-m-safeer/

# 95. වස විෂ නැති ආහාර ඕනෑ නම් මිනිස්සු ඒ ගැන හඬ නැඟිය යුතුයි

## වෛද්‍ය සංකල්ප මාරසිංහ

***විස පොල්තෙල් පිළිබඳව ප්‍රමිති ආයනයත් රජය පාර්ශවයත් නිසි වගකීම් සහගත ප්‍රතිචාරයක් නැහැ. එක එක කතා කියන්නේ...***



වෛද්‍ය සංකල්ප මාරසිංහ

මේකෙදි වෛද්‍යවරයෙක් විදියට මට කියන්න පුලුවන් කාරණාව තමයි අපි මහජනතාව සහ වෘත්තිකයන් හැටියට මේ කාරණාවදී ආහාරවල සුරක්ෂිතතාවය, එනම් ආහාරවල පෝෂණය සහ අහාර කොතරම් දුරකට වස විෂෙන් තොරයිද කියනඑක සැහෙන්න වැදගත් බව. අපිට ආහාරයකින් පෝෂණය ලැබෙනවාත් සමගම අපිට එම ආහාර නිසා යම් රෝගයක් කරදරයක් නැතිවෙන්න ඕන. ලංකාවේ ගොඩක් අයට මේ පිළිබඳව නිසි අවබෝධයක් නැහැ. පාරිභෝගිකයන්ට මේ පිළිබඳව අවබෝධය නැති නිසාම කාලයක් තිස්සේ අපි ඇගට ගන්න ආහාරවල සමහරවිට ඇගට නුසුදුසු විෂ සහ අන්තරායකර ද්‍රව්‍ය ඇතුලත් කර ගත්තා වෙන්න පුලුවන්.

ඇෆ්ලාටොක්සීන් කියන පළිකාකාරක විෂද්‍රව්‍ය පොල්තෙල් තොග යක තිබිලා අහුවුනා කියන මේ පුවත සමග ලොකු ආන්දෝලනයක් ඇතිවෙන්නේ මෙන්න මේ තත්ත්වය අස්සේ. පැවති මාධ්‍ය හමුවකදී විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂා අංශය, ඉතා පැහැදිලිවම කිව්වා මේ ඇෆ්ලාටොක්සීන් පරීක්ෂාව එහෙම නැත්නම් පොල්තෙල් සම්බන්ධයෙන් කරන පරීක්ෂාව අද ඊයෙක පැවති දෙයක් නෙවෙයි සෑහෙන කාලයක් තිස්සේ තියෙන එකක් කියලා.

ඒ වගේම රේගුවේ ප්‍රධානියා සමග ඒ විද්වත් මණ්ඩලය සාමූහිකව එකගවුණා විශාල වශයෙන් ලංකාවට පොල්තෙල් තොග ආනයනය කරන්න පටන් ගත්තේ ගියවසරේ සැප්තැම්බර් මාසයට පස්සේ කියලා. ඒ සමග තමයි ඇෆ්ලාටොක්සීන් වැඩි වශයෙන් මෙරටට එන්නේ. නමුත් ඇෆ්ලාටොක්සීන් පොල්තෙල් වැනි ධාන්‍ය ආශ්‍රිතව කෙරෙන තෙල් නිස්සාරණයේ තිබෙනවා කියනඑක විද්‍යාත්මකව සහ වෛද්‍ය විද්‍යාත්මකව අද ඊයේ හොයාගත් දෙයක් නෙවෙයි. ඒක අපි කාලාන්තරයක් තිස්සේ දන්න දෙයක්. විශේෂයෙන්ම මේ ඇස්ෆජිලස් ෆ්ලේවස් කියන දිලීරයෙන් තමයි මේවා නිශ්පාදනය වෙන්නේ. රටකජුවල තමයි ප්‍රධාන වශයෙන්ම තියෙන්නේ. උදාහරණයක් වශයෙන් 2019 පලකරපු වෛද්‍ය විද්‍යාත්මක ප්‍රකාශනයක් තියෙනවා, ඒකෙදී නිරීක්ෂනයක් ලෙස වෙළඳපොළ ඇති ඔවුන් පරීක්ෂාවට ලක්කරපු නියදිවලින් 38%ක ඇෆ්ලාටොක්සීන් තිබෙනබව හොයාගෙන තියෙනවා.

*වගකීවයුතු රටක් අස්සට මෙහෙම විෂ රසායන අඩංගු ආහාර ද්‍රව්‍ය එන්න පුලුවන්ද?*

අපේ වගේ රටක් අස්සට විෂ රසායන එන්න පුලුවන් ඉඩක් තියෙන බව තමයි මේ සිද්ධිය අපිට කියන්නේ. රට ඇතුලට විතරක් නෙවෙයි දැන් අපේ කඩවල් වලටත් ගිහින් තියෙනවා. එහෙම වෙන්න පුලුවන්ද. මේකෙන් කියවෙන්නේ රටක් විදිහට අපි කොතරම් දුරකට අසාර්ථකයිද කියන කතාව. අපේ සිස්ටම්ස් හරියට වැඩකරන්නේ නැහැ කියනඑක. ඕස්ට්‍රේලියාවට ගිහින් තියෙන කෙනෙක් දන්නවා අඳුරන කෙනෙක්ටවත් කෑම ටිකක් යවන්න බැහැ. යවනවා නම් පරීක්ෂණ කීපයකට ලක්කරලා සීල් කරලා, ලේබල් කරලා, පැක් කරලා යවන්න ඕන. නැත්නම් කොහෙත්ම යවන්න බෑ. ඒ වගේ ඒ රටවල් තුළ ඉතාම දෘඩ ආරක්ෂක ක්‍රමවේදයන් තියෙනවා. විශේෂයෙන්ම අහාරවලට. ලංකාවේ ඇත්තටම ඒම ක්‍රමවේද නැත්තටම නැහැ කියන්න බැහැ. අපි බැලුවොත් ආහාර ආරක්ෂක අංශයක් විශේෂයෙන්ම පවත්වගෙන යනවා. ඒවයේ විශේෂඥවරු සහ රජයේ නිලධාරීන් වැඩ කරනවා. ඒ අයගේ දෛනික රාජකාරිය හැටියට මේවා කරනවා. නමුත් ඒ කරන දෙයින් ප්‍රතිලාභ මහජනතාවට ගලා යනවාද කියලා බලන්න ඕන. මේ වෙනකොට විශාල ව්‍යාකූලතාවක් තියෙනවා කියලා පේනවා විෂ පොල්තෙල් ගත්තාද, ආපහු යැව්වාද, කඩවලට නිකුත් කරාද නැද්ද

කියලා. මහජන විශ්වාසය බිඳවැටිලා මහජනතාව අපෙන්, දන්න අයගෙන් අහන්නේ මේ පොල්තෙල් හොඳයි ද කන්න පුලුවන්ද කියලා.

***දැන් විස සහිත පොල්තෙල් වෙළඳපොලේ නෑ කියලා කවුරුත් විශ්වාස කරනවද?.***

විශ්වාස කරන්නේ නෑ. විශ්වාස කරන්න මිනිස්සුන්ට බැහැ. මොකෝ ඒ විශ්වාසය ගොඩනැඟීම නැහැ. මම මීට ටික මොහොතකට පෙර දැකපු දෙයක් තමයි සුපර්මාකට් එකේ තෙල් තියෙන සෙක්ෂන් එකේ කාන්තාවක් තෙල් රාක්ක දිහා නිකං භාවනා කරනවා වගේ බලාගෙන ඉන්නවා. විශ්වාසයක් නෑ කියන එක තමයි ඒකෙන් පේන්නේ. ජනතාව ආරක්ෂා කරන යාන්ත්‍රණය පිළිබඳ මහජන විශ්වාසය නැත්තං එම ආයතන පැවතීමෙන් පවා තේරුමක් නෑ.

දියුණු රාජ්‍යයක නම් මම හිතන්නේ නැහැ, ප්‍රමිති ආයතනය වගේ තැනක ඔහොම ප්‍රකාශ කරපු කෙනෙක්ට ඒ තනතුරේ ඉන්න හම්බෙයි කියලා. ඒකෙම අනිත් පැත්ත තමයි සාමාන්‍ය ව්‍යාපාරිකයෙකුට සදාචාරාත්මක අයිතියක් තියෙනවද මෙහෙම විස සහිත භාණ්ඩ ගේන්න.

ඇත්තටම එතන තමයි ගැටලුව තියෙන්නෙ. වගකීම සහ වගවීම අතර ප්‍රශ්නයක් මෙතන තියෙන්නේ. මේ දේ ඇතිවෙන්න නම් යම් ආයතනයක් හෝ තැනැත්තෙක් වැරැද්දක් කළොත් ඒ වැරැද්දට දෙන දඬුවම මොකද්ද කියන දේ වැදගත්. යම්කිසි ව්‍යාපාරිකයෙකු පරිභෝජනයට නුසුදුසු යම් දෙයක් ආනයනය කළොත් ඒ ව්‍යාපාරිකයාට දිගුකාලිනව බලපැවැත්වෙන යම්කිසි දඬුවමක් පැනවිය යුතුයි. විශේෂයෙන්ම මහජනතාවට පොදුවේ බලපාන සෞඛ්‍ය ගැටලු ඇති කරන දේවල් ආනයනය කළොත්, වසර පහළොවක් විස්සක් හෝ ආහාර වැනිදේ ආනයනය කිරීම තහනම් කරන ක්‍රමවේදයක් තිබිය යුතයි. ඒ තුළින් තමයි ඒ හික්මීම ලැබෙන්නේ. නැත්නම් අද පරිභෝජනයට නුසුදුසු බී ලූණු ගෙනල්ලා හදිස්සියේ එය යම් වැටලීමකට ලක් වුණොත් හෙට ඒ අය කරවල ගේනවා. නැත්නම් අනිද්දට පරිප්පු ගේනවා. මේ දඬුවම් කිරීමේ ක්‍රමවේදයට සමහරවිට පොඩි මනුස්සයෙක් මොන හරි ගෙනාවම ඒ මනුස්සයා අහු වෙනවා. නමුත් විශාල ව්‍යාපාරිකයෙක් ලේසියෙන්ම ගැලවිලා යනවා. අපි මේ එස්එල්එස් හරි ෂීධ හරි දෙන්නේ ඇයි. මෙහි වගකීමක් යම් කිසි

ආයතනයක් ගන්නවා කියලා මහ ජනතාවට එයින් දන්වන්න. නමුත් ආයතනයකින් එහෙම කිව්වට ඒ වගකීම ගන්නවා කියලා අපි විස්වාස කරන්නෙ නැත්තං, විශ්වාස කරන්නේ නැති තැනට එක ෆෙල් වෙලා නම් එවැනි ආයතන පැවතීමේ ඇති වැඩක් නෑ. එතකොට සම්පූර්ණ සිස්ටම් එකම කඩා වැටෙනවා.

***නුවරඑළිය ගත්තොත් එහි ගොවියා තමන්ටම කියලා පොඩි කොරටුවක් නඩත්තු කරනවා, ඒකට වස විෂ මොකවත් යොදන්නේ නැහැ, මේ කතාව කියන්නේ අපි රට අස්සේ නිශ්පාදනය කරගන්න ආහාරවලත් මේ ප්‍රශ්නය තියෙනවා කියනදේ නේද?***

ආහාරවල තියෙන සුරක්ෂිතතාව සම්බන්ධයෙන්, වස විෂෙන් තොර වීම සම්බන්ධයෙන් පසුගිය කාලෙ රට අස්සේ ලොකු සාකච්ඡාවක් තිබුණා උනාට අපි මහජනතාව වශයෙනි තවමත්, සෞඛ්‍යාරක්ෂිත ආහාරයක් ලැබෙන්න ඕන කියනඑක ගැන නැඟී සිටිනවා මදි කියලයි මගේ අදහස. අපි මහජනතා වශයෙන් ඉල්ලා සිටින්න ඕන රජයෙන්, අදාළ ආයතනවලින් පොදුවේ අපට ලැබිය යුතුයි සහ සුරක්ෂිත කළ යුතුයි කියලා අපිට ලැබෙන ආහාරය සහ එහි සෞඛ්‍ය ආරක්ෂිත බව. එක තමයි රජයක වගකීම. ජනතාවට සේවය කරන රජයක වගකීම එක තමයි. උදාහරණයකට අඹ ගෙඩි 10යක් කඩෙන් ගත්තොත් ගෙදර අරන් ගියාම ඒකෙන් කීයක් අපිට කන්න පුලුවන් තත්ත්වයක තියෙනවද? පහක්වත් කන්න බෑනේ අපිට හුඟක් වෙලාවට. සාමාන්‍යයෙන් කර්තකොලොම්බන් වර්ගය අඹ ගෙඩියක් රුපියල් දෙසීයකට ආසන්නයි මිලත්. ඇපල් ගෙඩියක් රුපියල් 80යි. ඉතින් ඔබ ගත්තොත් ලංකාවේ එක ඇපල් ගෙඩියක්වත් හැදෙන්නෙ නෑ. ලංකාවේ සුපර් මාර්කට්වල ඕනම දවසක ඕනෑම වෙලාවක ඇපල් තියෙනවා. ඇපල් ගැන විවිධ කතා තිබ්බට ඇපල් ගෙඩි පහක් අරන් ගියොත් බොහෝ වෙලාවට අපිට ඇපල් ගෙඩි පහම කන්න පුළුවන්. එතකොට ඇපල් නිෂ්පාදනය කරන රටවල් දියුණු තාක්ෂණය භාවිතා කරලා සුරක්ෂිතව ඒ අපනයන කටයුතු කරනවා. ඉතින් ඒ හරහා ඒ ආහාරය සුරක්ෂිතභාවය ඇති කරලා තියෙනවා. අල්පෝන්සු කියන අඹ වර්ගය ලංකාවේ වෙළෙඳපොළ තියෙනවනේ. ඒවා වෙළඳ නාමයක් සමග එන්නේ. ඉතින් කරත්ත කොලොම්බන් අඹ ගෙඩියයි අල්පොන්සු අඹ ගෙඩියයි ගත්තොත් විශේෂම සුරක්ෂිතභාවය සහ කොලිටි සලකද්දි අල්පොන්සු අඹ ගෙඩිය වඩා හොඳයි කියන එක කියන්න වෙනවා.

මොකද ඒක යම්කිසි ප්‍රමිතිකරණයකට යටත්ව තමයි නිශ්පාදනය සහ ඇසිරීම ප්‍රවාහනය කරලා තිබෙන්නේ. එතකොට ඇයි අපි ඉල්ලන්නේ නැත්තෙ අපිට කර්තකොලම්බන් අඹ ගෙඩියකුත් මෙහෙම දෙන්න කියලා. අපි ආහාරවල විතරක් නෙවෙයි කිසිම දෙයක ප්‍රමිතිය එතරම් තකන්නේ නැති ජාතියක්. මගෙ අදහස මහජනතාව හැමවෙලේම ඒ සඳහා නැගී සිටින්න ඕන කියන එකයි.

යම්කිසි ආහාර නිෂ්පාදනයක එම අදාළ සංඝටක සහ දේවල් නැත්නම් ඒක හොර බඩුවක්. එය තහනම් වෙළඳ වෙළෙඳ භාණ්ඩයක් බවට පත් වෙන්න ඕන. අන්න ඒ මට්ටමට රටේ නීතිය තහවුරු වෙන්න ඕන. උදාහරණයක් වශයෙන් යම් ආහාරක ඇති කල්තබා ගැනීමේ දේවල්, රසකාරක යම් රාමුවක් ඇතුලේ නාමකරණය කරන විදිහක් තියෙනවා. දැන් අපි කීයෙන් කී දෙනෙක් බලනවද සැකසූ ආහාරයක් ගන්නකොට පැකට්ටුවේ තියෙන රසකාරක, වර්ණකාරක සහ කල්තබා ගැනීමේ කාරක කොහොමද කියලා. අපි ඒ පිළිබඳ අඩුම ගානේ සැලකිලිමත් වෙනවාද? දැනුවත්ද.

නිශ්පාදකයා කියනදේ ආහාරය තුළ නැත්නම් සහ නිශ්පාදකයා කියනදේට අමතර දෙයක් ආහාරය ඇත්නම් ඒ පිළිබඳ දැඩි විරෝධයක් එල්ල වෙන්න ඕන. දැන් උදාහරණයක් වශයෙන් ගත්තොත් කිරිපිටි වර්ගවල, වෛද්‍යවරුන් විදියට අපි ජීවිතේට අහලා නැති විටමින් වර්ග සහ අංශු ගැන වෙළඳ ප්‍රචාරයන් යනවා. එහෙම ඒවා ලෝකෙ හොයාගෙනත් නෑ තාම. ඒ වාගේම මොළේ වර්ධනය වෙනවා, අස්ථි වර්ධනය වෙනවා වාගේ විවිධ ඒවා කියනවා. ඉතින් මේ වගේ විවිධ දේවල් කරන්න ඉඩ දෙන්න බැහැ. ඒකට නීතිය රජයෙන් ගෙනාවේ නැත්නම් ජනතාව ඉල්ලලා හරි ගන්න ඕන. එහෙම කරන්න බෑ. හුඟක් අය හිතන් ඉන්නවා පොඩි අයට දෙන කිරිපිටිවල මොළේ වර්ධනය වෙන විශේෂ දෙයක් තියෙනවා කියලා. ඇත්තටම හුඟක් වෙලාවට කරන්නේ කිරි ආහාරයක තියෙන සංඝටකයකට ඔවුන් වෙන නමක් දෙනවා. හැබැයි ඒකත් අනික් ඒවා වගේම තමයි.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/363vUI3qh8Q

https://www.aithiya.lk/aflatoxin-foods-sri-lanka-standards-institution-sls/

# 96. පරිනතබව තීරණය වෙන්නේ ජීවත්වුණ අවුරුදු ගානෙන් නෙවෙයි

## නීතීඥ චරිත් ගල්හේන, ජාතික ජන බලවේගය

***දැන් අපි දැක්කා ඔබ ජාතික ජනබලවේගය නියෝජනය කරමින් අපේක්ෂකයෙක් විදිහට ඉදිරිපත් වුණා, තරුණයින් විශාල ප්‍රමාණයක් හිටිය මැතිවරණ ව්‍යාපාරය තුළ, ඒත් අවසාන ප්‍රතිඵලය දී ඒ තරුණයන්ට ජනතාව ආකර්ෂණය වුණේ නැති බවක් තමයි පෙනුණේ..***



නීතීඥ චරිත් ගල්හේන

ඇත්තටම එහෙම ජනතාව ආකර්ෂණය නොවීමක් නෙවෙයි සිද්ධ වුණේ, ඒ කියන්නේ ජනතාව ඇත්ත වශයෙන්ම විකල්පයක් හොයනවා එතකොට ඒ විකල්පය කොහොමද කියලා දකිනඑක තමයි ප්‍රශ්නය. මීට අවුරුදු දහයකට පහකට පෙර බලනකොට මේ රටේ තිබ්බේ පාට දෙකක් අතර නැත්තං පක්ෂ දෙකක් අතර බලය හුවමාරු වෙන ක්‍රමයක්. දැන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වෙනකොට මේක වෙනස් වෙලා තියෙනවා. පවතින දේශපාලන ධාරාවෙන් පිටස්තර පුද්ගලයකුට බලය දෙනවා කියන විකල්පයට තමයි මිනිස්සු ගිහිල්ලා තියෙන්නෙ. අර තිබ්බ සාම්ප්‍රදායික දේශපාලන ක්‍රමය ක්‍රමයෙන් වෙනස් වීගෙන යනවා. හැබැයි ඉතින් මේ මිනිස්සු තෝර ගත්ත දේ විකල්පය ද කියනඑක තමයි අද දවසේ ප්‍රශ්න ගත කාරණාව වෙන්නෙ. ඊළඟට අනික් කාරණාව තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගන්නකොට හා මේ ආණ්ඩුව තෝරා තෝරාපත්කර ගන්නකොට ජනතාව බලපු කෝණය සාම්ප්‍රදායික කෝණයට වඩා වෙනස්. තමන්ට මොනවද ලැබෙන්නේ කියලා කියනඑක නෙවෙයි ජනතාව බැලුවෙ, ජනතාව

බැලුවේ පොදු අරමුණක ඉඳන්. නමුත් අද වෙනකොට ඒ පොදු අරමුණු ඉෂ්ඨ වෙලා තියෙනවද? ඒ අපේක්ෂාවන් මල්ඵල ගැන්විලා තියෙනවද?.

***පාර්ලිමේන්තුව ගත්තොත් ඕනම රටක ප්‍රතිපත්ති සම්පාදනය කරන තැන. වෙන රටවල්වල තරුණයෝ තමයි පාර්ලිමේන්තුවේ වැඩි ප්‍රතිශතයක් ඉන්නේ. දැන් පින්ලන්තය වගේ ගත්තොත් අගමැතිත් තරුණ කෙනෙක්. එතකොට වයස අවුරුදු තිහත් හතළිහත් අතර වයස පරතරය තියෙන අය තමයි ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ. නමුත් අපේ රටේ තාම ආකල්පයක් තියෙනවා තරුණයෝ පරිණත නෑ කියලා.***

දේශපාලනයේදී පරිණත බව අවශ්‍යයි, පරිණත බව කියන්නේ රටක් පාලනය කිරීමේදී අවශ්‍ය වන කාරණාවක්, හැබැයි ඒක තීරණය වෙන්නේ ජීවත්වෙන අවුරුදු ගාණ සමග නෙවෙයි. පරිණතවීම වෙන්න ඕන පුද්ගලයෙකුගේ දැනුම ආකල්ප සහ ඔවුන් ගන්නා තීරණ අනුව. දැන් ඔය අපි කතා වෙච්ච රටවල් ගත්තහම ඒ අය විවෘත ආර්ථිකයත් එක්ක හිටපු ධනවාදී ආර්ථිකයත් සමග ඉඳලා ධනවාදයෙන්ම ඉස්සරහට ගියපු අය. අපි තාම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට පවා ලාබාල ජාතියක්. දැන් අපි හිතන් හිටියට මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තියෙනවයි කියලා, මේ රටේ ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පවතින්නේ 1948 ඉඳලා 1978 දක්වා ඉතා සුළු කාලසීමාවක් පමණයි. එතකොට අවුරුදු 30ක වගේ සුළු කාලසීමාවක් තමයි පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ පරිණත බවක් තියෙන්නේ. එතකොට මේ රටේ තරුණයා පමණක් නෙවෙයි නෙවෙයි, ජනතාව ද ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් පරිණත නැහැ.

මේ රට ගත්තොත් 1971, 1989 කාලයේ තරුණයා දේශපාලනිකව නැගිට්ට රටක්. එතකොට මේ අවස්ථා තුනේදීම සන්නද්ධ අරගලවලට ගිහිල්ලා විශාල ජීවිත ප්‍රමාණයක් නැති වෙනවා. එහෙනම් අපි කල්පනා කරලා කරලා බලන්න ඕනි අර ඔබ කිව්ව කාරණාව, මේ රටේ ඇත්ත වශයෙන්ම දේශපාලනය තරුණයාට විවෘත ද, වර්තමාන පාර්ලිමේන්තුවේ ඉන්න තරුණයා ගත්තහම තමන්ගේ අම්මගෙ න් තාත්තගෙන් තමන්ට උරුම වෙච්ච දේශපාලන බූදලය අරගෙන

පාර්ලිමේන්තුවට ආපු කෙනෙක්. වර්තමාන පාර්ලිමේන්තුවේ ඉන්න තරුණයා පාර්ලිමේන්තුවේ ගාමක බලවේගයක් ද? ඒ තරුණයාට මේ ක්‍රමවේදය වෙනස් කරන්න පුලුවන්ද? උත්තරය බැහැ කියන එක.

***දේශපාලන ධාරාවේ දැන් ඉන්න වයසක අය තමන්ගේ පක්ෂයේ ඉහළට තරුණයෙක් එනවට අකමැත්තක් තිබෙනවා නේද? ඔවුන් සත්භාවයෙන් තමන්ගේ අසුන ඊළඟ පරම්පරාවට දෙන්න පොඩ්ඩක් පස්ස ගහනවා නේද?***

ඒක ඇත්තටම තරුණයන් එනවට තියෙන අකමැත්තක් නෙවෙයි, ඔය ප්‍රශ්නෙ ගැඹුරට ගිහිල්ලා බැලුවොත් එහෙම මේ ඉහළ ස්ථරයේ ඉන්න නායකත්වයට තියෙන අවශ්‍යතාවය තමන්දාලා යනකොට තමන්ගේ පුතාව ගේන්න තියෙන අවශ්‍යතාවය . එතකොට අද රටේ බලය එක පවුලක් අතේ තියාගන්න ක්‍රමයක් තමයි තියෙන්නෙ. සේනානායකගෙන් බණ්ඩාරනායකට හුවමාරු වීම බණ්ඩාරනායකගෙ න් නැවතත් සේනානායකට හුවමාරුවීම ඉන්පසු ජයවර්ධන ලා වික්‍රමසිංහ ලා ඔහොම ගිහිල්ලා මේ වනකොට රාජපක්ෂලාට මේ බලය ඇවිල්ලා තියෙනවා. ඒ අනුව මේ දේශපාලනයේ ඉන්නේ රාජපක්ෂ පවුල විතරයි. ඒ නිසා රාජපක්ෂ පවුල කැමති නැහැ මේ බලය වෙන කෙනෙක් අතට දීලා යන්න. මොකද වෙන නමක් රටේ බලයට එනවට ඔවුන් කැමති නැහැ.


---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/xtAWZELPYLQ

https://www.aithiya.lk/political-situation-youth-issues-in-sri-lanka-charith-galhena/

# 97. තොරතුරු පනතේ උදව්වෙන් පාරක් හදාගත්ත දයාරත්නගේ කතාව


ආර්.ඩී. දයාරත්න

ආර්.ඩී. දයාරත්න මහතා ජීවත් වෙන්නෙ බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇළ ප්‍රදේශයේ. ඔහු දවසෙ කුලියක් මලියක් කරගෙන ජීවත්වන අහිංසක අසරණ ගම්වැසියෙක්. ආබාධිතයෙක්. ඔහු ඔහුගේ නිවසට සහ තවත් නිවෙස් පොකුරක් ඉලක්ක කර මාර්ගයක් කපාගන්න ඉඩ ඉල්ලනවා, ඒ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, ඇත්තටම ඔහු ඉල්ලන්නේ පිඹුරුගත මාර්ගයක්. නැති පාරක් නෙවෙයි ඔහු ඉල්ලන්නේ. ඔහුට පයින් යන්න අපහසුයි, ගෙදරටම වාහනයක යන්න තියෙයිනම් කොච්චර දෙයක් ද? ගමේ ප්ලෑනේ එතනින් පාරක් තියෙනවා, ඔහු ඒක තමයි ඉල්ලන්නේ.

2015 ඉඳලා ඔහු ලියුම් ලියනවා. ඔහුම කියන ආකාරයට ඔහු රුපියල් හතලිස් අට දහසක පමණ මුදලක් වියදම් කරලා තියෙනවා මේ ලියුම් ලිවිල්ලට විතරක්. දයාරත්න මහත්තයාගේ දවසේ වැඩ කුලියත් එක්ක බලද්දි ඒක අති විශාල මුදලක්. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට, පරිපාලන අමාත්‍යංශයට, ඉඩම් අමාත්‍යංශයට, හිටපු ඉඩම් අමාත්‍යවරයාට, හිටපු පරිපාලන අමාත්‍යවරයාට, ජනාධිපතිට, අගමැතිට මේ සෑම ආයතනයකටම සෑම කෙනෙකුටම ලියපු ලියුම් මිටියක් ඔහු අතේ තියෙනවා. ඉහළ ආයතනවලින් කියලා තියෙන්නෙත් මෙම පාර ලබා දෙන්න කියලා. ග්‍රාම නිලධාරීටත් ලිඛිතව ලිපියක් නිකුත් කරලා තියෙනවා.

මේ අවසරය එක දවසින් දෙන්න පුළුවන්. නමුත් වසර පහක් ඔහු මේකට රස්තියාදු වෙනවා. අහන අහන හැම කෙනෙක්ම දයාරත්න මහත්තයාට කිව්වෙත් පිඹුරේ තියෙනවා නම් පාර ගන්න පුළුවන්

කියලා. දිස්ත්‍රික් ලේකම්ගේ නියෝග ලැබුණත්, හාලිඇල හිටපු ප්‍රාදේශීය ලේකම් මේ වැඩේ කරලා දුන්නෙ නැහැ කියලායි දයාරත්න මහත්තයාගේ චෝදනාව. ප්‍රාදේශීය ලේකම්තුමිය දිස්ත්‍රික් ලේකම්ට සහ ඉඩම් කොමසාරිස්ට ලිපි දෙකක් ලියලා තියෙනවා, මේ පාර ලබා දුන්නා කියලා. ඒක බොරුවක් බව ඔප්පුවෙන්නේ තොරතුරු දැනග ැනීමේ පනත යටතේ අයදුම් කර අදාළ විස්තර ලබා ගැනීම නිසා. තමන්ව මේ විදිහට නොමග යැව්වේ ඇයි කියලා දයාරත්න මහත්තයා ප්‍රශ්න කරන්නේ වේදනාවෙන්. පාර නොදී පාර දුන්නා කියලා තමන්ට ඉහළ ඉන්න නිළධාරීන්ට ව්‍යාජ තොරතුරු දෙන්න මේ ප්‍රදේශීය ලේකම් කටයුතු කරනවා. ඒක හසුවෙන්නේ තොරතුරු පනත නිසා.

දයාරත්න මහතාගේ නිවසට පහළින් ජීවත්වෙන පවුලක් මේ මාර්ගය ලබාගන්නට යැමේදී බොහෝ අකුල් හෙළනවා, ඒ ඔවුන්ගේ තේ වගාවෙන් යම් සුළු කොටසක් පාරට යටවෙන නිසා. මේ මිනිසුන්ගේ කියුම් බහට ප්‍රාදේශීය ලේකම් යටවුණා කියලා තමයි දයාරත්න කියන්නේ. ඒත් දයාරත්න මහත්තයා ඉල්ලන්නේ පිඹුරේ තිබෙන මාර්ග යක්. ඔහු ඔහුගේ අසනීප තත්ත්වයත් තියාගෙන, අතේ මුදලුත් වියදම් කරගෙන ගමන් වාර ගණනාවක් ඇවිදිනවා, මේ වෙනුවෙන්. දිසාපති ලිපි ලේඛන මගින් පාර ලබා දෙන්න කියලා දැනුම් දීලාත් ප්‍රාදේශීය ලේකම්තුමිය මේ වැඩේ මඟඇරලා තියෙන්නෙ, පාර තමන්ගෙ සාක්කුවෙන් යනවා වගේ කියලා තමයි දයාරත්න මහත්තයා කියන්නේ. ඇය මේ පාර ලබාදීම ප්‍රතික්ෂේප කරලා තියෙන්නේ “පාරවල් දෙකක් දැනටත් තියෙන නිසා තවත් පාරක් දෙන්න බැහැ” කියන පදනමෙන්. ඒ ඇය දයාරත්න මහතාට කියපු කතාව. එහෙත් ඔහු ප්‍රශ්න කරන්නේ පාරවල් තියෙනවා නම් මෙතරම් කරදර වෙලා තව පාරක් ඉල්ලන්නේ මොකටද කියලයි.

ප්‍රාදේශීය ලේකම්වරිය මෙලෙස පාර ලබානොදී එක එක දේවල් කියනකොට ඔහු උඃව ශක්ති පදනමේ අනුග්‍රහයෙන් තොරතුරු දැනග ැනීමේ පනත යටතේ තොරතුරු ලබාදෙන්නැයි ඉල්ලීම් කරනවා, එහිදී අදාළ රාජ්‍ය නිළධාරිනිය කියන්නේ මොකද්ද?
“එවැනි පනතක් නැහැ, ඔයාල හිතන හිතන විදියට ඒ තොරතුරු දෙන්න බැහැ.” කියමින් එම ඉල්ලීම් පවා ප්‍රතික්ෂේප කරන්න ඇය කටයුතු කරනවා. ඔහු මේ පාර ඉල්ලන්නේ තමන් වෙනුවෙන් විතරක්

නෙමෙයි, දැනට ඒ ආසන්නයේ ජීවත්වන පවුල් අටක් සහ තේ වතුවල වැඩකරන මිනිසුන් ඇතුළු හැමෝටම යන්න එන්න තමයි ඔහු මේ පිඹුරුගත මාර්ගය ඉල්ලන්නෙ. කොහොමහරි දීර්ඝ අරගලයකින් පස්සේ පාර කැපෙනවා. මේ මිනිසා ජීවත්වෙන නිවසට අපි ගියා. ඔහු දැන් ජීවත්වෙන්නේ රටක් රාජ්‍යක් ලැබුණා වගේ සතුටින්. ඔහුගේ ඊළඟ අරමුණ මේ මාර්ගය කොන්ක්‍රීට් කිරීම. ඔහුගේ ධෛර්යය නිසා ඒක ඔහුට බැරිවෙන එකක් නැහැ. ඔහු කියන්නේ ඌව ශක්ති පදනම, රයිට් ටු ලයිෆ් මානව හිමිකම් ආයතනය සහ තොරතුරු දැනගැනීමේ පනත නිසා ඔහුට මේ මාර්ගය ලබාගන්න හැකිවුණා කියලා.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/VJWuiKZGE5s

https://www.aithiya.lk/right-to-information-commission-rti-act-sri-lanka/

# 98. පොලිස් වදහිංසාවට තවත් උදාහරණයක්



මධුශංක

*රටක නීතියේ පාලනය සහ සාමය පවත්වාගෙන යෑම සඳහා ස්ථාපිත ප්‍රධානතම ආයතනය පොලීසියයි. සැමට නීතිය එකසේ ක්‍රියාත්මක කිරීමද පුද්ගල නිදහස සමාජය තුළ ස්ථාපනය කර පවත්වාගෙන යාමද පොලීසියේ ප්‍රධාන කාර්යයන් ය. එහෙත් එවන් අරමුණකින් ක්‍රියාත්මක වියයුතු පොලීසිය තුළින්ද නිතර නිතර මිනිසුන් වදහිංසාවන්ට පාත්‍ර කිරීම් ද ඝාතනයන් ද වාර්තා වෙයි. වැටත් නියරත් ගොයන් කානම් කාට කියන්න ද ඒ දුක කියා නොසිට මෙම පොලිස් ප්‍රචණ්ඩත්වය පිළිබඳව අප අපගේ හඬ අවධිකළ යුතුය. පුරවැසියාට තව තවත් ළඟ පොලීසියක් හදාගැනීමට මෙම සංවාදය සහ අපගේ හඬ අවධි කිරීම අත්‍යාවශ්‍යය.*

### *හක්මන නිදර්ශනය*

මෑතකදී හක්මන පොලිසියේ පහර දීමට ලක්වූ මධුශංකගේ කතාව ද එවැන්නකි. මුලින්ම මධුශංකගේ හඬට ඉඩ දෙමු. ''2021 ජනවාරි මස 06 වෙනිදා රත්නපුරයේ හා ඇඹිලිපිටියෙ ඉන්නා මාගේ සහෝදරයන් දෙන්නා සහ ඥාතීන් කීපදෙනෙක් රෝගීව මා නිවසේ ඉන්න මාගේ අම්මා බැලීමට ආවා. එදා රෑ මේ සියළු දෙනාම මගේ ගෙදර හිටිය නිසා අපි පොඩි සාදයක් පැවැත්තුව, අපි ඩ්‍රින්ක් එකක් ගනිමින් සිංදු කියමින් ඉන්න කොට අල්ලපු ගෙදර චන්දරේ මාමා රාත්‍රී 09.00ට විතර ඇවිත් අපිත් එක්ක මත්පැන් පානය කරමින් විනෝද උනා. මම රාත්‍රී 11.00ත් 11.30 ත් අතර කාලයේ මම බුදිය ගත්ත, අනෙක් අය සාදය පවත්වාගෙන ගියා. 2021.01.07 දින අළුයම 12.45ත් 01.00 ත් අතර කාලයේ විශාල ශබ්දයක් ඇහුන නිසා

නින්දෙන් ඇහැරුනා, ඒ වෙලාවේ චන්දරේ මාමාලගෙ ගෙදරින් රණ්ඩුවන ශබ්දය ඇසුනා, මම එහෙට යනකොට චන්දරේ මාමලයි නැන්ද, මගේ සහෝදරයන්ට බැන වදිමින් හිටිය. මම ඇසුව අපගේ පවුලේ අයගෙන් මොකද මේ කියලා. අපි චන්දරේ මාමට අරක්කු පොවලා කියා නැන්දා මාගේ සහෝදරයන්ට බැන වැදීම නිසා පොඩි කතාබහක් ඇතිවෙලා තියෙනවා. ඊට පස්සෙ මම අපගේ පවුලේ සියළු දෙනාම මාගේ ගෙදරට එක්කගෙන ආවා. 2021.01.07 වනදා අළුයම 01.30 ට විතර හක්මන පොලීසියේ ජීප් එකෙන් උ.පො.ප. ශාන්ත කරුණාරත්න මහත්තය එක්ක පොලිස් නිළධාරින් 05ක් විතර මගේ ගෙදරට ආවා. ඒ අය අධික ලෙස මත්පැන් බීල හිටියේ. චන්දරේ මාමලාට ගැහුවේ කවුද කියලා කරුණාරත්න මහත්තය මගෙන් අහල, අපට හොදටම බැනල, මම අත්තඩංගුවට අරගෙන, මගේ අත් දෙකට මාංචු දාලා මගේ ගෙදර ඉස්සරහ නතරකරලා තිබුණ ජීප් එක ළගට අරන් ගිහින් උඹ චන්ඩියෙක්ද කියලා මට කිතුල් පොල්ලකින් දිගින් දිගටම ගැහුව.

පස්සේ මාව ජීප් එකට දාගෙන හක්මන පොලීසියට උදේ 02.00 ට විතර අරන් ගියා. ඒ වෙලාවේ චන්දරේ මාමාත් එම නැන්දාත් පොලීසියෙ හිටියා. කරුණාරත්න මහත්තය චන්දරේ මාමට කථාකරල මූත් ගැහුවා නේද කියා අහල ඔහු අතේ තිබූණු කිතුල් පොල්ලෙන් මට හොඳටම ආයෙත් ගැහුවා. ඊට පස්සේ තවත් පොලිස් නිළධාරින් කන්ඩායමකට මාව භාර දූන්නා, ඒ නිළධාරින් මට අතින් පයින් පහර දූන්නා. මට කෙලින් හිටගෙන ඉන්න බැරි තත්ත්වයක් උදාවුණා, ඊට පස්සෙ පොලීසිය මාව ඇල්ලවල රෝහලට අරගෙන ගියා, මට යන්න කලින් කිව්වා දොස්තර ඉදිරියේදී එක වචනයක්වත් කතා කරන්න එපා, කතා කලොත් එල්ලල ගහනව කියලා.‘‘

මේ විදිහට කාන්තාවකට පහර දුන්නා කියන චෝදනාවට අත් අඩංගුවට ගන්නේ හක්මන, මුරුතාමුරය, පිටකටුවනගේ වත්ත, අංක 112/2, පදිංචි අබේසිරිවර්ධන සමරවීර ධනුෂ්ක මධුරංග කියන පුද්ගලයා. කාන්තාවක් තමන්ට මෙම පුද්ගලයින් පහර දුන් බවට පැමිණිලි කරපු පමණින් අත්අඩංගුවට අරගෙන මෙලෙස සහාසික අන්දමින් ඒ පුද්ගයාට සලකන්නට පොලීසියට තිබෙන අයිතිය කුමක්ද? අප ප්‍රශ්න කළ යුතුය. ධනුෂ්ක මධුරංග කියන ලෙස මෙම වැටලීමට

පොලීසිය අදාළ ස්ථානයට එනවිට ඔවුන් සිට ඇත්තේ බීමතින් ය. අරක්කු මතින් රාජකාරි කිරීම බරපතල වරදක් ය.

වෛද්‍ය වාර්තාවක් ගැනීමට රෝහලට ගෙනියන ධනුෂ්ක එම වාර්තාව ගෙන නැවත පොලීසියට ගෙන ආ පසුවද අමානුෂික ලෙස පහර දී ඇත. ‘‘අළුයම 04.00ත් 04.30 ත් අතර කාලයේ පොලීසිය මගේ ගෙදර තිබූ, මාගේ යතුරුපැදිය පොලීසියට ගෙනවිත් එම යතුරුපැදිය මට පෙන්වා මේක කාගෙද කොහේද තිබූනෙ කියලා ඇහුවා, කරුණාරත්න මහත්තයා මගේ ටී ෂර්ට් එකත් සමග කරකවා අත් දෙකින් අල්ලාගෙන සිටියදී නාඳුනන [දුටුවොත් හඳුනා ගැනීමට හැකි] පොලිස් නිළධාරියෙක් බිම අතුගාන ඉදල් මිටකින් මට අමාණුෂිකව පහර දුන්නා, පහර දෙන ගමන් මගේ සහෝදරයන් ගැන ප්‍රශ්න කලා. මේ පහරදීම් නිසා මගේ මුළු ඇගම තැලී, පැලී, ඉදිමී, සීරී, මගේ කකුලටත් හානි වුණා. ඔළුවට ගහපු හින්දා වමනය ගියා දැනටත් ක්ලාන්ත ගතියක් එනවා. යටිබඩේ කැක්කුම, මුත්‍රා සමග ලේ පිටවීම, දකුණු අත හිරිවැටීම කියන රෝග දැන් මට තිබෙනවා. දෙයියන්දර අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පස්සෙ මම අධිකරණයට කිව්වා මට පොලීසිය ගැහුවා කියලා. පහර දීම නිසා ඇතිවුණ තුවාලත් මම අධිකරණයේදී පෙන්නුවා, ඒ එක්කම මහේස්ත්‍රාත්තුමිය මාව පිස්කල් මගින් අධිකරණ වෛද්‍යවරයකු වෙත යොමු කිරීමට නියෝග කළා‘‘. ඒ සමග ධනුෂ්ක මධුරංගට ඇප ලැබෙන්නේ ය. අසල්වැසි නිවෙස් දෙකක් අතර අඬදබරයකට මැදිහත්වෙන පොලීසිය මෙහිදී හැසිරී ඇත්තේ නින්දිත ආකාරයට ය. නීතිය රැකීමට සිටින පොලීසියම බීමතින් පැමිණ නීතිය කඩාබිඳ දමා තමන්ට අවශ්‍ය පරිදි සහාසික ලෙස හැසිරී ඇත. මෙවැනි හැසිරීම් සහිත පොලිස් නිළධාරීන් පිළිබඳව පොලීසිය මීට වඩා වැඩි සැලකිල්ලකින් කටයුතු කළ යුතුය. මෙහිදී පොලිස් වදයට ලක්වූ ධනුෂ්කට සාධාරණය ඉටුවිය යුතුය.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/_eAJp0eqdbg

https://www.aithiya.lk/police-torture-human-rights-violations-in-sri-lanka-2/

# 99. ඝාතනයට වසර විස්සයි සැකකරු තවමත් නිදැල්ලේ



අමිතා ප්‍රියන්ති

කළුතර මහාධිකරණයේ නඩු අංකය එච්.සී.570/13 යටතේ විභාග වන නඩුව ලෝකයේ දීර්ඝතම අපරාධ නඩු විභාගය විය හැකිය. එය අවුරුදු 20ක් ගතවීත් තවමත් විභාග වෙමින් තිබෙයි. මෙම නඩුවට අදාළ සිද්ධිය කුමක්ද? පයාගල පොලිස් අත්අඩංගුවේදී අමානුෂික වදහිංසා මතින් ඝාතනය කරනු ලැබූ ලසන්ත ජගත් කුමාරට යුක්තිය ඉටුකරගැනීම අරඹයා මෙම නඩුව තවමත් ඇසෙමින් තිබෙයි. මෙම නඩුවට අදාළ ප්‍රධාන චූදිතයා කවුද? ඔහු එවක පයියාගල පොලීසියේ අපරාධ අංශය භාරව සිටි ස්ථානාධිපතිවරයා ය. නම වල්පොලගෙදර ප්‍රසන්න වික්‍රමරත්න.

2000 අවුරුද්දේ ජූනි 12 වැනිදා ප්‍රසන්න වික්‍රමරත්න ප්‍රමුඛ පයියාගල පොලිස් කණ්ඩායම ලසන්තව අත්අඩංගුවට ගන්නේ ඔහු හමුදාවෙන් පැන ආ පුද්ගලයෙක් යැයි කියමින් ය. ලසන්ත ජගත් කුමාර හමුදා සාමාජිකයෙක් බව සැබෑවක් වුණාට පයියාගල පොලීසිය ඔහුව හමුදාවට භාර දෙන්නේ නැත. නියමිත ක්‍රමයට නම් ඔහු හමුදාවට භාර දිය යුතුය. නමුත් එය සිදුවී නැත. පයාගල ප්‍රදේශයේ සිදුවූ සුළු සුළු අපරාධ රැසකට මොහු සම්බන්ධ බව ප්‍රකාශ කරමින් මෙහිදී ලසන්තව අත්අඩංගුවේ රඳවා ගන්නට පයියාගල පොලිස් ලොක්කා කටයුතු කර ඇත. අත්අඩංගුවට ගෙන දින 5කට පසුව ජූනි 17 කළුතර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලසන්තට පයියාගල පොලීසිය ගොනුකරන අපරාධ හේතුව වන්නේ, සැකකරුවන් හඳුනා නොගත් සුළු වැරදි කීපයකට වැරදිකරු බවය. ඒ වනවිට ලසන්තට පොලීසිය අමානුෂික ලෙස පහර දී දසවධ දී අවසන් ය. අධිකරණයට ඉදිරිපත් කරනවිටත් ඔහුගේ එක අතක් කැඩී හමෙන් එල්ලෙමින් තිබුණ

බව ඔහුගේ සොහොයුරිය අමිතා ප්‍රියන්ති අපහට පැවසුවා ය. මෙහිදී ලසන්ත අධිකරණයට ඉදිරිපත් කරන්නේ බොරු අධිකරණ වෛද්‍ය වාර්තාවක් ද සමගින් ය.

වෛද්‍ය නිලධාරී ඩබ් ආර් පියසෝම පොලීසියට අවශ්‍ය වාර්තාව ලියාදුන් වෛද්‍ය නිළධාරියා ය. එම වෛද්‍ය වාර්තාවේ සඳහන් වන්නේ ලසන්තගේ ශරීරයේ සුළු සීරීම් 5ක් පමණක් ඇති බවය. එහෙත් ඒ වනවිටත් ලසන්තගේ ශරීරා අභ්‍යන්තර ඉන්ද්‍රියන්වලට හානී සිදුවී තිබෙන්නට ඇත. මෙම හොර වාර්තා ලියාදුන් පියසෝමට වෛද්‍ය සභාවේ ලියාපදිංචිය වසර 3 කට අත්හිටුවනු ලැබිණි. ජුනි 18 වෙනිදා කොළඹ මැගසින් බන්ධනාගාරයට අධිකරණ නියෝග මත ගෙනඑන ලසන්ත ජුනි මස 20 වෙනිදා දෙනෙත් පියාගන්නේ ය. මෙම මරණය ගැන පරීක්ෂා කරන අධිකරණ වෛද්‍යවරයා කියන්නේ අභ්‍යන්තර තුවාල විසි දෙකක් තිබුණ බව. දැන් ඔබට පයියාගල පොලීසියේ හැසිරීම ගැන සිතාගන්නට පුලුවන් වනු ඇත.

මෙම සිද්ධියේ ප්‍රධාන චූදිතයා වල්පොලගෙදර ප්‍රසන්න වික්‍රමරත්න මෙම සිද්ධියට අදාළව අත්අඩංගුවට ගත්තත් ඔහුට ඉක්මනින්ම ඇප ලැබෙනවා. ඇප ලැබුණ දා සිට ඔහු තවමත් අතුරුදන්. මෙම පොලිස් නිළධාරියාගේ බිරිඳ අධිකරණයට ප්‍රකාශ කර ඇත්තේ මේ පුද්ගලයා ලංකාව හැරගොස් ඇති බවයි. එහෙත් අවුරුදු 20කට වැඩි කාලයක් සිය සොහොයුරා වෙනුවෙන් යුක්තිය ඉල්ලා උසාවි ගානේ රස්තියාදුවෙන අමිතා ප්‍රියන්ති මහත්මිය නම් කියන්නේ මේ පුද්ගලයා ලංකාවේ කොහේ හෝ සැඟව සුවසේ කල් ගෙවන බවය. ඒ පොලිස් අනුග්‍රහය යටතේ ය. 'නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරයා මේ පුද්ගලයාට ඇප දෙන වේලාවේදී ඊට විරුද්ධ වෙලා නැහැ. හර්ෂන නානායක්කාර කියන නීතිඥවරයා තමයි පෙනී ඉඳල තියෙන්නෙ රජය වෙනුවෙන්, එයා මේ සම්බන්ධයෙන් මුකුත් කියලා නැහැ. අනිත් නඩුවලදීත්වලදීත් එහෙමයි. මේ පුද්ගලයාට විතරක් සුවිශේෂී අවස්ථාවක් ලබාදුන්නේ කොහොමද? ඒකෙන් පේන්නේ හැමෝම මොහුට උදව් කළ තියෙනවා මේ නඩුවෙන් පැනයන්න.
පසුගිය කාලයක මට ආරංචියක් ලැබුණා මේ පුද්ගලයා කිහිප සැරයක්ම ඔහුගේ රැකියාව ඉල්ලලා ඇපිල් ඉදිරිපත් කරලා තියනවා කියලා. ඉතින් රැකියාව ඉල්ලලා ඇපිල් කරනවා නම් ඒ පුද්ගලයා ජීවත්

වෙනවා කියලා පොලිසිය දැනගන්න එපැයි. බුද්ධි අංශ නිලධාරීන්මයි කියන්නේ මෙයා පොලිස් මූලස්ථානයට ඇපිල්කරලා තියනවා කියලා. එසේ නම් ඒ පුද්ගලයා ලංකාවේ කොහේ හෝ තැනක ඉන්නවා නේ, ඇයි ඔහු අත්අඩංගුවට ගන්නේ නැත්තේ?' අමිතා ප්‍රියන්තිගේ මෙම ප්‍රශ්න කිරීම සාධාරණය.

'ඔක්කොම නඩු හතරක් තිබුණා, මේ වෙනකොට නඩු 3ක් විභාග වෙනවා, මූලික අයිතිවාසිකම් නඩුවයි, ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවයි, අපරාධ නඩුවයි, දිස්ත්‍රික් උසාවියේ නඩු දෙකයි. ඊට අමතරව වෛද්‍ය සභාවට විරුද්ධව පරීක්ෂණය ගියා, ඊටත් අමතරව නියෝග කඩ කිරීම සම්බන්ධව පොලිස් දෙපාර්තමේන්තුවේ පරීක්ෂණය ගියා. ඒවායෙන් මොනාද උනේ කියනඑක අපට පැහැදිලි නැහැ. නමුත් අදාළ චුදිතයා වශයෙන් සැකකරපු අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා පමණක් වැඩ තහනමකට ලක්වුණා. මොකද රංජිත් අබේසූරිය මහතා පොලිස් කොමිසම කරපු කාලයේ වර්තමානයේ වගේ නෙමෙයි අකුරට නීතිය ක්‍රියාත්මක වුණා. සාධාරණව මහජන පැමිණිලි සම්බන්ධව ක්‍රියා කළා. නීති ක්‍රියාත්මක කරන ආයතනවල තියෙන දුර්වලතාවය හා අපරාධකරුවන් සමඟ තියෙන සම්බන්ධතාවය නිසා මේ රටේ අපරාධ සම්බන්ධව යුක්තිය ඉෂ්ට වෙන්නේ නැහැ කියන එක තමයි මට අවසන් වශයෙන් කියන්න තියෙන්නේ. මල්ලී නැතිවුණා මල්ලිගේ පුතා දැන් තරුණයෙක් අපි ඔහුට කියන්නේ මොනාද? අපේ පවුල වගේම මල්ලිගේ පවුලත් මේ සිද්ධිය නිසා දෙදරලා ගියා. හැබැයි මේ සිද්ධියට අදාළ චූදිතයා තවමත් හොඳට නිදහසේ ඉන්නවා. අපිට කවදාද යුක්තිය ලැබෙන්නේ' මේ සියලු නඩු කටයුතු සහ යුක්තිය වෙනුවෙන් කෙරෙන අරගලය අමිතා ප්‍රියන්තිගේ නොවක් කැපවීමේ සහ ධෛර්යයේ ප්‍රතිඵල බව කිවයුතුය.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/fe1ygvGQKXc

https://www.aithiya.lk/worlds-longest-torture-case-police-torture-in-sri-lanka/

# 100. 20 සම්මතවීම සහ පාස්කු පරීක්ෂණ අතර ඩීල් එකක් තියෙනවද? අපිට සැකයි

## පාර්ලිමේන්තු මන්ත්‍රී නිරෝෂන් පෙරේරා

***පුත්තලම් දිස්ත්‍රික්කය නියෝජනය කරන කතෝලික මන්ත්‍රීවරයෙක් විදිහට ඔබ මුල සිටම පාස්කු ප්‍රහාර පරීක්ෂණ පිළිබඳව අදහස් දක්වපු පුද්ගලයෙක්. වර්තමාන ආණ්ඩුව යටතේ පාස්කු ප්‍රහාරය ගැන කෙරෙන පරීක්ෂණ ගැන කතෝලික ජනතාව අතර තිබෙන මතය මොකද්ද?***



පාර්ලිමේන්තු මන්ත්‍රී නිරෝෂන් පෙරේරා

කතෝලික ජනතාව විදිහට වගේම කතෝලික සභාවත් හැමදාම කීවේ පාස්කු ප්‍රහාරය පිළිබඳව ස්වාධීන සම්පූර්ණ පරීක්ෂණයක් කළ යුතුයි කියන කාරණය. කතෝලික ජනතාව තවමත් ඒ මතයේ ඉන්නවා. ඇත්තටම කතෝලික ජනතාවට දැන් මේක ලොකු ප්‍රශ්නයක්. දැනට පරීක්ෂණ කෙරෙන විදිහ වගේම ඒ ගැන ආණ්ඩුවේ උනන්දුව ගැන අපිට විශාල ප්‍රශ්න තිබෙනවා. අපි කියන්නේ කවුද මේක පිටිපස්සේ හිටපු ප්‍රධානියා, මහ මොළය කවුද? මේකට අරමුදල් ආවේ කොහොමද? මේකට තාක්ෂණික උපදෙස් ආවේ කොහොමද? මේක රට අස්සේ සංවිධානය උනේ කොහොමද? ඒකට උදව් කළේ කවුද? මේ සියල්ල සොයන්න ඕනෑ. සියල්ල සොයලා වැරදිකරුවන් හෙළි කළ යුතුයි. ඒ වගේම ඔවුන්ට දඬුවම් කළ යුතුයි. එහෙම කළොත් පමණයි කතෝලිකයන්ට සතුටු වෙන්න පුලුවන්. එහෙම කළොත් විතරයි මැරුණු මිනිස්සුන්ට සාධාරණය හිමිවෙන්නේ. මම හිතන්නේ කාදිනල් උන්නාන්සේ ඇතුලු කතෝලික සභාවත් ස්ථිරසාර අදහසක

ඉන්නවා මේගැන. කතෝලික සභාව කියන්නේ මේක ජාතිකව බේරගන්න බැරිවුණොත් ජාත්‍යාන්තරයට යනවා කියන කතාව. කතෝලික ප්‍රජාව කියන්නෙත් ඒකම තමයි.

***ශානි අබේසේකර ඇතුලු පාස්කු ප්‍රහාරය පිළිබඳව පරීක්ෂණ කරපු නිළධාරීන් සියල්ලම වගේ එම ස්ථානවලින් මාරු කරලා කියන කතාව පසුගිය දවස්වල හෙළිවුණා. මේ ගැන ඔබගේ අදහස.***

අපි දන්නවා මේ නිළධාරියා ඇතුලු අනෙකුත් නිළධාරීන් මේ ප්‍රහාරය පිළිබඳව පරීක්ෂණ මෙහෙයවූවා, ඔහු දැන් ඉන්නේ රක්ෂිත බන්ධනාග ාරයේ, ඒ වෙනත් චෝදනාකට. ආණ්ඩුව මේවා ගැන කෙළින් කතාකරන්නේ නැති නිසා සහ නිවැරදි තොරතුරු නොදෙන නිසා අපිට ඉතිං මේවා ගැන සැකයි. දැන් පාස්කු කොමිසන් වාර්තාව ගන්න, සියලු කරුණු හෙළිකරලා තිබෙනවාද? ජාතික ආරක්ෂාවට කියලා කරුණු, නිවැරදි තොරතුරු ජනතාවගෙන් සඟවනවා. එතකොට ඉතිං සැකයක් ඇතිවෙනවා, මේ මොකද්ද වෙන්නේ කියලා. විශේෂයෙන් කතෝලික ප්‍රජාවට සහ කතෝලික සභාවට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, ඒ තමයි 20 වැනි සංශෝධනය සම්මත වීම සහ පාස්කු ප්‍රහාරය පිළිබඳ පරීක්ෂණ අතර සම්බන්ධයක් තිබෙනවද, ඩීල් එකක් තිබෙනවද කියලා. මම හිතන්නේ ආණ්ඩුව මේවා ගැන තමන්ගේ මතය ප්‍රකාශ කරන්න අවශ්‍යයි. අපි හැමෝම දන්නවා නේ 20 වැනි සංශෝධනය සම්මත වුණ ආකාරය ගැන.

ඒ වගේම රජයට වගකීමක් තිබෙනවා දැන් පරීක්ෂණ කෙරෙන ආකාරය ගැන වගේම එහි ප්‍රතිපල ගැන අපව දැනුවත් කරන්න. මේක ලේසියෙන් කරන්න පුලුවන් වැඩක් නෙවෙයි, මේක පිටිපස්සේ ලොකු පිරිසක් ඇති අනිවාර්‍යයෙන්. අපි ඒ ගැන දැනගන්න අවශ්‍ය නැද්ද? අද කියනවා මහා මොළය සහරාන් කියලා හෙට කියනවා නවුෆර් මවුලවි කියලා, මොන කතාද මේ. මේවායි ආණ්ඩුව සහ පරීක්ෂණ කරන අංශ ගැන ජනතා විශ්වාසය නැත්තටම නැතිවෙනවා. ඒක හොඳ දෙයක් නෙවෙයි. ඒ නිසා ආණ්ඩුව කරුණු හංගන්නේ නැතුව නිවැරදි තොරතුරු ජනතාවට කියන්න ඕනෑ.

***හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා අත් අඩංගුවට ගන්න යනවාය කියලා ලොකු කතාවක් යනවා. මේ ගැන ඔබේ අදහස..***

පාස්කු ප්‍රහාරය පිළිබඳ පරීක්ෂණ සඳහා හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා අවශ්‍ය නම් ඔහු අත්අඩංගුවට ගන්න තිබ්බේ මීට සෑහෙන්න කළින්. නමුත් ඒක එහෙම නොකර ඔහු අර හෙළිදරව්ව පාර්ලිමේන්තුවේ කළාට පස්සේ අත්අඩංගුවට ගන්නට ආණ්ඩුව උත්සාහ කරනවානම් අපිට කියන්න වෙන්නේ, ඔව් ආණ්ඩුව හදන්නේ විපක්ෂය මර්දනය කරන්න කියලා තමයි. හරීන් පාර්ලිමේන්තුව අස්සේ කරපු ප්‍රකාශය ගැන කතාකළොත් මම ඊට වඩා දෙයක් ඒ ගැන දන්නේ නැහැ, ඒනිසා රජයේ වගකීම ඒ පිළිබඳව කරුණු සොයන එක, ඒ වගේම ඒ ගැන නිවැරදි තොරතුරු රටට හෙළිදරව් කරනඑක. අනික අපි මුලින් කතාකළානේ ශානී අබේසේකර ගැන, එතකොට අපි ආණ්ඩුවෙන් අහන්න අවශ්‍යයි ඔහු කරපු පරීක්ෂණවලට මොකද වුණේ? ඔහු සොයා ගත්ත තොරතුරුවලට මොකද කළේ කියලා. මේවා ගැන කතෝලික ප්‍රජාව අතර විශාල සැකයන් අවිශ්වාසයන් ගොඩනැගිලා තිබෙනවා. ඒ නිසා ඒවා දුරුකරන එක ආණ්ඩුවේ වගකීම.

---

**ලිපිය හා වීඩියෝව පහත සබැඳියන්ගෙන් ලබා ගත හැකිය.**

https://youtu.be/5fntrYMWYh4

https://www.aithiya.lk/politics-in-sri-lanka-niroshan-perera-samagi-jana-balawegaya/



RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

No. 288,135, Jayawardena Place,
Colombo 09.
Tel : +94 11 2669100  E-mail : right2lifelk@gmail.com
www.right2lifelanka.org

978-624-5860-01-2

Rs. 250/-